DAHAM SARANA

BY

PAṆDIT VIDYACHAKKRAVARTI.

පණ්ඩිත කුලශෙඛරායමාන ශ්‍රීමද්විද්‍යාචක්‍රවර්ත්තීන් විසින්

විරචිත

දහම් සරණ.

කොත්මලේ

ජේ. සිකුරාජපති ආණ්ඩුවේ මිනින්දෙරු මහතා

විසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රාපිතයි.

ප්‍රථම මුද්‍රාඛ්‍යාන්‍යෂ.

විද්‍යාචක්‍රවර්තියන් විසින් විරචිත

දහම් සරණ.

ප්‍රථම භාගය.

ඩබ්ලිව්. ඇස්. ද අල්විස් සිරිසඳ්ධාර්ම රත්නාකරගේ

සමාරාධනය පරිදි

කොත්මලේ

ඤාණෝදය පරිවෙණාධිපති පූජ්‍ය පණ්ඩිත

කේ. ශ්‍රී ධම්මකිත්ති ධම්මානන්දාභිධාන

ස්ථවිර පාදයන් වහන්සේ විසින්

සංශෝධිතයි.

ප්‍රථම මුද්‍රණය.

කොත්මලේ

ජේ. සිකුරාජපති ආණ්ඩුවේ මිනින්දෝරු මහතා

විසින්

කොළඹ ඉතිහාසප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවන ලදී.

2472

1929

DAHAM SARANA

BY

PANDIT

VIDYACHAKKRAVARTI

PART I

REVISED AND EDITED BY

THE VEN'BLE

PANDIT K. SRI DHARMAKIRTI DHAMMANANDA THERA

PRINCIPAL OF

JNANODAYA PIRIVENA, KOTMALE

WRITTEN AT THE REQUEST

OF

W. S. DE ALWIS, REGISTRAR OF MEDAPANE

FIRST EDITION

PUBLISHED BY

J. SIKURAJAPATI

Govt: Surveyor, Kotmale

PRINTED AT THE

GRANTHAPRAKASA PRESS, COLOMBO

B. E. 2472

C. E. 1929

පූර්විකා.

දහම් සරණ.

පරම මධුරතර විමුක්ති රසා'ස්වාදූ'ශක්ත සමස්ත විනෙය ජන කුමුදවන ප්‍රබොධයෙහි කෞමුදී සන්නිභ ගම්භීර දූරදර්ශී දුර'නුබොධ ශාන්ත ප්‍රණීතතා'දී විවිධ ගුණෝ'පලක්ෂිත නව ලොකෝ'ත්තර ශ්‍රී **සධර්ම්ම රත්නය** වනාහි භය ලොභ **කුලා'ච්** රාදීන් තොරව ශුද්ධ ශ්‍රද්ධා භක්ති පූර්ව්ඩගම්ව **ආත්මසන්නිය්‍යාතන ශික්ෂා භාවොපගමන, තත්පරායණ, ප්‍රණිපාත,** යන චතුෂ්ප්‍රකාරයෙන් පරම පිහිට කොට ගැන්ම **ධර්ම්ම ශරණ** නම් වේ. ඒ ශ්‍රෙෂ්ඨ සද්ධර්ම්මය වර්ණනා මුඛයෙන් **ධර්ම්ම ශරණ** මාහාත්ම්‍යය ප්‍රකාශක මේ ග්‍රන්ථය ද උපචාර වශයෙන් **දහම් සරණ** යයි කියනු ලැබේ.

නිමිත්ත.

ජින වචනා'මෘත ප්‍රවාහයෙන් පරම පාරිශුද්ධියෙහි පිහිටි විපුල පාලිභාෂාව නොහදුනූ සභාෂා මාත්‍රය දත් ධර්ම්මා'භිලාෂී සද්දෙශිය සාධූන්ගේ ධර්ම්ශ්‍රවණ වර්ණනය ශාස්ත්‍රා'දීන් හට භාෂා ව්‍යවහාර නතඵ ශ්‍රවණයෙන් ඇතිවන සභාෂාමය පවුත්වය සැලසීම, අතුල්‍යවූ සද්ධර්ම් ගුණ වර්ණනායෙන් සඤ්ජාතවන අපරිමිත පුණ්‍යඵල ප්‍රතිලාභයෙන් ග්‍රන්ථ කර්තෘහුගේ විමොක්ෂ ප්‍රතිලාභා'පෙක්ෂාව, ද මේ මාහැඟි ග්‍රන්ථය නිර්ම්මාණයෙහි **නිමිත්තයෝ** යි.

ග්‍රන්ථ කර්තෘ.

මේ උතුම් නිමිති සලකා ප්‍රතිපාදිත මේ ග්‍රන්ථයෙහි කර්තෘ වූයේ විඳූ ප්‍රභා භාස්වර අප්‍රතිහත ප්‍රඥ ගතීන් වොරැදූ න විඳූවක්‍රවර්ත්තීනි පරාක්‍රම ව්‍රිද්‍රාවරේණ්‍ය යා ම වේ. නාම මාත්‍රය ද ඇසීමට පවා දුර්ලභවූ මෙහි කර්තෘ කවරෙක්දැයි විනිශ්චය වශයෙන් කීම අතිශයින් ම දුෂ්කරය.

පුරාතන ග්‍රන්ථයන් විෂයයෙහි උපයුක්ත භාෂා විලාසය අත්‍රව. තද්ග්‍රන්ථ නිර්ම්මාණ සමය ද ග්‍රන්ථ කිපයක් රචනා කළ

ග්‍රන්ථ කතෘගේ ඒ ඒ ග්‍රන්ථයන්හි සාම්‍යය අනුව කතෘ ද විනිශ්චය කටහැකිය. නමුත් මෙහි පෙරාතුව කී කරුණ හැණ කෙසේ වෙතත් පැසුලුව කී කරුණ අනුව මේ ග්‍රන්ථයෙහි කතෘ විනිශ්චය කට හැකි නොවේ.

විදුවක්‍රවර්තීන්ගේ ග්‍රන්ථයන් භාෂා විලාසයෙන් හා රචනා රීතියෙන් ද අන්‍යොන්‍ය විසදෘශ බැවි තතුඵලඥයෝ දනිත්. එහෙයින් පහත පහළවන සාධක කාරණයන් සසඳා බලන කල මෙහි කතෘ ද **විදුවක්‍රවර්තී** පඬිවරයාම බව නිශ්චය වේ මය. **"දහම් සරණ** කතෘ **විදුවක්‍රවර්තීහු** නොවෙත්"යයි යම් භවතෙක් සලකා නම් ඔහට ප්‍රතිඵලා විය යුත්තේ **බුත්සරණ, දහම් සරණ, සඟ සරණ** යන ග්‍රන්ථාංශත්‍රයය ම එකට ලියූ පුස්කොළ පිටපත් කිපයක බුත්සරණ අවසානයෙහි **"විදුවක්‍රවර්තීන් විසින් කල අමාත්‍යවර නම් බුඩවර්තය නිම"** යන පාඨය නිබීමත් **දහම් සරණ-සඟ සරණ** යන්හි අවසාන කතෘ සංදර්ශන පාඨය එසේ නොවිබීමත් ග්‍රන්ථ ත්‍රයයෙහි භාෂා විලාසය අන්‍යොන්‍ය විසදෘශතා වෙන් පුනත්වීමත් ය.

.. මේ ප්‍රථම ශෝධනයෙහි අපට උපකාරීවූ පුස්කොළ පිටපත් හතක් සහ පුස්කොළ පොතින් පිටපත් කරගණු ලැබූ කඩදැසි පිටපත් දෙකක් ද වෙති. ඉන් **මාකුරාවේ රජමහා විහාරස්ථානයෙන්** හා **ලඹකාතිලක රජමහා විහාර** ස්ථානයෙන් ද ලැබුනු පිටපත් දෙකෙහි පමණක් කතෘ සඳර්ශක පාඨය දක්නා ලැබේ. අනිත් පොත් සතෙහි ම ග්‍රන්ථ කතෘ ගැන කිසි ම වාර්තාවක් නොමැත්තේය.

ඒ පොත්වල ඇතොකත්ත පාඨය අභාවයට පැමිණ බැවි පෙනේ. මෙය බුත්සරණ අවසන්හි පමණක් නොව **දහම් සරණ සඟ සරණ** අවසන්හි ද මෙසේ ම නිබී අභාවප්‍රාප්ත වූ බවට කිසිම සැකක් නොමැතිසි. ඊට සාක්ෂියක් නම් බුත් සරණ පිටපත් රාශියක ම එම පාඨය නොවිබීමයි.

මෙය එක කතෘවරයකුගේ එක ම පොතක් නම් **සඟසරණ** අවසන්හි කතෘ සඳර්ශනය කරණවා විනා බුත්සරණ අවසානෑ (ග්‍රන්ථ මධ්‍යයෙහි) මෙසේ යොදනලද්දේ කුමක් නිසාදැයි තර්ක කිරීමට අවකාශ නිබේ. **රසුවංශ ජාතකහරණ'දි** සුලභ බොහෝ මහාකාව්‍ය ග්‍රන්ථයන්හි සඟීයක් පාසා අනුක්‍රමයෙන්

කතා සඤ්ඤාපාඨ දක්නා ලැබෙත්. එලෙසින් ම මේ පොත් තුණ අවසන්හි ද පුරාණ පොත්වල මේ පාඨය තිබුනුබව සැල කියහැකිය. එහෙයින් මේ **සරණ ත්‍රයාර්ථ්‍රයය** ම **විද්‍යුවක්‍රවර්තීන්** ගේ කෘති බැව් ප්‍රසිද්ධ කිරීමෙහි සාධකයෝ බොහෝ වෙති. ඉන් සමහරක් මෙහි සඳහන් කරමු.

විද්‍යුවක්‍රවර්තීන් විසින් විරචිත බුද්ධසරණ ප්‍රාරම්භයෙහි ග්‍රන්ථකරණය පිණිස උපන්‍යාසය මානිකාව නම් **"සබ්බපාපස්ස අකරණං"** යනාදි බුළු ත්‍රිපිටක ධර්මය ම අලළා සුදෙසිත සාර ගර්භ බුද්ධවචනයෙකි. ඉන් ධර්මා'ධිෂ්ඨාන වශයෙන් සල කනවිට සියලු පව් නො කිරීම නම් අහින්මාර්ග ඥානා'වබෝධ යයි. අසඳෘශවූ අහින් මාර්ගඥානා'වබෝධය සර්ව්ඥයන් වහන් සේට ම හිමිය. එහෙයින් **"සබ්බපාපස්ස අකරණං"** යනු සර්ව්ඥ ගුණ වර්ණනායෙහි ප්‍රාරොවාක්‍යය ලෙස ග්‍රන්ථ කර්තෘ විසින් තබා ගන්නාලදී.

සුමේධකාලයෙහි අභිනීහක්‍රමණයෙහි පටන් සර්ව්ඥතාඥා නා'ධිගමය දක්වා කුශලධර්මයන් රැස්කිරීම ධර්ම ගුණවර්ණන යෙන් **දහම් සරණ** රචනාවට උපන්‍යාස වශයෙන් තබාගත්හ. ඒ **"කුසලස්ස උපසම්පදා"** යන්න අනුගමනය කිරීමෙනි.

"ස චිත්ත පරියෝදපනං" යනුවෙන් යොගාවචර භික්ෂූන් විසින් ඉතා දුකසේ නිවරණයන් මැඩ සිය සිත් සතන් පිරිසිදු කිරීම ප්‍රකාශ කෙරෙයි. එය ඉතාම රසවත්වූ සබ්ඣයාවහන් සේ පිළිබඳ නොයෙක් විසිතුරු කථා නිබෙද්දි **චිත්ත දමථා'නි සංසන්** ම ප්‍රකාශ කරණ කථා රාශියකින් මනොහරවූ **සඟ සරණ** ට මුඛ වාක්‍යය ලෙස සැලකුහ.

මෙසේ ත්‍රිවිධරත්නයෙහි ගුණ වර්ණනයට යොග්‍ය සේ රිට ගැළපෙන එක ම ගාථාවක් ප්‍රාරම්භ ග්‍රන්ථයෙහි ආරම්භය වශයෙන් යෙදීමෙන් මේ සරණ ග්‍රන්ථත්‍රයය ම එකකර්තෘක බව පැහැදිලි වෙයි. බුද්ධසරණ ප්‍රාරම්භයෙහි **"බුද්ධං සරණං ගච්ඡාමි, බුදුන් සරණ යෙමි"** කියා ද වාක්‍ය'වසානයක් පාසා **"බුදුන් සරණ යා සුතු"** කියා ද හැමතැන ම දක්නා ලැබේ. එලෙසින් ම **"දහම් සරණ--සඟ සරණ-දෙක්හි** ද ආදියෙහි **"ධම්මං සරණං ගච්ඡාමි, දහම් සරණ යෙමි"-"සඞ්ඝං සරණං ගච්ඡාමි, සඟ සරණ යෙමි"** කියා ද වාක්‍ය'වසානයෙහි **"දහම් සරණ යා සුතු"-"සඟ සරණ යා සුතු"** කියා එකා'කාර'යෙන් යෙදූ නිබීම ද සාධකයෙකි.

චිඤ්චක්‍රවර්තීන් විසින් විරචිත **සතුපවංශයෙහි** පෙනෙන්
සුමෙධ **පණ්ඩිතයන්ට** අයකැම් බන දුන්වූ පරිදි ප්‍රකාශිත
වාක්‍යය **දහම් සරණෙහි** වියූ ආකාරයට සවලපවූ වෙනසක්
කොට යොදූ තිබේ. යලිදු තමා මතු කරණ වර්ණනාවක්
අපෙක්ෂා නොකරණ බුඩගුණය පමණක් වර්ණනා කරන්
නෙකු විසින් නම් **සඬ්ම රත්නාවලී** ආදියෙහි මෙන් **සුවිසි බිව**
රණ කථා ද **අමාවතුර** ආදියෙහි මෙන් **ජාතක නාමඝෝ** ද
ඇතුළත් කටයුත්තාහුමය. තමා විසින්ම මතු රචනා කරණ
දහම් සරණයෙහි **විවරණකථා** ඇතුළත් කරණ බැවින් බුත්
සරණයෙහි විවරණ කථා ප්‍රකාශ නොකිරීම ද බුත්සරණ
යෙහි බොහෝ කොට ජාතක කථාවන් පිළිබඳ පුදගල නාමය
සදහන් කොට ජාතක නාමය දහම් සරණෙහි යොදූ හැණී
මට අවකාශ නබා හැණීමද සැලකිය යුත්තකි. **සරණ ග්‍රන්ථ**
තුණ ම එක ම පොතක් වශයෙන් ලියූ පරණ පුස්කොළ පිට
පත් රාශියක් දක්නා ලැබීම ද ග්‍රන්ථතුණෙහිම අන්‍යොන්‍ය
සම්බන්ධය ප්‍රකාශ කෙරෙයි.

තවද "මෙසේ මේ ජාතකයෙහි මුහුදු මැදු නැවු බුන්නන්
පොවා **බුත්සරණ යෙමි, දහම් සරණ යෙමි, සඟසරණ යෙමි** යි
කී බැවින් නාගරාජයන් සත්රුවන් නැව් වෙස් ගෙණැ සමුද්‍ර
දෙවතාවන් නියමු වෙස් ගෙණැ **තෙ සරණ ගතුවන්** ඒ නැවට
නගා උන් ගත් තෙ සරණයෙහි අනුශංසාදන් වූවනුදු ඒ නැවට
නගා එතර කොටැ උන්ගේ ගෙයි සත්රුවන් පුරා ගිය බව ම
"**රත්නත්‍රයය** සරණ ගියවුන්ට සියලු දුක් දුරුවෙයි "**කියා මා**
කියන්නාවූ තෙ සරණ ගුණයටම දෙය." යන දහම් සරණ්'
ගත වාක්‍යය ද අවිලඛ්‍යනීය සාක්ෂියෙකි. පූර්වොක්ත සාමාන්‍ය
සාධකයන්ට වඩා මෙය ඉතාමත් ආදරණීයය. "**මෙහි මා**
කියන්නාවූ තෙ සරණ ගුණයටම දෙය." යන වාක්‍යයෙන්
තමාම තෙ සරණ ගුණය වර්ණනා කරණ බව ප්‍රකාශ
කෙරෙයි. මේ ග්‍රන්ථත්‍රයෙහි වෙන් වෙන් වශයෙන් බුඩ, ධර්ම,
සඞ්ඝ යන ත්‍රිවිධ රත්නයෙහි මාහාත්ම්‍යය වර්ණනා කළබව
බුත් ව්‍යතිමිශ්‍ර වශයෙන් වර්ණිත බවක් නොපෙනේමය.
එවිට "මා කියන තෙ සරණ ගුණයට"යයි වෙසෙසා කීමෙන්
ත්‍රිවිධ රත්න ගුණ වර්ණනාව එක් කෙණෙකු විසින් ම කරණ
ලද බව පිළිගත යුතුය.

එහෙත් මේ ග්‍රන්ථත්‍රයා'තමක භාෂා විලාසයෙහි අන්‍යොන්‍ය විසදෘශතාවය ඉතා අධිකය. **සැලලිහිණි අස්නෙහි හා පරවි අස්නෙහිත්** ඒ ග්‍රන්ථ දෙක්හි සහ **කව්සිඳුකරයෙහිත්** භාෂාවිලාසමාත්‍රය සලකන්නන් විසින් මේ ග්‍රන්ථත්‍රයය ම එක ම පඬිවරයෙකුගේ කෘති ලෙස නො පිළිගන්නේ වේ. එසේ ද වුවත් මේ කාව්‍ය ග්‍රන්ථත්‍රයය ම **ජවි භාෂා පරමෙශ්වර කොටහමුවේ ශ්‍රී රාහුල සඞ්ඝරාජයන් වහන්සේගේ** රචනා ලෙස නො පළිගන්නෙක් වේ නම් හෙතෙම අවිචාර බුද්ධිමතෙක් වියයුතුමය. එලෙසින් **බුත් සරණ, දහම්සරණ, සඟ සරණ** යන පොත් තුණේ භාෂා නානත්වය අන්‍යොන්‍ය වෛෂම්‍යයෙන් යුක්තවුවත් පුළෝ'කත සාධකයන් සලකන යුක්ති විචාරකයන් විසින් තද් ග්‍රන්ථ ත්‍රයෙහි ම කතෘ **විදුරුවක්‍රවතීන්හිඳු** ලෙස පිළිගණු ලබත් මැයි.

අවසන්න සමය.

දහම් සරණ කතෘහුත **විදුරුවක්‍රවතීන්** වාසය කළ කාලය විනිශ්චය වශයෙන් කිවහැකි නොවේ. භාෂා නානත්වය ද අන්‍ය සාධක කරුණු ද සලකා බලනවිට පොළොන්නරු කාලය සහ දඹදෙණි කාලය අතර සිංහල භාෂාවේ අභිවර්ධනය සැල සුන සවණ්ණමය සමයෙහි වාසය කළබව අනුමිති වශයෙන් කිව හැකි වේ. විදුරුවක්‍රවතීන්ගේ අවසාන සමයා'සන්නයෙහි ම **පණ්ඩිත** කුලපති වූ ආචාර්ය **ගුරුළුගොමින්** ද ජීවත් වූ බව ප්‍රාඥයින්ගේ පිළිගැන්ම වේ.

ග්‍රන්ථ නානත්වය.

දහම් සරණ වනාහි ඔජොගුණ භූයිෂ්ඨවූ විචිත්‍ර පදවලියෙන් සාලඞ්කෘතය. අර්ථ මාධුර්‍යයෙන් පණ්ඩිත ජනා'හලාදකරය. පදලාලිත්‍යයෙන් විචිත්‍ර හෙයින් කර්ණ රසායනය. නිසඟී ජනිත කවිනවයෙහි පිහිටා විරචිත හෙයින් පරම විශුඛය. එහෙයින් කොමල විශෙෂණයන්ගෙන් තොරවූ සංඥා නාමාදිය මෙහි විරලය. එහිදු කෙවල පදලාලිත්‍යය ම ගරු නො කොට සාර්ථවත් භාවය හා පදලාලිත්‍යය එකවිට සිදුවන පරිදි මෙහි වාක්‍යයොජනාව කර තිබේ. මෙහි පෙනෙන යෙදුම් වැඩියක් ම ග්‍රන්ථ කතෘගේ සඳප්‍රතිභාණයෙන් විරචිතමුත් පරප්‍රත්‍යය ප්‍රතිඝාකොට ඇත්තේ නො වේ. මෙහි වාක්‍ය යොජනා විධිය පමණක් නොව පදවිධිය ද අනිවිසෘත සංස්කෘත භාෂාව අනුගමනය කෙළේ වේ.

"නිසඤ්ඣ ශොභා විශෙෂ සංසඤ්ඣයෙන් පරම මධුරවූ අම රවති නැමැති මඤ්ජර ලතායෙහි සඤ්ජාත සාම් ප්‍රබුද්ධවූ අමන මකරන්ද සුගන්ධ සම්බන්ධ බන්ධුරවූ" "බෘඤ්ජරක බෘඤ්ජනඤ්ජ සඤ්ඣෙහ නිදානවූ නඤ්ජ පුෂ්කරණ්‍යෙහි ගැලී නහා පිවිත්‍රවූ ශක්‍රදෙවෙන්ද්‍රයෙම කිසිකලෙස්හි චණ්ඩාල කුල ශරීර මල හරිත පූතිගන්ධයෙහි හී" "විවිධ විදග්ධ මුග්ධ විබුධ වධූ ගාඪා ලිඞ්ගන මනොා මහොත්සව පාත්‍රවැ වෙත්‍රම යාත්‍රා කළ" "උදය ශිඛර තිරොඩාන විමුක්ති සම සමය සමුද්ගිර්ණ සෘණී ශ්‍රේණී ශකලිත තමස්තොම සාහස ඇති" "චක්‍රවාලා'නන්තර ලා ඤ්ඣුරිත සහස්‍ර රශ්මි ඇති සූයී විමානොා'දර වර්තිවූ" කිසි කලෙස්හි රජනීකර කර නිකර විගුණීත ශෙවත කාන්ති ශුක්ත විශාල චන්ද්‍රශාලායෙහි ආසතිණ්ණ මුක්තා ශයනයෙහි "හංස චක්‍රවාක චකොාර කොඤ්ච ජීවඤ්ජීවක කපොත පාරා පත කීර ශාරිකාදි නානාප්‍රකාර ස්ථලචර ජලචර පක්ෂීන්ට සැම තුම් ගන්නා නැනක් බඳුවූ චම්පකා ශොකා මුගන්ධිනී ශීත ගන්ධී කණ්ණිකාර සහකාර සාල තාල තමාල වකුල ත්‍රුමුක කුරවක නාලිකෙර සන්නීර පනසා'සන සජී'ජුනාදි විවිධ තරුවර සමාකීණ්ණවූ" "අක්‍රම විවර්තිමා'නාතික්‍රාන්ත නක්‍ර චක්‍රා'කුලවූ" "මාරබල ව්‍යාල කුල විඝෝෂ කෙළීවෙන තෙයවැ ප්‍රණය මධුර කථා'ඝෂ නිඝෂෙප හ්‍රමරාවලියට විකසිත සහකාරසතවකවැ"

ඝනාදී වාක්‍ය ඛණ්ඩයන් දෙස බලන කල ග්‍රන්ථ කර්තෘගේ බුද්ධි වෛසාල්‍යය ද මධුරාර්ථවත් පද ලාලිත්‍ය සංඝටිත වාක්‍ය යොජනායෙහි අතිශයවත් පරිචිතිය ද කල්පනා කටහැකිය. නමුත් ගත්කරුවෝ මේ ක්‍රමය ග්‍රන්ථා'වසානයතෙක් ම නොා ගෙණ ගොස් විවරණකථායෙන් අවසන් කරණලදි. මෙහි ජාතක කාණ්ඩයෙහි දක්වන ලද්දේ පන්සිය පණස් ජාතක යන්හි සාරාර්ථ සංක්ෂෙපයෙකි. තෙවන කොටස මධුරාර්ථවත් කථා පඤ්ජරියකි.

ප්‍රමාණය.

මේ විශිෂ්ට ග්‍රන්ථය සූචිසි විවරණ කථා, ජාතක කථා, සද්ධම්ම වණ්ණනා කථා, යන කාණ්ඩ තුණ්ණින් උපශොභිතය. සම්පූර්ණ පොත මුද්‍රණය කළවිට පිටු සාරසිය විසිපහකින් අධික වේ ය යි සැලකිය හැකිය.

ප්‍රයොජන.

විශුද්ධවූ සම්බුද්ධ ධම්මය, සිංහල ගද්‍යකාව්‍යලක්ෂණය, මධුර වාක්‍යයොජනා විධිය, සිංහල භාෂාව පිළිබඳ වෙනස්වීම්, පුරාතන ඉතිහාස ප්‍රවෘත්ති, චරිත ශොධනයෙහි දැනගතයුතු ජාතක කථා, දිඝ ජාතක කථාවන්ගේ සංක්ෂිප්ත භාවය, නිසරණ ගැන්මෙහි අනුසස්, පැරණි සිංහල වචන, ග්‍රන්ථ රචනායෙහි විශිෂ්ට ආදර්ශී ඝන මේ ආදිය මේ ග්‍රන්ථය ඉගෙණීමෙන් ලැබෙන වැදගත් ප්‍රයොජනයෝ යි.

ශොධනය.

ශාස්තෘජීන්ට හා ධම්මා'භිලාෂින්ටත් විපුල ඵල දැයි මේ ග්‍රන්ථය ශුද්ධකොට ප්‍රචලිත කිරීම මහත් ලොකා'භියකැයි සැලකූ අප විසින් සුලෝදය පරිවෙණා'රක්ෂක **"ශාසනොපකාර"** මහාසම්මතයෙහි ප්‍රධාන ලේකම් ධුරය දරණ, පිරිවෙනට සහ අපටත් ඉතා හිතවත්වූ අප කැපකරු දායක දැනට කොත්මලේ හැදුනාවේ පදිංචිව බෙම්මනොට ඩබ්ලිව්. ඇස්. ද අල්විස් මැදපනේ රිජිෂ්ට්‍රාර් රාළහාමිගේ සාදරා'රාධනය ලෙස පුරාණ පුස්කොළ දහම්සරණ පිටපත් රාශියක් සපයා ගෙණ ඉතා මහන්සියෙන් ශොධනය කරණලදි. පුරාණ ග්‍රන්ථශොධනයෙහි ශොධකයාහට ප්‍රධාන ප්‍රතිඥාව වන්නේ පුරාණ පුස්කොළ පිටපත් සපයා ගැන්ම ය. නාම මාත්‍රයෙනුදු අප්‍රචලිතවූ මේ ග්‍රන්ථය ශොධනය කිරීමෙහි අපට උපකාරිවූ පුස්කොළ පිටපත් සතකි. මහනුවර **සඞ්ඝරාජ පරිවෙණාධිපති** මධුගල්ලේ ශ්‍රී **සුමන ධම්මසිද්ධි සිද්ධාර්ථාභිධාන** මල්වතු මහාවිහාරයෙහි අනුනායක සථිවරපාදයන් වහන්සේ විසින් මා වෙත එවනලද පුස්කොළ පොතින් පිටපත් කළ පොතක් **විද්‍යෝදය මහා විද්‍යාලයෙහි උපාචාර්‍ය** අප හිතවත් **පණ්ඩිත වැලිවිටියේ සොරත** සථිවරයන් වහන්සේගෙන් ලැබුන කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි නිබි පිටපත්කළ පොතත් අපගේ මේ ශොධනයට ඉතා ඉවහල්වූ බැව් කෘතඥතා පූර්වක ප්‍රීතියෙන් ප්‍රකාශ කරමු.

අප සපයාගත් ඒ පිටපත් නවය අතුරෙහි එක පිටපතක් ශ්‍රී විජය රාජසිංහ රජුසමයෙහි ලියන ලද්දකි. තවත් පිටපත් දෙකක් ද අවුරුදු දෙසියයක් පමණ පුරාණය යි සිතිය හැක. අනික් පුස්කොළ පිටපත් සම්බන්ධ කාල නිර්ණය කටහැකි නො වෙතත් අවුරුදු දෙසියයෙන් පරණමය යි පුස්කොළුවලින් හා අකුරු සටහනින් ද සැලකිය හැකි වේ. සපයාගත් දහම්

සරණ පිටපත් සියල්ල අන්‍යොන්‍ය විසදෘශ තාවයෙන් යුක්ත වීම නිසා මේ ශොධනයෙහි මහත් පරිශ්‍රමයක් දරන්නට විය. ඇතැම් පිටපත් ග්‍රන්ථාංශ රාශියකින් ම ඌනව පැවැත්තේය. ග්‍රන්ථ මධ්‍යයෙහි යෙදියයුතු පාඨ රාශියක් ඇතැම් පොත්වල පොත අවසානය පමණ යෙදී තිබුනේය.

ලඞ්කාතිලක රජමහාවිහාරයෙහි පොත සහ **මාකුරාවේ රජමහාවිහාරස්ථානයේ** පොතත් **මඩුගල්ලේ අනුනායකස්ථවිරපාදයන් වහන්සේගෙන්** ලැබුන පෑත හා **සත්තෝරලේ පුරාණ විහාරස්ථානයකින්** ලැබුන පොතත් **මාරඹ පුරාණ විහාර**යෙන් ලැබුන පොත ද **ඔබුගේ** පොත ද **මූලගිරි රජමහා විහාර**යෙන් ලැබුන පොත ද යන මේ පොත් අතර සුළුපටු සමානකම් තිබුනේය. අපගේ මේ ප්‍රථම ශොධනයෙහිදී ග්‍රන්ථානන්තරයන්හි ආ පාඨ අඩොලිපි වශයෙන් යොදා වැඩි පොත්වල තිබුන නිවරැදි පාඨය ග්‍රන්ථයෙහි යෙදිමු. ග්‍රන්ථ කර්තෘතුගේ යෙදීම්ය සි සැලකිය හැකි වැකි බොහෝ පොත් වල නොතිබුනත් පොතේ ශුද්ධ පාඨය ලෙස යෙදුවෙමු. එසේ ම මෙය භාවිතය කරන්නන්හට පහසුවන පරිදි කාණ්ඩ තුණ බෙදූ ආනන්තරමාතිකාවන් ද යොදා සැලකියයුතු වාක්‍ය සංඥා නාමාදිය සටිලා'ක්ෂරයෙන් ද දක්වා පිළියෙල කෙළෙමු.

'දහම් සරණ' මුද්‍රණයෙන් ප්‍රකාශයට පැමිණවූ **නිවේදනය.** ප්‍රථම වාරය මෙය බැවින් සවී නිර්දෝෂතාවයෙහි —— පිහිටුවා ශොධනය කිරීම නොහැකිමය එහෙයින් මුද්‍රණයෙන් පමණක්නොව අපගේ අනවධානත්වය නිසාද ඇතිවූ වරද මෙහි නොමැතිය සි නොකියමු. පොතෙහි අශුද්ධ ස්ථාන ගැටපද විවරණයෙහි ශුද්ධකොට යොදා අඩු ලියා තිබෙන හෙයින් එය බලා පොත්හි අක්ෂර ශුද්ධිය කරගතහැකිසි. එහිදු ඇතුළත් නොවූ වරද අප වෙත යම් හවතෙක් ලියා එවතොත් තව මාස කිපයකින් ප්‍රසිද්ධ කරණ **දහම් සරණ** සම්පූර්ණ ග්‍රන්ථය ශොධනයට මහත් ආධාරයක් වේ. **දහම් සරණ** චිරතිස්ථායිත්වය ලඟදීම ප්‍රසිද්ධ වේ. **දහම් සරණ** ගැටපදය දැනට **මහාජන සභාත්‍රාලයෙහි** මුද්‍රණය කරගෙණ යන බැවින් එයද සුළුපට කාලයකින් ලබාගත හැකිවේ. එසේම පටුන්, ජාතක නාම අනුක්‍රමණිකාදිය සහිත සම්පූර්ණ **දහම් සරණ** විශෙෂ ශුද්ධියකින් ද යුක්තව ලඟදී ප්‍රසිද්ධ කරණ බවත් බලවත් වැදගත් ඉල්ලීම් කිපයක් නිසා මෙසේ ප්‍රථම භාගය ප්‍රසිද්ධකළ බවත් දන්වනු කැමැත්තෙමු.

මේ සත්කෘතියෙහි මූල පටන් ම අපේ උගත් ශිෂ්‍ය වටද්දර මෙධානන්ද තැන බොහෝ උපකාරීව ක්‍රියාකළ බව සමාදර පූර්වකව මෙහි සඳහන් කරමි.

මේ ග්‍රන්ථය බොහෝ මහන්සි දරා ප්‍රිය දර්ශනීයා'කාර යෙන් මුද්‍රණය කරවා ප්‍රසිද්ධකළ අප භිතවත් දායක යෙක් වූ දුන්ට කොළඹ පරණවාඩිය පාරේ පදිංචි ජේ. සිකු රාජපති ආණ්ඩුවේ මිනින්දෝරු මහතාට ද පැරණි පුස්කොළ පිටපත් සපයා දුන් භවතුන්ට ද ග්‍රන්ථය ශොභන ලෙස ඉක්ම නින් මුද්‍රණය කරවා දුන් ඥානප්‍රකාශ ඝනාලයයෙහි අධිකාරී මහතුන්ට ද අප සතුතිය හිමි වේ.

කොත්මලේ,

ධම්මානන්ද ස්ථවිර තෙමේය.

ශ්‍රී බුද්ධ වර්ෂ 2472 ක්වූ නවම් මස පුර පසළොස්වක් තිථිය ලත් ශනි දින කොත්මලේ "ඤානොදය" පරිවෙණ ස්ථානයේදිය.

දහම් සරණ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුධස්ස.

"බුද්ධං සරණං ගච්ඡාමි" දහම් සරණ යෙමි ..... කෙබදු වූ දහම්සරණ ද? යත්:—

අප නිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේ සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සොයා වෙහෙසී අනන්තයෙහි බෝ මැඩැ වප්‍රාසනයෙහි වැඩහිඳැ සව් නේ ගෙවා දත් කෙණෙහි පසක් කළා වූ දහම් සරණ යෙමි" යි දහම් සරණ යා යුතු.

මෙ තැන්හි සත්පුරුෂයන්ට සතෙනාෂ සදහා ඇසුවනට සඛ්‍ගීහ මොක්ෂ සම්පත්නි සදහා අප බුදුරජානන් වහන්සේගේ ගුණ වියත් අවියත් මුළු ලෝ වැසියන් සිත් සනහා අමෘත පරිභොකයක් සේ ගල්වනු සදහා මැතිමි වූ ගෞතම ගොත්‍රයෙහි උපන් මුළු ලොවට අගමැණිවූ ශාක්‍යසිංහ වූ සම්මාසම්බුදුන්වහන්සේ ගේ චරිතය මූල ප්‍රණිධානයෙහි පටන් ඒක දෙශයෙකින් දක්වමි. කණ හුණු දහම් අකුරෙන් අකුරකට අමාමහ නිවන් ම මිළ කොටැ දක්වන්නා වූ ඒ විසමය සහිත වූ චරිතය සිනෙ හැනිවැ ඇසිය යුතු.

සුමෙධ තාපසහු. මෙයට සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් යටැ 2 —— අප බුදුරජානන්වහන්සේ සම්පත්තීන් අනූන වූ, විපත්තීන් සීණ වූ, අමරවර ශරීර සෞඛ්‍යයෙ සාර සම්‍පන්න හා'සිරුම වූ ශරීර කාන්තීන් හොබනා විවිධ විදග්ධ මුග්ධ නර නාරී ගණ නිණ්ණ වූ, "හත්‍ථිශබ්දය අශ්වශබ්ද ය රථශබ්ද ය මෘදඞ්ගශබ්ද ය වීණාශබ්ද ය ගීතශබ්ද ය ශඞ්ඛශබ්ද ය සම්ම ශබ්ද ය තාලශබ්ද ය 3 'කෑව! බොව!' යන ශබ්ද ය" යන මේ දශ්විධ වූ ශබ්දයෙන් සම්පන්න වූ, දුර්නිෂ්ක යක්ෂ ප්‍රලයෙන් අනු'පක්ෂිණ වූ, සුභික්ෂතාව හෙතු කොට ගෙණ නිරුපහතා'හාරපාන සම්පත්තීන් සා පිපාසායෙහි රස නො දන්නා වූ

---

1 මෙණ. 2 මත්තෙහි. 3 එව.

නිත්‍යයෙන් හෘෂ්ට ශිෂ්ට ජන සංසෙවිත වූ, විනෂ්ට දුෂ්ට ජනා
ව්‍යහත වූ, විවිධ වූ පරිඛා ප්‍රාකාර ප්‍රතොලි ආදී නගර රක්ෂාඛග
යෙන් 1 සම්පූර්ණ වූ "**සොමි ය, අමාත්‍ය ය, රාෂ්ට්‍ර ය, දුර්ග ය,
ඛන ය, මිත්‍ර ය, සෙනාව ය**" යන සප්තාඞ්ගයන්ගේ සම්ෘද්ධින්
නිවිසහවූ, "**ධම්මා'ථ කාමමොක්ෂ**" ලක්ෂණ පුරුෂා'ථ සම්පන්න
වූ සදූල සූක්ෂම වූ කර්මාන්ත සම්පාදන ව්‍යග්‍ර සමග්‍ර කාරු ශිල්ප
කුල කෞශල්‍යයෙන් නිර්මාදූමාන වූ අසමාන වූ කර්මාන්ත
සන්තානයෙන් සමාකීර්ණ වූ, "**රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ
ය**" යන **පඤ්චකාමගුණයන්ගේ** සම්වායයෙන් 2 **පඤ්චෙන්ද්‍රිය** සන්
තර්පණයට විහක්ත වූ, විෂය විශෙෂයෙන් පරම මනොහර වූ,
විමල සදූලා'නි සදූල මුක්තාඵලාදි විවිධ රත්නයෙන් සමුද්
ගත වූ, ප්‍රභා සාකල්‍යයෙන් වර්ණ හෙද සම්බන්ධියට පමුණු
වනලද පුර මස්තකා'කාශ දෙශයෙන් ගෙබි සදී කාලික වූ
සෞභාග්‍ය ඇති **කර්ණාට, ලාට, කාශ්මීර, කීර, කම්බොජ,
යවන, චීන, ශබර, බර්බර,** ගුර්ජරාදි නානා දෙශ වාස කවිජන
සමූහ සන්දර්ශිත විවිධ දෙසොච්ච දෙශ භාෂා විශෙෂ සංයොග
යෙන් සුන්දර වූ, "**ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ත චඡ
න්දෝ විචිති, ජ්‍යොතිෂ, ය**" යන ෂඩ්ඞයෙන් ශ්‍රුතවූ "**සාඞ්,
සප්‍රඤ්ඣාමනඕවණ ය**" යන සතර වෙදයන් ප්‍රධාන කොට ඇති
අවෙද්‍ය විද්‍යාස්ථාන සම්බන්ධයෙන් අග්‍රාමය්‍ය වූ, තත්තද් විද්‍යෙ'ප
ජීවින් විසින් නිරන්තර වූ, "**සන්ධි, විග්‍රහ, ස්ථාන'ාසන, සංශ්‍රය,
වෛධිභාව,** ලක්ෂණ වූ ෂාඞ්ගුණ්‍යයන්ගේ කාලොච්ච සථා
නොච්ච ප්‍රයොගයෙහි ප්‍රවීණ වූ රාජ රාජ ව්‍යශන විනාශයෙන්
සඞධර්ම කර්මයෙහි 3 අනුදූසින වූ සත්‍ය ශෞචාචරණ වූ 4
සොම් කුලයාගේ සම්‍යක් පාලන සංවර්ධන වූ පෞර ජනයන් 5
විසින් 6 සතතොද්ගීයමාන වූ ජයශබ්ද සාධුවාද ශත සහස්‍ර
යෙන් සම්මිශ්‍ර වූ, අධර්මයට 'නැත' යන බස කියන්නා වූ සම්ප
ත්තියෙහි 'නැත' යන්නක් 7නො කියන්නා වූ අන්‍යොන්‍ය සහ
යොගවැ පවත්නා ශුඛාඡ්ටකය සේ ඔවුනොවුන් නොහැර
වසන මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් විසින් සමාකීර්ණ වූ, භික්ෂූන්ට
විවෙක **විහාරයක්** බඳු වූ, නාගරිකයන්ට **ශෘඞ්ගාරශාලාවක්**
වැනි වූ, ශිල්පයට **විද්‍යාශාලාවක්** බඳු වූ, අධර්මයට වෙන වෙන
වධ්‍යභූමියක් බඳු වූ, 8 ධර්මාධිකරණ ප්‍රවෘත්තීන් විනිවත්තීන්ත
වූ මාත්සය්‍ය ඇති, මුඹ බෝ මැඩෙහි ගන්නා සර්ෂපතාණුන

1 අඞ්ග.
2 සමාචාරයෙන්.
3 සඞකර්ම පරකර්මයෙහි.
4 වාරයතවූ.
5 ජනපදයන්.
6 සතතොද්ගීර්‍යමාන.
7 යන බසක්.
8 ධර්මයට වෙන වෙන වධ්‍ය භූමියක්.

නැමැති කලාපයෙහි පළමු බිඳුවට හිඳුවූ තෝනැන්න බඳු වූ අමර පුරවරසඳ්තවූ අමරවති නම් රාජධානියෙහි, නිරූපදෙශයෙන් නිවන් ඇති බව සිතාගන්නා වූ සමධිසම්පන්නත්වූ සුඤ්ඤත වූ වයෝ මූනීන්ධර සුමේධ නම් බ්‍රාහ්මණ කුමාර වැසෙන කුල පරම්පරායෙහි පවත් ගෙණැ උදිතොදිත වූ "අධ්‍යාපනා ධ්‍යාපන, යජන, යාජන, දාන, ප්‍රතිග්‍රහණ," ලක්ෂණ සඩඛම්ම කම්මාභිරත වූ සුජාත මවු පිය පක්ෂ ඇති බැවින් ජාතිවාදයෙන් අංකලිඝට වූ මතු ඇතිබවත දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් කෙතුමාලායෙන් බ්‍යාමප්‍රභායෙන් මනොහර වූ බුඩිවිලාශ වෛචිත්‍රයයට ගත් වැටිසනක් බඳු වූ අවයව සම්පත්තීන් මනොහර වූ කුඤ්ඤ චන්ද්‍රිකා කුමුදෙ'ඳු වරුදි වූ සිසලු මධුර වසතුන්ගේ සථානොචිත විනිඝසයෙන් මනොඝපරිනාමයෙන් නිපජනා වූ රූපයක් සේ ජන නයන මනොරඤ්ජ නෙක රසායන වැ අනන්‍ය සාමාන්‍ය වූ සෞභාග්‍ය භාග්‍ය දෙදෙනාගේ යමක ප්‍රසවයක් සේ ලොකොත්තර වූ පවිත්‍ර චිත්‍ර චාරිත්‍ර විශෙෂ පාත්‍ර වැ

"ඍග්, යජුඃසා'මන්," යන වෙදත්‍රය විශුඛ බුඩි ප්‍රභාව භාවිත වූ චිත්තොත්පාදමාත්‍රයෙකින් ශ්‍රී හස්තාතල කලිත කොමලාමල බාල පල්ලවාදි විලාසයෙන් නිඝතුඝ කොටැ නිඝණ්ඨක වැ දැනැ වදුරා විශිෂට ශිෂට ගොචර වූ චතුඃෂෂ්ඨි කලා හා අෂ්ටාදශ විද්‍යා ස්ථානයන්ගේ ගුණ්ඩස්ථාන නැමැති ජීර්ණ පණ්ණපුට යමෘති නාරුච නිපානයෙන් විදූ කොවිදූ කොටැ දැනැ ඒ ඒ විද්‍යාවිෂයයෙහි අවිචාරඥ වූ ආචාර්ය්‍ය භාවයට පැමිණැ උන්නාත වූ කුලයෙන් විමල වූ ශීලයෙන් නව යුවති ජන මනොහරෙක හෙෂජාඝමාන වූ සමාන නවයෞවන සම්පත්තීන් ලොකොත්තර වැ අමරවති නැමැති පියුම් විල්හි විරාජමාන රාජහංසයක්හු සේ අමරවති නැමැති විශද ශරදුකාශ හඞීයෙහි දෙදීප්‍යමාන වූ ශාරද චන්ද්‍රමණ්ඩලය සේ ලොකොත්ත්‍ය වෛක කාරණ වැ අමරවති නැමැති විකසිත 1 කමල ගඞීයෙහි සුජාත වූ කණ්ණිකාවක් සේ නිසඝිහ ශොභා විශෙෂ සංසඝිගයෙන් පරම මධුර වැ අමරවති නැමැති මඤ්ජර ලතායෙහි සඤ්ජාත වූ 2සාම්ප්‍රබුඩ වූ 3 අමන මකරන්ද සුගන්ධ සම්බන්ධ බන්ධුර වූ කුසුම සතවකයක් සේ සකල ලොක ලොචනාභිලාදක වැ අමරවති නැමැති අප්‍රතිමල්ල වෙසුල්ල පඨිනොදරයෙහි

1 විකව. 2 සාම්ප්‍රබුඩවූ. 3 අමරණ.

ප්‍රවර්තමාන වූ වර්ෂශත රෙවර්ෂශත සම්භූතපරිශත මරීචි මාලා සමාකුල වූ ලොකාභවර්තනි චක්‍රවර්තිනි **නරවර** හොගය වූ **මහා මණ්ඩලනාගයක්** සේ ලොක බහුමාන භාජන වැ අමරවති නැමැති ගඩ ගජ කුම්භයෙහි සඤ්ජාත වූ සර්වදෘෂ්ට විනිර්මුක්ත මුක්තා ඵලයක් සේ නිරුපඩි මධුරලඤ්ඡම් නිවාස වැ සර්වලොක 1 සම්භාවනා භාජන වැ වෙසෙමින් තමන් වයසින් බාලව ද ඥානයෙන් වෘධාවස්ථායෙහි, මවු පිය දෙ පක්ෂයෙහි ඇත්තවුන් ප්‍රලය සමය දිවසකර කරෝ'පලුපත තුහිර බිඳු වයයක් සේ දුර්වාර මාරාභඩකාර ගොචර වැ කථාශෙෂ වූ කල්හි නානා ද්‍රව්‍ය ගණ සම්පූර්ණ කොෂ්ඨාගාර රක්ෂණ ලක්ෂණ ව්‍යාපාර **නිරන්තරාමාත්‍යවරයා** අවුත් සිටැ භකති භාරාවනත හසත ඇති වැ නිජ මස්තක විනාසත ශ්‍රී පාදෙත්තමංසයෙන් සළලී කෘත ප්‍රාණ ලාභ ඇති වැ වැඳැ නැඟි සිටැ පරමාදර දක්වා "සාමිනි! සාමි දරුවන්ගේ මවු පිය දෙ පක්ෂයෙහි ඇත්තවුන් වහන්සේ සවර්ගසථ වූ 2 බැවින් සාමි දරුවන් විසින් මේ කුලක්‍රමානුගත වූ මහාවසතු සමන්වා පිළිගත මනා වේ ද?" යි අම්ශ්‍ර සපත රත්නාදී නානාවිධ ද්‍රව්‍ය සම්භෘතයෙන් සම්පූර්ණ වූ භාණ්ඩාගාර යෙහි දෙර හරවා "මේ සාමීන්ගේ මැණියන් වහන්සේගේ පක්ෂයෙන් නිබි ඇ ධනය, මේ පියානන් වහන්සේගේ පක්ෂ යෙන් නිබි ඇ ධනය, මේ ධන සම්භාය වූ නියා සාමීන් සේ වූ ව්‍යවසථිත අය වියදම සඳරූප දන්නා කෙණෙකුන් තබා අනවසථිත වූ කෙණෙකුනුදු කැමැති ලෙස වියදම් කරත් එන් පුරුෂාශ්‍රයෙනින් නිමවාගත නො හැක්ක. එහෙයින් සාමීන් විසින් මෙබඳු මහා ධන රාශියගෙණැ "**ධර්මාර්ථ, කාම, මොක්ෂ,**" යන චතුර්විධ පුරුෂාර්ථයෙන් අභිමත පුරුෂාර්ථයක් සාධා වදාළ මැනවැ" යි දැන් වූ කල්හි

"යහපතැ" යි පිළිගෙණැ දැනාදී වූ කුසල් කෙරෙමින් කල් යවා එක් දවසක් අප වැන්නනුදු නිවන් දකුම්හ යි සිතුව මනාකල්හි, සසර වැනි මහා භීෂයකට දහම් පිළියමක් පැවැත්වුව මනා කල්හි; සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් අමා මහ නිවන් වැදූ3 සැනහුන මනා කල්හි, ත්‍රිභුවන මර්දන යෙහි නිරන්තර තත්පර වූ **වසවර්තිනිමාරයා** අවශවර්තීනී වැ සටන් බිමින් පැරැදූ පිට හඹ හඹා දිවුව මනා කල්හි, **කෘෂ්**

1 සහාජන. 2 පස්ස එබැවින්. 3 දැක.

ණා ය, අරහතිය, රහායය, යන මාර සත්‍රුන් තුන් දෙනා මුහුණ දැලි ගැවුණ මනා කල්හි, මේ කපැ නමත් ඇතුළු වූ පස් බුදු කෙණෙකුන් වහන්සේ විසින් හෙබැවි **භද්‍රකල්පය** යන නම් 1 ලද මනා කල්හි, පිය වූ **සුදොවුන් මහරජානන්** සේසත් යටැ හෙවැ රහත් වැ පිරිනිවන් පැ අමාමහ නිවන් 2 දුටුවා මනා කල්හි, වැදූ මැණියන් වහන්සේ සත් දවසෙනින් මියැ දෙව් ලෝහි දිව්‍ය පුත්‍ර වැ ඉපි දැ **සමාමහ පෙළහර** කොටැ තුන් පියවරකින් **නව නිසා** වැඩැ **පණ්ඩුකම්බල සිලාසනයෙහි** වැඩහිඳැ වදුරන්නා වූ **විජයී** අසා අමාමහ නිවන් 3 සෙවූ මනා කල්හි, මුළු ලොවට වූ මරණ භය නසන නුනුරුවන් රැක වරණ පස්වා දහසකට පැවැත මනා කල්හි, පිළිසිඳැ ගත් නුවර ය, උපන් උයන ය, සත් පියවර එබූ තැන ය, වැඩසිටැ කළ සිංහනාද ය, කාළ දෙවලයා මුදුනෙහි තුබූ පෘෂ්ඨය, වප් මඟුලෙහි වැඩහොත් තැන ය, නො හැරී ගිය දඹ සේය ය, එකුන් නිස් හවුරුද්දක් හිඳුවූ ඇඹෙණියයෝ ය, ලද පුතනුවෝ ය, කෙළි උයන ය, දුටු පුළුනිමිති ය, නැඟි අසා ය, නික්මුණු සමය ය, සහිතව ම හැරුණු දොර ය, රැ ගිය ගමන ය, පෙරළා බැලූ නුවර ය, පිනූ ගඟ ය, වැඩසිටි වැල්ල ය, කැපූ හිස කෙහෙය, හළ මළසළු ය, පිළිගත් අට පිරිකර ය, සිහාවන් ගම ය, සාවුරුද්දක් කළ මහා වියෂ්ය, මෙහෙ කළ **පස්වග මහණ** හ, කිරි පිඬු පිළිගැන් වූ **සුජාතාවෝ** ය, වැඩහිඳැ පිළිගත් නුග ගස ය, පිළිගෙණැ වැඩැ පැන් සැනහූ නොට ය, වැඩහිඳැ වැළඳූ කිරිපිඬු ය, ගඩහායෙහි හළ පාත්‍රය ය, දහවල් විසූ සල්වනය ය, බුදුවන දා පිට දුන් බෝ රුක ය, වැඩහුන් වප්‍රාසනය ය, **පන පන** හෙළා ලුහු බැඳවූ මර ය, මඟුල් මෙනෙ කළ දිව්‍ය බ්‍රහ්මයෝ ය, තුන් යම්හි ලද තුන් විදුව ය, අරුණෝදයයෙහි ලද සම්බුධරාජ්‍යය ය, වැඳැ ගෙණැ හොත් ඇතා ය, සක්වත් කළ සක්මණ ය, දෙව් ලොවින් බට හිණ ය, උපස්ථාන කළ මනැතා ය, 4 මිනි පිළිගැන් වූ වදුරා ය, දරණ ගැබැ වඩා හිඳුවූ නයා ය, දකුණත් සව්වන් වහන්සේ ය, වමත් සව්වන් වහන්සේ ය, වැදූ මැණියන් වහන්සේ ය, සඟිසට වූ කල පිරිමැසූ බාල මැණියන් වහන්සේ ය, සෙනසුන් හැමදි වගන්සේ ය, වෙහෙර කරවූ සිටානෝ ය, උපස්ථාන කළ උපාසිකාවෝ ය, වැඩ හෙවැ පිරිනිවන් පැ සල්වනය ය, ශරීරයෙන් විසිර ගිය ධාතු ය, වැළඳූ පාත්‍රය ය, පියවර එබූ තැන ය, යනාදියෙන් නම් **පමණක්** එක විටෙක ද

1 වුව මනා කල්හි. 2 දුටු මනා කල්හි, දුට මනා කල්හි.
3 නිවන් රැසවුවමනා කල්හි, 4 මී පිඬු.

සැදුහැයෙන් නුඩැ වකාපුවන් එකහෙලා නමන් වන් අමා මහ නිවනට ම වන මනා කල්හි, "මෙවැනි යක් බිමෙක අප වැන්නන් පවා සිඛාඊ කුමාරයන්ගේ 1 ගැත්තම්හ" සි නො බා සුව සේ විසුව මනා කල, සතර අපාය හිස් වුව මනාකල, දෙව් බඹ ලෝ පිරුණ මනා කල, යහන්හි වැඩැ හිඳැ මේ බදු සිතක් සිතා වදුලෝ ලු!

ඒ සවාමි දරුවානන් සිතූ පරිදි කියමි :-

2 ඔහු එක් දවසක් සකල 3 සමෘඩින් ප්‍රසාදකර වූ ප්‍රාසාද යෙහි අතුල වූ මහාතෙලෙහි පළක් බැඳැ වැඩහිඳැ "මේ සංසාර යෙහි සිටි සත්ත්වයහට ජාතියෙන් ජාතියෙහි පිළිසිඳැ පෙරළිම් නම් ඉතා දුක. ජානයහට වන්නා වූ ජරාව ද ඉතා දුක. ජීණී යහට වන්නා වූ මරණ නම් ඉතා දුක. මම ද ජාති ජරා ව්‍යාධි මරණ දුඃඛයෙන් අවුකතවැ සිටියෙමි. එසේ වූ මා විසින් අජර වූ අමර වූ ක්ෂෙම වූ ශාන්ති පුරයට වැද නිවි සැනහෙනු මැනව. මේ මා උසුළන මනුෂ්‍ය ශරීරය මොහයෙන් මනොහර වැ වැටහෙන බව මුත් අසුචියෙන් අසුචි වදනේ ය. අසුචියෙහි පිහිටි අසුචි ඇත්තේ ය. ඇතුලෙහි පිරී ඉතිරෙන අසුචි ම නික් මෙන්නට නියනවැ තුබූ **නවදොරක්** ඇත්තේ ය. නො එක් කුලෙහි පණුවන්ගේ ඉපදීමට **නිබ්බිගෙය** ය. අසුචියට **මඩ්ඩෝරගෙය** ය. මරණයට **මිනීගෙය** ය. සැවයට **අමුසොහොණ** ය. නමාගේ ශරීරයෙන් හළ නො සකස් නමා ම බලාත් නෙමේ නමහට පිළිකුල් එළවන්නේ ය. මෙසේ අසුචි වූව නෙමේ දුඃඛකාරණය නොවෙයි යත් :- එසේ ද නො වේ මැයි; සියලු දුක් පිරූ නිධානය වැ සිටියේ ය. මරහට එක ගොදුරු වැ සිටියේ ය. නුවණ වැඩි වැඩි සේ වඩා වඩා ම පිළිකුල් වැ පැණෙන බව මුත් කිසි ගතයුතු දෑයක් නැත්තේය. මෙසේ වූ මේ ශරීර භාරය උසුළා ඇවිදුනා සෙසු අඥන සත්ත්වයන් සේ මම ද මේ බරුසුළා ගෙණැ ඇවිදිම් නම් ඒ මා වැනි විඥනක් හට සුදුසු නො වෙයි.

මෙ ලොවෙහි දුක් නම් දෙයක් ඇති කල්හි, එයට ප්‍රතිපක්ෂ වූ සුව නම් දෙයෙක් පැණෙයි. අකුසලයට ප්‍රතිපක්ෂ වූ කුසල නම් දෙයෙක් පැණෙයි. ශරීර සන්තාප කර වූ භූණක් පැණෙන කල එයට ප්‍රතිපක්ෂ වූ සිනලයෙක් ප්‍රත්‍යක්ෂයෙන් ම

1 ඉණදතුම්හ සි. 2 එවුහු. 3 සකලසමෘඩි සිඹින්.

පැණේයි. මේ අනුමානයෙන් ම මෙසේ මහත් වූ සංසාර දුඃඛ යක් ඇති කල්හි එයට ප්‍රතිපක්ෂ වූ නිර්‍වාණසුවයක් නම් අවශ්‍ය යෙන් ම ඇත මැනව, අසුචි වළෙක්හි හුණු පුරුෂයන්හු මේ අසුචි සෝධන්නට සුදුසු වූ සුගන්ධ සිතල ජල හරිත වූ මහ විලක් බල බලා තමාගේ ශරීරය ශුඛ කොටැ නොගණුත් හොත් ඒ පුරුෂයාගේ අපරාධ බව මුත් විල්හි අපරාධයෙක් නොවෙයි. තව ද විවිධාශුබ හසන වූ සතුරන් විසින් පිරිවරණ ලද පුරුෂයෙක් තමා ගැළවී යන්නට සුදුසු සෙම මාර්ගයක් බල බලා ගැළවී නොයේ නම් හේ පුරුෂයාගේ අපරාධ බව මුත් මාර්ගයෙහි අපරාධයෙක් නොවෙයි.

තව ද, මහව්‍යාධීන් ආතුර වූ පුරුෂයෙක් ඒ ව්‍යාධි ශාන්තියට සුදුසු වූ අෂ්ටාඞ්ගායුර්වේදයෙහි දක්ෂ වූ වෙදක්හු ඇති බව දැනැ දැනැ ඔහු කරා එළඹැ තමාගේ ව්‍යාධියට ප්‍රතිකාර කරවා නොගණී නම් ඒ ආතුරයාගේ බාලමොහ බව මුත් වෛද්‍යයාගේ බාලමොහ බවෙක් නොවෙයි; එසේ ම මම ද මෙබඳු වූ මහා සංසාර ව්‍යසනයෙහි සිටියෙම් ඒ සංසාර ව්‍යසනයට ඒකාන්ත ප්‍රතිපක්ෂ වූ අමෘතමහා නිර්‍වාණයක් ඇති බව දැනැ දැනැ සුදුසු වූ මාර්ගයෙකින් එයට වැද නොසැනහිනිම් නම් මාගේ ම දෝෂ බව මුත් ඒ අමෘතමහා නිර්‍වාණයෙහි දෝෂ නොවෙයි.

එ සෙයින් ම මා විසින් සුචිකාමී වූ පුරුෂයන්හු තමා ගෙලෙහි බැඳි සර්පකුණපයක් කඩා හැරී සුව සේ යන්නා සේ මේ කුණප ශරීරය හැරී සුව සේ අමාමහ නිවන් සෑහිය යුතුය. තව ද, මහාසමුද්‍රයෙහි යාත්‍රාකරණ්ඩු කැමැත්තවුන් දැදුරු වූ නැවක් හැරී අභිනව නැවක් ගන්නා සේ මේ සංසාර සාගර යෙහි ගැලෙන්නා වූ නව චිර්‍ද්‍ර වූ ශරීර නැමැති නැව හැරී අමාමහ නිවන් නැමැති සෙම නොඉකාව ආශ්‍රය කරණ බව සුදුසුය. මහඇහි බඩුවක් ගෙණැ සොරුන් හා එක්වැ යන පුරුෂයන්හු සොරුන් විසින් ඒ බඩුවට අනතුරුයෙක් වේ දෝ හෝ යි යන භයින් 1 සොරුන් කෙරෙන් දුරුවැ යන්නා සේ මා විසිනුදු සසර පමණින් ලුහු බැඳගෙණැ දුවන්නා වූ මේ ශරීර නැමැති මහසොරහට වැළැහී අමාමහ නිවන් මහින් ගැළවෙනු සුදුසුය; මේ මා විසින් අනුභව කරන්නා වූ ධන රාශිය රැස්කළා වූ මවු පිය දෙ පක්ෂයෙහි ඇත්තෝ පරලොවට උපකරණ 2 පිණ්ස යි එස් කාවණුවකුදු නොගෙණැ අනාථ

1 ඔවුන් කෙරෙන්. 2 උපකාර.

ගමනින් ගියහ. ඔවුන්ගේ මහා අඟුන් විජෘම්භනය ය. මා විසින් වූ කලී මේ ඔන රාශිය ඉත සඟස්‍ර ගුණයෙන් එඩා **අමෘත මහා නිර්‍වාණාධිගමය** කොටැ ජාතියෙන් ජාතිය ගෙණැ යන බව ම සැදුස්සයැ" යි මෙසේ නිසි උපදෙශයක් නැති වැ සත්ත්‍වයා ඇතය හටගත් අඬුරයක් බදු වූ අසාධාරණ ඇත මහිමයෙන් සංසාරයාගේ අසාරථය ද, ශරීරයාගේ පිළිකුල බව ද, නිවන් මහිරි බව ද, නිවනට මාර්‍ගයක් ඇති බව ද, 'ඔන' නම් දෙය පසු පස්සෙහි ජාතියෙන් ජාතියට නො ගෙණැ යාහුතු බව ද, එසේ ගෙණ යාම ද දැනයෙහි යෙදිමෙන් සිඩවන බව ද, දැනැ වදුරා 'කරම්හ' යි නිශ්චය කළ කටයුත්තෙහි නමන් වහන්සේ මුත් අනික් තත්පරවැ කරන්නට සැදුස්ස උත්සාහ සම්පත්තියක්- පරාක්‍රම සම්පත්තියක් ඇත්තවුන් නැති හෙයින් ඒ වේලෙහි ම අනිමත වූ සෝඵ පරාඵ සිඩිය පිණිස, එ කල්හි රජකරන්නා වූ රජ්ජුරුවන් කරා එළඹැ :-

"මහරජ! මේ භවය නම්:- **රාගය, ද්වේෂය, මෝහය,** යන අජල 1 නිර්‍වාපණීය වූ අමාතු ශමණීය වූ අනෞෂධ සාඛ්‍ය වූ **මහා වහ්නි ත්‍රයයකින්** ආදිපනවැ සිටියේය. අඟුන වූ මේ සත්ත්‍ව යෝ මුත්හරෙක යන බුඩින් ඝොරවිෂ වූ සප්පයකු ගන්නට උත්සාහ කරන්නවුන් සේ සකල දුඃඛ නිධාන වූ පඤ්චකාම ගුණයන්ගේ අනුභව කිරීමෙහි තත්පරයහ, **මිහිකුයෙන්** සිතල සලිල පානයට දෙහොත් දින් කරන්නවුන් සේ දුඃඛ ශූන්‍ය වූ සංසාරයෙන් සුව අනුභව කරමින යි සිත් දි සිටිය හ. අමිත්‍ර වූ දුඃඛය ම සුඛ ය යි කියා කල්පනාකොටැ අසාර වූ වස්තුයෙහි ම සාර වූ බුඩියෙන් පෙළී අසුචියෙහි සුචි සංඥාවෙන් ආතුර වැ අනවරතයෙන් පිඩිතයහ. මේ සංසාරයෙහි සඞ්‍රූප නිරූපණය කරණ ප්‍රඥාසම්පන්නයහට අනික් එසේ වූ චිත්ත ඛෙදකාරණයෙක් නො පෙණෙන්නේ ය. මෙලොව වැස්සා අනුභව කරණ සුඛයෙක් ඇත් නම් හෙ ද **විපරිණාම දුඃඛය,** උපෙක්ෂා වෙදනාව **සංස්කාර දුඃඛය,** දුඃඛ වෙදනාව **දුඃඛ** හෙයින් ම දුඃඛය.

මෙසේ කල්හි තත්ත්‍ව විචාර ලොලයහට අසුචියෙහි චඤ්චල සඞ්කායෙන් නැත්තා සේ මේ සංසාරයෙහි සුචි සඞ්කා යෙක් නෙම නැත, **අච්ඡ භාවිත** චිත්ත සන්තාන ඇති සත්ත්‍ව යාගේ "මූ අපගේ අඹුවෝ ය, මූ අපගේ දරුවෝ ය," යන යම්

2 අවල, - අවාල.

තෘෂ්ණාවක් ඇත් නම් හෙද සත්ත්වයා සසරින් ගැලවී යා නො දෙන මහාපාසයෙක. මොහ මධුර වූ මේ නව යෞවන ශ්‍රීතොමෝ ජරාව හා සෙසාසෙසි යුධයෙහි පරාජයට පැමිණෙ ආ බව මුත් ජයක් නො ලත් විරූ වෑ, ප්‍රයත්න ශත ගුප්ත වූ ජීවිත යද මරහට කබල නො වැ නො ගැලවුණු විරිය.

කිසිකලෙක්හි මතැතුන් කුඹුපලා මුතු පිරා සත මෙදස් අනුභව කළ සෙශර සිංහරාජයෝ කාලානන්තරයෙක්හි ග්‍රාමා නන්තර පරිඛායෙහි අශුචි ද්‍රව පානයෙහි නත්පර වැ සඒ ලොක පරිභූත වූ ක්‍රියායෙන් ගහීාසපද වන්නාහ.

දසැහිල්ලක් නැතිමෙන් දසදහසක් සක්වළ එකාලොක කළ දෙලොස් යොදුන් ශරීර ඇති මහාබ්‍රහ්මයෝ කිසිකලෙක්හි ගුඤ්ජාඵලමාත්‍ර වූ ශරීර ප්‍රදෙශයෙහි සඤ්ජාත වූ වියනක් පමණ නැන්හිදු ආලොක නො පවත්වන්නා වූ පරිත්ත ප්‍රභා සංයොගයෙන් සකල ලොක පරිහාස්‍ය වන්නාහ.

කිසි කලෙක්හි වෘතූරක බෘහූ, නානා සඤ්ඤ නිදන වූ නානා පුෂ්කරණියෙහි හැළී නහා පවිත්‍ර වූ ශක්‍රදෙවෙන්ද්‍ර නෙම කිසිකලෙක්හි චණ්ඩාල කුල ශරීර මල හරින වූ පූති ගන්ධ යෙහි 1 හී ඓශ්වර්‍ය්‍ය ක්‍රීඩාභියොග ව්‍යවෘත වැ නමා සුඛිත යන් කෙරෙහි ඇතුළත් කොටැ සිතන්නේය.

කිසිකලෙක්හි විශද ශරදකාශයෙහි විප්‍රකීර්ණ තාරාගණ පරිවාරයෙන් ශුක්‍රතවැ සම්පූර්ණ වූ චන්‍ද්‍රමණ්ඩල ගතවැ විවිධ විදග්ධ මුග්ධ විබුධ වධූ ගාඪාලිඞ්ගන මනොං මහොත්සව පාත්‍රවැ වෛභ්‍රාජ යාත්‍රා කළ චතුර්දිව්‍යසුත්‍රඝා ද පවා කිසි කලෙක්හි තමා ම තමහට බැඳි කෝටු මිටි යට පණුවැ ඉපැදී හොත් තැනින් සෙල් වී ගත නො හී අනය ව්‍යසනයට පැමිණෙන්නේය.

කිසි කලෙක්හි උදය ශිඛර නිරොඛාන විවූකති සමසමය සමුද්ගීර්ණ ඝෘණී ශ්‍රෙණී විශකලිත නමසෙනාමසාහස ඇති චක්‍රවාලානන්තරාලාඳ්‍ය' පූරිත සහස්‍ර රශ්මී 3 ඇති සූර්‍ය්‍ය විමානොදරවර්තී වූ සූර්‍ය්‍ය දිව්‍යසුත්‍රඝා ද පවා කිසි කලෙක්හි

---

1 පූති ගාත්‍රයෙහි- පූතිගන්ධයෙහි. 2 බද 3 රශ්මී සහස්‍ර.

පූතිමාංසයෙහි කෘමිවැ ඉපදෑ ඒ මාංසය වියලෙන පිණිස දෙරෙහි වැනූ කල්හි අනික් සූයඝ්‍යක්ෂගේ රශ්මීන් වියලී ප්‍රාණ විනාශයට යන්නේය.

තව ද, දහසක් යොදුන් ආතමභාවයෙන් සුවාසූ දහසක් යොදුන් ගැඹුරු සාගරයෙහි ජලක්‍රීඩා කළ **ආනන්ද මහාමනෂ්‍ය** යා සේ වූ මහාමතස්‍ය රාජයෝ පවා කිසිකලෙක්හි ගෝකුර යෙහි වටැ වැසි දියත්තක් නිසා ජීවත්වැ ඒ දිය වියලෙන කල්හි ඒ හා කැටිවැ වියලී ප්‍රාණ විනාශයට පැමිණෙන්නා වූ ක්ෂුද්‍ර ප්‍රාණී ජාතීන්වත් ඇතුළත් වැ මහදුක් අනුභව කරන් නාහ.

තව ද, පන් සියයක් යොදුන් මහ ඝිඹුල් රුකින් නැඟි ප්‍රබල පක්ෂවාත ප්‍රහාරයෙන් 1 සාගර ජල සකාඛය දෙ බේ කොටැ නා ගොජ්‍රරු 2 හත් ගුරුළු රජහු කිසිකලෙක්හි තනුතර ශරීර ප්‍රමාණ වූ නිලමැසිවැ පූති ගාත්‍රයෙහි හොත්තා වූ ගැඩහුල් ආදිනුදු හොත් තැනින් සොල්වා ගත නොහී ඒ වලෙහි හඬ හඬා අමෙඛ්‍ය ගොචර ග්‍රහණයෙන් 3 වරිතාර්ථී වන්නාහ.

තව ද, කිසිකලෙක්හි සතර මහාවිපයෙහි එකාන පතු රාජ්‍යය කරණ පිණිස මෙහෙකරු රජදරුවන් විසින් ශිබා වට වැඩූ මිණී වොටුහු ඇති රජදරුවෝ කිසිකලෙක්හි සෝම් දරුවන් විසින් විලුම් පහරින් නළා හිසට නගන ලද දරම්පි ඇදූ මහදුක් අනුභව කරන්නාහ.

තව ද, කිසිකලෙක්හි රජනීකර කර නිකර සංයොග විඝුණිත ශෛවත කාන්ති යුකත විසාල චන්ද්‍ර ශාලායෙහි ආසනිණිණ මුකතා ශයනයෙහි යෙහෙන් නිදූ 4 පුබුදුනා මහාභාග්‍ය ඇත්තෝ ද කිසිකලෙක්හි අනලප කල්ප කාලසම්භූත මහොඝ විසමය වූ ඝුණුභළු නරකයෙහි හළුයෙහි හී පැලහී දුක් සහ වෙදනා සහස්‍ර භාජන වන්නාහ.

තව ද, කිසිකලෙක්හි උතසව 5 ශෘඞ්ගාර පිණිස ලෙහි ලූ මඤ්ජර කුසුම භාරය පොවා ක්ෂමා කොටැ ගත නොහෙන්නා වූ කොමල වූ දිව්‍ය ස්ත්‍රීහු කිසිකලෙක්හි තුන්ගව්

---

1 ප්‍රබල පක්ෂ ප්‍රහාරජන. 2 ගොදුරු. 3 වරිතාර්තම.
4 පුබුදිනා. 5 ශ්‍රීහාර.

පමණ යමපලුන් 1 වෙර හී නගා හෙළාලිය නො හෙන ගිනි ගෙණැ දිලියෙන යපොරෝ පහරින් කිළිල් කඩක් සේ දෙ පලු කරණ ලද හදවත් ඇත්නාහු කම්ම බලයෙන් නො මියා මහදුක් අනුභව කරන්නාහ.

තව ද, කිසිකලෙක්හි ගණනක් පමණ සත් රුවන් හිණැ කිප පෙති ගණනක් මැඩැගෙණැ තමන්ගේ ප්‍රාසාදයට නැඟි මෙහි බැස්මෙහි විඩාවන 2 මහ ඉසුරෝ කිසිකලෙක්හි මහා නරකයෙහි ශතයොජන ප්‍රමාණ අඞ්ගාර පර්වතය මැඩැගෙණැ යමපලුන්ගේ නියොගයෙන් අනෙක ලක්ෂ කොටි වර්ෂ සඞ්ඛ්‍යා යෙන් නැඟි බැසැ නො විඩා වන්නාහ.

තව ද, කිසිකලෙක්හි කැටුවැ දිය කෙළියට බටුවා වූ දිව්‍ය ස්ත්‍රීන්ගේ රතෙනාත්පල ගඤ්ඤ සේ කොමල වූ අතීන් විදුනාලද ජලධාරාව පවා තමන්ගේ ශරීරයට කර්කශ කොටැ සිතන දිව්‍ය පුත්‍රයෝ කිසිකලෙක්හි ක්‍රූර වූ යමපලුන් බැරහී ගෙණැ කපක් දවස්තැවී තුබූ නාඹතල් කඳ සා ලොහොදිය ධාරා ඉසැ සිටැ දෙපල්ලට නමත්ද මින් විරෙමින් බැහැ හඬින් හඬමින් මහා දුක් ගන්නාහ; එහෙයින් මහරජ! මේ සසර ඉතා 3 අව්‍යවසීතය; ඉතා භයඞ්කරය; ඉතා සාදීනවය; ඉතා අසාරය; ඉතා ව්‍යාකුලය; ඉතා දිගය, ඉතා එතරවිය නො හැක්කේය.

තවද, මෙ සසරෙහි කිසි කලෙක්හි ගෞරව පාත්‍ර වූ මවු වූවෝ කිසි කලෙක් හි නිලීජා වූ ශාඞ්ගාර වෙහාවට පාත්‍ර වූ අඹු වන්නාහ; තවද, කිසි කලෙක් හි සත්කාර භාජන වැ වැඳැ පිදුවන්ට අමා මහ නිවන් දෙන පරිද්දෙන් පිය වූවෝ කිසි කලෙක් හි පුත් වන්නාහ. කිසි කලෙක් හි පසින් පැවා හිසින් කරණ ගැනිවූ වෝ සමහර කලෙක් හි තමන් හුන් පත හිසින් දම්වන සොඬ්දරු වන්නාහ. මෙ සසරෙහි සිටි සියලු සත්ත්වයා "ලාභ ය, අලාභ ය, අයස ය, යස ය, නින්දා ය, ප්‍රශංසා ය, සුඛ ය, දුඃඛ ය" යන අෂ්ටලෝක 4 ධර්මයෙන් හෝ විනොදමා ගම්දරුවන් අත හුණු කෙළි පෙදක් සේ සසර පමණින් ව්‍යාකුල කරණ ලද්දහ.

---

1 බැරඟි. 2 මහ ඉසුරුවෝ. 3 අභ්‍යවසීතය. 4 ධර්මයන් හොඳසේද.

එහෙයින් ම මෙ සසරෙහි ආදීනව දුටු මම අසුරක් ගසන කලුදු එහි සිටිනා නො කැමැත්තෙමි. එහෙයින් මා විසින් මෙ කී සකල දුඃඛයෙන් අසම්මිශ්‍ර වූ ශාන්ත වූ ප්‍රණීත වූ අමෘත **මහානිර්වාණයට** වැදූ නිවී සැනහී සඟළුය සිඩ කොටැ සුවපත් වනු සුදුසුය; එහෙයින් මහරජ! මා සතු වූ අනෙක කොටි සඩ්ඛ්‍යාතවූ ධන ඇති. දෙවඟන්වහන්ස! ඒ පිළිගත මැනවැ"සි දන්වා:-

ඒ අසා විස්මය ප්‍රාප්ත වූ රජ්ජුරුවන් විසින් "තොප ගේ ධනයෙන් අපට ප්‍රයොජන නැති. තෙපි ම තොපට අභිමත යක් කරව! සි කී කල්හි 'යහපත දෙවසිනි!' සි ගිවිසැ නුව රෙහි බෙර ලවා අනෙක දිග්භාගයෙන් ආ1 යාචක චාතක සමූහයා සඟකීය ධන ධාරා නිපාතයෙන් සන්තුෂ්ට කොටැ සකලාර්ථ ජන නියමාන ධන සඤ්චයාගේ අනි බහුත්වය හෙතු කොටැ ගෙණැ අක්ෂය බලා, 'ධනක්ෂයයෙහි මහණ වෙම් නම් ආයුෂ්කල්පය ක්ෂයවන බව මුත් ධනක්ෂය නොවෙයි, සිතා කැමැති යාචක කෙණෙකුන් මේ ධන ධාන්‍ය රාශිය කැමැති පරිද්දෙන් ගත මැනවැයි **නිරගණිල සඤ** ඝොෂ කරවා නානා ප්‍රකාර ද්‍රව්‍ය ගණ සම්පූර්ණ භාණ්ඩාගාර චාර විවෘත කරවා, තමන් වහන්සේ ප්‍රබල දෘඪානල 2 සරහස සම්පාතයෙන් සංදහ්‍යමාන වූ වෘක්ෂ වල්ලිගුල්මාදි සංකීර්ණ වූ වන ගහණයෙකින් දුහාතිරේකය ක්ෂමා කොටැ ගත නො හී ක්ෂෙම ස්ථානයට නික්මුණ වූ මත්තාමානඛයකු සේ ද විවිධ ශරීරමල සම්පූර්ණා 'සුචිගතියෙක් හි එයින් නැඟි පවිත්‍ර ස්ථානයකට නික්මැ ගත් නාවූ සුචිකාමී වූ පුරුෂයක්හු සේද චණ්ඩ වූ සිංහ ශාර්දූලාදින් විසින් සමාකීර්ණ වූ වන ප්‍රදෙශයෙකින් අභයස්ථානයකට නික්මැ ගත් ප්‍රාණරක්ෂණාර්ථී වූ තරුණ වානරයක්හු සේ ද සමෘඩ්ධ වූ පඤ්චකාමයෙන් සාදීනව වූ තමන්ගේ මහාප්‍රාසාදය හැර 'පැවිදි වෙම්' යන අදහසින් වනාභිමුඛවැ නික්මුණුවූ ඒ මහා පුරුෂයානන්ගේ ව්‍රතය ඉතා ආශ්චර්‍යය සේ හා, උදුරවූ අදහස් ඇත්තවුන් විසින් ලොව අශූන්‍ය බව ඉතා ආශ්චර්‍යය සේ හා, මහතුන් විසින් සිතූයෙක්හි තත්පර කම් ඉතා ආශ්චර්‍යය සේ හා, පැනිය යුතු වසතුයෙහිදු නුවණැත්තවුන්ගේ නිරපෙක්ෂතාව ඉතා ම ආශ්චර්‍යය සේ හා, මෙතැන් පටන් සාරාසඩ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි සුදුසු සුදුසු ජාතියෙහි කරණ මහ

1 යාචකසමූහයා. 2 සරහස-සරගය.

ඝිනිස්මණට පටන් ගත් මොහොතක් ඉතා ශුභ සේ හා, ලොවට වූ අස්වසක් ඉතා මහත් සේ හා, පඤ්චකාමයෙන් ම කළ පරිහව ඉතා මහත් සේ හා, නොවළකා ගත හැකි පඤ්චේන්ද්‍රිය යන්ට හෙළෑ අකුලක් ඉතා නොසෙල්විය හැකි සේ හා, උදාදී පනවූ යෞවනයෙහිදු මදයක් නැතිවූ බැව් ඉතා අපූර්‍ව සේ හා, එබඳුවූ සෞන්දර්‍යයෙහිදු අහඞ්කාරයක් නොකළ බව ඉතා අචින්ත්‍ය සේ හා, ගෘහස්ථයන්ට වූවමනා සම්පත්තියෙහි කළ ජුගුප්සාවක් ඉතා අචින්ත්‍ය සේ හා, සංසාරයෙහි දෙඝ දුටු පරිද්දෙන් ඉතා අතුලබ්‍ය සේ හා, සත්පුරුෂ ධර්ම්මයෙහි කළ පක්ෂපාතයක් ඉතා ලොකොත්තර සේ හා පටන් ගත් කටයුත්තෙක බුදු බැවින් වන නිමාවක් ඉතා මනොහර සේ හා, මුළු ලෝවැසියන් එකහෙලා කළ කුසල් උදා දුන් පරිදි ඉතා විචිත්‍ර සේ හා, එබඳුවූ සම්පත්තියක් හැරැ හුදකලාවැ වනයට නික් මුණහ.

එ සමයෙහි ශක්‍ර දිව්‍යරාජතෙම මහාපුරුෂයානන් වහන්සේ මේසේ වූ උදාරඩම්බරයෙකින් මහභිනික්මන් කළ බැව් දැනැ **විශ්වකර්ම්ම දිව්‍යපුත්‍රයා** කැඳවා **"සුමෙධපණ්ඩිතයෝ** සකල සමෘඩ්ධි සාරය හැරැ පැවිදිවෙම්හි යන අදහසින් **හිමාලාභිමුඛවැ** නික්මුණහ. නෝ එනැන්හි ගොස් ඒ මහා පුරුෂයානන් වසන්නට සුදුසු පණ්ණශාලාදිය මවා එව!"යි සමුදින. **විශ්වකර්ම්මතෙමේ** ශක්‍රදෙවෙන්ද්‍රයාගේ නියොගය මුදුනෙන් පිළිගෙණැ හිමාලයෙහි **බාර්මික** නම් පර්‍වතයට නුදුරු තැන්හි පණ්ණශාලාදිය මවා දිව්‍යලොකයට ම ගියේය.

මහා පුරුෂයානෝ ද ක්‍රමයෙන් වැඩැ ආශ්‍රමය දැකැ එහි ද 1 **"බරවිෂමතා** ය, **ඇතුලන්හි ගස් ඇති බව** ය, **ගහණයෙන් මුවා බව** ය, **ඉතා** 2 **හැඟ බව** ය, **ඉතා මහත් බව** ය" යන පඤ්චදෝෂවර්‍ජිත වූ සක්මණ දැකැ සෙසු පැවිදිවන්නට සුදුසු පිරිකර ද දැකැ වදාරා නියතයෙන් මා සේ වූ ශ්‍රමණ භාවයෙහි නිබඳ වූ අභිලාෂා ඇති මහා පුරුෂයන්හු නිසා මැවූයේ යයි සතුටුවැ පණ්ණශාලාවට වැදී **"මහඇඟි බව පළමුවන** දෝෂය, **පරා පිළිබඳ බව** දෙවන දෝෂය, අනුභව කළ කල්හි **වහා කිළිවිවන බව** හා කෙලෙසී ගිය කල්හි **ඇපිල්විය සුතු බව** තුන්වන දෝෂය, **අනුභවයෙන් දිරාවන බව** හා දිරාගිය

1 දුක්කරවිහාරකා ඨ. 2 අති සම්බාධතා. අ. අ. මද.

කල්හි නැවත **හිවිම් හා ගෙත්තම් කටයුතු** බව හා සතරවන දෙඟය, **නැවත සොඟා ගන්නට නුසුදුවන්** බව පස්වන දෙඟය, **පැවිද්දනට නුසුදුසු** බව සවන දෙඟය, **සතුරන්ට සාධාරණ** බව සත්වන දෙඟය හැඳගත් කල්හි **විභූෂණවැ නිබෙන** බව අට වන දෙඟය, ගෙණ ඇවිදිනා නැනැත්තහු **'අපිස්' නම් නොවැ 'මහෙච්ඡ' වනබව** නවවන දෙඟය යි මෙතෙක් දෙඟයන් ගෙන් යුකතවූ හන්සඵව හැර **"මනා මිළක් වටනාබව ය, අනුන්සතු නොවන බව ය, තමා අතින් කොටැ ගනහැකි බව ය,** පරිභොගයෙන් **වහා නොකෙලෙසෙන බව ය,** පරිභොග යෙන් **දිරාගිය කල්හි ගෙත්තම් නොඟවයුතු බව ය, සුවසේ සොඟාගනහැකි බව ය, සොරභය නැතිබව ය, පැවිද්දනට සරුප්බව ය,** පොරෝණ තැනැත්තවුට **විභූෂණ නොවන බව ය, විවරප්‍රත්‍යයෙහි අපිස්බව ය,** පරිභොගයට 1 සුවබවය, **නොනාගන්නා වැහැරි සුලභබව ය, නවකල්හි නිරපෙක්ෂාබව ය"** යන දෙලොස් ගුණයෙන් යුකතවූ වාකව්වරය පෙරවැ ප්‍රව්‍රජ්‍යා සවිකාර කොටැ යෙහෙන් පණිණ ශාලායෙහි වැසැ ප්‍රත්‍යූෂ වෙලායෙහි නැඟි සිටැ තමන් වහන්සේ මහඟිනිස්මන් කළ පරිදි ප්‍රත්‍යවෙක්ෂා කොටැ වදුරණ සේයෙක්:-

"මම පූරුෂාසුෂ මාත්‍රයකිනුදු ක්ෂය කොටැ ගත නො හැක්කා වූ බොහෝ ධනයෙන් යුකත වූ අනුරකත වූ ශුචි වූ දක්ෂ වූ ක්‍රමාගත වූ පරිවාර සමෘඩීන් යුකත වූ දුබ්භික්ෂ නො වදනට කළාවූ මහා ශෛලදුගීහ බඳුවූ බොහෝ ධන ධාන්‍යයෙන් පිරුණු කොටු ගෙවල් සියදහස් ගණනින් යුකතවූ නානාප්‍රකාරවූ සුඝමවූ සුව පහස් දෙන්නාවූ සියලු ආභරණයන්ගෙන් අග්‍රාභරණය යි ප්‍රසිඛවූ ඒ ඒ ඍතු පරිද්දෙන් අනුභවකරන්නට සුදුසු සුවූ විචිත්‍ර වසත්‍ර විශෙෂයෙන් පිරී නිබෙන්නාවූ නොයෙක් භාණ්ඩාගාරයෙන් අනූනවූ ඒ ඒ කාලයට අනුරූප කොටැ කරණු ලබන්නාවූ ගෙයි දණ්ඩකම්මානතයෙන් සිඛවන නානාවිඛ ප්‍රයොජන විශෙෂයෙන් පරම මනොහරවූ 2 නො දුරු දුරු නැන්හි කරණලද විචිත්‍රවූ පනසින් හා, ලතාමණ්ඩපයෙන් හා, වැලිමළුයෙන් හා, තන්හි තන්හි හෙනහැලි සියදහසින් හා, විශෙෂ නාදයෙන් මධුරවූ කොකිලාවන්ගේ කුලගෘහ බඳුවූ මයූරයන්ගේ නෘත්‍යශාලා බඳු නොයෙක් ජාතියෙහි විචිත්‍ර මෘගයන්ගේ ක්‍රීඩා මණ්ඩප බඳුවූ හංස චක්‍රවාක චකොර කොඤ්ච

1 සුදුසු බවය. 2 නොදුරු තන්හි.

ජීවඤ්ජීවක කපොත පාරා පත කිර ශාරිකාදි නානාප්‍රකාර ස්ථලචර ජලචර පක්ෂිජාතීන්ට සැම්තුම් ගන්නා තැනක් බඳුවූ චම්පකා'ශොකාම්‍ර ගණිනී සිත ගන්නී කණිණිකාර සහ කාර සාල තාල තමාල වකුල කුමුක කුරවක නාළිකෙර සන්තිර පනසා'සන සපී'ඉනාදි විවිධ තරුවර සමාකිණ්ණවූ නොඑක් උයනින් මනොහර වූ පදමගඬයෙන් උත්පලගඬඅයට උත්පලගබඬයේන් පදමගඬඅයට අනවරතයෙන් දිවන්නාවූ මධුර මධු පාන් මත්තවූ බමරුන්ගේ මධුර නාදයෙන් පරම රමණීයවූ තෙරෙහි ලිය ඔඩුලුයෙන් දියකොල වැලිතලායෙන් රාත්‍රිඳිවයෙහි නයනොත්සවාවහවූ ගෘහ දිගිඝිකායෙන් මනොහර වූ මිහිරිකෙළි නළුයෙන් සිත්ගන්නා වූ නොවෙනස් වූ යහළු යෙහෙළියන්ගේ අනවරත සඤ්චරණයෙන් හෘදයඞඝම වූ සමාන කුලසිල යෞවනාභිරාම වූ පිරුණු තනභාර සෙනහයෙහි මහත්වූ පිරුණුවූ වලග සේ අවගුණයෙහි තුනුවූ දිස්වූ ඇස්සේ පුරුදු කම්හි දිස්වූ රත්වූ අධර සේ අනුරාගයෙහි රකතවූ පාදයෙහි හඬන නුරුවලාහි මිහිරි රැව් සේ බස්හි මධුරවූ උකුලෙහි දුන් මණිමෙඛලා බන්ධනයෙන් සිත්බදු වූ, රුවින් ඇසට මිහිරි, ගුණයෙන් සිතට මිහිරි, ශරීරයෙන් ම වෙන් වූ ජීවිතයෙන් එක්වූ ඇසිපිය හිම් පමණක් කප සියදහසක් කොටැ සිතන පැගත් අත ලිහිල් වූ පමණෙකින් ම ජීවිතයෙහි ආසාද ලිහිල් කරණ එක්වැ වසන රාත්‍රිය එක් පැයක් සේ සිතා වෙන්වූ රාත්‍රිය මූදක් සේ පිනා එතරවැ ගත නොහෙන බොලඳ කමට ම බැවෙන විදග්ධකමට ම නියලෙන ඩබරකොටැ දැ බොහෝකලක් දැඩිකමක් සිර කොටැ ගත නො හී ලැගෙන උපායක් තමන් ම සිතා ලැගිකල ඩබර මිහිරි කොටැ ලද දිවියෙහි අගහස් දී අනුභව මිහිරි කරණ අඹුවන් සියදහසින් ගැවසී ගත්තාවූ දිව්‍ය භවනයක් සේ වූ ගෙන් නික්මෙන්නෙම් දෙර හැරීගිය. ඒවිවිමහා නරකයෙන් නික්මෙන නරක සතුබයක්හු එහි අපෙක්ෂා නැතිවැ ගියා සේ නිරපෙක්ෂවැ නැඟී ආම්.

එසේ වූ මම දැනුත් පණ්ණශාලායෙහි විසීම් නම් හේ මට දෙවැනි ගිහිගෙයි විසීමක් හා සමයැ යි සිතා "**මහාසමභාරසෙන් කටයුතු බවය, තණපතය මැටිය යන මේ ආදින් දවස දවස පරිහරණ කටයුතු බව ය**, සෙනසුන් නම් දැය වැඩිමාල් ලන්ට පැමිණෙන බැවින් නො වේලෙහි සෙනස්නෙන් නැඟි කල්හිසිත එකඟ නොවන හෙයින් **උඤාපනීයභාව ය, සිතොහණ** දෙක ඇඟ නොගතදී **ශරීරය සියුමැලි කරවනබව ය, කරණ්**

නාවූ පාපයක් ඇත මුවහ කරණ බව ය, මාගේ මේ පණිණශා ලාවය යි මමනතවය උපදනා බව ය, සඤ්ඤිතිය භාව ය, සුහුණු මතුළු ආදි බොහෝ සතුන්ට සාධාරණ බව ය" යනා මෙතෙක් දෙපයෙන් යුකතවූ පණිණශාලාව හැරැ "1 මද සතනයකින් කොටැහන හැකි බව ය, සුලභ බව ය, ගසින් ගිලිහී එන පර ඩලා බල බලා සුවසේ අනිතය සංඥුව මෙනෙහිකොටැ ගත හැකි බවය, සසනාසනමානසයන්යෙන් දුරු බව ය, පවිකිරී මෙකි රහසක් නොවන බව ය, දෙවතාවන් හා එක්වැ වසන බව ය, මුවා හරණ බව ය, අනුභවයට සුව බව ය, ගිය ගිය තැනෙක්හි ම රුක් මුලක් ලැබෙන හෙයින් එහි තෘපණාවක් නො උපදනා බව ය" යන දස ගුණයෙන් යුකතවූ ගස්මුලට එළඹැ මා ආහාරයක් අරුම හෙයින් මහණ වෙස් පෑ සිහා අහ රත් ලද මැනවැ යි පැවිදිවූ එකක්ඛු නොවත් ආහාරපයෙසිෂණ දුඃඛය ද ඉතා බොහෝ වූව. එහෙයින් මට අනික් අහරකින් ප්‍රයොජන නැතැ යි එ දුරු කොටැ 2 තමාම තමහට වැටිනුණු එලාඵල ම ආහාර කොටැ, ඉඳිනා, සිටිනා, සක්මන් කරණ. තුන් ඉරියව්වෙහි ම වියඝිය අත් නොහැරැ පැවිදිවූ සත්දවසක් ඇතුළත ම පඤ්චාභිඥ අෂටසමාපත්ති උපදවා ආහාසචර බ්‍රහමලොකයෙහි උපදනාවූ බ්‍රහමකුමාරයකුසේ බහන සුඛ යෙන් දවස් යවන සේක.

දීපඞ්කර බුදුහු. එ සමයෙහි පූරිත පාරමිතාබල ප්‍රතිලබ්ධවූ ප්‍රඥා පරිණාම ඇති බුදුවන ආතමභාවයට තුන්වන ආතමභාවයෙහි තමන් කළ ආශ්චයඃ විශෙෂයක් හෙතුකොටැ ගෙණැ සකල මහීතලය කමපාකරවා බොධිස තතවාවසථායෙහි සිටැ කළමනා කටයුත්තෙහි මසතක ප්‍රාපතවැ එසින් සැවැ තුෂිතභවනයෙහි ඉපිදූ එහි ආයුවූ පරිද්දෙන් අප මණවූ පඤ්චකාම රසාසවාදය කොටැ මතු දිව්‍යලොකයට යනු කැමැතිවැ එකල්හි රැස්වූ දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහම යන් විසින් මනුෂ්‍යලොකයට අවුත් බුදුවන පිණිස ආරාධනා කරණ ලදුවැ පඤ්චමහාවිලොකනය කොටැ එසින් සැවැ මවු කුසැ පිළිසිඳැ ගෙණැ 3 අහුතපුබ්බවූ ලොකොතසව පවත්වමින් දසමසක් මුළුල්ලෙහි මඩුකුස්හි වැසැ දසමස් ඇවැමෙහි ප්‍රසව වැ ප්‍රතිසනීගෙහි වූ ලොකොතසවයන් සුනාරුතත කොටැ කුම්භයන් වැනි නවශ්‍රවති නායන මධුකර නිපෙය වූ යෙහවන

1 මිනා යන්තය. 2 මිංමිත වැපිහුණු. අදඤනසුවූ.

මකරන්ද සම්පූර්ණවූ ප්‍රභාත සමය ප්‍රබුද්ධවූ පද්මයක් සේ ලොකානන්දකරවැ, "**හිම ය, සම්ම ය, වසන්ත ය**" යන තුන් සෘතුවට සුදුසුකොටැ කරවන ලද තුන් ප්‍රාසාදයෙහි වෙසෙම්න් සන්නාඩ නාව යෞවන ඇති විදග්ධ විලාසිනින්ගේ මුඛාම්බුජයෙහි **රාජහංස** වැ, ඔවුන්ගේ ම ප්‍රණය සුධා රසයට පවිත්‍ර පාත්‍රවැ ඔවුන්ගේ ම ප්‍රණය මධුර කටාක්ෂ නිස්සෙප භ්‍රමරාවලියට විකසිත සහකාර ස්තාවක වැ ඔවුන්ගේ ම බාහුලතා ශෛලඝයට සුජාත පාරිජාතද්‍රැම වැ, ඔවුන්ගේ ම මන්දස්මිත කාන්ති නිෂේකයට චන්ද්‍රකාන්ත පාෂාණ වැ, ඔවුන්ගේ ම පීන ස්තන රාජහංසයන්ගේ සෛවර ක්‍රීඩාවට තමන්ගේ විශාල වක්ෂස ම රුචිර සරස් කොටැ බොහෝ කලක් වැසැ, අනුක්‍රමයෙන් උද්‍යාන යාත්‍රාගමනයෙහි ඛ්‍රහ්මාපණීත **ජීර්ණ වාධි, මරණ** නිමිත්ත සන්දර්ශනයෙන් **සංසාර** උද්වේග ඇති වැ ප්‍රව්‍රජිත රූප සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යායෙහි සොත්සාහ වැ **ඒයවන්මම්මයා** ඕසින් සදනලද හසනිස්කාඛාධිරූඪ වැ සූර්‍යාස්ථදහසක් ඇතුන් විසින් පිරිවරණ ලදු වැ ප්‍රවර කුඤ්ජර ස්කන්ධාරොහණ චාතුර්‍ය්‍ය සන්දර්ශන විස්මිත විශ්වලොකයා විසින් පවත් වනලද ජයශබ්ද ශත සහස්‍රයෙන් පිළිරැව් දෙවනලද දික් චක්‍රවාල ඇති වැ උයන් වැඩැ.

සියලු දිවාභාගයෙහි සෛවර ක්‍රීඩා විහාරයෙන් උද්‍යාන යෙහි වැසැ සවස්වේලෙහි මහුල් සලවටැ වැඩැ හිඳැ ප්‍රව්‍රජ්‍යාභිමුඛවූ චිත්ත ඇති වැ ඛ්‍රහ්මාපණීත **අෂ්ට පරිෂ්කාර** සන්දර්ශනයෙන් සන්තුෂ්ට වූ සිත් ඇති වැ සර්‍වාභරණ ගළවා මහුල් කඩුවෙන් ඉසකේ බහා රාජවෙශොචිත වූ හන්සළු සහළ ගළවා ශ්‍රමණවෙශොචිත වූ කාෂාය වස්ත්‍රාදි අෂ්ටපරිෂ්කාර ධරා තමන් අනුවැ පැවිදි වූ පුරුෂ කොටියක් විසින් පිරිවරණ ලදු වැ, දසමසක් මහාවීර්‍ය්‍ය කොටැ සකල සර්‍වඥ වර ඥානාධිගම මහොත්සව නිධානවූ **වෙසක් මසැ මැදි පොහෝ දවස්** එළඹැ සිරිකල්හි භික්ෂාටී වැ නගරාන්තරයකට වැදැ එනුවර වැස්සන් විසින් දෙවතාවන්ට බලිකර්ම්මාදාන පිණිස යයි සපයන ලද අසම්භින්න ෂෛරෙය භොජනය කොටිමාත්‍ර වූ පරිවාර ශ්‍රමණයන් හා සමග පිළිගෙණැ දෙවතාවන් විසින් ප්‍රක්ෂිපත ඔජස් ඇති ඒ ආහාරය එකුන් පණස් පිඩක් කොටැ වළඳා බොධිද්‍රැම ප්‍රාන්තයෙහි විසාල වූ සාලවනයෙහි දිවාවිහාර කොටැ සවස් වේලෙහි ගණයෙන්

දුරු වැ සානඳු වූ සුනඳසා විසින් දෙන ලද අට මිටක් තණ ගෙණැ සිපඵලිබොධිද්‍රැම සම්පයට එළඹැ තණ ඇතිරිය අතු රත්ම පොළොව පළා පැනැ නැහි වජ්‍රාසනයෙහි 1 අසූරියන් පමණ බොධි සානඞ්ගයට පිට දී වැඩැ හිඳැ හිරු හසායට යන් නාට පළමුකොට ම සොර මාර වීර වියර්‍ය්‍ය නිජ පරාක්‍රමයෙන් උනමූලනයට 2 පමුණුවා යාමත්‍රයා'ධිගත ඤානත්‍රය ඇතිවැ වාසනා සහිත සකල කෙලඹ කලමල ප්‍රක්ෂාලනයෙන් විසුඛවූ බුඩි ඇති සකල ලොක ශාන්තිකරවූ කරුණාකර වූ මොහාන්ධකාර දිවාකර වූ සුකති සුඛා නිසෙක නිසාකර වූ ක්ෂෙමඞ්කර වූ මාර භයඞ්කර වූ දිපඞ්කර නම් සම්මාසම්බුදුරජෝ ක්‍රමයෙන් පවත් වනලද උත්තම වූ ධර්ම්මචක්‍ර ඇති වැ ක්‍රමයෙන් තෘෂ්ණාදූස වූ ලොව නිදූස කෙරෙමින් සියලු සත්ත්වයාගේ සිත්හි සඞ්ඛ්මා ඞ්කුර උන්වම්මින් ධර්ම්ම නැමැති අභය භෙරිය ලවමින් මාර විජ යෝත්සව ප්‍රතිලබ්ධ සඞ්ඛ්මධවජ සම්මාසම්බුදුරජෝ අපගේ නුවරට වැඩිසේක" යනු අසා තත්කාලෝ'ද්භූත හර්ෂ සම්භ්‍රම ඇති උප චිත රුචිර ප්‍රවුරෝ'පහාරපරිගත හසාසමපූට ඇති වැ ඒ සම්මා සම්බුදුරුවන් කරා එළඹැ තත් පූර්‍ව්වාපූර්‍ව් සචරූප සඤ්ඤිනයෙන් නිවි ගිය ඇස් ඇති වැ ශකති පමණින් පූජා කොටැ එකත්පස් වැ වැඩැ හිඳැ අශ්‍රැත පූර්‍ව් වූ ශ්‍රවණ නිර්‍ව්වාපණීය වූ සඞ්ඛ්ම ශ්‍රවණ යෙන් නිවිගියා වූ කන් ඇති වැ තමන්ගේ මනොරථයෙහි අඩුපුරා සෙට වැනි දවසට සම්මා සම්බුදුරුවන් පවරා නුවර ගොස්:-

උදෘසනක් සේ ම නැගී සිටැ මහාසාගරය අලළන්නවුන් සේ මහපොළොව පෙරළන්නවුන් සේ සපතකුලපර්‍ව්තයන් එකතැනට කැටිකරන්නවුන් සේ දිව්‍යලොකයෙහි සම්පත්තිය හයා මනුෂ්‍යලොකයෙහි පුරන්නවුන් සේ නාග ලොක සම්ප ත්තිය උපුරා තමන්ගේ නුවරෙහි නිධාන කරන්නවුන් සේ මහදන් සපයා ප්‍රබුඛ වූ නීලොත්පල පත්‍රයෙන් සොයනලද් දුවු සුගන්ධි වූ චන්දනා'ගරු කල්කයෙන් පිරිබඩ ගන්නාලද භූමිභාග ඇති ඉස්නාලද පස්මලින් මනොහර වූ සථානා' සථානයෙහි වින්‍යාස වූ සුණ්ණඝටපඞ්කති ඇති සඛණී රජතමය තාරකා වින්‍යාස මනොහර වූ ශෙවත විතානයෙන් හොබනා වූ ඒ ඒ තන්හි එල්වන ලද 3 මුතුලැල් හා 4 මහමල් දම් ඇති ආකාශය මැඩැ ගෙණැ නැගෙන්නා වූ කර්පුර කාලාගරු ධූප යෙන් සුවඳ වූ සහ පිරිවර බුදුරුවන වැඩැ හිඳිනට සුදුසු වූ අඛණ්ඩ ලක්ෂ්මී මණ්ඩන වූ මණ්ඩපයක් කරවා:-

1 අසූරියන්. 2 උනමූලනයකොටැ. 3 මුතුදැල්. 4 මහනෙල්දම්.

ඉක්බිති අසුරයන් දුනැ තවිතිසා දෙව්නුවර වදනා **ශක්‍ර දෙවෙන්ද්‍රයා** එන පෙරමග සදන්නට පටන්ගත් දෙවතාවන් සේ තැන්හි තැන්හි 1 කෙහෙල් තොරණ හා 2 පූණ්ණකුම්භ යොදමින් පසැවණිණ වූ ධ්වජ පතාකා බඳවමින් විහාරයෙහි සිටැ නුවර දක්වා වඩනා දෙ මැදහි පිළි තොරණ ලමින් ගොඩ වළ සමකෙරෙමින් සුණු කොටැ පී මුතු බඳුවූ පයට සුව එළවන්නා වූ සුදු වැලි අතුරමින් වැලි මත්තෙහි පස්වණක් පැහැයෙන් හොබනා සුවඳමල් 3 ඉස්වමින් මග සදන්නට පටන් ගත්හ.

නිගණ විවරණ ලැබීම. එ සමයෙහි අපගේ බුඩාඩකුරවූ සුමෙධ තාපස සවාමිදරුවෝ තමන් වහන් සේගේ ආශ්‍රම පදයෙන් නික්මැ සෘඩි බලයෙන් ආකාශයට නැඟි තාපස වෙශධර වැ සුසජ්‍ර වැ මැවි ගිය විදුල්ලියක් සේ ද බ්‍රහ්මචර්‍යාව ගෙණැ අවයව සහිතවැ හොබනා වූ දෙව් දුනු කලඹක් සේ ද සථානොචිත විත්‍රාසයෙන් එක් තැන් වැ රැස්වැ ගත් සපතරත්නයන්ගේ ප්‍රභාසාරයක් සේ ද කාලා 'කාල විගාගයක් නො කොටැ එක් වැ හැනි ආකාශයෙන් නික්මුණු විචිත්‍රවූ කුසුම කාන්ති සන්තානයක් සේ ද කනක විචිත්‍රවූ සන්නාහයෙන් සන්නාඩවැ ආකාශයෙන් නික්මුණු **එරා වත** නම් දිව්‍යහස්තිඝ සේ ද වෙසෙසින් දිලියෙමින් තමන්ගේ රූපශ්‍රී සෘද්ධීනයෙන් මත්වූ ආකාශස්ථ භූමිස්ථ දෙවතාවන්ගේ නෙත් සිත් එක පැහැර තමන් කරා හයමින් **රම්‍ය නගරවා සින්ගේ** පුරමස්තකා'කාශයෙන් වඩිමින් එනුවරැ වැස්සන් ඒ සා මහත් උත්සාහයකින් මාඝීහ සංස්කරණයෙහි තත්පර වූවන් දැකැ ශුශානන වාන ප්‍රහාරයෙන් ගිළිනි බස්නාවූ චන්ද්‍රමණ්ඩල යක් සේ ආකාශයෙන් බැසැ "මේ සා මහත් උත්සාහයකින් නොප මේ මග සදන්නේ කාටදැ?" යි විචාරා ඔවුන් විසින්, "සුමෙධපණ්ඩිත සවාමිනි? නුඹවහන්සේ තව නො දුන වදාරණ සේක් ද? අප හැමදෙනාගේ දෙව බලයෙන් මාඝීහ ඝන සලිලධාරා ක්ෂාලිත වූ කෙලශ පඞ්ක ඇති **දීපඞ්කර නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ** ලොකයෙහි පහළ වැ අනන්‍ය සාධාරණවූ ධම්මචක්‍ර ප්‍රවර්තනයෙන් විශ්ව ලොක මනස්සන්තර්පණය කෙරෙමින් පරාර්ථ සවාර්ථ සම්පාදන ව්‍යග්‍ර වැ චාරිකායෙන් වඩනා සෙයෙක් අපගේ නුවරට පැමිණි සේක.

1 රඹතොරණ. 2 පූර්ණඝට කුම්භයන්ද සදමින්. 3 ඉසිමින්.

අපි ඒ සඟාම් දරුවන්ගේ අනිරූපිත පූජා රූපා'මෘතා'සඟාදයෙන් නිවිගිය ඇස් ඇති වැ අශ්‍රැත පූර්ව සඩ්ම්මා'මෘත පානයෙන් සැනහී ගිය සිත් ඇති වැ අද දවස් දැන් දෙම් හ්ධි පවරා ඒ සඟාමින් අපගේ නුවරට වඩා එන පිණිස මේ මඟ ඉදිකරම් හ සි දැන්වූ කල්හි 'බුදුන් වහන්සේ'යයි යන නම ඇසූ විට ම දැන් මෙදවස් තමන් වහන්සේගේ නම ඇසූ ලොවට වන සියලු සතෙනාෂ තාක් එදවස් තමන්වහන්ස්ගේ ලෙහි පුරන්නාක් මෙන් නිවී සැනහී "මාගේ භාග්‍යයක් ඉතා මහත් සේ ය. අද මා නික්මුණු ගමනක් ඉතා යහ පත් සේ ය. කන් ලද්දෙහි ඵල අද මා ලද පරිදි ඉතා සම්පූර්ණ සේ ය. ජන්මලාභ අද මා මසතකප්‍රාපත කළ සේ ය; බොහෝ කලක් ජීවත්වීමෙහි අනුසස් අද මට නිශෙෂයෙන් සිඛවූ සේ ය. සංසාරයෙහි නපුරු වූ බස් අසා කණට වූ බැහැහැ අද මේ එක නම ඇසීමෙන් ම නැතිවැ ගිය පරිදි ඉතා ආශ්වයසී සේ ය. බොහෝ කලක් සැඟවී සිටි දෙව ඵකවිට ඉෂ්ට ඵල දෙන පිණිස සන්නඛවැ ගත් පරිදි ඉතා අපූර්ව සේ ය. බොහෝ කලක් පෙළඹී ආ පාපයන් බිම් හැපිලියාවැ ගිය පරිදි ඉතා විසමය සේ ය. බසෙක මිහිරෙක් මෙතෙකින් වඩා කොයින් වේ ද? මෙයට වැඩි ඇසිය හැකි බසක් කොයින් සොයමෝ ද? කප් කෙළි සුවහසිනුදු 'බුඛ'ය යන ශබ්දය පවා දුලීහශ්. 'ඔහු උපන්හ. බණ වදුරමින් සිටියහ. මෙතෙනට වඩිමින් සිටියහ' යනාදී වූ බස් වූකලී දුලීහබව කියනුම කිම් ද? එබදුවූ සඟාම්දරුවෝ අප බදුවූ දුසයන් විසින් උපසථාන කටයුත්තයහ.

එහෙයින් මා විසිනුදු ඔවුන් වඩනා මඟ පිරිසිදු කරණ බව සුදුසුයැ"යි සිතා ඒ මනුෂ්‍යයන්ට "ඉදින් නෙපි සච්ඡ වූ සඟාම්දරු කෙණෙකුන් වඩනා මඟක් ඉදිකරහුනම් ඒ මෙහෙයට මමත් ඇතුළත්මි. මම ද බොහෝ සමපත් හැරැ සසරට බා වල්වන් එකෙක්මි. මට ද එක් නැනක් දෙව"යි වදුරා ඒ මිනිසුන් විසින් "සුමෙඛ පණ්ඩිතසෝ සිතූ නම් මේ සියලු ජම්බුදීපය චින්නොත්පාද මාත්‍රයකින් ම එක මල'ස්නක් සේ සදු ලන්නට පොහොසත්හ. එහෙයින් ඔවුන්ට අනුන් ඉදිකොටැ ගත නො හැකි තැනක් දෙම්හ"යි සිතා සලිල ප්‍රවාහයෙන් බිඳි වළවැ ගිය බොහෝ මඩින් පිරුණු කඳුරක් පැලා 'මෙතැන ඉදිකළ මැනැවැ'යි කී කල්හි:-

එ තැන බලා "මම මෙ තැන දිව්‍ය මඳුර කුසුමය, සිඳු වාර කුසුමය, සහකාර කුසුමය, කණිණිකාර කුසුමය, චඳන චූණ්ණය, අගරුචූණ්ණය, යනාදිවූ විසිතුරු වසතුයෙන් පූරම් නම් ඒ මාගේ ඒක චිත්තොත්පාද මාත්‍රයකින් ම සිඹ වන්නේය. එතකුදු උවත් එසේ වූ සඞ්ඝාමිදරුවනට අයත්තයෙන් ලඝු කොටැ මෙහෙ කරණ බව සුදුසු නො වෙයි. එසේ හෙයින් මා විසින් මෑගේ ශරීරය ඔවුන්ට පුදා දුක් ගෙණැ මෙහෙ කරණ බව සුදුසුයැ" යි සිතා වදුරා නිරන්තර සන්තොෂයෙන් **'මාගේ දිපඞ්කරස්වාමිය, මාගේ දිපඞ්කර සම්බුදු ස්වාමිය!'** යන නම අනවරතයෙන් ශ්‍රී මුඛයෙහි වක වකා විදැ විදැ සිත සිතා සියලු ශරීරය පුලුන් පෙදක් සේ ආකාශයට නඟා පියන පමණ මහත් වූ ප්‍රීතින් පිණ පිණ දෙ අතින් පස් හැරැ ගෙණැ මරහු ඇසැ වැලි ගසන්නා සේ වළහි පස් ලන්නට පටන්ගත් සෙයෙක.

ඔවුන් ඒ මෙහෙ කොටැ නො නිමවන තුරු නුවර වැස්සවුන් අහර වළඳන කල් දැන්වූ කල්හි **ප්‍රවාල සාගරයෙහි** කුළ දක්වා ගැලි ගිය **සත් රුවන්** [1] **මහමෙර** සේ කර දක්වා වසා සිටි **රතිඳු ගොව්වන්** පැහැ බඳු පැහැ ඇති තථාගතොචිතවූ වර චිවරය පෙරවැ, ශ්‍රීමත් වූ ධීමත් වූ ඥානවූ දැනවූ සන්තුෂ්ටවූ ශිෂ්ටවූ විනීතවූ ශීලසම්පන්නවූ සමාධිසම්පන්නවූ චතුරා'ශ්‍රව ප්‍රතිපන්නවූ ශීලස්කන්ධාදි පරම මහාගුණ ගණ'නෙ ඝණයෙහි ප්‍රවිණවූ 2 අනුගීත නිජකීර්තිනි ශ්‍රවණ ව්‍යග්‍ර ත්‍රිභුවන ජනෝ'පජන්‍යමාන සාධුකාර ශත සහස්‍ර ඇති 3 ප්‍රතිෂිඛ වූ පුනර්භව ප්‍රතිසන්ධි ඇති සතර ලක්ෂයක් ක්ෂීණාශ්‍රවයන් විසින් පිරිවරණ ලද **දිපඞ්කර නම්** සඞ්ඝාමිදරුවෝ, තුමූ විනරාගී වැ විනරාගී වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ අවෙෂී වැ අවෙෂී වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ අමොහී වැ අමොහී වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ඥාන්ත වැ ඥාන්ත වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ දාන්ත වැ දාන්ත වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ විමුක්ත වැ විමුක්ත වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ එතර වැ එතර වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ශුඛ වැ ශුඛ වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ධීර වැ ධීර වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ කාරුණීක වැ කාරුණීක වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ දක්ෂිණෙය්‍ය වැ දක්ෂිණෙ

---

1 මහනැවක් සේ. 2 අනවගත. 3 ප්‍රසිඛ වූ පුනර්භව ප්‍රතිසන්ධි නැති.

ය්‍ය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ආරාධනීය වැ ආරාධනීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ මානනීය වැ මානනීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ වන්දනීය වැ වන්දනීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ අමානී වැ.අමානී වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ භාවනීය වැ භාවනීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ශරණාගී වැ ශරණාගී වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ගම්භීර වැ ගම්භීර වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ සමරණීය වැ සමරණීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ ශ්‍රමණීය වැ ශ්‍රමණීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ රමණීය වැ රමණීය වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ අවිසංවාද වැ අවිසංවාද වූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ සුප්‍රතිපන්න වැ සුප්‍රතිපන්නාවූ පරිවාරයෙන් යුක්ත වැ, තුමූ සම්පුණ්ණ වූ මනොරථ ඇති වැ සම්පුණ්ණ වූ මනොරථ ඇති පරිවාරයෙන් යුක්ත වැ :–

සමුද්‍ර කුක්ෂියෙන් **සපතරණ** උක හා මුළු ලොව ඉස්නා සේ **ජව වණ්ණ** බුඩ **රශ්මි** නාක් දශ දිගහාගයෙහි ඉසැ ඉසැ සම්සන්න ලොක සන්තොෂ ප්‍රසව කෙරෙම්න් ඉතා ශුභ සුලු නොවූ ඉතා මද නොවූ මනොහර වූ ගමනින් 'ශ්‍රීපාදය ඔබම් හ'සි සිතා වදුළ ක්‍ෂණයෙහි ම වළ නැන් උස් වැ උස් නැන් සම වැ කටු පහණ හකුරු ආදී දුරු වැ සමතල වැ සිත්කලු වන්නා වූ භූමි ප්‍රදෙශයෙන් නමාට නමා ම නටුයෙන් ගැළවී වඩනා මග සදන්නා වූ නානා ප්‍රකාර වූ කුසුමයෙන් සියලු ලොවට විසමය එළවම්න් මනුෂ්‍යයන්ට පැණි පැණි සිටැ පූජා කරන්නාවූ දිව්‍ය බ්‍රහ්මයන් විසින් බුඩානුභාවයෙන් වෙනසක් නො පැණෙන පරිද්දෙන් සම වූ මිහිරි වූ දිව්‍ය නෘත්‍ය ගීත වාද්‍යයෙන් හා මනුෂ්‍ය නෘත්‍ය ගීත වාද්‍යයෙන් ද දිව්‍යලොක කුසුමයෙන් හා මනුෂ්‍ය ලොක කුසුමයෙන් ද වඩනා මාඝීනය ලොකොත්තර වූ විලාසයට පමුණුවම්න් පොළොව පලා ගෙණැ නැගෙන්නා වූ පිඹුම් ගැබින් නැඟි අකනිටා බඹලොව දක්වා සුවඳ කොටැ ගෙණැ දිවන්නාවූ පද්ම මකරන්දයෙන් මුළු ලොව එකපැහැරැ සුවඳ ගන්වම්න් නො ඇසූ විරූ නො දිටූ විරූ විසමය දැක්මෙන් එකවටම වදනට පුදන්නට බලන්නට සිතන්නාවූ සියලු සත්ත්වයාගේ බණ්ඩයක් නැතිවැ පවත්නාවූ නොයෙක් ආදර සහිත වූ පූජා විශෙෂයෙන් නිරන්තර වෙම්න් සියලු සක්වළ ගැබ මැඩැ ගෙණැ දිවන්නාවූ ඡට්වණ්ණ වූ බුඩ රශ්මින් සතිස් ලක්‍ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් සක් වළ ගැබ එකහෙලා සිත්තම් කරන්නාක් මෙන් සදම්න් වඩනට පටන් ගත් සේයෙක.

එ සමයෙහි තමන් වහන්සේට මෙහෙ කරන්නට නියම කළ තැන්හි මෙහෙ කෙරෙමින් සිටි 1 සුමේධ තාපසයන් වහන්සේ අසිමුබයෙහි අපරිමිත වූ බුඩ විලාසයෙන් අසාඩාරණ වූ ලොකොත්තරවයෙන් අද්භූතවූ ප්‍රාතිහාර්‍යයෙන් අච්චන්තය වූ මහිමයෙන් උදාරවූ තෙජසින් අශ්‍රාන්තවූ කීර්තියින් යුකත වැ පෙළහි වඩනා සාර ලක්‍ෂණයක් කළිණශ්‍රව පුත්‍රයන්ට 2 පළමුවැ සම්‍යක් ලොක වාසින්ගේ නෙත්‍ර නැමැති නාටකයන් නටන්නා වූ රඟ මඩලක් බඳු වූ විසිතුරු රුවින් තමන් වහන්සේ පවා 'මාත් මතු මෙසේ වූව මැනවැ'යි සිතා ලොභ කරණ පරිද්දෙන් මනොහර වූ රුවින් යුකත වැ වඩනා දීපඩකර නම් සම්‍යක්සම්බුඩයන් වහන්සේගේ කෙශාන්තයෙහි පවත් නඛාන්තය දක්වා මෙ දෙ අතුරෙහි හිටි ගැවසි සැරසි සිටැ ගත්තා වූ දෙනිස් මහාපුරුෂ ලක්‍ෂණයෙන් හා අසීත්‍යනුව්‍යඤ්ජනයෙන් රුවිරතර බ්‍යාම ප්‍රභා කෙතු මාලා විලාසයෙන් ද වෙන වෙන ම ප්‍රකාශ කරණ ලද්දා වූ අව්‍යාජ වූ සශීඝ විග්‍රහයෙන් හොඩනා වූ වාක්විෂයා'තික්‍රාන්ත වූ උපමා විෂයා'තික්‍රාන්ත වූ මනෝ විෂයා'තික්‍රාන්ත වූ ලොක විෂයා 'තික්‍රාන්ත වූ හුදෙක් බුඩ විෂයට ම සාඩාරණ වූ සමනිස් පැරැමන්ගේ අත් මෙහෙයට ම සුදුසු වූ දිව්‍ය බ්‍රහ්මයන්ගේ සාධුකාරයට ම සුදුසු වූ රූපය බලා වදාරා :-

අහස් පොළොව් සිදුරු දෙක වසා සිටැ සතුනි කරණ මල් ඉස්නා කළුවැල් දුම් ලන මල් ගත් දද ගත් පතාකා ගත් නටන, වයන, ගී කියන, දිව්‍ය සෙනාව මඩ්‍යයෙහි ආකාශ ගඩ්ගායෙහි පඤ්චවර්ණිත පදම මඩ්‍යයෙහි පිපී සිටි සත් බුමු වූ මහා කනක පදමයක් සේ විශිෂ්ට ශොභා ප්‍රාප්ත වැ මිහිකත සොල්වමින් මහමෙර නටවමින් සපතකුට පවිතයන් ඔවුනොවුන් හා පොර ගන්වමින් සක්වළ * ගල ඉපිළී හෙළවමින් මුළු ලොවට බුදු රැ පඬුරු පාමින් සතුටු කදුළු උපදෙස දෙමින් ලොමු දැහැ ගැන්මට එකාචාර්‍යවෙමින් එක්ලකුෂ අවසැට දහසක් යොදුන් මහමෙර ඉපිරෙන කොලාහලයක් සේ මහපොළොව එපිටින් එපිටට පෙරළෙන කෝලාහලයක් සේ වඩනා මහැ ඒක කොලාහල කරවමින් යොදුන් දෙ යොදුන් තුන් යොදුන් ආදී පමණ ඇති ශ්වේතච්ඡත්‍ර හා, ශ්වේත චාමර හා, 3 සත්රුවන් තල්වැට හා, රන් පැන රිදි පැන හා, රන් කලස

1 සුමෙධ පණ්ඩිතයන් වහන්සේ. 2 පළමුවලා. * ගැබ. 3 රන් රුවන්.

රිදී කලස හා, රන් කෙණ්ඩි රිදී කෙණ්ඩි හා, රන් කොතලා රිදී කොතලා ආදිවූ වඩනා මඟ යොදුන් 1 ගණන් වසා ගෙණැ යන්නාවූ දිව්‍ය මනුෂ්‍යයන් ගත්තාවූ නානා ප්‍රකාරවූ පූජොප කරණ මඩ්‍යයෙහි නික්මැ ගත්තාවූ 2 විසිතුරක් බලා වදාරා :-

'සබ්බඤ්ඤූ'ඝයි මා ඇසූ නමට සුදුස්සක් මා දුටු සේ ඉතා යහපත් සේ ය. ඉතා ආශ්චය්‍ය සේ ය, අසාධාරණවූ සත්හුන් කමක් ඉතා ආශ්චය්‍ය සේ ය. මහාසාගරයා ගොකුරක් සේ 3 උතැහි කොටැ පි හැඹුරු කමක් ඉතා ආශ්චය්‍ය සේ ය. මහමෙර පුලුන් පෙදක් සේ ලඝුකළ ගුරුත්වයක් ඉතා ආශ්චය්‍ය සේ ය. දිව්‍ය බ්‍රහ්මයන් වෙරැ මල් වැසි කළ මහානුභාවයක් ඉතා ආශ්චය්‍ය සේ ය. ශක්‍ර සුයාම සන්තුසිතාදීන්ගේ සෞභාග්‍යය ඇසට අරුචි උපදවන පරිද්දෙන් සැරහී සිටි සෞන්දය්‍යයක් ඉතා ආශ්චය්‍ය සේ ය. මුළු තුන් ලොවක් ම මැඩැ පියා සිටි භාග්‍යයක් ඉතා මහත් සේ ය. මේ කවර කුශලයක් හුගේ ඵල ද? මෙබඳු වූ මහත්හු ලෙව්හි කී දෙනෙක් වේද්ද? මෙසේ වූ සැනහුමෙක් ඇසට අනික් කොතැනෙක්හි ලැබේ ද? මේ කෙබඳු වූ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ප්‍රේමයෙක් භක්තියෙක් පක්ෂපාත කමෙක්ද? මේ කවර අද්භූතයනට වැඩි අද්භූතයෙක් ද? මේ කෙබඳු උපමා වසතුන්ට වැඩි උපමා වසතුයෙක් ද? මෙබඳු වූවන්ට සුදුසු පූජා නම් කොයි ඇද්ද?

එහෙයින් මෙසේ වූ **4 බුදුරුවනඟට** පූජා කරත් මාගේ ජීවිතයට වැඩි අනික් වසතුවක් නො දකිමි. මෙබඳු වූ මේ ශ්‍රීපාදය මා පිට 5 ගහා මේ සංසාරේ වැඩි දැ නම් මාගේ ජන්මය සේ සඵල වූ ජන්මයක් ලද සත්ත්වකෙණෙක් මුළු ලෙව්හි නැත.

එ හෙයින් මෙ බදු හිමියානන් වඩනා පෙර මඟට මාගේ ප්‍රාණයන් ම පූජාඤ්ජලි කොටැ බහාලා මේ මඩ අතුරෙහි මුහුණින් නැමෙන හේ වැ සතර ලක්ෂයක් ඍෂිණශ්‍රවයන් හා මේ **බුදුරජාණන්** හා මා පිටින් වඩනා පරිද්දෙන් හා එයින් ම මාගේ මනොරථය මසතක ප්‍රාපත කිරීමෙන් සම්පාණිඟ වූ ජන්මලාභ ඇතිවූවැ මැනවැ'යි සිතා වදාරා **සවණ්ණ පඩිච්ඡ** මසතකයෙහි විදුනී වැනී ගිය ඝන නීල වූ මෙඝ පටලයක් සේ නිල් වූ හිසකේ කළඹ උනා මඩ මත්තට දමා ලා අඳුන් දිවි සම් වාක චීවර'දී මඩ පිටට දමා මුහුණින් මඩෙහි හෙවැ "දැන්

1 ගණනක්. 2 වෙසතුරක්. 3 උතැහැනි කොටැ පූ. 4 බුදුරුවනට. 5 හඟා.

දැන් බුදුන්ට දිවි පුදම්"යන අදහසින් ඇකාශයෙහි පියා 1 හඬා වැඩා වැ ආකාශ ගඩගායෙහි රළ මත්තෙහි නිවී සැනසී හොත් **රාජහංසයන්හු** සේ නිවී සැන හී වැදී හොත් සේයෙක.

එදා ඒ පෑ පිට සාරා සඩ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සසරට පෑ පිටමය. එ මඩෙහි ගැලුණු ගැල්ම සමතිස් පැරැම්හි ගැලුණු ගැල්මය. එබඳු වූ බුදුවන්නවුන් බුදුකෙණෙකුන්ට එ වැනි පූජා නො කරත්:- අනික් කවුරු එසේ වූ පූජාවක් කෙරෙද්ද? බුදු කෙණෙකුන් ඒ පූජා පිළි නො ගණුත්:- අනික් කවුරු එසේවූ පූජාවක් පිළිගණිද්ද? මා පිණැති කල මා තුඩෙහි බුදු ගුණ වැකුණු මනාකල, මා සිතට ද මේ නියා සැනහුමක් වූවමනාකල, මා කියන බණ ඇසුව නුදු මා දිසාවට වැඳැ වැඳැ ඇසුව මනාකල, තමන්ගේ ගුණ කී පමණින් මාසේ වූවනුදු **ඛණ්ඩකපිකෂන්** කෙරෙහි ඇතුළත් වූව මනාකල, ඔහු එසේ වැඩැහොත් වූ ල. බුදුනට දිවි පුදා ලය බිම ගහා:-

මුහුණින් හොත්තවුන් තමා ලය බිම ගහා වැදූ නොසැනහෙනු ල දැඩි කමෙහි නිමාමෙක. එබඳු වූවන් සිහි කරත් දුකෙක් නම් ලඟේ ද? සුවයෙක් නම් දුරු වේ ද? සතුරෝ නම් ඇති වෙද් ද? මිතුරෝ නම් නැති වෙද් ද? එ දවස් දිව්‍ය ලොකයෙහි හා උතුරුකුරු දිවැ ඇති වූ සියලු කප්රුක් ඔහුගේ ගෙදොරැ නො වෙද් ද? ඔවුන් වඳිම්! ඔහු පෙරළා වැන්දෝ තුමූ අමාමහ නිවන් නො දකිද් ද? සසර පමණකට මෙතෙක් පිරිවහල් මද ද? නිවන් යන්නට මෙතෙක් පලාබත් 2 නො හැම්මේ ද?

එහෙයින් මා සිත ඇති පක්ෂපාතයෙන්-මා සිත ඇති සෙනහයෙන්-මා සිත ඇති භක්තින්-එ දවස් එ කලල් පිටැ වැදූ හොත් ඒ මාගේ **සුමෙධ තාපස සවාමීන්ගේ** 3 ශ්‍රී පාද පදම මා මුදුනෙහි තබා පුදා වඳිම්. මෙ මා කළ භක්ති සෙනහයෙන් ම කළ සහ භක්ති බව නියත වී නම් එයින් ම මා හා, මේ දුක් ගන්නා සත්ත්වයන් හා, මාගේ සවාමීන් හා, අනන්නා'පරිමාණ සක්වළ සත්ත්වයන් මූ (?) නිදුක් නිරෝගි සුව පත් වමෝ ව යි!

---

1 හමා. 2 නො හැඹේ ද? 3 ශ්‍රී පාදපද්ම.

එදා ඒ මඩැපිටැ වැදූ හොත් දවස් පටන් ගෙණැ පිරිනිවන් පානට **කුසිනාරා** 1 **සමහලැ** වැඩැ හෝනා දවස් දක්වා මේ අතුරෙහි ඔවුන් කළා වූ අචින්තය වූ **සඞ්ඝ්ම ඝම්ම සෙහි** අනුභසින් මේ හඩන සතුවයා තුඩැ තුඩැ සාධුකාර වැකෙන්නා අසම්ව සි! ඔවුන් ඇසින් වැහෙන දළ සෝ කඳුළු සතුටු කඳුළු බවට පෙරලෙන්නා මා ඇස් පුරා දකිම්ව සි! ඒ **බුදු රැව** දුටු ඒ **සුඡම්බ නාපසයන්ට** වූ සතුටු තමන්ගේ ගෙදොරැ මිදුල නැදෑයන් යෙහෙන් දුටු සත්ත්වයන්ටද වාසනා වේ වසි! මම ද කලඬකයක් නැත්නා වූ මේ බුඩ **ගණ** ප්‍රසාදයෙන් මේ කෙණේහි පටන් නිවන් දක්නා ඤණය දක්වා ඔවුන්ගේ නම ම සිහි කිරීමෙන් නිවී සැනහී සියලු ඉඡාඑ සිඩියට පැමිණෙම්වා!!

එසේ බුදු **රැවනට** දිවි පුදූ 2 වැදූ හොත්නාවූ ඒ සඞ්ඝ්ම දරුවානෝ "ඉදින් මම සිතුයෙම් විම් නම් මෙතැන්හි ම රාග වෙෂාදිවූ පාප ධම්මයන් නසා **ඤණාග්‍රවවැ** මේ **සඞ්ඝයන්** වහන්සේ පිරිවරා වඩිනා සාර ලඤයක් **ඤණාග්‍රවයන්ට** සඬ්ඛ නවකවැ අග්‍ර දඤිණෙය්‍ය වැ ඒ භික්ෂූන් වහන්සේ හා කැටි වැ ම 3 **රම්‍ය** නම් නුවරට වදනට සමඵයෙම්. මේ නිවනට මෙසේ සොරා වදනා බව මා සේ වූ එකක්හට සුදුසු නොවෙසි. මම ඛුදකලාවැ * සසරින් ගැලවී මෙතෙක් සතුන් දුක් ගද්දි අමා මහ නිවනට වනිම් නම් මා සේ නිඤාරුණිකයෝ ඇද්ද? මා සේ ල දුඞ්ගෝ ඇද්ද? මා සේ පරාඵයෙහි 4 පිරිමි වියෝ ඇද්ද? මා සේ ආතම සෙනහයට ගැහිවූවෝ ඇද්ද? මා සේ දිඨි දෂී නො වන්නෝ ඇද්ද? මා සේ තමා දරුවනට වළහා අමා එළදනෝ ඇද්ද? මා සේ ලෝවැස්සා විඳින දුකට නො දන්වන්වූවෝ ඇද්ද? මා සේ ගිනි ගත් ගෙදි දන දරුවන් නො බලා තමා ම ගළවා ගෙණැ දිවන මවුපියෝ ඇද්ද? මා සේ තමා කුස රක්නා පිණිස මහ සායෙහි 5 **දරැවන්** මස් කෑවෝ ඇද්ද?

"නිවන් වැනි මිහිරෙක් ල! සසර වැනි දුක් පත් නැනෙක් ල! මා වැනි විර පුරුෂයෙක් ල! මෙබඳුවූ මම එසේ මිහිරි නිවන් මේ **දුක්** පත් සතුන් හැරැ ඛුදකලාව වළඳම් ල! මේ බඳු නො වියත් කමෙක් මෙබඳු අවිරතවයෙක් මෙබඳු

1 යම සල. 2 වැඩ. 3 රම්‍යවති නම් නුවරට. 4 පිරි නිවිඳෝ.
5 දරු මස්. * සසරට බා.

අශුරත්වයෙක් මබඳුවූවක් හට සුදුසු නොවෙයි. එහෙයින් මා විසිනුදු මේ **සර්ඥයන් සේ ම සුවඥභාවයට** පැමිණෙ ව්‍යසන මහාසාගරයෙහි නිමග්නවූ මේ සත්ත්ව ලොකයා හළුවා ගෙණෙ ඕවුන් හා කැටිවැ ම මේ නිවන් රස විඳිනා බව **සුදුසු** යැ"යි සිතා:-

"මිනිස් බව ය, පිරිමි බව ය, පෙණෙ රහත්වන්නට කුසල් ඇති බව ය, බුදුන්ගේ දැක්ම ය, පැවිදිවීම ය, ඛාණා'භිඤ්ඤාදි ගුණ සම්පන්නිය ය, බුදුන්ට දිවි පිදූ බව ය, බුද්ධත්වයෙහි අද හස ය" යන අෂ්ට ධර්ම සමොධානයෙන් සංසිද්ධ වන්නාවූ මනොරථ ඇති වැ "ලෝ මුදම්" යන අභිප්‍රායයෙන් "බුදු වෙමි" යන දළුහා ගහණින් එදා තමන් වැදූ ඔත්-ඒ උදුර අඛ්‍යාශය අද මා ලවා මෙසේ කියවා පියන රිස්සෙන් මෙන් මා කෙරෙහිම කළ අනුග්‍රහයෙන් සාරාසඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි තිබී මුහුකුරණ මහාකරුණාව තමන් සිත්හි පිළිසිඳෑ ගණුත් බුදු බැව් වැනි මිහිරකට දෙළ ගෙණෙ වැදහොත් මාගේ **සුමෙඛ තාපස ස්වාමිනි!** ලෝකයෙහි පිරිමි නම් නෙපිමය.

පරාර්ථයෙහි සන්නාඩවූවා නමුත් නෙපිමය. සසර නොබැවූවා නමුත් නෙපිමය. කරුණා ඇත්තන්ට අගතැන් පත්වූවා නමුත් නෙපිමය. පරදුඃඛයෙහි දුඃඛිතවූවා නමුත් නෙපිමය. නිෂ්කරුණයෙහි කරුණා ඇත්තා නමුත් නෙපිමය. ආත්ම සුඛයෙහි අරුචි කළා නමුත් නෙපිමය. මුළුලොවට ආහරණ වූවා නමුත් නෙපිමය. සඛ්ගීයට ජය ඛව්ජවූවා නමුත් නෙපිමය. මුළුලොව තමහට ගැතිකළ තෘෂ්ණාව තොපට ගැති කළා නමුත් නෙපිමය. නිර්වාණයට මහවත් 2 හසන්නව පටන් ගත්තාත් නෙපිමය. සසර සඝ්ගරෙහී එලෙන්නට පටන් ගත්තාත් නෙපිමය. සමනිස් පැරැමට කුල දෙව් වූවාත් නෙපිමය. දෙසැට දෘෂ්ටියට විඝලන්නට පටන් ගත්තාත් නෙපිමය. මාරසේනාවට හකුල් හෙළන්නට පටන් ගත්තාත් නෙපිමය. මරහු මුහුණ දැලිගාන්නට පටන් ගත්තාත් නෙපිමය. තෘෂ්ණාවට ගබ්සා බෙහෙත් දෙන්නට පටන් ගත්තාත් නෙපිමය. සත්ත්වානුග්‍රහ විද්‍යාවට ආචාර්ය කමට පටන් ගත්තාත් නෙපිමය. බුඩ පරම්පරාව පිරි නොහෙළන්නට පටන් ගත්තාත් නෙපිමය.

---

1 නොබව්. 2 ඟසන්නට.

ලෝකයෙහි සත්පුරුෂයන් හා එක්වූවෝ නම් තොප හා එක්වූවෝමය. ලෝකයෙහි සැමිදරුවන් ලද්දෝ නම් තොපට හැතිවූවෝමය. අප සේ තොප වැනි පියන් ලද්දෝ නැත. අප සේ තොප වැනි මවුන් ලද්දෝ නැත. තොප සේ කටයුත්තක් කරම්හයි සිතුවෝ නැත. තොප සේ මරහු ලන ඉඳුජාලය බොරුබව දුටුවෝ නැත. තොප සේ ලෝ වැස්සන් ඇසැ වැකුණු දළු සෝ කඳුළු පිස්නට නොහැකිලී පටන් ගත්තෝ නැත. තොප සේ සසර මහගිමින් නැවුනු ලොව ශ්‍රීපාද සෙවන ලා සතපන්නට සිතුවෝ නැත. තොප සේ මුළුලොවට මිහිරක් දෙන්නට පටන් ගත්තෝ නැත. තොප සේ නිරා දුකට පොවා සිහිල්වැ සිටි හෙල්මැලි කළඹක් නැත. තොප සේ ලෝ වැස්සාගේ සිත්හි වූ කෙලෙස නැමැති අසුචි සෝධන්නට පටන් ගත්තෝ නැත.

කප් දහසක් ජීවත් වන්නමෝ නමුදු තොප සිහි නොකරමෝ නම් ඒ ජීවිතය අපට ව්‍යර්ථය. අපට අසූරක් ගසන කලුදු තොප සිහි 1 නොකොටැ ජීවත්වමෝ නම් ඒ අපට කප් ලක්ෂයක් හා සමය. බස් නම් තොපගේ ගුණ කී බස. සිත් නම් තොප සිතූ සිත. සසරට සැක නැත්තෝ නම් තොප ගැත්තෝය. යෙහෙන් නිදන්නෝ නම් තොප නම කණ හෙළි හෙළා නිදන්නෝය. ලොව නුමුළාවූවෝ නම් තොප ගේ ශිෂ්‍යයෝමය.

තොපගේ මේ චරිත සිහිකළ විටම ලෙහි සෝක නිවී ගියේය. අවීචි මහානරකයෙන් ගිලිනී සවන පරනිම්න වස වත්හි දිව්‍ය ලොකයෙහි ඉපිදූ ගිය සත්ත්වයාට වන සතුටට වඩා තොප නම සිහි කළ මට වන සතුට ශත සහස්‍ර ගුණයෙන් වඩනේය. මේ සත්ත්වලොකයෙහි තොපගේ ගුණයෙන් (?) වඩනේය. මේ සත්ත්ව ලොකයා සෙසු තොපගේ ගුණ සිහි කරන්නා නබා මේ එක ගුණයම සිහිකොටැ අමාමහ නිවන් දකිත්වයි ! නිවන් දක්නා දෙ අතුරෙහි නිදුක් නිරෝගී සුවපත් වෙත්වයි ! තොපගේ ගුණයෙහි අනුසසින්ම මා පැතූ මේ ප්‍රාර්ථනාව සිඩවේවා !

ඉක්බිති මෙසේ මේ සැමිදරුවන් බුදුබවට පතා හොත් සමයෙහි අද දක්වා තමන් සිහි කළ මා සිත අමා නම්මින් වඩනා දීපඞ්කර නම්වූ සැමිදරුවෝ ක්‍රමයෙන් වැඩ කලල්

---

1 සිහි කොට.

පිටැ වැඩැ හොත් **මහාපුරුෂයානන්** දුටහ. **මහාපුරුෂයා නෝද** ඔවුන් දුටහ. බුදු කෙණෙකුන් සිටැ **බොධිසත්ව** කෙණෙකුන් බලත්-බොධිසත්ව කෙණෙකුන් හෙවැ බුදු කෙණෙකුන් බලත්-දෙදෙනාටවූ සොම්නස් 1 කෙපැලැඟිවී හා?

ඉස් දෙරැ වැඩැ සිටි ඒ සඞ්ඝාමිදරුවෝ බුදු බැව් පතා හොත්තාවූ ඒ සඞ්ඝාමිදරුවානන්ගේ මනොරථය සිඛවන පරිදි දැකැ පස්සෙහි ඒඛනා පරිවාර භික්ෂූන් වහන්සේ කැඳවා, වැඩැ හොත් සඞ්ඝාමිදරුවන් පෑලා අසා සිටි මුළු තුන්ලොව **සත්ත්ව** යන් කන්හි අමා නමමින්, "මහණෙනි! 2 මේ කලල් පිටැ හොත් මහාපුරුෂතෙම සාධාරණ එකෙකැයි නොසිතව්! මුළු සත්ලොවන් එකහෙළා රස විඳැ නො නිමා ගත හැකි **අමා පිඬෙක්**. ජාතිභෙදයෙන් අනන්තවූ සත්ත්වයන්ට එක හෙළා මවුපිය තනතුරෙහි සිටි **මහාන්මයෙක්ෑ**, මුළු ලෝ වැසියන් තමන් තමන්ගේ නුවණ පමණින් ගණුත් නො අඩු වන ගුණ රුවන් පිරුණු **මහානිධානයෙක්ෑ**. තුන් ලොවට එකහෙළා සැරහී සිටි **භූෂණ කාරක්**වූ **ආභරණයෙක්ෑ**. තුන් ලොවට දහම් අමා මහ ගහ හෙළන **තපස්වි වෙශධාරී**වූ **පවිනරාජයෙක්ෑ**.

"අනුවාත-ප්‍රතිවාත විභාග නොකොටැ මුළුලෙව්හි අමා බස්නාවූ දසබල ගුණ නැමැති දසවිධ සුගන්ධයෙන් යුක්තවන **ජඞ්ගම ගන්ධමාදන පවිනයෙක්ෑ**. නාලොව දක්වා මුල් බස්නා අකනිටා බඹලොව දක්වා දලු ලන 3 සසර මුළුල්ලෙහි පතළ අතුපතර ඇති සත් ගුණ නැමැති මහාකල්පවෘක්ෂය හට ගන්නට මේ මඩෙහිදු උන්වාලූ **බිජුවමෙක්ෑ**. සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි අද මේ පිපි වණ්ණින්ම නොමලා ගුණ සුවඳ පවත්වන, **බොධිසත්ව කුසුමයෙක්ෑ**. අද අපට මේ පැ පිරින්ම තමාට වැඩක් කරම්හයි සිතට පැ හොත් **මහාකාරුණ්ණයෙක්ෑ**. අද මේ කලල ගැළී කිළිටුවූ මේ ශරීරය මතු දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙහි ගැළී අසාධාරණශ්‍රියට නිධාන වන්නේය."

"අද මේ සසර නැමැති විෂවෘක්ෂය පල නො ගන්නට **හැසු මඩු කවුවෙක්ෑ**. අද අප මේ මඩින් එතර කරන්නට හොත් මේ මහපුරුෂයා මුළුලොව සංසාර නැමැති පඞ්ක දුගීභ

---

1 කෙසේ පැලවිද. 2 මේකල කළල් පිට. 3 සරස.

යෙන් එතර කරන්ට ලූ **මහහෙයකැ**. අද මේ බුදුන් දිසාවට ලා හොත් හිස මතු 1 අන්ලෝ² බුදුන් වන්නට **පෙහෙවස්ගෙණැ හොන් හිසෙකැ**. අද මේ බුදුන්ට කළ මේ **ජීවිත පරිත්‍යාගය** සසර පමණින් කරණ **පඤ්චමහාපරිත්‍යාගයට ප්‍රඥාවනා වෙකැ**; අද මේ ගත් තාපස වෙශය මතු ගන්නාවූ බුඩවෙශයට බැඳලූ 2 **සැරයමෙකැ**. අද අප පාමුල්හි වැඳි වැඳීම මතු මුළුලොව තමන් පා මුල වඳනට 3 ශ්‍රමකරවා උගන්වන්නට වැඳි **වැඳිමෙකැ**".

"මුළුලෙව්හි මෙවැන්නෝ නො ලැබෙති. මුළුලොවක් සතාථ කරත් මෙබඳුවූවෝ එක්කෙණෙක්ම පමණයහ. මතු තමන්ගේ ආශ්චයර්‍යයෙහි සැලී විඩාවන මහපොළොව × අදම නිවා සනහා සිප ගෙණැ හොත් කෙණෙකුත් වැන්නහ. එහෙයින් මොහු සාරාසඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි සකල වසතු විපුලවූ **කපිලවසතු** නම් මහානුවර හැරී පින පයොධරවූ ශ්‍රොණ්ධරවූ **යසොධරාදෙවින්** කෙරෙහි නිරපෙක්‍ෂවැ ප්‍රේම බහුලවූ **රාහුල කුමාරයන්** කෙරෙහි නිස්සඞ්ගවැ රුචිර ගති කනතා' මඳර **කනඨකා'හිඩාන** හයවරා'ඩිරූඪවැ අවජානා පක්‍ෂපාත ජනතා'මාතය සහාය වැ **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ නොපට සක්විති රජය ලැබෙයි නො සඹ"යි කියා වළකන මරහු හැ කුවි කුවිල කටාක්‍ෂ නික්‍ෂෙප මාත්‍රයකින්ම 4 නිබ්භාර්සිත කොවැ ජානාසනතරයෙහි සහචරවූ විතිවත්ත චිත්ත විකාර ඇති **සවිකාර මහාබ්‍රහ්මා'පණ්ඩ** විශිෂ්ටා'ඥ **පරිෂ්කාර** සවිකාර පූර්‍ණාඞ්ගම වැ මහණ වැ සාවුරුද්දක් **මහා විසර්‍ජය** කොටැ."

අනතයෙහි ප්‍රචල බාල ප්‍රවාලා'**ජපාලමූල** ගතවැ උභය කුල සුජාත **සුජාතාගිඩාන** වනිතා කර කම්ලොපණීතා'සම්හි නාන පායාසා'නන ප්‍රතිග්‍රහණ පූර්‍වකවැ ජලාවගාහා'යාත නව ශුර්‍වති පීත සතන මඳින ජර්‍රිත **නෙරඤ්ජරා** නදී තීරයට පැමිණැ ස්වෙරාවගාහණ'හත ශරීර කලමථ ඇති වැ නැඟී එකුන් පණස් පිඩක් වළඳා පාත්‍රය ගඩගාවෙහි හැරී උඩු හොඟට ඇණ පාත්‍රයේන්ම තමනුදු නාඉණා ප්‍රවාහයට අනුනොවැ එදුවස් ම උඩු ඡෝ බලා යනබව නියත කොටැ **කුසුමා'මොදු**

---

1 අනවලෝ. 2 සැරෙක. 3 ශ්‍රමණකරන්නාවා. × ශ්‍රොණඩරවූ.
4 නිඕසිත.

මුදින මයුරු සිඤ්ජිත මධුකර නිකර නිරන්තර පාවන සාල වනැ ප්‍රවිෂ්ටවැ ඒ සාල වෘක්ෂයන් විසින් විකසිත කුසුම නෙත්‍ර දල්වා බලන ලද්දාක්මෙන් දිවා විහාර කොටැ සවසැ දෙවියන් සැදූ මහින් බොධි මූලයට එළඹැ ප්‍රදක්ෂිණ කොටැ වජ්‍රාසනයෙහි වැඩැ හිදැ ප්‍රබලා'හඞ්කාර පුරස්සරවැ විජිගීෂා සමුපසේවිතවූ **වශවර්තිමාරයා** අවසවතීනී කොටැ ලුහු බදවා විද්‍යුත්‍රයා'ධිගමයෙන් යාමත්‍රයය සනාථ කොටැ වාදශාඛය **ප්‍රතිත්‍යසමුත්පාද** ප්‍රත්‍යවෙක්ෂා ක්ෂණයෙහි තමන් එකි එකී අඞ්ගය ප්‍රත්‍යවෙක්ෂා කළ විසමයට දෙලොස් විටෙක මහපොළොව ලවා සාධුකාර දෙවා අරුණෝදය හා කැවිවම **සම්බුද්ධ ඥානොදයෙන්** බුදුවෙති."

"ඒ ජාතියෙහි මොවුන් වදන මැණියෝ–නම්හි ලුත් සිත්හි මායාවක් නැති **මහාමායා** නම් බිසෝ කෙණෙකැ. පියානෝ–සකල ලොක දුඃඛ විනොදනය කරණ **සුඛොදන** නම් මහරජාන කෙණෙකැ. තුමූ නමින් ලොකොත්තර වූ **ගොතම** නම් වන්නාහ. කෙලෙශ විකාරයෙන් අචලිතවූ සංසාර ව්‍යසනයෙහි අනාකුලවූ **කොලිත** නම් එක් අගසව් කෙණෙකැ. ජින ශාසනාකාශයෙහි උදුකළ ප්‍රභාසම්පන්නවූ **සුජ්ජ** නම් නක්ෂත්‍ර තාරකාව වැනි **උපතිජ්ජ** නම් එක් අගසව් කෙණෙකැ. සමරණ මාත්‍රයකින්ම ලොකා'නඤ්ඤ එළවන **ආනන්ද** නම් උපස්ථායක කෙණෙකැ. සකල ලොක ක්ෂෙමඞ්කරවූ **ක්ෂෙමා** නම් එක් අගසව් මෙහෙණනී කෙණෙකැ. රාග වෙශාදී පාප ධම්මයෙන් අව්වණ්ණිවූ සිත් ඇති **උපලවණ්ණා** නම් එක් අගසව් මෙහෙණනී කෙණෙකැ."

"හිදැ බුදුවන්නේ–සියලු ලොකයාගේ අසඞ්ඛ්‍යතාව දුරු කරණ අසඞ්ඛ්‍ය වෘක්ෂ මූලයෙකැ. එහෙයින් ම මේ **මහාපුරුෂ නෙම** අපගේ පසින් මැඩැ හැකි පිටක් ඇති එකෙක් නොවෙයි. තුදෙක් අප ඇවැමෙන් මුළුලෝ රක්නෝ කවුරුදෝහෝයි සිතන්නාවූ අපගේ මනොරථය මස්තක ප්‍රාප්තකළ **මහාපුරුෂයාට** අපත් පූජා කරණ බව සුදුසුයැ"යි මතු උන් ලබන අඡ්ඣා'ඞ්ග මාගියේ ගණනින්ම අව මිටක් මල් පුදා මතු ඔවුන් ඒ බෝ රුක පැදකුණු කරණ පරිද්දෙන්ම තමන් වහන්සේද **ඒ මහාපුරුෂයානන්** පැදකුණු කොටැ නික්මුණු සෙයෙකැ.

බුදුබව නම් මෙසේ මා හැඟි දෙයෙක් * වත් නව සමනිස් පෙරුම් නො සොයා **පඤ්චමහාපරිත්‍යාගයෙහි** නම් නො දැනැ **නිර්විඩ අජීවයත්‍යාශය** යන බසතුත් මුවෙහි නොවකා 'බුදුවෙමි' යන සිතා සිතූ මාත්‍රයෙකින්ම තුන් ලොවින් පූජා ලබන්නෝ තුමූ සවහස්තයෙන් මල් පුදා පැදකුණු කොටැ වඩිත්ල. එදා පොවා බුදුන් අතින් අට මිටක් මලින් පූජා ලද්දවුන්ට අද **බුදුවූ සමයෙහි** නමා අතින් එක මිටක් මල් පුදා සංසාර ව්‍යසනයෙන් ගැළවී නිවී සැන හෙනු 1 සත්පුරුෂයන්ට උතුම් ධම්මයෙකැ. එහෙයින් මේ බුදුහු ඔවුන්ට කළ පූජාව අනාවරතයෙන් ම සිහිකොටැ මා විසින් ඒ සවාම්දරුවානන්ට කළ **සතුති** හා පූජාවෙහි අනුසසින් ඒ බුදුන්ගේ මුහුණ දුටු බොධිසත්ත්වයන්ගේ මුහුණ සේද ඒ බොධිසත්ත්වයන්ගේ මුහුණ දුටු ඒ බුදුන්ගේ මුහුණ සේද ඔවුනොවුන් දුටු සියලු සත්ත්වයාගේද මුහුණ සතුටු වේවයි! ඒ බුදුන් වහන්සේගේ අතින් විවරණ පතුල් ලද ඒ බොධිසත්ත්වයන්ගේ මනොරථය මසතක ප්‍රාපත වූවා සේම මා ඇතුළුවූ අනන්තා'පරිමාණ සියලු සත්ත්වයන්ගේ මනොරථය මසතක ප්‍රාපත වේවයි!

මෙසේ ඒ **දීපඞ්කර සම්‍යක් සම්බුඩයන්වහන්සේ** 2 තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මල් පුදා වැඩිකල්හි පස්සෙහි වඩනා සතර ලක්ෂයක් ක්ෂීණ'ශ්‍රවයන්වහන්සේ වෙන වෙනම 3 තමන් තමන්වහන්සේ අතින් මල් පුදා පැදකුණු කොටැ වැඩිසේයෙක. එ තැනට රැස්වූ සියලු දිව්‍ය බ්‍රහ්මයෝද නානා ප්‍රකාරවූ පූජා පැවැත්වූහ. මෙසේ වඩනා සවීඥයන් දැකීන විෂය ඉක්ම ගිය කල්හි වැඩෑ හොත් මහාපුරුෂයානන්වහන්සේ බුදුන් වහන්සේ ඇතුළුවූ සියලු සත්ත්වයා තමන්වහන්සේට පූජා පිණිස දුම් මල් ඇතිරිය මත්තෙහි පලක් බැඳැ වැඩහුන් සෙයෙක.

දෙවියන්ගේ සතුති. මෙසේ මහාබොධි සත්ත්වයන් පලක් බැඳැ වැඩ හිඳිනා සෂණයෙහිම "සවාමීනි! නෙපි එකානතයෙන් බුදුවව! පෙර බොධිසත්ත්වයන් පලක් බැඳැ වැඩ හිඳිනා වේලෙහි යම් යම් ශුභ නිමිත්තයෙක් 4 පැණේ නම් ඒ හැම 5 දුන් එක පැහැරැ 6 පැණෙන්නට වන් පරිදි බලා වදුරණුව. නුඹ වහන්සේගේ ගුණනුභාව

1 සත් ප්‍රෂ්. 2 තමන් වහන්සේ. 3 තමන් වහන්සේ අතින්.
4 පෙනේ නම්-පාතේනම්. * වනැ. 5 අදන්. 6 පැණෙනුවන්.

යෙන් දස දහසක් සක්වළ මුළුල්ල අතිසිත නොවැ අත්‍යුපණ නොවැ වසනත සමයෙහි ප්‍රභාත වේලාව සේ සත්ත්වයාගේ ශරීරයට හා සිතට සුව දෙන් සම යෑතු ඇතිවූ පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේ බුදුවන සමයෙහි බණ වදාරණ කල්හි දස දහසක් සක්වළ සත්ත්වයන් නිශ්ශබ්දවැ නිරාකුලවැ අසන බවට පූර්ව නිමිත්ත පාණ සේ දැනුදු එක පැහැරි නිශ්ශබ්දවැ නිරාකුලවැ සිටි පරිදි බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේ බුදුවන දවස් ඒ වේලෙහි රාග වෙෂා' දිවූ පාප ධර්මයන් ප්‍රවණ්ඩ වැ නොපවත්නා සේ දැන් නුඹ-මේ **විවරණ පතුල් ලන්** මඛාලයෙහි ප්‍රවණ්ඩ වාත නොහමන පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ බුදුඩා තපාදයෙහි තෘෂ්ණා ස්‍රොතස සත්ත්වයාගේ චිත්ත නැමැති සාගරයට නොවදින පරිද්දට පූර්ව නිමිත්ත පාණ සේ මේ මහා ගඩාවන් මහා සමුද්‍රයට යන ගමන් හැරි පියා නොසෙල්වී සිටිනා සේ බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ සියලු දවස්හි දියෙහි ද ගොඩෙහි ද ශ්‍රී ශරීර රශ්මින් විදහී යන්නා සේ දියෙහි ගොඩෙහි අතුරු සිදුරු නැතිවැ නානා ප්‍රකාර කුසුමයන් පිපී වැනී ගිය පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ දවස්හි කෘතා'ධිකාර සත්ත්වයන්ගේ සිත්හි **ලොකොත්තර මාගඟී ඵල** ගන්නට පූර්ව නිමිත්ත පාණ සේ සියලු ඵල ගන්නාවූ වෘක්ෂයන් නොවැළඳී ඵල ගත් පරිදි බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේගේ ප්‍රාදුර්භාවයෙහි **සපත්තබොධ්‍යංඞ්ග රත්නයන්ගේ** උපදවීම මෙසේ වන්නේයැයි දක්වන්නා සේ ආකාශස්ථ භූමිස්ථ සකල රත්නයන් එක පැහැරි උපදවූ පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේ බුදු වැ එක පැහැරි දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි ධර්ම විජය හෙරි ලවන බවට පූර්ව නිමිත්ත පාණ සේ එක පැහැරි දිව්‍ය ලොකයෙහි දිව්‍යහෙරි හා මනුෂ්‍ය ලොකයෙහි මනුෂ්‍ය හෙරි තමාම තමහට ශබ්ද පවත්වන පරිදි බලා වදාළ මැනව. සඞ්ගාමින්ගේ බුඩ **මඞ්ගල** යෙහි වස්නව අදම ශ්‍රමකරන්නා සේ ආකාශයෙන් දිව්‍ය කුසුමයන් වස්නා පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ ජාති මහොනසවයෙහි විසම්‍යයෙන් මුළුලෝ වැසියන් සිත් ඉපිළ හෙන පරිද්දට පූර්ව නිමිත්ත පාණ සේ දස දහසක් සක්වළ එක පැහැරි වෙවුල්වන පරිදි බලා වදාළ මැනව.

"නුඹ වහන්සේ පහළවන ක්ෂණයෙහි මිථ්‍යාදෘෂ්ටි ගත්තවුන් උඩනවැ සැලෙන සැලුම් හැරැ පියා විනීත වන්නා සේ මහා සාගරය තරඹන වික්ෂෝභයෙන් උඩනවැ සැලෙන සැලුම් හැරැ පියා නිශ්චලවැ තුබූ පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ ධර්මය ඇසූ සත්වයන්ගේ චිත්ත සන්තානයෙහි රාග වෙෂාදි පාප ධර්ම නැමැති වහිනි සංකිලියන් නිවෙන බවට පූජා නිමිත්ත පාණ සේ දස දහසක් සක්වළ සියල් නර කයෙහි ගිනි එක පැහැරැ නිවී ගිය පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ මෛත්‍රී බලයෙන් අන්‍යොන්‍ය විරුද්ධවූ සත්ව යන් විරා'නුගත විරෝධය හැරැ එක් තැන්හි පෙළඹෙන බවට පූජා නිමිත්ත පාණ සේ උළුවැ දිලියෙන සූර්යමණ්ඩලය හා එක්වම 1 අනාවරණවූ ප්‍රභා ඇතිවැ දිලියෙන තරු කැල බලා වදාළ මැනව."

"නුඹ වහන්සේගේ බුඩ මඩුලයෙහි සියලු සත්වයන්ගේ සිත්හි අඛණ්ඩ ප්‍රසාදෝදයට පූජා නිමිත්ත පාණ සේ වැසි නැති වම මහීතලය පලාගෙණ්ඩු තාලස්කන්ධ ප්‍රමාණයෙන් ආකාශ යට නැගෙන්නාවූ නුඹ වහන්සේගේම ආකාශය වසා නැ හෙන්නාවූ කිරිනි නැමැති වෘෂ්ඨ පරම්පරායෙහි දළවැ සුනුඹුල් වැ හටගත් කඳ වෙළුපයක් බඳුවූ ජල ධාරා ශත සහස්‍ර බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ බුඩ මඩුලයෙහි සත්පුරුෂ යන්ගේ පැලඹීම් පාණ සේ නක්ෂත්‍ර තාරකාවන් සවිශෙෂවැ දිලියෙන පරිදි බලා වදාළ මැනව. මතු දශ දිඞ්මණ්ඩලයෙහි නුඹ වහන්සේගේ කීර්තිපුඤ්ජය හා එක්වැ දිවන මහා කරුණාව සේ සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලය හා එක්වැ ආකාශයෙහි පවත්නා විසා නක්ෂත්‍ර බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේගේ බුඩ රාජ්‍යයෙහි සැඟවී නුබූ 2 ධර්ම තත්වය එකහෙළා ප්‍රකාශවන්නට පූජා නිමිත්ත පාණ සේ නො එක් බිලයෙහි සැඟවී හොත්තාවූ ප්‍රාණීන් එක පැහැරැ නික්මැ ප්‍රකාශවන පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ ධර්මයෙහි සියලු සත්වයාහට අරුචියක් නො උපදනට පූජා නිමිත්ත පාණ සේ දැනුදු සියලු සත්වය නට කිසි අප්‍රීතියක් නැතිවැ එක පැහැරැ සන්තොෂවූ පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ බුඩ මඩුලයෙහි

---

1 අනාවරණවූ. 2 ධර්ම තත්වය.

ප්‍රේතයන්ට නිශ්ශෙෂයෙන් සා දුක නැතිවන්නා සේ සියලු සතුවයන්ට නිශ්ශෙෂයෙන් නැතිවන්නාවූ **රාග** ය **ද්වේෂ** ය **මොහ** ය **භය** ය යන මොවුන් අද ම තු නුවූ පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ ධර්මා'නුභාවයෙන් **මානාති මාන ඝනමහ සාරම්භාදි** පාප ධර්ම නැමැති රජසුන් සංසිඳෙන බවට පූර්ව නිමිත්ත පාණ සේ අද සියලු දස දහසක් සක්වළ මහපොළොව රජස් එක පැහැරි 1 සංසිඳුනු පරිදි බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේගේ බුඩ **මඞ්ගලයෙහි** අධර්මතාක් දුරු වැ සඞ්ධර්මයම පැළඹෙන බවට පූර්ව නිමිත්ත පාණ සේ සියලු අනිෂ්ට ගණිතාක් 2 පහවැ දස දහසක් සක්වළ කුසුම් එක පිසුම් ගබක් සේ එක පැහැරි සුවඳ කරමින් විහිදුවූ 3 සුවඳ පවන් හමන්නට වන් පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ ධර්ම දෙශනා බලයෙන් නැති වසතුවක්ම නො පැණෙන බව මුත් ඇතිතාක් මිසතුන්ගේ තතුවයන් එක හෙළා පැණෙන්නා සේ අරූතෙලෙහි සතුවයන් හැරි සෙසු දිව්‍ය බ්‍රහ්මයන් එක පැහැරි පැණෙන්නට වන් පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ **මඞ්ගල** ධර්ම **දෙශනා වෙහි** සියලු සතුවයා විඳිනාවූ ජාති ආදිවූ දුඃඛ නම් මේ වනැසී සියලු ලොවට පැණෙන්නා සේ සියලු නරක තාක් එක පැහැරි පැණී ගිය පරිදි බලා වදාළ මැනව."

"මතු නුඹ වහන්සේගේ අවවාදයෙහි සිටි **සතුවයාහට** සඛීහා'වරණයක් මාඛීහා'වරණයක් නො වන්නා සේ ම දැනුදු මේ දස දහසක් සක්වළ ගලෙකැ සෙලෙකැ යනාදින් කිසි මුවාවක් නැති වැ එකා'ඛගණවූ පරිදි බලා වදාළ මැනව. මතු නුඹ වහන්සේගේ අවවාදයෙහි සිටැ **නිරුපධිශෙෂ පරිනිර්ාණ ධාතුවෙන්** පිරිනිවි සතුවයන්ට කිසි ජාති දුකක්වත් මරණ දුකක්වත් නැතිවන්නා සේ මේ කෙණෙහි මේ සතුවයන්ට ජාතියක් වත් මරණයක් වත් නැතිවූ පරිදි බලා වදාළ මැනව. නුඹ වහන්සේගේ **උපපත්ති මඞ්ගලයෙහි** නැති වන ව්‍යාධි දුඃඛය අද දවස්ම නැතිවැ නික්මුණු සේ බලා වදාළ මැනව. එසේ හෙයින් නුඹ වහන්සේ එකාන්තයෙන් බුදුවන සෙයෙක නුඹ ගැනිවූ ඇපි එකාන්තයෙන් කෘතපුණ්‍යයම්හ. ඉදින්

1. සංසිඳුවන. 2 පැවිව. 3 සුගඬ පවන්නට වන්.

ඇපි මේ සව්ඥයන්ගේ ශාසනයෙහි සසරින් නො ගැළවුනු මෝ නම් මේ අද අප හැතිවූ හැතිකමින් ම මතු නුඹගේ ශාස නයෙහි සියලු දුක් ගෙවා අමාමහ නිවන් දැකැ සැනැහෙම්හ" යනාදින් නානා ප්‍රකාරවූ **සතුති කෙරෙමින්** සිටියහ.

පාරමී සම්මර්ශනය. ඉක්බිති මාගේ ලයට සිහිල් දෙන හෙල් මැලි කළඹක් වැනිවූ **සුමෙඛ නාපසයන්** වහන්සේ "**සව්ඥයෝ** නම් අනික් පරිද්දකට නො යන්නාවූ ඛස් ඇත්නාහ. ආකාශයට දමා ලූ කැට ඛිම මුත් නො නැ වත්නා සේ **සව්ඥයන්** වහන්සේ වදාළ අසීයෙක් ඇත් නම් සිඩවැ මුත් නො නැවැත්නි උපන් සතවයාහට මරණය ඒකා නතයෙන් සිදුව මුත් නො නැවැත්නා සේ ද පහන් වේලෙහි සූයස්යා.1 උදා කොටැ මුත් නො නැවත්නා සේ ද ගුහායෙන් නික්මුණු සිංහයාගේ සිංහ නාදය අවශ්‍යයෙන්ම වන්නා සේ ද ලොක සඛාම්වූ සව්ඥයන්ගේ වචනය වදාළ පරිද්දෙන්ම ඵල සිඛිය කොටැ මුත් නො නැවත්නේය. එහෙයින් මම ඒකා නතයෙන් ම සවී ලොකශානති කරවූ **සව්ඥතඥයට** පැමිණැ මේ දුඃඛිතවූ ලොවට ශානති කෙරෙම් මය."

"අඛම්ම සම්ම සනතපතවූ මේ සමසත ලොකයා මාගේ පා මුලට වැදැ නිවි සැනසී මුත් නො නවත්නාහ. මම ද මෙ හත් පටනින් **වජ්‍රාඝනාරූඪවැ** මාර වීර තිමිර නිකර දිවා කරවැ පුරිත පාරමිතා ලතා මඤ්ජරී භූත **සව්ඥඥාන** ලීලා 2 විලාස විශෙෂ පරමා'ඛාරවැ ඛම්මචකු වතුමා'ක්‍රානත විනෙය බනධු කෙලශ බනධන ඇතිවැ කාල දෙශ සථා'නෝ'චිතා'ද්භූත බුඩ විභූමප්‍රකටන ප්‍රභාෂව තෙලොක්‍ය ප්‍රණීයමාන සාධුවාද ශත සහසූ සමුචලිත දික් චක්‍රවාට ඇතිවැ නිරා'ලොක ලොකා'ලොක කරණයෙන් මසතක ප්‍රාපත මනොරථ ඇතිවැ මුත් නො නැවත්මි.".

"ඒ බුඩනතවය ද **බුඩකාරක** ඛම්ම කෙණෙකුත් ඇතිවැ මුත් සිඩ නොවන්නේය. ඒ බුඩකාරක ඛම්මයෝ ද කොතැනෙක්හි වෙද්දෝ හෝ"යි පරීක්ෂා කොටැ වදාරණ සෙයෙක් **පළමු කොටැ** ම සූචී සව්ඥ ප්‍රවරෝ'පසෙවිතවූ සව්ඥ ලක්ෂණ නාටිකා ප්‍රස්තා'වනා විධි කුශලවූ ප්‍රකට නටී විභ්‍රමා'භිරාමවූ

1 උදුවමුත්. 2 විකාශ.

යාචක චානක මනෝ නිව්ඩාපණේ'ක ඛාරාඛර ප්‍රථමාරම්භාය මානවූ **දාන පාරමිතාව** දැකැ වදාරා තමන් වහන්සේ ම තමන් වහන්සේට:-

"**සුමේඛ බුඛාඞිකුරයානෙනි,** තොප විසින් සකල දශබල නිසෙවිතවූ ශ්‍රේෂ්ඨ වචන විලාශයට 1 අවිඝයවූ අනුසස් ඇති **සම්බුදු** යන්ගේ මූ **වජ්‍රාසනාරොහණයට** පියවර ඔබා ගන්නා වෙදිකා ස්ථානයෙහි සිටියාවූ සියලු ලොකයාහට දයකයා ප්‍රිය කරන්නාවූ වශෂක්ෂුරනාරමානවූ **දාන පාරමිතාව** දක්නා ලදැ. ඒ දාන පාරමිතා තොමෝම තොපට ඉෂ්ටා'ඒ දුෂ්ටිකරන්නාවූ **මානෘස්ථානයෙහි** සිටිය. සම්බුදු ලක්ෂ්මිය ගෙණැ අවුත් තොප හා එක් කරන්නාවූ **සඛිස්ථානයෙහි** සිටිය. හෝම තොපට **කාමොෂාදි චතුරොෂ** නිසාතරණයට **සෙතුස්ථාන යෙහි** සිටිය. හෝම තොපට සකල දස බල ගුණ සමූහයා ගේ ආගවානයෙහි 2 මහා හමුදුවැ සිටිය. හෝම තොපට මේ ජීවිතයට වඩා අවශ්‍යයෙන් රක්ෂණීයවූ **ජීවිත ස්ථානයෙහි** සිටිය. එහෙයින් ඒ දානපාරමිතා නැමැති ජීවිතයට අනන්තරා යෙක් පැණේ නම් මේ සම්බුදු සතුට සාධාරණ ජීවිතය බලි කොටැ දීත් ඒ ම අවශ්‍යයෙන් තොප විසින් රක්ෂා කටයුත් තේය."

"එහෙයින් පැන් පිරුණු කලයක් මුතුණින් නමා පි කලැ 'ම ට මෙතෙක් පැන් නබම්; 3 මෙතෙක් පැන් වම්වම්'යි නොසිතා නිරවශෙෂයෙන් ම ඇතුළත්හි තුබූ ජලය වම්වා ද එසේම මා විසිනුදු මා සතුවූ ඇස ය හිස ය මස ය ඝනාදිවූ අධ්‍යාත්මික වසතූන් අතුරෙන් ද ඇතුන් අසුන් මුතතාමණි වෙඪූර්යාදිවූ බාහ්‍ය වසතූන් අතුරෙන් ද මෙතෙක් මට නබම්. මෙතෙක් යාචකයන්ට දෙම්'යි නොසිතා සම්ප්‍රාපනවූ යාචකයන්ට ප්‍රාණය සහිතවූ සියලු වසතූන් ඔවුන්ගේ මනෝ රථය පුරා දිය යුත්තේය. මෙතැන් පටන් **වජ්‍රාසනය** දක්වා මේ සසර කතර ගෙවා යන්නට පටන් ගත්තාවූ තොප විසින් **මේ දාන පාරමිතා අවලම්බන යෂ්ටිය** නොහැරැ ගත යුත්තේ ය"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක.

---

1 අවිඝය කළාවූ අනුසමානි ඇතිව. 2 මහාමුද්‍රාව
3 මෙතෙක්. යාචකයන්ට පැන් වම්වම්.

මහතුන් 'කරම්හ!'යි කියා ප්‍රතිඥා කළ දෙයෙස්හි සථිර පරිදි ඉතා ආශ්චය්‍යයි සේය. දැන් මේ කළ ප්‍රතිඥාවට භඞ්ගයක් නො කෙරෙමියි **සිව්රජවෑ** අකම්පවසින් ඇස් ඉල්වා ආ **ශක්‍ර බ්‍රාහ්මණයාහට** පස් පෑ දිස්නා ඇස් 1 උදුරා දී ලූහ. 'සා ම්'යි ආ බමුණාහට කුසෑ පූරා මස් දෙමියි **සහවෑ** ගිනි වන්හ. ගැත් තන් සොයා ආ **සූජාතයා** වැනි බමුණු වෙස් ගත් යකඇත්හු අතැ **ජාලිය කෘෂ්ණාජිනා** දෙදෙන තබා ලූහ. **මද්දෙවින්** ඉල්වා ආ **ශක්‍ර බ්‍රාහ්මණයා** මුහුණ සයින් කිරි ඉල්වා ආ **පුතස්හු** මුහුණ බලන මවකට වඩා සිනෙහැතිවැ බලා ඔහුගේ මනෝ රථය මසාක ප්‍රාපත කළහ.

මෙසේ **පළමුවනුදු** දැන පාරමිතාව දැකැ වදුරා 'තවද් ලොකයෙහි බුඩ **කාරකබම්මයෝ** නම් මෙතෙක් මතු නො වෙති සිතමි. එහෙයින් මා විසින් නවද ඔහු සෙවිය යුත්තා හ'යි පරීක්ෂා කොටැ වදුරණ සෙයෙක්:-

සකල මනෝ මල ප්‍රක්ෂාලනෝ'ක සලිල සෙකායමා නවූ සකල දශ බල බලා'ධාර සාමඟ්‍යමානවූ අනුවාත ප්‍රති වාත ඝන විභාගයක් නො කොටැ මුළු ලෙවිහි ව්‍යාපතවැ පවත්නාවූ ගුණ සුගන්ධයෙන් යුක්තවූ වසන්ත මාරුතා'ණීත මඤ්ජරී ජලබිඳු සඤ්ජාතයෙනුදු අනිච්චාපණීයවූ කෙලශ සන්තාපය නිවන්නාවූ චතුස්සාගර වාරිධාරා පරිෂෙකයෙනුදු අසමණීයවූ රාගරජස් සංඝට්ටවන්නාවූ දෙවනුවූ **ශීල පාරමිතාව** දැකැ වදුරා තදදර්ශනෝ'ද්භූතවූ වසන්ත මාරුත 1 සන්නෝෂ කොශ නිර්භරිත හෘදය ඇතිවැ තමන් වහන්සේම තමන් වහන්සේට:-

"සුමෙඛ **පණ්ඩිතයෙනි,** තොප විසින් සකල බුඩ කාරක ධර්ම ගුණ ශික්ෂාමණ්ඩවූ **ශීල පාරමිතාව** දක්නා ලදැ. ඒ පාර මිතාව තොප විසින් එක ඇසක් රක්නා **පුරුෂයන්හු** සේ ද ප්‍රිය පුත්‍රයන්හු රක්නා **මවක** සේ ද බිජුවට රක්නා **2 කිරළෙකු** සේ ද වාලධිය රක්නා **සෙමරෙකු** සේ ද බිය පත්වැ රක්ෂා කට යුත්තේ යයි අධිශ්ඨාන කොටැ වදුළ සෙයෙක.

ඔවුන් ඒ කළ අධිශ්ඨානයෙහි තත්පරකම් කෙසේ කියා නිම වම්ද? ශ්වාස මාත්‍රයකින් **මහාමෙරු පර්වතය** දවා පියන්නට

---

1 උදුරා. 2 වසන්ත මාරුත භූත. 3 කිරළුක.

සමඵවූ **සඛපාල නාගරාජවැ** තමන් සමාදන්වූ අපඨා' ඛශීලයට හෙදයෙක් වේදෝ හෝයි යන හයින් තමන්ගේ ශරීරයෙහි අට තැනක් හුලින් ඇනැ විදැ නීසෘණවූ කණුවක ඇති වේ රැණ ඒ සිදුරෙන් යවා ගැටලා දණ්ඩෙහි ලා බැඳවූ **භොජපුත්‍රයන්** මුහුණ රාජා'භිෂෙකයෙහි තමන් නළල උණ්හීෂ පටයෙ බඳිනවුන් බලන්නා සේ මෙෂ විකාරයක් නැතිවැ බැලූහ.

මෙසේ කිසි කෙණෙකුන්ගේ උපදෙශයක් නැතිවැ තමන්ගේ විශුඬවූ බුඩින් පළමුවන දැන පාරමිතාව හා දෙවන ශීල පාරමිතාව දුටු **මහා සුරුෂයානන් වහන්සේගේ** ශ්‍රීපාද වඳුය මා මුදුනෙහි තබා පුදා වැඳැ එවැනි කුසලින් සියලු සතුව යාගේ සතුටු මුහුණු බැලිය හෙම්වයි! මාගේ සතුටු මුහුණ සියලු සතුවයා බැලිය හෙත්වයි!

මෙසේ දෙවන ශීල පාරමිතාව දුටුවාවූ නිරවඩි නිරුපඩි ගුණ ගණ නිධානවූ **සුමෙඩ නාපස සාමි දරුවානන් වහන්සේ**:-තවද බුඩ කාරක ධම්මයන් සොයා වදුරණ සෙයෙක් **තුන් වනුවූ** සකල බොධි සතුව විකුමෙ'ක සාඩ්‍ය **නෙෂක්‍රම්‍ය පාරමිතාව** දැකැ වදුරා තමන් වහන්සේම තමන් වහන්සේට :-

"සුමෙඩ පණ්ඩිතයෙනි, තොප විසින් සවී බොධි සතුව සඳහට මහා බොධි සතුව ප්‍රසව සාමථ්‍ය විශෙෂ ඇති සකල ප්‍රව්‍රජ්‍ය ගුණ ගණ මාණික්‍ය මහා නිධානවූ **නෛෂක්‍රම්‍ය පාරමිතාව** දක්නා ලදැ. එහෙයින් තොප විසින් භවාශාව හැරැ නිරනතරා' 1 බහාසිත විභවා'භිප්‍රායයෙන් **අති වාසාභ රොග** උපදුත ජනපදයෙන් තමාගේ ගෙයි භිකති බිදැ ගෙණැ යන්නාවූ පුරුෂයක්හු නිරපෙක්ෂවැ ම ක්ෂෙම ස්ථානයකට නික්මෙන්නා සේ අනවරතයෙන් **පඤ්චකාමා'නුභවයෙහි සඤ්ජාතවූ** සංවෙගයෙන් **මහාභිනිෂ්ක්‍රමණය** කටයුතුයැ"යි අධිශ්ථාන කොටැ වදාළ සෙයෙක.

හිසැ එක නරයක් දැකැ සුවාසූදහසක් හවුරුදු විඳිනා චතුවතීති සම්පත්ති හා සමාන සම්පත්ති හැරැ ගත්නාවූ **නප සවී වෙශය** මේ කළ අධිශ්ථානයට ම සුදුසුයැ. මෙසේ තුන්

1 හාවිත.

වන නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දුටු **මහාපුරුෂඥානෝ** නවද බුඩ කාරක ධම්මයන් සොයා වදුරණ සේක් **සතරවනුවූ ප්‍රඥා පාර මිතාව** දැකැ වදුරා–1 සර්ව්වඥතාඥාන සම්භවෛක' බිහිරයමානවූ නෙත්‍රයට වඩා අතිනෙත්‍රවූ සකලා'ඥාශල ප්‍රවේශ ප්‍රතිඝෝපක ප්‍රතිහාරී ධුරන්ධරවූ 2 සර්ව්ව බොධි සත්ත්වා'නු ජානවූ ප්‍රඥා පාරමි තාව දැකැ වදුරා ආතම් චිනිය කොටැ:–

"**සුමෙධ පණ්ඩිතයෙනි,** තොප විසින් සර්ව්ව ගුණ පවිත්‍ර නිඝෝද නෛක 3 සඛණ්ඩ තූලිකායමානවූ සතර වනුවූ ප්‍රඥා පාරමිතාව දක්නාලද. හෝ තොම තොප විසින් ශරීරය හැරැ නො පවත්නා ජායාව සේ චිත්තය හැරැ නො පවත්නා පරිද්දෙන් පුරුදුකොටැ වැඩිය යුත්තියැ"යි අධිෂ්ඨාන කොටැ වදුළු සෙයෙකැ. **සම්භව කුමාරවැ** කෙළනට අතින් ගත් වැලි දමා පියා අතුරු වීථියෙහි වැලි කෙළනා අවස්ථාවෙහි සියලු **ජම්බු වීපයෙහි** විඥයන් විසින් නො කියාගත හුණු ප්‍රඥා බුඩ විලා ශයෙන් විසදුබව මෙසේ කළ අධිෂ්ඨානයටම සුදුසුමැ හුයි.

මෙසේ සතරවන ප්‍රඥා **පාරමිතාව** දුටු 4 නිපිඩ්‍ය ජාඩ්‍ය නිගඩ බඹ විවෙඡදන විදුබඩ කඤ්ඤවූ **සුමෙධ තාපස සවාමි දරුවෝ** නවද බුඩකාරක ධම්මයන් සොයා වදුරණ සෙයෙක් සකල බුඩකාරක ධම්ම ධුරන්ධරවූ **වීර්ය්‍ය පාරමිතාව** දැකැ වදුරා තමන් වහන්සේ ම තමන් වහන්සේට :–

"**සුමෙධ පණ්ඩිතයෙනි!** තොප විසින් පස්වනුවූ මේ **වීර්ය්‍ය පාරමිතාව** දක්නා ලද. හෙතෙම තොප විසින් දිවස භාගය හා අවිනාභාවී වූ සූර්ය්‍යයා සේ තොපගේ චිත්තය හා අවිනාභාවී කොටැ නිඛිය යුත්තේයැ"යි අධිෂ්ඨාන කොටැ වදුළු සෙයෙක. සොළොස් හැවිරිදි කුමාරවැ මහාසමුද්‍රයෙහි නී අක්‍රම විවර්ත්ත මානා'නික්‍රාන්ත නක්‍ර චක්‍රා'කුල වූ සාගර කුක්ෂියෙහි පොවා පඤ්ච වර්ණ පදමයෙන් 5 සැදුම් ගත්තා වූ ගෙදික් විලෙක දිය කෙළනා තරුණ රාජ කුමාරයන්හු සේ සත් දවසක් මුළුල් ලෙහි පිහිනූ පිහිනුම මෙසේ කොටැ වදුළු අධිෂ්ඨානයට ම සුදුසු මැයැ.

මෙසේ පස්වනු වූ **වීර්ය්‍ය පාරමිතාව** දැකැ තවද බුඩකාරක ධම්මයන් සොයා වදුරන්නාවූ ප්‍රඥා'විරොධ නිරොධ නිෂ්ප්‍රත්‍යූහ

1 සර්ව්ඥ ඥාන. 2 සර්ව්බොධි සත්වානුඥාන. 3 වර්ණතූලිකායමාන.
4 නිර්විඩ්. 5 සඤ්ජනන.

ප්‍රබෝධ ඇති සුමෙධ තාපසයන් වහන්සේ **සවනුවූ ඛන්තී පාරමිතාව** දැකැ වදාරා :-

"**සුමෙධ පණ්ඩිතයෙනි,** තොප විසින් දක්නා ලද්දා වූ සෑම ගුණවත් සකල සාධු ජන කාන්ත වූ ඛන්තී පාරමිතා තොම බුඩත්වයෙන් මනොරථය පිරෙණ තුරුත් නො හැරැ පිරිය යුත්තියැ"යි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක. සත් මැසි කුමාරවැ සුකුමාල වූ හස්ත පාදයෙහි නිඛණ වූ ඛාරා ඇති පොරොව හෙළන්නාවූ රජ්ජුරුවන් මුහුණෙහි අශ්‍රාන්ත මෙත්‍රී ඛාරායෙන් ආදී වූ නෙත්‍රොත්පල පත්‍ර හෙළා ලිම මෙසේ කළා වූ ප්‍රතිඥාවට සුදුසු මැය.

මෙසේ සවන **ඛන්තී පාරමිතාව** දුටු සොම්දරුවානෝ තව ද බුඩකාරක ධර්මයන් සොයා වදාරණ සේයෙක් සකල සර්ව්‍වඥතඥාන ප්‍රතිවෙධයට මහාකාරණ වූ සත්ගුණ'විරොධ නිත්‍ය වූ **සත්‍ය පාරමිතාව** දැකැ වදාරා මේ තොප විසින් දුටුවාවූ **සත්වන පාරමිතාව** නමන්ගේ ප්‍රාණයම ඒ සත්‍යය රක්නා සන්නාහ කොටැ සිතා ඒ ප්‍රාණය නසා ද තෙමේ නො නැසිය යුත්තේයැ"යි ඉටා වදාළ සෙයෙක. **පොසි සාදයා** අත්හි නස්නා ජීවිතයට නො සිතා බමුණට කළ ප්‍රතිඥාව බොරු වේ දෙහෝ යි සිතා දෙම්නසට පැමිණැ නැවත එම්' යි ඕහට ප්‍රතිඥා කොටැ රාජ්‍යයට ගොස් බ්‍රාහ්මණයාට ධන දී නැවත එම් කියාලා අවුත් නො ගියෙම් නම් හෙද මාගේ **සත්‍යයම** නුසුදුසු යයි ජීවිතයෙහි ආශා නො කොටැ පොරිසාදයාට ඔත් වන්නට නැඟී ගිය ගමන මෙසේ කළ ප්‍රතිඥාවටම සුදුසුය.

මෙසේ සත්වන **සත්‍ය පාරමිතාව** දුටු සොම්දරුවෝ තවද බුඩකාරක ධර්මයන් සොයා වදාරණ සෙයෙක් සකල බොධි පාක්ෂික ධර්මා'ධිෂ්ඨාන වූ **අටවනුවූ අධිෂ්ඨාන පාරමිතාව** දැකැ වදාරා, "සකල ලොක දුඃඛ ව්‍යපසමයෙහි එක දීක්ෂිත වූ **සුමෙධ පණ්ඩිතයෙනි !** තොප විසින් සර්ව්‍ව තථාගත මනොරථ 1 නිඝ්‍රා නිර්ඝට පරාක්‍රම ඇති මේ අට වනුවූ අධිෂ්ඨානය වර්‍ණ්‍ය සනා'රොහණය දක්වා අඛණ්ඩ කොටැ පිරිය යුත්තේය"යි ප්‍රතිඥා කොටැ වදාළ සෙයෙක. **චේමිය කුමාර** වැ සොළොස්

1 නිඝ්‍රාතොදදිඝේ.

හවුරුද්දක් මූළුල්ලෙහි ගලෙහි කොටා ලූ රුවක් සේ ඉඳුරා විකාරයක් නැතිවැ වැඩහොත් බව මෙසේ කළ ප්‍රතිඥාවට ම සුදුසුය.

මෙසේ අටවනු **අධිෂ්ඨාන පාරමිතාව** දුටු මහාපුරුෂයානන් වහන්සේ තව ද බුඩකාරක ධර්මයන් සොයා වදුරණ සෙයෙක් සමසත බුඩාඩතුරෙ'කම්හු වූ **නවවනුවූ මෛත්‍රී පාරමිතාව** දැකැ වදුරා "**සුමෙඛ පණ්ඩිතයෙනි!** නොප විසින් සකල මහාසත්ව මනොරථ නිෂ්පාදනෙ'ක චරිත්‍රපවිත්‍රවූ නවවනු වූ මෛත්‍රිපාරමිතා නොම දක්නා ලද. හෝ නොමෝ නිජනෙත්‍ර නිර්ශෙෂ කොටැ අසාධාරණෙ'තෘසාහයෙන් රක්ෂා කට යුත්තියැ"සි ප්‍රතිඥාකොටැ වදුළ සෙයෙක. සතුරු රජු නුදු අවුදින් සමෘඩ වූ සියලු රාජ්‍යය හැරැ ගෙණැ මහාවාර යෙහි ය සාල්ලෙහි බැඳැ එල්වූ කල්හි පවා ඔවුන් කෙරෙහි මෛත්‍රී කොටැ සහල්ලෙන් ගැලවී ආකාශයෙහි පළක් බැඳැ ගෙණැ වැඩැහුන් වැඩැ හිඳිම මෙසේ කළාවූ ප්‍රතිඥාවට ම සුදුසුය.

මෙසේ නවවනු වූ **මෛත්‍රී පාරමිතාව** දුටුවා වූ මහාපුරුෂයානන් වහන්සේ තව ද මත්තෙහි දු බුඩකාරක ධර්මයන් සොයා වදුරණ සෙයෙක් සකල බුඩ සිංහ සමනන චක්‍ෂුස් ප්‍රතිලාභයට නිරපෙක්ෂෙ'ක කාරණ වූ **දසවනු වූ උපෙක්ෂා පාරමිතාව** දැකැ වදුරා "**සුමෙඛ පණ්ඩිතයෙනි!** නොප විසින් ත්‍රිභුවන සාක්ෂි කොටැ දුටුවා වූ මේ **උපෙක්ෂා පාරමිතා** තොමෝ ජීවිත නිරපෙක්ෂවැ ද විශෙෂයෙන් රැක්ක යුත්තියැ"සි ප්‍රතිඥ කොටැ වදුළ සෙයෙකැ. ශ්‍රී ශරීරයෙහි එක් භාග යෙක්හි සඳුන් ගල්වන්නන් කෙරෙහි ද **එක්** භාගයෙක්හි බොල් කෙළ ඉස්නාවුන් කෙරෙහි ද එකාකාර වූ සිත් ලත් බව මෙසේ කළා වූ ප්‍රතිඥාවට ම සුදුසුය.

මෙසේ උතුකලිතො'තුකලිත භව කලමළ දුලීබඩි ලාසිත ඇති සුචරිත්‍රා'දුලීලිත වූ මහාසත්ව වූ බොධිසත්වයන් විසින් අනුමාර්ගණීය වූ සම්කරණීය සම්බොධි සංසිඳි සිඩ නෙතා'පදෙශා'සමාචාර්‍ය්‍ය ස්ථානීය වූ **දස පැරැමන්** දැකැ වදුරා ඔවුන්ම අනුලොමයෙන් ප්‍රතිලොමයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරත් සියලු සඒඥතා ඥානයට ධුර පැමිණැ සිටි මහාපුරුෂයානන් පළමු විවරණ පතුල් ලත් දවස් නිරූපදෙශයෙන් බුඩකාරක

ධම්මයන් සොයා දුටු පරිද්දෙන් ම නුඹ වහන්සේ ද ඔවුන් සොයා දුටු පරිදි ඉතා ආශ්චර්යීය සි සාධුකාර දෙන්නාක්මෙන් දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන බහල මහාපෘථිවි තොමෝ එක පැහැරී ගුගුරන්නට පටන් ගත.

මේ ගත් පටන ඔවුන්ගේ ආශ්චර්යයෙහි ජාති ජාතියෙහි හඬා නො විඩාවුන්නට ගත් පටනැ. අනුපම බොධිසත්ව ගුණ සඤ්ඤිනයෙන් සන්තුෂ්ට වූ **මෙරුපර්වතය** අධික වූ සුරා පානයෙන් මත්වූ යුනයක්හු සේ 1 සපතාකුලා'චලයන් හා එක් වැ අනවසීන වැ නටන්නට පටන් ගත. මේ ආදී ලොකො' තසව පවත්නට පටන්ගත් ක්ෂණයෙහි සකල නරා'මර බ්‍රහ්ම ගණයා විසින් නානා ප්‍රකාර සතුති ගිති පූජාඩහම කොටැ නමස්කාර කරමින් සිටිය දී **බොධි සත්ත්වයන් වහන්සේ** ව්‍යාකරණ ප්‍රතිලාභයෙන් සම්පූර්ණ වූ මනොරථ ඇති වැ ශ්වේත පදමවනයකින් පියා පැහැරී ආකාශයට නැඟි සවර්ණ වර්ණ **හෘතරාෂ්ට්‍ර** හංස රාජයකු සේ පූජා'සනයෙන් ආකාශ යට නැඟි **හිමාලයවනයට** වැඩි සෙයෙක.

මෙසේ මාගේ සවාමිදරු වූ ශාක්‍යසිංහ වූ ඡඩභිඥ වූ ධම්ම රාජ වූ සමන්ත භද්‍ර වූ සවාමි දරුවානන් වහන්සේ **දිපඞ්කර පාදමූලයෙහි** තමන් වහන්සේගේ ප්‍රාණ පරිත්‍යාග කොටැ සොයා ලද්දා වූ ශාන්ත වූ ප්‍රණීත වූ ඉෂ්ටා'ඵ සිද්ධිකර වූ සවී මඞ්ගලෙ'ක නිදුනවූ මා ඇතුළු සියලු සත්ත්වයා කෙරෙන් සියලු දුක් දුරු කොටැ සියලු අභිමත සම්පත්ති ඵලවන්නා වූ අනුපම වූ ආදි මධ්‍ය'න්ත කල්‍යාණ වූ **ධර්මරත්නය** සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

දිපඞ්කර සම්බුධ විවරණ කථා නිමි.

කොණ්ඩඤ්ඤ සම්බුධ විවරණ කථා.

මෙසේ ග්‍රාම්‍යීයෂ් මකරා'කර වූ විශ්ව ලොක ප්‍රියඞ්කර වූ **දිපඞ්කර ශ්‍රී ඝන** ශ්‍රී පාදමූල ප්‍රතිලබධ වූ ව්‍යාකරණ ඇති සුමෙධ තාපසයන් වහන්සේ **සම්භාරාශන් පාරමිතා** පූරණ'ඹි ප්‍රාශයෙන් දුස්තර සංසාර සාගරා'වතීර්ණ වැ සවකීය විචිත්‍ර පවිත්‍ර චරිත්‍ර සම්බන්ධයෙන් ත්‍රිභුවන පාවනය කෙරෙමින් භව යොනි ගති විඤ්ඤාණ සථිති සත්තා'වාසයෙහි කරුණා'වෘත

---

1 සපතාකුලාවල බර්බරකුලය හා එක්වැ.

පරිනයතවයෙන් ලොකාර්ථ පාණ්ඩත්‍යයෙන් විවිධා'ශ්‍රවයෙන් සාහිත්‍යයෙන් අඟුත රුහිත්‍යයෙන් බොධිපාක්ෂික ධම්ම සාඛත්‍යයෙන් ලොකෝ'තසව ප්‍රසවය කොටැ වැදෑරණ කල්හි දීපඞ්කර සවාමීන් පිරිනිවි පසු එක් අසඞ්ඛ්‍යයක් සවීඝු'ලොක විරහයෙන් එකා'ඞ්කාරවූ ජඟත්හි සවී සත්ත්වයන්ගේ අනලප සංකල්ප සිඩි කාරණාවූ එක් කපෙක්හි:-

ආලෝක සාමාන්‍ය වූ සවීසම්මාන්‍ය වූ නිර්'නිඝයප්‍රාඛාන්‍ය ඛන්‍යතාය සම්බඞ්ඛ බඳුර වූ පරම සෞජන්‍ය සම්භාවිත වූ **මඞ්ගණ්ඩිණ්‍ය නම් සවාමි දරුවානන් වහන්සේ** සොළසාසඞ්ඛ්‍ය කල්ප ලඤයක් පාරමිතා පුරා දෞම්මනස්‍යය සම්බඞ්ගයෙන් අකලඤිත වූ රුචිරා'මර චාමර ග්‍රාහිණී විභ්‍රම විභූෂිත වූ **තුෂිත** පුරයෙන් චුතවැ සමසතා'හිඤට වයතු සාඛත්‍යයෙන් පරම රම්‍ය වූ **රම්‍යවති** නම් රාජධානියෙහි සකලා'ද්භූත ප්‍රසූති නඳු වූ **සුනන්ද** නම් රජ්ජුරුවන් නිසා අනිවිඝිඤට සම්පත් සුඤවින් සවීලොක පූජිත වූ රාජ වංශයෙහි සුජාත වූ **සුණිඤා** නම් දේවින්ගේ කුඤියෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් වූ ප්‍රසව යෙන් සවී'ද්භූත ප්‍රසවය කොටැ ක්‍රමයෙන් වැඩි නවයුවති නයන වුලුක නිපෙය නව සෞවන ශ්‍රී මදිරායෙන් ජන නයන මොහනය කරණ අවසථායෙහි:-

ශාරද චන්ද්‍ර කාන්තීන් සුන්දරවූ නිජ දෙහ රුචිර ඇති **සුරුචි** නම් අග්‍ර මහිෂීන් වහන්සේ කුසින් සකල ලොක විදිතවූ **විජිත නම් කුමාරයා** උපන් කල්හි **ශුඛාවාස** බ්‍රහ්මාප ණීත නිමන්ත සන්‍දර්ශනයෙන් සංසාරයෙහි උවිඟනවැ ප්‍රව්‍රජ්‍ය යෙහි සාභිලාෂ වැ **මහාභිනිඤ්ක්‍රමණය** කොටැ දස කෙළක් පමණ මහජනයා කැවිවැ මහණවැ දස මසක් **මහාවිසථ්‍ය** කොටැ **වෙසක් මසැ මැදි පොහෝදා** සුරෙන්ද්‍ර සමානවූ ආඪ්‍ය ජනයා විසින් ආකීර්ණවූ **සුරෙඤ්ජ** නම් ගම්හි චාරු බිම්බා ඛරවූ පින පයොධරවූ **යශොධරාවන්** දුන් නිවී පිඬු පිළිගෙණැ වළඳා සාල වනයෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි ගණයා හැරී **සුවඤ්ඣ** නම් ආජීවකයා දුන්නාවූ අට මිටක් නණ පිළි ගෙණැ සකල ලොක කල්‍යාණවූ **සාලකල්‍යාණ** වෘක්ෂමූලයෙහි අට පණස් රියන් **වජ්‍රාසනයෙහි** චතුරඞ්ග වීර්‍යා'ධිෂ්ඨාන පූවී ඞගම වැ වැඩැ හිඳැ මාරා'භඞ්කාර නීහාර සංහාර ද්වාකරවැ ප්‍රත්‍යූෂ කාලයෙහි සම්බිගත සවීඥතා ඥානය ඇතිවැ ක්‍රම යෙන් **ධම්මක්** පවත්වා ග්‍රාම නිගම රාජධානියෙහි සැරිසරා වඩනා සෙයෙක් **චඤවති** නම් රාජධානියට පැමිණි සෙයෙක.

එ සමයෙහි අප සම්මාසම්බුදු රජාණන් වහන්සේ එනුවරෙහි 1 ධම්මා'නුවත්තිවූ විනයානුවත්තිවූ චක්‍රවත්තිවූ මහරජ වැ නම්න් ඛිජිතාවී නම් වැ කෞණ්ඩිණ්‍ය සවීඥයන් වහන්සේ නමන් වහන්සේගේ නුවරට වැඩිබව අසා 2 නහෝ'දිත චන්ද්‍ර මණ්ඩලා'භිමුඛවැ ගමන් ගත්තාවූ පියූෂ පාන රසිකවූ චකෝර සාඛකයක්හු සේ සවීඥයන් වහන්සේට පෙර ගමන් කොටැ බුඩ ප්‍රමුඛ භික්ෂූසඞ්ඝයා වහන්සේට මනොහරවූ ආහාර විහාර යෙන් තුන්මසක් උපස්ථාන කොටැ වදාළ සේක. එ බදුවූ ඒ මහ සඞ්ඝාරාම දුටු ඒ සවීඥයන් වහන්සේ මේ මහාපුරුෂ තෙම මේ මහාදානයෙහි අනුසසින් අනාගතයෙහි ගෞතම නම් සම්‍යක් සම්බුඩ වෙයි කියා දීපඞ්කර සවීඥයන් වහන්සේ වදාළ පරිද්දෙන්ම තමන් වහන්සේ ද විවරණ පතුල් දී වදාළ සේ යෙක.

එ බස් ඇසූ ඒ මහාපුරුෂයානන් වහන්සේ 'මම අනා ගතයෙහි ගෞතම නම් සම්‍යක් සම්බුඩ වෙම් ල! එසේවූ මට මේ අසිරවූ චක්‍රවත්තී රාජ්‍යයෙන් ප්‍රයොජන නැතැ'යි රාජ්‍ය තෘෂ්ණයෙහි නිරභිලාෂවැ බුඩ ශාසනයෙහි මහණවැ පිටක ත්‍රය ඉගෙණැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍ය්‍ය වසානයෙහි බ්‍රහ්මලොකයෙහි උපන් සෙයෙක.

මේ මාගේ සවාමි දරුවූ සවීඥයන් වහන්සේ විසින් සප්ත රත්න සමලඞ්කෘතවූ සතර ඍඩිඝණින් යුක්තවූ සතිස් යොද නෙක්හි පැතිරී ගෙණැ සිටිනා මහාපරිවාර ඇති චක්‍රවත්තී රාජ්‍යය නානාවිධ ශව ශත නිවිතවූ අමු සොහොනක් සේ හැරී පියා බුඩ ශාසනයෙහි මහණවැ නොයෙක් ලෙස බොධි සම්භාර ධම්මයන් පුරා ඝනය මුඟුකුරුවා අනන්තයෙහි වජ්‍රාසන යෙහි වැඩ හිඳැ සවයම්භූඥානයෙන් පසක් කළාවූ ධම්ම රත්නය සරණ යෙමි සි **දහම් සරණ යා යුතු.**

කෞණ්ඩිණ්‍ය සම්බුඩ විවරණ කථා නිමි.

මඞ්ගල සම්බුඩ විවරණ කථා. මෙසේ අසඛ්‍ය දසබල ගුණ පූරණ මණ්ඩිත කෞණ්ඩිණ්‍ය නම් ශ්‍රීඝන ශාසනා'නන්තඥානයෙහි පටන් එක් අසඞ්ඛ්‍යයක් මුළුල්ලෙහි ශ්‍රීඝන ඝනාඝන ප්‍රවචනා'මෘත ධාරා'භිෂෙක යෙන් ලොක නිර්‍වෘතියක් නො වූ කල්හි පරම දුඃඛා'ක්‍රාන්තවූ

1 ධම්මානිවත්තිවූ. 2 නවොදිත.

සතුව වඟිහයා සච්ඡිහා'පවඟිහ මාඟිහ රසානභිඤුතවැ අඤුන මහා සාගරයෙහි නිමගන වූ කල්හි නිවිකලප ධම්ම සඬකලප නිරන්තරවූ එක් කලපා'නන්තරයෙක්හි සඩම්දරුවෝ සතරදෙ නෙක් ලොකයෙහි පහළවූහ.

එහි ආවිඩිභාවිත විශ්වලෝ'කෙක මඩගලවූ **මඬගල** නම් සව්ඇම්දරු කෙණෙක. සච්දෙශනා වසන්ත ශ්‍රී සමපාන විකශිත කෘතා'ධිකාර සුමනසුන් ඇති ධම්මාමෘත රසා'සවාද **සුම** නස්වූ **සුමන** නම් එක් සව්ඇම් දරුකෙණෙක. නිජා'ද්භූත විශෙෂ විරාජිත වසුන්ධරා මණ්ඩල ඇති **රෙවත** නම් එක් සව්ඇම් දරු කෙණෙක. නිවීඤජ ධම්මරාජ ලඤම් ශොභිතවූ **ශොභිත** නම් එක් සව්ඇම්දරු කෙණෙක.

මෙහි **පළමු** වනුවූ නිරසත සමසතා'මඩගලවූ **මඬගල** නම් සව්ඇම් දරුවානෝ සොළසා'සඬඛ්‍ය කප ලඤෂයක් මුළුල්ලෙහි පාරමිතා පුරා තුන්වන ආත්මභාවයෙන් චුතවැ විවිධ මණි මරීචි රැවිර **තුෂිත** පුරවරා'ධිරුඪවැ එහි ආයු පමණින් ශ්‍රී වළඳ දෙවතාවන්ගේ ආරාධනා හිවිසැ **පඤචමහා විලොකනය** කොටැ **තුෂිත** කායයෙන් චුතවැ සකල සම්පත්තීන් නිරැත්තරවූ **උත්තර** නම් නුවරෙහි ලොකොත්තර ගුණ ගණා'භිරාමවූ **උත්තර** නම් මහ රජානන් වහන්සේ නිසා සෞභාග්‍ය ලඤම්න් සුන්දරතරවූ **උත්තරා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් ප්‍රසව ශ්‍රියෙන් සකල ලොකා'නන්ද සඤෙහ නිදහනවැ ක්‍රමයෙන් වැඩි වඅසට පැමිණැ **පඤචේන්ද්‍රිය** මධුකර බාල සන්තපී'ණෙක මධු රසික **පඤචකාම** ගුණෙක නිධානවූ ශීලවතීවූ රූපවතීවූ ගුණවතීවූ කුලවතීවූ **සඅසවතී** නම් දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති දහස් අඹුවන්ගේ මදන දහ නිවීඨපණයෙහි අභිනව **කර්පූරහාර**වැ ප්‍රිය ශිලිවූ **1 සිලවත් කුමාර** මඤජරී ග්‍රහණයෙන් **සඅසවතී දෙවි** ලතාව සනාථවූ කල්හී සකල පූජා නිමිත්ත දකැ පූජිත ශරදඟ පිණ්ඩ පාණ්ඩුර වූ **පාණ්ඩර** නම් අශ්වරාජයා පිටින් **මහාභිනිඝ්‍රමණය** කොටැ තුන් කෙළක් මිනිසුන් හා කැටිවැ මහණවැ අට මසක් **මහාවිඅසී** කොටැ **වෙසක් මසැ** **මැදි පොහෝ** දවස් :-

උත්තර නම් නුවර **උත්තර** නම් සිටානන්ගේ **උත්තරා** නම් දියනිය විසින් පිළිගන් වන ලද කිරි පිඬු වළඳා සල්වෙනෙහි

1 ශීලමක.

දිවා විහාර කොටැ සවස් වේලෙහි උතුරනම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් නණ ගෙණැ සකල ලොක භාගධෙයෙ'කවූ බොධිසත්ව රාග ක්ෂය කරවූ විශ්වාදමාන ඝන පරාග ධාරා සුරභි භූත වූ නිජ රූප ලක්ෂ්මී දිදෘක්ෂා'නම් ලිත මත්ත මධුකර කාඤ්ඡ මණ්ඩලොප'ශොභිත කුසුම කලාප ඇති ඒ බොධිවෘක්ෂ රාජයා විසින් බොනු ලබන්නාවූ රූප කාන්ති ඇත්තාක්හු මෙන් නාගබොධි මූලයට එළඹැ අට පණස් රියන් වප්‍රාසනයෙහි චතුරඞ්ග විශ්‍යාබි'ඥානයෙන් වැඩැ හිඳැ ඛර නඛර ප්‍රකර ප්‍රතිම ප්‍රමථන දුර්ධාර කෙශරී කිශොරී හුංකාර ශ්‍රවණ කාතරීභූත කලභා'කුල ලීලායෙන් මාර බල ප්‍රලය කොටැ යාමත්‍රයෙහි ඝනත්‍රයා'ධිගම කොටැ අරුණෝදය තා සමධිගත සර්ව ඥ ඝන විලාසයෙන් විශ්ව ඥෙය මණ්ඩලය ප්‍රතිච්ඡාදක මොහ සෙනාම විඝාය කොටැ සම්‍යක් සම්බුධ වැ නමන් වහන්සේ බොධි සත්ව භූමියෙහිදී දරුවන් දන් ගත් යකු නමන් වහන්සේ බල බලා සිටියදීම මුලපලා අලයක් කන්නා සේ ම දරුවන් කන වේලෙහි දෙ තොලින් වැහිරෙණ ලේ බල බලා මදකුදු දෙම්නසක් නො කොටැ මෙහි අනුසසින් 'මා බුදුවූ කල්හි මාගේ ශරීර ප්‍රභා දස දහසක් සක්වළ එක පැහැරැ පැතිරේවා !'සි කියා පැතූ ප්‍රාර්ථනාවට සුදුසුවැ අනූදසක් අවුරුදු මුළුල්ලෙහි විරූවාපී රන් රසයෙන් පිරුණු තුත්තක් සේ දස දහස් සක්වළ ගබ රැ දවහල යන විභාගයක් නොවන පරිද්දෙන් තමන් වහන්සේගේ ශරීර යෙහි සඛණ්ඩකානන්නින් පිරෙණා පරිද්දෙන් අනූපමවූ ශරීර ප්‍රභා ලදින් සත් සතියක් යවා බ්‍රහ්මාරාධනාව හිවිසැ ක්‍රමයෙන් ධම්මක්ක් පවත්වා ලොකය බුඩ ශ්‍රී වෛචිත්‍රයට චිත්‍රපට කෙරෙමින් ග්‍රාම නිගම රාජධානියෙහි ලොකාර්ථ සම්පාදන 1 ව්‍යාවෘතවැ වසන සෙයෙක.

එ සමයෙහි අපගේ සවාම්දරුවෝ බුදු මුඛයෙන් තමන් ලද්දාවූ විවරණ පතුලට වැදූ 'සමනිස් පෙරුම් පුරම්'සි කළ අධිඡ්ඣානයට හළ ආතම ප්‍රෙමයට ද කළි සත්ව කරුණාවට ද එක චිත්තෝත්පාද මාත්‍රයක් කලූදු විරොධයක් නො කෙරෙමි සි භවයෙන් භවයෙහි බොධි සම්භාර ධම්මා'ජිනයෙහි තත් පරවැ ඇවිදිනා සෙයෙක් එසමයෙහි සුරුචි නම්වූ එක් බ්‍රාහ්මණ ග්‍රාමයෙක්හි සඩ්මේකරුවිවූ සුරුචි නම් බ්‍රාහ්මණොත්තම යෙක් වැ සුගන්ධ සම්බන්ධ බන්ධුර පඳුමා'දර නිපාත ශිලීවැ

1 ව්‍යාවැ.

දිව ගත්තාවූ භාග්‍යවතුන් සේ සද්ධර්මරස ලොලවැ සම්බුදුයන් වහන්සේ කරා එළඹැ **මඟුල සම්බුදු** චන්ද්‍ර මණ්ඩලයෙන් වැහෙන්නාවූ සද්ධර්ම නැමැති චන්ද්‍ර කාන්තිය හෙත් හෙත් තමන්ගේ ලය චන්ද්‍රකාන්ත පාෂාණයක් සේ ද්‍රව කෙරෙමින් **මඟුල සම්බුදු දිවාකරයාගේ** නානා රස මධුර වචන කර නිකර සාධුයියෙන් තමන්ගේ මනොරථ නැමැති පදුමය විකාශයට පමුණුවමින් විකසිත දශබල මඟුල කමලොදරයෙහි නිරන්තර සම්පූර්ණවූ ධර්ම මකරන්ද සඤ්ඤයට තමන් ශ්‍රවණ මත්ත භ්‍රමර විභ්‍රමයෙන් යොමු කෙරෙමින් හිඳැ බණ අසා වදාරා–

කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ප්‍රධාන කොටැ ඇත් නාවූ සම්බුදුයන් වහන්සේට දන් දෙම් සි පවරා 'මම වූ කලි මාගේ සම්පත්තිය අධික හෙයින් දන් දෙම්මය; මෙතෙක් පරිවාරයෙන් යුක්ත වූ සම්බුදුයන් වහන්සේ වැඩැ හිඳිනට සුදුසු සථානයෙක් මට දුලීහයැ'යි සිතා වදාළ කල්හි ඒ සිත දත් නාවූ **ශක්‍ර දෙවෙන්ද්‍රයා** වඩු වෙසින් 1 අවුදින් දෙලොස් යොදුන් ප්‍රදේශයෙක්හි සම්බුදුයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි 3 සව්ණ්ණ කාන්තිය ම වැජඹී ගොනැස ය, පේකඩ ය, දූව කඩ ය යනාදි ලෙසින් සිටැ ගත්තා සේ මනොහර වූ නානා සථාන යෙහි විලම්බමාන වූ කුසුමදාම කිංකිණික ජාලා සමාකුල වූ බුදුන් වහන්සේ හා කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ හා වැඩැ හිඳිනට සුදුසු සපත රත්නමය ආසනයෙන් යුක්ත මණ්ඩපයක් මවා දෙව් ලෝ ගිය කල්හි:–

ඒ මණ්ඩපයෙහි කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ හා සම්බුදුයන් වහන්සේ වඩා හිඳුවා සතර මහා සාගරයෙහි ජල සකඛය එක තැනට හයන්නා සේ චතු මධුරයෙන් යුක්ත වූ මහදන් සත් දවසක් මුළුල්ලෙහි දී අනන්ත දවස් කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේගේ පාත්‍රා පුරා හෙළ ගිතෙල්, වෙඩරු, මී, සකුරු, පැණි, දී එතෙක් දෙනා වහන්සේට තුන්සිවුරු දුන් සේකැ. ඒ සිවුරෙහි මාහැඟිකම් කෙසේ කියම් ද? හැම දෙනා වහන්සේ 2 කෙරෙන් පස්සේ වහන්සේ ලද සිවුර කෙළ ලක්ෂයක් අගනේය. මෙසේ මහදන් දුන් සොම්දරු වෝද 'මෙහි පෙලෙන් මම ද මතු බුදුවැ **නවලොකොත්තර** සද්ධර්මයන් ප්‍රත්‍යක්ෂ කෙරෙම්ව'යි කියා ධර්මයම පතා වදාළ සෙයෙක.

---

1 අවුත්. 2 ගෙන්. 5 සම්‍යක්සම්බුදු කාන්තිය

මෙසේ මහදන් දුන්නාවූ මහපුරුෂයානන් වහන්සේගේ උදුරාඩ්ගශය දුටු ඒමඞ්ගල නම් සම්බුද්ධයන්වහන්සේ ද 'මේ මහා පුරුෂ නෙමේ මේ දැනයෙහි අනුසසින් මතු ගෞතම නම් බුදු වෙයි' යනාදින් දීපඞ්කර සම්බුද්ධයන් වහන්සේ වදාළ පරිද්දෙන් විවරණ පතුල් දී වදාළ සෙයෙක. ඒ ඇසූ මහාපුරුෂයානන් වහන්සේ සම්බුද්ධාඥායෙහි නිබඳවූ මහොත්සාහයෙන් තමන් වහන්සේගේ ඇති වසතුව මුළුල්ල බුදු පාමොක් මහා සඞ්ඝයාවහන්සේට සිවු පසයට දී ඔවුන් වහන්සේගේ ශාසන යෙහි මහණවැ පිටකත්‍රයය ඉගෙණැ සතර ඛ්‍රහ්මවිහාර වඩා පඤ්චා'භිඥ අෂ්ටසමාපත්‍ති උපදවා ඛ්‍රහ්මලොකය සදෘ වදාළ සෙයෙක.

මෙසේ මහදන් දුන්නා ද වූ එසේ වූ මහාපුරුෂයානන් විසිතුදු අනික් 1 වයතුවෙන්හි ආසා නැතිවැ පැතුයේ බ්‍රහ්මයම පසක් කරන්නට ම ය. එහෙයින් 'මහතුන් විසින් මේ සා මහත් යත්නයකින් පතනලද සඞ්ඝම්මය අප විසින් අයත්න යෙන් පැමිණෙන ලදැ; එසේවූ ධම්මය සරණ ගොසින් සියලු අභිමතාර්ථය සැබිය යුත්තේයැ'සි සත්පුරුෂයන් විසින් දහම් සරණයෙම් සි **දහම් සරණ යා යුතු.**

මඞ්ගල සම්බුධ විවරණ කථා නිමි.

සුමන සම්බුධ විවරණ කථා. මෙසේ සචිරෙර ජෙත්‍ත සිරි

විරජ්ජෙන විලසිත විහත්‍ත ලොකාන්ධකාර පටල ඇති **මඞ්ගල සම්‍යක් සම්බුධයන් වහන්සේ** තමන් වහන්සේගේ අනාවරණඥානයෙන් සියලු වසතුන් කරා තමන් වහන්සේගේ 2 වණ්ණ ප්‍රත්‍යුපත්‍ති කරවා පිරිනිවන් පෑ කල්හි අතුරෙහි එක් බුඩානන්තරයක් ගිය කල්හි සචයං වරණ සඞ්ඝ ලාභ විරචිත විශ්වලොකාධි ගමන ඇති **සුමන** නම් සඞ්ඝාධිපරුවෝ සමතිස් පැරැමෙන් මතු පත්වැ තුන්වන අත් බැවින් සැවැ **තුෂිතපුරෙහි** පිළිසිඳ ගෙණැ එහි ආයු පමණින් කාමාවෙශ විවශ ලලිත වනිතා වදන පදුමවන රාජහංසවැ අන්‍යයෙහි දෙවතාරාධනා පිළිගෙණැ **පඤ්චමහා විලොකනය** කොටැ තුෂිත කායයෙන් චුතවැ:-

---

1 වයතුයෙක. 2 වණ්ණ ප්‍රාප්තිය.

*සෙෂමකර වූ **කෙෂම** නම් නුවර අසපිණ විතත වූ සුවිනිත චිත්තවූ **සුදසන** නම් රජ්ජුරුවන්ගේ කුලෙහි අසපිණවූ යෙහ. වන ශ්‍රී ඇති ශ්‍රීමතී නම් මහාදේවීන් වහන්සේගේ කුසැ පිළිසිද ගෙණැ සම්පුණ්ණ වූ 1 දශමාසානත්‍යයෙහි ප්‍රශව ශ්‍රීන් දශසහ ස්‍රීලොකධාතුව සදෘ ක්‍රමයෙන් යෙෞවනයට පැමිණැ දසදෘසක් නාටකසත්‍රින්ගේ විදග්ධ මුග්ධ සරස මධුර කටාෂනිෂෙෂ' පෙක පාත්‍රවැ 'චන්ද්‍ර,පවනෝ'පගමන සෛචරවාරි විහාර සංගීත 2 ප්‍රසඛාදි විවිධා'නුභාව විශෙෂයෙන් කල් යවා:–

සකල ශ්‍රුවති ජනා'වතංසක වූ **වතංසිකා** නම් දේවීන් වහන්සේගේ කුසපියෙන් 3 සෞඳෘයී සාගරයෙන් අනූපමවූ **අනූපමණ** නම් කුමාර රත්නය ප්‍රසවවූ කල්හි බ්‍රහෙමාපණීත **චතුෂටය** නිමිත්ත සඳෘශීනයෙන් ප්‍රව්‍රජ්‍යයෙහි සාභිලාෂවැ විචිත්‍ර සජ්ජා විශෙෂ බඤුර සිඤුර වරා'ධිරුඪවැ **මහාභිනිෂක්‍රමණෂ** කොටැ මනුෂ්‍යයන් තිස් කෙළක් හා කැපිවැ මහණවැ දසමසක් **මහාවිෂී** කොටැ වෙසක් **මස මැදිපොහෝ** දවස් විශව විභවා'නවම වූ **අනවම** නම් නුවරැ සම්පත්තීන් නිරූප මවූ **නිරූපම** නම් සිටානන්ගේ 4 විතෝ'පම වූ **අනූපම** න්ම් දියණියන් විසින් පිළිගන්වන ලද කිරිපිඬු වළඳා **සල්** වෙ නෙහි දිවා විහාර කොටැ සවස්වේලෙහි **අනූපම** නම් ආජීවක යා විසින් දෙන ලද්දාවූ අටමිටක් තණ ගෙණැ මඳ මඳර නාග විහ්‍රමයෙන් **නාග** බොධි මූලයට එළඹැ නිස්රියනක් පමණ **චක්‍රාෂනයෙහි චතුරඞ්ග වියූහාධිෂ්ඨාන** කොටැ වැඩැ හිඳැ මාර සෙනා'භිමාන මද්දන ප්‍රඛ්‍යාත කීර්තිපිණ්ඩ පාණ්ඩු රිත 5 භුවනා'භොග ඇතිවැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගම කොටැ බ්‍රහම මුහුතී ප්‍රාදුභීාව සමයා'විභූත බ්‍රහමානිබ්‍රහමභාව විභාවිත සඒඥවිලාස ඇතිවැ ක්‍රමයෙන් සත්සති යවා බ්‍රහමාරා ධනාව පිළිගෙණැ **ධම්මක්** පවත්වා සකල ජඥදෘ'නඥය කෙරෙ මින් ග්‍රාමනිගම රාජධානියෙහි චාරිකායෙහි වඩිමින් කෘතාධි කාරයන්ගේ කන් කන්හි ධම්මාමෘත නමමින් වසන සේක.

එ සමයෙහි අපගේ බොධිසත්ත්වයන් වහන්සේ නිජවාද නිහිත සමත්‍රිංශත් පාරමිතා පූරණ'ශායෙන් විවශවැ කරුණා යෙන් අශූන්‍යවැ ප්‍රඥයෙන් මතු පත්වැ ධම්මයට බැහැවී පාප යට ප්‍රතිපක්ෂවැ ජාති ජාතියෙහි සමරණීය රමණීය ගුණයෙන්

---

1 දසමාසානතයෙන්. 2 ප්‍රසහාදී. 3 සුසුදී සාගරයෙන්. 4 විරූපමවූ.
* මෙබලං නාම-අඤ්ඤා. 5 භවනා භොග.

ශුක්‍රතවැ භවයෙහි ඇවිදිනා සෙයෙක් නාග භවනයෙහි ප්‍රබලවූ තුලනාතික්‍රාන්ත වූ අතුල නම් නාගරාජ වැ 'අඤ' ලොක ප්‍රඥ'ලොක දයකවූ සුමන නම් සම්බුදුන් වහන්සේ ලොකයෙහි උපන් සෙයෙක' යනු අසා බුඩාලම්බණ ප්‍රිති සන්තති ප්‍රාදුර්භාව න්ඝරිතා'තමභාව ඇතිවැ එබදු මහා පුරුෂ යානන්ට මා විසිනුදු පූජාවක් කළ මැනවැ යි සිතා නාග භවන යෙන් නික්මැ සියලු මාර්ගය බුදු පුදයට ගත්තාවූ කඩුපුල් මලින් වසමින් කාලාගරු ධූප ද්‍රව්‍ය සම්පූර්ණ වූ කරණ්ඩක සන්තතින් නිරන්තරකෙරෙමින් දිව්‍ය කර්පූර චන්දනාදී සෞරභ්‍ය ප්‍රබඩ බන්ධුර කෙරෙමින් නාගවල්ලි දලයෙන් හරි තවූ නානා ප්‍රකාර විතාන වින්‍යාසයෙන් මනොහරවූ පූජොප කරණ විශෙෂයෙන් සකලා'කාශය නිරවකාශ කෙරෙමින් අතින් ගත් මිණිදඬුවැට පහන් හා පරිවාර නාගයන්ගේ හෙළෙහි බඳ කණ්ඨමණි ආලොකයෙන් සියලු මාර්ගය රුචිරතර තාරකා නිකරා'වතිර්ණවූ ගගනාඩම්බරය සේ මනොහර කෙරෙමින් අමිත වල්ලිතා'වලිත කෙතු පතාකා විජෘම්භන යෙන් සමූහත නෙත්‍රොං'තසව ඇති නාග භවනයෙන් නික්මැ:-

'සඩම්මය අසම්' යන රිස්සෙන් අදනා ලබන්නක්නුමෙන් බුඩ රූපය දක්නා රිස්සෙන් මෙහෙයන ලබන්නක්නු මෙන් අවුත් කෙළලඤ්ඣයක් භික්ෂූන් වහන්සේ පිරිවර කොටැ ඇති සම්බුදුයන් වහන්සේ දැකැ වඳිමින් පැදකුණු කෙරෙමින් එකත් පස්වැ ඖදැ ධම්මා'මෘතයෙහි කන් ගලා රූපා'මෘතයෙහි ඇස් ගලා රමණීය සම්බුදු ගුණානුසමරණය කෙරෙමින් නිරවද්‍ය වූ 1 වාද්‍යයෙන් හා විවිධ ලයානු'වතීනි නෘත්‍යයෙන් හා රස නිර්හරිත ගීතයෙන් හා සුහෘදය හරණ ප්‍රවණ චාරු වාණියෙන් හා රස විශෙෂ නිරංශ වංශ නාදයෙන් හා 2 ආවිර්භාවිත හෘදයා'නන්ද කන්දල මද්දල නාදයෙන් හා මෙයින් පිටත් නානා ප්‍රකාරවූ සංගීත විද්‍යා'පයොගී වූ වාද්‍ය විශෙෂයෙන් හා බුඩ පූජා කොටැ වදුරමින් තුන් සිවුරු ඇතුළු වූ මහදන් දෙමින් එසේ වූ පූජා වක් කොටැ ඒ සා මහත් දානයක් දී ද අනික් සම්පත්තියක් නො පතා මෙහි පෙලෙන් මම ද නිරුපදෙශයෙන් නව ලොවු තුරා දහම් පසක් 3 කටැ හෙම්ව යි කියා සඩම්මා'ධිගමය ම පතා වදාළ සෙයෙක.

---

1 අස්‍රෞස්‍රෝ. 2 අවිර්භාවක. 3 කොට හෙම්වයි.

සවීඥයන් වහන්සේ ද මේ මහානුභාවයාට මේ දැනයෙහි මේ පූජායෙහි බලයෙන් මතු කවර සිඩියක් වේ දෝ හෝ යි 1 සිතා වදුරණ සෙයෙක් මතු තමන් වහන්සේ සේ ම බුදුවන බව දැනැ සිටුවණක් පිරිස් මැද 'මේ මහාපුරුෂ තෙම අනාගතයෙහි **ගෞතම** නම් සම්‍යක් සම්බුඩ වෙයි" යනාදින් **දීපඞ්කර සවාමීන්** වහන්සේ වදාළ පරිද්දෙන් ම විවරණ පතුල් දී වදාළ සෙයෙක.

එ බස් ඇසූ සවාමිදරුවෝ මම අනාගතයෙහි බුදු වෙම්ල! යි එම සමතිස් පැරැම් පිරීමෙහි දැඩ ග්‍රහණය කොටැ වදාළ සෙයෙක. මෙසේ මාගේ සවාමිදරුවන් නාගා'නුභාවයෙහි සිටැ පොවා බුඩ ශාසනයෙහි මහාපරිත්‍යාග කොටැ මෙම ධම්මය ම පැතූ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් මෙසේ මහතුන් විසින් පතනා ලද්දාවූ සවී බුඩ ප්‍රත්‍යෙක බුඩ නිසෙවිත වූ චිත්ත ඉදුරි කාරණ වූ සඩම්මය ම සරණයෙමෝව යි **දහම් සරණ** යා යුතු.

සුමන සම්බුඩ විවරණ කථා නිමි.

රෙවත සම්බුඩ විවරණ කථා. මෙසේ **සුමන සම්‍යක් සම්බුඩයන් වහන්සේ** ත්‍රෛලොක්‍ය ශිඛා මණි විලාශ දක්වා පරිනිඵපන්න වූ බුඩ කෘත්‍යය ඇතිවැ පිරිනිවන් පෑ කල්හි ශාසනයද ක්‍රමයෙන් අන්තර්ධානයට පැමිණි කල්හි ක්‍රමයෙන් එක් බුඩාන්තරයක් ඉක්මුණු කල්හි සමත්‍රිංශත් පාරමිතා පූරණ ප්‍රාවිණ්‍ය ප්‍රතිලබ්ධ ප්‍රඥ ප්‍රකෂී ඇති ලොකාඑ නිරත වූ **රෙවත** නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ **තුෂිත** පුරයෙහි ඉපිදූ ලලිතා'මිත දෙවතා වනිතා කටාක්ෂ ශූලකොටි සමුනමූලිත මානබන්ධ ඇතිවැ මධුපාන කෙලි රසිකවැ රූප, ශබ්ද, ගන්ධ, රශ' සප්‍රඡටව්‍ය, සම්‍යඵෂ්ප පඤ්ච විධා'ඤ්ඡ සන්තර්පී'නෙක සාඵෂ්ඡවැ ආයු පමණින් එහි සිටැ දෙවතාවන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ:-

අම්හ 2 ධනාවිත ධනධාන්‍යාභිධාන නගරවරයෙහි ත්‍යාග සත්‍ය, ශෞචයෂී, විපුල වූ **විපුල** නම් මහරජානන් වහන්සේගේ

---

1 බලාවදුරණ. 2 ධාන්‍ය විලිත.

කුලෙහි විපුලා නම් අග්‍රමහිෂීන් වහන්සේගේ කුසියෙහි පිළිසිඳෙණෑ දශමාසා'නන්තයෙන් ප්‍රසවවෑ ක්‍රමයෙන් වැඩී ප්‍රණීත රස මධුර'දර්ශන වූ සුදර්ශනා දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති දෙතිස් දහස් නාටක සත්‍රීන්ගේ කුච කලශ සෙවර සඤ්චාරයට භවනෝ'පාන්ත සරසිවැ සුදර්ශනා දෙවීන් වහන්සේ කුසින් 1 හෘදයහරණ වූ වරුණ නම් කුමාරයන් වහන්සේ ප්‍රසව වූ කල්හි:-

බ්‍රහ්මා'පණීත නිමිත්ත විශෙෂ සඤ්ඥානයෙන් සඤ්ජාත සංසාර විරාග ප්‍රව්‍රජ්‍යා රාග ඇතිවැ මහා පරිවාරයෙන් ආජානිය රථයෙන් මහාභිනිෂ්ක්‍රමණ කොටැ කොටිප්‍රමාණ පුරුෂයන් හා එක්වැ මහණවැ සත්මසක් මහාවිර්‍ය කොටැ වෙසක් මස මැදි පොහෝ දවස් අකලඩක යශොධර සශොධරාභිධාන වනිතෝ'පණීත පායාසානුභව පූර්‍වාඛ්‍යම කොටැ සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි වරුණාභිධාන නම්වූ ආජීව කයා විසින් දෙන ලද අව මිටක් තණ පිළිගෙණැ විකච කුසුමොදර ප්‍රස්‍යන්දමාන මන්‍ද මකරන්ද බින්දු සම්බන්ධ සුරභි භූත නාගබොධි ද්‍රැමෝ'පසර්පණය කොටැ පසලොස් රියන් වප්‍රා සනයෙහි වැඩැ හිඳැ මාරවාරණ මාන විදාරණේ'ක පඤ්ඤා නනවැ සර්‍වඥතා ඥාන සමධිගමයෙන් සම්පූර්ණත්වූ මනොරථ ඇතිවැ සපත සපත්‍නහා'නික්‍රමණයෙන් බ්‍රහ්මාරාධනා පිළිගෙණැ අනන්‍යප්‍රවර්‍තනීය ධම්මචක්‍ර ප්‍රවර්තනයෙන් විනිවර්‍තිත සංසාර දෝෂ වෛශම්‍ය ඇතිවැ එතැන් පටන් අමා ගඟක් බහන්නක්හු මෙන් හෘදයා'නන්‍තයට බිජුවට වපුරන්නාක්හු මෙන් ලොකා'සවාදයෙහි අස් බිඳුනක්හු මෙන් ශීලයට ජය සතමහ හිඳුවමින් සමාධියට අභිෂෙක කරවමින් ප්‍රඥාවගේ ආඥා වෙහි මුළු ලොව පවත්වමින් ලොකාර්‍ථයෙහි තත්පරවැ වසන සෙයෙක.

එසමයෙහි අපගේ සවාමිදරුවෝ සමතිස් පැරැමෙහි අඛ්‍ඛ පුරමින් සෞජන්‍යයෙහි කුළු ගන්වමින් පරාක්‍රමයෙහි නිමාම් දක්වමින් බොධිසත්ත්‍වව්‍රතයෙහි මුල් බස්වමින් කාරුණ්‍යයෙහි තාරුණ්‍යය දුරු කෙරෙමින් ජාතියෙන් ජාතියෙහි සංසරණය කෙරෙමින් රම්‍යවතී නම් නුවර අතිදෙව නම් බ්‍රාහ්මණවැ වාතුර්‍වේද විද්‍යාස්ථාන මහා සාගර පාරගතවැ නානානුභාව යෙන් වෙසෙමින් බුදුන් ලොකයෙහි උපන් බව අසා භක්ති

1 හෘදයාභරණවූ.

ප්‍රසාද පුරස්සරවැ සවීඥයන් වහන්සේ කරා එළඹැ රූප නිරූපණයෙන් හා කණ්ණ'මෑත ප්‍රවචනා'කණ්ණයෙන් හා සඤ්ජා තවූ ප්‍රීති සෞමනස්‍යය ලෙන් උතුරුවන්නාක්හු මෙන් **සොලෝ දහසකින්** සතුති කොටැ වදුළ සේක.

මෙසේ සතුති කොටැ වදුරා අන්‍යයෙහි තමන් වහන්සේගේ දසරුවෙහි තුබූ දැසක් වටනා උතුරු සළුවෙන් පූජා කොටැ වදුළ සේක. මෙබඳු වූ සතුතියක් කොටැ පූජාවක් කොටැ ද අනිකක් නොපතා මෙහි පෙලෙන් මේ බුදුන් වහන්සේ විසින් පසක් කරණ ලද සඞම්මය ම පසක් කෙරෙම් වයි කියා සඞම්මය ම පතා වදුළ සේක. ඒ සවීඥයන් වහන්සේ ද ඔබගේ චිත්තාචාරය දැනැ "මේ **මහාපුරුෂ තෙම** මට තමා කළ සතුතියෙහි හා පූජායෙහි අනුසසින් මතු සවී ලොකොත්තම වූ **ගෞතම** නම් බුදු වෙයි"යනාදින් **දීපඞ්කර ස්වාමීන්** වදුළ පරිද්දෙන් විවරණ පතුල් දී වදුළ සේකැ.

මාගේ **බොධිසත්ත්වයන් වහන්සේ** ද සවීඥයන් වහන්සේගේ බස් අසා මතු බුදුවෙමි යි යන අදහසින් පාරමිතා පූරණයෙහි ම තත්පරවැ වදුළ සෙයෙක. මෙසේ මාගේ සවාමි දරුවූ **ගෞතම සම්‍යක් සම්බුද්ධවූ** සවාමි දරුවන් විසින් නොයෙක් යත්න කොටැ සංසාරයෙහි මහා දුක් ගෙණැ අන්‍යයෙහි බෝ මැඩැ වැඩැ හිදැ පසක් කොටැ වදුරා මහා කරුණාවෙන් ලොවට ප්‍රකාශ කළාවූ ශාන්ත වූ ප්‍රණීත වූ අමාමහ නිවන් දෙවන්නාවූ සඞම්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

රෙවත සම්බුද්ධ විවරණ කථා නිමි.

සොභිත සම්බුද්ධ විවරණ කථා. මෙසේ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ **රෙවත** නම් සවාමි දරුවන් පිරිනිවි කල්හි ශාසනයද ක්‍රමයෙන් 1 අන්තර්හිතවූ කල්හි එක් බුඩා'න්තරයක් ඉක්මුණු කල්හි සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇති 2 ආකාරණ කරුණා පලොහිතවූ චිත්ත ඇති **සොභිතත්තම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** දෙවනාවන්ගේ ආරාධනාව පිළිගෙණැ තුෂිත භවනයෙන් චුතවැ පරම ධර්මඥවූ **සුධර්ම** නම් **මහරජානන් වහන්සේ** නිසා පතී චූතා ධම්ම පර 3 **සුධර්මාවතී** දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි

---

1 අන්තර්ධානවූ. 2 අකාරණ. 3 පරවශවූ.

පිළිසිඳෑ ගෙණෑ ප්‍රසවවෑ ක්‍රමයෙන් වැඩි විචකිල දැඟින වූ අඛිල ගුණ ගණඟිරාම වූ අඛිල දෙවින් වහන්සේ ප්‍රධාන කොටෑ ඇත්තාවූ සැත්තෑ දහසක් නාටක සත්‍රීන්ගේ රති කෙළි ශ්‍රානන්ත කුචා'නන්ත නිම්නාන්ත සෙවදෑ'මිබුඩාරා නිම්නාර රති කලමවූ ඇතිවෑ කල් යවා දසදෑසක් හවුරුදු ගිය කල්හි පුරුෂ සිංහවූ සිංහ නම් කුමාරයන් උපන් කල්හි ඛ්‍රහෙමා'පණීත චතුර්ඩ පූජී නිමිත්ත සඤ්ඤීනාවඤානයෙහි දී ප්‍රාසාදයෙහිදී ම මහණවෑ සද්දවසක් මහාවිසර්ජ කොටෑ වෙසක් මසැ මැදි පොහෝදෑ අඛිල මහාදෙවින් විසින් දෙන ලද කිරි පිඩු වළඳෑ ප්‍රාසාදයෙන් බැසෑ නාග බොධි මූලයට නික්මෑ ක්‍රමයෙන් වජ්‍රාසනාරූඪවෑ පශ්චිමයාම සමනන්තර සමධිගත සම්‍යක් සම්බොධි ඇතිවෑ ක්‍රමයෙන් සත් සති යවා ඛ්‍රහමාරාධනා පිළිගෙණෑ ධම්මසක් පවත්වා ලොකාඑ කොටෑ වදෑරණ සේක.

එ සමයෙහි අපගේ බොධි සතන්‍රයන් වහන්සේ රම්‍යවති නම් රාජධානියෙහි ප්‍රවර වූ රූපධෙය ඇති රූපඝනවූ භාග්‍ය ධෙය ඇති සඒඤ ඤනධෙය ඇති ශ්‍රධෙය වූ කරුණාවිධෙය වූ සකල ලොකාභිධෙය වූ හෘදය සන්නිධෙය වූ 1 සුජාත නාම ධෙය වූ බ්‍රාහමණවෑ සඒඤයන් වහන්සේ කරා එළඹෑ සඛම්ම රසාසවාදය කොටෑ දුන් මෙ දවස් තුන් ලොව ම තමන් සරණ යන්නා සේ ද තුමූ ද එ දවස් තුණුරුවන් සරණ ගොස් බුදුන් වහන්සේ පවරා පඤ්ච මහා ගඞ්ගා ප්‍රවාහය එකතැනට නමන්නා සේ නානාවිධවූ මහදන් පවත්වා ඒ දන් කෙළ වරෙහි ලොකයෙහි පැනියයුතු සියලු වසතුන් අතුරෙන් එකද වසතුවකුත් නො පතා මෙහි පෙලෙන් මම අනාගතයෙහි මේ සම්‍යක් සම්බුඩයන් වහන්සේ පසක් කොටෑ වදෑළ සඛම්ම යම පසක් කට හෙම්ව සි කියා ප්‍රර්ථනා කළ සේක.

ඒ සඒඤයෝ ද අනාගතාංඤ ඤනයෙන් මහා පුරුෂයානන්ගේ මනොරථය සිඩවන බව දැන "මෙහි පෙලෙන් මහාපුරුෂතෙම අනාගත යෙහි ගෞතම නම් සම්‍යක් සම්බුඩ වෙයි" යනාදින් විවරණ පතුල් දී වදෑළ සෙයෙක. ඒ ඇසූ මහාපුරුෂයානන් වහන්සේ මම අනාගතයෙහි මේ බුදුන් වහන්සේම පසක් කළ සඛම්මඤ ම පසක් කෙරෙම්ල! යන අදහසින්

---

1 අජිත ජාතකඪ කථා.

එම සමතිස් පැරුම් පිරීමෙහි දෘඪග්‍රහණය කොටැ වදාළසේකැ. මෙසේ මාගේ සම්බුධයන් වහන්සේ විසින් ඒ ඒ ජාතියෙහි ඒ ඒ බුදුන් හමුයෙහී පතා ලද සබම්මයම සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

සොභිත සම්බුධ විවරණ කථා නිමි.

අනවමදර්ශි සම්බුධ විවරණ කථා.

මෙසේ එකාලොකී කෘත විශ්ව ලොකීවූ **සොභිත** නම් වූ සම්මා සම්බුදුන් වහන්සේ පිරිනිවි කල්හි එතැන් පටන් එක් අසඞ්ඛ්‍යයක් කප් මුළුල්ලෙහි කිසි බුඩොත්පාද මහොත්සවයෙක් ලොකයෙහි නො විය. එ හෙයින් ම මේ කතීව්‍යය, මේ අකතීව්‍යය, මේ මාඝීකය, මේ අමාඝීකය, මේ සාවද්‍යය, මේ නිරවද්‍යය, මේ සුචරිතය, මේ දුශ්චරිතයයි විභාගයක් නො දන්මෙන් අඥාන වූ ලොවට බුඩාදිත්‍ය විගමයෙන් මොහාන්ධකාර විජෘම්භනයම විය.

එසේ එක් අසඞ්ඛ්‍යයක් ගිය කල්හි සකල ලොක මනොරථෙ'ක නිෂ්පාදනෙ'ක කල්පවෘක්ෂවූ එක් කල්පයෙක්හි පරමාඵ දර්ශී වූ **අනවමදර්ශි** නම් සම්‍යාම්දරුවෝ ය, ශ්‍රමණ පදම්වූ **පදුම** නම් සම්‍යාම්දරුවෝ ය, අනවරාග්‍ර සංසාර දුවූ **නාරද** නම් සම්‍යාම්දරුවෝ යැ'යි මෙසේ සම්‍යක් සම්බුධයෝ තුන්දෙනෙක් ලොකයෙහි පහළ වූහ.

එහි අනොම නිර්‍වාණ දර්‍ශිවූ **අනොමදර්ශි නම් සම්‍යාම්දරුවෝ** සමතිස් පැරුම් පුරා තුසි පුරයෙන් චුතවැ සමපත්‍ති සාන්‍ද්‍ර වූ **චන්‍ද්‍රවති** නම් රාජධානියෙහි දුරවගාහ ප්‍රතාප භාසවත් වූ **යශවන්** නම්වූ මහරජානන් වහන්සේ නිසා අප්‍රතිහත යශොධරවූ **යසොධරා** නම් දෙවින් වහන්සේගේ කුක්‍ෂියෙහි පිළිසිඳ ගෙණැ පිළිසිඳ ගත් දවස් පටන් ගෙණැ අසූරියනක් තන්හි රැ දුවල් මුළුල්ලෙහි සඳ දහස් හිරු දහස් නැංගා සේ ආලොක පවත්වමින් මවූ කුසැ වැසැ දස මසෙකින් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී නයනොත්පාද යෞවන ශ්‍රීමත්වූ **ශ්‍රීමතී** නම් දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තාවූ සත්‍රීන් ලක්‍ෂයක් දෙනාගේ වදන වනජ විකාශ හාස්කාරවැ දස දසක් හවුරුදු ගිහිගෙයි වැසැ **ශ්‍රීමතී** දෙවින් වහන්සේගේ කුක්‍ෂියෙන් සකලලොක ප්‍රේමකාරණවූ **උපවාණ** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි:-

බ්‍රහ්මාපණීත චතුර්විධ නිමිත්ත සැලැකීමෙන් ප්‍රව්‍රජ්‍යා වෙහි සාභිලාෂවැ රත් සිව්ගෙයක්හි මහාභිනිෂ්ක්‍රමණය කොටැ තුන් කෙළක් මිනිසුන් හා එක්වැ මහණවැ දස මසක් මහාවිසීී කොටැ සකල ලොක විශොකත්ව කාරණවූ විශාඛ පූර්ණමාසිය එළැඹැ සිටි කල්හි අනූපම නම් බ්‍රාහ්මණ ග්‍රාම යෙහි 1 සිටි දියණී කෙණෙකුන් විසින් පිළිගන්වන ලද්දාවූ කිරි පිඬු වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොටැ අනොපම නම් ආජීවකයා දුන්නාවූ අට මිටක් තණ පිළිගෙණැ සජ්ජන පූජී තවූ මාරතර්ජන කරවූ අජ්ජුන බොධි මූලයට එළැඹැ:-

අටනිස් රියන් පමණ වප්‍රාසනයෙහි හිදැ දුර්වාර මාර තරුණ තරණී මණ්ඩලාග්‍රාසෙ'ක ධූමග්‍රහ වැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයය සිඛකොටැ පශ්චිමයාම සමධිගත සර්ව්‍යඥතා ඥාන ඇතිවැ සත්සති යවා බ්‍රහ්මාරාධනාව පිළිගෙණැ ධර්මචක්‍ර පවත්වා බැලූ බැලූ සතුවයන්ගේ ඇසැ ඇසැ සමතිස් පෙරැ මෙහි අඟහස් බදුවූ රුව අඳිමින් සියලු ලොව එක ධර්මශාලා වක් සේ කෙරෙමින් එක නිවන් නොටක් සේ එක කුසල් බවු පටනක් සේ එක ඇදුරු හලක් සේ එක ධර්මරත්න නිධානයක් සේ පවිත්‍ර කෙරෙමින් කුලයෙන් කුලයෙහි ග්‍රාමයෙන් ග්‍රාම යෙහි නිගමයෙන් නිගමයෙහි රාජධානියෙන් රාජධානියෙහි මොහ නිද්‍රා දුරැ කෙරෙමින් මෙෂන මුද්‍රාව බිඳිමින් සඛම්මා' මෘත නිෂේකය කෙරෙමින් වසන සේක.

එ සමයෙහි අපගේ සවාමිදරුවෝ ලොකාඑ නත්පරවැ බොධි පාඤ්ඡික ධර්මයන් මුනුකුරුවම්හි මරහුගේ විරොධ අසීර කෙරෙමින් ඇසි පිය එළාලන ඇසිල්ලකුදු සසරට ඔද වඩනා කටයුත්තක් නො කෙරෙමින් කරණ කටයුත්තෙහි බොධිසත්ව ධුරය සරහමින් යඤ්ඤ සෙනාධිපතිවැ බුදුන් ලොකයෙහි 2 උපන් බව අසා සතුටුවැ එළඹැ බණ අසා සත් රුවන් මඩුවක් නිමවා එහි සපරිවාර සර්ව්‍යඥයන් වඩා හිඳුවා මහදන් දුන්හ.

'බොධි සත්ත්වවූව! දෙවතාවූව!! බුදු කෙණෙකුන් දුට! දනට පටන් ගත! කවර ලෙස ඔහු දන් දෙද්ද? ඒ මම මෙලෙසකැයි කෙසේ කියා නිමවම් ද? එසේ සදිව්‍ය ලොක සම්පත්තිය එකවාර කරන්නා සේ මහදන් දුන් මහා පුරුෂයා

---

1 සිටු. 2 පහළ වූ බව.

නන් වහන්සේ අනිඤ්ඤ සම්පතනියක් ම නොපතා ම මෙම ධම්මය ම පසක් කෙරෙම්මැයි ධම්ම ලොභයෙන් ප්‍රාර්ථනා කොටැ වදාළ සේක.

සර්ඥයන් වහන්සේ ද ඔවුන් වහන්සේගේ අදහස් දැකැ "මේ මහා පුරුෂ තෙම මේ දැනයෙහි අනුසසින් මතු **ගෞතම** නම් සම්‍යක් සම්බුධ වෙයි" කියා **දීපඞ්කර ස්වාමීන්** වදාළ පරිද්දෙන් ම විවරණ පතුල් දී වදාළ සෙයෙක. එබස් ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද මම මතු බුදුවෙමි යි යන අදහසින් එම සමනිස් 1 පැරුමෙහි තතපරවැ වදාළ සේකැ. මෙසේ මාගේ සවාමිදරුවූ නිලෝඟුරු වූ **ශාක්‍ය සිංහයන්** වහන්සේ විසින් නොයෙක් උතසාහයෙන් පතා පසක් කලාවූ ධම්මය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

අනවමදර්ශි සර්ඥ විවරණ කථා නිමි.

පදුම සම්බුධ විවරණ කථා. මෙසේ ත්‍රිකාල දර්ශිවූ **අනවම දර්ශි** නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ පිරිනිවන් පෑ පසු එක් බුධාන්තරයක් අතිතවූ කල්හි පුරණ ලද්දා වූ සමනිස් පෙරුම් ඇති නිරුපම වූ බුඩ ශ්‍රී පදම වූ විකසිත මුඛ පදම වූ **පදම නම් සවාමිදරුවෝ** තුසිපුරයෙන් චුතවැ සකල ලොකාඵ සම්පාදක වූ **චම්පා** නම් පුරවරයෙහි සකල ගුණ ගණයෙන් අප්‍රතිසම වූ **අසම** නම් මහ රජානන් වහන්සේ නිසා කල්‍යතා සම වූ නතු ලතා විලාස ඇති 2 **අසමා** නම් දෙවින් වහන්සේගේ කුසියෙහි පිළිසිඳැ ගෙණැ ක්‍රමයෙන් ප්‍රසවවැ වැඩි රුචිර යෞවනාවතාර 3 පරම මධුරී භූත ශරීර ශොභාවෙන් ලොකොත්තර **උත්තරා** නම් මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තාවූ තිස්දහසක් නාටක සත්‍රීන්ගේ මධුරාධර චෂකොපනීත ගණ්ඩූෂ මධුපාන මත්තවැ දස දහසක් හවුරුදු යවා නිරතිශය සෙනහොත්තර වූ 4 **උත්තරා** නම් මහාදෙවින් වහන්සේ **පරම රම්‍ය** නම් කුමාරයන් වැදූ කල්හි:-

ඛහෙමාපණීත වූ චතුර්ඛ නිමිත්ත සඤ්ඤිනයෙන් සංසාර යෙහි උච්ඡනවැ ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂවැ නිර්ඤජ මනොරථ

---

1 පැරුම් පිරීමෙහි. 2 සමාති නම්. 3 පරම වධූ රමණීය.
4 සෙනහොත්තරා නම්.

සාධනීය වූ ආජානීය රථයෙන් මහාගිනිඤකුමණය කොටැ පුරු ෂයන් කෙළක් හා කැටිවැ මහණවැ අට මසක් මහාවිසථ කොටැ වෙසක් මසැ මැදි පොහෝදා ඛඤඤවති නම් ග්‍රාමයෙහි ධනය ශ්‍රෙෂඨියාගේ දූ වූ අතිධනය වූ ධනය්වතිය විසින් පිළිගන් වන ලද්දාවූ කිරිපිඬු වළඳා නයන මනොහරවූ මධුකරා'කර සහකාර වනයෙහි දිවා විහාර කොටැ නාසනිකාජිවකො පනිත අෂට තෘණ මුෂටි ග්‍රහණවැ තරුණශොණ පලලවාහි රාම මහාශොණ බොධි ද්‍රැමයට එළඹැ අට නිස් රියන් වප්‍රාස නයෙහි චතුරඩග වියහ්‍යාධ්‍යායන පූර්‍වාඩගමවැ වැඩහිදැ මාර සාහස ප්‍රභාව නව භානු ප්‍රතාන තුහින ලෙසයට පමුණුවා යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයය සිඩ කොටැ බුදුම මුහුනියෙහි සකල කාල දෙශ සවභාව ව්‍යවහිත කෘෂණ ශුකල හීන ප්‍රණීත සාවද්‍යානවද්‍ය නෙකවිසතු විසතරතතත්වාව භාවී වූ සවීඥතා ඥාන ලදින් ක්‍රමයෙන් සත් සති යවා බුහමාරාධනා පිළිගෙණැ ඛනඤඣොද්‍යානයෙහි වැඩැ හිදැ ඛම්සක් පවත්වා ඛම්ම මක රඳු සඤ්ඤහ නිෂ්‍යන්දු පදම වූ පදමනම් සවාමිදරුවෝ ක්‍රම යෙන් 1 ලොකානුශාසනා කොටැ වසන සේක්:-

එක් සමයෙක්හි මධුර ගුම්බ ගුමා'රව මුඛර මධුකර නිකර නිරන්තර වූ ප්‍රවල ප්‍රවාල 2 ජාලාදන්තුරවූ තරුණ සහකාර 'ඛකුර සවාද චපල කොකිල කුලයා විසින් කරණ ලද කුහ කුහාරවයෙන් මනොහරවූ 3 ශිතලචඡායායෙහි හොත්තා වූ තරුණ'රුණ හරිණ ගණයා විසින් කරණ ලද රොමන්ථයෙන් මන්ථර වූ මඳ මාරුතාන්දෙලිත වූ නව ලතා වනිතාවන්ගේ පලලවා'ඛකුරාභිඝාතයෙන් සන්තුෂටවැ ගත්තාවූ තරුණ පුෂපා'ඛකුර නැමැති රොමා'ඛකුර ඇති ජායා ද්‍රැමයෙන් හොඛ නාවූ සන්තතා'රබඛ වූ සිඛවිඤඣරෂන්ගේ සඛහින ප්‍රසඛ ඇති වන මහිෂ විෂාණ ඝානයෙන් ඝූර්ණිතවූ සරොරොධස් ඇති මත්ත මානඛඝයන්ගේ සථූල කපොල භිත්තින් වැහෙන් නාවූ දැන ධාරා නිපාතයෙන් සුරහි භූත වූ භූමිභාග ඇති කිසි තැනෙක්හි කපුරු සුණු සේ සුදු වූ වැලිතලා ඇති.-

කිසි තැනෙක්හි සිඛණ්ඩි මණ්ඩලයාගේ එකජීවිකාය මානවූ විසනිණ්ණ වූ සිතල ජල ඇති කිසි තැනෙක්හි නව ශාවල කම්බලාව'ගුණ්ඨිත වනසථලී සිමන්තිනින් ඇති කිසි

---

1 ලොකාථානුග්‍රහ කොටැ. 2 ජාලාදනතර වූ. 3 තන්හි සන්හි.

තැනෙක්හි විකසිත චම්පක වනෝද්භූත සෞරභ්‍ය ප්‍රසරයෙන් සුරභි භූත වූ වන මස්‍යක ඇති කිසි තැනෙක්හි උදගනී ශීතලගන්ධී විටප විගලිත පුෂ්පා'ඩකුරයෙන් කර්‍රුල වූ භූමි මණ්ඩල ඇති කිසි තැනෙක්හි විශාල සාල තරු 1 වනයන්ගේ නූතන ප්‍රශූන සම්පකීයෙන් පරම රමණීය වූ කිසි තැනෙක්හි විකසිත වකුල ධූලි පටලා'නයන පරිශ්‍රාන්ත මඤ්ජු මාරුත සන්තාපයෙන් දුරුකරණු ලබන්නාවූ ශරීර කලාන්ත ඇති කිසි තැනෙක්හි විනිද්‍ර සාන්ද්‍ර නාග පරාගා'නු රාගයෙන් පිඤ්ජරිත වූ පඒත නිකුඤ්ජ ඇති කිසි තැනෙක්හි ගිරි ශිඛරයෙන් වැහෙන්නාවූ නිර්ඣර ඣල්ලරීන්ගේ ඣංකාරයෙන් මනොහර වූ කිසි තැනෙක්හි සෛවර විහාර නිරත ශබර පුලිඳ සුන්දරීන්ගේ මධුර ගායනායෙන් මනොහර වූ වනයකට වැඩෑ:-

අචෙතසකවූ වෘක්ෂයන් විසිනුදු මන්ද'නිලා'ඤ්ජිතවූ නව මඤ්ජරී චාමරයෙන් ව්‍යධූයමානවැ පුෂ්පා'සවාද විදග්ධවැ හඬන්නාවූ කොකිලාවන් විසින් ම සඩ්ගියමානවැ වන සරසුන් විසින් පදම නැමැති මුඛයෙහි තබනලද රාජහංස නැමැති සකින් පුඹුනා ලදින් අන්‍යොන්‍ය ප්‍රීතියෙන් යුක්තවූ නිත්‍ය විරොධී සත්ත්වයන් පරම මෛත්‍රියෙහි රස දන්වමින් එක් වෘක්ෂයක් මූලැ ප්‍රශාන්ත චෛතන්‍ය'විරොධ ඇති නිරොධ සමාපත්තියට සමවැදූ වැඩැ හුන් සේක.

එ සමයෙහි මවම මවූ වූ මට ම පිය වූ මට ම සරණවූ මට ම පරායණවූ **ගෞතම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** ජාතියෙන් ජාතියෙහි ලොකාඵ කොටැ ඇවිදිමින් එම වනයෙහි දංෂ්ට්‍රාබලයෙන් බාහුබලයෙන් ඌරුබලයෙන් නඛ බලයෙන් මුඛ බලයෙන් සම්පන්නවූ රුචිර කෙශර විසර 2 විසඵාර සම්බන්ධයෙන් බන්ධුරවූ සාණ්ඩ සණ්ඩ ඇති සඨා'නොචිත වර්ණවිශෙෂයෙන් විරාජමානවූ අඛ ප්‍රත්‍යඛ ශොභා ඇතිවැ **සිංහරාජවැ** උපන් සෙයෙක.

සා වැ උපන් කලැ පවා සිංහ විලාස දක්වන්නාවුන් **සිංහවැ** උපන්කලැ කරන්නාවූ වික්‍රමය කෙසේ කියම්ද? ඔහු එ වල්හි වසම්න් වන ඝටායෙන් වන ඝටායට නිශ්ශඞ්කවැ ඇවිදිමින් පවනා'නුපාත විචලිතවූ තරුවනයන් විසින් දෙන කුසුමාඤ්ජලී පිළිගන්මින් විසි නිස් යොදුන් පමණ මහගල්

1 වරුන්ගේ. 2 විස්තාර.

ඇඟින් හෙන හැල්ලෙන් විසිරෙන ජල බිඳු 1 ඇඟැ ගස්ව ගස්වා රන් රිදී අතලෙඟි සිටැ සිටැ යෙහෙන් සැත පෙමින් කිසි තැනෙක්හි සුපඤ්ඤවූ ඇම්බුල්ලෙඟි තුඩු දී මධුර නාද පවත් වන්නාවූ කෙවිල්ලන්ගේ හඬට කණ 2නමා කර බිඳැ සිටිමින් කිසි තැනෙක්හි තමන් දැකැ පත පතඟි දිවන මතැත් කැල බලා දැඩිපයෙන් කර නහා සිටිමින් කිසි තැනෙක්හි පිපා සිත වැ පඤ්ච වණ්ණ පදමා'කිණ්ණවූ වන සරස්හි තුඩු ඔබා ද්‍රවැ ගියාවූ ඉඳුනිලමාණික්‍ය රසායමානවූ සිතල සලිල පානය කෙරෙමින් කිසි තැනෙක්හි දුරින් දැකැ මොහාඤ්ඤ කාරවැ එළඹෙන්නාවූ තරුණතර සිංහීන්ගේ අතරුණ සෙනහයෙඟි රස විඳමින් බුදුන් වහන්සේ වැඩැහුන් තැනට අවුත්:-

3 බුදුරුවන් බලා ඇස් අනික් දඹාවකට නමා ලිය නොහී එක පියවරකුත් අනික් තැනකට සොල්වාලිය නොහී ඇසිපිය හෙළාලන ඇසිල්ලකුදු කප් සියදහස් කොටැ සිතමින් නිවී සාදවූ ප්‍රේමයෙන් හා ප්‍රසාදයෙන් හා ආදරයෙන් නැම් නැම් වඳිමින් ගෞරවයෙන් කණ්ණ වාලඛිය ආදිවූ අවයවයන් නොසොල්වා පැදකුණු කෙරෙමින් ඇතුළෙඟි පිරී ගිය සෙනහය හෘදයෙන් උදගාරය පවත් වන්නාක්හු සේ තුන් වටෙක සිංහ නාද කොටැ බුඩා'ලම්බණ ප්‍රීතින් ගොචරයෙඟි ආසා හැරැ මෙ වැනි සඞ්ඝාමිදරු කෙණෙකුන්ට මාගේ ජීවිතයෙන් පූජා කෙරෙම්යි ශ්‍රීපාදමූලයට නුදුරුතැන්හි හිස තබා හෙවැ ගෙණැ සිත්නමැ ඇද්දූ රුවක් සේ ගල්හි කොටා දූ රුවක් සේ නිශ්චල වැ නිරොධ සමාපත්‍ති බලයෙන් සත් දවසක් මුළුල්ලෙඟි නිරාහාරවැ වැඩැ හිඳිනා සඞ්ඝාමිදරුවන් හා කැටිවැ බුඩා'ලම්බණ ප්‍රීති බලයෙන් තමන්වහන්සේ ද නිරාහාරවැ වැඩැ හොත් සෙයෙක.

එසේ වැඩැ හෙවැ අනික් වසතුවක් නොපතා "මේ ප්‍රසාදයෙඟි අනුසසින් මමද මේ සඞ්ඝාමින් දුටු නිවන් දහම් පසක් කටහෙම්වයි" පතා වදාළ සේක. ඉක්බිති නිරොධ සමාපත්‍තියෙන් නැඟි සම්‍යක් සම්බුඩයන් වහන්සේද මෙසේ වැඩැ හොත් සඞ්ඝාමිදරුවන් දැකැ 'මේ සිංහරාජනෙම අනාගතයෙඟි ගෞතම නම් ධර්මරාජවෙයි' යනාදීන් ව්‍යාකරණ දී වදාළසේක.

---

1 ගස්වම්ස්. 2 දමා. 3 බුදුරුව.

එබස් ඇසූ බොධි සත්ත්වයන් වහන්සේද 'මමද බුදු වෙම්ල! යන අදහසින් සමතිස් පැරුම් පිරීමෙහි ම තත්පරවූ සේක මෙසේ මාගේ සවාමිදරුවන් සිංහරාජවැ උපන්කලැ පවා සර්ඥයන්වහන්සේට දිවි පුදා සත් දවසක් නිරාහාරවැ හෙවැ මහා දෙළින් පහා ලද්දාවූ ආදි මධ්‍ය'නත කල්‍යාණවූ ධම්මරත්නයම මට අභිමතාර්ථ සාධා දෙන පිණිස සරණ කොටැ ගත්මි සි **දහම් සරණ** යායුතු.

පදුම සම්බුධ විවරණ කථා නිමි.

නාරද සම්බුධ විවරණ කථා. මෙසේ මනොමල දහන දුවා නලවූ **පදම** නම් සවාමි දරුවා නන්වහන්සේ ලොකා'ලොචන චකොර චඤ්චුකායමාන සවණී කානතීන් හා ශ්‍රවණීය පියූෂ නිෂෙක මනොහර භාරති විලාස යෙන් හා ජගදා'නන්දනය කොටැ අනතයෙහි නියති නියොගා නික්‍රමණ'සමර්ථවැ නිරූපධිශෙෂනිර්වාණ ධාතුයෙන් පිරිනිවි කල්හි ක්‍රමයෙන් ශාසනය අනතර්'ගිතවැ බුධානතරයක්(දු) ඉක්මුණු කල්හි තෘෂණා'භිලාෂ ලතොා'නම්ලන කෙළි විරදවූ **සමසභ** ලොක ශොක විනොද විදූ විශාරදවූ දුනා'ඛ්‍යාශයා නපෙක්ෂිත ප්‍රියපුත්‍රදරුවූ 1 භුවනා'භොගවත්‍යපි ශෙවත කීර්ති 2 පූරපාරවූ චරණ 3 සරණ'පත්තා ජනතා බ්‍රහ්ම විහාරදවූ සකල කලි සම්මා'පහරණ ප්‍රවීණ මහා නීරදවූ:-

නාරද නම් සම්‍යක් සම්බුධඝන්වහන්සේ සාරා'සඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි සමතිස් පැරුම් පුරා නිහිත මහිත පරිචිත පාරමිතා මහිමොා'පහිත මති පරිණාම ඇතිවැ **තුෂිත පුරයෙන්** චුතවැ (දෙව) දෙවසපර්‍ය්‍යාවූ ප්‍රතාප ඇති මහාදෙව ඇති **සුදෙව** නම් මහාරජානන් වහන්සේ නිසා **අනවමා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසව වැ ක්‍රම යෙන් වැඩී සකල කාම සෙනා නායකවූ **විරසෙනා** නම් මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති එක් ලක්‍ෂ විසි දහසක් පමණ ඇති තරුණවූ ඝුවතින්ගේ චරණ ප්‍රණාම ප්‍රණය ප්‍රසාද විදූ විදගධවැ නව දහසක් අවුරුදු යවා **විජිත සෙනා** නම් අග්‍ර මහිෂීන් වහන්සේ සකල ජන නයන මනොා නන්දනොා'නත රවූ **නන්දනොාතතර** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි:-

---

1 භුවනාලොකවත්‍යපි. 2 පූරපාරදවූ. 3 සරණොාපනත.

බ්‍රහ්මා'පණීත චතුර්විධ නිමිත්ත සඤ්ඤිනයෙන් සංසාර යෙහි කලකිරී ප්‍රව්‍රජ්‍යාවෙහි අභිලාෂවැ එක්වැ සැරහූ මහල කට නමාගත් සදිව්‍යලොකයෙහි දෙවතාවන් සේ සැදී පැහැදී නික්ම ගත් මහා පරිවාර ජනයන් මධ්‍යයෙහි ශ්‍රීපාදයෙන්ම උයනට වැඩැ මිනිසුන් ලක්ෂයක් හා කැටිවැ මහණවැ සත් දවසක් **මහාවිභූති** කොටැ **වෙසක් මසැ** මැදි පොහෝ දවස් **විජිතසෙනා** නම් අග්‍ර මහිෂීන් වහන්සේ විසින් දුන් කිරිපිඬු පිළිගෙණැ වළඳා එම උයන්හි දිවා විහාර කොටැ සවස් වේලෙහි සකල ලොක සුදැසිනවූ **සුදර්ශන** නම් උද්‍යාන පාලයා විසින් දෙනලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ තමන්ගේ නාම මාත්‍ර සමරණය කළ සතළුවයාහට සචේ'හා'පවේ'හ මා'හා' රොපණය කරන්නාවූ **මහාසොණ** බොධි ද්‍රැම වර මූලයට එළඹැ:-

අට පණස් රියන් පමණ **වප්‍රාසනයෙහි** වැඩැ හිඳැ යාමත්‍ර යා'ඛ්‍යාත ඤානත්‍රයය ඇතිවැ පශ්චිම යාම සමනන්තර සමඛ්‍යාත **සච්ඡුනාඤාණ** ලක්ෂණයෙන් සමයානෙයමණ්ඩලයෙහි ඒක රාජ්‍යය ලදින් සත් සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ එම උයන්හි **ධම්මක්** පවත්වා නමන් වහන්සේගේ කරුණායෙහි අඩු පුරණින් බුඩකෘත්‍ය මසතක ප්‍රාපත කෙරෙමින් ලොකයෙහි වසනසේක.

එ සමයෙහි අපගේ බොධි සතළුයන් වහන්සේ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චා'භිඤ අෂට සමාපත්‍රති උපදවා හිමාලයයෙහි වසනසේක. එසමයෙහි **නාරද නම්** සම්‍යක් සම්බුඩයන් වහන්සේ අපගේ බොධි සතළුයන් වහන්සේට අනුග්‍රහ කරණු කැමැතිවැ අසූ කෙළක් රහතන්වහන්සේ විසින් හා දසදහසක් අනාගාමී උපාසකවරුන් විසින් පිරිවරණ ලදුවැ බොධි සතළුයන් වහන්සේගේ පන්සලට වැඩිසේක.

ඒ බොධි සතළුයන් වහන්සේද **නාරද** ශ්‍රීඝන ශ්‍රීමුඛ සඤ්ඤිනයෙන් ප්‍රසඩ්ගාවිර්භූතවූ ප්‍රමොද පරම්පරායෙන් පරිපූරිතවූ අන්තඃ කරණ ඇතිවැ පෙරගමන් කොටැ නානා ප්‍රකාර අග්‍රන්තුක සත්කාර කොටැ තමන් වහන්සේගේ අභිඤ බලයෙන් අශ්‍රම පදයක් මවා එහි 1 පරිවාර සහිතවූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ වඩාහිඳුවා රාත්‍රිය මුළුල්ලෙහි ඔවුන් වහන්සේගේ පරම මධුරවූ ධම්මය අසා සිත්හි පතළාවූ ප්‍රීතිවේගයෙන්:-

---

1 සපරිවාර.

"ජය! ජය!! ශ්‍රමණ පදම !!!
ජය! ජය!! ශ්‍රමණ සිංහ !!!
ජය! ජය!! ශ්‍රමණ මාණික්‍ය !!!
ජය! ජය!! ශ්‍රමණ චන්ද්‍ර !!!
ජය! ජය!! ශ්‍රමණ භාස්කර !!!
ජය! ජය!! ශ්‍රමණ වනාංග !!!
ජය! ජය!! ශ්‍රමණ රාජහංස !!!
ජය! ජය!! ශ්‍රමණ ගුරු !!!
ජය! ජය!! ශ්‍රමණ ධීර !!!
ජය! ජය!! ශ්‍රමණ පියූෂපූර !!!
ජය! ජය!! ශ්‍රමණ ප්‍රදීප !!!

ප්‍රතිවාදි විශ්ව ගළී විශොෂණ ප්‍රලය මාතිණ්ඩ!
ප්‍රතිවාදි හරිණ ශාඛ විදූරණෛක **පඤ්චානන**!
ප්‍රතිවාදි තාල පණ්ණ සවූණ්ණා'නෙක **නිශිතාන පාන**!
ප්‍රතිවාදි මෘණාල නාල විශෝෂාහ කෙළි **දනනාවල**!
ප්‍රතිවාදි ඝොෂ 1 පරිවාරි විශෝෂණෛක **සම්මාවනාර**!
ප්‍රතිවාදි 2 මත්සරනක්‍ර 3 දුගීග්‍රාහ **සාගර**!"

යනාදින් නොයෙක් ලෙසින් සතුති කොටැ පහන්වූ කල්හි **උතුරුකුරු දිවින්** අහර ගෙණැ අවුත් එපමණ මහා පරිවාර ඇති සළඳඟයන් වහන්සේ සත් දවසක් වළඳවා අන්නයෙහි හිමාලයයෙහි සඤ්ජාතවූ අනඕවූ ලොහිත චන්දනයෙන් පූජා කොටැ වදුරා "මේ මා කළ කුසලින් මතු මේ සළඳඟයන් වහන්සේ සේ ම නව ලොකොත්තර සඩම්මය ප්‍රත්‍යක්ෂ කට හෙම්වයි" කියා ප්‍රාර්ථනා කොටැ වදාළසේක.

. ඒ සළඳඟයෝද ඔබගේ චිත්තාචාර 4 දැනැ 'මේ මහාපුරුෂ තෙම තමා කළ බුඩ පූජායෙහි හා බුඩ සෙවාත්‍රයෙහි අනුසසින් අනාගතයෙහි **ගෞතම** නම් බුදු වෙයි' යනාදින් විවරණ පතුල් දී වදාළ සෙයෙක. බොධි සත්වයන් වහන්සේද අවෙත වචනවූ සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ බස් අසාම 'මතු මම බුදුවැ දහම් පසක් කෙරෙම්ල!' යන අදහසින් බුඩ කාරක ඛම්මයන් පූරණයෙහි ම තත්පරවැ වදාළසේකැ.

---

1 පාදවාරි. පාදවාදි. 2 මසක. 3 දුගීහාසකර. 4 දැකැ.

මෙසේ මාගේ සවාමි දරුවානන් විසින් නොයෙක් සුචරිත සහස්‍ර පූරණයෙහි අනුසසින් නොයෙක් ලෙස පතා බොධි මූල යෙහි වප්‍රාසනයෙහි වැඩ හිඳ පසක් කළාවූ සකල කලාණවූ අති මධුරවූ ත්‍රිභුවනෙ'ක සරණවූ දහම් සරණයෙම්සි **දහම් සරණ සා සුතු.**

නාරද සම්බුධ විවරණ කථා නිමි.

පදෙමානතර සම්බුධ විවරණ කථා.

මෙසේ 1 ශාන්ත සධම්මාමෘත වර්ෂාවූ නාරද නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි ඒ ශාසනය ක්‍රමයෙන් අන්තර්හිතවූ කල්හි එයින් මතු එක් අසඛ්‍යයක් කප් ගිය ලෙහිම සම්බුධ *සුධා රසා'නභිඝූවූ සියලු සදාවලොකය චතුරපාය පාතනියනවැ මහා'ඝූහ භාජනවූහ.

එයින් පසුවැ මෙයට කප් ලක්‍ෂයකින් යටැ සමස්ත භුවන සඞ්කරවූ පරම මහත්තරවූ **පදුමුත්තර** නම් සම්‍යක් සම්බුධ යන් වහන්සේ සංසාර පූති ගතීන්මගනවූ විශ්වලොකයාගේ පවිත්‍ර සන්තානයට හෙතුවූ ධම්මමහාහ්‍රදය සංස්කරණයෙහි නත්තරවැ සමනිස් පැරැම් පුරා **තුෂිතපුරයෙහි** අග්‍රුපමණින් සිටැ:-

ධම්මයට වූ බැගෑ හා අධම්මයට වූ බැහැවුම් හා මොහය අභිභෙක 2 කළ පරිදි හා ඤ්‍රණය අසරණවූ පරිදි හා මිථ්‍යා දෘෂ්ටිය නිෂ්පන්නවූ බව හා තෘෂ්ණාව ජය ලද පරිදි හා මානස යඥය එකාග්‍රවයඥ ලද බව හා 3 ව්‍යාපාදය විශාරදවූ බව හා සත්පුරුෂධම්මය 4 නිදිගත් පරිදි හා අවිවේකය පැලඹී සිටි පරිදි හා දුටුවාවූ දිව්‍ය බ්‍රහ්මයන් විසින් තත්ප්‍රතිකාර 5 නත්ත රවූ පුරුෂාන්තරා'ලොභණ ව්‍යග්‍රවැ තමන් වහන්සේම දැකැ බුදුවන පිණිස ආරාධනා කළ කල්හි:-

පඤ්චමහාවිලොකනය කොටැ උදිතොදිත රාජහංස නිසෙවිත වූ **හංසවති** නම් රාජධානියෙහි සෞඛ්‍ය සුන්දරවූ ධෙයඥ මන්දිරවූ කීර්ති සාන්ද්‍රවූ වනිතා නයන මධුකර නිසෙවිතා'රවින්දවූ **ආනන්ද** නම් මහරජානන් නිසා **සුජාතා** නම් දේවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳ ගෙණැ දස මසක්

1 ඒශ්‍රාන්ත. 2 ලද පරිදි. 3 ව්‍යාපාරය. 4 නිගත්ඛව හා. 5 ප්‍රීතිකාර. * සිබානතරසා.

යවා මවුකුසින් ප්‍රසූතවැ, ප්‍රසව වන සමයෙහි සියලු ලොකො, නැවය හා සමග සක්වළ ගබ පුරා පියුම් වැසි වස්වා එයින්ම **පදුමුත්තරය** යන නම් ලදින් ක්‍රමයෙන් වැඩ අභිනව යෙඟවන පත්තනවූ ප්‍රණය ප්‍රසාද දත්තාවූ **වාසුදත්තා** නම් දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති ලක්ෂයක් පමණ නාටක සත්‍රින් ගේ විදග්ධ මුග්ධ ශෘඞ්ගාර කෙළි විනොද රසිකවැ අශ්‍රාන්ත චිත්ත සන්තපිණ භූධිඤ්ඣවැ දසදසක් හවුරුදු යවා **වාසුදත්තා** නම් අග්‍රමහිෂීන් වහන්සේ ප්‍රේම දූසතරවූ භාග්‍ය විසතරවූ **උත්තර** නම් කුමාරයන් වහන්සේ වැදූ කල්හි:-

සතර පූර්ණිමිත්ත දැකැ ප්‍රාසාදයෙන්ම මහාභිනිෂ්ක්‍රමණය කොටැ කැවිවැ ගිය පරිවාරයෙහි සත්‍රින් පිටත්වැ සෙසු පුරුෂයන් මුළුල්ල හා කැවිවැ මහණවැ සත් දවසක් **මහාඞ්ගීත්** කොටැ **වෙස්සන්මසැ** මැදි පොහෝ දවස් 1 අතක්‍රීයවූ ගුණඇති **රුවිනන්ද** නම් සිටානන්ගේ දියණියන් විසින් පිළිගන්වනලද කිරිපිඬු වළඳා සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **සුවිත්‍ර** නම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ තරුණ තර තරල පල්ලවා'භිරාමවූ **සාලබොධිය** පැද කුණු කොටැ අටනිස් රියන් **වජ්‍රාසනයෙහි** වැඩැ හිදැ තුමුල මාරබලා'වලෙප විලොප පූර්ඛගම කොටැ යාමත්‍රයයෙහි ඤානත්‍රයය ලදින් ප්‍රත්‍යූෂ කාලයෙහි ප්‍රත්‍යූහ ශූන්‍යවූ ධම්ම රජ්ජ'ධිගම කොටැ සියලු ජම්බුවිපයෙහි පඨමවෂ්ඊව වස්වා ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහ්මයාගේ ආරාධනාව පිළිගෙණැ. **ධම්මක්** පවත්වා නුන්ලෝ පවිත්‍ර කරන්නට පටන්ගත් සේක. එසමයෙහි පුත්‍රිකෘතවූ ඍර්සතත්වයන් ඇති අපගේ **මහාබොධි සත්ත්වයන් වහන්සේ** අනෙක කොටි ධන ඇති **ජටිඛනම්** රාෂ්ත්‍රිකවැ සර්ඥ ගුණ නැමැති මහාසාගරයෙහි තමන්ගේ පරිණාමෝ'නුබවූ ඤාන නැමැති දැසක් යොදුන් **ආනන්ද** නම් මනස්‍යයා සෙවර සඤ්චාර කරවා බුදුගුණයෙහි ප්‍රසන්නාවැ බුදු පාමොක් මහසඞ්ඝයා වහන්සේට මහදන් දී අනන්තයෙහි තුන් සිවුරු දී මාගේ මේ **මහාදානයෙහි** අනුසසින් මමද සියලු සත්ත්වයාගේ **දුඃඛ** නිර්‍වාපණයෙහි දිව්‍යෞෂධ **සඞ්ඝ්මය** මේ මහා පුරුෂයානන් සේම පසක් කට හෙම්වසි කියා සඞ්ඝ්මයම පතා වදාළසේකැ. ඒ සර්ඥයන් වහන්සේද "මේ දානයෙහි අනුසසින් මෙයින් කප ලක්ෂයකින් ඔබ්බෙහි **ගෞතම** නම් සම්‍යක් සම්බුඩවෙයි" යනාදීන් විවරණ පතුල් දී වදාළසේකැ.

---

1 අසන්‍යවූ ගුණ ඇති.

එබස් ඇසූ බොධිසත්වයන් වහන්සේ මම මතු 1 ලොව්තුරා දහම් පසක් කට හෙම්වයි යන අදහසින් එම සමනිස් පැරැම් පිරීමෙහි තත්පරවැ වදාළසේක. මෙසේ මාගේ සවාමි දරුවන්වහන්සේ විසින් ජාති ජාතියෙහි අනෙක ප්‍රකාර යත්න කොටැ පතා ලද්දාවූ හෘදය නිවීාපණය කරන්නාවූ සවීදුඃඛ සමතික්‍රාන්තවූ ප්‍රණීතවූ සවී බුඩ ප්‍රත්‍යෙක බුඩ ශ්‍රාවක මහා ශ්‍රාවකාදී මහාසුරුෂයන් නිෂෙවිතවූ සවීාථී සාධකවූ සඩම්මය සරණ යෙමිදි **දහම් සරණ සා සුතු.**

පදෙමාත්තර සම්බුඩ විවරණ කථා නිමි.

සුමෙඩ සම්බුඩ විවරණ කථා. මෙසේ කරණ ලද සමස්ත
—— ලොකා'ලොක ඇති නිරූපහ
තා'ශූනා'ලොක ඇති දුරුකරණ ලද ප්‍රජාශොක ඇති කරණ ලද මාරෝ'තෙසක ඇති නො දිනිය හැකි ධම්මා'නික ඇති ප්‍රත්‍යක්ෂ කරණ ලද කම්මවිපාක ඇති නිරවධි වූ කරුණා'මෘත නිෂෙක ඇති නිවීාණ නායකවූ ලොකනායකවූ **පදෙමාත්තර** නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ පිරිනිවී පසුව ශාසනයද ක්‍රමයෙන් අනතර්ධානවූ කල්හි එයින් මත්තෙහි සැත්තෑ දහසක් කප් මුළුල්ලෙහි කිසි බුඩ බහුු කෙණෙක් නො වූහ. මෙයින් තිස් දහසක් කපින් මත්තෙහි එක් කපෙක්හි **සුමෙඩ** ය, **සුජාත** ය, යන සවාමිදරුවෝ දෙදෙනක් පහළුවූහ.

මෙහි සුමෙඩ නම් සවීඥයන් වහන්සේ සමත්‍රිංශත් පාරමිතා පූරණ ප්‍රාවිණ්‍යයෙන් සම්ප්‍රාපතවූ ප්‍රඥ ප්‍රකෂී ඇතිවැ තුන්වන ආත්මභාවයෙන් චුතවැ **තුෂිත පුරයෙහි** ඉපිදී එහි ආයුප්‍රමණින් පඤ්චකාම රසා'සවාද කොටැ දෙවතාවන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ සකල ලොක සුදශීනවූ **සුදශීන** නම් රාජධානියෙහි සම්පත්තීන් අමත්තවූ **සුදත්ත** නම් මහරජානන් වහන්සේ නිසා ඔබගේ අග්‍රමහිෂීන් වහන්සේගේ බඩැ පිළිසිඳ ගෙණැ ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩි නව යෞවනා'කාර මධුරවූ අවස්ථාවට පැමිණ හෘදය මධුකර චාරණ සුමනස්වූ **සුමනා** නම් මහාදේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති අටසාළිස් දහසක් නාටකස්ත්‍රීන්ගේ කුව කමල කුඩමල සන්නිවෙශ මනොහරවූ වක්‍රාසථල නැමැති මහා සරසින් මනොහරවැ නව දහසක් හවුරුදු ගිහිගෙයි වැසැ :-

---

1 මතු බුදුවැ,

සුමනා මහාදේවීන් වහන්සේ විසින් සවී ලොක මිත්‍ර වූ සුනවීසුමිත්‍ර නම් කුමාරයන් වහන්සේ වැඳූ කල්හි බ්‍රහ්මා'පණීත නිමිත්ත සතුඝීනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂාවැ **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ කෙළසීයක් පිරිමින් හා කැවිටැ මහණවැ අටමසක් **මහාවිශ්‍රී** කොටැ **වෙසඟ මසැ මැදි පොහෝ** දවස්:–

සකල සමෘඩි සඬකුල වූ **නකුල** නම් ග්‍රාමයෙහි **නකුල** නම් සිටාණන්ගේ දියණියන් විසින් පිළිගන්වන ලද්දූ වූ කිරි පිඬු වළඳා සල් වෙනෙහි දිවාවිහාර කොටැ සවස් වේලෙහි සකල ලොක මනොරථ වඩින වූ **ශ්‍රීවඩන** නම් ආජීවකයා විසින් පිළිගන්වන ලද්දූවූ අටමිටක් තණ පිළිගෙණැ සකල ලොකදිපවූ ඉෂටාථ සම්පවූ **නිප** පාදප මූලයෙහි විසිරියනක් පමණ වප්‍රාසනයෙහි වැඩැ හිඳැ ප්‍රබල මාරබල ඝලහ කුල ප්‍රලය ප්‍රදීපායමානවැ යාමත්‍රයයෙහි ඥනත්‍රයාධිගම කොටැ ප්‍රත්‍යූෂ වේලායෙහි සඞම්ම රාජ්‍ය ප්‍රතිලබ්ධවැ සමහාවින වූ මනොරථ සිඳී ඇතිවැ සත් සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ 1 **සුදර්ශිනොද්‍යානයෙහි ධම්මක්** පවත්වා ලොකා'ලොක කොටැ **චදුරණ්සේකැ.**

එසමයෙහි මාගේ සවාම්දරුවානන් වහන්සේ **උනාතර** නම් මානවකවැ නිර්ජිත සංසාරා'ඞකුර ඇති නර්ජිත මාරා'හඞකාර ඇති ක්ෂිපිතවූ කෙලඹ චමත්කාර ඇති ප්‍රාපනවූ ලොක සත්කාර ඇති නිර්වාණවබොධය ඇති **සුමෙඛ** නම් සවාම්දරු වෝ ලෝකයෙහි 2 උපන්සේකැයි අසා ප්‍රෙම ප්‍රසාද ප්‍රකර්ෂ 3 ප්‍රවණ්ය කෘතා'තම ඇතිවැ **සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ** කරා එළඹැ එ රුව දැකැ එ බණ අසා විසමය ප්‍රාපනවැ "මේ කෙබදුවූ ගාම්භීර්‍යයෙක් ද? මේ කෙබදු වූ සියලු ක්‍රියා වන්ගේ ඔඃවිත්‍යයෙක් ද? මේ කෙබදු වූ අසඳෙහ මධුර වූ විඤ්ඤනයෙක් ද? මේ කෙබදු වූ ධම්ම පක්ෂපාතයෙක් ද? මේ කෙබදු වූ කණ්ණා'මෘත වහන තපස්වී කමෙක් ද? මේ කෙසේවූ සියලු ලෝවැස්සන් මුදුනෙන් පිළිගත් 4 ආශ්චර්‍ය්‍ය කමෙක් ද? මේ කෙසේ වූ නිර්විකාර පුරුෂදම්‍ය ශික්ෂා ප්‍රකාරයෙක් ද? මේ කෙසේ වූ අභූෂණ සුභගවූ විලාශයෙක් ද?

---

1 සුදසනොද්‍යානයෙහි. 2 උපන්හැ යි. 3 ප්‍රවිණ්ය.
4 ආවර්‍ය්‍ය කමෙක් ද.

මේ කවර කුශලයක්හුගේ විපාකයෙක් ද? මෙසේ වූවන්ට පූජා නො කොටැ අනික් කාට පූජා කරමෝදැ"යි සිතා වදුරා දනක් සරහන්නට පටන් ගත්හ.

දන් සැරහූ පරිදි කියා 1 නිමවත් හොත් උගහටය. එක් දවසක් දෙන දනට උපකරණ අසූ කෙළක් ඛන විසදම් කොටැ සපයා වදුළුසෙයෙක. මෙසේ මහදන් දී පඤ්චකාම රසයන් හැරැ ඒ සම්බුදුයන් වහන්සේගේ ශාසනයෙහි මහණ වැ අනික් සම්පත්තියක් නො පතා මා දුන්නා වූ දානයෙහි හා රැකි ශීලයෙහි අනුසසින් මම ද මේ සම්බුදුයන් වහන්සේ **පසක් කළ සඛම්මය** ම පසක් කට හෙම්ව යි පතා වදුළු සෙයෙක.

ඒ බුදුන් වහන්සේ ද "මේ මහාපුරුෂතෙම දුන්නාවූ දාන යෙහි හා සීලයෙහි අනුසසින් මෙයින් නිස්දහසක් කපින් මත් තෙහි **ගෞතම** නම් සම්‍යක් සම්බුධ වෙයි" යනාදීන් වාකර නාදී වදුළුසේක. එබස් ඇසූ අපගේ සවාමිදරුවෝ **දීපඞ්කර සම්බුදුන්** වදුළු සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් පවා හතර **පැයක්** විසි අසුරක් කොටැ සිතා වදුළු සේක් නිස් දහසක් කපැ යි කි කල්හි කෙතෙකැ යි සරුකරණ සේක් ද? එහෙයින් "මම නිස් දහසක් කපින් මත්තෙහි බුදුවැ මෙම සඛම්මය පසක් කෙරෙමියි" යන අදහසින් එම සමනිස් පැරුම් පිරීමෙහි **දෘඪ** ග්‍රහණය කොටැ වදුළු සෙයෙක.

එසේ මාගේ සවාමිදරුවන් විසින් අනෙක යත්නයෙන් සාධාගත් **සඛම්මය** මම අයත්නයෙන් ලදිමි. එහෙයින් මා විසින් මෙම සඛම්මය සරණ යා යුතුයැයි **දහම් සරණ සාසුතු.**

සුමේධ සම්බුධ විවරණ කථා නිමි.

සුජාත සම්බුධ විවරණ කථා. මෙසේ සඛම්ම සම්‍රාජ්‍ය ධුරඛ
රවූ සුමේධනම් සම්‍යක් සම්බුධ
යන් වහන්සේ පිරිනිවි කල්හි ක්‍රමයෙන් බුඛානන්තරයක් ඉක්මුණු කල්හි සකල කාරුණික 2 සඤ්ඤානවූ **සුජාත** නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ **සමන්‍රිංශත්** පැරුම් පිරීමෙන්

1 නිමවන්නට. 2 සඤ්ඤානීයවූ.

බොධි සත්ත්ව පුරුෂා'කාරයම මස්තක ප්‍රාප්ත කොටැ තෘතීයා'තමභාවයෙන් වුතවැ **තුෂිත භවනයෙහි** ඉපිදැ එහි ආයු පමණින් 1 සිටැ අන්තයෙහි දෙවතාවන්ගේ ආරාධනා පිළිගෙණැ **තුෂිත** භවනෙන් වුතවැ:-

සකල ලොක මඩල භාජනවූ **සුමඩල** පුරවරයෙහි සවී සමප්ත සම්බුදගතවූ **උද්ගත** නම් මහරජානන් වහන්සේ නිසා නිරුපමා'ඛග ප්‍රත්‍යඛ ප්‍රභාවන්වූ **ප්‍රභාවති** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී සමර ජර ජර්ජරිත නව ශ්‍රුවති හෘදයා'හලාද කලහාර කර්පූර භාරුයමානවූ අසමාන යෞවනයෙහි සිටි අභිනව රූප ශ්‍රී සුන්දරවූ **ශ්‍රී නන්ද** නම් දෙවින්වහන්සේ ප්‍රධානකොටැ ඇති දෙවිසි දහසක් නාටක සත්‍රීන්ගේ ශෘඛාර යාඤ 2 චාටු චෙෂ්ටා සහස්‍ර මිශ්‍රිතවූ හාව භාවයන්ට භාජනවැ දසදසක් හවුරුදු ගිහිගෙයි වැසැ:-

ශ්‍රීනන්ද දෙවින් වහන්සේගේ කුක්ෂියෙන් ප්‍රණය ලතා ප්‍රසූතවූ **උපසෙන** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි බ්‍රහෙමාපණීත නිමිත්ත සන්දර්ශනයෙන් මහා'භිනිෂක්‍රමණය කිරීමෙහි සාභිලාෂාවැ **වනංඝවෘෂභ** නම් අශ්වරාජයා නැඟි මහා'භිනිෂක්‍රමණය කොටැ මිනිස් කෙළක් හා කැපිවැ මහණ වැ නව මසක් **මහාවිස්ථී** කොටැ **වෙසක්** මසැ මැදි පොහෝ දවස්හි විරචිතවූ නර සුරා'නන්ද ඇති **සුරනන්ද** නම් නුවරෙහි 'සුරනන්ද'නම් සිටානන්ගේ දියණියන් විසින් එළවන ලද කිරි පිඬු වළඳා සල්වෙනෙහි දිවා විහාර සපයා සවස් වේලෙහි 3 අමන ගුණ සුගඬ ඇති **සුනන්ද** නම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් නණ පිළිගෙණැ සවීලොක ශොක දූරී කරණ ප්‍රවීණවූ **වෙණු** බොධිද්‍රැම මූලයට එළඹැ නෛසරියන් පමණ වප්‍රාසනයෙහි වැඩ හිඳැ මාර මාන ගිරි භඬ විදැර 'ණෙක නිර්‍යාන පානවූ උදාරවූ පරාක්‍රම ඇතිවැ යාමත්‍ර යයෙහි ක්ෂණත්‍රයා'ධිගමය කොටැ පශ්චිම යාම සමනන්තර යෙහි ද ධම්ම නත්ත සවී සමය සාක්ෂාත් කරණයෙන් සම්පූර්ණවූ මනොරථ ඇතිවැ බොධි මූල ප්‍රාන්තයෙහි සත් සතියවා බ්‍රහමාරාධනා පිළිගෙණැ **සුමඩලොද්ගතයෙහි** ධම්සක් පවත්වා :-

---

1 හිඳැ. 2 චාරු. 3 අමන්ද, අපමණ.

එනැන් පටන් පර ව්‍යසනා'පහර කම්මයෙහි නිඝණාතවැ සඞ්ගහා'පවඞ්ග මාගි ව්‍යඛ්‍යාන විද්‍යුයෙහි පරමාවායඥිවැ අපාය ගාමි සත්ත්වයන් වෙරළ කෙරෙමින් මෙරු මන්දරාදීන් තරළය කරමින් අකලඩකාවූ යසසින් සමස්ත ලොකය ධවල කෙරෙමින් නිර්‍ෂජ මධුර නිර්‍ෂාණ රසය කබළ කෙරෙමින් සාධුවාද යන් ප්‍රබල කෙරෙමින් සත්පුරුෂ වෘන්තයන් තුමුල කෙරෙමින් ලොකාඑ චඝ්‍යාගයෙහි නත්පරවූසේක.

එ සමයෙහි අපගේ සඛාමිදරුවෝ සමස්ත චක්‍රවාලා චලා නන්ත සිමානන්ත විහන්ත විශ්වාම්බර මණ්ඩලෙක මණ්ඩිනාය මානවැ **චක්‍රවර්ත්තිරජ** වැ බුඩොත්පාද මඩහල ශ්‍රවණයෙන් සඤ්ජාතවූ කුතූහල ඇතිවැ සර්‍ෂයන් වහන්සේ කරා එළඹැ සඩම්මය අසා එබඳුවූ මහාපුරුෂයානන්ට අනිස් සුදුසු පූජා වෙක් නැතැයි සිතා වදුරා එකමල් මිටක් දමා ලන එකන්හු සේ සතර මහාවිපයෙහි සප්තරත්න සමලඩකෘතවූ **චක්‍රවර්ත්ති රාජ්‍යය** තුණුරුවනට පූජාකොටැ ඔවුන් වහන්සේගේ ශාසන යෙහි මහණවැ මෙ මා පිදූ සක්විති රාජ්‍යයෙහි අනුසසින් හා රැකි ශීලයෙහි අනුසසින් මේ සර්‍ෂයන් අනුභවකළ දහම් අනුභව කට හෙම්වයි එම සඩම්මයම පතා වදාළසේක.

ඒ සර්‍ෂයන්වහන්සේද 'මේ මහා පුරුෂතෙම මේ අසාධාරණවූ දැන ශීලාදිවූ ගුණ ගණයෙහි අනුසසින් මතු **ගෞතම** නම් සම්‍යක් සම්බුඩ වෙයි' කියා විවරණ පතුල් දී වදාළ සෙයෙක. බොධි සත්ත්වයන් වහන්සේද තමන් වහන්සේ මතු බුදුවන බව අසා විශෙෂයෙන්ම බුඩ කාරක ධම්ම පූරණයෙහි නත් පරවූ සෙයෙක.

මෙසේ මාගේ සඛාමිදරුවන් විසින් චක්‍රවර්ත්ති රාජ්‍යය පුදා මහණවැ මහා යත්නයෙන් පතා ලද්දාවූ අනූපම ධම්මය සරණයෙමියි **දහම් සරණ යා සූත්‍ර.**

සුජාත සම්බුඩ විවරණ කථා නිමි.

ත්‍රිසදර්ශි සම්බුඩ විවරණ කථා. මෙසේ ප්‍රඥා පූරයෙන්වූ කරුණා ධුරන්ධරවූ සාර ධිරතා ශ්‍රුතඥ රවූ **සුජාත** නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ පිරිනිවි පස්සෙහි මෙයින් මතු එක්දස් අවසියක් කපින් මත්තෙහි නිර්කල්ප

ලොක සඩ්කාලප සිඩ් කාරණවූ එක් කලපයෙක්හි ලොකලොචන ප්‍රියදර්‍ශිවූ ප්‍රියදර්ශි නම් එක් සවාම්දරු කෙණෙක. සම සත තන්වාඵ දර්‍ශිවූ අර්‍ථදර්‍ශි නම් එක් සවාම්දරු කෙණෙක. මධුර නර ලොකොත්තර සවාම්හු තුන්දෙනෙක් ලෝක යෙහි පහළවූහ.

එහි, පළමුවන ප්‍රියදර්‍ශිහි නම් සවාම් දරුවෝ විඩවයන සමයන බොධි පාක්‍ෂික ධම්ම ප්‍රතිබණ්ඩ ඇතිවැ සමත්‍රිංශත් පාරමිතා පූරණ ප්‍රවිණ පරිණත ප්‍රඥාතිරෙක ඇතිවැ තුන්වන ආත්ම භාවයෙන් වුතවැ **තුෂිත භවනයෙහි** ඉපැදූ එහි අෂ්ඨ පමණින් වැඩැ සිටැ අප්‍රමාණ රමණීය පඤ්චකාම ගුණ'සවාදයෙන් 1ප්‍රණීතවූ අනන්තඃකරණ ඇති දිව්‍ය සම්පත්හි වළඳූ දිව්‍ය ඛ්‍යාමයන්ගේ ආරාධනා ගිවිසැ **පඤ්ච මහා විලොකනය** කොටැ දෙව්ලොවින් වුතවැ :-

ඛන්‍ය නර නාරී නිසෙවිතවූ 2 ඛන්‍ය නම් නුවරෙහි අප්‍රමාණ විත්ත ඇති **සුදස්න** නම් මහරජානන් වහන්සේ නිසා මුඛා මධුරවූ මුඛ චන්‍ද මනොහරවූ **චන්‍ද්‍රා** නම් දේවීන්වහන්සේගේ කුක්‍ෂියෙහි පිළිසිඳැ ගෙණැ දසමසක් යවා ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩි වාමලොචනා නයන චෂකපුර නීපෙයකානන්හි පියූෂ නිෂ්‍යන්‍ද සුන්දරවූ නවයෙෞවනා'වතාරයට පැමිණැ විමල වදන කමල මනොහරවූ **විමලා** නම්වූ මහා දේවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තෙනිස් දසක් නාටක සත්‍රීන්ගේ මධුර' ඛ්‍යාපාළි කෙළි රසිකවැ ගෙහි කෙළනා කෙළියෙන් උකටලි යට වැට කොටැ උද්‍යානයෙහි කෙළනා කෙළියෙන් සොම් නසට දෙර හැරි වනයෙහි කෙළනා කෙළියෙන් අරනියට වනදුර්‍ගහ සංස්කාර කොටැ දියෙහි කෙළනා කෙළියෙන් කුසීඳ යට ජලදුර්‍ගහ සපයා මිත්‍රයන්ගේ නොවෙනස් කම්න් ගැහැණුන්ගේ නොබොරුයෙන් ශරීරයෙහි ආරොග්‍යයෙන් දෙවයාගේ අනුකූල්‍යයෙන් කළ කළ දෑයෙහි 3 අපශ්‍රාත් භාවයෙන් 4 වෙෂභාෂා දෙක්හි 5 විදග්ධ කම්න් නව දසක් හවිරුදු ගිහි ගෙයි වැසැ :-

විමලා දේවීන් වහන්සේගේ කුක්‍ෂියෙන් සෞඤ්‍යයී සාරයෙන් උපදලිතවූ **කාඤ්චන සාර** නම් පුතනුවන් වහන්සේ

---

1 පිණුත වූ. 2 සුධන්‍ය නම්. 3 අපශ්‍රාවාත්තාපයෙන්.
4 දෙශ භාෂා දෙක්හි. 5 අවිදග්ධ.

උපන් කල්හි බ්‍රහ්මාපණීත චතුර්ඛ දුර්නිරීක්ෂ්‍ය සඤ්ඤීන පූර්ව්‍යාඛ්‍යමවැ ආජානීය රථවරයෙන් **මහාභිනිෂ්ක්‍රමණය** කොටැ පුරුෂයන් තෙළක් දෙනා හා කැටිවැ, මහණවැ සත් දවසක් **මහාධ්‍යාත්‍ම** කොටැ **වෙසක් මසැ** මැදි **පොහෝ දවසැ** අද දක්වා සමරණීය වූ **වරණ** බ්‍රාහ්මණ ග්‍රාමයෙහි වෘෂභ බ්‍රාහ්මණයාගේ දියණියන් විසින් එළවන ලද්දාවූ ම්හිරි කිරිපිඬු වළඳා දිවා භාගයෙහි සාලවනයෙහි වැසැ සවස් වේලෙහි **සුජාතා** නම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ විවිධ ලොක 1 පූජාවිධෙය වූ **ඝනකුඩ** බොධියට එළඹැ තෙ පණස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිදැ මාරබල ව්‍යාලකුල විෂෂාහ කෙලි **වෛනතෙයවැ** යාමත්‍රයයෙහි අධිගතවූ විද්‍යාත්‍රයය ඇතිවැ සමසත වයතු විසතාර සඞ්ඛ්‍යාව සළු සඞ්ග්‍රහණ රසික සළුඤතා ඤාන සමධිගමයෙන් සම්පූර්ණවූ මනොරථ ඇතිවැ බොධිද්‍රැම සම්පයෙහි ම සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණැ **ධම්මක්** පවත්වා සකල ලොකාපි චයතී 2 චාර ඛෙණරෙයවැ කරුණා ප්‍රඤපරවැ අමතු වූ ජගදා' නඳනය කොටැ වදුරණ සෙයෙක.

එ සමයෙහි අපගේ බෝසතානන් වහන්සේ කරුණා'ව ශ්‍යවූ **ඛාශ්‍යප** නම් බ්‍රාහ්මණවැ සළුඤයන් වහන්සේගේ ගුණ අසා රූපසඤඤීනයෙන් හා සඛම්ම ශ්‍රවණයෙන් හා ප්‍රතිලබ්ධවූ ශ්‍රඛා හා ප්‍රසාද ඇතිවැ කෙළ ලඤයක් වියදම් කොටැ නිළුණා'රාමා'භිරාම වූ බුඛාරාමයක් කරවා බුදු පා මොක් මහාසඛඤ යාවහන්සේට පිළිගන්වා සරණ සිල දෙකැ පිහිටා මම මේ කළ පරිත්‍යාගයෙන් හා ගුණධම්මයෙන් හා 3 මතු මේ සළුඤයන් වහන්සේ පසක් කළ **සඛම්මය** ම පසක් කට හෙම්වසි කියා ප්‍රාර්ථනා කොටැ වදුළ සේක.

ඒ සළුඤයන් වහන්සේ ද "මේ මහා පුරුෂතෙම මතු **ගෞතම** නම් සම්‍යක් සම්බුඛවෙසි" වදුළ සේක. ඒ අසා සඞ්ඝ දරුවානෙනා 'මම මතු බුදුවෙම්ල! යන අදහසින් එම සමනිස් පෙරුම් පිරීමෙහි දෘඪග්‍රහණ කොටැ වදුළ සේක.

මෙසේ මාගේ බොධිසත්වයන් වහන්සේ විසින් මහ පොළොවක් පෙරලන්නා සේ මහ මුනුද දිය දෙහොනින්

1 නානාවිධවූ. 2 වාරා ඛෙරෙයක ව. 3 ගුණධම්මයෙහි අනුසසින්.

ඉස්නා සේ මහාමෙරුව පෙරලන්නා සේ හිරු සඳු දෙදෙනා නොයා දී වළකන්නා සේ මහා යත්නකොටැ සාරාසඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි පැරැම් පුරා පරාක්‍රමයෙන් සාඛ්‍ය අත් පත් කළාවූ සඩම්මය සරණ යෙමියි **දහම් සරණ සා සුතු.**

ප්‍රියදර්ශි සම්බුධ විවරණ කථා නිමි.

අර්ථදර්ශි සම්බුධ විවරණ කථා. මෙසේ සමස්ත තතක්ව විදර්ශිවූ ප්‍රියදර්ශි නම් සම්‍යක් සම්බුඩ යන් වහන්සේ පිරිනිවි පස්සෙහි, ක්‍රමයෙන් බුඩානන්තරයක් ඉකුත්වූ කල්හි නිරුපදෙශ බුඩගොචර දර්ශිවූ අර්ථදර්ශි සම්‍යක් සම්බුඩයන් වහන්සේ සමතිස් පැරැම් පුරා නුසි සුරයෙහි ඉපැදෑ දෙවියන්ගේ ආරාධනායෙන් එසින් චූතවැ:-

සචී'ඛ්‍ය ශොභනවූ **ශොභන** නම් නුවරෙහි නෙජසින් භාස්කරවූ සචීලොක සඩකරවූ මනුජලොක පුරන්දරවූ රාජ මුත්හි සුන්දරවූ ශ්‍රැතවෘත්ත බන්ධුරවූ රාජලොක ශෙඛරවූ චාරු භාව පඤ්ජර වූ වික්‍ර'මෙක මන්දිර වූ ක්ෂිපනා'රතිසඛර වූ විපුලකීර්ත්හි සාගර වූ **සාගර** නම් මහ රජානන් වහන්සේ නිසා සකල ලොක සුදර්ශන වූ **සුදර්ශනා** නම් දෙවින් වහන්සේ ගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දසමසක් ඇවැමෙන් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී මදන'මඛ්‍ඛල මන්දිර'කාර චාරු ශරීර කාන්ති සම්පූර්ණ වූ නවයෞවන ශ්‍රීන් විරාජමාන වූ කඤ්චි තරු වරාග්‍ර ශාඛායමාන වූ **විසාඛා** මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති නෙ තිස් දෑසක් පුරස්ත්‍රීන්ගේ රුචිර නූපුරා රාවයෙන් අන වරත මුඛර වූ නිජ හම්‍ය සථල ඇතිවැ දස දෑසක් හවුරුදු ගිහි ගෙයි අනන්ත සම්පත් අනුභව කොටැ:-

විසාඛා නම් කල්‍ප තරු ශාඛායෙහි **ශෛල කුමාර** නැමති කුසුම සාඛකය හටගත් කල්හි චතුර්ඛ සුචීනිමිත්ත දැකැ ප්‍රව්‍රජ්‍යයෙහි සාභිලාෂවැ **සුදර්ශන** නම් අශ්වරාජයා පිටින් **මහා භිනිෂක්‍රමණය** කොටැ නව කෙළක් පුරුෂයන් හා කැටිවැ මහ ණවැ අට මසක් **මහාවිශ්‍ය** කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් **සුදස්සන** නම් නාග කන්‍යාව විසින් එළවනලද මිහිරි කිරි පිඬු වළඳා සල් වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි **මහාකී** නම් නාගරාජයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ:-

වසන්නා' වෙශ සම්බුද්ධුත ප්‍රභූත. කුසුම සම්පකී ඇති චම්පකා මහා බොධියට එළඹැ නම්න් වහන්සේගේ බුඩ මඩප ලයට නහා ලූ මහ පහන් ඇහැයක් බදු වූ ඒ බොධිද්‍රැම රාජ යාගේ මූලයෙහි තෙ පණස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිදැ තුමූල මාර බල බහලා'ඛ්කාර නිකරයෙහි ප්‍රචණ්ඩ සංවර්ත මාන්නණ්ඩ මණ්ඩලවැ චණ්ඩතාව දක්වා යාමත්‍රයයෙහි ඤානත්‍ර යා'ධිගමය කොටැ ප්‍රත්‍යුෂ කාලයෙහි සමන්ත භෙෂ්ඨ රෙඩාව ශ්‍රී හස්තාරෙඩා සේ නිර්ශෙෂ කොටැ දුනැ වදුරා ක්‍රමයෙන් සත් සති යවා බ්‍රහ්මාරාධනා ඵළිගෙණැ ධර්මයක් පවත්වා:-

එතැන් පටන් ඒ ධම්ම ප්‍රවිණයට ධම්ම නෙරන්තයීයට ධම්මවිජයට ධම්මා'ධිෂ්ඨානයට ධම්ම විප්‍රැමහනයට ධම්ම දපි යට ධම්මා'හඩකාරයට ධම්ම මහෝ'නසවයට ධර්මෝ'තෙසකයට ධම්ම වෛසාරද්‍යයට ධම්ම හර්ෂයට ධර්මෝ'තතර වෙමින් අධම්ම තර්ජනයට අධම්ම නිර්ථනයට අධම්ම විදුරණයට අධම්ම නිශසීවනයට ඒක නිදුන වෙමින් ලොව සදන්නට පටන්ගත් සෙයෙක.

එ සමයෙහි අපගේ සවාම්දරුවෝ චම්පකා නම් නුවරෙහි සුසීම නම් බ්‍රාහ්මණ මහාසාරවැ සදීලොක සම්මතවැ අභ්‍ය සන සමසන විද්‍යා නිරවද්‍ය මනිවැ පඤ්චකාමයෙහි දොෂ ප්‍රප ඤ්චය දුකැ තමන් වහන්සේ සතුවූ සියලු වසතු සම්භාය දිනා' නාථ මනොරථ පූරණය හා යොදු හිමාලයට වැඩැ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණවැ වසන සේක.

එසේවූ සවාම්දරුවෝ චන්ද්‍ර'ලොකයට දිවන චකොරයන්හු සේ තමාල නීලවර්ණ සුන්දරවූ විද්‍යොතමාන විද්‍යුත්වලයා'භි රාම වූ නිරන්තර ඉන්ද්‍රචාප කලාපා'වනඩවූ මෙඝ කුටයකට දිවන චාතකයකු සේ ද අනිනීල සිතල සලිල හරිත වන සරසි විනාහ'නෙක රසික මත්ත මානඩග රාජයන්හු සේ ද ජනානී සනන දර්ශනයට දිවන තරුණ සනානඹයකු සේ ද පිපා සිතවැ මහා හ්‍රදයකට දිවන පක්ෂිකයන්හු සේ ද නීවීා'ණේ'නම්ූ ඛවැ දිවන යොගාවචරයන්හු සේ ද අතිශයින් ලොල්වැ සිවූ වණන් පිරිස මධ්‍යයෙහි බණ වදුරන්නාවූ ඒ සම්‍යක් සම්බුඩ යන් වහන්සේ කරා එළඹැ බණ අසා පරම ප්‍රීතිප්‍රසාද නිර නතරීභූත හෘදය ඇතිවැ:-

'මෙයට සුදුසු පූජා කිම් දෝ හෝ'යි පරීක්ෂා කොටැ දෘශ්‍යමාන ශරීරයෙන් ම ආකාශයට පැනැ නැඟි සහමුලින් මල් ගෙණැ සිරියාවූ දෙවියන්ගේ සියක් යොදුන් පරසතු රුක මුල්නී ගෙණැ පිල අත්තක් සොඩින් අල්වා ගෙණැ සලනලද මතැතක්හු සේ සලා සවීඥයන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි පහරවා මුළු සක්වළ බුඩපූජා පිණිස දිවමල් වැසි වස්වා 1 මෙම මලින් නොයෙක් වර්ණයෙන් යුකතවූ මල් ඇඟැ මල් තොරණ මල් ආසන පණවා තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මල් 2 සැතක් අල්වා ගෙණැ මහාපූජා කොටැ 'මම මේ පුඥ පූජායෙහි අනුසසින් මතු මේ සවීඥයන් වහන්සේ පරිද්දෙන් ලොවට සඩම්ම 3 වෂී පැවැත්තිය හෙම්වයි කියා මේ සඩම්මඤ ම පතා වදාළ සෙයෙක.

ඒ සවීඥයන් වහන්සේ ද 'මේ මහාපුරුෂතෙම මේ පූජායෙහි අනුසසින් මතු ගෞතම නම් සම්‍යක් සම්බුඩ වෙයි' විවරණ පතුල් දී වදාළ සේක. එබස් අසා වදාළ සුසීම නම් බොධිසත්ත්වයන් වහන්සේ "මම මතු බුදුවෙම් ලැ"යි එම බුඩකාරක ධම්මයන්ගේ පූරණයෙහි සතතොද්‍යුකත වූ සිත් ඇතිවූ සේක. මෙසේ මාගේ සඩාමදරුවන් විසින් සක්වළ ගබ පූරා දිව මල් වැසි වස්වා දිව මල් ඇඟැයෙන් දිව මල් තොරණින් දිව මල් කුඩයෙන් දිව මල් ධවජයෙන් දිව මල් පතාකායෙන් අපරිමාණ වූ පූජා කොටැ පතා ලද්දාවූ සඩම්මඤ සරණ යෙමි.

දහම් සරණ සා සුතු.

අථදර්ශි සම්බුඩ විවරණ කථා නිමි.

ධම්මදර්ශි සම්බුඩ විවරණ කථා. මෙසේ යථාථ නාමාක්ෂර වූ අථදර්ශි නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ පිරිනිවිකල්හි ඒ අනතඃකල්පය ඉක්මුණුකල්හි තමන්ට ම සුදුසුවූ ධම්මදර්ශි යන නම් ඇති ධම්මදර්ශි නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ සමතිස් පැරැම් පූරා තුන්වන ආතමභාවයෙන් වුනවැ තුෂිත පුරයෙහි ඉපිද එහි ආයු පමණින් සිටැ දෙවතාවන්ගේ ආරාධනා ගිවිසැ එයින් චුතවැ ත්‍රිභුවන ශරණවූ ශරණ නම් නුවරහි විරචිත රාජ ලක්ෂ්මී සභයං වරවූ අනුපම චාරුකරණ විභූතිත සමඝත තනතු ලාභී නිසසාරණවූ ප්‍රණත ධරණීපති 4 මණ් මෞලි මාලා'ලඞ්කෘත චරණවූ පාපීව සිඤුර ගබ වාරණවූ වරවිතෙ'ඤ්‍රියා'හඞකාර නිවාරණවූ මානසයඃ ප්‍රත්‍යභාඛ්‍යාන කරණවූ ධමේ'ක

---

1 එම 2 සතක් 3 වෂී. 4 පසිඟුමණි.

පරායනවූ දුර්නිති විසරණවූ **සරණ** නම් මහරජානන් වහන්සේ නිසා නයනා'නාදුවූ **සුනන්දා** නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩි :-

මුඛා'ඛහනා වදන කමල කුඩමල විකාශ'නෙක රාජ හංසාය මානවැ නව යෞවනාවස්ථා'වතාරයෙන් මනොහර වැ අවක්‍රජ කෙළි රහිතවූ 1 **විවිකේළි** නම් මහා දේවීන් වහන්සේ ප්‍රධානකොටැ ඇති, විසිදුසක් නාටක සත්‍රීන්ගේ සවිඩහි නවූ අනඩහ පරිදුහ නිර්‍රාපණයෙහි නව චඳුන පල්ලව රස නිශෙකාය මානවැ අට දුසක් හවුරුදු ගෘහ ශ්‍රී අනුභව කොටැ **විවිකේළි** නම් දෙවීන් වහන්සේගේ කුක්ෂියෙන් අවක්‍රජ ප්‍රිති වඩිනවූ **පුණ්ණවඩන** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි බුදුගමා'පණිත චතුර්ඩ නිමිත්ත සඳර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාඝ්ලාඝවූ ක්ෂණයෙහිම ආකාශයට පැන නැංගාවූ **සුදර්ශන** නම් ප්‍රාසාදයෙන්ම මහාභිනිෂ්ක්‍රමණය කොටැ කෙළ ලක්ෂ යක් පිරිමින් සමග මහණවැ සත් දවසක් **මහාවිශ්ව** කොටැ :-

විවිකේළි නම් දෙවීන් වහන්සේ විසින් එළවන ලද්දාවූ කිරි පිඬු වලඳා දහවල් රුවිර තර 2 බදරවනයෙහි දවස් යවා සවස් වේලෙහි ශ්‍රීවඩන නම් යවපාලයා විසින් දෙනලද අට මිටක් තණ පිළිගෙණැ සනරා'මර ලොකප්‍රණත රත්න කොරක ඇති **රත්න කුරවක** බොධියට එළඹැ තෙ පණස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳැ මාර වීර මුසෙනානවුලන කෙලි මහා වරාහවැ යාමත්‍රයා'ඛ්‍යනතවූ ඝනත්‍රයය ඇතිවැ සවි ඛම්ම නිරූ පණ ප්‍රවීණ ප්‍රඥ ප්‍රතිභී ඇතිවැ සත් සතියක් බොධිද්‍රැම මූල යෙහි කල් යවා බ්‍රහමා'රාධනා පිළිගෙණැ **ඛම්මක්** පවත්වා එතැන් පටන් ජෙණැ ජාති වැසනයෙන් හා ජරා පරිපඩ්ඩයෙන් හා මෘත්‍යු නිඝ්‍රාත පාතයෙන් හා ශොක විශොඝයෙන් හා පරි දෙව ශූල 3 නොදයෙන් හා දුඃඛ ජ්වාලානලජ්වාලා'වලෙප යෙන් හා දෞමනස්‍ය මූර්ච්ඡා වෙඝයෙන් හා උපායාස විඝා'වෙඝ යෙන් හා එකපාහැරැ ලොව නලවන්නට පටන්ගත් සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්වයන් වහන්සේ **ශක්‍රදේව** ඳුවැ ධම්මදර්ශි සඛාම්දරුවන්ගේ ත්‍රිභුවන ව්‍යාපිවූ ගුණ ගණ ශ්‍රවණයෙන් අදනා ලද්දාවූ සිත් ඇතිවැ දෙව්ලොව වසන්නාවූ

1 විවිඝකාළි. විවිඝකාළි. 2 බදර. 3 ඝොදඝයෙන්.

දිව්‍ය සෙනාව රැස්කරවා නානා ප්‍රකාරවූ පූජා විශෙෂ සපයා සියලු ලොකයෙහි ඇතිතාක් විසමය එක තැන්හි ගෙණැවුත් පුරන්නා සේ සියලු ආකාශය පූජා විසින් නිරන්තර කෙරෙමින් සඞ්ඝයන් වහන්සේ කරා එළඹැ දිව්‍ය පුෂ්ප ධූප දීප නෘත්‍ය ගීත වාද්‍යාදීන් මහා පූජා පවත්වා රූපසඤ්ඤීනයෙන් හා සඞ්ඝ ම්මුඛවණයෙන් හා සඤ්ඤාතවූ ප්‍රිති ප්‍රසාද ඇතිවෑ රත්නත්‍රය යෙහි සරණ ගොසින් තමන් වහන්සේ කළ අනුපම බුධ පූජා යෙහි හා කළ ප්‍රසාදයෙහි හා අනුසසින් මතු 'මම මේ සර්‍වාම් දරුවන් දුටු සඞම්මයම පසක් කටහෙම්වයි ප්‍රාර්ථනා කොටැ වදාළසේක

ඒ සඞ්ඝයන් වහන්සේද 'මේ මහාපුරුෂවූ දෙවරාජතෙම මේ කුසලයෙහි අනුසසින් මතු මාසේ ම බම්මරාජවෙයි' විවරණ පතුල් දී වදාළසේකැ. එබස් ඇසූ ශක්‍රදෙවෙන්ද්‍රවැ උපන්නාවූ බොධිසත්වයන් වහන්සේද "මතු මම බුදුවෙම්"ල යන අදහසින් සමනිස් පෙරුම් පිරිමෙහි මහොත්සාහවූ සෙයෙක.

මෙසේ මාගේ සර්‍වාම්දරුවන් ශක්‍රදෙවෙන්ද්‍රවැ ඉපදූ දෙදෙව් ලොව එකපැහැර පෙරලා[1] අචින්ත්‍යවූ අතුල්‍යවූ අවාච්‍යවූ අවදිඤවූ බුධපූජා කොටැ ප්‍රාර්ථනා කොටැ වදාරා නොයෙක් යත්නයෙන් පසක් කළාවූ ඛම්ම රතනයතෙම මට ඉහලොකයටත් සරණමය. පරලොකයටත් සරණමය. සවී සම්පත්හි නිවීණ සම්පත්හි සාධා දෙන්නෙත් එම සඞම්මයමය. එසේ හෙයින් මට අවශ්‍යවූ සඞම්මය සරණයෙමියි දහම් සරණ සාසුතු.

ඛම්මදර්ශි සම්බුධ විවරණ කථා නිමි.

සිඛාපී සම්බුධ විවරණ කථා. මෙසේ නිරවධි නිරූපධි විශුධ බුධ කෘත්‍ය'නු ශ්‍රාවා න යෙන් විසාරිත ප්‍රහලාදිත නිවීරිත සමයත්‍ර ලොක ඇති ඛම්මදර්ශි නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ පිරිනිවි කල්හි ඔබුන් වහන්සේගේ ශාසනයද ක්‍රමයෙන් අන්තරහිතවූ කල්හි ඒ කල්‍පයද විනාශයට පැමිණ්කල්හි එනැන් පටන් එක් දහස් සත්සිය ස කපක් ගියකල්හි 2 මෙ නැනට සුවානුවක් කපින් මත්තෙහි එක් කපෙක්හි ඒක වීරවූ ඒක බිරවූ ඒක මානාත්‍යවූ ඒක වදන්‍යවූ ඒක ශ්‍රාෂ්‍යවූ ඒක වාගීවූ ඒක ප්‍රාරොහිත්තමවූ:-

---

1 අනන්තවූ. 2 මෙකපට.

සම්මති ප්‍රභාවා'ප්‍රති සිඛාළුවූ සංසිඛා'ශෙෂ පුරුෂාළුවූ සිඛාපී නම් සම්‍යක් සම්බුඛයන් වහන්සේ සම්තිස් පැරැම් පූරා තුන් වන ආත්මභාවයෙන් වූතවැ තුෂිත පුරයෙහි ඉපදූ විවිධ විබුධ විදගධ මධුර භාව'නුභාව භාජනී භූතවැ එහි අෂ්ඨ පමණින් සිටැ දෙවතාවන්ගේ ආරාධනා ඉවසා පඤ්චමහාවිලොකනඤ කොටැ දෙවී ලොවින් වූතවැ ප්‍රකටිකෘත සමසත මහිත මහොතසව 1 හාරවූ ලුම්බිනාවන නම් නුවරෙහි උදිත සමසතලොක * හෘදයානන්දවූ උදෂන නම් මහරජානන් වහන්සේ නිසා, සකල ශුවනි ලීලා දර්ශිවූ ශත වාර විහත කාපිාස කලා සපාශිවූ සුසපශිා නම් මහා දේවීන්වහන්සේගේ කුසියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් මවුකුසින් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩි ප්‍රණයිනී ප්‍රණය කථාෂ නිෂෙප ලෂණී ක්‍රියමාන ප්‍රතීත නව යෞවන භාජනවැ :-

ක්‍රියාවෙන් හා රූපයෙන් හා කුලයෙන් හා යෞවනයෙන් හා සිතූ සිතූ කෙණෙහි බැලූ බැලූ කෙණෙහි ලග ලහාවූ කෙණෙහි සෞමනස්‍යයම එළවන්නාවූ සොමනස්‍සා නම් මහා දේවීන් වහන්සේගේ කුසින් හෘදයා'හලාද චන්ද්‍ර'පමවූ අනූපම නම් කුමාරයන් වහන්සේ උපන්කල්හි සවණ්ණහිවිකා නෙන් මහා'භිනිෂක්‍රමණය කොටැ කෙළ ලෂයක් දෙනා හා කැටිවැ මහණවැ දස මසක් මහාවිෂ්ඨ කොටැ වෙසක් මසැ මැදි පොහෝදා සකල සමාධීන් අසදෘශවූ අසදෘශ නම් බ්‍රාහ්මණ ග්‍රාමයෙහි ප්‍රබුඛවූ උත්පල පත්‍රයකට බදුවූ නෙත්‍ර ඇති 2 නෙත්‍රා නම් බ්‍රාහ්මණ කන්‍යාව විසින් පිළිගන්වන ලද්දාවූ කිරි පිඬු වළඳා බදිර වනයෙහි දිවා විහාර කොටැ:-

සවස් වේලෙහි වරුණ නම් යවපාලයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ විනිද්‍ර පුඥා'ලඞ්කාරවූ ඛර්ණිඛාර බොධිද්‍රැම මූලයට එළඹැ සතළිස් රියන් පමණ වප්‍රාසනයෙහි වැඩැ හිඳැ උදුර මාර සපි දපි වාරණේ'ක වෙනතෙෂවැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොටැ ප්‍රත්‍යූෂයෙහි නිෂප්‍රත්‍යූහ සවීඥතාඥාන සම්බිගමය කොටැ බොධිමූල සම්පයෙහිම සත් සති යවා බ්‍රාහ්මා'රාධනාව පිළිගෙණැ ක්‍රමයෙන් ධම්මඞ්ක පවත්වා එතැන් පටන් දුර්දමිනත දමනය කොටැ වෙෂ 3 විශෝ'නපාටනය කෙරෙමින් කුදෘෂ්ටි දෘෂ්ටි සම්දෂාටනය කෙරෙමින් ධම්ම ප්‍රදිපය උද්දීපනය කෙරෙමින් ලොකාළු කරන්නට පටන්ගත් සෙයෙකැ.

---

* හෘදයනෂවූ. 1 හාරවූ. 2 සුනෙත්‍රා. 3 විශොඛාටය.

එ සමයෙහි අපගේ සම්‍යක්සම්බුදුරුවෝ අමිතවූ චතුරඞ්ග සෙනා ඇති සුරසෙන නම් නුවරෙහි දුරු කරණ ලද අවම ඞගල ඇති එළවන ලද සියලු මඞගල ඇති මඞගල නම්වූ සභා ලොක කාමීණවූ බ්‍රාහ්මණවැ කාමයෙහි ආදීනව දැකැ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණවැ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වසනා සෙයෙක් සිඛාඊ නම් සම්‍යක් සම්බුඞයන් වහන්සේ උපන් බව අසා වදුරා පරම ප්‍රසාදයෙන් සභාෂ්‍යයන් වහන්සේ කරා එළඹැ බණ අසා සඞම්ම ප්‍රීතින් නිරන්තරීභූත චිත්ත සන්තාන ඇතිවැ දඹදිවට සලකුණු වූ මහදඹ ගසට එළඹැ 1 මහදඹ පක් ගෙණැ අඩුදින් අනූ කෙළක් භික්ෂූන් වහන්සේ සපරිවාර කොටැ ඇති සභාෂ්‍යයන් වහන්සේ මහ දඹරස 2 අනුභව කරවා මම මේ සපරිවාරවූ බුදුන් වහන්සේට දුන්නාවූ දඹ රසයෙහි අනුසසින් මතු සම්‍යක් සම්බුඞයන් වහන්සේ අනුභව කළ ඞම්මරසය අනුභව කටහෙම්වයි කියා මෙම ඞම්මයම පතා වදාළ සෙයෙකැ.

ඉක්බිති සිඛාඊ නම් සම්‍යක් සම්බුඞයන් වහන්සේද මේ මේ මහා පුරුෂතෙම මේ දැනයෙහි අනුසසින් මතු ගෞතම නම් සම්‍යක් සම්බුඞ වෙයි කියා විවරණ පතුල් දී වදාළ සේක. ඒ ඇසූ මහාපුරුෂයානෝ බුඞ භාවයෙහි ඞඞකඤ්ඤවැ එම සමතිස් පැරුම් පිරීමෙහි තත්පරවූ සෙයෙක. මෙසේ මාගේ සම්‍යක්සම්බුදුරුවන් විසින් නොයෙක් ජාතියෙහි නොයෙක් දෙළින් පතා ලද්දාවූ ඞම්මරාජාණ මුදුනෙන් පුදා සරණ යෙමියි දහම් සරණ යා යුතු.

සිඛාඊ සම්බුඞ විවරණ කථා නිමි.

නිඡ්ඣ සම්බුඞ විවරණ කථා. මෙසේ ප්‍රතිවිදිත තතඤාඊ ඇති සිඛාඊ නම් සම්‍යක් සම්බුඞයන් වහන්සේ පිරිනිවි කල්හි ඒ කල්පයද ඉක්මුණු කල්හි මධ්‍යයෙහි එක් කල්පයෙක් බුඞ ශූන්‍ය විය. 3 එයට ඉක්ඞිනි කප්හි නිඵකයන් විසින් අදෘශ්‍යවූ කෙලශයන් විසින් අදුෂ්‍යවූ නිඡ්ඣය, පුඡ්ඣය, යන සම්‍යක්සම්බුදුරුවෝ දෙදෙනෙක් ලොකයෙහි පහළුවූ සෙයෙක.

---

1 මහ දඹ පලක්. 2 වළඳවා. 3 ඒවිට.

එහි තිසස නම් සවාම්දරුවාතෝ සමතිස් පැරැම් පුරා තුන් වන ආත්මභාවයෙන් චුතවැ **තුෂිත** පුරයෙහි ඉපද එහි අසූ පමණින් දිව්‍ය ශ්‍රී අනුභව කොටැ දෙවතා'රාධනා පිළිගෙණැ එයින් චුතවැ නානා ප්‍රකාරවූ චරිතයෙන් කරණ ලද්දාවූ 1 ප්‍රඥ ලබ්ධ බන්ධුජන ඇති නිරත්‍යයවූ ලොකාත්ම 2 සහිතවූ සවාම් සම්බන්ධ ඇති ප්‍රත්‍ය'ඛ්‍යතවූ දුර්නීති ගන්ධ ඇති ලොක ව්‍යාපිවූ කීර්ති ප්‍රබුන්ධ ඇති වෘෂභ සකන්ධවූ 3 **සත්‍ය සන්ධ** නම් මහරජානන් වහන්සේ නිසා සෞන්දර්‍ය ශ්‍රී නිවාස කුශල සම්භාර නම්වූ විනිද්‍ර මුඛ පද්මවූ **සද්ධා** නම් දෙවින් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් නික්මැනව යෞවන සුන්දර තර සෙනහ මන්දිරවූ යූනා'වස්ථාවට පැමිණැ:-

සත්‍රින්ට උවමනා ගුණෙන් සම්පන්නොහද්‍ර වූ **සුභද්‍රා** නම් මහා දෙවින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තෙතිස් දහස් නාටක සත්‍රින්ගේ නයන කුමුද විකාශ නව චන්ද්‍රිකා ප්‍රවාහවැ සත් දහස් හවුරුදු ගිහිගෙයි සිටැ බ්‍රහ්මා'පණිත සතර පූර්ව නිමිත්ත දැකැ **සුභද්‍රා** නම් දෙවින් වහන්සේගේ කුසින් පරමා'නන්ද මූර්තිවූ **ආනන්ද** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි ලොකොත්තර වූ **ඔඝෝණෝඝතර** නම් අශ්වරාජයා පිට නැඟි මහාභිනිෂක්‍රමණය කොටැ පුරුෂයන් කෙළක් දෙනා හා කැටිවැ මහණවැ අට මසක් **මහාවිශ්‍ව** කොටැ වෙසක් මසැ මැදි පොහෝදා ප්‍රවිණ පුරුෂා'කීර්ණවූ **විරනම්** ග්‍රාමයෙහි **විර** නම් සිටානන්ගේ දියණියන් විසින් එළවන ලද්දාවූ කිරි පිඬු වළඳා අව්රල කුසුම කරාලවූ **සරල** වනයෙහි දිවා විහාර කොටැ:-

සවස් වේලෙහි **විජිත සඞ්ග්‍රාම** නම් යවපාලයා විසින් එළවන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ සව්ලොක ප්‍රිය දර්‍ශනවූ සකල කලි නාසනවූ **අසන** බොධිද්‍රැමයට එළඹැ සත ළිස් රියන් වප්‍රාසනයෙහි වැඩැ හිඳ මාරසෙනා මාන ප්‍රධාන ලතා ග්‍රන්ථී භෙදයෙහි ප්‍රබල ප්‍රහර්‍ෂජනවැ යාම ත්‍රයයෙහි ඤාන ත්‍රයාධිගමය කොටැ අරුණෝ'දයෙහි අතරුණ කරුණ ධ්‍යාන විභාසීකෘත සමස්ත ප්‍රාණී මණ්ඩල ඥෙය මණ්ඩල ඇතිවැ ධර්ම රාජ්‍යයෙහි ඤානා'භිෂෙක ලදින් බොධිද්‍රැම ප්‍රාන්තයෙහි සත්

1 ප්‍රඥ බන්ධු ඇති. ප්‍රඥ ජන ලබ්ධ බන්ධුජන ඇති. 2 සංහිතවූ.
3 සත්‍ය බන්ධ නම්.

සති යවා බ්‍රහ්මා'රාධනා පිළිගෙණැ ධම්මඤ්ඤ පවත්වා එතැන් පටන් සියලු සත්ත්වයන්ගේ ඇසැ ඇඳි ගියාක්හු සේ බැසැ බැසැ සැරහී ගියාක්හු සේ ආදරයට නිදුනවූවක්හු සේ ලොකා' ලඞ්කාර කරන්නට පටන්ගත් සෙයෙක.

එ සමයෙහි අප සම්මා සම්බුදු රජානන් වහන්සේ **ඔසවති** නම් රාජධානියෙහි සවීලොක විසුතවූ භූලොක පාරිජාතවූ විචිත්‍රා'භිග්‍රාමිකා'පදුන ජාතවූ උභය පක්ෂයෙන් සුජාතවූ **සුජාත** නම් මහරජවැ පඤ්චකාමයෙහි ආදීනව දැකැ සමසත සමපත්හි සාංගීත්‍යයෙන් මනොහරවූ රාජ්‍යය හැරැ මහණවැ වල්හි වෙසෙමින් **තිෂ්‍ය** නම් සවීඥයන් වහන්සේ උපන් බව අසා ප්‍රසාද ප්‍රණය පූර්‍ණාඩ්ගමවැ ශ්‍රී පාද සේවා පිණිස එළඹැ සඞ්ඝම්මය අසා මෙසේ වූ කල්‍යාණ කීර්ත්‍තිනි වූ ධම්ම ඝූෂිනි වූ සඞ්ඝාම්දරුවෝ තමා සේ වූ ගැත්තවූවන් විසින් ශක්‍ති පමණින් පූජා කට යුත්තේ යයි සිතා වදාරා :–

චිත්තෝත්පාද සම කාලයෙහි ම **නව්හිසා** භවනයට එළඹැ **චිත්‍රලතා** වනාදි දිව උයන් සතරට වැදූ පරසතු මදාරා දිවූ දිව මල් බිදැ ගව්වක් පමණ සත්රුවන් සුම්බෙක්හි පුරා වියනක් පමණ මල් ගොටුවක් අල්වා ගෙණැ එන බලවත් පුරුෂයක්හු සේ අයත්නයෙන් සවීඥයන් වහන්සේ කරා එළඹැ ශ්‍රීපාද මූලයෙහි තබා චිත්‍ර වින්‍යාස මනොහර කුසුම පූජා කොටැ මැණික් මයවූ දණ්ඩ ඇති පදමරාගමය වූ පත් ඇති සඞ්ඛ්‍ය මය වූ කණ්ණිකා ඇති සුරභි කෙශර මනොහර වූ මහ පියුම් සනක් සවීඥයන් වහන්සේගේ මුදුනට වඩා වැඩැ සිටි සෙයෙක.

එසේ වැඩැසිට මේ සා බුඩ පූජාවක් කොටැ අනික් වසතුව කට නො පතා මෙහි පෙලෙන් මෙම සවීඥයන් වහන්සේ දුටු ධම්මයම පසක් කට හෙළිවසි කියා එම සඞ්ඝම්මය ම පතා වදාළ සෙයෙක. ඒ සඞ්ඝාම්දරුවෝද 'මේ මහා පුරුෂතෙම මෙම කුසලයෙහි අනුසසින් මතු මාසේ ම ගෞතම සම්‍යක් සම්බුඩ වෙයි' විවරණ පතුල් දී වදාළසේක. ඒ අසා වදාළ සඞ්ඝාම්දරුවෝ මම ද බුදු වෙම්ල යන අදහසින් ඒ සමන්ස් පැරුම් පිරීමෙහි සෞමනසාහවැ වදාළ සේක.

මෙසේ මාගේ සඞ්ඝාම්දරුවානන් විසින් අනන්‍ය සාධාරණ වූ බුඩ පූජා කොටැ නොයෙක් ජාතියෙහි පතා වදාළාවූ අනන්‍ය

ජානියෙහි වප්‍රාසනයෙහි වැඩ හිඳ මහා වජ්‍රඤ්ඤෝ'දයෙන් පසස් කරණ ලද්දාවූ සඩම්මයම මට දුක් නොවැද්ද දෙන්නට වප්‍ර ප්‍රකාරයෙක. සියලු සම්පත්හි එළවන්නාවූ කල්ප වෘක්ෂයෙක. සසරගිම් නිවා වැදූ නිවී සැනහෙන අමාමහ විලෙක. එහෙයින් එසේවූ සඩම්මය ම සරණ යෙමියි **දහම් සරණ යා යුතු.**

පුෂ්‍ය සම්බුධ විවරණ කථා නිමි.

පුෂ්‍ය සම්බුධ විවරණ කථා. මෙසේ සමස්ත භුවනා'භොග භාස්කාරවූ අපගත මනඃකාලුෂ්‍ය ඇති නිඝ්‍ය සම්‍යක් සම්බුඩයන් වහන්සේ පිරිනිවී එක් බුඩා'නන්ත රයක් ඉක්මුණු කල්හි අනුලෝම විලෝම සමස්ත ලොකාථි සිඩි පුඝ්‍යවූ පුෂ්‍ය නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ සමනිස් පැරැම් පුරා දෙවියන්ගේ ආරාධනා පිළිගෙණ තුසි පුරෙන් සැවැ සමස්ත සම්පත්තිනින් විකසිතවූ ඝනසි නම් තුවරෙහි නිපිනවූ අරුහ සෙනා ඇති **ජයසෙන** නම් මහරජානන් වහන්සේ නිසා නිරුපමෙයවූ රූප ශ්‍රී ඇති ශ්‍රීමති දෙවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳා ගෙණ දස මසක් ඇවැමෙන් මවු කුසින් නික්මැ ක්‍රමයෙන් වැඩි සව ඛාහු පාඝනඝ්ඨිත නව සුවති ජන ප්‍රෞඪ ගාඪ ශ්ලේෂ රසික වූ අවස්ථාවට පැමිණැ:-

අකෘශවූ සෙනහ ඇති **ඝිඝා** ගොතමින් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තිස් දහසක් නාටක සත්‍රීන්ගේ ශෘඛාර සඝන සහායවැ දස දහසක් හවුරුදු ගිහි ගෙයි වැසැ බ්‍රහ්මා'පණීත 1 සතර නිමිත්ත දැකැ ප්‍රව්‍රජ්‍යයෙහි සාභිලාෂවැ **ඝිඝා** ගොතමින් වහන්සේ විසින් **අනූපම** නම් පුත්‍රරත්නයක් ලත් කල්හි **හඤ්ඤියාන** යෙන් මහාභිනිෂක්‍රමණය කොටැ උඩත සිඤ්චුර වර සකඩ් සනි සමාරෝ'හණ ප්‍රාවිණ්‍යයෙන් ප්‍රකටිකෘතවූ ඓරාවනාවාරණ'ධිරූඪවූ පුරන්දර සෞඤ්‍යඝ්‍රීය ඇතිවැ හස්තියානයෙන් බැසැ කෙළක් පුරුෂයන් හා කැටිවැ මහණවැ :-

සමසක් **මහාවීර්‍ය්‍ය** කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් අභිවෘඩ්වූ සෞඤ්‍යඝ්‍රී ශ්‍රී ඇති ශ්‍රීවඩ්ධන නම් සිටුදියණියන් විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඩු වළඳා සවස් වේලෙහි ශ්‍රීවඩ්ධන තාපසෝ'පණීත අෂ්ට මුෂ්ටි ප්‍රමාණ තෘණ ප්‍රතිග්‍රහණ

1 නිඝම්ක. 2 චතුර්විඩ රූප ඔඤ්ඡනයෙන්.

පූජ්‍යාඩඟමවැ සකල ලොක පාලකවූ අමලඤ්ඤ බොධිද්‍රැම මූලයට එළඹැ අට නිස්ථිඝන් වත්‍රාසනයෙහි වැඩැ හිදැ මාර චක්‍ර වික්‍රම විඝෙඡාහ කෙලි විදඟ්ධවැ යාමත්‍රයයෙහි ඤාන තුයා'ධිගමඝ කොටැ ප්‍රත්‍යූෂ කාලඃයහි සර්ඤඥා ඤාන සමධිගමයෙන් ප්‍රත්‍යඛ්‍යානවූ සමසත්‍ත වසතූ විසතාර යථාතථ්‍ය විරොඛනෙ'ඤ රසික මොහ ප්‍රබන්ධ සඛන්ධ ඇනිවැ බොධිද්‍රැම ප්‍රාන්තයෙහිම සත් සති යවා බ්‍රහ්මයාගේ ආරාධනා පිළිගෙණැ ධම්මඤ්ඤ පවත්වා එතැන් පටන් සකල විනෙය වඝිහයා නිස ඒඝ මධුර තරණයෙන් සඛ්‍ගා'පවඝී මාඝියෙහි පිහිටුවමින් ලොකාඑ කරන්නට පටන්ගත් සෙයෙක.

එ සමයෙහි අපගේ බෝසතාණන් වහන්සේ අභිඤ්ඤම නම් නුවරෙක්හි සකලා'රාති දමනයෙන් යථාඵවූ නම් ඇති අභිඤ්ඤම නම් මහරජවැ පුඤ්ඤ නම් සම්‍යක් සම්බුඛයන් වහන්සේ ලෝකයෙහි උපන්බව අසා උන්වහන්සේ කරා එළඹැ සඛම්ඊ අසා නිරනිඤය ප්‍රසාදයට පැමිණැ කෙළ ලඤ්ඤයක් සක්වළ ඟබ එක පැහැරැ වස්නා කප හටගන්නා මහා මෙඝයක් සේ බුදු පා මොක් මහා සඛ්ඣයා වහන්සේට මහත් වූ ඤාතඥා වස්වා නිසඣඛවැ රාජ්‍යඤ හැරැ ඔවුන් වහන්සේගේ ඤාසනයෙහි මහණවැ මේ සා මහත් කුඤල කම්මයකින් අනික් සම්පත්තියක් නොපතා මේ මා දුන් දන් හා හළ රාජ්‍යයෙහි හා රැකි ඤිලයෙහි හා අනුසසින් මම ද සඛාම්දරුවානන් වහන්සේ පසක් කළාවූ සඛම්මඤම පසක් කට හෙම්වසි කියා දහම් පතා වදුළුසේක.

ඒ පුඤ්ඤනම් සඛාම්දරුවානෝ ද මේ මහාපුරුඡතෙම මතු ගෞතම නම් සම්‍යක් සම්බුඛ වෙසි කියා විවරණ පතුල් දී වදුළුසේක. ඒ ඇසූ බොධි සත්වයෝ "මතු මම බුදු වෙම්ල" යන අදහසින් එම සමතිස් පැරැම් පිරීමෙහි 1 සෙවනසාඟවැ වදුළුසෙයෙක. මෙසේ මාගේ සඛාම්දරුවානන් විසින් පඤ්ච කාම ගුණයෙන් සමෘඛවූ රාජ්‍යඤ හැරැ නොයෙක් ජාතියෙහි මහණවැ දුඤ්කරවූ ඤාසන ප්‍රතිපත්ති පුරා නොයෙක් යත්න යෙන් පතා ලද්දාවූ ඛම්මයම සරණ යෙමිසි දහම් සරණ ඤා සුතු.

පුඤ්ඤ සම්බුඛ විවරණ කථා නිමි.

---

1 මහොත්සාඟවැ.

විදර්ශි සම්බුධ විවරණ කථා. මෙසේ 1 අශොභ්‍යවූ කරුණ
ප්‍රවාහ ඇති සුභාෂිතම් සම්‍යක්
සම්බුධයන් වහන්සේ පිරිනිව් කල්හි ඒ කල්පයද නට කල්හි
මෙ කපට යටින් එකානූවන කප්හි භූත-භව්ෂ්‍යත්-වර්තමාන
ඝන කාලත්‍රය දැකීසිටිවූ විදර්ශි නම් භගවත් අර්හත් සම්‍යක්
සම්බුධයන් වහන්සේ සමනිස් පැරැම් පුරා තුන්වන අත්තභාව
යෙන් චුතවැ කුසිසුරයෙහි ඉපැදී එහි ආයු පමණින් දිව්‍ය
2 සම්පත් වළඳා පඤ්ච මහා විලොකනෂ කොටැ දිව්‍ය බ්‍රහ්ම
යන්ගේ ආරාධනා පිළිගෙණ එයින් චුතවැ සමසා භූවන 3
බන්ධුවූ බන්ධුමති නම් නුවරෙහි අක්ෂීණ බන්ධුමත්වූ බන්ධුමති
නම් මහරජානන් වහන්සේ නිසා ප්‍රබුධ වදන භාත්‍ර බන්ධු
මතිවූ බන්ධුමති නම් දේවීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ
ගෙණැ දස මසක් ඇවැමෙන් මවු කුසින් බිහිවැ මදන ජ්‍වර
ජර්ජරිත ශ්‍රුවති ජන නයනොං'තපලා'සාද තරුණ සඛී එල
කාය මානවූ වක්‍රසර්ථල ඇති යෞවනයට පැමිණැ සෙනහ
මධුර දර්ශන ඇති :–

සුදර්ශනා නම් මහා දෙවීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇත්
නාවූ එක් ලක්ෂ විසි දහසක් නාටක ස්ත්‍රීන්ගේ ප්‍රෙම සීමා'විල
ඕඝවූ ශෘඞ්ගාර සුධා නිෂෙක පාත්‍රවැ අට දහසක් හවුරුදු ගිහි
ගෙයි වැසැ චතුර්විධ පූර්ව නිමිත්ත සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යාෂෙහි
අභිලාෂවැ සුදර්ශනා දේවීන් වහන්සේගේ කුක්ෂියෙන් නිර්වූඪ
ප්‍රෙම බන්ධන ඇති සම වෘත්තන සඞ්ඛ්‍ය නම් පුත්‍ර රත්නය උපන්
කල්හි අජානීය සෛන්ධවයන් යෙදූ රථයෙන් මහානිෂ්ක්‍රමණය
කොටැ සුවාසූ දහසක් පිරිමින් හා කැවිවැ මහණවැ අට මසක්
මහාවිර්‍ය කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් සුදර්ශන
නම් මහ සිටානන්ගේ දියණියන් විසින් එළවන ලද්දාවූ කිරි
පිඬු වළඳා දහවල් සහමල් සල් වෙනෙහි දිවා විහාර කොටැ:–

සවස් වේලෙහි සුජාත නම් යව පාලයා විසින් එළවන
ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ බහල තුමුල මොහ පටල
පාවන සහායවූ පාවල බොධියට එළඹැ නෙ පණස් රියන්
වප්‍රාඝනාරූඪවැ මාර සොර නාර හුංකාර විකාර නිකර ධූරී
කරණයෙන් ප්‍රකටී භූතවූ බොධි සතුබ සාමර්ථ්‍යය ඇතිවැ
යාමත්‍රයයෙහි ඥනත්‍රයා'ධිගමය කොටැ ප්‍රතෘෂ කාලයෙහි

1 අශෙෂවූ. 2 සුව. 3 සමග්‍රානුවෘත්තත්‍රය බන්ධුරවූ.

සවිඥතා ඤාන සම්බිගමයෙන් අනුන පාණ්ඩිත්‍යයට පැමිණෑ සත් සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙණ ධම්මක් පවත්වා සියලු ලොවට භූදකලාවැ මවුපිය තනතුරෙහි සිටැ බඹුවර්ණ වස් වන්නට පටන්ගත් සෙයෙක.

එ සමයෙහි අපගේ බොධි සත්ත්වයන් වහන්සේ **නාග ලොකයෙහි** මහානුභාවවූ **නාගරාජවැ** ඉපදූ අනෙක කොටි ශත සහස්‍ර සඞ්ඛ්‍යත වූ නාග සෙනා පරිවාරයෙන් යුක්තවැ සවිඥයන් වහන්සේ කරා එළඹැ බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේ වැඩැ හිඳිනට සුදුසුවූ මණ්ඩපයක් මවා එහි සපරිවර සවිඥයන් වහන්සේ වඩා හිඳුවා සත් දවසක් මහදන් දී අනන්‍ය යෙහි දවස් බුදුන් වහන්සේ වැඩැ හිඳිනට සුදුසුවූ සවී රත්න මණ්ඩිතවූ සථා'නොචින සඛණී කමිනන්‍ත විනාසයෙන් විසි තුරුවූ අසනයක් මවා දී මෙහි අනුසසින් මොවුන් වහන්සේ විසින් දන්නා ලද්දුවූ සඞ්ඝම්මය මමද ප්‍රත්‍යක්ෂ කට හෙම්වසි පතා වදාළසෙයෙක. ඒ සවිඥයන් වහන්සේද "මේ **මහා පුරුෂතෙම** මතු මාසේම සවිඥ වන්නේය"සි විවරණ පතුල් දී වදාළ සෙයෙක.

ඒ අසා වදාළ **මහාපුරුෂයානන්** වහන්සේ ද මම මතු බුදු වෙම් ලසි එම සමතිස් පැරුම් පිරීමෙහි දැඩ ග්‍රහණය කොටැ වදාළසේක. මෙසේ මාගේ ගෞතම ගොත්‍රයෙහි උපන් සර්‍වාම් දරුවන් වහන්සේ විසින් මනුෂ්‍යවැ ද දෙවෙන්‍දුවැ ද සිංහරාජවැ ද චක්‍රවර්ත්තිවැ ද නාගරාජවැ ද නොයෙක් ලෙසින් කුසල් කොටැ පතා ලද්දුවූ සඞ්ඝම්යම සරණ්‍යයම් සි **දහම් සරණ** යායුතු.

විදර්ශි සම්බුධ විවරණ කථා නිම.

සිඛි සම්බුධ විවරණ කථා. මෙසේ සකල ධම්මා'ධම්ම 1 විභාග නිදර්ශිවූ **විදර්ශි** නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ පිරිනිවි කල්හි ඒ කල්පයද විනාශයට පැමිණ කල්හි එයින් ඔබ්බෙහි එකුන් සැට කපෙක්හි සවිඥය යන නාම ශ්‍රවණ මාත්‍රයකුදු ලොකයෙහි නොවීය. මෙයින් එකුන් තිස් කපෙකින් මත්තෙහි වනාහි කෙලස බඹන දහන සිබිවූ **සිඛි** නම් සර්‍වාම්දරුවෝය ඤානාතිරෙක සයම්භූවූ **වෙස්සභූ** නම් සර්‍වාම්දරුවෝයයි මෙසේ හිමියෝ දෙදෙනෙක් ලොකයෙහි පහළවූ සේක.

1 විභාගදර්ශිවූ.

එහි, රාග නාග මාන මද්දන සිබිවූ සිබිනම් සවාමිදරුවෝ සමහිස් පැරුම් පුරා දෙවියන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ තුසි පුරයෙන් චුතවැ පදුම්රඟ මණ්ඩප කිරණ සප්තරණයෙන් නිරන්තරයෙන් අරුණවත්වූ **අරුණවති** නම් රාජධානියෙහි අති තරුණවූ ලොකත්‍රය ව්‍යාපි වූ තෙජසින් අරුණවූ **අරුණවන්** නම් මහරජානන් වහන්සේ නිසා සාරවන්තු ශොභාවතිවූ **ප්‍රභාවතින්** වහන්සේගේ කුසෙහි යෙහි පිළිසිඳ ගෙණැ දස මසක් ඇවැමෙන් ප්‍රසවවැ ප්‍රණය කුපිත ප්‍රණසිනින්ගේ මාන ග්‍රහ විෂ චිකිත්සා'හී හෙෂජායමානවූ නව යෞවනයට පැමිණැ :-

පඤ්ච කාම සම්පත්තිය සවරූපවූ **සුචිකාම** නම් දේවීන්වහන්සේ ප්‍රධාන කොටැ ඇත්තාවූ සූවිසි දහසක් නාටක සත්‍රීන්ගේ නයන මදනසදන 1 ධුරන්ධරවැ සද්දහසක් හවුරුදු ගිහිගෙයි වැසැ සුචිකාම දේවීන් වහන්සේගේ කුසින් සෞභාග්‍ය උවතී ලවූ **අතුල** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි ඛ්‍රහ්ම සංඥිත චතුර්විධ නිමිත්ත දැකැ **හසති** වාහනයෙන් මහා'භිනිෂ්ක්‍රමණය කොටැ සැත්තැ දහසක් පිරිමින් හා කැටිවැ මහණවැ අට මසක් **මහාවියූහ** කොටැ වෙසඟ මැදි පොහෝ දවස **සුදර්ශන** නම් ගමැ ප්‍රියදර්ශන නම් මහ සිටානන්ගේ දියණියන් විසින් පිළිගන්වන ලද්දාවූ මිහිරි 2 කිරි පිඬු වළඳා හෘදය මදන මන්දිරායමානවූ **බදිර වන**යෙහි දිවා විහාර කොටැ:-

සවස් වේලෙහි අනවමදර්ශි නම් තාපසයන් විසින් පිළිගන්වන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ සකල භව දුඃඛ ප්‍රත්‍යනිකවූ **සුඛසීඛ** බොධි ද්‍රැම මූලයට එළඹැ සූවිසි රියන් වප්‍රාසනයෙහි වැඩ හිඳැ මාරබල බාල මෘණාල භෙදයෙහි ප්‍රවර චරාහ විලාස දක්වා යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොටැ අරුණෝදයෙහි කෙලෂා'වරණ ව්‍යපගමයෙන් විශුඛවූ අනන්තාකරණ ඇතිවැ සම්බුඥානාඥුන සම්බිගමයෙන් මසාක ප්‍රාපතවූ මනොරථ ඇතිවැ බොධිය සම්පයෙහි සත් සති යවා ඛ්‍රහ්මා'රාධනාව පිළිගෙණැ ධම්සක් පවත්වා වදාළ සෙයෙක.

මෙසේ සමසත සතත්වාභි'මතාර්ථ සාධ'නෙක කල්ප 3 ඛ්‍රියාවූ සිබි නම් සම්‍යක් සම්බුඛයන් වහන්සේ ලොකානුග්‍රහ කොටැ වදාරණ කල්හි අපගේ සවාමිදරුවෝ සවාමිය අමාත්‍යය

1 නයන වදන් මදන. 2 මිපිඬු. 3 සිබිවූ.

යනාදිවූ සපතා'ඛ්‍ය සමෘඞ්ගින් අපරිහූනවූ **අපරිහූන** නම් නුවරෙහි විරචිතවූ ඉන්ද්‍රිය දමනය ඇති **අරිඤ්ජමනම්** රජවැ තමන් වහන්සේගේ නුවරට එළඹියාවූ සම්‍යක් සම්බුඛයන් වහන්සේට පෙරගමන් කොටැ දැකැ වැඳැ පූදැ බණ අසා සතර් මහාවීප යෙහි එකහෙළා වස්නා මහාමෙඝයක් සේ සත් දවසක් මුළුල්ලෙහි මහදන් දී බුදුපාමොක් මහා සඞ්ඝයාවහන්සේට තුන් සිවුරු පිණිස ලක්ෂගණන් අඟය ඇති උතුරුසළු දහස්ගණන් දී තමන් වහන්සේගේ මඟුලැත්හු සදැ සිටුවා ඔන්න උසෙක පමණ බෙහෙත් බඳු පූරා දන් දෙවා වදුලසේක.

මෙසේ මහදන් දීද අනික් වසතුවක් නොපතා මෙහි පෙලෙන් මෙම සම්‍යක් සම්බුඛයන් වහන්සේ ලද **ඛම්මාභිසමය** ලබම්වයි කියා ප්‍රාර්ථනා කොටැ වදුලසේක. ඒ සචාම්දරු වෝද 'මේ මහා පුරුෂයානෝ මේ දැනයෙහි අනුසසින් මතු **බෝධිඤාණ** නම් සම්‍යක් සම්බුඛ වෙති'යි විවරණ පතුල් දී වදුල සේක. එබණ ඇසූ මහා පුරුෂයානන් වහන්සේද මම මතු බුදුවෙම්ල යි එම සමතිස් පැරැම් පිරීමෙහි තත්පරවැ වදුල සේක.

මෙසේ මාගේ සචාම්දරුවන් විසින් අනික් සම්පතනියක් නොපතා **සුමේඛතාපස** කාලයෙහි පටන් ගෙණැ මේ **අරිඤ්ජම** නම් රජවැ උපන් ජාතිය දක්වා බුඛෝත්පාදයෙහිද බුදු හමු වෙහිද අබුඛෝත්පාදයෙහිදු තමන්වහන්සේගේ සුභාවිතවූ බොධිසතවා'භිප්‍රාය වූ පරිද්දෙන් දැනාදී නොයෙක් පරිද් දෙන් පින්කම් කොටැ පතා ලද්දාවූ මේ සඞ්ඝම්මයම සරණ යෙමියි **දහම් සරණ යායුතු.**

සිබි සම්බුඛ විවරණ කථා නිමි.

විශවභූ සම්බුඛ විවරණ කථා. මෙසේ සංහෘත මදන ශිඛා ඇති **සිඛි** නම් සම්‍යක් සම්බුඛයන් වහන්සේ ශිඛා ප්‍රාපතවූ මනොරථ ඇතිවැ පිරිනිවන් පැ කල්හි ඒ බුඛානතරය ඉක්මුණු කල්හි **විශවභූ** නම් සම්‍යක් සම්බුඛයන් වහන්සේ සමතිස් පැරැම් පූරා **තුෂිත** පුරයෙහි ඉපදූ එහි ආයු පමණින් සිටැ දෙවියන්ගේ ආරාධනායෙන් **පඤ්චමහා විලොකනය** කොටැ එයින් සැවැ සම්පතනියෙන්

අනුපමවූ අනුපමනම් නුවරෙහි සත්ගුණයෙන් සුප්‍රතීතවූ **සුප්‍ර තීත** නම් මහරජානන් වහන්සේ නිසා විශුඩ ශීලවතීවූ **ශීල වති** නම් දේවීන් වහන්සේගේ කුස්හි පිළිසිඳැ ගෙණැ දස මසක් ඇවෑමෙන් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී නව යෞවන සුඳුර සුඳුරි ජන මදන මහෝ'තසව මඳිරවූ යෞවනයට පැමිණැ :-

ආචාරයෙන් පුවිත්‍රවූ රූපයෙන් විචිත්‍රවූ **සුචිත්‍රා** නම් දේවීන් වහන්සේ ප්‍රධානකොටැ ඇති නිස් දහසක් නාටක සත්‍රීන්ගේ මුඛ'චෂකෝ පනිත මධුර ගණ්ඩූෂ මධු පානයෙන් මත්තවැ දස දහසක් හවුරුදු ගිහිගෙයි වැසැ **සුචිත්‍රා** නම් දේවීන් වහන්සේ ගේ කුසින් ප්‍රසාද සුමුඛවූ සුප්‍රබුඩ පදෙමා'පම මුඛවූ **සුප්‍රබුඩනම්** පුත් රුවන උපන් කල්හි සතර නිමිත්ත දැකැ රන් සිවිගෙන් මහාභිනිෂක්‍රමණය කොටැ සත්නිස් දහසක් පිරිමින් හා කැවිවැ මහණවැ සමසක් **මහාවිෂ්ණී** කොටැ **වෙසක් මසැ** මැදි **පෝ හෝ දවස්** 1 **සුම්නා** නම් ගමැ ශාඩහාර කාමුක 2 නාග මාණවක මනොරථ වඩිනවූ **ශ්‍රීවඩිත** නම් නාග කන්‍යාව විසින් එළවන ලද්දාවූ කිරිපිඬු වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොටැ :-

සවස් වේලෙහි **නරෙන්ද්‍ර** නම් නාග රාජයා විසින් එළවන ලද්දාවූ අවමිටක් තණ පිළිගෙණැ ලොකාඑ **චයඃ** වත්සල මාංසලවූ **ශාල** බොඩියට පැමිණැ සතළිස් රියන් වප්‍රාසනයෙහි වැඩ හිඳැ මාර වීර වියඃ කර්පූර දහයෙහි ප්‍රබල වාහි විලාස දක්වා ක්‍රමයෙන් සම්‍යක් සම්බොධියට එළඹැ සත් සති යවා බ්‍රහමා'රාධනා පිළිගෙණැ **ධම්සක්** පවත්වා අනන්තා'පයඃඥාන ලොකා'ඒ සම්පාදනයෙහි අවිශ්‍රාන්තවූ උත්සාහ ශක්ති ඇතිවැ භුවනා'චායඃ ධුරයෙහි මස්තක ප්‍රාප්තවැ වසන සෙයෙක.

එසමයෙහි අහගේ සවාමිදරුවෝ තමන් වහන්සේ විසූ මහිමායෙන් සිහිකිරීම් මාත්‍රයෙකිනුදු සියලු ලෝකයට සරණවූ **සරණවති** නම් නුවරෙහි සඞ්ඝසනඩ සුදඃශීනවූ **සුදඃශීන** නම් මහරජවැ ගාම නිගම රාජධානියෙහි චාරිකායෙහි වඩනාවූ ඒ සඞ්ඝයන් වහන්සේ තමන් වහන්සේගේ නුවරට පැමිණි කල්හි ඔවුන් වහන්සේ කරා එළඹැ බණ අසා හටගත්තාවූ මහත් බුඩා'ලම්බණ ප්‍රීති ප්‍රසාද ඇතිවැ බුදු පාමොක් මහාසඩඝයා වහන්සේට තුන් සිවුරු හා එක් කොටැ මහදන් දී නිර්ධූත

1 සුවිත්‍රා. 2 නාක.

මාර හුෑ කුටි ඇති සවීඥයන් වහන්සේට අනුපමවූ ගඬ කුටි යක් කරවා ඒ සිසාරා විහාර දහසක් කරවා අනාතයෙහි සියලු රාජ්‍යශ්‍රී හැරැ ඔවුන් වහන්සේගේ ශාසනයෙහි මහණවැ සියලු සම්පත්හි තුණුරුවන් 1 අයති කොටැ තෙළෙස් ධුතා'ඩගබරවැ මහාගුණ පුරා මෙ මා පිරූ සුචරිතයෙහි අනුසසින් මතු මෙම විශ්වභූ සවීඥයන් වහන්සේ පසක් කළ පරිද්දෙන් සඬම්මය පසක්කට හෙම්ව සි කියා ප්‍රාර්තනා කොටැ වදාළ සෙයෙක.

ඒ සවීඥයන් වහන්සේ ද මේ උසාහෙම පුරාළ නෙම මේ සුචරිතයෙහි අනුසසින් මතු **ගෞතම** නම් සම්‍යක් සම්බුඩ වෙසි කියා විවරණ පතුල් දී වදාළ සෙයෙක. ඒ ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද මතු මම බුදුවෙම් ල යන අදහසින් එම සමනිස් පැරැම් පිරීමෙහිම ශත සහස්‍ර ගුණයෙන් තත් පරවැ වදාළ සේක. මෙසේ මාගේ සඟාමින් 2 විසින් 3 නොයෙක් කුසල් කොටැ නොයෙක් සම්පත්හින් සමෘඩ රාජ්‍යය හැරැ මහණවැ නොයෙක් යතනයෙන් පතා ලද්දාවූ සඬම්ය **සරණ** යෙමි සි **දහම් සරණ** යායුතු.

විශ්වභූසම්බුඩ විවරණ කථා නිමි.

කකුසන්ධ සම්බුඩ විවරණ කථා. මෙසේ සියලු බම් මහාතම්‍ය ———— ඝට 4 ප්‍රතිභූවූ **විශ්වභූ** නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි එයින් 5 මෑත එකුන් තිස් කපක් මුළුල්ලෙහි බුඩෝ'ත්පාදයෙක් නොවිය එයින් මුබෙහි අපසේ වූවන්ගේ තුඩද තුණු රුවන්හි නම් වකා පියන්ට (නොා) පොහොසත්වූ දෙවිදත්හු වැනි රත්නත්‍රයට ද්‍රෝහීන් පවා 'බුත් සරණයෙමි' කී 6 බසක් පමණකින් මතු පසේබුදුවැ අමාමහ නිවන් දක්නට හෙතු ලබන්නට සුදුසුවූ පස්වා දහසක් මුළුල්ලෙහි මාගේ සඟාමිදරුවන් පියවර එබූ සමනොළුහුල් වැකුහැ 7 කැලණිය වැකුහැ යනාදිවූ සුචරිත කළවුන් මාගේ ඉ සම්‍යක් සම්බුඩයන් වහන්සේ අමාමහ නිවණට ගෙණැ යන්නාට පොහොසත්වූ මාගේ සඟාමිදරුවානන් හිදැ බුදුවූ බෝරුක්හි පරම්පරායෙන් ආ රුක්හි පවා මල පරඹුලා ගෙණැ යුජා කළවුන් විසින් පවා සජීව බුදුන් වහන්සේට

---

1 අසිති කොටැ. 2 සඟාමිදරුවන්. 3 නොා එක්. 4 ප්‍රීති භූතවූ. ප්‍රති භූතවූ. 5 මුඛෝකි. 6 බස්. 7 කැලණිගඟ.

පූජාකළවුන් ලබන දිව්‍ය සම්පත්හි මනුෂ්‍ය සම්පත්හි වළඳවන්නාවූ සඟමිදරුවන් නො හැඳිනැ වන්නාවූ අප පොවා ඒ **තුණුරුවන්හි සරණ්** ගිනි ගිනි යැයි නො සිතා විෂ විෂ යැයි නො සිතා වැසැන වැසැන යැයි නොසිතා :–

චණ්ඩවූ සිංහ ව්‍යාඝ්‍රාදීන් චණ්ඩ සත්ත්ව කෙණෙකැයි නො සිතා අව්වෙකිවූ ප්‍රචණ්ඩවූ පරලොවක් ඇතැයි නො සිතන ජීවිතයත් අස්ථිරයයි නො සිතන රා බී මත් ආරොහකයන් නැඟි මතැතුන්සේ කි කි වන් කි කි වක්ම කරණ භයංකරවූ රාජ කුලයට වැදූ අප තුණුරුවන් ගැත්තනට කුමනනම් උපද්‍රවයෙක් වේදැයි යෙහෙන් නිදා පිබිදූ අකාල මරණීන් ගැලවෙන පමණ සුචරිත පුරන්නට සුදුසුවූ බුදුන් මරමිහයි දිවූ **අඞ්ගුලිමාලඝන්** බිණු පිරිනින් පොවා කපක් මුළුල්ලෙහි ලොක ශාන්ති එළවන්නාවූ බුදුන් පය අල්වා ගෙණැ **පර සක්** වළ ගසම්හයි දිවූ **ආලවඛාසා** පවා තමන් වළඳන පය ගත් **අනඳමහතෙරුන්** මෙන්සේ ලද ගුණ ධර්මයෙහිම පිහිටුවන මහතුන් ඇතිවීමෙන් ලොවට අසහාය සරණවූ, බුදුන් මරන්නට දිවූ **නාලාගිරි** නම් මතැත්හු පවා 'ධනපාල ය සිලපාල ය යන නම් කියවූ බුදුරජ මුහුණ බලා හුන් **බඞ්ගමුහුණඞ්ගු** පවා **පසේබුදු** වන්නට හෙතු ලබන්නාසේ බුදුන් වහන්සේගේ ධාතු පිහිටවූ සතර රියන් දැගබ බැඳවූ අපසේවූව වුන් පවා **අමාමහනිවණට** 1 ගබ් ගන්වන්නාවූ **තුණුරුවන්** පිහිටි මේ **ලක්දිව** පස් ගෙණැ මුදුනෙන් පිදූ වනුදූ බුදුන් වහන්සේගේ ශ්‍රීපාදය මුදුනෙන් පිදූවන් ලබන අමාමහ නිවන් ලබන්නට කාරණවැ සිරියාවූ සකල ගුණ හදවූ 2 මේ **හදු කල්පයෙහි** :–

නසනලද්දාවූ භව ප්‍රතිසන්ධි ඇති **ඛකුසඳ** නම් එක් සඟමිදරු කෙණෙකා, ලොක * ප්‍රණාම ගුණාගමන ඇති **කොණාගමන** නම් එක් සඟමිදරු කෙණෙක, ශ්‍රමණ ගජ ගඬ ලිපතවූ 3 **කාශ්‍යප** නම් එක් සඟමිදරු කෙණෙක, සසර දුකින් වෙවුළුම් ගත් අප තමන් පාමුල්හි ලා ගෙණැ රක්නාවූ පිරිනිවි පන් දහසක් හවුරුදු මුළුල්ලෙහි තමන් නම කීවන්ට වැද පිදූවන්ට පවා තමන් ලද තනතුරු දෙන සකල **සුරැහෝ'** **ඝනමවූ** හුදක් මා ම නිසා සසරට වන් මා සේවූ අඤ්ඤයක්හු ගේ 4 ප්‍රලඝට පවා මිහිරිබව වැටහෙණ පරිද්දෙන් ඉතා

---

1 ගබ. 2 ද්‍රුමවූ. 3 ඵපවූ ඔපතවූ. 4 ලිප්‍රළඝට. * ප්‍රමාණ

ආශ්චර්‍යවූ ගුණ ඇති **ගෞතම**නම් සම්‍යක්සම්බුදුරුවෝ එක් කෙණෙ කැයි මෙසේ සතර දෙනෙකුන් වහන්සේ බුදුවූ සෙයෙක. සකල ලොක කල්‍යාණ මිත්‍රවූ **මෛත්‍රෙය නාථ**යෝ මතු බුදු වන්නට දවස්ගතවෑ දැන් තුසි පුරෙහි වසන සෙයෙක.

එහි, පළමුවූ වතුවූ **ක්‍රකුසන්ධ** නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේ සමතිස් පැරුම් පුරා තුසි පුරයෙන් සැවැ යමසත සතහට සෙමකරවූ **ක්ෂෙමවති** නම් රාජධානියෙහි **ක්ෂෙමංකර** නම් මහරජ නන්ට පුරොහිතවූ **අග්නිදත්ත** නම් මහාබ්‍රාහ්මණයානන් වහන්සේ නිසා සවිඥ පුත්‍ර ලාභයෙන් විසොකවූ **විශාඛා** නම් 1 බැමිණියන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳ ගෙණෑ දසමසක් ඇවෑමෙන් මවු කුසින් නික්මෑ ක්‍රමයෙන් වැඩි මදන දහනා' විෂට විදගධ ගණ්ඩ වධූ හෘදය නිර්‍වාපණ'ණක සුධා ප්‍රවාහයෙක් සමානවූ නව යෞවනයට පැමිණෑ සෞන්දර්‍ය්‍ය ශොභා විරොව්තවූ 2 **රොවිනි** නම් බ්‍රාහ්මණීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති තිස් දහසක් නාටක සත්‍රීන්ගේ ශෘඩහාර යාඥ * සම්ප්‍රයොග යෙහි අග්‍ර ධුරීණවෑ සාර දහසක් හවුරුදු ගිහි ගෙයි වැසෑ **රොවිනි** නම් බ්‍රාහ්මණීන් වහන්සේගේ කුසින් ලොකොත්තරවූ **උත්තර** නම් කුමාරයන් වහන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකෑ:–

අජානීය සෛන්ධවයන් යෙදූ රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොටැ සතළිස් දහසක් පුරුෂයන් හා කැටිවෑ මහණවෑ අට මසක් **මහාවිශ්‍ව** කොටැ **වෙශක්** මසැ මැදි පොහෝ දවස් සුවිඛ්‍රවූ සත්‍රී පුරුෂයන් විසින් ගැවසී ගත්තාවූ **සුවිඛ්‍රර** නම් ගම්හි **වජ්‍රෙඤ්ඣ** නම් බ්‍රාහ්මණයන්ගේ දියණියන් විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඬු වළඳා 3 නිගිරි වෙනෙහි දිවා විහාර කොටැ **සුභද්‍ර** නම් යවපාලයා විසින් එළවූ අට මිටක් තණ පිළිගෙණෑ 4 ලොක ශොකා'පහාරීවූ **මහති** මහබෝ රුක් මුලට එළඹෑ නිස් රියන් වප්‍රාසනයෙහි වැඩ හිඳ මාර හෘදය පල්ලව දල කම්පායෙහි ඝූහා'නන්ත වාත විඝ්‍රම දක්වා බුදුවෑ සත් සති යවා බඹහුගේ ආරාධනා පිළිගෙණෑ 5 **ධර්මයක්** පවත්වා ලොකා'ර්ථ මධ්‍යාත්ත ප්‍රාපත කෙරෙමින් වසන සෙයෙක.

එසමයෙහි අපගේ සම්බුදුරුවෝ **ක්ෂෙම** නම් මහරජවෑ බුදු පාමොක් මහාසඞ්ඝයා වහන්සේට සවී පරිෂ්කාර දන් දී

1 බැමිණියන්. 2 විරොචන. 3 නිඹිරි. 4 ශොක ශාඛා පහාරීවූ.
5 ධර්මයක් වටා.

රජ්ජණ හැර බුඩශාසනයෙහි මහණවැ මම් මේ කුසලින් මේ බුදුන් වහන්සේ පසක් කළ සඩම්මයම පසක් කටහෙම්වසි පතා වදාළ සෙයෙක. ඒ ඇසූ සවීඥයන් වහන්සේද මේ මහා පුරුෂතෙම මෙම කප **ගෞතම** නම් සම්‍යක් සම්බුඩවෙයි කියා විවරණ පතුල් දී වදාළසේක.

එබස් ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ද "මම මතු බුදු වෙම් ලසි" එම් සමනිස් පැරැම් පිරිමෙහි දෘඪග්‍රහණය කොටැ වදාළ සෙයෙක. මෙසේ මාගේ සඩාම්දරුවූ සවීඥයන් වහන්සේ විසින් පවා මනොරථ ශත සහස්‍රයෙන් පතා ලද්දාවූ සඩම් යම සරණ යෙමසි **දහම් සරණ යායුතු.**

කකුසඬ සම්බුධ විවරණ කථා නිමි.

මෙසේ විචිත්‍රතාවූ භව බඬින ඇති **කකුසඬ** නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ අසීම සතුට කරුණායෙන් ලොකා'ඵ කොටැ බුඩ කෘත්‍යය නිමවා පිරිනිවන් පෑ කල්හි ක්‍රමයෙන් බුඩා'නතරයද ඉක්මුණු කල්හි සකල ලොකයා විසින් අනවරතයෙන් කරණ්ලද චරණ සරණා'ගමන ඇති **කොණාගමන** නම් සම්‍යක් සම්බුඩියන් වහන්සේ **තුසි** පුර යෙන් 1 සැවැ ප්‍රාසාද ශෘඩහා'ග්‍රයෙහි විරාජමානවූ නවරත්න ශොභා ඇති **ශොභාවති** නම් රාජඩානියෙහි **සඤදනන** නම් බ්‍රාහමණයානන් වහන්සේ නිසා **උනතර** නම් බ්‍රාහමණීන් වහන්සේගේ කුක්ෂියෙහි පිළිසිඳැ ගෙණැ ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී නව යුවති හෘදය හරණා'වාසීවූ සෞඳර්‍යයෙන් උද්දී පතවූ නව යෞවනයට පැමිණිහ:-

පරම මධුර ශාත්‍රවූ **රුචිගාත්‍රා** නම් බ්‍රාහමණීන් වහන්සේ ප්‍රධානකොටැ ඇති සොළොස් දහසක් සත්‍රීන්ගේ ප්‍රණය කල හා'වසාන සම්භාව්‍යමානවූ සමෙහාග ශෘඩහාර සුඩා'සවාද යෙන් තුන්දහසක් හවුරුදු යවා **රුචිගාත්‍රා** නම් බ්‍රාහමණීන් වහන්සේගේ කුසින් ප්‍රණය රසා'සවාහිවූ **සවාවිවාහන** නම් පුතනුවන් වහන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකැ **හසති වාහනයෙන්** මහා'භිනිෂක්‍රමණය කොටැ නිස් දහසක් පුරුෂ යන් හා කැවිවැ මහණවැ සමසක් **මහාවිසීති** කොටැ **වෙසක්** මසැ මැදි පොහෝ දවස් 2 **අගනිසෙන** නම් බ්‍රාහමණයන්ගේ දියණියන් විසින් එළවන ලද්දාවූ මිහිරි කිරිපිඬු වළඳහ:-

---

1 සැවවැ. 2 අගනිදෙව.

සිහිකරත් මිහිරිවූ 1 කිහිදි වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි කිතුදුහ නම් යවපාලයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ නව නිල මෙඝ කූට විලාසයෙන් සා'ඩම්බරවූ උදුම්බර බොධියට එළඹැ විසිරියන් වප්‍රාසනයෙහි මාර විර 2 සොහා'සුදු නිර ශොභයෙහි ප්‍රලය දිවාකරවැ යාම තුයයෙහි විද්‍යුත්‍රයා'ධිගමය කොටැ ප්‍රත්‍යූෂයෙහි සඞ්ගී සමධි ගමයෙන් සම්පූර්ණවූ මනොරථ ඇතිවැ සත් සති යවා බ්‍රහ්ම යාගේ ආරාධනා පිළිගෙණැ ධර්මඝක් පවත්වා' සියලු ලොවට ඉහලොකා'ඒ පරලොකා'ඒ සාධනයෙහි 3 අසාධාරණ කරුණ' ධිනවැ ම වසන සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්ත්වයන් වහන්සේ සකල සම්පත්තීන් අසිපිලවූ මිථිලා නම් නුවරැ සම්පත්තීන් අහවීතවූ ප්‍රතිරාජසෙවා නිවාරණ පළිතවූ පඤ්ච නම් මහරජවැ සඊඤ යන් වහන්සේට තුන් මසක් උපසථාන කොටැ අනතයෙහි බුදු පාමොක් මහාසඞ්ඝයා වහන්සේට 4 චිනඝටාදිවූ මහඇති වසතු ඇතුළුවූ සඊපරිඤකාර දන් දී මම මේ අනුසසින් මතු මේ සමයක් සම්බුධයන් වහන්සේ පසක් කළ සඞ්ඝියම පසක් කටහෙම්වයි කියා මේම සඞ්ඝියම ප්‍රාර්ථනා කොටැ වදාළ සෙයෙක.

ඒ සඊඤයන් වහන්සේද මේ මහාපුරුෂතෙම මේ දාන යෙහි අනුසසින් මෙම කප්හි ගෞතම නම් සමයක් සම්බුඩ වෙයි කියා විවරණ පතුල් දී වදාළ සෙයෙක. ඒ ඇසූ මහා පුරුෂයානන් වහන්සේද මම මතු බුදුවෙම්ලයි යන අදහසින් මෙම සමතිස් පැරුම් ඉරිමෙහි දැඩ වුතවූ සෙයෙක. මෙසේ මාගේ සවාමිදරුවන් විසින් අනෙක ජාතියෙහි නොයෙක් යතන යෙන් පතා ලද්දාවූ සඞ්ඝිය සරණ යෙමිසි **දහම් සරණ යායුතු.**

කොණාගමන සම්බුධ විවරණ කථා නිමි.

කාශ්‍යප සම්බුධ විවරණ කථා. මෙසේ **කොණාගමන** නම් සමයක් සම්බුධයන් වහන්සේ පිරිනිවි පසු ඒ බුධානතරයද ඉක්මුණු කල්හි විශකලිත විශ්ව පාපවූ **කාශ්‍යප** නම් සවාමිදරුවෝ තුසි පුරෙන් චුතවැ බාර ණසි නම් රාජධානියෙහි **බ්‍රහ්මදත්ත** නම් බ්‍රාහ්මණයානන්

1 නිඹිරි. 2 සොරපද. 3 අසාධ්නව. 4 එන වස්තුවු.

වහන්සේ නිසා ඛනවති නම් බ්‍රාහ්මණීන් වහන්සේගේ කුසෙහි පිළිසිඳ ගෙණ දස මසක් ඇවෑමෙන් ප්‍රසවවැ ක්‍රමයෙන් වැඩී යෞවන විලාස පාටවවූ මධුරා'වසථාවට පැමිණ අමනු විලාස මන්දිරවූ සුනෙත්‍ර නම් බ්‍රාහ්මණීන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති අට සාළිස් දහසක් නාටක සත්‍රීන්ගේ කරුණ ශෘඞ්හාර කෙලි සහාශවැ දෙදහසක් හඳුරුදු ගිහි ගෙයි වැසැ සුනෙත්‍ර නම් බ්‍රාහ්මණීන් වහන්සේගේ කුසින් සඳ්ලොක විජි තවූ විජිතසෙන නම් පුතණුවන්සේ උපන් කල්හි සතර නිමිත්ත දැකැ ප්‍රාසාදයෙන්ම මහාභිනිෂක්‍රමණය කොටැ:-

තමන් වහන්සේ හා කැවිවැ නික්මුණුවූ ගැහැණුන් පිටත් කොටැ සෙසු පරිවාර හා කැවිවැ මහණවැ සත් දවසක් මහාවිශ්‍ය කොටැ වෙසක් මසැ මැදි පොහෝ දවස් සුනෙත්‍රනම් බැමිණිය විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඩු වළඳා උතුරණ්ඩ වෙන් බාහිරවූ හෘදයා'නඳ මන්දිරවූ ඛදිර වනසෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි සොමනස් නම් ශවපාලයා විසින් එළ වනලද්දාවූ අට මිටක් තණ පිළිගෙණැ මාර වීර විරොධ නිරොධිතවූ න්‍යග්‍රොධ බොධි මූලයට එළඹැ පසලොස් රියන් වජ්‍රාසනසෙහි වැඩැ හිදැ මාර'ණීක ප්‍රත්‍යනීක නිජ පරාක්‍රම ප්‍රභාව ඇතිවැ යාමත්‍රයයෙහි විද්‍යාත්‍රයා'ධිගමය කොටැ ප්‍රත්‍යූෂයෙහි සවාසනා සඒකෙලශයන් නසා බුදුවැ බොධි සම්පයෙහි සත් සති ඝවා බ්‍රහමා'රාධනා පිළිගෙණැ ධම්මක් පවත්වා සියලු සත්ත්ව ලොකයා තමන් වහන්සේගේ සඩම්මා'මෘත ප්‍රවාහයෙහි ගලමින් 1 උල්පවමින් නිවමින් සනහමින් වසන සෙයෙක.

එසමයෙහි අපගේ බොධිසත්ත්වයන් වහන්සේද සකල ලොක පාලවූ ඝෝනිපාල නම් මාණවකවැ ඝවිඤ්ඤාරනම් කුමහ කාර සහාශයන් හා කැවිවැ සඒඤයන් වහන්සේ කරා එළඹැ සඒඤයන් වහන්සේගේ බණ අසා මෙසේවූ බණ ඇසූ අප සේ වූවෝ පෙරළා ගෙට යෙද්දැයි කියා බුඩ ශාසනයෙහි මහණවැ පිළිවෙත් පුරා එම සඩම්යම පතා වදාළ සෙයෙක. ඒ සඒඤ යන් වහන්සේද මේ මහාපුරුෂතෙම අපට දෙවනුව මෙම කපැ ගෞතම නම් සම්‍යක් සම්බුඩවෙයි කියා විවරණ පතුල් දී වදාළ සෙයෙක.

---

1 උපුල්වමින්.

මෙසේ මාගේ සවාමිදරුවන් විසින් දීපඞ්කර සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ පාද මූලයෙහි පටන් කාශ්‍යප නම් සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ ශ්‍රීපාදමූලය දක්වා ඒ ඒ සඒඥයන් හමුවෙහි ධන පතන මහ දුගියන්හු සේ ද ආහාර සොයන මහාප්‍රෙතයන්හු සේ ද මවුන් සොයන අසරණවූ පුත්‍රයන්හු සේ ද රාජ්‍යය පතන තරුණ රාජකුමාරයන්හු සේ ද මාගිය සොයන මං මුළා එකන්හුසේද සුපවුන් සොයන මහානෑවියන් හුසේද සෙවනක් සොයන ඝර්ම්'හිතපත එකන්හු සේද සරණක් සොයන දුඃඛිත සතවයන්හු සේ ද මුකතියක් සොයන බඳින ගත එකන්හු සේ ද ඖෂධයක් සොයන රොගාතුර එකන්හු සේ ද අනෙක යන්නයෙන් පතා සාරාසඩ්ඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි දුක් ගෙණැ අනන්තයෙහි බොධි මූලයෙහි වප්‍රාසන යෙහි වැඩ හිදැ පසක් කළාවූ සඩ්ඝ්‍ය සරණයෙම්සි **දහම් සරණ යාසුතු.**

කාශ්‍යප සම්බුඩ විවරණ කථා නිමි.

සුවිසි විවරණ කථා නිමි.

ප්‍රථම භාගය සි.

ජාතක ධර්ම සඞ්ග්‍රහ.

නවද, මෙසේ සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි ඒ ඒ බුදුන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහි නානා ප්‍රකාරවූ සුචරිත පිරීමෙන් මෙම ධර්මයම පතා වෙසතුරු අත්බැව දක්වා සම නිස් පැරැම් පිරුවාවූ **මහාපුරුෂයානන්** වහන්සේ අනන්තා'පරි යන්ත කාලයෙහි ඒ ඒ ජාතියෙහි කොටැ වදාළ සුචරිත කියා නිමවත් එම සර්වාඥ්‍යරුවන්ටත් උගහටය. එහෙයින් ඒ මහාපුරුෂයානන් වහන්සේගේ **ධර්මලොභය** හඟවන පිණිස **පන්සිය පණස් ජාතකයෙහි** ඇතුළත්වූ සුචරිත එක දෙශයෙකින් (කියා) කිවාවූ මාගේ හා ඇසූ සැදහැ ඇත්තවුන්ගේ සිත් හා සනහනු පිණිස **අපණ්ණකාදිවූ** ජාතකයෙහි කථා ශරීරය හැරැ ගෙණ ඒ සර්වාඥ්‍යරුවන්ගේ ධර්මලොභය හඟවම්. මා තබා චණ්ඩාලයක්හු තුඹින් ඇසුවද ඇසුවනට දමා මහ නිවන් සිඹ කරන්නාවූ ඒ කථා විශෙෂයෝ රත්නත්‍රයයෙහි ප්‍රිති ප්‍රසාද ඇත්තාවූ සත්පුරුෂයන් විසින් සෙනහ ඇතිවැ ආදරයෙන් ඇසිය යුත්තාහු යි.

ඒ කෙසේද? යත්:-

මාගේ සර්වාඥ්‍යරුවෝ මා ඇතුළුවූ සියලු සත්ත්වයා ගන්නා දුකට එකහෙළා තුබූ ල කණියවා ජාතියෙන් ජාතියෙහි පර වැඩ සඳහා දුක් ගෙණ ඇවිදිනාහු **අපණ්ණකජාතකයෙහි** ප්‍රඥාසම්පන්නවූ මහවෙළඳවැ පන්සීයක් ගැල් පිරිවරා ගෙණ මරු කතරට පැමිණ නමන්සේම පන්සියයක් ගැල් පරිවාර ඇති නුවණ නැති අනිත් වෙළඳහු මිනිස් වෙස් ගත් යකුන්ගේ 1 වඤ්චාවට හසුවැ ඔවුන්ට ගොචරවැ නට කල්හි තුබූ තමන් ගේ අසාධාරණ බුද්ධි ශක්තියෙන් යක්ෂයන්ගේ මායම් දැනැ ඔවුන්ට ගොචරවූ පරිවාර හා තමන් හා ගළවා ප්‍රඥයෙහි මස්තක ප්‍රාප්තවැ යක්ෂ ගොචරවූ සත්ත්වයන් ගළවන්නෝද ධර්මයෙහි කළ ලොභයෙන්ම බුදු වෙම්හ යි යන අදහසින් ගැළවූහ.

නවද, **වණ්ණුපථ ජාතකයෙහි** එසේම මහවෙළඳවැ පන් සියයක් ගැලින් යුක්තවැ වඩනාහු ජලය ක්ෂයවැ ගියකල්හි එහි එතෙක් පරිවාර ජනයා නහන්නට බොන්නට පැන් නොලදින් වියලී මියන්නට වන් සමයෙහි තුබූ මරු කතරෙහි

1 බඹව.

නිල්වන් 1 ඊතණපදුරක් දැකැ සෙසු තැන්හි ගස් කොළ වියලි මිය යාදී මෙතැන්හි මෙගස 2 නිල්වැ තිබෙන්නේ නියතයෙන් මේ යටැ පැනන් ඇතිහෙයිනැයි බිම කණවා යටැ මහගහ වසා සිටි ගල බිඳුවා තල් කදක් සා මහත් ජල ධාරාව පැන නැඟි කල්හි මහාජනයාට පැන් දී තමන් ඇති කළ ඒ පැනින් ම ඒ මරු භූමියෙහි යන එන වෙළඳුන්ට පැනින් වන ඵලා දුරු කොටැ ලොකා'ථ කරන්නෝද මේ සසර ඝෝර පිපාසායෙන් පෙළෙන සත්වයාහට පැන් දී දුක් නිවූසේම අමෘත මහා නිර්වාණය ගෙණැ දී සසර දුක් නිවිය හෙම්වයි කියා මේ ධර්මයම ප්‍රාර්ථනා කළහ.

තවද, සෙනි වාණිජ ජාතකයෙහි වෙළඳවැ ලක්ෂයක් වටනා රන්තලිය දුටු ලොහොබි වෙළඳහු 'නිකම් හැරිගන්මි' යන සිතින් මේ කදුවළලු අටකුත් 3 නොවටි සි කියා ගහා කොටැ ගිය කල්හි තුමූ ඒ ලක්ෂයක් වටනාබව කියා ඒ පාත්‍රය ඇත්තවුන් "සහාම්දරුවෙනි! ආදි ආ වෙළඳුනෝ මේ මදට භාගයකුත් නො වටිසි කියා අල්වා ගෙණැ බිමට දමා පියා ගියහ. නුඹවහන්සේ දැන් ලක්ෂයක් වටනා රන්පාත්‍රයකැයි කියන සෙයෙක. ඒ නුඹගේ පිණින් රන්වූ නියායෙක් වන. ඇපි මේ රන් පාත්‍රය නුඹටම පූජාකරම්හ"යි දුන් කල්හි තමන් වහන්සේ අත තුබූ පන්සියයක් මසුරන් හා පන්සිය යක් වටනා බඩු ඔවුන්ට දී තමන්ගේ ඇති වසතුයෙන් අටමස් සක් හා පසිඳිබිය හා තුලාදණ්ඩ මතු හැරිගෙණැ යන්නාහුද අනුන්ට අධර්මයක් නොකොටැ ම ධර්මයක්ම රක්ෂාකළහ.

තවද, චුල්ලසෙඨි ජාතකයෙහි ධන සිටුවෑ වීථියෙහි මියැ හොත්නාවූ මියකු දැකැ 'මේ මියා ගෙණැ වෙළඳුම් කළ එකෙක් ඇත්නම් ධනසිටු වෙයි කියා තමන්ගේ උපදෙශ කළාවූ දුගීත තැනැත්තහු * ලක්ෂයක් ලබන පරිද්දෙන් කොටැ අනතයෙහි තමන්ගේ දියණියන් ඇතුළුවූ සියලු වසතු වට ඔහු හිමි කරන්නාහුද මෙසේම මතු මට ඤාතිරූවන්නට ම් ලද නිර්වාණ සම්පත්තියද හිමියයි කියා මේ සඛර්මයම අභිලාෂ කළහ.

තවද, තණ්ඩුල නාලි ජාතකයෙහි ඇතුළු නුවර පිරිනුවර සහිතවූ සරාජකවූ දෙලොස් යොදුන් බාරාණසිය සාල් නැළි යක් වටියයි කියන්නාවූ අශුභවූ අශය කරණ තැනැත්තහු

1 තණපතක්. 2 නිලන්නේ. 3 නොවටිසි.

* දෙලක්ෂයක් ලැබූ බැව් ජාතක පොත්හි පෙණේ.

වළකා අශ්වාදිවූ සියලු වයතුයෙහි ඇති අනර්ථම දක්වන්නාහු මා මේ අනුත්ට අලාභ නොකොට වයතුවෙහි අගය කී කුසලින් මතු බුදුවැ ලෝවැස්සන්ට සියලු වයතුයෙහි ඇති නිර්ඝයම හැඟවිය හෙම්ව සි කියා සඞ්ඛ්‍යම ප්‍රාර්ථනා කළහ.

තවද, දෙව ධම්ම ජාතකයෙහි දෙවධම්ම කියා තාපසයා අතින් තමන් මළුන් ගලවන්නාහුද මම මෙහි අනුසසින් මතු මාගේ ධර්මදේශනාවෙන් යකු අතින් මොවුන් ගැලවුවා සේම සියලු සතුන් සසරින් ගැලවිය හෙම්ව සි කියා සඞ්කල්පම පතා වදාළ සෙයෙක.

තවද ඛණ්ඩහාලි ජාතකයෙහි රජ්ජුරුවන් නිසා දරකැවිදුව වඩා හොවා කිරි බොන කුමාරවැ ඒ රජ්ජුරුවන් මේ මා පිත් නොවෙයි කී කල්හි මැනියන් වහන්සේ මොහු තොප පුතනුකෙණෙක් වූ නම් ආකාශයෙහිම හිඳිත්ව සි නැත බිමහී මියෙත්වයි කියා පය ගෙණැ ආකාශයට දැමූ කල්හි රාජධානි මසකයෙහි ආකාශයෙහි පළක් බැඳැ හිදැ:-

"පුත්තෙහා නත්‍යහං මහාරාජ! තුවං මං පොස! ජනාධිප!
අඤ්ඤෙපි දෙවෝ පොසෙති කිඤ්ච දෙවෝ සකං පජං"

කියා බණ වදාරා තමන් පුත්බව හිවිස්වන්නෝ ද මතු තමන් නිලෝ මුදුන් පැමිණැ තමන්ගේ ධර්මදේශනා සියලු සත්ත්වයාට ධම් සචරූප භගවන බවට බිජුවට හිදුවූ කෙණෙකුන් සේ සඞ්ඛ්‍යවම අවශ්‍යවූහ.

තවද, ගාමිණී ජාතකයෙහි තමන්ගේ වැඩිමහළු නැයන් සිටියදී තමන්ගේ අවවාද කළ බාල කුමාරයා රාජ්‍යසම්පත්ති ලැබීමට කාරණ කරවන්නාහුද මතු තමන් බුදුවූ සමයෙහි තමන්ට නොකියාවූ දිව්‍ය බ්‍රහ්මාදීන් සිටියදී තමන් කී පරිදි දෙන් ධර්මය පිරූ මනුෂ්‍යයන් නිර්වාණ සම්පත්ති ලබන බවට පූර්වනිමිත්ත පානාස් සේ ධර්මයෙන්ම ධර්ම්ප්‍රසවය කළහ.

තවද, මහාදෙව ජාතකයෙහි හිසැ එක නරයක් දැකැ සුවාසූ දහසක් හවුරුද්දට ආයු ඇතිවැ ද රාජ්‍යය හැරී මහණ වන්නාහු මේ ධර්මයම සොයා මහණවූහ. තවද, සුවණ්ණහංස ජාතකයෙහි රාජ්‍යයක් රකිම්සි නොයෙක් පරිද්දෙන් උපසාහ කරණ තැනැත්තෝද සුවසේ නිදන්නා නම් නොවෙසි

තවද, යමෙක්හු බොහෝ දෙනා සිසාරා හෙවැ රක්‍ෂා කෙරෙත් නම් හෙද සුවසේ නිදන්නා නම් නො වෙයි. වැළි කිමෙක්ද? යත්:–අනුත් තමාට කරණ රක්‍ෂාද තමා අනුන්ට කරණරක්‍ෂාද හැරී පියා හුදකලාවැ තව පැල්හි ධර්‍මය රක්‍ෂා කරණ තැනැත්තේම යෙහෙන් නිදයි කියා ධර්‍මය රක්‍ෂාකරණ තැනැත්තහුම සුවපත් කොටැ රැ හෙවැ බණ කියන්නාහුද ධර්‍මයටම ප්‍රශංසා කළහ. මෙසේ මාගේ සහාම්දරුවන් විසින් අනෙක ජාතියෙහි අනෙකලෙස ප්‍රශංසා කරණලද්දාවූ පතන ලද්දාවූ සබ්බර්‍මයම සරණ යෙමි යි **දහම්සරණ සාසුතු.**

තවද, **ලක්‍ෂණ මෘග ජාතකයෙහි** තමන්ගේ අවිනීතවූ පුත්‍රයා පන්සියයක් පමණ පරිවාර මුවන් නොයෙක් පරිද්දෙන් විනාශයට පැමිණවූ කල්හිද තමන් කීකරු පුතනුවන් තමන් පරිවාරයෙහි පන්සියයක් පමණ මුවන් නො නසා රක්නා පරිද්දෙන් අවවාද දෙන්නෝද ධර්‍මයටම අනුග්‍රහ කළහ. තවද **නිග්‍රෝධ මෘග ජාතකයෙහි** රන්වන්වැ සියලු මුවන්ට රජවැ රජ්ජුරුවන් කෙරෙන් අභය ලදින් තමන් සරණවන් ගර්භිණීවූ මෘග ඩෙනුව රක්‍ෂා කරණ පිණිස දම් ගෙඩියෙහි හිස් තබා හෝ නෝද ධර්‍මයටම දිවි පුදා හොත්හ.

තවද, **ඛණ්ඩින ජාතකයෙහි** මුවදෙනට වසඟවැ ශරප්‍රහාර යෙන් නටුවාවූ මුවා දුකැ **වෘක්‍ෂ දේවතාවැ** සිටැ සියලු වනය ඒක කොලාහල කොටැ කාමයෙහි ආදීනව හඟවා ධර්‍මදේශනා කරන්නෝද දැන් බුදු තුඩිනුදු තමන් එදා වදාළසේ යහපතැයි * ප්‍රශංසාකරණ පරිද්දෙන් ධර්‍මදේශනා කළහ. තවද, **වාන මෘග ජාතකයෙහි** රස තෘෂ්ණායෙන් 1 මිහි මුසු තණයෙහි කළ ලොහයෙන් රාජා'ඛ්‍රණයට පවා නැඟි ආවාවූ මුවා දුකැ රජවැ සිටැ කාමයෙහි ආදීනව වදාරන්නෝ දැන්වන ලොකොත්තරවූ ධර්‍මකථිකතත්වයට එ දවස් ශ්‍රමකරන්නාසේ සියලු බාරාණසි වාසින්ට ධර්‍මදේශනා කළහ.

තවද, **ඛරාදිය ජාතකයෙහි** තමන් නො කීකරුවූ 2 බැන මුවාවූ මරණින් මේ කල්හිදු තමන් නො කීකරුවන්ට ම වන විපැත්තිය හඟවන්නා සේ මුවවැ සිටැ ද ධර්‍මකථිකතත්වය නො හළහ. තවද, **කිපල්ලජ්ඣ මිග ජාතකයෙහි** මුවරජවැ දැන්

---

* මාප්‍රශංසා. 1 මිහිරි මුසු. 2 බැන මුවාට.

තමන්ගේ අවවාද කළවුන් මරහුගේ මුලින් ගැලවෙන බවට පුළුනිමිත්ත පානාසේ තමන්ගේ අවවාද කළ බැනනුවන් වැද්දාගේ මුලින් ගලවා සුවපත් කරණුවෝ ධර්මයෙන්ම සරණ ගතයන් රක්ෂාකළහ. තවද **මාලුත ජාතකයෙහි** වෘකයාගේ හා සිංහයාගේ හා "සීත නම් දෙය කෘෂ්ණ පක්ෂයෙහි වෙයි. ශුක්ලපක්ෂයෙහිය" යන වාදයෙහි කෘෂ්ණපක්ෂයෙහි වූව මනා මය. ශුක්ලපක්ෂයෙහි වූව මනාමය. පවනින්ම වෙයි කියා පැණ විසඳන්නෝද ධර්මනිකායයෙහි සිටැ එක් කෙණෙකුන් කෙරෙහි මමතත්වයක් නො කොටැ විසදුහ.

තවද, **මහාසත්ත්ව ජාතකයෙහි** බ්‍රාහ්මණ මාණවකවැ වැඩැ හිදැ අවවාද දී මේ **එළුවා** මිය යා නො දෙම්හයි අතැවැසි යන් සිසාරා ගෙණැ රක්ෂාකරව කරවා හිසැ ගල්ලැල්ල කඩා ගෙණැ හී හිස කැපී මළ එළුවා පැ ප්‍රාණාතිපාතයෙහි ආදීනව දක්වා **වෘක්ෂදෙවතාවැ** සිටැ ආකාශයෙහි පළක් බැඳැ වැඩ හිඳැ අවවාද දී සියලු දඹදිව් වැස්සවුන් පණිවාසයෙන් දුරු කරන්නෝද ධර්මයටම සුපාකළහ. තවද, **ආයාචිත භක්ත ජාතකයෙහි** දෙවතාවන්ගේ ශක්තීන් මම මේ වැඩ සාධාගනිමි කියා ඇට බලිකර්මාදිය කෙරෙමියි බොහෝ ප්‍රාණ වධ කරන්නාවූ **කුවුම්බිකයා** දුකැ **වෘක්ෂදෙවතාවැ** සිටැ ප්‍රාණඝාත යෙහි ආදීනව කියා සියලු සත්වයන් සිතැ ඇති අකුසල් දුරු කරන්නෝද ධර්මයම ඔවුන්ගේ ලෙහි පිහිටු වූහ.

තවද, **නළපාන ජාතකයෙහි** උදක රාක්ෂසයා විසින් අඩි ගෑහිතවූ විලට නො බැසැ පාරමිතා බලයෙන් එකදු කළ අධිෂ්ඨානයෙන් කපක් මුළුල්ලෙහි ඒ පොකුණ වට කොටැ සිටි බට දඬු ඇතුළෙන් ගැට නැතිවන පරිද්දෙන් 1 ආශ්වයෂ්මත්කොට අෂ්ට දහසක් වඳුරන් විලට නො බස්වා බට දණ්ඩන් පැන් පොවා රාක්ෂස හසින් මුදා ශාන්ති කරන්නාහුද ධර්මබල යෙන්ම එබඳු පරාක්‍රමයක් කළහ.

එදා උන් වඳුරුවැ උණ දණ්ඩෙහි හළ ගැටම දැන් පස්වා දහසක් මුළුල්ලෙහි මා ඇතුළුවූ සියලු සත්වයාහට සසරගැට නැතිවන්නට පුළුවන් නිමිත්ත විය. එදා **උදකරාක්ෂසයා** කෙරෙන් තමන්ට හා තමන්ගේ පරිවාරයට උපද්‍රව නො වියදුන් බව තමන් ඇතුළුවූ මුළුලොවට මරහු කෙරෙන් උපද්‍රව නො විය දෙන බවට පුළුවන් නිමිත්ත විය. එකදු කළ අධිෂ්ඨානය කපක්

1 ආශ්වයෂ්මත්කොට.

දවස් මුළුල්ලෙහි පැවැත්වීම බුදුවැ තමන් කළ ආශ්චර්‍ය පස්මා දහසක් මුළුල්ලෙහි පවත්වන බවට පුළුවි නිමිත්ත විය. මෙසේ මාගේ සර්‍වාම්දරුවානන් අනාත්‍ත ජාතියෙහි අත් නොහැරැ දෙසා විමසා පරිහරණ කොටැ රක්‍ෂාකළ ධර්‍මයම සරණ යෙමියි **දහම් සරණ** යායුතු.

නවද **කුරුඩ්‍ඩ මෘග ජාතකයෙහි** මුවවැ ඉපිදූ ගසැ හුන් වැද්දෑ දැමූ එල දැකැ මේ එකාන්තයෙන් උඩහුන් මිනිසෙකු විසින් හෙළන ලද බව මුත් ගසකින් හුනු එලයෙක් නොවෙයි, ගසෙක ඉදුරා එල හෙළන බව දැකැ මුත් කැට ගසන්නා සේ තෙම දුරහුන්නවුන්ට එල නොදෙයි කියා නිශ්චය කොටැ වැද්දාගේ වදෑවායෙන් ගැලවී ඔහු දැමූ අඩයටිය වළහා යන්නෝ ද ප්‍රඥයෙහි මස්තක ප්‍රාප්ත කොටැ ධර්‍මයන්ම දිවි පිළි පද්දහ.

නවද **කුක්කුර ජාතකයෙහි** බල්ලන්ට රජවැ තමන්ගේ නැසන්ට නිර්‍කාරණයෙහි වූ ව්‍යසනය දුරු කරණ පිණිස රජ ගෙට වැදූ රජ්ජුරුවන්ට **දශරාජධර්‍මයෙහි** අනුශාසනා කරන්නෝ ද තුඩ බලු තුඩ මුත් බණ බුදු බණට නොඅඩුකොටැ කීහ. *

නවද **තිත්තිර** ජාතකයෙහි අශ්වෝ'ධර්‍මයා විසින් බවුවාවූ තොටට නොබස්නාවූ උත්තමා'ශ්වයාගේ අභිප්‍රාය බුදු නුවණින් දත්තාසේ පිරිසිදැ දන්නාවූ ද තමන්ගේ ප්‍රඥා පාරමිතා බලයෙන්ම කුළුනත්හ. නවද **මහිලාමුඛ** ජාතකයෙහි දුෂ්ටවූ සොරුන්ගේ බස් අසා අධර්‍මයෙහි පිළිපන් ලොව තමන්ගේ ධර්‍මය ඇසිමෙන් තමන්ගේ නවලෝකොත්තර ධර්‍මයෙහි පිහිටිවීමට පුළුවි නිමිත්ත පානාසේ ධර්‍මයටම ආචාරී වූහ.

නවද **අභිණ්හ** ජාතකයෙහි බල්ලාගේ විරහයෙන් ශොකීවූ හසුනුගේ අභිප්‍රාය දැනැ ඔහුගේ ශොක දුරුකරන්නාහුද මතු බුදුවැ අඥාන සත්ත්වයාගේ ශොක දුරුකොටැ කරන්නාවූ ලොකා'ර්‍ථයට ශ්‍රමකරන්නාසේ ධර්‍මයෙන්ම ධර්‍මය ප්‍රඥව කළහ.

නවද, **නන්දි විශාල ජාතකයෙහි** ගොන්වැ සිටැ අප්‍රිය වචන බිණූ බමුණා දහසකට පරදවා ප්‍රිය වචන බිණූ දවස්

* ජාතක කථා දෙකක අඩුව පෙණේ.

වැලි බොරළු පිරූ ගැල් සියක් හුදකලා ඇදූ ඒ බමුණා දෙදහ සකට දිනවන්නාහුද ලොකයෙහි සත්‍යයා විසින් ප්‍රිය වචන බිණීය යුත්තා බවට උපදෙශ දී ධර්මයම ඔල් බැස්වූහ. තවද, **සාණහ ජාතකයෙහි** වූ එසේම ගොන්වැ මඩෙහි ගැලී ගිය ගැල් පන්සියක් උදකලා ඇදූ ගොඩ දක්වා එයට කුලී පිණිස වෙළඳුන් කරා බැඳලූ මසු දහස ගෙණෑ අඩුත් තණ පැන් ලා වැඩූ මෑණියන්ට දී ඔවුන් යෙහෙන් රක්ෂාකරන්නාහු ද **සෙ ළෙහිගුණ දැනිම්** නැමැති ධර්මයම රක්ෂා කළෝ නම් වෙති.

තවද, **මුනිඝ ජාතකයෙහි** එසේම ගොන්වැ ඉපදූ තමන් උපන් කුලයෙහි කුමාරිකාව විවාහයට යන දවස් රැස්වූ ඕනි සුන්ට අමුතු බත් දෙනවිට මරා මස් ගෙණෑ මාළු පිසන පිණිස වඩන්නාවූ ගූරෙකුට දෙන ආහාරයෙහි ලොභ කළාවූ මලනුවන්ට ඒ ආහාරය කෑ ඔහු විනාසයට පැමිණෙන බව හා තණ මාත්‍රයක් කෑ නමන් යෙහෙන් ජීවත්වන බව හා දක්වා ඔවුන්ට ඇතිවූ අස්ථානයෙහි ලොභය හරවා අවවාද වදාරන්නාහු ද ධර්මකථිකයන් කෙරෙහිම අග්‍රවැ සත්කාළු කළහ. මෙසේ මාගේ ධර්ම සඞ්ගම්වූ ලොක සඞ්ගම් දරුවානන් වහන්සේ විසින් නොයෙක් ජාති 1 භෙදයට පැමිණෙද අත්නොහැරී රක්ෂා කොටැ සවිඥානයෙන් සමාධියට පැමිණවූ ධර්මයම සරණ යෙමිසි **දහම් සරණ** යාසුතු.

තවද, **කුලාවක ජාතකයෙහි** ශක්‍රදෙවෙන්දුවැ යුද්ධයෙහි පැරැදූ අසුරයන් කෙරෙහි කළ හයින් දිවෙම්නුදු තමන්ගේ රථයෙහි හඬින් හය පත්වැ දියෙහි හී දුක් විඳුනා ගරුඩ පොතකයන් දැකැ අපට වන හය දුරු කරණ පිණිස අනුන්ට හය උපදවමෝ නම් අපගේ මහා කරුණාවට සුදුසු නොවෙයි කියා රථය සතුරන් කරාම නවතා*බිඳිපලාගිය රථය නැවත එන්නේ පිට පුරා පිරිසක් ආහෙයිනැයි අසුරයන් තමන්ම බිඳුනු කල්හි අයත්තයෙන් 2 රජය ගන්නෝද ධර්මයෙන්ම රජය ගත්හ.

තවද, **නවච ජාතකයෙහි** හංසරාජවැ තමන් වහන්සේගේ දියනියන් ලොභ කළාවූ **මසුරසා** ඒ සත්තොෂයෙන් නවම්පි නොපැවැ මන්ා ගුයහ අඩහ පැ හිරි ඔතප් බුන් කල්හි මේ මසුරතෙම හිරි ඔතප් නැත්තේය. එසේවූ නොකටයුත්තෙහි

1 ජාති භෙදයට. 2 ජයගත්තෝද. * බිඳිපලරථය.

ලජ්ජාවක් භයක් නැති තෙනත්තනුට මාගේ දුව නොදෙමි ඕහට ගහිා කරන්නාහුද ධර්මයෙහිම රුචි ඉපදවූහ. තවද, **සමෙමාද මාන ජාතකයෙහි** වටුවෑ ඉපදී වටුවන් තමන්ගේ අවවාද කළ දවස් දුල් ඇසින් හිස් නංවා දුල් නංවා ගෙණෑ ගොස් කටු ලැහැප්හි හෙළුවා වැද්දු අතින් ඔවුන් ගළුවා 1 තමන්ටත් ඔවුන්ටත් ශාන්ති කොටෑ ඒ වටුවන් සමහර කෙණෙකුන් ඔවු නොවුන් හා විවාද කොටෑ අද 2 සුරුවී නම් තෝම දුල නහා ගෙණ යාසි තෝම දුල නහා ගෙණ යාසි ඔවුනොවුන් හා කරණ වාද අසා කලහ නම් දෙසින් ඉෂ්ටනම් දෙයෙක් නැතැසි විවාදයෙන් මොවුන්ට විනාශය නියතය. එසේ තන්හි තමා එක්වෑ නස්නාබව නොසුදුස්සයසි තමන්ගේ පිරිස හැරගෙණෑ බැහැර ගොසින් කලහ කළ වටුවන් වැද්දු දුම්මු දුල හසුවෑ තෝ දුල් හස්සෙන් හිස නගව තෝ දුල් හස්සෙන් හිස නගවසි විවාද කොටෑ එකකුදු දුල් හස්සෙන් හිස නොනහා නත හී වැද්දුට හසුවෑ විනාසයට පැමිණියදී තමන් හා කැවිවෑ හියවුන් රක්ෂාකොටෑ තමන් පිරිසට ශාන්ති කරන්නෝද කලහයෙහි ආදීනව ලොවට අද දක්වා පහළ කොටෑ ධර්මයෙන්ම ඒ ශාන්තිය කළහ.

තවද, **මනුස්‍ය ජාතකයෙහි රාජපුරොහිතවෑ** කාමයෙහි ගිජු මැසින්න පස්සෙහි දිවෙමි සි දුල්හි හසුවූ මනුස්‍යයා කෙවුළන් ගොඩෑ ඇදූ හොවා ලූ කල්හි තමා මියන මරටත් විඳිනා වෙදනාවටත් නොසිතා මැසින්නගේ වියොගය ක්ෂමා කොටෑ ගත නොහී හඬන්නට වත්කල්හි මිනිස්වෑ සිටෑ පොවා මසුන්ගේ බස් දන්නා නුවණ තමන්ට ඇති හෙයින් මේ මනුස්‍ය නෙම තමාගේ මරණ නොසිතා කාමාතීනවෑ හඬයි. ඉදින් මෙසේ කාමාතීනවෑ හඬා මෙලේ වී නම් අනතයෙහි නරකයෙහි උපද්දී දැනෑ මාසේ වූ කරුණ ඇති එකක්ෂු බල බලා සිටියදී මේ අනාථ මනුස්‍යයා මියෑ නරකයෙහි උපදනා බව සුදුසු නොවෙයි කියා මහා කරුණාවෙන් චොදිතවෑ කෙවුළන් කරා එළඹෑ ඒ මනුස්‍යයා ඉල්වා ගෙණෑ දෙ අතින් වඩාගෙණෑ ගොස් දියෙහි ලා මරණ භයින් ගළවන්නෝද ධර්මයෙහිම පිහිටා හැළුවූහ.

තවද, **වට්ටක ජාතකයෙහි** පියායෙහි පත් නොහටගත් හෙයින් දෙ පයෙහි ශක්ති නොහුන් හෙයින් දෙමව්පියන්

1 තමන් ඔවුන්ට. 2 සුරවිනම්.

ගොචර පිණිස ගියහෙයින් අසරණවැ සියලු වල දවා ගෙණැ කලපා'නත වහනියක් සේ දිවන්නාවූ ලැව්ගිනි දැකැ "මම පසින් යත් පුය ශකති නැත්තෙම් පියා හඬායත් පියායෙහි හුන්පත් නැත්තෙම්. මවුපියන් වහළින් ගැළවීම් නම් ඒ මවුපියෝද ගොචර පිණිස නැඟි ගියහ. මෙතැන්හි මාගේ ඛම් බල මුත් අනික් බලයෙක් නැතැයි" තමන්ගේ **සතය වචන** ශකතීන් කපක් මුළුල්ලෙහි **සොළොස් කිළිසක්** තැනට ගිනි නොවදිනා පරිද්දෙන් සත්‍යක්‍රියා කොටැ වෙරළ වල වැදගත් නාවූ ගින්න මහාසමුද්‍රයට් නොවැද්ද දෙන්නා සේ සියලු වල දුවූ ලැවි ගින්න තමන් හොත් තැනට නොවැද්දූ දුන්හ.

තව ද, **සකුණ ජාතකයෙහි පක්ෂිරාජවැ** ඉපදූ ඒ වෘක්ෂයෙහි ශාඛායෙහි රිරි සැටි ගිනි 2 හෙනැ දන පරිදි දැකැ මේ හෙන ගිනි අප හා අපගේ නැයන්ට විනාශකරන්නේයයි දැනැ තමන්ට නොකිකරුවන් ගින්නෙහි හි විනාශයට පැමිණියදී කිකරු පිරිස හැරැ ගෙණැ තුමූ ගැළවී ඔවුන්ටත් තමන්ටත් ශානති කරන්නාහුද ධම්යෙන්ම ශානති කළහ.

තවද, **නිතනිර ජාතකයෙහි වවුවැ ඇතක්හු හා වඳුරක්හු** හා සහාය වැ තුන්දෙන එක්වැ එක් නුග ගසෙක් නිසා වෙසෙමින් "අප තුන්දෙනාට තොපි වැඩිමහල්ලහ යි මොහු බාලය හයි යන නියමයක් නැතිවැ අනවසථිතවැ වසන බව සුදුසු නොවෙයි" කියා වැඩිමහල්ලන් නිශ්චයකරණ[1] උපායක් සිතා ඇත්තෙම:-'මම මේ නුගගස බාලකල මා සතර පා හස්සෙහි සිපියේය යි කී කල්හි, **වඳුරුතෙම**:-'මම මේ ගස බාලකල බිම ඉඳැ කර නොඔසවාම අග දළු කම්' කී කල්හි, තුමූ:-'මම අසෝ තැන නුගගසින් 1 පල කා මෙතැන්හි ශරීර ධමී කෙළෙම්. එසින් හටගත්මේ ඵලය'යි කියා ඔවුන් දෙන්නාට තමන් වැඩිමාළුබව හඟවා ඔවුන් විසින් මෙතැන් පටන් තොපට වැඳුම් පිදුම් ආදිවූ උපසථාන කරම්හ. තොප කළාවූ අවවාද යෙහි පිහිටම්හ. නෙපි මෙතැන් පටන් ගෙණැ අපට අවවාද අනුශාසනා කරව යි කීකල්හි එතැන් පටන් වඳු තෙම ඔවුන්ට අවවාදානුශාසනා කොටැ ඔවුන් පන්සිල්හි පිහිටුවා තුන්දෙන ඔවුනොවුන් කෙරේ සහාය වැ වසන්නාහු තිරිසන්වැ ද පොවා ඔවුන්ට ධම්බලයෙන් ම අවවාද අනුශාසනා කළහ.

---

1 පලකා. 2 හෙන.

තවද, ඔහු ජාතකයෙහි වෘක්ෂ දෙවතාවෑ ඉපදී දිය නැති පොකුණෙන් දිය ඇති පොකුණට ගෙණ යෙමි යි මගදී මනුෂ්‍ය යන් කන්නාවූ කොකු නමාට වැඩි වඤ්චා දන්නාවූ කකුළුවා එපවත් දුනෑ උගුර නළින් මැඩැ මරණ භයින් භය්පත් කොටැ "සඛාමිනි! මම තොප නොකම් මම තොප නොකම්"යි කියව කියවා හඬන්නට වන්කල්හි එසේවූව මාගේ පොකුණට ම මා ගෙණෑ යා යි කියා ඔහු පොකුණට ම ගෙණෑ ගියකල්හි දියට වදනා කකුළුවා සූක්ෂමවූ කතුරකින් මානෙල් දණ්ඩක් කපන්නා සේ තීක්ෂණවූ නළින් ඔහුගේ ඔිස කපා පී කල්හි වඤ්චා දන්නාවූ ඒ කොකුවවූ විනාශය දුකැ වඤ්චාවෙහි ආදීනව වදරන්නෝ ද සඛම්ම ජීවිකායෙහි ම ගුණ දක්වූහ.

තව ද, නන්දා ජාතකයෙහි පරඛිනා කුවිම්බිඤවැ බැහැර දී ඛන්පාම් කියා ධන තුබූ තැනට ගිය කල්හි "මිඩිය පුත! තව ධන කොයිදැ"යි කියා උඩත කම් බණන්නාවූ නන්දා නම් දුස යාගේ පවත් අසා මොහු සෙසු තැන දී විනීතවැ මෙතැන දී උඩත වන්නේ නියතයෙන් එතැන යටැ තුබූ ධනයෙහි මහිමා යෙනැ යි ඒ තැන්හිම ධන තුබූ බ්ව නිශ්චය කොටැ ධනය ඇත්තවුන්ට ධනය පාවා දෙන්නාහු ද තමන්ගේ අසාධාරණවූ ප්‍රඥා ධර්මයෙහි ම පිහිටියහ.

තව ද, බදිරඛාර ජාතකයෙහි පසේ බුදුන්ට දන්දෙන පිණිස පාත්‍රයෙන් දන් ගෙණැ යෙමින් සිටැ ඒ දන්දීමට විඝාතයක් කෙරෙමි යි මරහු අවුත් සිටැ පසේබුදුන් වහන්සේ හා දෙමැදැ අසූරියනක් පමණ ගැඹුරු සහලගුරු වළක් මවාලා ආකාශයෙහි සිටි කල්හි "මේ වළැ හී දැ මියෙම් නම්‍බුදු මා දෙන්නාවූ දනට අන්තරායයක් නොකරම්"යි වළට පය දික් කළ ක්ෂණයෙහි පිපියාවූ සත්බුවු මහපිය්‍රම් මැඩැ ගෙණැ ගොස් දන් දෙන්නාහු ද ධර්මයෙහිම පිහිටා ගිනි මත්තෙහි මහපිය්‍රම් පිප්පූහ. මෙසේ මාගේ සඛාමිදරුවන් අන් සරු කොටැ පිරිමසා නොනසා රැකැ ආවාවූ ධර්මය සරණ යෙමි යි දහම් සරණ යාසුතු.

තව ද, 1 ලොසක ජාතකයෙහි අවවාද කරන්නාවූ ඉෂ්ට මිත්‍රයන් බස් නොගිවිසැ විනාශයට පැමිණියාවූ මිත්‍රඛිඤඤා දුකැ සත්පුරුෂයන්ගේ අවවාද නොකිරීමෙහි ආදීනව දක්වා අවවාද කරන්නාහුද ධර්මයෙහිම පිහිටා අවවාද කළහ.

---

1 අලොසක. අලොසක.

තව ද, **ඝපොනඝ ජානඝසෙහි** තිරිසන්වූ **පරෙවි** වැ ද තමන් නිසා වසන්නාවූ කවුඩුවාට තපස්වී කෙණෙකුන් **පසු** මහණ කෙණෙකුට් අවවාද දෙන්නා සේ ලොලවීමෙහි ආදීනව දක්වා අවවාද කොටැ ඔහු ඒ අවවාදයෙහි නො වැළකැ සිටානන්ට තන්කළ මස් කන්නට වැදූ 1 අරක්කැමියා අතැ විනාශයට පැමිණී කල්හි මේ අධමයා අපගේ බස් නො*කොටැ විනාශ යට පැමිණියේ. ඉනිඹ අප විසිනුදු මෙතැන්හි වසන්නට නො පිළිවනැ සි එ තැන හැරී යන්නෝ ද අලොල ධම්යෙහි පිහිටියහ.

තවද, **වෙළඝ ජානඝසෙහි** හිමාලඝසෙහි **හණ ශාඝතෘ** වැ තමන්ගේ අවවාද නො කොටැ සපියා වඩා ඔහු අතැ නටුවාවූ තපස්වීහු පැ සෙසු තපස්වින්ට අවවාද දෙන්නාහු ද දැන් තමුන් ගේ අවවාද නො කොටැ සංසාර ගොචරවන සතඔයන් පැ සෙසු භව්‍ය පුද්ගලයන්ට අවවාද දෙන 2 බුඩ විලාසය මෑදක්වා ධම්යටම පිහිටවූහ. තවද, **මඝඝ** ¶ **ජානඝසෙහි වෙළඳ** වැ පියා හිසැ හුන් මදුරුවා මරම් සි මහ පොරොවින් පියානන් හිසැ ඇනැ මැරූ පුතු දැකැ **"නුවණ නැති මිත්‍රයාට වඩා නුව ණැති අමිත්‍රයා උතුමයැ"**සි අවවාද කරන්නාහු ද ධම්යෙන් පානාවූ යුක්තියක් කීහ.

තවද **රොහිණී ජානඝසෙහි මහසිටු** වැ මවහිසැ හුන් මැස්සා නෙරම්සි මොහොලින් මව හිසැ පැහැරී මැරූ **රොහිණී** නම් දුසිය දැකැ **"අනුඝමපාඝරණ අඝුනයාට වඩා ඝුන සම්පන්නවූ අමිත්‍රයාම උතුමයැ"**සි අඝුනයාට අප්‍රශංසාකරන් නාහු ද ධම්යට ම ප්‍රශංසා කළහ. තව ද **ආරම දූසඝජානඝ සෙහි** පණ්ඩිත පුරුෂවැ උයන් පල්ලාගේ නියෝගයෙන් උයන ගසට පැන් වත් කරම්හ සි පටන් ගෙණැ අඝුන වානර ජෙෂ්ඨයා නියොගයෙන් ඉතා ගැඹුරට බට මුලට බොහෝ කොටැ පැන් වත් කරම්හ. මද කොටැ බට මුලට මදක් පැන් වත්කරම්හ සි පැලයෙන් පැලය උදුරා බලා බලා පැන් වත්කොටැ ගස් මැරූ වානරයා දැකැ "අඝුනයෝ වැඩක් කරම් හ සි අවැඩක් ම කෙරෙති. එහෙයින් නුවණ නැත්තවුන් ලවා 3 වැඩක් කරවා ගැන්ම දුෂ්කරය"සි අවවාද දෙන්නාහු ද ධම්නායෙහි ම පිහිටා අවවාද දුන්හ.

තවද **වාරුණී ජානඝසෙහි බාරාණසි සිටුවැ** රා වෙළඳු ගේ අතැවැස්සහු තමා විකුණන රා බොන මිනිසුන් ලුණු

---

* කොඹිවිසැ. 1 අරක් කැමියා. 2 බුඩ විලාසයම. 3 වැඩකම්. ¶ මසඝ.

ඩැහැ ගෙණැ රා බොන්නා දැකැ රායෙහි ලුණු මදින් වන මොවුන් ලුණු ඩැහැ ගෙණැ රා බොන්නේය යි සිතා ඒ රායෙහි ලුණු පුරා රා නැසූ නැනැත්තහු දැකැ අඟුනයෙහි ආදීනව වදාරන්නාහු ද ධම්මයෙන් ම අවවාද කළහ. තව ද **වෙදබහජාතකයෙහි වෛදේහී** නම් බ්‍රාහ්මණයාට අතැවැසිවැ තමන්ගේ අවවාද නො කොටැ අසථානයෙහි බැහැදැසි වස්වා සතුරන් අතැ නැසී මිනිසුන් දහසක් 1 එකතැන්හි ම ජීවිත විනාශයට පැමිණෙන පරිද්දෙන් අවවාද ක්‍ෂම නො වූ බ්‍රාහ්මණයා දැකැ "යමෙක් උපාය නො දැකැ අඵ සොයා නම් ඔහු විනාශයට පැමිණෙන්නේයැ"යි ධම්ම දෙශනා කරන්නාහු ද බුඩ විලාශයෙන් ධම්මය පරිහරණය කළහ. තව ද **නක්ඛත්ත ජාතකයෙහි** ප්‍රඥ සම්පන්නවූ ග්‍රාමික පුරුෂවැ නකත නපුරැයි අඹුවන් කෙරෙන් අපවත්වූ පුරුෂයා දැකැ "අඵ සිඩිය ම නකත නම් වන බව මුත් ආකාශයෙහි තුබූ තරුයෙන් සත්ත්වයන්ට වන සුභා' සුභයේක් නැතැ"යි වදාරන්නාහු ද **පරමාඵ** ධම්ම ම වදාළහ.

තව ද **දුම්මෙධ ජාතකයෙහි බරණැස් රජහට** පුත්වැ රාජධානියෙහි මිනිසුන් දෙවතාවන්ට බලිකම්මාන්ත කොටැ කැමැති කැමැති පරිද්දෙන් වැඩ සාධම්ම යි බොහෝ ප්‍රාණවධ කරන්නවුන් දැකැ මේ පව් කරන්නාවූ සත්ත්වයා කෙසේ වළකම් දෝ හෝ යි තමන් වහන්සේ දෙවතාරාධනයක් කරන්නා සේ අතුරතුරෙහි මහජනයා පූජාකරණ නුග රුක මුලට ගොසින් ඒ ඒ තැනැ පැදකුණු කොටැ මල් පුදා උදකා'භිෂෙක කොටැ අවුත් ක්‍රමයෙන් පියානන් ඇවැමෙන් රාජ්‍යය ලදින් මේ බාල සත්ත්වයා පාපයෙන් වළකන්නට කලැ යි සිතා ඇමැත්තන් කැඳවා "මම ප්‍රාණවධ කරන්නාවූ දහසක් මිනිසුන් මරා ලේ හා අතුනුබාන් හා මස් හා ගෙණැ බලිකම්මාන්ත කෙරෙමි යි නුග ගසැ දෙවියාට ආරාධනා කොටැ මේ රාජ්‍යය ලදිමි. දැන් මාගේ විජිතයෙහි යම් කෙණෙක් පණිවා කෙරෙත් නම් එසේ එසේවූ දහසක් නෝරා අල්වා ගෙණැ කපා ලේ හා මස් ආදිය ගෙණැ බලිකම්මාන්ත කරව යි නියොග කොටැ, "ප්‍රාණවධ කරන්නවුන් ගෙණැ රජ්ජුරුවෝ යක්හට කපත්ල යි" ඇසූ මහජනයා ප්‍රාණවධයෙන් දුරැ කරවා ධම්යෙහි පිහිටුවන්නෝද ධම්යව ම අනුග්‍රහ කළහ.

---

1 එකැන්හිම.

එහෙයින් මාගේ සැමියවූ තිලෝගුරු සම්‍යක් සම්බුඩයන් වහන්සේ නොඑක් ජාතියෙහි බොධි සත්ව භූමියෙහි සිටි කල්හි යෙහෙන් පිළිපැදූ රක්‍ෂාකළා වූ මහඇති ධම්‍යම සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

තව ද **මහාසීලව ජාතකයෙහි** සියලු ජම්බුවිපය සාධා දෙන්නට සමර්ථවූ එකි එකී අමාත්‍යයන් විසින් යුක්තවූ ඇමැත්තන් දහසක් ඇතිවැ රාජ්‍යයක් පිණිස මිනිසකු ඇඟින් ලේ නොසොල්වම් යි කිසිවක්හට අනතුරාය නොකොටැ සතුරු රජහු අවුදින් මතු මහල්තෙලෙහි හුන් තමන් හා ඇමැත්තන් පිරිතොල හයා බැඳැ අමුසොහොන්හි උගුර දක්වා වළලා පි කල්හිදු වියෂ නොහැරැ තමන්ගේ මස් කන්නට ආ කැණහිල්හු නිකරින් බිම හා එක්කොටැ ඔබා ඔහු පසුරු ගහා පස් හැරිපි කල්හි වළින් නැඟි මිනිය බෙදාගත නොහෙන්නාවූ යක්‍ෂයන් දෙදෙනාට සතුරු රජහු මඟුල් කඩුව ගෙන්වා ගෙණැ එයින් කෙසගස් හා අඩුවැඩියක් නොකොටැ මිනිය කපා දී තමාට සතුටුවූ යකුන් දෙන්නාගේ ආනුභාවයෙන් සතුරු රජහුගේ මතු මහල්හි ඔහු නිදන තැන්හි සිටැ කිරි බොන පුතක්හු සෙමින් සොල්වා පුබුද්දනා සේ මුව අත ඇහැ නොපාරවා කඩුවෙන් සොල්වා පුබුද්දූ තමන්ගේ ධම්‍යඤකම-උත්සාහය-ප්‍රභාවය ඇති මේ ආදි ගුණ දුටු ඒ රජහු විසින් තමා කළ දෙෂ ක්‍ෂමාකරවා නැවත දෙන ලද්දාවූ රාජ්‍යය ලබන්නාහුද ධම්‍යෙන්ම ලදහ.

තව ද, **චූලජනක ජාතකයෙහි** පඤ්ච වණී පදමයෙන් හැවැ සිගත් විලෙක පිනන එකෙක් සේ මහාසමුද්‍රය පිනා ක්‍රමාගතවූ රාජ්‍යය ලබන්නාහුද ධම්‍යෙන් ම ලදහ. තවද, **සුණීපානි ජාතකයෙහි** බාරාණසි සිටුවැ තමන් ම විෂ මිශ්‍රවූ රා පොවා මත් කොටැ හන් පළන් වස්ත්‍රාභරණාදිය ගණුම්හ යි සිතූ සොරුන්ගේ වඤ්චා දැනැ ඒ සුරාපානයෙන් දුරු වන්නාහු ද සුරායෙන් දුරුවූ බව මුත් ධම්‍යෙන් දුරු නොවූහ. තවද, **එල ජාතකයෙහි ඝාතිවාහව්** ගමට නොදුරු තැන්හි සිටි සුවසේ නැඟි ගත හැකි ගස්හි තුබූ1අඹ පල වැනි පල කම්හයි තමන්ගේ පරිවාරයෙහි වෙළඳුන් සිතූ කල්හි මේ ගස ගමට නොදුරුවැ සුවසේ නැඟ හැකිවූව කන්නන් නැතිවැ සමෘඩවැ තුබූයේ එකාන්තයෙන් විෂ වෘක්‍ෂයක් හෙයිනැ යි කියා දැනැ ඒ කෑ නොදී තමන්ගේ වෙළඳුන් රක්‍ෂා කොටැ ඔවුන්ට ජීවිත දානය දෙන්නාහුද ධම්‍යෙන්ම දුන්නාහ.

1 අඹපක්.

නව ද **පඤ්චාවුධ ජාතකයෙහි පඤ්චාවුධ** කුමාරවැ මනුෂ්‍යවැ සිටැ යක්‍ෂයා හා යුද්ධ කෙරෙමි යි පටන් ගෙණැ ගැසූ ආයුධය ඇනලූ අත ඇනලූ පය ඇනලූ හිස ඔහුගේ ඇහැ ඇලී ගත් කල්හි යක්‍ෂයාගේ ශරීරයෙහි එලෙමින් සන නිල 1 මෙඝ කූටයක් ඇලයේ තුබූ පූණී චන්‍ද්‍රමණ්ඩලයක් සේ ප්‍රසන්නවූ මුඛ යෙන් නිර්ගයවැ හෙවැ තමන්ගේ ශෞයර්‍ය්‍ය දුටු යක්‍ෂයා විසින් තොප නො බාන්නේ කුමක් පිණිසද යි විචාළකල්හි එක් ජාති යෙක්හි එක් මරක් නියතවූව මා බාන්නේ කුමක් පිණිසද යි කියා, තවද තමන් **දිපඞ්කර පාද** මූලයෙහි පටන් ගෙණැ කුසිනාරා යම සලට එනතුරු දෙ අතු'රෙක් අසත්‍යයක් තුඩැ නො පැහැරිවූවද වෘජ'නතරයෙකින් අසත්‍යයක්ම නො කියා සියලු ලොව දනන්හට සමවූ ඉතා නිර්ක්‍ෂණවූ ශුන නැමැති වජ්‍රායුධයක් තමන්ගේ අභ්‍යන්තරයෙහි ඇති හෙයින් යක්‍ෂය! මාගේ අභ්‍යන්තරයෙහි **වජ්‍රායුධයෙක්** ඇත. ඉදින් තෝ මා කෑයෙහි වී නම් වජ්‍රායුධය දිරවා ගත නො හෙන් නෙහි එතැන ම තාගේ අතුනු බහන් කපා ගෙණැ පිටත නික් මෙන්නේය, එසේකල්හි නොපිත් මමත් දෙන්නම වැනසුම් හ"යි කියා:-

ඒ ඇසූ යක්‍ෂයා විසින් මේ වීර පුරුෂයා සත්‍යයක් ම කියයි නිබොයින් මොහු කන්නා තබා මොහුගේ ඇහින් තල ඇටක් සා මස් සුහකුත් දිව ගැ නො පැහැරී විය හැක්කැයි සිතා "මහා පුරුෂය! නා සේ වූවවුන් ඇහැ ලෙහෙ මස් අප සේ වූව වුන්ට ගොචර නො වෙයි. එහෙයින් තෝ රහු මුඛයෙන් මුක්තවූ චන්‍ද්‍රයා සේ මා අතින් ගැලවී යා"යි කී කල්හි මම ගැලවී මොහු අපායෙන් නො ගලවා ගියෙම් නම් මාගේ කරු ණාවට නුසුදුසුය"යි නො එක් ලෙසින් සවීඤ විලාසයෙන් ඕහට බණ කියා ප්‍රාණවධයෙන් දුරු කොටැ ඒ වනයෙහි බලි පිළිගන්නා දෙවතා ස්ථානයෙහි තබා ඔහු පන් සිල්හි පිහිටුවා වඩනාහුද තමන්ගේ ඛම්සමම ඡඝණමහ හිඳුවූහ.

තව ද **කාඤ්චන සඤ්ඣ ජාතකයෙහි** ශුන සම්පන්නවූ **කෘෂිවැ** තමන් සාන කලැ නඟුලෙහි ඇවිලැ ගියාවූ ඇත්හුද සොල්වා ගත නො හැක්කාවූ මහා රන්කඳක් දැකැ හුදකලාවැ 2 සොල්වා ලිය නොහී තමන් සිතින්ම මෙයෙන් මෙතෙක් හැරී ගෙණැ ජීවත්වෙමි යි මෙතෙක් නිධාන කොටැ තබම් යි

1 මෙඝකූටයක් මෙන්. 2 සෙල්වීය නො හී.

මෙතෙක් ගෙණැ කර්‍මාන්ත කෙරෙමි යි යනාදීන් සිතින්ම බෙදා 1 සැල්ලු කොටැ පියා යන්නාහු ද දැන් තමන් බුදුවැ කරන්නාවූ **පඤ්චඋපාදානක්ඛන්ධ විභාගසම** පුච්ඡානිම්මත්ත පානා ධර්‍මයටම වාරදුන්හ.

තව ද **වානරෙන්ද්‍ර ජාතකයෙහි** වදුරුවැ තමන් කන්නට ගං මැදු හෙවැ ගත්තාවූ කිඹුලු දැකැ "මේ ගොඩෙක් ද? නොවෙයි කිඹුලැ"යි දැනැ "පහණ! තෝ මා හා පෙර බැණැ දැන් නො බෙණෙයි" කියා "මේ පාණ පෙරමුන් හා බණින්න වන. දැන් මා නො බිණුවහොත් රැහැණි වීනම් නපුරැ"යි සිතා කිඹුල්හු බැණැ නැඟි කල්හි කිඹුලා බව නිශ්චය කොටැ "තෝ මා කන්නා කැමැත්තෙහි නම් කට දල්වා ගණුෑ මම තා කටට පෙණෙම්"යි කියා ඔහු කට දල්වා ගත් කල්හි ඇස පියන්නා ඔහු පිටට පැනැ බිම ගසා ලූ පෙදක් සේ සුණ යෙකින් පිටින් ඇතට ගොඩට පැනපී සෙයෙක. **කිඹුලුන් කට දල්වාගත් කල්හි ඇස් පියෙන්නේය.**

මෙසේ ඔහු කරා පෙනෙම් යි. කී බස සබා කළ හෙයින් **සත්‍යධර්‍මය,** උපායෙන් කිඹුල්හු බණවා ගත් හෙයින් **ප්‍රඥාවගේ මහත්ත ප්‍රාපත්වීමය,** ඇත භික්ත්තියෙන් කිඹුල්හු පිටට පැනැ එයිනුදු මැත භික්ත්තියට පැනැ ගැළවෙන්නාවූ **වීර්‍යය,** කිඹුල්හු පිටට පැන්න වේලෙහි කළ **ආනමපරිත්‍යාගය** යන මේ සතර ධර්‍මයම රක්‍ෂාකරන්නාහුද ධර්‍මයෙන් ම රක්‍ෂාකළහ.

තව ද **නයොධම්ම ජාතකයෙහි** තමන් වහන්සේ මරන්නා කැමැති පියවූ **වඳුරා උදඹ රක්‍ෂසයා** ලවා මරවා ගත මැන වැසි සිතා රක්‍ෂසයා වසන විලට ගොස් මල් ගෙණෙවයි කී කල්හි 'යහපත ගෙණෙම්'යි විලට ගොස් එහි රක්‍ෂසයා ඇති බව තමන්ගේ නුවණින් දැනැ රක්‍ෂසයා කන්නේ තමාගේ විලට වන් කෙණෙකුන් වේදැ යි කියා විලට නො බැසැ ඇතින් ඇතට පැනැ පැනැ මල් කඩා ඒ අද්භූත දුටු රක්‍ෂසයා අතින් වැදුම් ලදින් ගැත්තක්හු හිසැ මල් මිටියක් තබා ලා එන සඟාමිදරුවක්හු සේ ඔහු හිසින් ම මල් අදවා ගෙණැ පියා කරා අවුත් ඒ විස්මය දුටු දුෂට පියා ලය පැලී මළ කල්හි ක්‍රමා ගතවූ **වානර රාජ්‍යය** ලබන්නාහුද ධර්‍මයෙන් ම ලදහ.

---

1 සල්ලු කොටැ.

තව ද **හෙතිවාද ජාතකයෙහි** හා **සඞ්ඛමන ජාතකයෙහි** තමන් නො කිකරු පියන් අනවරතයෙන් සක් පිඹැ බෙර ගසා ආදි පිඹලූ විට මහා ඊශ්වර කෙණෙක් ආවෝයයි සිතා පලාගිය සොරුන් නැවත නැවත පිඹිනා හඬ හා ගසන හඬ අසා මේ ප්‍රධාන කෙණෙකුන් සක් පිඹිනා හඬ හා බෙරගසනා හඬෙක් නො වෙයි කියා දැනැ ආවාවූ සොරුන් වසතු හැරිගත් කල්හි එම වල්හි සඵීඤ විලාසයෙන් ශුකතාප්‍රාප්තවූ අවවාද දෙන්නාහුද ධර්මයෙහිම පිහිටුවා දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි සෝ' තසාහවැ සා'භිලාෂවැ සාරවැ සාරදවැ සප්‍රේමවැ රක්ෂා කළාවූ ධර්මය ශරණ යෙමි යි **දහම් සරණ** යායුතු.

තව ද **අසාත මන්ත ජාතකයෙහි** සියලු ශිල්පයට ආචාර්‍යවැ ජරා ජීර්ණ වැ එක් සිය විසි හැවිරිදි වූ එදෙම මියන්නට සිටියාවූ තමන් වහන්සේගේ මෑණියන් තමන් වහන්සේගේ අතවැස්සා කෙරෙහි කළ ලොභයෙන් එබඳුවූ වයසක් නො සලකා එබඳුවූ ජරාවක් නො සලකා මෙබඳු අවස්ථායෙහි සිටියාවූ තමා රක්ෂා කරණ මාවැදූ පුතණුවෝ වෙද්දැසි නොසිතා අතැවැස්සාගේ බස් ගෙණැ **කාමනාසණා** වසඟවැ ලෙලි ලෙලි පොරව හැරැ ගෙණැ තමන් වහන්සේ මරන්නට අවුදින් පළමුකොටැ ම සත්‍රින්ගේ ආදීනව හඟවන්නට පටන් ගත්තාවූ තමන් වහන්සේ විසින් තමන් වහන්සේ වැඩැ හෝනා නැන දඬුරුවක් නබාලූ කල්හි ඒ දඬුරුව තමන් වහන්සේයයි කියා පොරොවින් පැහැරැ දණෙඟි පොරොව වැදගත් හඬ අසා මපුතණුවෝ මාගේ අනාචාර දක්නාහයි එතැන්හිම 1ඒ මැහැල්ලන් මියැ හුණුකල්නි ඔවුන් දෘෂ්ටානන්ත කොටැ ගැණුන්ගේ ආදීනව ප්‍රකාශ කරන්නාහුද ධර්මයෙහිම පිහිටා ප්‍රකාශ කළහ.

තව ද **අණ්ඩභූත ජාතකයෙහි** බරණැස් රජවැ ගජයෙහි පටන් ගෙණැ වඩා හිඳුවා රක්ෂා කරන්නාහු බමුණ ඇස් වසා ලා කඩක් බැඳ ලා සොර සැමිවූ ධුතීයා ලවා හිසැ ටොකු එවූ ගැණිය පෑ කාමයෙහි ආදීනව දක්වන්නාහුද ධර්මයම මුල් බැස්වූහ.

---

1 මැහැල්ලන්.

නව ද නඤ්ඤා ජාතඤ්ඤෙහි තුම්බ පඤ්ඩා'භිඤ්ඤ අඤ්ඤට සමාපත්තිං උපදවා ඛඤනලාඟිවූ නාපස්සි වැ ආශ්‍රමයෙක්හි වෙසෙමින් 1 රැහැ ගංවතුරෙහි හී හඬා යන්නාවූ කුමාරිකාවගේ හඬ අසා මහාකරුණායෙන් සුළු පතක් හැරැ ගෙණැ විහිනා ගෙණැ ගොස් ඇ නහා ඇ කෙරෙහිම කළ ලොභයෙන් පඤ්ඩා'භිඤ්ඤ අඤ්ඤට සමාපත්තියෙන් පිරිහී වල හැරැපියා ගමට අවුත් මෝරු වෙළඳුම් කොටැ රක්ෂා කෙරෙමින් එක් දවසක් ගම් පැහැරී යන සොරුන් ඇ හැරැ ගෙණැ ගොස් සොර දෙටුවා තමහට අඹුකොටැ ගත්කල්හි කෙළෙහි ගුණ නො දන්නා ඒ ගැහැණිය විසින් ගඟ එතුරෙන් නැඟූ පරිද්ද-තමා නිසා එබඳු ගුණධර්මයෙන් පිරිහුණු පරිද්ද-මෝරු විකොටැ රක්ෂාකළ පරිද්ද-නොසලකා "මා මෙහි සුවසේ වසන තැනැත්තිය ඒ යම් ලෙස කින් ගෙණැ හියේ නම් නපුර. ඌ හිදැ 2 සැපක් නම් නැත. ඔහු මරවා ගනමැනවැ"යි සිතා පිටින් රැහැසියන් යවා තමන් වහන්සේ ගෙන්වා ගෙණැ බත් කවාලා "මේ වේලෙහි යන බව නපුර; මා හැරැ ගෙණැ යව; රෑ වනතුරු කොටුයෙහි 3 හැලී ගෙණැ හිඳුව"යි කොටුයෙහි හැල්වා හිඳුවා සොර දෙටුවා අවුත් රා බී මත්වැ හුන් කල්හි:-

"මෙසේවූ විට මාගේ සොර සැමියකු දුටුනම් කුමක් කරවිදැ"යි විචාරා ඒ ඇසූ සොරු කිපී මෙ මා බොන රැසට ඌ ඇඟ මස් අවුළු කොටැ කා පියමි යි කී කල්හි එසේවූ එකෙක්දු රැදෑ තුලූ කොටුයෙහි උන්නහු කී කල්හි සොර දෙටුවා පහනක් 4හැරැ ගෙණැ ගොස් කොටුයෙහි හුන් තමන් වහන්සේ අල්වා ගෙණැ නොයෙක් පරිද්දෙන් අනින් පසින් මරන්නට වන් කල්හිඒ මහදුක් විඳැ විඳැ ද අනික් බසක් නොකියා "කිංපති, කෙළෙහි ගුණ නොදනිති, කේලාම් දනිති, මිත්‍රද්‍රෝහිය" යන මේ අසිරී ගෙණැ

"සොඛනා අඤ්ඤඤ්ඤු ච-පිසුනා මිත්තා දූභිඤා"

යන මේ පදයම කිය කියා හඬා සොරු තමන් බැඳලා නිදා පියා නැවත නැඟි සිටැ මරන්නට පටන් ගත් කල්හි එම බස් කිය කියා හඬා මෙබස් නා කියන්නේ කුමකට දැයි විචාළ කල්හි එසේ වී නම් අසවයි කියා ගඟින් නැඟූ තැන් පටන් ගෙණැ කොටුයෙහි හල්වා හිඳුවූ තැන දක්වා සියලු වෘත්තා'න්ත කී කල්හි ඒ ඇසූ සොරහු මේ සා උපකාරයක් කළ උන්ට

1 රැ ගඟ වතුරෙහි. 2 ඉද්දක් නැත. ඉරද්දක්.
3 හැලී-හැල්වා. 4 අවුලුවාගෙණ.

මෙසේ කළ නැනැත්නි අපට කුමක් නොකෙරේදැ යි සිතා බොධි සත්ත්වයන් වහන්සේ අස්වසා ඇ පුබුද්දෑ ගෙණැ මොහු මරන්නා බලන්නට එයි කැඳවා ගෙණැ ඇ විසින් මාගේ සතුරා පිරි දක්ම් සතුටු සතුටුවැ ගිය කල්හි බොධි සත්ත්වයන් වහන්සේට කඩුව 1 නඟා පුන් ලවා මිත්‍රද්‍රෝහි නැනැත්නියම හිස ගසා 2 පලවා පිකල්හි කාමයෙහි ආදීනව කියා සොර දෙටුවා හා කාටුවම පඤ්චා'භිඤ්ඤ අෂ්ට සමාපත්‍ති උපදවා බ්‍රහ්ම ලොකයට යන්නෝ ද ධර්මයෙන්ම ගියහ.

තව ද **දුරාජාන ජාතකයෙහි** ආචාර්‍යවැ නමන්ගේ අතැ වැස්සාට "ගැණුන් සෙනහ ඇත්තැයි සතුටු නොවූවැ මැනව. 3 නො සිනැහැත්තැයි රැහැණි නොවුව මැනව. මස්සුන් දියෙහි ගිය තැන් නො පැනෙන්නා සේ ඔවුන්ගේ අභිප්‍රාය නොදත හැක්කැ යි" අවවාද දෙන්නාහු ද ධර්මයෙන්ම අවවාද දුන්හ. තව ද **අනඟරති ජාතකයෙහි** "හැමදෙනා පැන් බොන ගඟක්සේ ද චණ්ඩාල ක්ෂත්‍රිය ආදීන් එකහෙළා ඔන මඟක් සේ ද බොහෝ රා සොඬුන් එක්වැ රා බොන රා ගෙයක් සේ ද බොහෝ දෙනා එක්වැ යුකති බණන සභාවක් සේ ද බොහෝ පිපාසා ඇත්තවුන් පැන් බොන පින් පැන් මඩුවක් සේ ද නිමක් නැතිවැ සත්ත්වනම් සැම සාධාරණයෝ" යැ යි අතැවැස්සාට අවවාද දෙන්නාහු ද ධර්මයෙහිම පිහිටා සද්ධර්මය අලඞ්කාර කළහ.

තවද **මුදුලක්ඛණ ජාතකයෙහි** දේවින්ගේ ලිහිල්වූ සළු ඇති උකුළු දැකැ ඛ්‍යානයෙන් පිරිහි රජ්ජුරුවන් දේවින් තමන් වම පාවාදුන් කල්හි උන් පිණිස අසුචි ආදිය ඇදැ දමා පිරිසුදු කොටැ ගෙයක් ඉදිකොටැ 4 එයට සුදුසු උපකරණ හිසින් ඇදැ අන්තයෙහි දේවින් හා කම්රස අනුභව කෙරෙමි යි ආස නාවූ බෝසතාණන් දැළි අල්වා ගෙණැ ඇදැ ලූ මාත්‍රාවට කල කිරි පඤ්චකාමයෙහි ආදීනව සලකා නට ඛ්‍යානය උපදවා ආකාශයෙන් හිමාලය යට යන්නාහු ද ධර්මයෙන්ම ගියහ.

තව ද **උච්ඡඞ්ග ජාතකයෙහි** රජවැ ගැහැණියක කී යුකති සඟවන බසට සොරුන යි බැඳැ ගෙණැ ආවාවූ බැනෝය. සම නෝය. පුතනුවෝය. යන තුන්දෙනම හරණහු සුභාෂිත ප්‍රිය තාවම ආශ්‍රය කොටැ ධර්මයෙන්ම හළහ. තව ද **සාකෙතජාතක**

1 නඟා පුල්වා. 2 පල්වාපි. 3 නො සිත ඇත්තැයි 4 ඒව.

කසෙකි බුදුවැ වැඩැ හිදැ පොවා තමන් වහන්සේ **සුඛොදන රජ්ජුරුවන්** නිසා **මහාමායා දේවීන්** වහන්සේ කුසින් උපන් බව දිව්‍ය බ්‍රහ්මාදීන් ඇතුළු මුළු ලෝ දනුතුදු ගිය ජාතියෙහි මවු වූ බැම්ණිය හා පිය වූ බමුණ හා පුතැ සි කියන බස් ඉවසා ඔවුන්ගේ ගෙට ගොස් වළඳැ දෙදෙනාට අනාගාම් මාහිළුල දී අමාමහ නිවන් දිමෙන් කෙළෙහි ගුණ දැන්ම කුළු ගත්නාහු ද ධම්යෙන්ම කුළුගැන්හ.

නව ද **විසවනන ජාතකයෙහි** විෂ වෛද්‍ය පැ විෂ සොර සපියාට පන්සිල් දි ජාතිය මුළුල්ලෙහි ඔහු සිල් රක්නන් කෙරෙහි ඇතුළත් කරන්නාහු ද ධම්යෙන්ම ආචාර්‍ය වූහ. නව ද **කුදාල ජාතකයෙහි** කුදාල පණ්ඩිතවැ හුදලු කෙරියෙක්හි කළ ලොභයෙන් 1 සවිඩෙක මහණවැ පෙරළ පෙරළා ගෘහ සථවැ අනතයෙහි මේ සා ලොභයක් මට උපදනේ මේ තුබු යෙන් වේ දැ සි ඇස පියා නෙණැ හුදැල්ල හිසැ සිසාරා ගඟට දමා දිනිම් දිනිම් සි හඬ ගහා ඒ ඇසූ රජ්ජුරුවන් එතැනට අවුදින් නොප කා දිනුයෙහිදැ සි කී කල්හි "මහරජ! තෙපි එක් 2 විඩෙක් දිනූනම් නැවත පරදුව; එසේ හෙයින් නොපගේ ජය අනවසීතය; මම වූ කල්හි පෙරළා ම සිතට නොපවත්නා පරිද්දෙන් (මහණවැ) කෙලෙස් සතුරා දිනිම්"සි බණ වදරා ඒ ඇසූ රජු කාමයෙහි ආදීනව දැකැ "මම ද මහණවෙම්"සි කී කල්හි ඒ රජ්ජුරුවන් ඇතුළුවූ දෙලොස් යොදනෙක්හි පැතිරී සිටියාවූ මහපිරිස් හැරී ගෙණැ හිමාලය යට වැද මහණවැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්‍ති උපදවා එහි මහණවූ මහපිරිස්හා එක්වැ බඹලොවට වදනාහුද ධම්යෙන්ම වැඩියහ.

මෙසේ මාගේ සවාමිදරුවන් විසින් ම ජාති ජාතියෙහි පුරුදු කරණ ලද ඥානතවූ ප්‍රණීතවූ අලෞකිකවූ අචින්‍තාවූ අතුල්‍යවූ අවාච්‍යවූ අවෙද්‍යවූ අසාධාරණවූ සකල ලොකයට සරණවූ බුඩ ප්‍රත්‍යෙකබුඩාදී සත්පුරුෂ නිසෙවිතවූ ධම්රත්නයම සරණ යෙමි සි **දහම් සරණ** ඒ **සුතු.**

නව ද **වරණ ජාතකයෙහි දිසාපාමොක් ආචාර්‍යවැ** නොකල්හි උතසාහ කෙරෙමි සි වරණ හුල ඇනැ ඇස කණ කොටැ ගත් හඩන්නාවූ ශිෂ්‍යයා දැකැ අකාලයෙහි ඉතා ශ්‍රුතුවැ අඥන

1 සඉඩෙක. 2 ඉඩෙක.

යෙන් කටයුතු කිරීමහි ආදීනව වදුරන්නෝ ද ධර්මයට අල ඔකාර සැපයූහ. තව ද **සිලව නාගරාජ ජාතකයෙහි ඇත්වෑ** සිටැ මං මුළාවූ තැනැත්තහු පිරින් ඇදූ කෙළෙහි ගුණ නොදන්නාවූ ඒ අසත්පුරුෂයා නමන්ගේම දළ කපන්නට කියත ගෙණැ ආ කල්හි "මා අනින් එතෙක් උපකාර ලද්දාවූ මේ අසත්පුරුෂයා දැන් මාගේම දළ කපන්නට ආය; එහෙයින් ඔහු සුණු කොට පියම්"යි නොසිතා "යහපත –තා කළ සේ. මාගේ දැන පාරමිතාව මසතක ප්‍රාපත කෙළේ"යි වදුරා සතර කකුල නමා බිමැ බැසැ හෙවැ ඔහට දළ කපා දෙන්නාහු ද ධර්මයම දළ කළහ.

තව ද **සඞ්ඛ කිර ජාතකයෙහි** මහ වතුරෙන් නැඟූ අයත් පුරුෂ රාජකුමාරයා ක්‍රමයෙන් රාජ්‍යයට පැමිණැ තමන් මරන්නට උපසාහ කළ කල්හි එපවත් ඇසූ රට වැස්සන් ඒ රජහු මරා තමන් රජයට අභිෂෙක කළ කල්හි ඒ රාජ්‍යය ලබන්නාහු ද තමන්ගේ ධර්‍ම බලයෙන්ම ලදහ.

තවද **රුහක ධම්ම ජාතකයෙහි වෘක්ෂ දෙවතාවෑ** ඉපදූ තමන් නොකිකරු දෙවතාවන් ඒ ඒ තැන්හි විසිරී පියා නිබෙන්නාවූ රුක්හි විමන් ගත්තාවූ කල්හි තමන් කීකරු දෙවතාවන් කැඳවා නෙපි සනවැ ඔවුනොවුන් නිසා සිටියාවූ 1 රුක්හි විමන් ගන්වයි කියා ඔවුන් ලවා එසේවූ විමන් ගන්වාලා කාලා'නතරය කින් මහවැසි මහසුළං පහළවූ දවස් නොකිකරු දෙවතාවන්ගේ මැනවැයි වෙන්වැ සිටි ගස් බිඳුනු කල්හි ඔවුන් විමන් නැතිවැ දුක් ගත දී ඔවුනොවුන් නිසා සිටි රුකකට කිසි උපද්‍රවයක් නොවන හෙයින් තමන් කීකරු දෙවතාවන්ට සුව දෙන්නාහු ද ධර්මයෙන් ම දුන්හ.

තව ද **මක්ඝ ජාතකයෙහි මඝවෑ** වැසි නට තමන්ගේ සත්‍ය ක්‍රියා බලයෙන් මහහිම් නිවා වැසි වස් වන්නාහු ද ධර්මයෙන්ම වැස්ස වූහ. තව ද **අසංකිය ජාතකයෙහි තපස්විවෑ** හිමාලයයෙහි සිටැ අවුත් මහත් සාත්තුවක් හා කැටිවැ කතරෙහි වඩනාහු රාත්‍රියෙහි සෙස්සවුන් නිදිය දී නොනිදා මනසිකාරයෙන් යුක්තවැ සක්මන් කරන්නාහු මිනිසුන් නිදූ වේලෙහි සාත්තුව පහරණට ආ සොරුන් සක්මන් කරන්නාවූ තමන් දිහන්සේ දැකැ මේ තපස්වී අප දැකැ වෙළඳුන්ට කිවුනම් නපුරු මොහු නිදූ කල්හි පහරුම්හ"යි කියා වියඤ්ඤති මහපුරුෂයන්

1 රුකින්.

වහන්සේ රෑ මුළුල්ලෙහි නො නිදන හෙයින් සිටැ වෙහෙසි පහන්වැ "තෙල නපස්වින් ඇති හෙයින් මූත් නොප ජීවිත විනාශයට පමුණුවා නොප සතු වයතු හැරිගත්තමෝ වෙයි. උන් පිණිසය නොප දිවිත් ධනත් ලද්දේ; එහෙයින් උන් වහන්සේට මහාපූජා කරව්! " යයි හඬ1නහා හියකල්හි වෙළ දුන් අවුත් "සාමිනි, නුඹ සතුරන් දැකැ කෙසේ නො බැ ද"යි විචාළ කල්හි අනුන් පැහැරි ගත හැකි ධනයක් රක්ෂාකරන්නෝ වෙත් ද සතුරන් බන්නේය; මම වුකලි කා විසිනුත් පැහරිගත නො හැක්කාවූ මෛත්‍රිය කරුණාය යන දෙ ධනය රක්ෂා කෙරෙමි; එහෙයින් කිසි භයෙක් නැත්තෙමි"යි ධම් දෙශනා කරන්නාහු ද ධම්යටම ප්‍රශංසා කළහ.

තව ද මහා සවජ්ජ ජාතකයෙහි සොළොස් සවපනයෙක් දුටු රජතු එහි අර්ථ දැනගත නොහි සවපනයෙන් වන අනිෂ්ට ඵපාක දුරු කරවන පිණිස බ්‍රාහ්මණ ප්‍රාණීන් නසා යාග කරන්නට පටන්ගත් කල්හි සවීඥ විලාසයෙන් සවපනා'ර්ථ කියා එයින් ඒ රජහට වන අන්‍ෂටයක් නැතිබව හඟවා සත්ත්ව යන්හට ප්‍රාණ දැන දෙන්නාහු ද ධම්යෙන්ම දෙවූහ. තව ද ඛරස්සර ජාතකයෙහි වෙළඳවැ සොරුන් හා එක්වැ ගෙණැ ගම් පහරණට වන්නාවූ දුෂ්ට ග්‍රාම භොජකයාගේ අධම්ය ක්ෂමා කොටැ ගත නොහී ඔහට පරිහාස කරන්නාහු ද ධම් යෙන්ම පරිහාස කළහ.

තවද භිමසෙන ජාතකයෙහි චුල්ලධනුග්‍රහ පණ්ඩිතවැ තමන් හා සමයෙහි වෘත්ති නොගණ්මි යි අවමාන කළාවූ භිමසෙන නම් යෝධයා රජතුගේ යුධවූ දවස් තමන් ඇතුගේ පශ්චිමාසනයෙහි හිඳුවා තමා පූර්වාසනයෙහි හිදැ ඇත් යුධයට වැද සතුරන් ලංවත් මරණ භයින් භයපත්වැ ඔහු මල මූත්‍ර යෙන් ඇත්පිට නසා පි කල්හි ඔහුගේ අශුනතාවට පරිභව බැණැ ඔහු ඇත්පිටින් බහා තුමූ පූර්වාසනයෙහි හිදැ ඇත්කැලයක් බිඳින සිංහරාජයක්හු සේ සතුරන් බිදැ සතුරු රජතු නොමරා ගෙණැ බරණැස් රජහට පාවා දී ඔහට අභය දෙවා දැනාදී කුසල් කොටැ මෙලොවින් පරලොවින් අර්ථ සාදන්නාහු ද ධම් යෙන්ම සැබූහ.

මෙසේ ජාති ජාතියෙහි මාගේ සවාමීන්ට හස්තසාරවැ සිටි යාවූ සබ්මියම මට සියලු ඉෂ්ටාර්ථ සාදන්නේය. එහෙයින් එසේවූ සබ්මියම සරණ යෙමි යි **දහම් සරණ යායුතු.**

---

1 ගඩගහා.

තව ද **සුරාපාන ජාතකයෙහි මහානාපසව්** හිමාලයයෙහි වැඩ හිඳ තමන් වහන්සේ හැර අනායකවැ මනුෂ්‍ය පථයට අවුත් පාන මත්වැ රහමත් සිඳ නැවත තමන් වහන්සේ වැඩ හුන් ආශ්‍රමයටම ගොස් එපවත් දැන්වූ කල්හි අවවාද අනුශාස නාකරණ කෙණෙකුන් නැතිවැ අනාචාර්‍යවැ විසිමෙහි දෙස දක්වා අවවාද කරණ සෙයෙක් ද ධර්මයෙන්ම අවවාද කොටැ වදාළ සෙයෙක; තව ද **මිතාචිඤ්ඤ ජාතකයෙහි** හිත කැමැත්ත වුන්ගේ අවවාද නොගිවිසැ **උරවක්‍රයෙන්** කැපෙන අවිනිතයා දැකැ **දෙවතාවැ** සිටැ අවවාද කරණ සෙයෙක් ධර්මයෙන්ම අවවාද කොටැ වදාළ සෙයෙක.

තව ද **කාලකණ්ණි ජාතකයෙහි මහසිඹුවැ** තමන්ගේ මිත්‍රවූ කාලකණ්ණි තැනැත්තහුගේ නම අශුභයැ යි බොහෝ දෙනා විසින් මොහු නුඹ වහන්සේගේ ගෙට වැද්ද නො දුන මැනවැ යි කී කල්හි ද ඔවුන්ගේ බස් නො ගිවිසැ "සත් පියවරක් එක්වැ ගියෝ මිත්‍ර නම් වෙති; දෙළොස් පියවරක් එක්වැ ගියෝ **සහාය** නම් වෙති; මසක්-යෙළුමසක් පුරුදුවූවෝ **ඤාතෝ** නම් වෙති; එයින් වැඩි පුරුදුකමක් ඇති කෙණෙක් **ආත්මය හා සමයහ**; මම මට සුව නකා බොහෝ කලක් පුරුදුවූ **කාලකණ්ණි**හු කෙසේ අත්හරිම්ද" යි මිත්‍රයන් අත් නො හරණහු ද ධර්මයෙන්ම අත් නොහළහ.

තව ද **අඤ්ඤ මාර ජාතකයෙහි මහසිඹුවැ** තමන් කරා අවුත් අළුයට උපාය නම් කිමැ යි විචාළාවූ තමන් වහන්සේගේ පුත්වූ සත් හැවිරිදි කුමාරයන්ට:—**නිරොගිබව** එක් වැඩසාධන උපායෙක, **ආචාර දන්නා බව** එක් වැඩ සාධන උපායෙක, **නුවණැත්තවුන් කිවා කරණබව** එක් වැඩ සාධන උපායෙක, **බොහෝ ඇසු පිරිවූ තැන් ඇතිබව** එක් වැඩසාධන උපායෙක, **සුචරිතයෙහි පවත්නාබව** එක් වැඩ සාධන උපායෙකැ, කට ශ්‍රුත්තෙහි හින **විඤ්ඤාණයක් නැතිබව** එක් වැඩ සාධන උපාය කැ යි මෙසේ බොධි සත්ත්ව භූමියෙහි සිටැ පවා සළිඳු විලාසයෙන් අළුවාර වදාරණ සෙයෙක් ද ධර්මයෙන්ම වදාළ සෙයෙක.

තව ද **කිමපඤ්ඤ ජාතකයෙහි** අඹපලැයි කියා **කිම්පල** කා මි යන්නවුන් එහි සවරූප දක්වා රක්‍ෂා කරණ සෙයෙක් ද ධර්මයෙන් ම රක්‍ෂා කළ සෙයෙක; තව ද **සිල වීමංස ජාතකයෙහි පුරෙහිතවැ** තමන්ගේ ගුණ නකා බොහෝදෙනා

කරණ පූජා දැනැ "මූ මට ආචාර්‍යය පිණිස පූජා කෙරෙත් දෝ හෝ මොහු මට ගුණ පිණිස පූජා කෙරෙත් දෝ හෝ අනිස් දෙයක් පිණිස පූජා කෙරෙත් දෝ හෝ යි විමසුව මැනවැ යි සිතා වෙල්දුන්ගේ හලට ගොස් සොරකම් කොටැ ක්‍රමයෙන් සොරකම් වැඩි ගත් කල්හි වෙළඳහු ඉවසා කොටැ ගත නොහී කර සපා පියා බැඳැ රජ්ජුරුවන්ට දැන්වූ කල්හි රජ්ජුරුවනුදු මී නියා ස්ථානා'නන්තරයෙක සිටැ අප කරණ සත්කාර නො සිතා මොහු මෙබඳුවූ දුශ්චරිතයක් කළ සේ නපුරු වේ ද මෝහට රාජා'ඥ කරවයි කී කල්හි එතැන්හි සිටැ "මහරජ මම සොර කම් පිණිස මී නියා අනාචාරයක් නොකෙළෙමි; නුඹ ඇතුළු බොහෝදෙනා මට සත්කාර කරන්නෝ ජාති ආදිවූ සෙසු මහ තක් තකා දෝ හෝ ගුණයෙහි මහතක් තකා දෝ හෝ යි පරීක්ෂා කරණ පිණිස කෙළෙමි; දැන් නෙපි මාගේ ජාතිය, ස්ථානාන්තරය, ධනය, පුරුදුකම, ශනාදී සියලු ගුණ නොතකා එක අනාචාරයක් පිණිස මට වධයට නියොග 1 කළ හෙයින් ලෝකයෙහි සිලයම උත්තමය; මෙසේ මහඇති සිලයට පූජා ගෘහස්ථවැ සිටැ කොටැ ගත නොහෙමි, එහෙයින් මා විසින් මහණවන බව උත්තමයැ" යි සියලු ධන සමෘඩිය හැරැ මහණවැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්ම ලොකයෙහි උපදනාහු ද ධර්මය පරීක්ෂා කොටැ ධර්මයම බැලූහ.

තව ද **මඞ්ගල ජාතකයෙහි තාපසවැ** මියන් කැ වසනුය අවමඟුල ය යි සොහොන්හි දැමුවා හැරැ නෙණැ තමන් කරා අවුත් මිනියා අවමඞ්ගල වස්තුයක් ගෙණැ නො නසුව යි අවවාද කී පුරොහිතයාට ලොකයෙහි සත්ත්වයාට වන ශුභා ශුභයෙක් නම් කුශලා'කුශල කර්මයෙන් බවමුත් මඟුල අවමඟුල ශුභය, අශුභය, 2 (යන) මෙයින් වන්නේ නො වෙයි කියා අවවාද වදුරණ සෙයෙක් ද ධර්මයෙන්ම වදුළ සෙයෙක.

තව ද **සාරම්භ ජාතකයෙහි හොන්වැ** සිටැ පවා ප්‍රිය වචනයෙහි අනුසස් වදුරණ සෙයෙක් ද ධර්මයෙන්ම වදුළු සෙයෙක. තව ද **කුහක ජාතකයෙහි** ප්‍රඥා සම්පන්නවූ **පුරුෂවැ** අනුන්ගේ ගෙයි තණ පත හිස්වැද ගතැයි අතර මංහි සිටැ අවුත් ඒ තණ පත ඔවුන්ගේ ගෙයිම ලා 3 කුහන කම් පෑ අන්තයෙහි රත්රන් සියයක් හැරැ ගෙණැ පැලැවාවූ **කුව ජවිලයාගේ** වඤ්චා හසුකොටැ දී අවඛනතවයෙහි අනුසස් වදුරන්නාහුද

1 කළවළු හෙයින්. 2 සුහුතුශ. ජේතශ. 3 කුහක පබ්බජිකම්.

ධර්මයම වදාළහ.. තව දු **අඛනාඤඤා ජාතකයෙහි බරණැස් මහසිටුවෑ** තමන් වහන්සේ කළ උපකාරයට ප්‍රත්‍යුපකාර නොකළාවූ ප්‍රත්‍යනත්‍ත වාසි සිටුහුගේ කෙලෙහි ගුණ නොදන්මට නිදුකොටැ කෙලෙහි ගුණ දන්මට ප්‍රශංසා කොටැ මතු බුදුවැ "නො හැඳිනැ උපකාරයක් කරණ තැනැත්තේ දුලී හය; කළ උපකාරයෙහි ගුණ දන්නා තැනැත්තේ දුලීහය"යි කෙලෙහි ගුණ දන්මෙහි ගුණ වදාරණ සේක් ද ධර්මයෙන්ම වදාළ සෙයෙක.

එහෙයින් මාගේ සවාමීන් විසින් මෙනෙහි කොටැ පරීක්ෂා කොටැ නො නසා රැකැ පුරුදු කොටැ ආවාවූ සඛර්මයම සරණ යෙමි යි **දහම් සරණ යාසුතු.**

තව ද **ලිඛනජාතකයෙහි අක්ෂධූර්තිවෑ** ඉපදු වැඩිවියෙන් දු කෙළිම් යි පස ඇට ගලන අක්ෂධූර්තියාට පසඇටෙහි හලා හල විෂ ගල්වාදී ඔහු ඒ ගැලැ මුදිප්‍රාවට පැමිණි කල්හි එයට සුදුසු ඖෂධ දී රක්ෂා කරන්නාහු ද මතු බුදුවූ කල්හි ප්‍රත්‍යවෙක්ෂා නොකොටැ ප්‍රත්‍යය පරිභොග කරන්නාවූ භික්ෂූන් වහන්සේට යමෙක් ප්‍රත්‍යවෙක්ෂා නොකොටැ ප්‍රත්‍ය පරිභොග කෙරේ නම් හෙතෙම නොවිමසා පස ඇට ගිලූ අක්ෂධූර්තියා සේ විනාසයට පැමිණෙයි කියා අවවාද දෙන පිණ්ඩපාතික ධර්මයටම උපස්ථම්භක වූහ.

තවද මහාසාර ජාතකයෙහි තමන්ගේ උපාය ශක්තීන් වැඳිරිය ගත්තාවූ මුක්තාහාරය ගළවා ගන්නාහු ද මතු තමන් බුදුවැ තෘෂ්ණාවට ගැතිවූ මුළුලෝ ගළවන බුඛ **විලාසයට** දෘෂ්ටාන්ත දක්වන්නා සේ ගැළවූහ. තවද **විශ්වාස භොජන ජාතකයෙහි** මිමින්න හා කළ විශ්වාසයෙන් විෂ මිශ්‍රවූ ඇගේ ඇඟ ලොවැ මළාවූ **සිංහයා** දැකැ "විශ්වාස නොකළ මනා වුන් හා විශ්වාස කළ කල්හි ඉන් වන්නේ සතුරියාට ජීවිත විනාසාදී මහා'ලාභයයි"අවවාද දෙන්නාහු ද මතු බුදුවැ නුවණැත් තවුන් විසින් අවිශ්වාසනීයවූ සංසාරය හා විශ්වාස නොකට යුතුයැ යි කරණ ධර්මදේශනාවට බිම් ගන්නාක් මෙන් ධර්මයටම උපකාර වූහ.

තව ද **ලොමහංස ජාතකයෙහි ආජීවකවෑ** නගනාවැ වසු ගොම වළඳා මරණ'න්නය දක්වා වැසැ මරණ මඤ්චකයෙහි

හොත් සමයෙහි නිරා නිමිත්ත පහළවූ කල්හි මා ගත්තාවූ මේ දුලීබධිය අපාය මාංශියෙක් වනැසි දැනැ එම විටම මිථ්‍යා දෘෂ්ටි හැරී සම්‍යක් දෘෂ්ටි ගෙණැ නරකයෙහි නිමිත්තය පෙරළා දිව්‍ය.ලොක නිමිත්ත කොටැ නරක ගමනින් වැළකී දෙව් ලොවටම වඩනාහුද ධර්මයෙන්ම වැඩියහ.

තව ද **මහා සුදර්ශනාභිනිෂ්ක්‍රමණයෙහි** "මහා සුදර්ශන"නම් චක්‍ර වර්ත්තිවැ ධර්ම්ම නම් ප්‍රාසාදයෙන් බැසැ සත්රුවන් තල්වෙනෙහි මරණ මඤ්චකයෙහි වැඩැ හෙවැ **සුභද්‍රා** බිසවුන් වහන්සේ අවුත් සිටැ "ස්වාමිනි, නුඹවහන්සේගේ **කුසාවති** නම් රාජ ධානිය ප්‍රධානකොටැ ඇත්තාවූ සුවාසූ දහසක් රාජධානිය ඔබ නම් ප්‍රාසාදය ප්‍රධාන කොටැ ඇත්තාවූ සුවාසූ දහසක් ප්‍රාසාදය ඝනාදින් ඒ ඒ වස්තු පෑමෙහි ඇලුම් කළ මැනවැ"යි කියන කල්හි "දේවිනි, **එසනුඛාමා, සොලසඝාමයෙහි** අපෙක්ෂාවක් කරන්නාවූ අවවාදයක් මට නො දෙව; අද මේ මාගේ 1 **අන්තා ශයනය**"යි කී කල්හි දේවීන් සොකය ඉවසා ගත නොහී මහ හඬින් හඬන්නට වන්කල සෙසු සුවාසූ දහසක් අඹුවනුදු සුවාසූ දහසක් අමාත්‍යයනුදු රාජ කුමාරයනුදු එකපැහැරී හඬන්නට වන්කල්හි "හඬා කොලාහල නොකරව"යි අස් වසා සුභද්‍රා දේවීන් කැඳවා "දේවිනි, ඇති වස්තුවක් නැතිවන කල ශොක නො කළ මැනවැයි සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් සිටි සේ සිටිනා එකුදු ධර්ම් කෙණෙක් නැතැ"යි–

"අනිච්චා වත සඞ්ඛාරා උප්පාද වය ධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමෝ සුඛෝ" කි

යන ගාථායෙන් බුදුවූ කල්හිදු අඳුරක් පිල්ලක් නො හැරී එම ගාථායෙන්ම වදුරණ පරිද්දෙන් අවවාද් දෙන්නාහුද ධර්ම් යෙන්ම අවවාද දුන්හ.

තව ද **නෙලපාන ජාතකයෙහි රාජකුමාරවැ** සිටැ දිව්‍ය රූප මවා ගෙණැ එන්නාවූ යකින්නගේ රූ දැකැ තෘෂ්ණා වසඟ නො වන්නාහුද 2 ධර්මයටම සත්කාර කළහ. තව ද **නාමසිද්ධි ජාතකයෙහි ජීවක** නම් ඇත්තෝද මියෙති; **ධනපාල** නම් හුද දුගීන වෙති; **ජනඵඛ** නම් හුද මං මුළා වෙති; එහෙයින්ම සත්ත්වයාහට ධර්මයෙන්ම අවිසිඳිය වන බව මුත් නාම මාත්‍රයකින් වන ඉෂ්ටා'නිෂ්ට නැතැයි අවවාද දෙන්නාහුද

1 අන්ත සෙයියායයි. 2 ධර්ම්මයෙන්ම.

ධර්මයටම පූජාකළහ. තව ද **කූටවාණිජ ජාතකයෙහි** වෙළඳ වෑ තමන් හා කැටිවැ ධන බෙදන්නාවූ අනික් අති **පණ්ඩිත** නම් කුට වෙළඳතු තමා පියා ගස්1 බුහුරෙහි හිඳුවා පියා වෘෂභ දෙවතාවන් ලවා කියවන්නා සේ අති පණ්ඩිතයන්ට වඩා දෙවයි කියවූ කල්හි. වෘෂභ දෙවතාවනුත් වෘෂභ දෙවතා නොවන්නනුත් මම හඳුනන්නෙමි වෙමි දැයි ගස් බුහුරෙහි හිනි ලා ඔහු ගස් බුහුරෙන් දිවැගෙණැ අතු අගට ගොස් අත්ලෙහි එල්බැ ගෙණැ බිමැ හි අති පණ්ඩිතයන්ට වඩා **පණ්ඩිතයෝ** උත්තමයෝ යැයි කීකල්හි වඤ්චකයන්ගේ වඤ්චා හැරැ සම කොටැ ධන බෙදා දී දැනාදී කුසල් කරන්නාහුද ධර්මය හා ම අත්වැල් බැඳහ.

තව ද **පරොසහස්ස ජාතකයෙහි මහා බ්‍රහ්මවෑ** ඉපදූ තමන් බස අවී දන්නාවූ ජෙෂ්ඨ තාපසයන්ගේ ප්‍රඥාසම්පත්තියට බ්‍රහ්ම ලොකයෙන් මනුෂ්‍ය ලොකයට අවුත් සතුති කරන්නාහුද ධර්මයෙන්ම සතුති කළහ. තව ද **අසාත රූප ජාතකයෙහි බරණැස් රජවෑ** නිරිසන්වැ සිටැ **ශක්‍රයා** අතින් වැදුම් ලබන්නට පොහොසත්වැ ද තමන් බැඳැගෙණැ මරන්නාවූ **කොශල රජ්ජුරුවන්ට** කිසි හිංසාවක් නොකොටැ ලෙහි මෛත්‍රියම උත්තමියට පමුණුවන්නාහු ජීවිතයද හැරැ ධර්මය රක්‍ෂා කළහ.

මෙසේ මාගේ සම්‍යක්සම්බුදු **ධර්ම චක්‍රවර්තීන්** වහන්සේ විසින් අනෙක ජාතියෙහි රක්‍ෂා කළාවූ ධර්මය මේ ජාතියෙහි පවත් ගෙණැ නිවන් දක්නා ජාති දක්වා අප රක්‍ෂා කරන්නේයැයි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යා යුතු.**

තව ද **පරෙසත ජාතකයෙහි** පියා විසින් වලට දූ ගෙණැ ගොසින් කෙලශ වසඟයා සේ අත අල්වා ගන්නා ලද්දාවූ දුව ගේ ආචාර ධර්මයට **වෘෂභ දෙවතාවැ** සිටැ ප්‍රශංසා කරන්නාහුද ධර්මයෙන්ම ප්‍රශංසා කළහ. තව ද **වෙදී ජාතකයෙහි බරණැස්හි මහසිඹුවෑ** අතරමගැ සොරුන් දැකැ මෙහි කල් යවන බව නපුරැයි සිහුවැ බරණැසට වැදූ බඩු රක්‍ෂා කරන්නාහුද සංසාරයෙහි ආදීනව දැකැ සිහුවැ බුඩ භූමියට වැදූ සසරින් සත්‍යවියා ගළවනබවට දෘඪානන්ත පානාක් මෙන් ධර්මයෙන් ධර්මය සැසි සැටුහ. තව ද **මහාජනවිඤ්ඤ ජාතකයෙහි දිව්‍ය පුත්‍රවෑ**

1 සිදුරෙහි.

සිටෑ ලත් ලත් දෙයෙහි අසන්තුෂ්ටවෑ හොස් උරවක්‍රයෙහි කැපෙන්නාවූ යථාලාභ සන්තොෂ නැති සත්ත්වයාගේ තෘෂ්ණා මහිමාවට නිදහස් කරන්නාහු ද තෘෂ්ණා නිදහස් මුඛයෙන් ධර්ම ප්‍රශංසා වම කළහ.

තව ද **දුර්ලභාෂම ජාතකයෙහි වෘක්ෂදෙවතාවෑ** සැලි නැඟි දඩ පතට පවා මරණ භයින් වෙවුලන්නාවූ හසුනු දැකැ ඕහට අවවාද කියා ඔහු කෙරෙන් මරණ භය දුරුකරන්නාහුද මතු බුදුවැ කරණ සියලු සත්ත්වයාගේ මරණ භය දුරු කිරීමට පූර්ව සෙවා කළහ. තව ද **උදඤ්චනි ජාතකයෙහි තාපසවෑ** ගැහැණියක් අවගුණ කී **සෘෂ්‍යශෘඞ්ගකුමාරයන්ට** පඤ්චකාම යෙහි ආදීනව හඟවා ධ්‍යාන සමාපත්තියට උපදෙසය දී ජීවිතා' න්තයෙහි බ්‍රහ්මලෝකයෙහි සිටුවන්නාහුද ධර්මයටම මාහිය පැහ. තව ද **සාලිඝාතක ජාතකයෙහි රාජාමාත්‍යවෑ** අත්හකුරු ගසා ගස් පතැ රූප පානාවූ පිළු ගම්වර සතරක් ලත් සේ දකැ සිටෑ යම්කිසි ශිල්පයෙක්ම උගත යුතුයැයි කියා මානසයක් නැතිවෑ ශිල්පයට ප්‍රශංසා කරන්නාහුද ධර්මයටම ප්‍රශංසා කළහ.

තව ද **බාහිය ජාතකයෙහි රාජ්‍ඥීමාත්‍යවෑ** රාජා'ඩම්බරයෙහි ශරීර ධර්මය යුතුවැ කළාවූ ග්‍රාම්‍ය ස්ත්‍රියක් දැකැ සිහපඤ්ඤරය හැරැ පියා සිටි රජ්ජුරුවන් මේ ගැණිය මෙසේවූ රාජා'ඩම්බරයෙහි අප්‍රතිඝ්‍රඥතාවෑ ශරීර ධර්ම යුතුවැ කෙළේ නිරෝගි හෙයින, මෙසේවූ නිරොගින්ගේ වසාතුවද විශද වෙයි, විශද වසාතු ඇති ස්ත්‍රීන් ලද පුත්‍රයෝ පිණැති වෙනියි අහමෙහෙයුන් තැන තැබූ කල්හි ඈ නොබෝ කලෙකින් සක්විති රජ වන පුතකු වැදුවා දැකැ ශරීර ධර්ම මාත්‍රයක් පිරීමෙන් පොවා ගැණියට මෙතෙක් ඉෂ්ටවූ කල වැඩි විද්‍යුවක් උගත්තවුන්ට වැඩි ලාභයෙක් වන්නේයැයි විද්‍යුවට ප්‍රශංසා කරන්නාහුද ශිල්ප ප්‍රශංසා මුඛයෙන් ධර්මයටම ප්‍රශංසා කළහ.

තව ද **කුණ්ඩපූව ජාතකයෙහි එඩරු ගසැ වෘක්ෂදෙවතා** වැ ඉපදූ තමන්ට කුඩු පූවක් පිදූ තැනැත්තවුට "මේ මද දුයෙක් වේද මට පූජා කෙළේයැයි නොසිතා එඩරුගසැ සිසාරා මුවවිවින් මුවවිට ඇරැ තුබූ සියදහස් ගණන් නිබාන පෑ ඔහුගේ සිටුතනතුරු ලැබීමට කාරණ වන්නාහුද මතු බුදුවැ තමන්ට කුඩු පූව පිළිගැන්වූ පූර්ණතම් දැසියට අමාමහ නිවන්

පෑ සෝවාන් තනතුරු දෙන බවට පූර්වනිමිත්ත දක්වූවාක් වැන්නහ. තව ද **සබ්බ සංහාරඤ්ඤ ප්‍රශ්නය, ගද්‍රභ ප්‍රශ්නය, අමරා දෙවි ප්‍රශ්නය** යනාදි **උම්මඟ්ග ජාතකයෙහි** නොයෙක් ප්‍රශ්න යෙහි තමන් ප්‍රශ්න ප්‍රකාශකිරීම් මුඛයෙන් ධර්මයම ලොවට ප්‍රකාශ කළහ.

මෙසේ මාගේ සඞ්ගාමින් විසින් අනෙක ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් ලොවට ප්‍රකාශ කළාවූ සද්ධර්මය අසා විමසා මෙනෙහි කොටැ වැඳැ පුදු අභිමතා'ඒ සාධර්මයි **දහම් සරණ** යාසුතු.

තව ද **සිඟාල ජාතකයෙහි** වෘෂ්‍ය දෙවකාවැ රාත්‍රියෙහි සොරොව්වෙන් ගමට කැණහිල්හු වැදැ රෑ රහ බී නිදැ පහන්වැ ගිය කල්හි ගැළවී ගත නො හී බමුණාහට මසුරන් දෙසිය යක් දෙමි කියා බමුණු ධන ලොභයෙන් පිළියෙන් වසා කිසිල්ලෙහි හොවා ගෙණැ පිටත් කළ කල්හි අමූසොහොන කෙරෙහිදි බැසැ පියා උතුරු සළුව අතුටලැසි කියා රන් පොදි බදවන්නට උතුරු සළුව අතුරුවාලා මෙ තැන මාගේ ධනය තුබූයේ නො වෙයි එතැනය යි කියා එතැන ඔහු කැණීයදී අතුට ලූ පිළියේ සතර කොණෙහි හා මැද හා පස් නැනකට වර්චස් කොටැ වටනින් තෙමා සොහොනට දිවගත් කැණහිල්හු දැකැ දුර්ජනවූ කැණහිල්හුගේ බස් හැදහු බමුණාට අවවාද දෙන්නාහුද ධර්මයෙන්ම අවවාද දුන්හ.

තව ද **මිනවිහති ජාතකයෙහි** 'මිත විහති'නම් **මත්ස්‍ය රාජවැ** කෙවුලන් දැල් දැමූ කල්හි දැල ගඳ අසා දැලට නොහසුවැ ගැළවී කිසි පරීක්ෂාවක් නැතිවැ දැල්හි බැඳි හියාවූ "ඔහු විහති" "අලසවිහති" නම් මත්ස්‍යයන් දෙන්නා කෙරෙහි කළු කරුණයෙන් දැල් පස්සෙන් ගොසින් දැල පලා පියා ඔහු ගළවා ගෙණැ හියාක්හු සේ කෙවුලන්ට පැනී කෙවුලන් මසු දැල් පලා ගෙණැ හියහයි සිතා 'මසු හසුකරම්හ' යන සිතක් නැතිවැ දැල ඔසවා ගත් කල්හි ඔවුන් දෙන්නා දැලින් ගළවා හෙළා ජීවිතදාන දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ.

තව ද **අනුශාසික ජාතකයෙහි** **ලිහිණි** දෙවුවැ තමා ගොදුරු කන්නාවූ බිම්හි සෙසු පක්ෂීන් නො ඇවිදිනා පිණිස

1 සකුණ ජාතකයෙහි.

"මෙතැන ඉතා සොපද්‍රවයැ"යි අවවාද කියා නවතා තමා පරික්ෂා නැතිවැ ගොදුරු ගෙණැ දිවන්නාවූ ගැල් සක්හි හසුවැ හිස කැඩිගිය කල්හි මළාවූ පක්ෂියා දැකැ යම්කෙණෙක්තුමු ලොල්වැ තමන්ගේ ලෙඟල්ල්‍යය හැරැපිය නොහී අනුන්ට අවවාද කියත්නම් ඔහු මෙසේ විනාශයට පැමිණෙනිසි අවවාද දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ. තව ද **දුබ්බච ජාතකයෙහි අනවැසිවැ** තමන්ගේ අවවාද නො කොටැ පමණ දැකැ අඩ යපි පනෙම්සි එහි ඇති මළාවූ ආචාර්‍යයා තමාගේ විද්‍යාශකතින් පමණින් මුත් වැඩියක් කරන්නට සිතූ කෙණෙක් ඇත්නම් මෙසේ විනාසයට පැමිණෙනිසි 1 බණ වදාරන්නාහුද ධර්මයෙන්ම වදාළහ.

තව ද **තිතතිර ජාතකයෙහි ගණශාසකයාව** අස්ථානයෙහි හඬා වටු වැද්දු අතැ නටුවාවූ වටුවා දැකැ "අස්ථානයෙහි බොහෝ කොටැ දෙඩන්නාහුද මෙසේ විනාශයට පැමිණෙති" 2 අවවාද වදාරන්නාහුද ධර්මයෙන්ම වදාළහ. තව ද **චම්මක ජාතකයෙහි වටුවැ** වටු වැද්දාහට හසුවැ "මම අහර කා තර වීම් නම් මෙතෙම වටුමස් කන්නවුන්ට මිළයට මා දෙන්නේ යැ"යි සිතා ගොදුරු නොකා ජීර්ණවැ සෙසු වටුවන් දිනිමවා පියා ඉතා දිරා ගියාවූ තමන් වහන්සේ අත්ලෙහි හිඳුවා ගෙණැ මේ වටු මෙලේ දෝහෝඩි පරීක්ෂා කරණ කල්හි ඔහු පමා වන බව දැනැ සෘෂණයෙහි ආකාශයට නැඟී ගැලවෙන්නාහුද උපාය කෞශල්‍ය ධර්මයම රක්ෂා කළහ.

තව ද **අඤ්ඤාල රුව ජාතකයෙහි දිසා පාමොක් ආචාර්‍යවැ** නො කල්හි හඬා මළාවූ කුකුළා දැකැ අස්ථානයෙහි බිණ්ඩිහි දෝෂ වදාරන්නාහුද ධර්මයෙන්ම වදාළහ. තව ද **ඛණ්ඩාහාල ජාතකයෙහි බරණැස් රජහට පුරෝහිතවැ** ප්‍රත්‍යන්තය සන්හිඳු වන්නට යන්නාවූ ඒ රජහු තමන් නුවර රක්ෂායෙහි හිඳුවා ගියකල්හි තමන් හා අනාචාර කරම්හ්ති බිසවුන් කී කල්හි ලොකාමිෂවූ සුඛයක් නකා මට බත් දුන් රජ්ජුරුවන් කෙරෙහි හා සතර අපායෙහි උපදවන්නාවූ අකුසල්හි හා භය කොටැ අනාචාරයක් නොකරම්සි කියා "ඉදින් එසේ නොකෙරෙහි නම් මාගේ උපාය ශකතින් රජ්ජුරුවන්ට කියා තා හිස් කප්පා පියම්"යි කිකල්හි "එක ජාතියෙක්හි වන්නාවූ ජීවිත විනාශයට හිතා ජාති ජාතියෙහි රක්ෂා කරන්නාවූ ධර්මයට විනාශයක් නොකරම්" කී කල්හි "තට කටයුතු දන්වම්"යි

1 අවවාද දෙන්නාහුද. 2 දෝෂ වදාරන්නාවූ.

කියා පියා බිසවුන් තමන්ගේ ශරීරයෙහි නඛ ව්‍රණ කොටැ රජ්ජුරුවන් ප්‍රත්‍යනන්තය සාඛා ඇ කල්හි "තොප රාජ්‍යය රක්‍ෂා වට සිටුවා ගිය පුරොහිතයන්ගේ ආචාර සම්පත්හි බලව, මූ තොප කෙරෙහි භයක් නැතිවැ පරලොක භයක් නැතිවැ මා හුන් ගෙට අවුත් තමන්ගේ බස් නො ගිවිස්නාවූ මාහා බලාත් කාරයෙන් අනාචාර කොටැ ගියහ"යි කියා කිව.

එබස් ඇසූ රජ්ජුරුවන් විසින් "ඒ දුෂ්ට පුරොහිතයා පිරි තොල හයා බැඳැ අමුසොහොනට ගෙණැ ගොසින් මරව"යි කියා රාජ පුරුෂයන්ට නියොග කළ කල්හි රාජ නියොග ලද්දාවූ ඒ පුරුෂයන් තමන් වහන්සේ බැඳලා මරන්නට යැයි අමු සොහොනට ගෙණැ යන කල්හි මේ නියතයෙන් බිසවුන් විසින්වූ උපද්‍රවයෙකැයි දැනැ "නිෂ්කාරණයෙහි රජ්ජුරුවන්ට අලාභ නොකොට මා නොමරා රජ්ජුරුවන් කරා මා ගෙණ යව"යි කිකල්හි ඔවුන් ගෙණැ ගොසින් රජ්ජුරුවන්ට පෑ කල්හි "මහරජ, මම ඇතිවූ තැන් පටන් ගෙණැ ලෙහෙ ඩිත්තකද මරා ප්‍රාණ වධයක් නො කළවිරිමි. අනුන් අයිති තණ පත පමණකුදු නො ගත් විරිමි ලොභ වශයෙන් පර සත්‍රීගේ මුහුණ නොබැලී විරිමි කෙළි පිණ්ඩිසද බොරු නො කී විරිමි තණ අගෙකිනුදු සුරායෙහි දිව නොපැහැරවූ විරිමියි තොපගේ බිසව් තොපගේ මේවර ඇ අමාත්‍යයන් සූසැට දෙනකු හා අනාචාර කොටැ මාද කෙළසන්නට කියා සිතා තමන්ගේ බස් නො ගිවිස්සාවූ මා කෙරෙහි මෙහෙකොටැ මෙසේවූ බොරු කීහ"යි කියා ඇ කළ අපරාධ ගිවිස්වා:–

ඒ බව දැනැ කිපි රජ්ජුරුවන් ඒ සූසැටදෙනාට හිස් කපන්නට නියොග කළ කල්හි සියලු ලොව ගළවන්නට සමර්ථවූ ධර්ම යුක්තවූ කථායෙන් රජ්ජුරුවන් පොළඹා ඔවුන්ට අභය දෙවා ගැහැණුන්ගේ අවගුණ දක්වා බිසවුන් කෙරෙහිද ක්‍ෂමා කරවා ඔවුනුදු බන්ධනයෙන් ගළවා තුමූද බන්ධනයෙන් ගැළවෙන්නාහුද ධර්මයෙන්ම ගැළවුනාහ. මෙසේ මාගේ සැවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් මෙනෙහි කරණ ලද්දාවූ ධර්මයම සරණ යෙමි යි **දහම් සරණ යායුතු.**

තව ද **කුසනාළි ජාතකයෙහි** දිය මෙරලිය ගස්හි **වෘක්‍ෂ දෙවතාවෝ** ඉපදූ තමන් හා මිත්‍රවූ මහානුභාවවූ වෘක්‍ෂ දෙවතාවා වසන්නාවූ ගස රජ්ජුරුවන්ගේ ප්‍රාසාදයෙහි සතමහයට

කපන්නට පටන් ගත්කල්හි විමානය ඇති වෘක්ෂ දෙවතාවා තමාගේ මිත්‍රයන් හා එක්වැ ඔවුනොවුන් වැලැඳැ ගෙණැ වළාම් කරන්නට පටන් ගත් කල්හි එතැනට වැඩැ එපවත් විවරා දැනැ ජාති ජාතියෙහි අනුන්ට උපන් දුඃඛයක් දුරුකරන්නට සුදුසුවූ නුවණ නම් දෙය තමන්ට කුලධර්ම හෙයින් "නෙපි හැමදෙනම නොබව මම මේ වෘක්ෂය රක්‍ෂා කොටැ දෙමි"යි අස්වසා සෙට වැනි දවස් වඩුවන් ගස් කපනට ආ වේලෙහි (කටු) බොහොඩ වෙසක් මවා ගස මූල් අතුරට වන්නාසේ පැනීලා රුක් මැදින් නැඟි කඳ මුදුනෙන් නික්මැ වැඩැ; හෙවැ ඒ බව දුටු වධුවන් මේ ඇතුළෙන් සිදුරු ඇති රුකෙකැයි හැරැ පියා ගියකල්හි මිත්‍රයාට විමානය හා වෘක්ෂය හා හැරැ දෙන් නාහුද මතු තමන් සවිනේ හෙවා දැනැ සියලු ධර්මයන් පසක් කරන්නට වැඩැ ඉඳිනා බොධි වෘක්ෂයට මරහු විසින් කිසි උපද්‍රවයක් නොවිය දෙන්නට හෙතු සම්පාදනය කරන්නවුන් මෙන් සඩර්මයම සුහුඹුල් කළහ.

තව ද දුමෙඹ ජානඤ්ඤෙහි හසතිරාජවෑ රජගහානුවරැ රජහු තමන් මරන්නට යැයි **වෙළුලල** පර්වතයට නහා "එක් පයක් පර්වතයෙහි 1 ඔබ්බා ගෙණැ තුන්පයක් ආකාශයට නහා ගෙණැ සිටුව"යි කියා හස්ත්‍යාචාර්‍යයාට නියොගකළ කල්හි ඒ තමන් වහන්සේ මරන්නට කරන්නාවූ ප්‍රයෝගය බව දැනැ ඒ ක්‍ෂණයෙහිම ඇතිවැ ගත්නාවූ ප්‍රණ්‍යමයවූ ඍද්ධියෙන් හස්ත්‍යාචාර්‍යයා හා එක්වැම ආකාශයෙන් බරණැස් නුවරටම ගොස් තමනුත් හස්ත්‍යාචාර්‍යයාත් ගළවන්නාහුද ධර්මයෙන්ම ගැළවූහ. තව ද **නඞ්ගලිස ජානඤ්ඤෙහි දිසා පාමොක් ආචාර්‍යවෑ** තමන්ගේ ශිෂ්‍යයා දුටු දුටු දෙයක්ම නඟුලිසක් වැන්නැයි කිය කියා පරිවය ලෙස "නඟුලිසක් වැනි සපියකු දිවිම්" කීදැද එහි මදක් ආකාර සාම්‍යයෙක් ඇතෙයි ගිවිසැ "නඟුලිසක් වැනි ඇත්තු දිවිම්" කීදැද තෝරා කියාලිය නුහුඹු බව මුත් ඇතුගේ සොඬ හා නඟුලිස මදක් එක්වැනි ලෙසෙක් ඇතැයි කියා උපෙක්‍ෂා කොටැ "නඟුලිසක් වැනි උක්දණ්ඩක් කාලා ආම්" කීදැද උක්දණ්ඩටත් නඟුලිසක් වැන් ලෙසෙක් ඇතැයි උපෙක්‍ෂාවැ මියෙන් නොබැණැ ඉඳැ අනික් දවසක් දියෙන් කිරිබත් කැම්හ"යි කියාදී කිරි නම් ඛමක් වැනිදැයි විචාළ කල්හි "හැයි දී කිරි නඟුල්සක් වැනි වේදැයි කියා දැන්වූ කල්හි "මේ අඥානයා නො විචාරා දුටු දුටු දෑයටම නඟුල්සක් වැන්නැයි කියයි. මොහු උගන්වාගන්ට නො පිළිවනැයි අත්හර ණුහුද ධර්මයෙන්ම හළහ.

1 ඔවා.

තව ද **අඹ ජාතකයෙහි** පැවිදිවැ පන්සියයක් තාපසයන් හා කැටිවැ හිමාලයයෙහි වෙසෙමින් තමන්ගේ අනැවැසි එස් තාපසයන්හු මහ නියම්හි පැන් නො ලබන්නාහු, තිරිසනුන්ට ගසක් කැණ පියා දෙණක් ඉදිකොටැ පැන් බොන්නට එන තිරිසනුන් මේ තාපසයෝ අපට පැන් නගම්හයි කියා එලා' එලයට නො ගොසින් තුමූ සහ දුකින් පෙළෙති. මොවුන්ට අප උපකාර කළ මැනවැයි ශක්‍රත්ව තරම්න් අඹදඹ ආදිවූ එල ගෙණ කල්හි එක තමන් කන්නට ගෙණ එලා'එලයෙන් පන්සියයක් තාපසයන් රක්‍ෂාකරණ පරිදි දැකැ "එක වතාවත් දන්නා ගුණ සම්පන්න කෙණෙකුන් නිසා බොහෝදෙනා සුව යෙන් වෙසෙති යි වත් සම්පත්තියෙහි අනුසස් වදුරන්නාහුද ධර්මයෙන්ම වදුළහ.

තව ද **කවාහ ජාතකයෙහි** මහසිඹුවැ තමන්ගේ ගැත් නවු තමන් ලිවා කොටැ පනක් ලියවා ගෙණැ තමන්ගේ පිත්මි කියා හොස් පසල් දනව්වෙහි සිටානන්ගේ දුවනියන් හිඳුවා ගෙණැ වසන කල්හි එපවත් අසා "මොහු කළසේ ඉතා නපුරු; මා ගොසින් ඔහු බැඳ ගෙණෙව මැනවැ"යි ඔබ හොස් ඔහු පෙරමගට අවුත් කළාවූ ගැනි මෙහෙ දැකැ මපිත් මිදි මොහු සුවසේ වුන්නෙන් මට කුමන අලාභයෙක්දැයි සිතා පුත් බවම හිවිසැ ඔහු ලද්දාවූ ශ්‍රී සම්පත්කොටැ ඒ තමන් වහන්සේගේ ගැත්තහු සිටුදියණියන් තමහට ඉදිකළාවූ අග්‍ර රස භොජනයට ගහණකරණ කල්හි එපවත් අසා ඕහට මතුනූ අඳ හැගෙන නියාසෙන් ඔහුගේ ගැනිකම් හඟවා ගාථාවක් සිටු දියනියන් උගන්වා ඔහු වාචාලකම් බණන කල මේ ගාථාව නෙපි වදුරා ඔහුගේ වාචාල කම් හරවා ඔහුගේ ශ්‍රී සම්පත්කරන් නාහුද ධර්මයෙන්ම සම්පත් කළහ.

තව ද **අසිලක්ඛණ ජාතකයෙහි රාජකුමාරවැ** කඩුයෙහි ලක්‍ෂණ පරීක්‍ෂා කෙරෙමිසි කඩුව හිඹැ මිරිස් සුණු නාසයට වත් කල්හි කිවිසැ නාසය කපාගත් බඩහ පරීක්‍ෂකයා හා එම මිරිස් සුණු නාසයෙහි ලා කිවිස මසිල් රජ්ජුරුවන්ගේ දුවනියන් හා රාජ්‍යය ලද තමන්වහන්සේ හා දෘෂ්ටාන්ත කොටැ "සමහරුන්ට අනිෂ්ටයට කාරණවන දෙයක් සමහරුන්ට ඉෂ්ටයට කාරණ වෙයි" මේ කිවිසැ නාසය කපාගත. ඇපි කිවිසැ රාජ්‍යය ලදුම්හයි බණ වදුරන්නාහු ද ධර්මයෙන්ම වදුළහ. තව් ද **සාලණඩුක ජාතකයෙහි බරණැස් සිටුවැ** අශ්‍රුකාරිවූ තමන්ගේ දූසයා 1 භික්මවා විනීත කරන්නාහුද ධර්මයම සුහුඹුල් කළහ.

---

1 දූසකාරයා.

තවද **බිලාර ජානකයෙහි** හා **අගතික ජානකයෙහිද** මිහිවෑ ඉපදූ ද තපස්වී වෙශයෙන් මියන් කන්නාවූ 1 සිවල්හුගේ වඤ්චා හසුකොටැ ඔහුගේ හසින් මුදා තමන්ගේ පරිවාර මිහියන් රක්ෂා කරන්නාහුද දැන් බුදුවැ සසර හසින් මුදා තමන්ට ඇතිවූ මුළුලෝ රක්ෂා කරණ බවට පූර්ව නිමිත්ත පෑහ. තව ද **කොසිය ජානකයෙහි දිසාපාමොක් ආචාර්ය්‍යවැ** තමන්ගේ අතැවැස්සාගේ අඹුවූ අනාචාර කරන්නාවූ බ්‍රාහ්මණියගේ දුස්සීල කම් තමන්ගේ උපායෙන් හරවා ශීලත්‍රයෙහි පිහිටුවන්නාහුද ධර්මයෙන්ම පිහිට වූහ.

මෙසේ මාගේ සවාමිදරුවූ **තිලෝගුරු බුදුරජානන් වහන්සේ** අනන්ත ජාතියෙහි නොයෙක් ලෙසින් පිරිමසා විමසා සුභූ බුල් කොටැ පරිහරණය කළාවූ සඩ්ඝය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

තව ද **අසම්පදාන ජානකයෙහි** "**සඩ්ඝ**"නම් සිටුවැ තමන්ගේ ගෙට අනාථවැ ආ මිත්‍ර සිටුහට සතළිස් කෙළක් ධන දී තමන් අනාථවැ ඔහුගේ ගෙට ගිය දවස්හි ඔහු තමන් වහන්සේ දැකැ මා අනාථවැ ගිය දා සතළිස් කෙළක් ධන දුන් තැනැත්තෝ වෙද්දැයි නොසිතා කෙළෙහි ගුණ නො දන්නවුන් කෙරෙහි අඟතැන්පත් වැ සිටිහෙයින් "පෙරළා අපගේ ගෙට නොඑව; තෙලෙ පිසැ කව"යි කියා කුරුගුලා කන්හි බැඳලූ බොල්තිඹක් ගෙණැ යන්නෝද "මා එතෙක් ධන දුන් තැනැත්තහුට මේ බොල් තිඹක් දිනැ"යි නොසිතා මෙපමණ ප්‍රත්‍යුපකාරයක් පිළිගෙණැ ද අපගේ මිත්‍රධර්ම්‍ය සථිරවිනම් ශහපතැයි සතුටු සතුටුවැ වඩනාහුද ධර්ම චින්තායෙන්ම වැඩි ශහ. තව ද **පඤ්චශරූක ජානකයෙහි රාජකුමාරවැ** දිව්‍ය රූප මවා ගත්තාවූ යක්ෂීන්ගේ වඤ්චා දැනැ ඔවුන්ට හසුනොවැ රාජ්‍යශට පැමිණැ ලොක රක්ෂා කරන්නාහුද දශරාජ ධර්ම්‍ය ම රක්ෂාකළහ.

තව ද **ඝතාසන ජානකයෙහි පක්ෂිරාජවැ** තමන් වසන වනයෙහි විල හොත්තාවූ **නාගරාජයා** ගස් මත්තෙහි හුන්නාවූ පක්ෂීන් තමා වසනු විලට වර්චස් හෙළතිසි **කිපී විෂා'ග්නි** හරණට වන් කල්හි බැහැරි ගිනි ඇතිවූ කල්හි "දියෙන් ඒ ගිනි නිවති; දියෙන් නැහි ගින්නට ප්‍රතිකාර කොසින් කෙරෙත්ද? එහෙයින් අපට සරණ්ම හඟ උපනැ"යි කියා

1 බලල්හුගේ.

තමන් වහන්සේගේ පක්ෂීන් ගෙණෑ අනික් තැනකට වැඩෑ නො කිකරු පක්ෂීන් එහිම හිඳෑ මියයාදී කිකරු පක්ෂීන් ගළවන සෙයෙක්ද මේ කෙලෙස් ගිනි ගත් සසරෙහි තමන්වහන්සේට නො කිකරු වන් දමින් පැලහෙමින් මහදුක් ගත්දී තමන් වහන්සේ කිකරුවන් යෙහෙන් ගළවා ගෙණෑ අමාමහ නිවන් වදනා බවට පූර්ව නිමිත්ත පෑ සෙයෙක. තව ද **ඛාණසොණ ජාතකයෙහි** හා **චන්ද්‍රාභ ජාතකයෙහි** බ්‍රහ්මලොකයෙන් මනුෂ්‍ය ලොකයට අවුදින් අතෑවැස්සාගේ බුඩිස්ට ප්‍රශංසාකරණ සෙයෙක්ද ධර්මයෙන්ම ප්‍රශංසා කොටෑ වදාළ සෙයෙක.

තව ද **සුවණ්ණහංස ජාතකයෙහි සුවණ්ණහංසරාජයෑ ජාත්‍ය'** නන්තරයෙහි පුරුදු බැම්ණියට තමන්ගේ ශ්‍රී ශරීරයෙන් රන්පත් දී රක්ෂා කරන්නාහුද ධර්මයෙන්ම රක්ෂා කළහ. තව ද **බබ්බු ජාතකයෙහි ගල්වඩු දෙවුයෑ** ගිය ජාතියෙහි **ධනසිටුහට** අඹුයෑ ධනයෙහි සෙනහයෙන් තමාගේ නිධානය ඇලයෙහි **මිහිරෑ** උපන් තැනැත්තිය තිරිසන්වෑ සිටෑ පොවා තමා සතු ධනය තමන්ට දෙන පරිද්දෙන් හා ඈ කළ උපකාරයෙහි ගුණ දැනෑ ඇට සුදුසු ගොවර දීමෙන් හා උපද්‍රව දුරුකිරීමෙන් ඈ රක්ෂා කරණ පරිද්දෙන් ලෝ වැස්සන්ට ප්‍රිය වන්නාහුද කෙලෙහි ගුණ දන්නාහුද ධර්ම බලයෙන්ම මෙසේවූ විශෙෂයකට පැමිණියහ. තව ද **ගොඛ ජාතකයෙහි ගොවෑ** ඉපදී තමන් වහන්සේගේ මාංශයෙහි ලොභ කළාවූ කුට තාපසයා තමන් වහන්සේ මරන්නට කළ වඤ්චා ප්‍රයොගයෙන් ගැලවී ජීවිත රක්ෂා කරන්නාහුද ධර්මයෙන්ම රක්ෂා කළහ.

තව ද **උභතොභණ්ඩ ජාතකයෙහි වෘක්ෂ දෙවතාවෑ** ඉපදී මස් ගන්මිසි දියට බැසලා අඹුන **බිලිවෑද්දී** පුතු හා කැපිවෑ බිලී බාන්නට ගොස් බිලි හෙබට දමා ඒ කණුයෙක්හි 1 වැදී ගත්කල ඇදී බලා තරබව දැනෑ මහමසෙක් වැදගත් වනැයි සිතා "මාගේ අඹුව හා ඉක්බිති ගෙයි ඇත්තන් හා ඩබරක් කොටෑ ගත්කල මස් පිරිවුළු නැති වන්නේයැයි" කියා පුතු යවා අඹුව ඉක්බිති ගෙයි ඇත්තන් හා ඩබර කරන්නට කියවූ කල්හි අඹු නිෂ්කාරණයෙහි ඩබර කොටෑ දඩෑ හුනේ; මේ මනුෂ්‍ය ලොභයෙන් ගොඩ පිළී තබා දියට බැසෑ මසු සොයමිසි කණුයෙහි ඇනෑ ඇස් කණ කොටෑ ගත; ගොඩ තුබූ

1 බැඳගත් කල.

පිළි සොරු ගත්හ. තෙමේ ගොඩට නැඟි නහනවැ පිළි සොයා නොදක්කී ඔහු දැකැ "තාගේ ඇස කණවිය, පිළි වලට ගියේය අඹු දඩැහුන; නෝ අශුනය හෙතුකොටැ ගෙණැ දියෙහි ගොඩෙහි කම්මානතයෙන් පිරිහිනි"සි අවවාද වදුරණසෙයෙක්ද ධර්මයෙන්ම අවවාද දී වදුළ සෙයෙක.

තව ද **කාක ජාතකයෙහි** කවුඩුවැ ඉපද පොවා **බාරාණසි රජ්ජුරුවන්ගේ** සිංහාසනයෙහි ශ්වේතච්ඡත්‍රය සටැ වැඩ හිදැ සර්ව විලාසයෙන් බුණ කියා සියලු සත්ත්වයාට අභය දෙවා වදුරණ සෙයෙක්ද ධර්මයෙන්ම දෙවා වදුළ සෙයෙක. මෙසේ මාගේ සවාමින් අනෙක ජාතියෙහි පුරුදු කොටැ ගෙණැ ආවාවූ ධර්මයම සරණ යෙමි මෙමා සියලු දුකින් ගළවා සියලු සම්පත්තියෙහි යොදා අභිමතා'ඒ සාධා දෙන්නේයැයි **දහම් සරණ යා සුතු.**

තව ද **ගොධ ජාතකයෙහි** ගෝවැ තමන් වහන්සේගේ පුත් **ගොසිඝ** කුමුබොඬ විශ්වාස කොටැ තමන් වහන්සේගේ පරිවාර සියලු ගොසින්ට එළවූ විපත්තිය දැකැ "පාප ජනයන් හා සංසර්ගය කරණ තැනැත්තේ ඉෂ්ටයක් නොලබයි කියා අවවාද වදුරණ සෙයෙක් මතු තමන් වහන්සේ බුදුවැ "සියලු භය උපදී නම් අසත්පුරුෂයා කෙරෙන් උපද්දිසි සත්පුරුෂයා කෙරෙන් නූපද්දී" යනාදීන් වදුරන්නාහුද ධර්මයට බිජුවට වපුළ සෙයෙක. තව ද **සිඟාල ජාතකයෙහි කැණඹිල්වැ** ඉපද තමන් වහන්සේ මරා මස් කමිසි කියා පොල්ල හඟවා ගෙණැ නොමියැ මළවෙස් ගෙණැ අඹු සොහොන්හි මිනි අතු රෙහි හොත්තාවූ සුරාබූතියාගේ වඤ්චා දැනැ තමන් වහන්සේගේ බුඩි ශක්තියෙන් ඔහු අතින් තමන් වහන්සේත් තමන් වහන්සේගේ පරිවාරත් ගළවා ගන්නා සෙයෙක් ධර්මයෙන්ම ගළවා වදුළ සෙයෙක.

තව ද **විරොචන ජාතකයෙහි සිංහරාජවැ** සිංහක්‍රියා කෙරෙමිසිඇත්පිටැ පැනැ වැරදූ හී ඔහු සතරාපයින් ගැහැටි විනාශයට පැමිණී **කැණඹිල්හු** දැකැ තමහට නුසුදුසු ක්‍රියා කරණ සත්ත්වයාට විනාශය නියතයැයි අවවාද වදුරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදුළ සෙයෙක. තව ද, **නඩහුඬ ජාතකයෙහි** සංසාර දෝෂයෙන් මිථ්‍යාදෘෂ්ටි ගෙණැ ගිනි පූජා කරන්නට එක් දවසක් තමන් වහන්සේ ලත් ගොණුන්හු ගිනි පූජා කරණු

පිණීස යැයි බැඳැ සිටුවා ලුණු පිණීස ගමට ගොසින් තමන් වහන්සේ වැඩියදී ආවාවූ වැද්දන් ගොණු මරා ඇට හා නහුට හා තබා මස් කා ගියකල්හි "තමාට තුබූ ගොණු රක්ෂාකොටැ ගත නොහෙන වහැකි දෙවතාවා මා කෙසේ රක්ෂා කෙරේද? එහෙයින් මෙය යහපත් දෘෂ්ටියක් නොවෙයි" සිතා වහැකිදෙව තාවා කරා එළඹැ තෙපි තොපට තුබූනු ගොණු රක්ෂාකොටැ ගත නුහුනුව. සොරු ඔහුගේ මස් කා ගියහ. තුබූයේ මේ නහුට හා ඇටමැය. ලද්දෙක් ලද්දේ නහුඵින් වීනම් කවයි කියා ඒ නහුට හින්නෙහි ලාපියා ඒ මතය හැරැ තාපස ප්‍රව්‍රජ්‍යා වෙන් මහණවැ **පඤ්චාභිඤ්ඤ අෂ්ට සමාපත්ති** උපදවා බ්‍රහ්ම ලොක පරායන වනසෙයෙක්ද අධර්මය දුරුකොටැ ධර්මයම මෙනෙහි කොටැ වදාළ සෙයෙක.

තව ද **රාධ ජාතකයෙහි ගිරාවැ** ඉපදූ බ්‍රාහ්මණියගේ අනාචාරය වැවූ බමුණු පියානන්ට වදුරණ සෙයෙක්ද අධර්මය ක්ෂමාකොටැ ගත නොහී ධර්මයෙහි කළ ලොභයෙන්ම වදාළ සෙයෙක. තව ද, **කාක ජාතකයෙහි සමුද්‍ර දෙවතාවැ** ඉපදූ රහ බී මත්වැ මුහුදු වෙරළහි හිඳැ රැළට හසුවැ මළාවූ **කැව්ඩිය** සොයම්හයි මුහුදු දිය තුඩින් උකා වලඳවම්හයි පටන් ගෙණැ ලුණුදිය කටට වදුත් වදුත් උගුරු වියලී ඇස් රත්වැ ගිය කල්හි මේ අසකාය'නුශ්‍රාණ කරන්නාවූ කාකයන් නොමියන තුරු මෙතැනින් නෙරපුව මැනවැයි සිතා භයඞ්කරවූ රූපයක් දක්වා ඔවුන් ලුහුබඳවා ප්‍රාණ දුනය දෙන සෙයෙක්ද ධර්මයෙන්ම දුන් සෙයෙක තව ද **සුපඵරහන ජාතකයෙහි ආකාශස්ථ දෙවතාවැ** උත්සවයෙහි අඹුවට පිළී පොරවන පිණීස සොරා වනුක් මල් කඩම්හි උයනට වැදූ අසුවැ ජීව ශූලයෙහි හිඳැ කවුඩුවක්හු අවුත් හිසැ හිඳැ ඇස් සාරා කන කල්හි "මේ දුකට වඩා මාගේ ප්‍රිය තැනැත්තිය වනුක් මලින් පෙවූ රතක් එකාංශ කොටැ බහාලා මා ගෙලෙහි එක් අතක් තබා මේ උත්සව නොකෙළිනාබව මට ඉතා දුකැ"යි හඬන්නාවූ කාම වසඟවූ පුරුෂයා දැකැ පඤ්ච කාමයෙහි ආදීනව වදුරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක.

තව ද **සිගාල ජාතකයෙහි කැණඹිල්වැ** ඇත් මිනිය ඇතු ළට වැදූ වන් මඟ හැසිරී ගියකල්හි සත්දවසක් මුළුල්ලෙහි මහදුක් ගෙණැ අනාහයෙහි මහවැස්සක් වැසැ චම්ම සිවිල කොටැ පී කල්හි විදහී ගත්තාවූ සිදුරෙන් නික්මෙන කල්හිම

ඇඟ සියලු රෝමයෝ රැුරා ගෙණැ පිටත්වැ මෙතෙක් දුක් මට වූයේ රස තෘෂ්ණා යෙනැයි කාමයෙහි ආදීනව. වදුරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදුළ සෙයෙක. තව ද, **එකපණ්ණ ජාතක** යෙහි **තාපස්වියැ** දුෂ්ටවූ රාජකුමාරයාට කොසඹ පැලය දෑෂ්ටා නත කොටැ "කුමාරය, එක් පෙනි අවස්ථායෙහි මෙසේ තිකතවූ කොසඹ පැලය වැඩි ගත් නම් කෙසේ තිත්ත නොවේදෝහෝයි කියා උදුරා පියා අතින් මැඩැ දැමී. නෝද බාලාවස්ථායෙහි චණ්ඩයෙහි. එසේම චණ්ඩවූ නාද රටවැස්සෝ "කුමාර බාලකල්හි මෙසේ චණ්ඩවූයේ මතු රාජ්‍යයට පැමිණි අවස්ථායෙහි කෙසේනම් චණ්ඩ නොවේ දෝහෝ"යි සිතා මූලෝ'චිත්තා කරන්නාහ. එහෙයින් චණ්ඩනොව"යි කියා අවවාද දී ඔහුගේ ඒ ඵරුෂත්වය හරවන සෙයෙක්ද ධර්මයෙන්ම හැරවූ සෙයෙක.

තව ද, **සඤ්ජීව ජාතකයෙහි දිසාපාමොක් ආචාර්යවැ** මළ ව්‍යාඝ්‍රයා උපදවා ඔහු අතම නට මාණවකයාගේ ප්‍රවෘත්ති අසා **"අඝාත්තුරූපයන්ම අනුග්‍රහ කලෝ ඔවුන් අතම නසිති"** යි අවවාද වදුරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදුළ සෙයෙක.

තව ද, **රාජෝවාද ජාතකයෙහි බරණැස්රජවැ** තමන් වහන්සේගේ අගුණ කියන කෙණෙක් ඇද්දෝ හෝයි කියා පරීක්ෂා කරණ පිණිස රථයකට නැඟි පසල් දනව්වෙහි ඇවිදින සෙයෙක. එසමයෙහි කොසොල් දනව්වෙහි **රජද** එසේම රථයකට නැඟි අවුත් එතැනවම සම්භව්‍ය. "අපට මහදී නෙපි ඇලවව! නෙපි ඇලවව"යි කියා "ජාති සම්පන්නි ආදිවූ සියලු ගුණ සමවූව කාට කවුරු ඇලවමෝද්ද"යි සිතල්හි ගුණයෙන් වැඩි කෙණෙකුන්ට ඇලවම්හයි කියා තමන් වහන්සේගේ සාරථිහු කොශල රජහුගේ සාරථිහට නාගේ රජහුගේ ගුණ කියයි කී කල්හි:-

ඒ සාරථිහු විසින් "මාගේ රජ්ජුරුවෝ දැඩියන්ට දැඩි කම්ම කෙරෙති. මොළොකුන්ට මොළොක්වම පවතිති. 1 සත්පුරුෂයන් සත්පුරුෂකම්ම්ම දෙනෙති. 2 අසත්පුරුෂයන් අසත්පුරුෂකම්ම්ම දෙනෙති. එසින් මුන්ගේ ගුණ වැඩිය. නෙපි මගින් ඇලවව"යි කී කල්හි තමන් වහන්සේගේ රථාචාරිහු සිපියා "කොල, නාගේ රජ්ජුරුවන්ට මාගේ රජ්ජුරුවන්

1 සත්පුරුෂයන්ට. 2 අසත්පුරුෂයන්ට.

වහන්සේගේ ගුණ කියම් නා කීසේ සතර අපායෙහි උපතනියට කාරණයවූ අවගුණය හළ මාගේ සැමියන්ගේ ගුණ අස"සි කියා ඔහු "කියා බලව"සි කීකල්හි "මාගේ සැමියා තමන් කෙරෙහි ක්‍රොධ කළ එකක්හුගේ ක්‍රොධා'ගතිය මෛත්‍රී නැමැති ජලයෙන් නිවන සෙයෙක. අසත්පුරුෂයා සත්පුරුෂ කම්න්ම දනන සෙයෙක. කිසිවක් නොදෙන්නාවූ තද මසුරු තැනැත්තහුගේ මසුරුකම් දැනයෙන් දනන සෙයෙක. බොරු කියන තැනැත්තහුට සබා කියාම දනන සෙයෙක්. එසේහෙයින් මෙබදු ගුණ ඇති සැමියන්ට මහ දෙව"සි කීකල්හි:-

එබස් ඇසූ **කොසොල් රජහු** හා **සාරථිහු** මේ **මහා පුරුෂයාගේ** ගුණ සියලු සත්ත්වයාට මවුපියවැ සිටියාවූ බුඛත්වයට ධුර පැමිණි සිටි මහනක්හුගේ ගුණමුත් සාධාරණ රජක්හුගේ ගුණ නොවෙයි. මේ හිමියාගේ ගුණනියාව මහ දෙන්නා තබා දිවිදෙත් සුදුසුයැයි මගින් ඇලවැ සිටිකල්හි රථයෙහිම වැඩැහිදැ ඒ රජහට බුඛවිලාසයෙන් **දශරාජ ධර්ම** වදාරා ඒ රජහුද තමන් වහන්සේගේ ධර්මයෙහි පිහිටුවා නුවරට වැඩැදුනාදි කුසල් කොටැ බොධිසම්භාර ධර්මයන් මුහුකුරුවන සෙයෙක් ධර්මයටම පිවිවහල්වූ සෙයෙක. මෙසේ මාගේ සැමියන් විසින් අනන්ත ජාතියෙහි පරිහරණ කොටැ ආවාවූ ධර්මය සරණ යෙම්සි **දහම් සරණ සාසුතු.**

තව ද **සිඟාල** ජාතකයෙහි සිංහවැ ඉපදැ **කැණහිල්හු** මරණුවස් පැනැ සබැ කෙණෙකු දැවාන භක්තියෙහි හැසී ලය පැලී මළකල්හි තුමූ සිංහ නාදයෙන් ඇතුලෙහි හොත් කැණහිල්හු ල පලන්නාවූ මතු තමන්ගේ ධර්මය සිංහ නාදයෙන් විනෙයජනයා සිත්හි පවත්නාවූ කෙලෙසුන් පැලීමට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද **සූකර** ජාතකයෙහි සිංහරාජවැ සිටැ අසූචියෙහි වැකුණු භූරාට දුරුවන්නාවූ මතු බුදුවැ කෙලෙසුන් දුරුවන බවට පූර්ව නිමිත්ත දක්වූහ.

තව ද **උරග ජාතකයෙහි නාපස** තෙ නිත්‍ය වෛරීවූ **ගරුඩයා** හා **නාගි** හා දෙදෙනා තමන්ගේ අවවාදයෙන් මිත්‍රකරන්නාහුද මතු තමන් බුදුවූ මහුලෙහි සියලු **කවුඩෝය බකමූණෝය සිංහයෝය ඇන්තුය අස්ත්‍රුය මිගිමුය මියෝය බලල්ලුය නකියා මොණරුය** යනාදිවූ නිත්‍ය වෛරී සත්ත්වයන්ගේ

වෙර සන්හිඳුවීමට පූර්වනිමිත්ත දක්වූහ. තව ද **ගඟහඟින ඣයෙහි** සිටුපුත්වැ නිවිස්සනට ආ නෝ වැඩුවන් හා ආ වැඩුවන්ට පෙරළා ආ නොවැඩුවන් හා කන්නාවූ **යක්ෂයා**ගේ සැබෑප දැනැ නිවිස් පූ පියානන් වහන්සේට ආ වඩා යක්ෂයා අතින් තමන් වහන්සේ ගැලවී තමන් වහන්සේගේ උපදෙශයෙන්ම පියානන් වහන්සේ ලවා තමන් වහන්සේටත් ආ වඩවා ඔහුනුදු යක්ෂයා අතින් ගලවා යක්ෂයාද තමන් වහන්සේගේ උපදෙශ යෙන්ම දමා පන්සිල් ගන්වා ඒ යක්ෂයා විසින් සියලු සතුබයාට වන උපද්‍රව වළකා ලොක ශාන්තිකරණ සෙයෙක්ද ධර්මයෙන්ම කොටැ වදාළ සෙයක.

තව ද **අලින චිනන ජාතකයෙහි** කිරි බොන **කුමාරවැ** පියානන් මළකල්හි සතුරු රජහු රාජ්‍යය සිසාරා ගත් කල්හි ඒ අවසථායෙහි ඇත්පිටැ නැඟී සතුරු රජහු ලුහුබදවා රාජ්‍යයට පැමිණෙන්නාහුද දැන් වජ්‍රා'සනාරූඪවැ මාර සෙනාව ලුහුබද වා ධර්ම රාජ්‍යය ගන්නා බවට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද **ගුණ ජාතකයෙහි සිංහරාජවැ** මඩෙහි එරී ගිය තමන් නැඟ **කැණගිල්හු** හා ඔහුගේ අඹුදරුවන් හා තමන්ගේ කාඤ්චන ගුහායෙහි ලා රක්ෂාකොටැ මිත්‍රධර්මයෙහි කුළුගන්නාහුද ධර්ම යෙහිම කුළුගත්හ. තව ද **සුහනූ ජාතකයෙහි පණ්ඩිත අමා ත්‍යවැ** කුළු අසුට කුළු අසු හරවා අස් වෙළඳුන්ට ධන ලාභය කට කාරණවූවාහුද ධර්මයටම කාරණවූහ.

තව ද **මොර ජාතකයෙහි මයූරවැ** බුදුවැ දෙසූ කල්හි කෙළි ලක්ෂයක් සක්වළෙහි ආශ්‍ර පවත්නා පමණ **මොර පිරින්** පිරි වහන්නාහුද ධර්මයටම කාරණ වූහ. 1 තව ද **විනිලජාත කයෙහි 'විදෙහ රජ'වැ** රථයෙන් නගර ප්‍රදක්ෂිණ කෙරෙමින් **හංසයන්** දෙන්නකු ඩැහැගත් දඩැ මැදූ හුන් **කාඤයා** "මේ රජ්ජුරුවන් අස්හු අදිනි; මා හංසයෝ අදිනි; අප දෙදෙනා ගේ කවර වෙනසෙක් දැ"යි සිතූ ක්ෂණයෙහිම විනාශයට පැමිණෙන පරිද්දෙන්ම ආනුභාව ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ.

මෙසේ මාගේ සැමීන් විසින් අනන්ත ජාතියෙහි සාතම කොටැ පුදූ පිරිමසා පරිහරණ කොටැ ආවාවූ ධර්ම රත්නයම මට සියලු දුක් නොවැද්ද දෙන **වජ්‍රඤවචයෙඤ**; සියලු සම්පත්හි සාධා දෙන **ඤලප වෘක්ෂයෙඤ**; එහෙයින් ඒ මේ සරණ යෙම් **දහම් සරණ යායුතු.**

---

1 පිරුළ.

තව ද **ඉඤ්ඤමාන** නොනත **ජාතකයෙහි** බ්‍රාහ්මණ පුත්‍රවැ තමන්ගේ අවවාද නොකොටැ ඇතු අතැ මළාවූ තපස්විහු දැකැ "විශ්වාස නොකට යුතුවූ අසත්පුරුෂයන් හා විශ්වාස කළ කල්හි කාලා'නන්තර යෙනුදු සතක්‍රියාට අනර්ථම වන්නේය; එහෙයින් සිලයෙන් ප්‍රඥාවෙන් බහුශ්‍රැතතායෙන් සමවූ හෝ වැඩිසිටියාවූ හෝ සත්පුරුෂයන්හාම සමාගම කළ මැනවැ"යි අවවාද වදාරන්නාහුද ඛම්යෙන්ම වදාළහ. තව ද **සනඨව** ජාතකයෙහි බ්‍රාහ්මණවැ වහනි පූජා කොටැ එම වහනින් තමන්ගේ පණ්ශාලාව දැ කල්හි "තමාට සන්නාපිණය කළාවූ මාගේ දුකින් කළාවූ පණ්ශාලාව දැවූ අකෘතඥවූ වහනියට පූජා වෙන් ප්‍රයොජන නැතැ"යි තමන් පුදන ගිනි ගසා නිවා පියා පන්සලට වැද තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවන්නාහුද ඛම්යෙන්ම ඉපදවූහ.

තව ද **සුසිම ජාතකයෙහි හඤ්ඤිමඩ්ඩල පුරෙහිත** බ්‍රාහ්මණයාට **පුත්වැ** ඉපදූ සොළොස් හැවිරිදි අවස්ථායෙහි පියානන් මළකල්හි ඇත් මඟුල් දවස ආසන්නවැ සිටිකලැ ඇත් මඟුල් කරණ පුරෙහිතයා "නැත ඇපි මඟුල් කොටැ ඛන ගණුම් හ"යි බ්‍රාහ්මණයන් ඛන ගන්නට සැරහී සිටිකල්හි තමන් වහන්සේගේ මැණියන් වහන්සේ "සත්වන පරම් පරුයෙහි පටන් අපටම නිබී ආ ඇත්මඟුල් දැන් අන්හු 1 කරන්ට වන්හ. අපගේ වංශය පිරිහෙන වනැ"යි හඬා හුන් කල්හි "අම්ම, කුමක් පිණිස හඬන සෙයෙක්දැ"යි විචාරා එපවත් අසා "මම ඇත් මඟුල්, කෙරෙමි යි නො හැඬුව මැනවැ"යි කියා මැණියන් වහන්සේ "තොප **වෙදත්‍රුෂය** නොදනුත් '**හඤ්ඤිසූත්‍ර**' නොදනුත් කෙසේ මඟුල් කරවිදැ"යි කීකල්හි :-

ඇත් මඟුල් කී දවසකින්දැ යි විචාරා මෙතැනට සතර දවස කිනැයි කීකල්හි නුඹවහන්සේ වදාළ **තුන්වේදය** හා **හඤ්ඤිසූත්‍රය** දන්නෝ කොයි වෙසෙත්දැයි විචාරා මෙතැනට එක්සිය විසි යොදනෙක්හි **කක්ඝලා නුවර** වෙසෙනියි වදාළ කල්හි "අම්ම, ශොක නොකළ මැනවැ; මේ සතර දවස මට සතර පැයක් හා සමය; මේ එක්සිය විසි යොදන මට එක්සිය විසි පියවරක් හා සමය; සෙට එක දවසින් ඔබ ගොසින් රෑ නිස් පැයින්ම **තුන්වේදය** හා **හඤ්ඤිසූත්‍ර** ඉගෙණැ තුන්වෙනිදා මුඹ අවුත් සතර

---

1 කරන්නහ.

වෙනි දා ඇත් මඟුල් කොටැ නුඹ වහන්සේගේ ශොක පසිඳුම්සි වදුරා දෙවෙනි දවස් මැණියන් වහන්සේ වැඳැ පැදකුණුකොටැ "මාවැනි පුතුන් ඇතිකල්හි ශොක නොකළ මැනවැ"යි සමු ගෙණැ:-

නිස් පැසින් එක්සිය විසි යොදන ගෙවා ගොස් ආචාර්‍ය්‍යයන් දකැ එපවත් කියා මසු දහසක් ඉදිරියෙහි තබා ලා අද එක රැයට මට අවකාශ දෙවයි කියා ඉල්වා ගෙණැ දෙතිස් අකුරක් ගණන් ඇති එකා සතරපද **ශ්ලෝකක්** උගන්නා සේ ලක්‍ෂගණන් ග්‍රන්ථ ඇති **තුන්වේදය** හා **හසතිසුත්‍ර** සොළොස් දහසක් ඉගෙණැ අලුයම් නො විදහනතුරු ආචාර්‍ය්‍යයන් දන්නා දෙය නිමවා උන්මුවෙන් නො බැණැ හුන්කල්හි "දන්නා දෑ තවත් ඇත්ද? මෙතෙක්මද"යි විචාරා "පුතනුවෙනි, මා දන්නේ මෙතෙක්මයැ"යි කීකල්හි එසේ වුවහොත් නුඹ මා ඉගැන්වූ තැන්හි "මෙතෙක් පදවැටී හිනා. මෙතෙක් තැන් හදුරා වරදවා පියනලද. මෙතැන් පටන් ගෙණැ ශිෂ්‍යයන් මෙසේ ඉගැන්වුව මැනවැ"යි කියා ගුරුන්ටත් වැරැදි තැන් වදුරා අනික් දවස් බරණැසම අවුත් මැනියන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳලා නමන්ද උගත් ශාස්ත්‍රය කියාලා ශොක නොකළ මැනැවැයි කියා අත්ලේවා දවස් සියලු නුවර ඇත් මඟුල් සරා රජ්ජුරුවන් සිංහාසනාරූඪවැ හුන් තැනට ගොස් දුන් බුදුවූ දවස් නිඬ්කයන් තමන් මඬ්‍යයෙන් බැණ ගත නොහෙන්නාසේම **හසති මඞ්ගල** කරන්නට ආවාවූ බ්‍රාහ්මණයන් තමන් මඬ්‍යයෙහි එකබසක් සොල්වා ලිය නොදී සියලු ශාස්ත්‍රය 1 පිරිවහා පියා තමන්ගේ අසමසිත සිංහනාද යෙන් ඔවුන් ලුහු බදවා පියා සරාජික පණ්ඩිත් විසමයට පමුණුවා ඇත් මඟුල් කොටැ බොහෝ ධන ලදින් ශොකා'තුරවූ මැනියන් වහන්සේගේ ඇසැ සෝක කඳුළු පෙරළා සතුටු **කඳුළු** කොටැ ඔවුන් රක්‍ෂා කරන්නාහුද ධර්‍මයෙන් ම රක්‍ෂා කළහ.

තව ද **ගිජ්ඣකූට ජානකයෙහි ගිජ්ඣලිඛිණ්වෑ** ඉපිදූ මවුපියන් රක්‍ෂා කරන්නෝද ධර්‍මයෙන් ම රක්‍ෂා කළහ. තව ද **නකුල ජානකයෙහි නකුලස්ත්‍රීවූ** ඔවුනොවුන් හා නිත්‍ය වෛරීවූ **මුගවියා** හා **සර්පියා** හා දෙදෙනා දුන් තමන් වහන්සේගේ සස් නෙහි පැවිදි **සැරියුන්** **මුගලන්** දෙදෙනා වහන්සේ ඔවුනො

1 පිරිවරපිරිසා.

වුන් කෙරෙහි මෛත්‍රී කරුණ පරිද්දෙන් අවවාද කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක. තව ද **උපසාළහක ජාතකයෙහි තාපසයා** අනුන් නොදුවු බිමෙක තමා දවන්නට යැයි කියා කියා ගල් පළිතාදිය සොයා **ගිජ්ඣකූට** පර්වත මස්තකයෙහි තමා දවන්නට සොහොන් බිම් පා එන බමුණා කැදවා එපවත් අසා බමුණා ඔබ කැදවාගෙණැ ගොස් එතැන බලා මේ අනුන් නොදුවු තැනැයි නා පියානෝ තට කිව්දැයි කියා එසේයැයි දැන්වූ කල්හි සී පියා "මෙතැන්හි සෙසු සතුන්යා දුවුගණන් තබා පියා මෙම **උපසාළහක** නම් කල්හි මෙතැන්හිම දුවුයේ නුදුස් දහසක් වාරයෙක; එහෙයින් ලොකයෙහි අනුන් නොදුවු බිමෙක් නැතැ"යි බණ වදාරණ සෙයෙක්ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

තව ද **සම්බි ජාතකයෙහි නපස්විවැ** තමන්ගේ රූපා'ග්‍ර ප්‍රාප්තවූ ආත්මභාවයෙහි ලොභකළාවූ දෙවතා දුවගේ බස් අසා ද දැන් මාරස්ත්‍රීන්ගේ බස් අසා ලොභ නොකළ පරිද්දෙන්ම ඈ කෙරෙහි ලොභ නොකොටැ බ්‍රහ්මචර්‍යාව රක්‍ෂා කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන් ම වදාළ සෙයෙක. තවද **සකුණගහි ජාතකයෙහි වවුවැ** ඉපදී **උස්සාව** හඳුවැ සියලු සත්ත්වයන් තමන්ගේ විෂයෙහි මුත් අනුන්ගේ විෂයෙහි හැසිරෙණ බව විනාශ කාරණයැයි කියා සියලු ලොවට අවවාද දෙන්නාහුද ධර්මයෙහි ම හැසුරුණහ. තව ද **අරඤ්ඤ ජාතකයෙහි මහරුසිවැ** සත්හවුරුද්දක් මෛත්‍රී භාවනා කොටැ ඒ කල මෛත්‍රියෙහි අනුසසින් සංවට්ට විවට්ට කල්‍ප සතක්ම බ්‍රහ්ම ලොකයෙහි වසන සෙයෙක්ද ධර්මයෙන්ම විස්තරයෙක. තව ද **උමංගසෙහි ආකාණවක ජාතකයෙහි මහෞෂධ පණ්ඩිතවැ** නිරිසන්වූ ඝණ්ඨබෝධීගේ අභිප්‍රාය බුඩඝූනයෙන් දන්නා සේ දැනැ වදාරණ සෙයෙක්ද තමන් වහන්සේගේ ඥාන ධර්මයෙන්ම දැනැ වදාළ සෙයෙක.

මෙසේ අනෙක ජාතියෙහි මාගේ සැමියන්ගේ සිත හා ප්‍රිය මිත්‍රකම් ගත්තාක් වැනිවූ ධර්මරත්නය සරණයෙමියි **දහම් සරණ යායුතු.**

තව ද **කල්‍යාණධර්ම ජාතකයෙහි 'මහා බන සිවු'වැ** රජ ගෙට ගොස් එනවිට තමන් වහන්සේ මහණවූවයි යන බසක් ගෙයි කියා කොලහල කරන්නා අසා උපන්නාවූ කිත්තිනි

ශබ්දය නොනැසුව මැනැවැයි සිතා ඒසා මහත් ධන සමෘඩියක් හැරැ මහණවන සෙයෙක්ද ධර්මයෙහි ලොහයෙන්ම මහණවූ සෙයෙක. තව **ද දදර ජාතකයෙහි සිංහරාජවෑ** තමන් වහන්සේ වදාළ අවවාද නොගිවිසෑ සිංහනාද කෙරෙමිසි හඬ හැඬූ කැණහිල් පැටහුගේ අවිනිතකමට වණීනා කොටැ අවවාද වදාරණ සෙයෙක්ද ධර්මයෙන් ම වදාළ සෙයෙක.

තව ද **මඝදේව ජාතකයෙහි තාපසවෑ තපස්වී** වෙශය ගත්තාවූ **වානරයා**ගේ වෘත්තාන්ත දන්නා සෙයෙක්ද දැන් ධර්මාචාර්ය රූපයෙන් සිටියාවූ නීලකයන්ගේ අධර්මයෙහි සැබෑරූපය දන්නට පූර්ව නිමිත්ත සාධන්නාහුද තමන් බුදුවූ කල්හි සංසාරයට පස්සා බස්නා විනෙය බන්ධූන් ලවා කෙලෙශයන් මඩවා නිර්වාණය හස්තප්‍රාප්ත කරණ බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව **ද දුතිය මඝදේව ජාතකයෙහි තාපසවෑ** තමන් වහන්සේ හිසැ වර්චස් හෙළන්නාවූ **වඳුරා**ගේ කෙළෙහි ගුණ දැනුම් නොවිචාරා ධර්මයෙහි සිටැ පැන්දි වදාරණ සෙයෙක්ද ධර්මයෙන් ම දෙවා වදාරණ සෙයෙක. තව **ද ආදිච්චුපට්ඨාන ජාතකයෙහි තපස්වීවෑ** හිරුට උපස්ථාන කරන්නාසේ කොහොන්කම් හඟවා සිටි **වානරයාට** ප්‍රශංසා කරන්නාවූ මනුෂ්‍යයන් දැකැ "මේ ආචාර සම්පන්න නොවෙයි; 1 අඟනි හොත්‍ර දූෂකයෙකැ; කමණ්ඩලු හෙද කළාවූ දුශ්ශීලයෙකැ"යි ඔහුගේ කොහොන්කම් ප්‍රකාශ කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක.

තව ද **කළාණමුඛී ජාතකයෙහි අමාත්‍යවෑ** සිටැ අකාලයෙහි යුද්ධයට යන්නාවූ රජ්ජුරුවන්ට අවවාද කියා අකාලයෙහි කරන්නාවූ යුද්ධයට ගමන් වළකා බත් දුන් රජ්ජුරුවන්ට අනුග්‍රහ කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම අනුග්‍රහ කොටැ වදාළ සෙයෙක. තව ද **නිඤ්ඤ ජාතකයෙහි වානරෙන්ද්‍රවෑ** අසූදහසක් වානරයන් මරණ භයින් මුත් සමයෙහි ඔවුන් අස්වසා පසුවැවූ තමන් වහන්සේගේ බෑනනුවන් ලවා සියලු වානරයන්ට ජීවිතදානය දෙවන සෙයෙක්ද ධර්මයෙන්ම දෙවූ සෙයෙක. තව ද **කච්ඡප ජාතකයෙහි කූමභකාරවෑ** සිටැ මා මුත් නැනයැයි කියා භූමියෙහි ආලය නොහැරැ තමන් වහන්සේගේ මුදුල්ලෙහි පහරින් මළාවූ කැස්බෑ පැ "යම්මක් උපදුව සහිතවූ ස්ථානය පුරුදුයැයි කියා නොහරිනම් ඒ මෙසේ විනාසයට පැමිණෙයි" කියා අවවාද දී වදාරණ සෙයක්ද ධර්මයෙන්ම දී වදාළ සෙයෙක.

---

1 අඟනිහොත්‍ර දූෂකයෙකි.

තව ද **සතධම්ම ජාතකයෙහි** චණ්ඩාලවැ තමන් වහන් සේගේ ඉදුල් කා මළාවූ කුලීනයාගේ වෘත්තා'න්ත ඉපැදුවී මෙන් මතු බුදුවැ මා චණ්ඩාලවූ ජාතියෙහි මා ඉදුල් කෑ නැ නැත්තවුට සුවයක් නොවූවා සේ මාගේ ශාසනයෙහි මහණවූ කුල පුත්‍රයා නුසුදුසු පරිද්දෙන් ආහාර උපදවා අනුභව කරන් සුවයෙක් නැතැයි කියා කරන්නාවූ ධර්ම දෙශනාවට උල් උන්වා වදාළ සෙයෙක. තව ද, **දුද්දදජාතකයෙහි තාපසවැ** පරිවාර තාපසයන් හා කැවිවැ බරණැසට වැඩැ තමන් වහන් සේට දන් දුන්නාවූ උපාසකවරුන්ට 1 "මනා දානයෙහිදු චිත්ත ප්‍රසාදය මහත් කල්හි මහා ඵලවෙයි" කියා අවවාද වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක. මෙසේ මාගේ සව්ාමීන් විසින් අනන්ත ජාතියෙහි අභ්‍යාස කරණ ලද්දාවූ ධර්ම සරණයයි කියා **දහම් සරණ** යායුතු.

තව ද **අසදිස ජාතකයෙහි බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන්ට පුත්වැ **අසදිස කුමාර**වැ සුවාසූ දහසක් යොදුන් **නව්තිසා භවනය** දක්වා නැගෙන පරිද්දෙන් විදින ශරය සතර රියනක් පමණ් නැනට විදින්නක්හු සේ විදිනට සමර්ථවැ ඒ ශක්තිය දක්වා සියලු ජම්බුද්වීපයෙහි ප්‍රසිද්ධවැ මලනුවන්ගේ රාජ්‍යය සිසාරා ගත්තාවූ රජ්ජුරුවන් සත්දෙනා බත්කන තලියෙහි තමන් ගේ නම් ලී සර හෙළා ඔවුන් ලුහු බඳවා මලනුවන්ට රාජ්‍යය සවිසර් කොටැ නබා තුමූ සියලු පඤ්චකාමයෙහි අපෙක්ෂාවක් නැතිවැ මහණ වන්නාහුද ධර්මය පිණිසම මහණවූහ. තව ද, **සඞ්ඛාමාවචර ජාතකයෙහි හත්ථාචාරිවැ** ඇතු නැඟි ශුද්ධ මධ්‍යයට වැදූ යන්ත්‍ර පාෂාණාදීන් පහර කා ලොහොදියෙන් දූ පසුබස්නා ඇත්හට තමන් වදාළ එකවචන මාත්‍රයකින් උත්සාහ වඩවා සියලු දුගීය එක ඇත්හු ලවා බිඳුවා රාජ්‍යය සාධන්නාහුද තමන් බුදුවූ කල්හි සංසාරයට පසු බස්නා විනෙය බන්ධුන් ලවා කෙලෙශයන් මඩවා නිර්වාණය හස්තප්‍රාප්ත කරණ බවට පූර්වනිමිත්ත දැක්වූහ.

තව ද, **වාලොදක ජාතකයෙහි අමාත්‍යවැ** අග්‍ර රස පානය කොටැ නොමත්වූ **සෙනඞ්ගව**යන් හා හීනවූ කසට රස ඛී මත්වූ **ගද්‍රභයන්** හා දැකැ හීනයන් 2 මනා දෙයකින් මත්වන බව දක්වන්නාහුද ධර්මයෙන්ම දැන්වූහ. තව ද **ගිරි දත්ත ජාතකයෙහි රාජාමාත්‍යවැ** කොරුගේ ගමන් ඉගෙණැ

1 මද දානයෙහිදු. 2 මද දෙයකින්.

කොරවැ ඇත්නාවූ නො කොර අයුවුන්ගේ අභිප්‍රාය දැකැ අනිත් සහපත්වූ ගමන් ඇති පුරුෂයන්හු ඉදිරියෙහි ලා ඔහුගේ ගමන් උතුන්වා කොර හරවන්නාහුද ධර්මයෙන්ම හැරිවූහ. තව ද, **අනගි රන ජාතකයෙහි ආචාර්‍යවැ** ගිහිගෙයි කම්කටු ලෙන් මනුෂ්‍ය පිරිවහා ගත නොහෙන්නාවූ ශිෂ්‍යයා දැකැ සිත "වියවුල් කල්හි 1 අර්ථය නොවැට හෙන්නේයැයි" කියා වදුරන්නාහුද මුතු තමන් බුදුවැ **"සමාගිනෝ සඵාහුනං පත්‍ථනාති"**යි වදුරන්නාවූ ධර්මයටම බිජුවට දැක්වූහ.

තව ද **දධිවාහන ජාතකයෙහි අමාත්‍යවැ** කොසඹ ගස හා එක්වූ අඹගස විරසවූවා දැකැ අසත්පුරුෂ සමාගමයන් සත්පුරුෂයාහට විනාශය දක්වන්නාහුද ධර්මයෙන්ම දැක්වූහ. තව ද **චතුම්මට ජාතකයෙහි හංසපොතකයන්** දෙදෙනා ඔවු නොවුන් හා මනුෂ්‍රණය කරණ තැනට වැදී බණින්නාවූ **කැණහිල්ලු** දැකැ **වෘක්ෂදේවතාවැ** සිටැ මේ උත්තම ජාතිවූ **හංසරාජයන්** දෙදෙනා සිටි තැනට තාසේවූ හීන ජාතීන් වදනට කාරණ කිමිදැයි ගහා කරන්නාහුද දැන් බුදුවැ අකුශල ධර්මයන් කුශල ධර්මයන් හා එක්වීමට කරණ ගහාවම දැක්වූහ. තව ද **සිහසොඞ්ඩ ජාතකයෙහි සිංහරාජවැ**, සිහ හඬ හඬමිදී කැණහිල් හඬ හඬා තමාගේ සැබෑ ප්‍රකාශ කරන්නාවූ කැණහිල් පැටව් දැකැ ඔහට අවවාද කියා ඔහු මතු නොබණින පරිද්දෙන් හික්ම වන්නාහුද දැන් බුදුවැ ධර්මය කියා අධර්මය හඬ වන්නාහුද නිර්‍ඝකයන් හික්මවා නිශ්ශබ්ද කරණ බවට පුළු නිමිත්ත දැක්වූහ.

තව ද **සිහචම්ම ජාතකයෙහි ගොව්වැ** කෑම් කම්නැත්ත කොටැ ජීවත් වෙමින් සිංහ චර්ම පෙරවැ ඇවිත් නා **ගද්‍රභයා** බොහෝදෙනාට සිංහයන්හු සේ වැටහී භය උපදවා තමා මරන්නට සිසාරාගත්තාවූ මිනිස්සුන් මැදැ ගද්‍රභ ශබ්ද පවත්වා තමා සිංහ නොවන බව හඟවා විනාශයට පැමිණී කොටළුවා දැකැ මේ ගද්‍රභයා තමාගේ ශබ්දයෙන්ම විනාශයට පැමිණ්නේයේයයි ධර්මදේශනා කරන්නාහුද ධර්මයෙන් පිටත් නොවූ කථාම කළහ. තව ද, **සීලානිසංස ජාතකයෙහි සමුද්‍රදේවතාවැ** ඔහුද වැදූ නැව් 2 බිඳී **නොසරණ** සිහිකළ මාත්‍රයෙකින්ම මහානාග රාජයන්හු **නැව් වෙස්** ගන්වා තුමූ **නිසමුවෙස්** ගෙණැ නැව සත්

---

1 කම්හි. 2 මැද.

රුවනින් පුරා ඒ උපාසකයා නහා පස්සෙහි යන කරනැවැම් යාගේ ගුණයක් නැතිහෙයින් නැවට නොනහා එතර කොටැ දෙදෙනාගේ ගෙහි ධන පුරා තමා ගුණයක් නැති කරනැවැ ගියා පොවා සත්පුරුෂ සමාගමයෙන් ගැලවුනු පරිදි බණ වදාළ සෙයෙක.

මෙසේ මේ ජාතකයෙහි මූහුදු මැද නැවු බුන්නන් පොවා **"බුන්සරණ යෙමි" "දහම් සරණ යෙමි" "සඟ සරණ යෙමි"**යි කී බැවින් නාගරාජයන් සත්රුවන් නැවිවෙස් ගෙණැ සමුද්‍ර දෙවතාවන් නියමුවෙස් ගෙණැ **තෙසරණ** ගතුවන් ඒ නැවට නහා උන් ගත් තෙසරණයෙහි අනුමෝදන් වූවනුදු ඒ නැවට නහා එතර කොටැ උන්ගේ ගෙයි සත්රුවන් පුරා ගියබවම "රත්නත්‍රයය සරණ ගියවුන්ට සියලු දුක් දුරුවෙයි" කියා **මා කියන්නාවූ තෙසරණ ගුණයටම දෙන.** එහෙයින් මාගේ සැමියන් විසින් මෙසේ අනන්ත ජාතියෙහි පරිහරණය කරණ ලද්දාවූ ධර්මය සරණ යෙමියි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යායුතු.**

තව ද **රුහක ජාතකයෙහි බාරාණසි රජවැ** අඹුවගේ බසින් අස් සැඳැ ලා ගෙණැ අස්බෙර හස්වා ගෙණැ අස් ගම නින් රජගෙට ආ පුරොහිතයා දැකැ ගැණුන්ගේ ආදීනව වදාරන්නෝද ධර්මයෙන්ම වදාළහ. තව ද **සිරි කාලකණ්ණි ජාතකයෙහි** ශ්‍රී කාන්තාව හා කාලකණ්ණියා හා දෙන එක් නොවන බව වදාරන්නාහුද ධර්මයෙන්ම වදාළහ. තව ද **චුල්ල පදුම ජාතකයෙහි පදුම කුමාරවැ** උරෙන් ලෙහෙ පෙවූ ගැහැණිය කොටෙක් කෙරෙහි කළ සෙනහයෙන් තමන් උස් ගලින් හෙළා කල්හි තමන්ගේ භාග්‍ය බලයෙන් හා පූර්ව සෙනහ බලයෙන් **ඉරාවැ** උපන්නාවූ **ආනන්ද** නම් මහතෙරුන් වහන්සේ පිට හෙළවා ගෙණැ දිවි දුන් කල්හි ගොසින් රජය ලදින් ඇතු නැඟි දන් දෙන්නට වඩනා තැනට **කොටු** පැසින් උසුළා ගෙණැ අවුත් තමන් වහන්සේ නො හැඳිනැ සිටියාවූ කෙලෙහි ගුණ නොදන්නාවූ ගැහැණිය තමන් වහන්සේ හැඳිනැ ඇගේ බොරු හසුකරණ පිණිස මේ නිට කුමක් වේදැයි විචාරා මාගේ නැන්දනියන් බඩැ හොත් මසිලනුවන් පුතනුවෝයයි කී කල්හි තමන් උරෙන් ලෙහෙ පෙවූ පරිදිද කොටහු කෙරෙහි කළ සෙනහයෙන් තමන් වහන්සේ ගලින් හෙළා පරිදිද ප්‍රකාශ කොටැ වදාරා තමන් වහන්සේ දිවි ගන්නට සිතූ අනාචාරය වද ක්ෂමා කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම ක්ෂමාකොටැ වදාළ සෙයෙක.

තව ද **මණිචෝර ජාතකයෙහි ගෘහපතිවූ** තමන් වහන්සේගේ අඹුවන් කෙරෙහි සෙනහ කළාවූ රජහුතමාගේ මාණික්‍යය තමුන් වහන්සේ නැති ආ ගැලැ ලවාපියා මැණික සොරු ගත් තැනැත්තේයයි තමන් වහන්සේ මරන්නට වන් කල්හි තමන් වහන්සේගේ ඇඹෙණියන් වහන්සේගේ සත්‍ය ක්‍රියා බලයෙන් ආවාවූ **ශක්‍රයා** තමන් වහන්සේගේ හිසැ තුබූ දම් ගෙඩි යෙහි ඒ දුෂ්ටවූ රජාගේ හිස තබා ඔහුගේ හිස කපවා තමන් වහන්සේ ඇත්පිටැ හිඳුවූ කල්හි ඇඹෙණියන් වහන්සේ හා කැටිවැ අභිෂෙක ලදින් රාජ්‍යශ්‍රියට පැමිණෙන සෙයෙක්ද ධර්මයෙන්ම පැමිණි සෙයෙක. තවද **පබ්බතූපච්චර ජාතකයෙහි 1අමාත්‍යවැ** තමන්ගේ රජ්ජුරුවන්ගේ අන්තඃපුර ද්‍රෝහකළ අමාත්‍යයාගේ පවත් අසා "මහරජ, මේ අමාත්‍යයාත් තොපට ප්‍රයොජන වත්වුව, මේ ස්ත්‍රියත් තොපට ප්‍රියවූව, දෙදෙනාට ක්ෂමා කරව"යි දෙදෙනා කෙරෙහි රැහැණි හරවා ඔවුන්ගේ සම්පත්තිය ඔවුන්ට ස්ථිර කරණ සෙයෙක්ද ධර්මයෙන්ම ස්ථිර කරවූ සෙයෙක.

තව ද, **වලාහකාඝ ජාතකයෙහි** ආකාශචාරිවූ **අයවරා ජවැ** ඉපදූ නැවූ බිඳි විදෙශයට වන්නවුන් තමන් වහන්සේගේ පිටින් ඇදූ සවිදෙශයට පමුණුවා නිදුක්කරවන සෙයෙක්ද ධර්මයෙන්ම කළ සෙයෙක. තව ද, **මිත්තාමිත්ත ජාතකයෙහි ගණිකාඤ්ඤාවැ** මිත්‍රා'මිත්‍ර සචරූප වදාරණ සෙයෙක්ද දැන් තමන් වහන්සේ බුදුවැ වදාරන්නාවූ කුශලා'කුශල ධර්මසචරූප සේම අවිපරීත කොටැ වදාළ සෙයෙක. තව ද **රාධජාතකය හෙයින් ගිරාවැ** බැමිණියගේ අනාචාර පියානන්ට වදාරණ කල්හිදු නුවණැත්තෝ නම් ඇත්තක් වත් නැත්තක් වත් කියන කල්හි ඇසුවන් සිත ඇලලෙන බසක් නො කියතිදි ඛණ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක. තව ද **ගෘහපති ජාතකයෙහි බොධිව** තමන් වහන්සේගේ දරුවන් කෙරෙහි විප්‍රතිපන්නාවූ ග්‍රාම භොජකයාට අවවාද කොටැ වදාරණ සෙයෙක්ද ධර්මයෙන්ම වදාළ සෙයෙක.

තව ද **සාධුසීල ජාතකයෙහි දිසා පාමොක් ආචාර්‍යවැ** දුන් විවාහ දෙන්නා කැමැති බමුණු දුන්නම් රූපසම්පන්නායට දුන මනාදෝ වය සම්පන්නායාට දුන මනාදෝ ජාති සම්පන්නායාට දුන මනාදෝ සීල සම්පන්නායාට දුන මනාදෝදි විවාළ

1 අණ්ඩරූපක්ඛ-පණ්ඩිතජාතකය.

කල්හි සිල සම්පන්නයාට දිම උත්තම කොටැ වදුරණ සෙ යක්ද සතර අගති දුරුකොටැ ධර්මයෙන් වදුළු සෙයෙක. මෙසේ මාගේ සව්මින් විසින් අනන්ත ජාතියෙහි සාත්මකොටැ නො නසා විමසා රක්ෂාකරණ ලද්දාවූ ධර්මය සරණ යෙම්සි **දහම් සරණ යාසුතු.**

තව ද, **බඬ්ගනාමාර ජාතකයෙහි තාපසයා** නො හරණවූ අඹුදරුවන් හැරැ මහණවැ පඤ්චා'භිඥ අෂ්ට සම්පත්ති උපදවා අපරිහීන ධ්‍යානවැ බ්‍රහ්ම ලොකයෙහි උපදවන්නාහුද ධර්මබල යෙන්ම උපන්හ. තව ද, **කෙළි සිල් ජාතකයෙහි ශක්‍රදෙවේන්ද්‍රයා** ඉපදූ කෙළි සිලවූ රජහු ඥාතීන්ගේ වයෝ වෘද්ධයන් හා කැවිවැ කෙළි කෙළ්ලැ අනර්ථ කරන්නා දැකැ දිව්‍ය ලොක යෙන් මහළු වෙසක් මවා ගෙණැ අවුත් ඇත් පිටින් නුවර පැදකුණු කරන්නාවූ රජහු ඉස දී සැලියක් බිඳැ ලජ්ජාවට පමු ණුවා ඔහුගේ අවිනීතකම් හරවා ආචාරයෙහි පිහිටුවන්නා හුද ධර්මයෙන්ම පිහිටුවූහ. තව ද, **බඬ්ගවතන ජාතකයෙහි තාපස්විවැ** සිටැ තමන්ගේ මෛත්‍රී බලයෙන් විෂ ඝොරවූ සපී යන් තමන් බුදුවූ කල්හි දරණ ගබ වැඩැහිදැ ගඳකිළි කළ **මුචලින්දනාම නාගරාජයා** සේ භික්ෂාවා තමන්ගේ අතැවැසි තාපස්වින් වහන්සේද නිත්‍යයෙන් උපස්ථාන කරණ උපාසක වරුන්සේද භික්ෂාවා මෙත් සිත් පිහිටුවන්නාහුද ධර්මයෙන්ම පිහිටුවූහ.

තව ද, **විරඝ ජාතකයෙහි දිඝකාව** උපන් කල්හි පොවා තමන්සේ ක්‍රියා කරන්නාවූ **ඝාඝයාගේ** විනාශ දුක්වීමෙන් බුදුවූ කල්හි තමන්සේ කෘත්‍යය කරන්නට පටන් ගත්තාවූ දෙවදූතයාට වන විනාශයට පූර්වනිමිත්ත දැක්වූහ. තව ද, **ගඞ්ගෙය්‍ය ජාතකයෙහි වෘක්ෂදෙවතාවැ** ඉපදූ 'මම යහපතිම්! මම යහපතිම්'යි කියා ගර්ජාකොටැ 2 කැස්බෑ කරා ගියාවූ **ගඞ්ගෙය්‍ය** නම් මත්ස්‍යයා හා **යාමුණෙය්‍ය** නම් මත්ස්‍යයා හා තුන්දෙ නාගේ රූප ප්‍රශංසා අසා සිටියාහු දැන් තමන්ගේ රූප ප්‍රශංසා කරන්නවුන් භික්ෂාවන්නට වදුරණ ධර්මදේවස්ම මෙනෙහි කොටැ සිටියාහයි සිතුම්. තව ද **කුරුඛමිග ජාතකයෙහි** මුවවැ ඉපදූ තමන් මරන්නට ලා ලූ මලෙහි බැඳි මිත්‍රවූ **කැරෙටුලාගේ** හා **කැස්බාගේ** බලයෙන්ම 3 මලින් ගැලවී දිවි ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ.

---

1 තමන්ගේ. 2 කැස්බාවා. 3 මලින්.

තව ද **අසඝන ඤාතකයෙහි තාපසවෑ** මළාවූ අඹුවැ දෙණෙහි ලාලා ශොකයෙන් හඬන්නාවූ රජහුගේ ශොක දුරු කොටැ බණ වදාරන්නාහුද ධම්යෙන්ම වදාළහ. තව ද **සුංසුමාර ජාතකයෙහි වඳුරුවෑ** කිඹුලාට හසුවැ තමන්ගේ උපාය ශකතින් ගැලවෙන්නාහුද ධම්යෙන්ම ගැලවුනාහ. තව ද **ඛණ්ඩහාල ජාතකයෙහි වෘක්ෂ දෙවතාවෑ** ඉපදූ ශරීර රක්ෂායෙහි කුසලවූ **ඛණ්ඩහාල** නම් පක්ෂිහු වැද්දාට හසු නොවන සේ බලා මතු තමන් දරුවන් මරණට හසු නොවන බව එසේමයැයි ධම්යුකතවූ චිනතාවක්ම කළහයි සිතම්. තව ද **ඛණ්ඩජලක ජාතකයෙහි ගස්කොමන පක්ෂිවෑ** ඉපදූ තමන් වහන්සේ ගස් කොටන ලෙස් බලා "මමද මෙසේ ගස් කොටම්" තමාගේ ජාතියට නුසුදුසුවූ ක්රියා කොටැ තුඩ බිදගත්නාවූ පක්ෂිහු දක් නාහු මතු බුදුවූ කල්හි තමන් ලෙස ධම් දෙසම්හයි පටන් ගත්තවුන් දළ දප් බිදෙන බවට පූර්ව නිමිතත දක්වන්නාහුද ධම්යෙන්ම දුටහ. මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ජාති යෙහි අනෙක් ලෙසින් සාක්ෂාත් කරණලද්දාවූ ධම්ය සරණ යෙමිසි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යායුතු.**

තව ද, **සොමදතත ජාතකයෙහි** රජ්ජුරුවන්ට උපස්ථාන කරන්නාවූ **සොමදතත මාණවකවෑ** තමන් ඉගැන්වූ ශාස්තෘව සහවුරුද්දක් මුළුල්ලෙහි ඉගෙණැ ද අනතයෙහි වැරැදවූ පියා නන්ගේ දෘෂ්ටානතයෙන්ම දැන් බුදුවූ කල්හි **මහා බ්රහ්ම** යනුදු තමන් දෙසූ ධම්ය එලෙසින්ම දෙසිය නොහෙන බවට දෘෂ්ටා නත දැක්වූහ. තව ද, **උච්චිඨඛතත ජාතකයෙහි දුගතතවෑ** 1 ඉපදූ සොර සැමියාගේ ඉදුල් බත් මත්තෙහි සිය සවාමියාට බත්ලා (දෑ) කවන්නාවූ ගැණිගේ දැක්මෙන් දැන් බුදුවැ වදා රන්නාවූ ගැහැණුන්ගේ දුෂ්කම් හඟවන ධම්යට දෘෂ්ටානත දුටහ. තව ද, **භාරු ජාතකයෙහි 2 තාපස්වීවෑ** සිවැ ඔවුනොවුන් හා කලහ කරවා තුන්සියක් යොදුන් රට මුළුල්ලෙහි දෙවතා කොපයෙන් විනාශයට පැමිණියාවූ රජ්ජුරුවන්ගේ දැස්මෙන් දැන් තාපස්වීන් ඔවුනොවුන් කලහ කරවන **කොසොල් රජ්ජුරුවන්ම** අවවාද දෙන්නාහු ධම්යට මූල දෘෂ්ටානත දුටහ. තව ද, **පුණණතදී ජාතකයෙහි පුරෝහිතවෑ** ගූඪවූ අභිප්රාය ඇති රජ්ජුරුවන්ගේ බස්හි අර්ථ දන්නාහුද ප්රශ්න සඛ්යාතවූ ධම්යෙන්ම දත්හ.

---

1 තාපස්වීවැ-ඇ. 2 ගිරු. අරු

තව ද **සුවර්ජප ජාතකයෙහි** අමාත්‍යවැ ආකාශයෙහි දණ්ඩ ඩැහෙණැ යෙමින් සිටියාවූ **කැස්බා** බෙණෙම්සි කියා දණ්ඩ කටින් හැරී ගොස් බිම හි මළ පරිදි දක්වා බොහෝ කොටැ දෙඩන්නාවූ රජ්ජුරුවන්ට අවවාද දී ඔවුන්ගේ වාචාලකම් හරවන්නාහුද ධර්මයෙන්ම හැරවූහ. තව ද, **මහාසුදස්සන ජාතකයෙහි පුරෝහිතවැ** මැසින්න පස්සේ දැලට හසුවැ ගොඩ ඇදූ හොවා ලූ කල්හි මේ ගින්නෙහි දැමට වඩා මේ උල්හි ඇවිනීමට වඩා මාගේ මැසින්න මා අනික් තැනකට ගියහයි කියා සිතන සිතෙක් ඇත්නම් ඒ ම මා ලය තවන්නේ යැයි හඬනාවූ හඬ අසා කාමයෙහි ආදීනව දැකැ ඔහු ගලවා දිවි දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ. තව ද, **සෙගහුජාතකයෙහි වෘක්ෂ දෙවතාවැ** ඉපදූ දුවගේ සිලාචාර විමසන්නාවූ බ්‍රාහ්මණයා දක්නෝ දැන් ඔහු තමා දුව විමසූ කල්හි පෙරත් නෝ මෙසේම විමසිසි කියා ධර්මය වදාරන්නට මූලකථා කළහ.

තව ද **කුම වාණිජ ජාතකයෙහි** වෙළඳවැ තමන්ගේ 1 යහලු මියන් කැවනැයි නුදුන්නාවූ **කුම වාණිජයාගේ** පුතු **උකුස්සා** ගෙණැ ගියහයි කියා උපාය ඝකනින්ම ඔහුගේ වඤ්චාව හැරැ තමන් සතු වසතුව තුමූ ගන්නාහුද ධර්මයෙන්ම ගත්හ. :තව ද, **ධර්මධ්වජ ජාතකයෙහි අමාත්‍යවැ** රජ්ජුරුවන් ලවා තමන් මරන්නට සිතුවාවූ කුහකයාගේ බසින් නොකට හැකි දෙයක් කරන්නට යොදලා මොහු මරවාපුව මැනැවැයි සිතූ රජ්ජුරුවන් "එක් දවසකින්ම මැරවුව මැනැව, පොකුණු වුවමැනැවැ"යි යනාදින් කී කල්හි තමන්ගේ ධර්මයෙහි ප්‍රසන්නවූ **ශක්‍රයා** අවුත් මැවූ උයන් ආදී පෑ රජ්ජුරුවන් ඇතුළුවූ සියලු ලොව සතුටු කොටැ ශත්‍රු 2 විනය පූර්ණ'ඛ්‍යමවූ මහා සම්පත්නි ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ. මෙසේ අනන්‍ය ජාතියෙහි මාගේ සවාමීන්ට ම කුලධර්මවැ සිටියාවූ ධර්මය සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යායුතු.**

තව ද **ගරහිත ජාතකයෙහි වානරවැ** සිටැ පොවා මමය මාගේයැයි කියන්නාවූ මනුෂ්‍යයන්ට තුමූ ගහී කොටැ එසේම ගහී කරන්නාවූ වදුරු පිරිස් ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ. තව ද **කාසාව ජාතකයෙහි හස්තිරාජවැ** ඉපදූ පසේ බුදුන් ගේ වෙස් ගෙණැ කාෂාව වස්ත්‍රය පෙරවැ සිටැ ඇතුන් මරන්නාවූ පුරුෂයාගේ වඤ්චාව දැනැ ඔහු තමන්ගේ පිරිස් රක්ෂා

1 යහළු. 2 විනාශ.

කරන්නාහුද ධර්මයෙන්ම රක්ෂා කළහ; තව ද, **මූලනන්දි ජාතකයෙහි වානරවෑ** ජරා ජීර්ණවූ මෑණියන් විඳිනට දුන්න භයා ගත්නාවූ කරුණා නැති පුරුෂයාගේ ශරයට තුම්බ හසුවෑ වැදූ මෑණියන්ට දිවි දෙන්නාහුද ධර්මයටම දිවි පිදූහ. තව ද **සුතසෝම ජාතකයෙහි අමාත්‍යවෑ** බිසවුන් කෙරෙහි නිෂ්කරුණාවූ රජ්ජුරුවන්ට අවවාද කියා අනාථ සමයෙහි දුග්ගත් බිසවුන්ට ශ්‍රී දෙන්නාහුද ධර්මයෙන්ම දෙවූහ. තව ද, **කුම්භීල ජාතකයෙහි වානරවෑ** සිටෑ තමන් මරන්නට ප්‍රයෝග කළාවූ කිඹුලා අතින් ගැළවෙන්නාහුද ධර්මයෙන්ම ගැළවුනාහ.

තව ද, **ඛන්තිවණ්ණන ජාතකයෙහි** තමන්ගේ ප්‍රිය භාර්‍යාවන් කෙරෙහි අපරාධකළාවූ අමාත්‍යයා කෙරෙහි ක්ෂමාකරන්නාහුද ධර්මයෙන්ම ක්ෂමා කළහ. තව ද, **සොසිම ජාතකයෙහි අමාත්‍යවෑ** නො නික්මුන මනා කල නික්මුනු බකමූණ කවුඩුවන් අතැ නට පරිදි පෑ "මහරජ තමාට නුසුදුසු කල්හි නික්මුනාහු මෙසේ විනාශයට පැමිණෙනි"යි අකාලගමනයෙන් ඒ රජ්ජුරුවන් වළකා ඒ රජ්ජුරුවන්ට ද සෙනාවට ද දිවි දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ. තව ද, **ගුථපාන ජාතකයෙහි** හසනියකු හා ශුඛ කරම්සි පටන් ගත් රූ බී මත් අසුචි පණුවා ඇත්හු අතැ නට පරිදි දැකෑ "තමාගේ බල නොදැනැ වැඩිසිටියන් හා සැසඳා කරන්නාහු මෙසේ විනාශයට පැමිණෙනිසි" ව ඍෂි දෙවතාවෑ සිටෑ බණ වදාරන්නාහුද ධර්මයෙන්ම වදාළහ. තව ද, **කාමනීත ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍රවෑ සිටෑ කාමයෙහි ලොභ ඇත්නාවූ රජහු කෙරෙහි කළ කරුණාවෙන් දිව්‍ය සම්පත්හි හැරී මනුෂ්‍ය ලොකයට අවුත් තමන් වහන්සේගේ ධර්ම දෙශනාවෙන් ඔහුගේ ලොභය හරවා ශීලයෙහි පිහිටුවන සෙයෙක්ද ධර්මයෙන්ම පිහිටුවූ සෙයෙක.

තව ද, **පලාසි ජාතකයෙහි** ද **දුතියපලාසිජාතකයෙහි** ද **බරණාස්රජවෑ** මහසෙනග ගෙණ ආවාවූ සතුරු රජහු තමන් වහන්සේගේ දෙරටු පටහා තමන් වහන්සේගේ කාඤ්චන පටවයක් වැනිවූ නලළ හා දුටු සතුරු රජහු එතැන්හිම සිටෑ බිඳී වල්වදනා පරිද්දෙන් මහානුභාව ඇතිවන සෙයෙක්ද ධර්මයෙන්ම ඇතිවූ සෙයෙක. මෙසේ මාගේ සර්‍වාම්දරුවූ ධර්මාධිරාජවූ ත්‍රිභුවනෙශ්වරවූ ශාක්‍යසිංහවූ සුරාසුර ප්‍රජාපති මකුට මණී ලලිත චරණ කමල ඇති සර්‍වාම්දරුවන් අනෙක ජාතියෙහි පරිහරණය කළාවූ ධර්මරත්නය සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ ගියයුතු.**

තව ද, **උපාහන ජාතකයෙහි හඤ්ඤාවාඝ්ඨවෑ** නමින් වහන්සේ හා සසඳා කරන්නට ආවාවූ අතැවැස්සා හා විවාද යෙහි ලෝවැස්සන් කරණ හසුනි ශික්ෂාව හැරී යන්නට කළු සංඝයෙහි සිරිනා පරිද්දෙන් සිරිනට කළු සංඝයෙහි යන පරිද්දෙන් යනාදීන් ආශ්චර්‍ය්‍ය හසුනි ශික්ෂාව දක්වා අතැවැස්සා ලුහුබදවා ජයගන්නාහුද දැන් බුදුවැ නිවුකයන් කරණ ලොක ශික්ෂාවට ප්‍රතිපක්ෂ කොටැ ලොකා ශික්ෂා කොටැ අමෘත මහා නිර්‍වාණය දක්වා ධර්‍මයෙන්ම ජයගන්නා බවට පූර්‍ව නිමිත්ත දක්වූහ. තව ද, **විණාථුන ජාතකයෙහි** උත්තම ගොණුන් ගේ මොල්ලි ඇත්තා දැකැ කුදු පිටත් ගැට දැකැ මේත් උත්තම පුරුෂයෙකැයි කියා කුදු පස්සෙහි ගියාවූ සිටුදුව දැකැ ඇගේ අඟුනය තත්වූ පරිද්දෙන් නිශ්චය කරන්නාහු දැන් අසුහවූ ආලම්බණයෙහි ශුභසංඥයෙන් අනුපවත්නාවූ තෘෂ්ණායෙහි සැරුප දැන් මට පූර්‍ව නිමිත්ත දක්වූහ.

තව ද, **විඤ්ඤාණඤ්ඤජාතකයෙහි රජවෑ** මනුෂ්‍යයන් පස් සෙහි එම්සී ශර ප්‍රහාර කා මළාවූ නිබුල්හු දැකැ පඤ්චකාම යෙහි අනුවැ ගොස් නස්නාවූ සත්ත්වයාට වනා විනාශය නිශ්චය කරන්නාහුද ධර්‍මයෙන්ම නිශ්චය කළහ. තව ද, **අසිනාහු ජාතකයෙහි තාපස්විවෑ** තමන්ගේ සැමියවූ රාජකුමාරයා **ලිය කිනනරාව** පස්සෙහි ගියැ පරිදි දැකැ කළකිරී තමන් වහන්සේ කරා අවුත් වන්කල්හි ඇට එතැන්හිම පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ගන්නා සෙයින් උපදෙස් දෙන සෙයෙක්ද ධර්‍මයෙන්ම දුන් සෙයෙක. තව ද, **වඩ්ඪමාන ජාතකයෙහි පණ්ඩිත ජාතාවෑ** තමන් පඤ්චකාම ගුණයෙන් පැවරූ මහසිටුහට එහි ආදීනව දක්වා ගුණධර්‍මයෙන් පිරිනොහෙන්නාහුද ධර්‍මයෙන්ම නොපිරිහුන්හ. තව ද, **සාකෙතජාතකයෙහි බ්‍රාහ්මණපුත්‍රවෑ** ජාත්‍යනන්තරයෙහි තමන්ට මව්පියවූ බමුණ හා බැමිණිය කියන පුත්‍රවාදය ඉවසා 'සෙනහ' නම් දෙය ජාත්‍යනන්තර වාසනාවෙන් වෙයි" යි දක්වන්නාහුද ධර්‍මයෙන්ම දුක්වූහ.

තව ද, **එකපද ජාතකයෙහි මහසිටුවෑ** තමන් ඇකයෙහි හුන්නාවූ **තරුණ කුමාරයා** සියලු අළු සාදන පරිද්දෙන් ඔහු කී ප්‍රඥා විසඳූ ඔහුගේ අළුසිඹියට කාරණ වන්නාහුද ධර්‍මයෙන්ම කාරණ වූහ. තව ද, **හතිනමාතු ජාතකයෙහි නීල මණ්ඩූකවෑ** තමා බලවත්දූ මනුෂ්‍යයන් කා දුර්‍වලවූ දූ මනුෂ්‍යයන් අතැ නට්ටවාවූ **උදක සප්පියා** දැකැ" යි කළු සත්ත්වයෝ තමන්

බලවත්ද, අනුන්ට හිංසා කෙරෙනි අනුන් බලවත්ද, ඔහු අතැ විනාශයට පැමිණෙනිසි" නිලමණඩුකාවැ කෙමෙන මත්තෙහි හිඳැ කියන බණ වජ්‍රාසනයෙහි හුන් බුඩ විලාසයෙන් වදුරන් නාහුද ධර්මයෙන්ම වදුළහ. තව ද, **මහා පිඹුල ජාතක** යෙහි 'මහා පිඹුල' නම් රජහට පුත්වැ අධර්මිෂ්ඨවූ ඒ පියරජහු මළ කල්හි තුමූ රාජ්‍යය ලදින් සියලු රටවැස්සන් ඒ රජහු මළ බවට සතුටුවැ සැලෙන කල්හි:-

හඬ හඬා සිටියාවූ දෙරටු ගොවියා කැඳවා මේ සියලු රට වැස්සන් ඒ රජහු මළබවට සතුටුව නෝ හුදකලා නැනැත් නෙනි, කුමට හඬහිදැයි විචාරා "මහරජ! මම ඔහට සිනා හඬන්නෙම් නොවෙමි; ඒ රජ්ජුරුවෝ තමන් ඇතිකල ගෙන් පිටතට යන කලත් ඇතුළට වදනා කලත් මා හිසැ ටොකු ඇනැ ගෙණම යෙති. ඒ ටොකු ඉතා රළුවය; මා හිසැ ඒ අන්නා ලෙසම පරලෝ ගොසින් යමයා හිසත් යමපලුන් හිසත් ටොකු ඔත්තු නම් උඟ ඒ වේදනාව ඉවසා ගත නොහී ඒ රජහු පෙරළා මෙහි 1 එවාපු නම් නැවත මට ටොක්කෙන් ගැළවීමෙක් නැතැයි හඬම්"සි කී කල්හි රජ්ජුරුවන්ගේ 2 චණ්ඩත්වයෙහි ආදීනව සලකා තුමූ **දශරාජධර්මයෙහි** පිහිටා ලොකය රක්ෂා කරන්නාහුද ධර්මයෙන්ම රක්ෂා කළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි තමන්ට ආවෙණික ධන කොටැ රක්ෂා කළාවූ සර්ධර්මය මා සියලු දුකඛ යෙන් ගළවා සියලු සුවයෙහි යොදා රක්ෂා කරන්නේයයි සත් පුරුෂයන් විසින් **දහම් සරණ යායුතු.**

තව ද, **සබ්බඥ ජාතකයෙහි පෘථිවි ජයමන්ත්‍රය** ඉගෙණැ සියලු නිරිසනුන් පිරිවරා ගෙණැ ඇත්තු පිටැ සිංහයන්තු සිටුවා සිංහයා පිටැ හිඳැ ගෙණැ සියලු පොළොව දන ගෙණැ තමන් ගේ රාජ්‍යයට ආවාවූ කැණහිල්හු තමන්ගේ උපාය ශක්තින් දැනැ පරදවා ජයගන්නාහුද දැන් බුදුවැ මුළුලොව දිනූ සංසාර ව්‍යසන ලුහුබදවා තමන් ගන්නා ජයට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද, **සුභඛජාතකයෙහි පණ්ඩිත පුරුෂවැ** උපාය ශක්ති නැති බැවින් බහණ කා පියා පලා නො ගොස් බඹුනයෙහි හෙවැ දුක් ගන්නා බල්ලා දැකැ ඔහට අවවාද කියා ඒ බඹු නය ඔහු ලවා කවා බඹුන මුක්ත කරවන්නාහුද සියලු සත්ව

1 ලාපුනම්. 2 චරිතයෙහි.

ලොකයාහට කරන්නාවූ බණින මුකනියට පුළුනිමිතත දක් වන්නාහුමෙන් මේ ධම්යම පෙරදුරි කළහ.

තව ද, **ඉතිල ජාතකයෙහි මනුෂ්‍යව.සිටැ ශක්‍රදෙවෙශ්‍රයා** මිනිස් ලොවට අවුත් තමන්ගේ වීණ අසා නැවත **වෛජයනන රථය** එවා දෙව්ලොවට ගෙන්වා දිව්‍ය සත්‍රින් මධ්‍යයෙහි වීණ ගයවා **පඤ්චසිඛයා** වැනි වීණ ගයන්නවුන් ඇති තැන් හිදු තමන්ගේ වීණවට සතුටුවැ තොප කැමැති වසතුවක් ගන්ව යි කිකල්හි දිව්‍ය සම්පත්තියෙහි අපෙක්‍ෂා නොකොටැ ඒ දිව්‍ය සත්‍රින් කැඳවා "මට අනික් මිළයකින් 1 ප්‍රයෝජන නැත; තොප මේ දෙව්ලොව උපදින්නට කාරණවූ ගිය ජාතියෙහි කළ කුසල් කියව"යි කියා ඔවුන් විසින් වෙන වෙනම "මම සිල්වත් වහන්සේ කෙණෙකුන්දැට පුදන්නට මල් දින්මි" "මම දැගබ් අතුල් ගසන්නට සුවද දින්මි" යනාදි තමන් කළ කුසල් කිකල්හි මනුෂ්‍ය ලොකයට අවුත් මිනිස් ලොවැ ගැහැණුන්ට "මෙවැනි මද කුසල් කළ ගැහැණුහු මෙසේ ශක්‍රයාට අඹුවූහ"යි කියා කුසල්හි උනසාහ වඩ වඩා සියලු සත්‍රින් මරණින් මත්තෙහි ද දෙව්ලොව උපදනා පරිද්දෙන් කුසල්හි සමාදන් කරවන්නාහුද ධම්යෙන්ම කරවූහ.

තව ද, **විතිචඡා ජාතකයෙහි තාපසවැ** සියලු ජම්බුවිපය දැනැ ආවාවූ පරිබ්‍රාජකයින් වචන මාත්‍රයෙකින් පරදවන්නා හුද ධම්යෙන්ම පැරදවූහ. තව ද, **මූලපරියාය ජාතකයෙහි ආචාර්‍යවැ** අසදෘශවූ මානයෙන් ත්‍රිභුවනයෙහි තමන් හා සමයන් නැතැයි සිතා ආවාවූ පන්සියයක් මානවකයන් එක වචන මාත්‍රයකින් පරදවා තමන්ගේ ශ්‍රී පාදය වන්දවන පරිද්දෙන් 2 විහතමානීන් කරවන්නාහුද ධම්යෙන්ම කළහ. තව ද, **තෙලොවාද ජාතකයෙහි තපස්විවැ** මනුෂ්‍ය මාංස දන්දුන් උපාසකයා ප්‍රාණීන් මරා මනුෂ්‍ය මාංස වැළඳුයේ නපුරු වේ දැ යි කිකල්හි "දන් දෙන තැනැත්තේ තමා අඹුදරුවන් මරා දුන් නමුදු ශුඛ චිත්තයෙන් වළඳන තැනැත්තහුට දෙස් නැතැයි" අවවාද වදාරන්නාහුද ධම්යෙන්මැ වදාළහ.

තව ද, **පාදඤ්ජලි ජාතකයෙහි අමාත්‍යවැ** සිටැ කළ කළි දෙයට තොල් බිඳ ලන්නාවූ **පාදඤ්ජලිය** නම් රාජකුමාරයා ගේ අශුනත්වය ප්‍රකාශකොටැ තුමූ රාජ්‍යය ලබන්නාහුද

1 කම්නැත. 2 විගතමානීන්.

ධර්මයෙන්ම ලදහ. තව ද, **කිංසුකොදම්ම ජාතකයෙහි රජවැ** තමන් කරා විවාදකොටැගෙණැ ආ දරුවන් සතර දෙනාට **කණ්හ කාලස** (ල) **පන්හකාලස මල්ගස් කාලස එලගස් කාලයැයි** සතර අවස්ථායෙහි කැලගස් සාරවිහු පෑ කල්හි විවාද කොටැගෙණැ ආ රජදරුවන් සතර දෙනාම තමන් දුටු අවස්ථායෙහි ගස් සට හන් කී කල්හි "තෙපි හැමදෙනම කැලගස දුටුවහු; විභාග කොටැ විචාරා නොගත් හෙයින් සංශය වී"යැයි වදාරන්නාහුද දැන් තමන් බුදුවැ **සකල ආණ්ඩු සත්‍යයෙහි** සිරුර වෙන වෙන විචාරන්නවුන්ට එකහෙළා සිතට නහාලන පරිද්දෙන් බණ වදාරණ ආචාර්යකමට පැවී නිමිත්ත දැක්වූහ.

තව ද, **සාලක ජාතකයෙහි ධාන්‍ය වාණිජවැ** එක දෙශ යක් දැකැලාම සැමිහු අතින් පලාගිය වදුරා නැවත ඔහු කරා නොම ආ පරිදි දක්වන්නාහුද දැන් තමන් සිතින් එකවරෙක්හි ගිය කෙලශයන් නැවත තමන් සිතට නොඑන බවට පැවී නිමිත්ත දැක්වූහ. තව ද, **ඝට ජාතකයෙහි තාපසවැ** සෘෂි වෙශයෙන් ආ වානරයා තපස්වී කෙණෙකැයි හදහා ගන්නාවූ පුතනුවන්ට ඔහු වදුරුබව හඟවන්නාහුද දැන් තමන් බුදුවැ කාම සුඛා'නුයොගය ධර්මයැයි සරණ ගත්තාවූ ලොවට ඒ අධර්මයැයි හඟවන බවට පැවී නිමිත්ත දැක්වූහ. මෙසේ මාගේ සැමිහු විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යස කළාවූ තමන්ගේ ලයන් සේ රක්ෂා කරණ ලද්දාවූ ධර්ම සරණ යෙමියි **දහම් සරණ යායුතු.**

තව ද, **සඛපප ජාතකයෙහි තපස්වීවැ** සිටැ රජ්ජුරුවන් ගේ බිසවුන් කෙරෙහි ලොභයෙන් කාමා'තුරවැ හඬා නැවත ඒ ශොකය නැති කොටැ බ්‍යන උපදවා ආකාශයෙන් යන්නාහු තමන්සේවූ සත්පුරුෂයන් සිතැ ධර්මයක් මුත් අධර්මයක් බොහෝ කලක් නොපිහිටුවන බවට පැවී නිමිත්ත දැක්වූහ. තව ද, **නිලමුඛි ජාතකයෙහි දිසාපාමොක් ආචාර්යවැ** තල මිටක් සොරා ගත් රාජකුමාරයාට හුණ පත්තෙන් ගෙඩි දී හික්මවා ඔහු ක්‍රමයෙන් රාජ්‍යය ලදින් ඒ වෛරය සිතැ තබා තමන් ගෙන්වා මරන්නට ප්‍රයොග කළ කල්හි අවවාද කියා ගැලවෙන්නාහුද ධර්මයෙන්ම ගැලවූනාහ.

තව ද, **මණ්ඩකුණ්ඩ ජාතකයෙහි තපස්වීවැ** නාගරාජයා ගේ සමාගමයෙන් දුකඳිතවූ තමන්ගේ මලනුවන්ට "ඔහු

නොප කරා නොඑන පරිද්දෙන් කණ්ඩ මාණික්‍යය ඉල්වව"යි කියා ඔවුන් ඒ ඉල්වූ කල්හි නාගරාජයා කණ්ඩ මාණික්‍යය දෙන්නට මැලිවැ ඔහු කරා නොඇවුත් හැරපි කල්හි විෂ සොර සපියා කෙරෙන් මලනුවන්ට වන භය දුරුකරන්නාහුද දැන් තමන් බුදුවැ සියලු සත්ත්ව ලොකඝාට සසර භය දුරු කරවන්නට පුළු නිමිත්ත දක්වන්නාහු ධර්මයෙන්ම දක්වූහ. තව ද, **කුණ්ඩකුච්ඡි සිඤ්ච ජාතකයෙහි අස්වෙළඳවැ** මැහැල්ලන්ගේ ගෙන් කුඩු කා වැඩි අශ්වරාජයාට තමන් කෙරෙහිදී සෙනිව යන්ට සුදුසු අශ්ව භොජනය දෙන්නාහු දැන් බුදුවැ නිළුකයන් කෙරෙහි අධර්ම අනුභවකළ ලොවට තමන් කෙරෙහි දී සඩමී' මෑත දෙනබවට පුළු නිමිත්ත දක්වූහ.

තව ද, **සුඛඡීවකයෙහි ගිරග්ගසමජ්ජවැ** භොජනයෙහි ප්‍රමාණ නොදැනැ අඹ රස අති පානයෙන් අසාත්මවැ මුහුදු බත්වූ ගිරවි දක්නාහු දැන් තමන් බුදුවැ භික්ෂූන් වහන්සේට "මහණෙනි, භොජනයෙහි පමණ දනුව පමණ නොදැනැ අඹරස බී පී ගිරවි මුහුදු බත්වූ පරිද්දෙන් අප්‍රමාණ භොජනයෙන් විනාශයට නොපැමිණේව්"යි වදාරන්නාහු අවවාදයට දෘෂ්ටානත දුටහ. තව ද, **ජරුදපාන ජාතකයෙහි පඤ්ඩිත වෙළඳවැ** ධන ලොභයෙන් ලිංවලට වඩාලා කණනා වෙළඳුන්ට ලොභයෙහි ආදීනව දක්වන්නාහුද නොකණුවයි අවවාද දී ඔවුන්ට එයි නොවැලකැ කැණැ සට හොත්නාවූ **නාගරාජයා** අතින් විනාශය පැමිණී කල්හි එම නාගරාජයා අවුත් තමන්ගේ ගුණයෙහි පැහැදී පන්සියයක් ගැල්හි සත්රුවන් පුරා පූජා කළ කල්හි එබඳුවූ පූජා ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ.

තවද, **ඝාමණ්ඩිඝණ්ඩ ජාතකයෙහි 'ආදුසමුඛ කුමාර'වැ** පියානන් මළකල්හි සත්හැවිරිදි වැ සිටැ ශක්‍ර බ්‍රහ්මාදීන් විසිනුත් නො විසඳිය යුතුවූ අර්ථය සවීඥ විලාසයෙන් ප්‍රකාශකොටැ දක්වන්නාහුද දැන් තමන් බුදුවැ තමන්ම දෘෂ්ටා'නත කොටැ සත්ත්වයාගේ කාමයෙහි තෘප්තියක් නැතිබව දක්වා ධර්මදේශනා කරන්නට කථා'නතර දක්වූහ. තව ද, **කිඤ්චවච්ඡ ජාතකයෙහි තපස්විවැ** සිටැ ශ්‍රද්ධයෙහි පැරැදුණ වල්වැදුණ පිපාසායෙන් තමන්ගේ ලිදට වැටී හුන් රජ්ජුරුවන් ගොඩට නගා ජීවිත දුන දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ.

තව ද, **දූනඡනකසෙහි රජවැ** සිටැ ලඤ්ඡයක් වියදම් කොටැ මෙහෙ නිමවමින් එහි ලොභ කළාවූ පුරුෂයන්හු "දූනයෙකිමි" කියා දුවැ ගෙණැ ගොස් තමන් වහන්සේ මෙහෙ නිම වන තලියෙන් බත් ඉදුල් කොටැ හැරිගත් කල්හි මෙහෙ නිම වන තැනැ රැකවල සිටි අමාත්‍යයා ඔහු හිස කපන්නට වන් කල්හි එසේ නොකරවයි වළකා තෝ කාගේ දූනයෙක්ද යි විචාරා "මම තෘෂ්ණාවගේ දූනයෙකිමි"යි කී කල්හි "මමත් ඒ තෘෂ්ණාවගේ දූන්යෙමි; තාත් තෘෂ්ණා දූනවූවැ මාත් තෘෂ්ණා දූනවූවැ දූනයන්ට උපකාර කළ මනා වේදැ"යි රතු ගෙරි දහසක් ප්‍රධානකොටැ ඇති බොහෝ සම්පත් දෙන්නාහු ද ධර්මයෙන්ම දුන්හ. මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණලද ධර්මය සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ සා සුතු.**

තව ද, **පදුම ජනඤකසෙහි සිවුකුමාරවැ** නාසා හින **පිසුම් හොව්වාගෙන්** බොරු ගුණ කී ශ්‍රෙෂ්ඨි පුත්‍රයන් පිසුම් නො ලද කල්හි තුමූ ඔහුගේ සඞ්භාවයන් කියා "මේ ජානියෙහි නාසාව නට. ඒ ඇතිවන්නේ නොවෙයි. මා විසින් ඇත්තක් කී බැවින් සත්‍යයෙහි ප්‍රියයක් ඇත්තෙහි වී නම් මල් දෙව"යි කියා ඔහු විසින් ඇති ගුණ කීයේ යහපත් වේ දැයි සතුටුවැ ඔහු දුන් මල් ලබන්නාහුද දුන් තමන් සත්‍යයෙන් මරහු ලුහුබදවා වජ්‍රා'ස නය ලබන බවට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද **මුදුපාණි ජනඤකසෙහි මහරජවැ** තමන්ගේ දියනියන් රකිමියි අත අල්වා ගෙණැ සිටැ ඔවුන් පෙරළා බාල කොල්ලකු අත පියා නන් අතැ තබා සැමියා හා කැටුවැ ගියකල්හි "ගැහැණු නම් මෙසේ රක්‍ෂා කොටැ ගත නොහැකි ජානියෙක් වනැ!"යි ගැණුන්ගේ අයුතු දන්නාහුද ධර්මයෙන්ම දත්හ.

තව ද **චුල්ල පලොභන ජනඤකසෙහි 'අනිඝි ගණ්ඩ කුමාර** කල්හි බ්‍රහ්ම ලොකයෙන් චුතවැ ඇ හෙයින් ගැහැණුන් දුර බිඳු කටහඬට පවා වෙවුලා සත්‍රී සාපයෙන් දුරුවැ ගණ්ඩී සත්‍රියගේ ගී අසා ඇ කෙරෙහි බැඳි කාමරසානුභවයෙන් මූර්ඡිතවැ "ගැහැණුන් මම් අනුන්ට නො දෙමි"යි කඩුව හයා ගෙණැ විටියට බැසැ පුරුෂයන් ලුහුබදවමින් විටියෙහි නික් මුනි. එබස් ඇසූ රජ්ජුරුවන් ගැහැණිය හා එක්කොටැ රාජ්‍ය යෙන් නෙරපි කල්හි ඇ අත අල්වා ගෙණැ මල් මැදු ආශ්‍රම යෙක්හි වෙසෙමින් එතැන්හි වසන ආකාශචාරීවූ තාපසයන්හු

තමන්වහන්සේ එලා'එල පිණිස වලට ගිය කල්හි ආකාශයේන් යෙමින් සිටෑ ඈ කෙරෙහි පෙළඹී ඛ්‍යානයෙන් පිරිහී ආශ්‍රමයෙහි හිදැ තමන් වහන්සේ එන්නා දැකැ දිවන්නට වන් කල්හි ඔහු දුටු තමන් වහන්සේත් කඩුව හයා ගෙණැ ලුහු බදවා ඔහු මුහුදු කොලට පැමිණැ පෙර ඇති සෘඩිය පිරිහුනු බව නොදැනැ ආකාශයට නැඟි සෘඩින් යෙමි සි උඩට පිනූ පිම්මෙන්ම මුහුදු දියෙහි හුනුවා දැකැ "මේ ආකාශචාරීවූ තාපසයෙක් වන. **පඤ්චකාමය** නිසා නටුයේයැ"යි සිතා කාමයෙහි ආදීනව දැකැ ඒ ගැහැණිය ගෙණැ අවුත් මනුෂ්‍ය පථයෙහි සිටුවා පියා එම ආශ්‍රමයෙහි තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිවැ **පඤ්චාභිඤ්ඤ** අෂ්ට **සමාපත්ති** ලදින් ආයු කෙළවරැ බ්‍රහ්ම ලොකයෙහි උපන් සෙයෙක්ද ධර්මයෙන්ම උපන් සෙයෙක.

තව ද, **මහා පනාද ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍රවැ ඉපැදී මනුෂ්‍යවූ **මහාපනාද** නම්වූ රජ්ජුරුවන්ට කායවෙය්‍යාවච්ච කරණ සෙයෙක්ද දැන් තිලෝගුරු සම්‍යක් සම්බුඩවැ ලෝවැසියා ගන්නා දුකට පූර්ව නිමිත්ත දක්වූ සෙයෙක. තව ද, **බුරප ජාතකයෙහි** **ඛත්තියවැ** දහසක් දුන් වෙළඳහුට ජීවිතපරිත්‍යාග කොටැ ඔහු ඒ කාන්තාරයෙන් එතර කරවන සෙයෙක්ද දැන් තමන් වහන්සේට අහර බත් දුන්නවුන්ට ධර්ම පරිත්‍යාග කොටැ සසර කතරින් ඔවුන් එතර කරණ බවට පූර්ව නිමිත්ත දක්වූ සෙයෙක. තව ද, **වානග්‍ර සිඤ්ච ජාතකයෙහි අශ්වරාජවැ කොටලිස** හා සමාගමය කෙරෙමි සි එළඹැ ලොමුදහැවැ සිටැ ගෙණැ සිවිකල ගසාලූ එක පා පහරින් ඈ කෙරෙහි අභිලාෂ නැතිවැ වඩනා සෙයෙක්ද තමන් වහන්සේ ගැහැණුන්ගේ පිළිකුල් දුටුවිට **කපිලවසභ** පුරුෂ හැරැපියා යන බවට පූර්ව නිමිත්ත දක්වූහ.

තව ද, **කණ්ඩිමඛ ජාතකයෙහි** ඇන්වැ **කකුළුවා** නළට හසුවූ වේලෙහි පටන් ගෙණැ කකුළුවා මැඩැපියන තුරා අත නොහැරැ සිටිනා ඇතින්න ලබන්නාහුද සසරට හසුවූ වේලෙහි පටන් ගෙණැ සසර මැඩැ පියනතුරු අත් නොහරින ප්‍රඥව ලබන ලෙසින් ලදහ. තව ද, **ආරාම දූසක ජාතකයෙහි** **පණ්ඩිත පුරුෂවැ** ආරාම දූෂක වානරයන්ගේ සවරූප දන්නා හුද දැන් ලොක දූෂණය කරන්නාවූ කෙලෙසුන්ගේ සවරූප දන්නා පරිද්දෙන්ම දත්හ. තව ද, **සුජාත ජාතකයෙහි රජවැ** එරූඪ වචන බණන්නාවූ මැණියන්ට අවවාද දී බණ වදුරන්නාහුද දැන් බුදුවැ **මහාමායා** දේවීන් වහන්සේට වදුරණ බණට අභ්‍යාස කළහ.

තව ද, **උලූක ජාතකයෙහි හංසපොතකවැ** බහුමූණා ගන්මි සි සිතූ පක්ෂි රාජ්‍යය තුමූ ලබන්නාහුද දැන් මරහු පැතූ වජ්‍රා'සනය තුමූ ගෙණැ ලබන්නාවූ බුදුරජාණන් වහන්සේ ඇසක් සේ රක්ෂාකළාවූ සඩ්ඝයා මා රක්ෂා කරන්නට පොහොසතැ සි **දහම් සරණ යාසුතු.**

තව ද, **උදපානදූසක ජාතකයෙහි ගණකාඝතවැ** උදපාන දූෂණය කළාවූ වඳුරාගේ සවරුප දන්නාහුද චිත්ත දූෂණ කෙලෂයන්ගේ සවරූප දැන් මට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද, **ව්‍යාඝ්‍රජාතකයෙහි වෘක්ෂ දෙවතාවැ** ඉපැදූ චණ්ඩවූ සිංහ **ව්‍යාඝ්‍රයන්** නිසා තමන්ගේ විමානයට ආශ්‍රයවූ වනය රැකෙනබව දන්නාහු බොධිසත්ව භූමියෙහි කෙලෂයන් නිසා බොධි සම්භාර ධර්මයට ආශ්‍රයවූ තමන්ගේ චිත්ත සන්තානය පවත්නා බවට නිදර්ශන වූවහ. තව ද, **කච්ඡප ජාතකයෙහි නාපසවැ** ඉපැදූ තමන්ගේ කණ්ණ විවර මුඛ විවරාදියෙහි විප්‍රකාර කරන්නාවූ **වානරයා** කෙරෙහි ක්ෂමා කරන්නාහු ද බොධිසත්ත්ව භූමියෙහිම කුළු ගත්හ.

තව ද, **ලොල ජාතකයෙහි** හා **රුචිර ජාතකයෙහි** ද **පරෙවිවැ** තමන්ගේ අවවාද නොගත් **කාකයන්** රජ්ජුරුවන්ගේ මුළුතැන් ගෙට වැදූ විනාශයට පැමිණි සේ දැකැ ලොලත්ව යෙහි ආදීනව දක්වන්නාහුද ධර්මයෙන්ම වූවහ. තව ද, **කුරු ධර්ම ජාතකයෙහි රජවැ** උත්සවයෙහි විදි හිය දියෙහි හුනුවා නොදැකැ ප්‍රාණියක් නසම්හ යන සිතක් නැත ද එහි ප්‍රාණියෙක් නටදෝ හෝයි යන සිතින් තමන් රක්නා **පඤ්චසීලයට** කලඬකයෙක් වියැයි සිතන්නාහු ධර්මයෙන්ම කුළු ගත්හ. තව ද, **රොමක ජාතකයෙහි පරෙවිවැ** තමන් මරන්නට සිතූ **කුමනාපසයා** කෙරෙන් ගැළවෙන්නාහුද දැන් තමන් සසරින් ගැළවෙන්නට පූර්ව නිමිත්ත දක්වූහ.

තව ද, **මහිෂ ජාතකයෙහි 'සිලව මහිසරාජ'වැ** නාගබල ඇතිවැ තමන්ගේ ශරීරයෙහි මල මූත්‍ර කරන්නාවූ **වානරයා** කෙරෙහි ශරීරයෙහි මල මූත්‍ර කරණ ප්‍රිය පුත්‍රයාහුට මෙන් ක්ෂමා කොටැ ක්ෂාන්ති පාරමිතායෙහි කුළුගන්නාහුද සත්පුරුෂ ධර්මයෙහි කුළුගත්හ. තව ද, **සත්තපන්න ජාතකයෙහි**

සොරදෙවුවෑ සිටෑ දහසක් හැරැගෙණෑ යන මානවකයා **ඝාතගිල්වෑ** උපන් මවගේ හිතකාම්වූ හඬ නොඅසා අනඒ කැමැති සියොත්හුගේ හඬ ගිවිසි බවද දැනැ "වැඩ කැමැත්ත වූන්ගේ බස් නොගිවිස්මෙහි හා නොවැඩ කැමැත්තවූන්ගේ බස් ගිවිස්මෙහි" ආදීනව දක්වන්නාහුද ධර්මයෙන්ම දැක්වූහ.

තව ද, **සුමදූසඝ ජාතකයෙහි උදුම්පාලයා** හෙළි හෙළි පුටය නසන්නාවූ වානරයාගේ සවරූප දන්නාහු ලොක විනාශක කෙලසයන්ගේ සවරූප දන්නා බවට පූර්ව නිමිත්ත දක්වන්නාක්මෙන් ධර්මය මෙනෙහි කළහ. මෙසේ ශරණ'ගත වජ්‍රපඤ්ජරවූ සමසත ලොකපාලවූ මාගේ සවාමීන් විසින් අනන්‍ය ජාතියෙහි පුරුදුකළ ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යායුතු.**

තව ද, **අඛ්‍යානතර ජාතකයෙහි තාපසවෑ** ශක්‍රයාට සංශය උපදනා පරිද්දෙන් සිල් රක්නාහු ද ධර්මයෙන්ම රක්‍ෂා කළහ. තව ද, **සෙඝ්‍යංඝ** ජාතකයෙහි **බරණැස්රජවෑ** කිපි බැලූ මාත්‍රයෙකින්ම සියලුම ශත්‍රුමණ්ඩලය හසමකරන්නට සමර්ථවෑ සතුරු රජහු අවුත් නමන් බඳවා බන්ධනා'ගාරයෙහි ලනතුරු රාජ්‍යයක් පිණිස අනුන් හා යුධයක් නොකෙරෙමි යි වැඩෑ හිඳෑ බන්ධනාගාරයෙහි ලූ කල්හි එහි වැඩෑ හිඳෑ සතුරු රජහු මුල් කොටැ මෛත්‍රී කොටැ ධ්‍යාන උපදවන්නාහුද ධර්මයෙන්ම ඉපැදවූහ. තවද, **වඩඪකී සූකර ජාතකයෙහි වෘක්ෂදෙවතාවෑ** දුර්ලවූ භූරෝ උපාය ශකතින් බලවත්වූ 1 **වාඝ්‍රයා** ගිලූ පරිදි දක්නාහු දැන් බුදුවැ නමන්ගේ සව්වන් බලවත් සසර දනන පරිදි දක්නා බවට පූර්ව නිමිත්ත දුටහ.

තව ද, **සිරිජාතකයෙහි හස්තාචාර්‍යවෑ** කුලූපකවැ තමන්ට බත් දුන් හස්තාචාර්‍යයා මහානුභාවවූ කුකුළු මස් කවා රාජ්‍යත්වයෙහි පිහිටුවන්නාහුද ධර්මයෙන්ම කළහ. තවද **මණිසූකර ජාතකයෙහි තාපසවෑ** මැණික්පව්වට කෙලෙසම් හසි කියා භූරන් මඩෙහි වැකී රෝමයෙන් ගැසූ ගැසූ සේම විශෙෂයෙන් ඔප් නගන්නාවූ මාණික්‍ය දක්නාහුද දැන් තමන් බුදුවැ නිර්වාණයන් තමන්ගේ කීර්තිය කිව්වූ කරම්හ යි සිතූ සිත සේම ඒ කීර්තිය භවා'ග්‍රප්‍රාප්තවැ විශෙෂයෙන් නිර්මල වන බවට පූර්ව නිමිත්ත දුටහ. තව ද, **සාලූකජාතකයෙහි ගොන්**

1. සිංහයා.

වෑ සිටැ වධ්‍යවූ හූරන් කන ගොදුරෙහි ලෝභකළු මලනු වන්ට අවවාද දී ලොභයෙන් වළකන්නාහු දැන් වසතු කාම කෙලෂ කාමයෙහි ආදීනව නොදැනැ පඤ්චකාමයෙහි හුනු වාවූ සත්ව ලොකයාගේ එහි ලොභය හැරවීමට ශ්‍රමකළහ.

තව ද, **ලාභ ගරුක ජාතකයෙහි දිසා පාමොක් ආචාර්‍ය වෑ** ලාභ ලබන්නේ කෙසේදැ යි විචාළාවූ ශිෂ්‍යයාට "අඟුණයන් අතින් ලාභ ලබ්නේ නම් වියරුහුණු වන් සේ වූව මැනව, කේලම් කිව මැනව. නටන නාට්‍යකාරයන් සේද අලජ්ජිවූව මැනව. කටට ආවාක් බිණුව මැනවැ"යි කියා ලාභ උපද වන කාරණයම නපුරු සේ දක්වා ඔහු ලාභයෙහි අපරිඤා නොකොටැ මහණවැ පඤ්චා'භිඤ අෂ්ට සමාපත්‍ති උපදවන පරිද්දෙන් අවවාද වදුරන්නාහුද ධර්මයෙන්ම වදුළහ. තවද, **මච්ඡුදඤ්ඤ ජාතකයෙහි වෙළඳවෑ** මසුන්ට බත් ලාලා ඒ පින් ගහැ දෙවතාවන්ට දී ඒ පින් අනුමෝදන්වූ දෙවතාවන් විසින් මසු ගැලපු තමන් සතු දහසක් බද පියල්ල එළවූ කල්හි එසේ නට වසතුව ලබන්නාහු ද ධර්මයෙන්ම ලදහ.

තව ද, **නානාච්ඡන්ද ජාතකයෙහි රජවෑ** තමන් සොරුන් අත්පත්වැ ගැළවුනු බව කී නැකත්තාහට බ්‍රෝ යසස් දෙන් නාහුද ධර්මයෙන්ම දුන්හ. තව ද, **සීලවීමංස ජාතකයෙහි පුරොහිතවෑ** සොරකම් කොටැ සීලයම උත්තම සේ පරීක්ෂා කොටැ සියලු සම්පත්‍ති හැරැ පියා රජ්ජුරුවන් අනු දන්වා **හිමාලය** යට වැද පැවිදිවැ පඤ්චා'භිඤ අෂ්ට සමාපත්‍ති උපද වා බ්‍රහ්මලොක පරායණ වන්නාහුද ධර්මය අවශ්‍ය කොටැ රැක්කහ. මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කොටැ ජීවිතයක් සේ රක්ෂා කළාවූ ධර්මයම සරණ යෙමි සි **දහම් සරණ සාසුතු.**

තව ද, **භද්‍රඝට ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවෑ** සිටැ ගිය ජාතියෙහි තමන්ගේ පුත්‍රයාහට සිතු පැතු දෙය දෙන **භද්‍ර කුමාර** දෙන්නාහුද ධර්මයෙන්ම දුන්හ. තව ද, **සුපත්‍ර ජාතකයෙහි කාකවෑ** සිටැ තමන් දිවි පුදා බරණැස් නුවරැ රජ්ජුරුවන්ගේ මුළුතැන පහරණ කාකා'මාත්‍යයන් පහර ලබන්නාහුද ධර්මයෙන්ම ලදහ. තවද **කාසව්චජීන්ද ජාතකයෙහි පණ්ඩු රොග ඇතිවෑ** වෙදුන් අසාධ්‍යය සි හළ කල්හි මේ රෝගය නැතිවූ විටම මහණ වෙමි යන සිතින් කිපදවසකින්ම පොකුරු

පතෙක්හි වත්කළ පැනක් සේ ඒ රෝගය ශරීරයෙන් ගිලිහී ගිය කල්හි මහණවැ බ්‍රහ්මලොක පරායණ වන්නාහුද ධර්ම යෙන්ම නිරොගිවූහ.

තව ද, **ජම්බුබාදක ජානකයෙහි** ද **අනන ජානකයෙහි** ද **වෘක්ෂ දෙවතාවැ** ඉපැදූ චතුෂ්පාදයන් කෙරෙහි අධමවූ **කැණ කිල්ලුංහා පක්ෂීන්** කෙරෙන් අධමවූ **කාකයා** හා ඔහුනොවුන්ට ප්‍රශංසා කරණ පරිදි දකැ හෙරව රූපයෙන් ඔහු ලුහුබඳවන් නාහු දැන් බුදුවැ හිනවැ සිටැ අනෙක්'නාය්‍යයන් ප්‍රශංසා කරන් නාවූ නිඵකයන් ලුහුබඳවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තවද **සමුද්‍ර ජානකයෙහි සමුද්‍ර දෙවතාවැ** මහා සාගරයෙහි පැන් නොනසා බොවදී කියා බට **කච්ඡපයන්ට** අවවාද කියන්නාහු **කාකයාගේ** ලොභයට ගහී කරන්නාහුද ධර්මයෙන්ම කළහ. තව ද, **කාමවිලාප ජානකයෙහි දෙවතාවැ** ජීව ශූලයෙහි හිඳැ පඤ්චකාම පිණිස විලාප කරන්නවුන් දක්නාහුද දැන් බුදුවැ තමන් වදුරණ පඤ්ච කාමා'දිනවයට දෘෂ්ටා'නත දුටහ.

තව ද, **උදුම්බර ජානකයෙහි වෘක්ෂ දෙවතාවැ** ඔවුනොවුන් හා විවාද කරන්නාවූ **වඳුරන්** දෙදෙනා දක්නාහු සංසාර යෙහි පාපධර්මයන් ඔවුනොවුන්ගේ විශෙෂයෙහි නැවත නැවත පවත්නා බවට දෘෂ්ටා'නත දුටහ. තව ද, **කොමාය පූර්ව ජානකයෙහි තාපස්වීවැ** සිටැ කෙළි සිලවූ තාපසයන් හා පරිච යෙන් නොඑක් මුඛ විකාර කරන්නාවූ **වානරයා** තමන්ගේ අවවාදයෙන් භික්ම වන්නාහු දැන් කෙලශ සංසගියෙන් විප්‍රකා රයට පැමිණි ලොව භික්මවන බවට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද, **බඹ ජානකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවැ** එළු වෙසක් මවා ගෙණැ සිසාරා වතුරෙන් හසුවැ ගිය ගහමැදැ ගොඩෙහි හොත් **කොක්නාවා** කන ගොදුරක් නැති හෙයින් සිල්රක්මියි සිතූ කල්හි ඔහු ඉදිරියෙහි පැනී තමන් වහන්සේ දුටු ඔහු සිල් පසුවැ රැකගත හැක්කැයි ගන්නට පැණැහුණු කල්හි ශක්‍රා'තමභාව යෙන් ආකාශයෙහි සිටැ ඔහුගේ ලොල චිත්තතත්වය ප්‍රකාශ කරණ සෙයෙක් තමන් වහන්සේ අගුණයෙහි ප්‍රියනැති බව හා ගුණයෙහිම ප්‍රිය ඇතිබව හා දක්වා වදාළ සෙයෙක.

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණලද ධර්මය සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ යායුතු.**

තව ද, **චුල්ලකාලිඞ්ග ජාතකයෙහි තපස්විවෑ** ශක්‍රදෙවෙන්‍ද්‍රයා දෙනෙනි කී රජහු පැරැදි කල්හි නා දෙනෙනි කී රජහු පරදනට කාරණ කිම්දැ යි විචාරා පරාක්‍රමය-දමනය-සමාධිය යනාදිවූ ධර්ම්මයෝ ඔහුගේ විජයට කාරණය හයි ශක්‍රයා කී කල්හි ඒ ධර්ම්මයන්ගේ විශෙෂ දස්වන්නාහු ධර්ම්යෙන්ම දත්හ. තව ද, **මහා අස්සාරොහ ජාතකයෙහි රජවෑ** උපකාර කළ කුටුම්බිකයාට ප්‍රත්‍යුපකාර කරන්නාහුද ධර්ම්යෙන්ම කළහ. තවද, **ඒකරාජ ජාතකයෙහි රජවෑ** මෛත්‍රී පුරස්සරවූ ධර්ම් පරායණවූ තමන් අල්වා ගෙණ රාජවාරයෙහි හිස බිම් බලා බැඳ එල්වාපු රජහු කෙරෙහි මෛත්‍රී කොටැ වැඳුම් සිදැ ගෙණ ආකාශයෙහි පළක් බැඳ ගෙණ හිඳිනාහුද ධර්ම්යෙන්ම හුන්හ. තව ද, **දද්දර ජාතකයෙහි** විෂ හොරවූ **නාගරාජවෑ** ලූඛ්‍යවූ කැට කැබිලිති බැහලා මරතුදු විෂ නැති ගරබොසින් දියබරණුන් සේ ක්‍ෂමා කරන්නාහුද ධර්ම්යෙන්ම ක්‍ෂමා කළහ.

තව ද, **සිලවීමංස ජාතකයෙහි පණ්ඩිත මාණවකවෑ** දිසාපාමොක් ආචාර්‍යයන් ශිෂ්‍යයන්ගේ ආචාර පරීක්‍ෂා කරණ පිණිස "මාගේ දියනියන්ට විවාමගුල් කෙරෙමි" "නෝ හැමදෙනා වසන්‍නා'ලඞ්කාරාදිය ගෙණෙව"යි කී කල්හි සෙසු අන්තෙවාසිකයන් සොරා වසන්‍නා'ලඞ්කාර ගෙණතුදු තුමූ නොගෙණ අවුත් ආචාර්‍යයන් විසින් "සෙස්සනු අපට වසන්‍නා'ලඞ්කාර ගෙණෙත් නෙපි නොගෙණෙව්"යි විචාළකල්හි "අනුන් නො දුක්කදී ගෙණෙන්නට වේද නුඹ කියන්නෙහිය. කාත් නැතත් දෙවතාවන් මා කරණ.පව් බලා සිටුත්, "කෙසේ රහ සැයි පව් කෙරෙම්ද"යි කියා පාපය නොකරන්නාහු ධර්ම්යෙන්ම නො කළහ. තව ද, **සුජානා ජාතකයෙහි අමාත්‍යවෑ** 1 ඩෙබර පල විකුණන ගැහැණිය රජ්ජුරුවන් කෙරෙහි හිඳැ අන්තයෙහි "මෙම වට පල ජාතිය කුමක්දැ යි" කියා රජ්ජුරුවන් කන ඩෙබරෙහි නම් විචාළ කල්හි "පෙර තොප මුඛ හිසින් රෙදි කඩක් හැඳ ගෙණ අතු කඩා බහා කැටූ පල වේ දැ"යි කියා කිපී නී නො හඳුන ඩෙබර හැඳිනැ ගෙණ පෙර සේ ම වස වයි නෙරන්නට වන්කල්හි මහරජ! එසේ නො කිපුන මැනව, "ශ්‍රී ලත් කල්හි පෙරැ හුන් දුකෙක් ඇත් නම් සිතැ නො තිබෙයි" කියා ක්‍ෂමාකරවා අස්වසන්නාහුද ධර්ම්යෙන්ම අස් වැසූහ.

---

1 ඩෙබර පක්.

තව ද, **පලාස ජාතකයෙහි** කැහැල ගසැ වෘක්ෂදෙවතාවැ තමන්ට ආරාධනාකළ දුගීහතයාහට මුවවිටින් මුවවිටි පැහැරි සිටි මහා නිධාන දෙන්නාහුද ධම්මයෙහිම අභිලාෂයෙන්ම දුන්හ. තව ද, **ජව සකුණ ජාතකයෙහි පක්ෂීවැ** සිටැ කෙළෙහි ගුණ නොදන්නාවූ සිංහයාගේ උගුරට වැදැ එහි ඇණුනු මස් ඇට හැරි ඔහු සුවපත් කරන්නාහුද ධම්මයෙන්ම සුවපත් කළහ. තව ද, **ජව ජාතකයෙහි චණ්ඩාලවැ** සොරකමට උයන් වැදැ ගස් උඩ හිදැ රජ්ජුරුවන් උඩහිදුමාලා බිම හිදැ බණ කියන පුරොහිතයාගේ අධම්මය ක්ෂමා කොටැ ගත නොහී ජීවිතයෙහි ආසා නැතිවැ මා දිවි ඇතිවැ ධම්මයට කරණ නිසුව ක්ෂමා කෙරෙම්දැ සි ගසින් බිමැ හී බණ කියා **චණ්ඩාලවැ** සිටැ රාජ්‍යය ලබන්නාහුද ධම්මයෙන්ම ලදහ. තව ද, **සඝභජාතකයෙහි පුරොහිත පුත්‍රවැ** හස්ත ප්‍රාප්තවූ පුරොහිත ස්ථානය හැරි මහණ වන්නාහුද ධම්මයෙන්ම මහණවූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි සා'තම කරණ ලද ධම්මය සරණ යෙමි සි **දහම් සරණ සා සුතු.**

තව ද, **සුවිමසු ජාතකයෙහි** කොසඹ ගසැ **වෘක්ෂදෙවතාවැ** ඉපැදැ ගම් පැහැරි වසතු ගෙණැ ඒ ගසමුල හොත්නාවූ සොරහු තමන්ගේ වෘක්ෂ මූලයෙන් නෙරපා ඒ ගසට උපද්‍රව විය නොදී රක්ෂා කරන්නාහුද දුන් තමන් වැඩහුන් බොධි වෘක්ෂයට මරහු විසින් උපද්‍රව විය නොදෙන බවට පූජී නිමිත්ත දුස්වූහ. තව ද, **ඛණ්ඩපමාදිය ජාතකයෙහි තාපසවැ** බාල කුමාරයන් කෙරෙහි කළකිරුනාවූ පියානන් වහන්සේට අව වාද දී විරොධ හරවන සෙයෙක්ද ධම්මයෙන්ම හැරිවූ සේ යෙක. තව ද, **ඛන්තිවාදි ජාතකයෙහි තාපසවැ** අත් පා කපන්නට පරශු ධාරා ගෙන්වන රජ්ජුරුවන්ගේ මුහුණ 'සළු' ඝයෙහි අමෘතධාරා නමන චන්ද්‍රයා සේ ප්‍රසාද මධුරවූ නෙත් යෙන් බලන සෙයෙක්ද ධම්මයෙන්ම බැලූ සේයෙක. තව ද, **ලොහකුම්භි ජාතකයෙහි තාපසවැ** ලොහොකුඹු නරකයෙහි පැසෙන්නාවූ සතුන්ගේ හඬ අසා භයපත්වූ රජහු ධනලොභි බ්‍රාහ්මණයන්ගේ බසින් නොයෙක් ප්‍රාණවධ කොටැ යාග කරන්නට පටන්ගත් කල්හි සවපනයෙහි අඬී කියා රජහට වන අනිෂ්ටයක් නැතිබව හඟවා මරණ මුඛයට පැමිණී සියලු අපාද විපාද චතුෂ්පාදයන් ගළවා සත්ත්වයාට ප්‍රාණදාන දෙන්නාහුද ධම්මයෙන්ම දුන්හ.

තව ද, **මාංස ජාතකයෙහි** සිවුපුතුවෑ ප්‍රිය වචන බලයෙන් වැද්දු අතින් මස් ලබන්නාහු ද ධම්මයෙන්ම ලදහ. තව ද, **සඝ ජාතකයෙහි සඝවෑ** ඉපැදු සාමි සි ආ බවුණට ගිනි වැදූ මස් දෙමි සි ගින්නට පැන තමන්ගේ ප්‍රතිබිම්බය කලපා'නතය දක්වා සිපිනා පරිද්දෙන් චඳුමණ්ඩලයෙහි අන්දවන්නාහු ද ධම්මයෙන්ම ඇන්දවූහ. තව ද, **මහාරෙදන ජාතකයෙහි** සිඟලු සංඝාර ධම්මයන්ගේ අනිත්‍යතාව හඟවා මළවුන් කෙරෙහි ශොක කරන්නවුන් අස්වසන සේයෙක් ද ධම්මයෙන්ම අස්වැසූ සේයෙක. තව ද, **ඛණවෙර ජාතකයෙහි සොරවෑ** ඉපැදූ ගැහැණුන්ගේ ආදීනව දන්නාහු ද ධම්මයෙන් ම දත්හ.

තව ද, **නිකතිර ජාතකයෙහි නාපසවෑ** සිටැ වැද්දුගේ සන් වටුවා ඔහු අතින් ගැලවී වලට වැදූ තමා වසන තැනට ආවාවු වැද්දු අතින් මළ හෙයින් මටත් ප්‍රාණනිපාත ඇද්දෙ හෝ සි කියා විචාළ කල්හි ප්‍රාණ වධයක් කෙරෙම් සි යන සිතක් නැති කල්හි තට පාපයෙක් නැතැ සි ධම්මය වදාරන්නාහු ද දන් බුදුවැ "**වෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි**"සි කියා වදාරණ බණට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද, **සුචජ ජාතකයෙහි අවාන්‍යවෑ** රජ්ජුරුවන් හා කැවිවැ වල්හි දුක්ගත් බිසවුන් කෙරෙහි රජ්ජුරුවන් කරුණා නැති වූ කල්හි බිසවුන්ගේ ගුණ සිහි කරවා කෙළෙහි ගුණ දන්මෙහි අනුසස් වදාරා ඔවුන් කෙරෙහි සෙනහ කරවා බිසවුන්ගේ සම්පත්තිය විගුණ ත්‍රිගුණ කරවන සෙයෙක් ද ධම්මයෙන් ම කළ සෙයෙක.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කොටැ අභිවෘද්ධියට පැමිණවූ **ධම්මය ම සරණ සෙමි සි දහම් සරණ යා යුතු.**

තව ද, **කුම්භීලසඤ්ඤ ජාතකයෙහි පක්ෂිවෑ** තමන්ගේ කසල්ල බිඳපු වදුරා බලා බිඳින කසල්ල බල බලා කරණ මෙත්‍රී මාගේ ලෙහි කෙලෙසුන් බිඳින බවට ප්‍රත්‍යය වේව සි සිත සිතා මෙත්‍රී කරන්නාහු ද ධම්මයෙන් ම කළහ. තව ද, **දද්දභ ජාතකයෙහි සිංහවෑ ඉපැදූ** 1 බෙලි පල හුණු හඬට පොලොව පෙරළෙයි කිය කියා දිවන්නාවූ **සඝවගේ** බස් ගිවිසැ මුහුදු බත් වන්නාවූ සියලු චතුෂ්පදයන් රක්ෂා කරන්නාහු ද දන් බුදුවැ නිර්භීකයන්ගේ අධම්මය ගිවිසැ නරකයට වදනාවූ

1 බෙල් පක්.

සත්ත්වයන් රක්ෂා කරණ බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, **බ්‍රහ්මදත්ත ජාතකයෙහි නපස්විවෑ** රජ්ජුරුවන් අතින් එක්පට වහනක් හා පත් කුඩයක් ඉල්වා ගන්නට සිතා අනුන් අතින් යමක් ඉල්වීම නම් අප්‍රිය යයි දෙලොස් හවුරුද්දක් කල් යවන්නාහු ද ධර්ම්යෙන් ම කල් යැවූහ.

තව ද, **චම්මසාටක ජාතකයෙහි වෙළඳුවෑ** ඇන්මට පසු බස්නා එළුවා තමා කෙරෙහි ගෞරවයෙන් ප්‍රසාදයිනි යි සිතා ඇල නොවැ සිටැ ඔවුන් අතින් ඇනුම් කා මළාවූ **පරිබ්‍රාජකයා** දැකැ "ලොකයෙහි සත්ත්වයාට විනාශ නම් අඥානයෙන්ම වෙයි" කියා නිශ්චය කොටැ ඒ අඥානයෙන් දුරුවන්නාහු ද ධර්ම්යෙන්ම දුරුවූහ. තව ද, **ගෝධ ජාතකයෙහි ගෝවෑ ඉපැද** තමන් මරන්නට සිතූ **කොහොන් නාපඝඝා** අතින් ගැළවෙන්නාහු ද දැන් බුදුවන ජාතියෙහි තමන් විනාශ කරන්නට සිතූ මරහු අතින් ගැළවෙන බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, **කණ්හකාරූ ජාතකයෙහි දිව්‍යපුත්‍රවෑ** තමන් මිනිස් ලොවට ගෙණ දිව්‍ය කුසුම් නැති ගුණ ඇත්තෙමි යි කියා පැළඳවූ පුරොහිතයා හිස රුජා ක්ෂමා කොටැ ගත නොහී හඬන්නාවූ පුරොහිතයා කෙරෙහි කරුණ කොටැ ඔහු හිසින් මල් ගළවා රුජා නැති කොටැ නැති ගුණ ඇත්තම්හ යි හැඟැවීමෙහි ආදීනව දක්වනාහු ද ධර්ම්යෙන් ම දැක්වූහ.

තව ද, **කාකාති ජාතකයෙහි රජවෑ** සමුද්‍ර මධ්‍යයෙහි ගරුඩ විමානයෙහි ලාත් ගැහැණුන් නො රැකැ ගත හැකි බව නිශ්චය කොටැ පඤ්චකාමයෙහි ආදීනව දක්වනාහුද ධර්ම්යෙන්ම දැක්වූහ. තව ද, **අණාඤ්ඤොව්‍යා ජාතකයෙහි නාපඝවෑ** කැවිවැ පැවිදි වූ රන් පිළිමයක් වැනි ඇඹේනියන් සිහා වැඩියදී මළ කල්හි රැස්වූ මහජනයා උන්ගේ රූ බල බලා හඬ හඬා සිටි තැනට අවුත් මියැ හොත් පරිබ්‍රාජිකාවන් දැකැ **'සිඝලූ සංඝ්කාරෝ ධර්ම්මඝෝ අනිත්‍යඝඝ''** යි කිසි ශොකයක් නොකොටැ ඔවුන් මියැ හොත්නාවූ පෝරු කෙළවරම හිඳැ අහර වළඳා රැස්වූ මනුෂ්‍යයන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්තවූ ධර්ම් දෙශනා කරන්නාහු ද ධර්ම්යෙන් ම දෙශනා කළහ. තව ද, **සීලවීමංස ජාතකයෙහි පුරොහිතවෑ** සිලයෙහි ම අනුසස් පරීක්ෂා කොටැ හස්ත ප්‍රාප්තවූ රාජ්‍ය සම්පත්තියට ද අධිකවූ පුරොහිත ස්ථානය හැරැපියා මහණවැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොක පරායණ වන්නාහු ද ධර්ම්යෙන් ම බ්‍රහ්මලොක පරායණ වූහ.

මෙසේ මාගේ සැමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණ ලද්දාවූ අප්‍රමාණ ගුණ ඇති **ධම්ම රතනය සරණ** යෙමි සි **දහම් සරණ** යා යුතු.

තව ද, **සොඤ්ඤාලි ජාතකයෙහි රාජාමාත්‍යවැ** කැවිඩියගේ කසල්ලෙහි වැඩුනු කොවුලු පැටව් තමා කවුඩු පැටවෙකැ සි සිතා කැවිඩිය රැක්ෂා කරණ කල්හි නො හඬා නො හිදැ කෙවිලි හඬ හඬා කැවිඩිය තමා දරු නොවන බව දැනැ තුඩින් කසල්ලෙන් හෙළා පි කල්හි ඔහු පැලා "අස්ථානයෙහි දී දෙඩිම් විනාශ කාරණයි" බොහෝ කොටැ බණන්නාවූ රජ්ජුරුවන් හික්මවන සෙයෙක් ද ධම්මයෙන් ම හික්මවූ සෙයෙක. තව ද, **රථලඹි ජාතකයෙහි** ද **රාජාමාත්‍යවැ** තමා කැවින් තමා හිස ඇනැ ගෙණැ අනුන් තමා මැරුහයි පැමිණැ සිටි ඔවුන්ගේ සවන්සඬ ගන්නට පටන්ගත් පුරොහිතයාගේ අධම්මය දැනැ වූ පරිද්දෙන් නිණ්ණය පවත් වන්නාහු ද ධම්මයෙන් ම විනිශ්චය කළහ. තව ද, **කාළබාහු ජාතකයෙහි ගිරාවැ කාළබාහු** නම් චපල වානරයා විඳි අසීර සම්පත්තියෙහි ලොභ නො කරන්නාහු ද ධම්මයෙන්ම නො කළහ.

තව ද, **සොඩ ජාතකයෙහි** එසේම **රාජාමාත්‍යවැ** කෙළෙහි ගුණ නොදන්නාවූ රජහු බොහෝ කලක් දුක් ගත් දේවින් කෙරෙහි කරුණ ඇති කරන්නාහුද ධම්මයෙන්ම ඇති කැරැවූහ. තව ද, **රාජොවාද ජාතකයෙහි තපස්විවැ** සිටැ තමන්ගේ ගුණ පරීක්ෂා කරන්නට වලට වන් රජ්ජුරුවන්ට "සිත් නැති නුග පත් පවා රජ්ජුරුවන් ඛාදීඤ්ඤ කල්හි මිහිරි වන බව හා අඛාදීඤ්ඤ කල්හි නිත්තවන බව" දක්වා අවවාද කියා ධම්මයෙහි පිහිටුවන්නාහු ද ධම්මයට ම වහල් වූහ. තව ද, **ජම්බුඛ ජාතකයෙහි සිංහරාජවැ** තමන් සේ ක්‍රියා කෙරෙම් සි කියා නටුවා වූ **ශෘගාලයා** දැකැ "මහතුන් කරණ ක්‍රියා කරම් හයි සිතූ ක්ෂුද්‍රයන්ට වන මහා විනාශ දක්වා" බණ වදාරන්නාහු ද තමන්ගේ සිංහ නාද පවා ධම්ම නාද කළහ. තව ද, **ඉඛචජ්ඣාන ජාතකයෙහි අමාත්‍යවැ** උයන්හි තිබූ නිධානයෙහි වසතු හැරැ ගෙණැ එහි තණ ඔබා පියා රාජපුත්‍රයා නැඟී ගිය කල්හි ඛන ශොකයෙන් තණයෙහි නම කිය කියා හඬන්නාවූ රජ්ජුරුවන්ට බණ වදාරා ශොක දුරු කරන්නාහු ද ධම්මයෙන් ම දුරු කළහ.

තව ද, **පිඨජානඤ්ඤජාතකයෙහි** තපස්වීවූ අනුන් ගෙදොරැ සිහා සිටූ ප්‍රතිවචන මාත්‍රයක් නො ලබන කල් පවා නිර්කලපවැ ඇසා නැතිවැ යන්නාහු ද ධම්මයෙන් ම ගියහ. තව ද, **ථූණ ජාතකයෙහි දිසාපාමොක්ඛ** ආචාර්‍යවූ පියානන් මරන්නට පටන් ගත්තාවූ රාජපුත්‍රයාගේ මායාවෙන් වන උපද්‍රව වළකා රජහට ජීවිත දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. තව ද, **ඛා වෙරි ජාතකයෙහි මයූර රාජවැ** පක්ෂීන් නොඇදුනන රවෙහි පූජා ලද්දාවූ කාකයාට කරණ සත්කාර සම්මාන දුරුකොටැ තුමූ බොහෝ සම්මාන ලබන්නාහු ද දැන් තමන් නො උපන් නාට පළමු ලොක පූජා ලදින් සිටි නිර්ධකයන් මැඩැ තමන් මහා පූජා ලබන බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, **විසයහ ජාතකයෙහි සිටුවැ** අසූකෙළක් ධන ව්‍යයදම් කොටැ දන් දී වසතු නිමාවට යන්නා හා තණ ගෙණැ අවුත් විකොටැ දන් දෙමින් අවියෙහි තණ කදඇදු ගත නොහී කඩා ගෙණැ හී. ආකාශයෙහි සිටි ශක්‍රදෙවෙන්ද්‍රයා මෙතැන් පටන් ගෙණැ දන් නො දෙව යි වැළකුව ද තමන්ගේ දුනාඩ්‍ය'සය හඟවා "කුමක් පිණිසද තොප දන් දෙන්නේ"දැයි විචාළ කල්හි "අනික් භව සම්පත්තියක් පතා දන් නො දෙමි. සවිනේ ගෙවා දුනැ බුදුවැ ඔළුලොව ගළවන පිණිස දන් දෙමි"යි කී කල්හි ඒ බව දුනැ සතුටුවූ ශක්‍රයා තමන්ගේ ගෙය සත්‍රුවනින් පුරා ගියැ කල්හි දවස් පතා දෙලොස් ලක්ෂයක් ව්‍යයදම් කොටැ දන් දෙන්නාහු ද ධම්මයෙන් ම දන් දුන්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්‍ත ජාතියෙහි පුරුදු කරණ ලද **ධම්මය සරණ යෙමි සි දහම් සරණ යා යුතු.**

තව ද, **වානර ජාතකයෙහි** වඳුරුවැ තමන් මරණු කැමැතිවැ ඇත දියෙහි උයනක් ඇතැ සි පිටට නගා ගෙණැ යන්නාවූ කිඹුලාගේ වඤ්චා දුනැ "මාගේ හදවත තෙල දිඹුල් ගස තුබු යේය"සි කියා එතනට කිඹුල්හු ගෙණැ ගියැ කල්හි ඔහු අතින් ගැළවෙන්නාහුද ධම්මබලයෙන්ම ගැළවුනාහ තවද, **කුන්තිනී ජාතකයෙහි බරණැස් රජවැ** තමාගේ දරුවන් මළ හෙයින් තමන්ගේ ගෙහි නො වැසැ හිමාලයයට යන්නාවූ කුන්තිනී නම් පක්ෂියාගේ දුක්මෙන් දුන් තමන් හැරැ යන්නාවූ තෘෂ්ණාවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, **අම්බවොර ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවැ** භාවනා කොටැ අඹ උයන රක්‍ෂා

කොටැ වසන්නාවූ කුට ජටිලයාගේ අනාචාර දූකැ දෙව්ලොවින් මිනිස් ලොවට බැසැ ඕහට භය උපදවා ශ්‍රමණ ධම්ම යෙහි පිහිටුවන්නාහු ද ධම්මයෙන්ම පිහිටු වූහ. තව ද, **ඡජ කුමඣ ජාතඣයෙහි රාජමාත්‍යවැ** සෙමෙන් සෙමෙන් යන්නාවූ **ඡජ කුමඣ** නම් ප්‍රාණීහු පැ අලසයන්ට වන විනාශය දක්වා රජ්ජුරුවන් අනලයෙහි පිහිටුවන්නාහුද ධම්මයෙන්ම පිහිටු වූහ.

තව ද, **කෙසව ජාතඣයෙහි ඣලඣ නම් තාපසවැ** රජ්ජුරු වන් **පන්සියක්** වෙදුන් ලවා සන්හිඳුවා ගත නුහුණු **කෙසව තාපසයන්ගේ** රොගයට තමන් දිලූ ලුණු ඇඹුල් නැති පලා මාත්‍රයෙකින් සන්හිඳු වන්නාහුද ධම්මයෙන්ම සන්හිඳු වූහ. තව ද, **අඣකුට ජාතඣයෙහි රජවැ පණිවා** වළකා බලිකම්මා නත නොලැබීමෙන් කිපියාවූ යකුන් තමන් මරන්නට එවූ යක්ඛ කන් කුළක් සා යකුළක් අල්වා ගෙණැ ආකාශයෙන් අවුත් තමන් හිසැ පහරණට සිවි කල්හි තමන් රැකි ධම්මබල යෙන්ම ශක්‍රදෙවෙන්ද්‍රයාගේ ආසනය හුණුවූ කල්හි ඔහු දිලි යෙන වජ්‍රායුධය හැරැගෙණැ අවුත් "ඉඳින් තෝ මේ ධම්ඣ මහරජානන්ට විපත්තියක් කෙළෙහි නම් නා හිස මම මේ වජ්‍රායුධයෙන් පළා පියමි" සි කියා යක්ඛ භයපත් කරවා ලූහු බැඳැවූ කල්හි නිරුපද්‍රැතවැ ජීවිත ලබන්නාහුද ධම්මයෙන් ම ලදහ.

තව ද, **අරඤඤ ජාතඣයෙහි තපස්විවැ** මනුෂ්‍ය පථයට යන්නා කැමැති පුතනුවන්ට සෙවනය කටයුතු පුරුෂයන්ගේ ගුණ දැක්වීමෙන්ම එසේවූ පුරුෂයන් දුර්ලභ බව හඟවා මනුෂ්‍ය වාසයට යන ගමන් වළකා කිසුණු පරිකම්ම කියා ඩහන උප දවා බ්‍රහ්ම ලොකයට ගෙණැ යන්නාහුද ධම්මයෙන්ම ගෙණැ ගියහ. තව ද, **සඤ්ඣෙද ජාතඣයෙහි බරණැස් රජවැ** සිංහ වෘෂභ දෙදෙනාගේ මෛත්‍රී භෙදයට කාරණවූ සිවල්හුගේ සැබෑරූපය දක්වන්නාහු ද සියලු කුශලධම්ම විනාශ කාරණවූ අකුසල ධම්මයන්ගේ සැබෑරූප දැක්මට පුළුවන් නිමිත්ත දැක්වූහ. තව ද, **චුල්ලකුණාල ජාතඣයෙහි පක්ඣිවැ** සිටැ සත්‍රින්ගේ අව ගුණ දන්නාහු ද ධම්මයෙන්ම දත්හ. තව ද, **මඣහඣඩ පණ්ඩි තවැ** මිනිස් ලොවැ සිටැ දෙවතාවන් විචාරණ ප්‍රශ්නයෙහි අසූ දන්නාහුද ධම්මයෙන් දත්හ.

මෙසේ මාගේ සැමියන් විසින් අනන්‍ය ජාතියෙහි අනන්‍ය ප්‍රකාරයෙන් මෙනෙහි කොටැ පුරුදු කොටැ පරීක්ෂා කොටැ හස්තසාර කොටැ කුලඩන කොටැ වඩන ලද්දාවූ **ධම්මසම සරණ යෙමි සි දහම් සරණ යා සුතු.**

තව ද, **මණ්ඩුකුණ්ඩල ජාතකයෙහි** බරණැස් **රජවැ** රාජ්‍යය හැරැ ගත්තාවූ සතුරු රජහු කෙරෙහි අත තුබූ බත්පිඩ උදුරා හැරිගෙණැ සෙනහයෙන් කන ප්‍රිය පුත්‍රයක්හු කෙරෙහි සේ මෛත්‍රී කරන්නාහුද ධම්මයෙන්ම කළහ. තව ද, **සුජාත ජාතකයෙහි කෙළෙඹි පුත්වැ** මළ පියානන්ට හඬන්නාවූ තමන්ගේ පියානන් දැකැ මළ ගොණෙකු හොවා ලා ඕහට තණ ලාලා "තණ කා"සි ! තණ කාසි ! කිය කියා සිටැ තමන්ගේ පියානන් මපුතනුවෝ ව්‍යරුහුණු වන්හ සි කියා ගොසින් පුත තෙපි ව්‍යරුහුණුදැ සි කී කල්හි දැ හළුවැ ගියැ අපගේ මුත්තනු වන්ට හඬන තොපට වඩා අත් පා හිස් වාලඹි ආදී තුබූ සේ තුබූ වාවූ ගොණුට තණ ලන්නාවූ මම ව්‍යරුහුණිම්දැ සි කියා පියා නන්ගේ ශොක හරවන්නාහු ද ධම්මයෙන්ම හළහ. තව ද, **වෙනසාඛ ජාතකයෙහි** තමන්ගේ අවවාද නොකළාවූ රාජ කුමාරයා **රජදරුවන් දහසක්** ඇස් උදුරුවා යකකු එක් ඇසක් උදුරා ගෙණැ ගිය කල්හි ගිජුලිහිණියක කවින් ගැළවී හුණු ඇවින් දෙවන ඇස සිල්වැ ගියකල්හි හඬ හඬා මියැ නිරා වදනේ මාගේ සැමියන්ගේ ධම්මයෙන් යුකතවූ අවවාද නො කළවුන්ට වන විපත්ති දැක්විය.

තව ද, **උරග ජාතයෙහි** බමුණුවැ උරෙහිදැ දරුවන් මළ කල්හිදු මරණ සි භාවනායෙන් සිත්හි ශොක දුරුකරන්නාහුද ධම්මයෙන්ම දුරුකළහ. තවද, **සට ජාතකයෙහි රජවැ** තමන් ගේ රාජ්‍යය හැරිගත් රජහු කෙරෙහි මෛත්‍රී කරුණා කොටැ බඹුනය සිඳැ ගෙණැ ආකාශයෙහි පළක් බැඳැ හිඳිනාහුද ධම්ම යෙන්ම හුන්හ. තව ද, **සාරාණීය ජාතකයෙහි අනෙනවාසිකවැ** අනුන්ට නොකැමැති සේ සිල් දෙන්නාවූ ආචාර්‍යයන් හික්ම වන්නාහුද ධම්මයෙන්ම හික්මවූහ. තව ද, **ලටුකිකා ජාතකයෙහි මනාතහසනිවැ** බලවත්වැ සිටැ මාගේ බිජුවට නොමැඩැ මැනැවැ සි හැඩූ කිරිල්ලගේ බස් අසා මෛත්‍රීන් බිජුවට වළහා ගන්නාහුද ධම්මයෙන්ම වැඩියාහ. තව ද, **ධම්මපාල ජාතකයෙහි සන්මෑසි කුමරුවැ** සිටැ මහනෙල් මල්පෙති සේ මොළොක් අත් පා කපන්නාවූ පියරජහු කෙරෙහි මෛත්‍රී කරන්නාහුද ධම්මයෙන්ම මෛත්‍රී කළහ.

තව ද, **සවණ්ණමෘග ජාතකයෙහි** රන්වන් මුවවෑ මිලෙහි බැඳි මුවදෙනගේ ශකතීන් ගැළවෙන්නාහුද දැන් තමන් ප්‍රභූ බලයෙන් සංසාර සාගරයෙන් ගැළවෙන බවට පූර්ව නිමිත්ත දක්වූහ. තව් ද, **උසුකි ජාතකයෙහි සුපණ්ණරාජවෑ සුපණ්ණ** භවනයෙහිත් ගැහැණුන් රක්‍ෂාකොටැ ගත නො හැකි බව දක්වන්නාහු ද ධම්මයෙන් ම දැක්වූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණලද ධම්මයම මට රක්‍ෂා මන්ත්‍රයෙක. මට වජ්‍ර කවච යෙක, මට රක්‍ෂා ප්‍රාකාරයෙක, මට අමෘතෞෂධයෙක, මට අභිමතාර්ථ සාධා දෙන්නාවූ කල්ප වෘක්‍ෂයෙකැයි **දහම් සරණ යා යුතු.**

තව ද, **පණ්ණරෙහ ජාතකයෙහි වෘක්‍ෂ දෙවතාවෑ** සිටැ මිත්‍රවූ සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනා බිදුවන්නට කැණහිල්ලු ප්‍රයොග කොටැ අභිමතාර්ථ සාධාගත නොහී ගිය පරිදි දක්වන්නාහුද දැන් තමන් හිදුවූ ගුණ ධම්මයන් විසුරුවන්නට උත්සාහ කරන්නාවූ නීචකයන් හීනොත්සාහ වන බවට පූර්ව නිමිත්ත දුටහ. තව ද, **සිලවීමංස ජාතකයෙහි බ්‍රාහ්මණවෑ** සියලු ධන යට වඩා සිලධනයම උත්තම බව දැනැ හිමාලයයට වැදූ මහණ වන්නාහුද ධම්මයෙන්ම මහණ වූහු. තව ද, **නිදී ජාතකයෙහි බරණෑස් සිටුවෑ** මිත්‍ර ධම්මයෙහි ගුණ දැනැ එම මිත්‍ර ධම්මය රක්‍ෂා කරන්නාහුද ධම්මයෙන්ම රක්‍ෂා කළහ. තව ද, **අහි තුණ්ඩික ජාතකයෙහි ධාන්‍ය වාණිජවෑ** එන් වරෙක්හි දෙප දුටුවාවූ වානරයා අහිතුණ්ඩකයා හැරැ පැල බව දක්වන්නාහු එක්වරෙක්හි තමා සිතින් පැල කෙලශයන් නැවත තමන් කරා නොවදනා බවට පූර්ව නිමිත්ත දක්වූහ. තව ද, **ගුම්බිය ජාතකයෙහි වෙළඳවෑ** මධුවණ්ණවූ විෂය මිශ්‍රය සි කියා කන්නට වන්නාවූ තමන්ගේ පරිවාර ජනයාට එහි ආදීනව හඟවා නො කෑ දී රක්‍ෂා කරන්නාහු "දැන් පඤ්චකාමයන් මධුරයයි අනුභව කොටැ නස්නට සිටි සියලු ලොව ගළවා අමාමහ නිවන්හි දක්වන බවට" පූර්ව නිමිත්ත දක්වූහ.

තව ද, **සාලිය ජාතකයෙහි කුමාරවෑ** තමන් කා මරම් හයි සිතූ සපියා තරවා උගුර් හෙණැ භූමියෙහි හෙළා දුරුවන් නාහුද දැන් තමන්ගේ සිත්හි පවත්නාවූ කෙලශයන් දුරු කොටැ කෙල'ශොපද්‍රවයන් ගැළවෙන බවට පූර්ව නිමිත්ත

දක්වන්නාහුද ධම්මයෙන්ම දැස්වූහ තව ද, **නවසාර ජාතක** යෙහි **ග්‍රාමජාත දූරක්ඛවෑ** සම්ප්‍රාප්තවූ මරණයෙහි සෙසු ගම් දරුවන් දෙමිනස් පත් නො වන්නට අවවාද කොටැ තුබූද දෙමිනස් පත් නොවැ ප්‍රසන්නවූ මුඛ ඇතිවැ 'රජ්ජුරුවන්ට ඛණ කියා සපරිවාරවැ මරණින් ගැලවෙන්නාහු ද ධම්මයෙන්ම ගැලවුනාහ. තව ද, **මිත්තවින්ද ජාතකයෙහි දිව්‍ය පුත්‍රවෑ** ඔසුපත් නරකයෙහි හි චක්‍රායුධයෙන් හිස කැපෙන්නාවූ පුරුෂයා දැකැ යථාලාභ සන්තොෂයක් නැතිවීමෙහි ආදීනව වදුරන්නාහුද ධම්මයෙන්ම වදාළහ. තව ද, **සලාඝිජාතක යෙහි සුවණ්ණ හංසවෑ** තමන්ට මිත්‍රවූ වෘක්ෂ දෙවතාවාගේ විමානය පිහිටි ගසට විනාශ කරවූ නුගගස වැඩෙන බව කියා එයින් දුරුවන්නට උත්සාහ කරවාද ඔහු එසේ නොකළි කල්හි ක්‍රමයෙන් වැඩි ගියාවූ නුග ගසින් ඔහුගේ විමානයට පිහිටවූ වෘක්ෂය නටකල්හි හංසරාජයා කිවා නො කෙළේවී නම් තමන් වදාළ අවවාද සිහිකරණ පරිද්දෙන් නිරිසන්වැ සිටැ දෙවතාවාට අවවාද දෙන්නාහුද ධම්මයෙන්ම දුන්හ.

මෙසේ මාගේ සැමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණලද ධම්මයම සරණ යෙමි. ඒ මට ඉහටා'ඒ සිද්ධියට මහා චාරයෙකැ යි **දහම් සරණ සා සුකු.**

තව ද, **දිසීති කොසල ජාතකයෙහි දිසාසුජක කුමාරවෑ** මවුපියන් මැරූ රජ්ජුරුවන් හිසකේ අල්වා ගෙණැ කඩුව හයා ගෙණැ **"අනුන් කොරෙහි මෙහ නොකළ මැනැවැසි"** මවුපියන් දුන් අවවාද සිහි කොටැ ගුරුවචනයට උල්ලඞ්ඝනයක් නො කරන්නාවූ මා නොපට කළ අපරාධ මහත් වුවත් නොපට කිසි ද්‍රෝහයක් කට නො හෙම්යි තමන් අත කඩුව සතුරු රජහු අතට දුන්නාහු ධම්මයෙන්ම දුන්හ. තව ද, **මිගපොතක ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවෑ** වැටුඹු මුවා මළහයි ශොක කරන්නාවූ තාපසයාගේ ශොක දුරුකරණ පිණිස දිව්‍ය ලොකයෙන් අවුත් අවවාද කියා ඔහුගේ ශොක දුරුකරන්නාහු ද ධම්මයෙන්ම දුරුකළහ. තව ද, **මූසික ජාතකයෙහි දිසාපාමොක් ඇවාසීවෑ** තමන් කෙරෙහි විද්‍යා'භ්‍යාස කළාවූ කුමාරයාට පුත්‍රයා විසින් වන උපද්‍රව දුරු කරන්නාහු ද ධම්මයෙන්ම දුරු කළහ. තව ද **චුල්ල ධනුග්ගහ ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවෑ** සමණන් අතැ කොපුව තබා සොරු අතැ කඩුව තබා සමණන් මරවා සොරහට අඹුවෙමි යි සිතා ඒ සොරහු විසිනුදු

කෙළෙහි ගුණ නො දන්නා එකෙකැ සි හැරැ ගිය කල්හි දෙතැනින් ම පිරිහී හඬන්නා වූ ගැහැණිය හුන් තැනට කැණහිල් වෙසින් අවුත් මස් කැවියක ඩැහැ ගෙණැ යෙමින් සිටැ මස් වෙස් ගත් **මානලිඟු** දියෙන් ගොඩට පනන්නා හා මස් ගන්මි සි කවැ තුබූ මස් ගඩුව හෙළා පියා ගිය කල්හි ලිහිණී වෙස් ගත්තා වූ **පඤ්චසිඛයා** මස් ගඩුව හැරැ ගෙණැ අහසට නැඟි කල්හි මනුෂ්‍යයා ද පැනැ දියෙහි හුණු කල්හි මවිජ මාංශ දෙකින් පිරිහි තමන් දුකැ සි සූ. ඒ කෙළෙහි ගුණ නො දන්නා ගැහැණියට අපහාස කරන්නාහු ද ධම්මයෙන් ම කළහ.

තව ද, **ඝපොත ජාතඛයෙහි ඝපොතවැ** ලොල්වැ නටුවා වූ කාකයාට අවවාද දී තමන් කී අවවාද නො ගෙණැ ඔහු නට සේ දුකැ බණ වදුරන්නාහු ද ධම්මයෙන් ම වදුළහ. තව ද, **ආවාරිය ජාතඛයෙහි නාපසවැ** අවෙහයෙහි අනුසස් වදුරණ සෙයෙක් ද ධම්මයෙන් ම වදුළ සෙයෙක. තව ද, **සෙනකෙතු ජාතඛයෙහි සුරොහිනවැ** චණ්ඩාලයා විවාළ ප්‍රශ්න කියා ගත නොහී තමන්ගේ අත වැස්සා ඔහු යට පස් සෙන් ගිය කල්හි ඒ ප්‍රශ්නයෙහි අර්ථ බුඩ විලාසයෙන් වදුරන්නාහු ද ධම්මයෙන් ම වදුළහ. තව ද, **දසීමුඛ ජාතඛයෙහි බරණැස් රජවැ** පසේ බුදුන්ගේ අවවාද අසා රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ. තව ද, **සුනෙරු ජාතඛයෙහි සවණ්ණ හංසවැ** වසන්නාහු ද සියලු සතුවයන් එකවණ්ණ කරන්නාවූ පවිතය දුකැ මේ පවිතය උත්තමා'ධම දෙපසෘයම එකවණ්ණ කරණ පවිතයෙක. ගුණ' ගුණ විභාගකරණ නැනෙක්හි මුත් මෙසේ වූ නැනැ වසන බව සුදුසු නො වෙයි කියා ඒ පවිතය හැරැ යන්නාහු ද ධම්මය ම තකා ගියහ.

තව ද, **ආසඛක ජාතඛයෙහි නපස්විවැ** පදමඟියෙන් ගෙණැ වැඩූ දියණියන් රජහට දෙන්නාහු දැන් තමන් ලද නිධාණ සම්පත්තිය ලෝවැස්සාට දෙන බවට පූර්වනිමිත්ත දැක්වූහ. තව ද, **මිගලොප ජාතඛයෙහි ගිජු ලිහිණිවැ** තමන්ගේ අවවාද නො ගත්තා වූ ගිජඬු පොතකයා වෙරම්බ වාතයෙහි නට බව පෑ සෙළු ගිජඬුයන්ට අවවාද දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. තව ද, **සිරිකාලඛණ්ඩි ජාතඛයෙහි බරණැස් සිටුවැ** තමන්ගේ යහන්හි ගැවී ගිය ශ්‍රී දෙවතාවා

සියලු දෙවතාවන් මැඩැ අනුතත් විල ගැළී නහා නිවෙන පරිද්දෙන් කරන්නාහු දැන් තමන්ගේ ධම්මයෙහි පා හළුවන සියලු සතුට ලොකයා මැඩැ අමෘත මහා නිවීණයට වැදූ සැනහෙන බවට පූවීනිමිත්ත දැක්වූහ.

මෙසේ මාගේ සැමියන් විසින් අනාගත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යාස කරණ ලද **සච්චධම්මය** ම මට **සියලු අහි මනා'ඵල සාධා දෙන්නේය සි දහම් සරණ** යා යුතු.

තව ද, කුඤ්ඤුට ජාතකයෙහි කුකුළුවෑ සිටැ බැලළුගේ වඤ්චා දැනැ ඇ අතින් ගැළවෙන්නාහු ද ධම්මයෙන් ම ගැළවුනාහ. **තව ද, ඛන්ධඛවජ ජාතකයෙහි පක්ඛිරාජවෑ** තපස් වීම් සි කියා අඤුන පක්ෂීන් බඳ ගෙණැ ඔවුන්ගේ බිජුවට කන්නා වූ කවුඩුවාගේ වඤ්චායෙන් පක්ෂීන් රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. **තව ද, නන්දිය මිග රාජ ජාතකයෙහි මුවවෑ** සිටැ මවු පියන් රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. **තව ද, බ්‍රහ්මදත්ත ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවෑ** අඩුවට මනුෂ්‍ය කියා හිනි වදනා රජහු කෙරෙහි කරුණායෙන් දිව්‍යලොකයෙන් අවුත් ඔහට ජීවිත දානය දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. **තව ද, සුචි ජාතකයෙහි කඬුරුවෑ** කඬුරු පෝරු වෙයෙහි හිඳිකටු විකොවැ සියලු දඹදිව් වැසි කම්මි කාරයන් නොගත හුණු කඬුරු දුව ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ. **තව ද, සංඛ්‍ය කකිටක ජාතකයෙහි බ්‍රාහ්මණවෑ** තමන්ගේ මිත්‍ර වූ කකුළුවාගේ බලයෙන් තමන් කා මැරූ සපියා දකැ ඔහට උපදෙස් දුන් කවුඩුවා හා දෙදෙනා කෙරෙන් වන උපද්‍රවයෙන් දුරුවැ ජීවිත ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ.

තව ද, මයහක සකුණ ජාතකයෙහි මහා ධන සිටුවෑ සියලු වසතුව හැරැ මහණවැ තමන් කරවූ දන්හල විදහා දන් පිරිහෙළූ මල්හට බණ කියා දන්හල් පෙර පරිද්දෙන් පවත්වන්නාහු ද ධම්මයෙන් ම පැවැත්වූහ. **තව ද, 1 පබ්බජිත විහෙඨ ජාතකයෙහි ශක්‍ර දෙවෙන්ද්‍රවෑ** තපස්වී වෙශධාරී වූ දිව්‍ය විද්‍යාධරයා බිසවුන් හා කළ අනාචාර දැකැ තපස්වීන් කෙරෙහි කලකිරුණු රජහු කෙරෙහි කළ කරුණායෙන් පසේ බුදුකෙණකුන් වහන්සේ පළමු කොටැ ලා තමන් වහන්සේ

1 කරපත්‍ත-සිං. බ්‍රහ්මගෙඨ ජාතකය-සිං.

වැදෑ වැදෑ ආකාශයෙහි සිටෑ රජ්ජුරුවන් අවුත් "ශක්‍ර දෙවෙන්දුවැ සිටෑ මේ තපස්වීන් කුමක් පිණිස වදුදැ" යි කී කල්හි තපස්වීන්ට කරණ නමස්කාරයෙහි අනුසස් දක්වා රජහු හා ලෝවැස්සන් කුසල්හි යොදන්නාහු ද ධම්මයෙන් ම යෙදූහ. තව ද, 1 **උපසිඬ්ඝපුප්ඵ ජාතකයෙහි තපස්වීවැ** නෙලුම් මල ගිඹිමින් සිටෑ සුවඳ සොරය යි හඬ ගැහැවූ දෙවතාවාගේ බස් අසා එපමණකුදු දුශ්චරිතයෙක් වනැ යි එයින් දුරු වන්නාහු ද ධම්මයෙන් ම දුරුවූහ.

තව ද, 2 **විසාඛාදේ ජාතකයෙහි ශක්‍රදෙවෙන්දුවැ** සිටෑ වලට වැදූ මහණවැ තපස් නො කොටැ කෙලෙසි වසන්නාවූ තපස්වීන් කෙරෙහි අනුග්‍රහයෙන් ගිරා වෙසින් අවුත් බණ කියා ඔවුන් තපස්වී බැව්හි පිහිටුවන්නාහු ද ධම්මයෙන් ම පිහිටුවූහ. තව ද, **වට්ටක ජාතකයෙහි වටුවැ** ප්‍රණීත භොජන කන කවුඩුවා ලද දෙයෙහි සන්තොෂයක් නැති හෙයින් කෘෂ වන බව අසා තමන් අමධුර භොජනය අනුභව කරනුදු ලද දෙයෙහි සන්තොෂ ඇති හෙයින් සුඵල වන බව වදාරන්නාහු ද ධම්මයෙන් ම වදාළහ. තව ද, **කාක ජාතකයෙහි පරෙව්වැ** ලොල භාවයෙන් බරණැස් රජ්ජුරුවන්ගේ මුළුතැන්ගෙට වැද නටුවාවූ කාකයා දුකැ ලොලතාවයෙහි ආදීනව හා අලොලතාවයෙහි අනුසස් මෙනෙහි කරන්නාහු ද ධම්මයෙන් ම මෙනෙහි කළහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්‍ය ජාතියෙහි මෙනෙහි කරණ ලද්දාවූ ධම්මයම සරණ යෙමි යි ඒ ම මට ඉෂ්ටා'ඵල සාධා දෙන්නා වූ දිව්‍ය මන්ත්‍රයෙකැ යි **දහම් සරණ සා සුතු.**

තව ද, **කුක්කු ජාතකයෙහි පණ්ඩිතා'මාත්‍යවැ** අධාර්මිකවූ රජ්ජුරුවන්ට කැණී මඩල සීර වූවහොත් හොණැස් සීර වෙයි. හොණැස් සීර වූවහොත් අමාත්‍යාදී සියලු රාජ්‍යය සීර වෙයි. රාජ්‍යය සීරවූ කල්හි රජ ද සීර වන්නේය යි අවවාද කියා අධර්මිෂ්ඨවූ රජහුගේ අධර්මය හරවන්නාහු ද ධම්මයෙන් ම හැරවූහ. තව ද, **මනෝජ ජාතකයෙහි සිංහ රාජවැ** තමන්ගේ ධර්මිෂ්ඨවූ අවවාද නො ගිවිසැ සිංහයා රජ්ජුරුවන්ගේ අශ්ව ශාලායෙහි අසුන් හන්මි යි විනාශයට පැමිණි බව දක්වන්නාහු ද අද දක්වා තමන්ගේ ධම්මය නො වරදවා ලෝවැස්සන් පිළිගත මනා බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද,

1 මිනපුපඵ ජාතකය. පුෂ්පගන්ධි ජාතක-සිං. 2 විසාඛ ජාතකය.

සුතන ජාතකයෙහි තමන්ගේ ප්‍රභූබලයෙන් යක්ෂයා අතින් ගැලවෙන්නාහු ද ධම්මයෙන් ම ගැලවුනාහ. තව ද, **ගිජඣ ජාතකයෙහි** ගිජුලිහිණිවෑ සිටැ මලෙහි බැඳි තමන්ට වන විනාශය නො සිතා තමන් විසින් රක්‍ෂාවන මවු පියන් දෙදෙනාගේ අනාථකමට ශොක කොටැ හඬා මලින් ගැලවෙන්නාහුද ධම්මයෙන් ම ගැලවුනාහ.

තව ද, **දබ්භපුප්ඵජාතකයෙහි** වෘක්‍ෂ දෙවතාවැ ඉපැදී අනුන් සතු මාංස විලොපනය කරන්නාවූ ශෘගාලයාගේ වඤ්චා ප්‍රයොග දන්නාහු ද ධම්මයෙන් ම දත්හ. තව ද, **දශාණ්ණක ජාතකයෙහි පණ්ඩිතා'මාත්‍යවැ** කෙලශ වසඟවැ චෛතසික රොගයෙන් මියැ යන්නාවූ රජහු තමන්ගේ අවවාදයෙන් රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. තව ද, **1ඝනතු ඝනත ජාතකයෙහි** ධම්මකථිකවූ **සෙනක** නම් **පණ්ඩිතවැ** බ්‍රාහ්මණියාගේ පසුම්බියේ හොත්තාවූ නයි ප්‍රභූ චක්‍ෂුසින් බලා ඔහුගේ දුක් මුදා මරණින් ගළවා සුවපත් කරන්නාහු ද ධම්මයෙන් ම කළහ. තව ද, **අරිඤ්ජය ජාතකයෙහි** රජහු විසින් රාජ්‍යයෙන් පැවරුව ද **ඝාඤ්ඤු** නම් තපස්වී වූ මට සුදුසු දෙයක් නො වෙයි කියා කිසිවක් නො ඉල්වන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. තව ද, **ඛදිර ජාතකයෙහි වඳුරුවැ** සිටැ පුරොහිතයා හිසැ වර්චස් ලූ අවිනීත වානරයා නිසා වන උපද්‍රව දැකැ තමන්ගේ සෙනාව හැරැ ගෙණැ ගොස් ඔහු පැහීන් හා කැවිවැ අවිනීත පාමින් නටකල්හි තමන් හා තමන්ගේ සෙනාව කිසි උපද්‍රවයකට පැමිණීය නො දී රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂාකළහ. තව ද, **ඛඬ්ඩභම ජාතකයෙහි ඛප්ප නම් තාපසවැ නාරද** නම් අමාත්‍යයා විසින් හිමාලයට ගෙණැ ගොශව නම් තාපසයාගේ රොගය තමන්ගේ දැහීන මාත්‍රයකින් ම සංහිදු වන්නාහු ද ධම්මයෙන් ම සංහිදුවූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි පුරුදු කරණලද ධම්මය ම සරණ යෙමි යි සත්පුරුෂයන් විසින් **දහම් සරණ සා සුතු.**

තව ද, **ඉන්ධාර ජාතකයෙහි** රාහු ගත්තාවූ චන්ද්‍රමණ්ඩලය දැකැ එපමණක් ආලම්බණය කොටැ රාජ්‍යය හැරැ මහණවැ තමන් වහන්සේ මහණවූ බැව් ඇසූ විදෙහ **රජ්ජුරුවන්ඳු**

1 **සෙනක ජාතකයෙහි**-සිං.

නමත්ගේ රාජ්‍යය හැරැ පියා මහණවැ නමන් වහන්සේ හා කැටිවැ ග්‍රාමා'නුග්‍රහයට අවුත් සෙට ට ය සි පතක ලුණු අසුරක් තැබුවා දැකැ රාජ්‍යයක් හැරැ පියා ලුණු මාත්‍රාවෙකැ ලොභ කළ සේ නුසුදුසුය සි අවවාද දෙන දැ ද ධම්මයෙන් ම අවවාද දුන් සේයෙක. තව ද, **මහාඛපි ජානඛයෙහි වානරවැ** ජීවිත සංසයට පැමිණියාවූ අසූ දහසක් වදුරන් පිරින් එතර කොටැ අනතයෙහි කෘතඥතාවූ වදුරා පිරින් පළාපි කල්හි තමන් ඛමාවැ වසන්නට නැඟූ සඵටික විමානයෙහි යොදැ ලූ ගොණුස්සේ පරාල ඇට පැණිගිය කල්හිදු මාගේ දැස පසුයා ගැළවුණු බැවින් මට මරණවූවත් කිසි චිත්තඛෙදයෙක් නැතැති නිවි සැනසී වැඩැ හෝනාහු ද ධම්මයෙන් ම වැඩැ හොත් සෙයෙක. තව ද, **කුම්භඛාර ජානඛයෙහි කුම්භඛාරවැ** ම අරමුණක් දැකැ සංසාර සාගර වෛරාග්‍යයයෙන් පසේ බුදුවූ මහතුන් දැකැ සම්පත්තිය හැරැ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණවූහ.

තව ද, **දළහධම්ම ජානඛයෙහි පණ්ඩිතා'මාත්‍යවැ** ශක්ති ඇති දැ මෙහෙ ගෙණැ අශක්ති දැ කිසි ගොචරයක් නො දී රජ්ජුරුවන් විසින් අනාථ කොටැ හරණලද්දාවූ තිරිසන්වූ ඔටු දෙනගේ අනාථකම් දැකැ රජ්ජුරුවන් කරා එළඹැ කෙළෙහි ගුණ දැන්මෙහි අනුසස් දක්වා ඇට පෙර පරිද්දෙන් සත්කාර සම්මාන තබා දෙන සෙයෙක් ද ධම්මයෙන් ම තබා වදාළ සෙයෙක. තව ද, **සොමදත්ත ජානඛයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවැ** බොහෝ අඹුදරුවන් හැරැ මහණවැ ඇත් පැටවක්හු පුත් කොටැ වඩා ඔහු මළ කල්හි ශොක කරන්නාවූ තපස්විහු කරා එළඹැ ඔහුගේ ශොකදුරුකරන්නාහු ද ධම්මයෙන්ම දුරු කළහ. තව ද, **සුසිම ජානඛයෙහි පුරොහිතවැ** තමන්ගේ රූපය දුටුවාවූ රජ්ජුරුවන්ගේ මැනියන් තමන් කෙරෙහි සෙනහ කොටැ ශොකා'තුරවැ පුතනුවන් කෙරෙහි පොවා ලජ්ජාවක් නැතිවැ තමන් පිණිසවූ ශොක කියා තමන් ඉල්වා ගන්නා පරිද්දෙන් රූපසම්පත්ති ඇතිවැ එම කාරණයෙන් තුමූ රජවැ මැනියන් පාවා දුන් රජ්ජුරුවන් යුවරජ කොටැ රාජ්‍යය කෙරෙමින් බිසවුන් හිස නරයෙකැයි අත කඩා ලා ලූ මාත්‍රයෙකින් ම ගෘහ වාසයෙහි ආදීනව දැකැ මහණවන්නාහු ද ධම්මයෙන් ම මහණවූහ.

තව ද, **කොට සිම්බලි ජාතකයෙහි වෘක්ෂ දෙවතාවෑ** ශබ්දය කළමනාකරුස්ථානයෙහි ශබ්දය කරන්නාහු ද ධම්මයෙන් ම ශබ්දය කළහ. තව ද, **ධූමකාරී ජාතකයෙහි විධුරපණ්ඩිතවෑ** අමුතුවෑ ඇතිවූ දැසඟන්ට සත්කාර කෙරෙම් යි පෙර නිබී ඇ දැසඟන්ට සත්කාර නො කොටැ ශුඛයෙහි පැරැදි රජ්ජුරුවන්ට දිව්‍ය විලාසයෙන් අවවාද කියා සියලු කටයුත්තට වඩා කුශල සඞ්ග්‍රහය ම කටයුතු බව දක්වා ඔවුන් දැනැදී සුචරිතයෙහි පිහිටුවන සෙයෙක් ද ධම්මයෙන් ම පිහිටුවූ සෙයෙක. තව ද, **ජාගර ජාතකයෙහි තපස්විවෑ** සිටැ සියලු මහාජනයා නිද්‍රා ප්‍රාප්ත කල්හිදු මනස්කාරයෙහි නිරතවෑ නිදි දුරු කොටැ සත් මණින් කල් යවා ඒ අනලස කමට සතුටුවූ වෘක්ෂ දෙවතාවන් අතින් සතුති ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ. තව ද, **කුම්මාසපිණ්ඩ ජාතකයෙහි අනාථවෑ** සිටැ කොමු පිඩක් දී රාජ්‍යය ලදින් ජාතිස්මරණ ඥානයෙන් තමන් කොමු පිඩක් දී ලා රාජ්‍යය ලත්බව සිහි කොටැ "මම මේ සා රාජ්‍යයක් කොමු පිඩක් දීලා ලදිමි"යි කී කල්හී මහජනයා මා කෙරෙහි අවමානය කෙරෙති යි නො සිතා මහජනයා මධ්‍යයෙහි කොමු පිඩක් දීලා තමන් රාජ්‍යය ලත්බව හඟවා දේවීන් ඇතුළුවූ සියලු නුවර වැස්සන්ට දැනයෙහි අනුසස් දක්වන්නාහුද ධම්මයෙන් ම හැඟවූහ. තව ද, **පරනන්ප ජාතකයෙහි රජවෑ මනුෂ්‍යවෑ** සිටැ කැණහිලුන්ගේ බස අසා දන්නාහුද දැන් තමන් බුදුවැ කිහිඹි කුතුඹුවන් ආදිවූ සියලු සත්ත්වයන්ගේ භාෂිතයෙහි අසා දනැ ඔවුන්ගේ අභිප්‍රාය දනැ බණ වදාරණ බවට පූර්ව නිමිත්ත දක්වූහ.

මෙසේ මාගේ සඞ්ඝයාගේ විසින් අනන්ත ජාතියෙහි අනෙකා'කාරයෙන් භාවිත කරණලද්දාවූ සද්ධම්මය ම මට සියලු අභිමතා'ර්ථ සාධා දෙන කල්‍ප වෘක්ෂයෙක. එහෙයින් ඒ ම මට අසාධාරණවූ සරණයෙකැ යි **දහම් සරණ යා යුතු.**

තව ද, **කුම්මාසපිණ්ඩ ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවෑ** ධම්මය මෙලේය යි කියා හඬන්නාවූ මැහැල්ල සිපි තැනට ආකාශයෙන් අවුත් ලොකයෙහි ධම්මය නම් නො මෙලේ මා ඇති කල්හි ධම්මයෙක් නම් නැද් ද? ධම්මයක් නැති කල්හි මා නම් ඇද්දැ?යි වදාරන්නාහු ද ධම්මයෙන් ම වදාළහ. තව ද, **අට්ඨසදද ජාතකයෙහි කාපසවෑ** යාගයට බැඳැ සිටවූ ප්‍රාණීන්

ගළවා ලොවට ශාන්ති කරන්නාහු ද ධම්මයෙන් ම ශාන්ති කළහ. තව ද, **කුලසා ජානකයෙහි වෘක්ෂ දෙවතාවෑ** තමන් ගේ උපාය ශක්තීන් සොරහු මරන්නාවූ ගණිකාව දක්නාහු තමන්ගේ ප්‍රඥා බලයෙන් සංසාරය මූලෝච්ඡින්න කරණ්ඩවට පූජනීමිත්ත දැකැ සිටි සෙයෙක. තව ද, **සුමඛල ජානකයෙහි රජවෑ** සිටැ සප්ත විලාසයෙන් රාජ ධම්මය කියන්නාහු ද ධම්මයෙන් ම වදාළහ.

තව ද, **ගඞ්ගමාල ජානකයෙහි උදය නම් රජවෑ** එක් රැයක් රැක්කාවූ සිලය කරණකොටැ ගෙණැ බ්‍රාහ්මණියගේ රාජ්‍යය ලබන්නාහු ද ධම්මයෙන්ම ලදහ. තව ද, **චේතිය රාජ ජානකයෙහි සකුල බ්‍රාහ්මණවෑ** තමන්ගේ අවවාද නොගිවිසැ බොරු කී රජහු අපායෙහි හෙන පරිද්දෙන් ලොවට ඉෂ්ටවූ අවවාද දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. තව ද, **ඉන්ද්‍රිය ජානකයෙහි සරභඞ්ග තාපසවෑ** පඤ්ච කාමා‘ස්වාදයෙහි ලොභයෙන් ධ්‍යානයෙන් පිරිහුනු තපස්වීන්ට අවවාද කොටැ ධ්‍යානය නැවත උපදවන්නාහු ද ධම්මයෙන් ම ඉපැදූ වූහ. තව ද, **ආදිත්‍ය ජානකයෙහි භරත මහරජවෑ** දක්ෂිණාවට සුදුස්සවුන් නෝරා මහාඵලවූ දන් දී අමෘත මහා නිර්වාණය සාධන්නාහු ද ධම්මයෙන් ම සැදූහ.

තව ද, **අධ්‍යාත්ම ජානකයෙහි ශ්‍රේෂ්ඨි පුත්‍රවෑ** දහසක් ගන්නා ගැණියට දවසින් දවස දහසක් දහසක් බැගින් දී එක් දවසක් රජගෙයි සිටැ කල්හිය හෙයින් ගෙට ගොසින් දහසක් ගෙණැ යා නොහී මෙතෙක්දා මා නිබඳයෙන් ම දහස් දහස් බැගින් ම දුන. අද එක දා සිස‘නින් හිය හෙයින් මට රැහණී වේද? සෙට දෙදහසක් එක් කොටැ දිලම් යි සිතා සිස‘නින් ගොස් නිකම් හිය බැව් දන්නාවූ වෙශ්‍රවණ එතෙක් කල් දවස් පතා දුන් වයතු නොසිතා සෙට දිවුණු දෙම් යි කියව කියවා අනුභව කෑමැති බව මුත් වයතුවට සිනහැනි එකෙකැයි කියා කර සප්පා දෙරලවා පි කල්හි ගැහැණුන්ගේ ආදීනව මෙසේ වනැයි සිතා පඤ්චකාමයෙන් ප්‍රයොජන නැතැයි සිතා සියලු සමෘඩ්ධ්‍ය හැර පියා මහණවැ පඤ්චා‘භිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොකයෙහි උපදනාහු ද ධම්මයෙන් ම උපන්හ. තව ද, **දිසා ජානකයෙහි තාපස්වීවෑ** සිටැ දිවියා අත හුනු ඒ ලියගේ විනාශ දක්නාහු ද තමන්ගේ විශුද්ධවූ ඥානයට හමුවූ කෙලෙශයන්ගේ විනාශ දැක්මට පූජනීමිත්ත දැක්වූහ.

තව ද, **ගිජඣ ජාතකයෙහි ගිජ්ඣලිගිණ්වෑ** තමන්ගේ අවවාදයෙහි නොසිටියන්ට වන විනාශ හා එහි සිටියවුන්ට වන අවිනාශය දක්වන්නාහු ධම්මයෙන්ම දුටහ. තව ද, **මහාසුවරාජ ජාතකයෙහි** හා **චුල්ල සුවරාජ ජාතකයෙහි ගිරාවෑ** සාමල් පල රුක් බල බලා පුරුදුවූ දිඹුල් කණුව නොහැරී තමන්ගේ ගුණයෙහි ප්‍රසන්නවූ ශක්‍ර දෙවෙන්ද්‍රයා ලවා ඒ රුක අම්බ ඵලයෙන් යුකත කොටැ සමෘඩ කරවන්නාහු ද ධම්මයෙන් ම කරවූහ.

මෙසේ මාගේ සඞ්ඝයින් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභිවෘඩියට පමුණුවා ලොවට සියලු ඉෂ්ටාර්ථයට මුල් කොටැ නඛා වදාළ ධම්මය සරණ යෙමි යි **දහම් සරණ සා සුතු.**

තව ද, **භදිනව ජාතකයෙහි** දෙර අඩවාළු කොටැ වැඩ හිඳ කෂිණය බැලූ මාත්‍රයකින් ම නවඛ්‍යනය උපදවා ගන්නාවූ ශක්ති ඇතිවැ පවා රාග වසඟවැ බන්ධනයෙන් පිරිහෙන සෙයෙක් ද දැන් තමන් වහන්සේ වදාරන්නාවූ කෙලෂයන්ගේ ආදීනවය දක්නා බවට පූර්වනිමිත්ත පෑ සේක. තව ද, **1 පදමානවක ජාතකයෙහි** ආකාශයෙහි සොරුන්ගේ පියවර දක්නා සෙයෙක්ද දැන් තමන් වහන්සේ කා විසිනුත් නොදන හැක්කාවූ **චතුරාෂ්‍ය සත්‍යඥානය** දක්නා බවට පූර්ව නිමිත්ත පෑ සෙයෙක. තව ද, **ලොමෂ හංශ්‍යෂ** ජාතකයෙහි චඤ්චවති නම් බිසවුන් පිණ්ස **තාපසවෑ** සිටැ ඇතු මරම් යි කඩුව හඹා ගෙණැ ඔහුගේ ආහිතසඤ්චරය අසා කානන්තාරයෙහි දුත්‍ර මාංස කන්නට යි අල්වා ගත් එකත්හු ඔහු හැවූ හඬට කරුණා කොටැ අත ඇදූ හන්නා සේ මරන්නට ගත් කඩුව හෙළා පියා "කෙලෂ වසඟවැ ප්‍රාණ වධ නොකෙරෙමි" යි ප්‍රාණාතිපාතයෙන් දුරුවන්නාහු ද ධම්මයෙන් ම දුරු වූහ.

තව ද, **චක්‍රවාක ජාතකයෙහි සක්වා වෑ** ද ලොලවූ කාකයාට තමන් අනුන්ට හිංසාවක් නොකිරීමෙන් වණ්ණ සම්පත්තිය වඩනා බවට කාරණ දක්වන්නාහු අවෙෂයෙහි අනුසස් වැදෑරීමෙන් ධම්මයට ම අනුග්‍රහ කළහ. තව ද, **හලිද්දරාග ජාතකයෙහි තාපසවෑ** සිටැ තපස්වී කුමාරයන්ට අසත්පුරුෂ ගුණයෙහි සඞරූප දක්වන්නාහුද ධම්මයෙන් ම දුන්වූහ. තව ද,

1 පදකුසල ජාතකය සි.

සමුගත ජාතකයෙහි දූතවරක්ෂසයා බඩැ හොත්තාවූ සත්‍රිය සොර සැමිවූ විදූඩරයා හා දෙන්නා නමන්ගේ ප්‍රඥාබලයෙන් දක්නාහු සාතවයන්ගේ සිත්හි පවත්නාවූ කා විසිනුත් නො දත හැක්කාවූ තෘෂ්ණාව හා වෙෂය හා දෙක බුදු නුවණින් දක්නා බවට පූර්වනිමිත්ත දැක්වූහ. තව ද, පූතිමංස ජාතකයෙහි වෘක්ෂ දෙවතාවැ පූති මාංශ පරෙෂ්ෂණය කරන්නාවූ ශෘගාල යාගේ සැබෑරූප දක්නාහු දැන් කාම ලොලවූ සතවයාගේ සැබෑරූප දක්නා බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, නිනතිර ජාතකයෙහි වටුවැ සිටැ වෙදැත්‍රය උගන්නාහු ද තමන්ගේ ප්‍රඥා ප්‍රකර්ෂය ත්‍රිභුවනා'නිශායි වන බවට පූර්ව නිමිත්ත දැක්වූහ. තව ද, චතුමාර ජාතකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රවැ නො කිකරු බැවින් නටුවාවූ මිථාත්විදෘෂ්ඨයාගේ තිව්‍රවූ දුඃඛානුභවය දන්වන්නාහු ද ධර්මයෙන් ම දුටහ. තව ද, කණහ ජාතකයෙහි තාපස්විවැ සිටැ මනුෂ්‍යවූ තමන් කරා ආවාවූ ශක්‍රදෙවෙන්ද්‍රයා සතුටුවැ වරගන්ව යි කී කල්හි සියලු අභිමතා'ර්ථයන් ශක්‍රයා විසින් සිඛවතුදු බ්‍රහ්මචරියා නිඃශ්‍රිතවූ වර ගන්නාහු ද ධර්මයෙන් ම ගත්හ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් අභ්‍යාස කොටැ පුරුදු කරණ ලද්දාවූ ධර්මය සරණ යෙමි යි දහම් සරණ ය යුතු.

තව ද, චතුපොෂධික ජාතකයෙහි ක්‍රොධ කටයුත්තනුකෙරෙහි ක්‍රොධ නො කිරීමෙහි අනුශස් වදාරන්නාහු ද ධර්මයෙන් ම වදාළහ. තව ද, සඛබ්‍රාහ්මණ ජාතකයෙහි ශඛබ්‍රාහ්මණවැ මහා සමුද්‍රයෙහි නැවූ බිඳි සත්දවසක් මුහුදු පිනා නැවූ නැගෙණ සමයෙහි පසේ බුදුන් වහන්සේට පිළිගැන්වූ වහන් සහළෙහි අනුශසින් මුහුදු මධ්‍යයෙහි මණිමෙඛලා නම් දෙව්දුව මැවූ සත්රුවන් මහ නැව ලබන්නාහු ද ධර්මයෙන් ම ලදහ. තව ද, චුල්ලබොධි ජාතකයෙහි බොධි තාපසවැ හාහසථ සමයෙහි පාදපරිචාරිකාවැ මහණ වන සමයෙහි කැටිවැ මහණවූ බුදුවන දවස් දක්වා නො හැරැ අඹුවූ පරිබ්‍රාජිකාවන් කෙලෙශ වසඟයෙන් බලා හඬව හඬවා උයනින් රජගෙට ගෙණැ යන කල්හි ඔවුන්ගේ හඬ අසා චිත්තයෙහි ශොක මාත්‍රාවක් නො උපදවන්නාහු ද ධර්මයෙන් ම නො ඉපැදවූහ. තව ද, කණ්හදීපායන ජාතකයෙහි තාපසවැ

පණස් හවුරුද්දක් මුළුල්ලෙහි කාම වසඟවැ ද චිත්තයෙහි බලවත්වූ කාමරාගය පවතුදු රාග වසඟවැ තිබී කාය ප්‍රයෝග යක් වත් මාක් ප්‍රයෝගයක් වත් නොකරන්නාහු ද ධම්මයෙන් ම නොකළහ.

තව ද, **නිග්‍රෝධමිග ජාතකයෙහි නිග්‍රෝධ රජවැ** අකෘතඥවූ **ශාඛා කුමාරයාගේ** කෙළෙහි ගුණ නොදන්මට නිදු කරන්නාහු ද ධම්මයෙන් ම නිදු කළහ. තව ද, 1 **නඞ්ගල ජාතකයෙහි පණ්ඩිත කුමාරවැ**, සත්‍රු වසඟවූ පියානන්ට බණ කියා ගැහැණියගේ බසින් තමන්ගේ පියානන් මරා නරකයෙහි හී අනන්ත කල්පයක් මුළුල්ලෙහි දුක් ගන්නා පියානන් වහන්සේ ගළවන්නාහු ද ධම්මයෙන් ම ගැළවූහ තව ද, **මහා ධම්මපාල ජාතකයෙහි ධම්මපාල කුමාරවැ** පඤ්චශීලය රක්ෂා කොටැ වැළඳුවැ මනා පරමායුෂයෙන් එක අසයෙකුදු නොහැරී වළඳන්නාහු ද ධම්මයෙන් ම වැළඳූහ. තව ද, **කුක්කුට ජාතකයෙහි කුක්කුට නම් පක්ෂිවැ** තමන් වහන්සේ මරන්නට ප්‍රයෝග කළාවූ උකුස්සා අතින් ගැළවෙන සෙයෙක් ද ධම්මයෙන් ම ගැළවුනු සෙයෙක.

තව ද, **මටටකුණ්ඩලී ජාතකයෙහි** මියැ දිව්‍ය ස්ත්‍රීවැ තමන් වහන්සේ පිණ්ස හඬන්නාවූ පියානන් වහන්සේගේ ශොක දුරුකරණ පිණ්ස දෙව්ලොවින් අවුත් බණ වදාරණ සෙයෙක් ද ධම්මයෙන් ම වදාළ සෙයෙක. තව ද, **බිලාලඝෝසිය ජාතකයෙහි ශක්‍රදෙවරාජවැ** තණපතක් අගැ වැදගත් තෙල බිඳු මාත්‍රයකුදු ලොභයෙන් අනුභවට නොදෙනාවූ සිවුනට අනුග්‍රහ කරණු පිණ්ස දෙව්ලොවින් අවුත් බණ වදාරා ගිය ජාතියෙහි දන් දී තමන් වහන්සේ දිව්‍යවූ බව ප්‍රකාශ කොටැ මස්සු සිටානන් එනැන් පටන් කොටැ නිවන් දක්නා ජාති දක්වා ඔවුන් තමන් ලද්දාවූ සුණු සුභකුදු අනුභවට නොදී නොකන පරිද්දෙන් දැනා'නිරත කරණ සෙයක් ද ධම්මයෙන් ම කොටැ වදාළ සෙයෙක.

මෙසේ මාගේ සැමියන් විසින් අනන්ත ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් ලොකා'ර්ථ තත්පරවැ පුරුදු කරණ ලද්දාවූ සබ්බම්ම ය ම සරණ යෙමියි **දහම් සරණ යා සූත්‍ර.**

---

1 සඤ්ඤාදි.

තව ද, චතුවාහ ජානනයෙහි සත්වාවෑ බාරාණසියෙහි හැසිති කුණපාදීන් අතෘප්තවැ මහා හිමාලයට වැද එහිදු පලා පලයෙන් අතෘප්තවැ ගඩොනදියට ගොස් තමන් දුකැ "ඔන්ඉනා යහපත්:- බොහෝ මනුස්‍ය මාංශ කන හෙයින් වන. "ඔවුන් කන ආහාරය මාත් කව මැනවැ සි" සිතා තෙපි කවර ආහාරයක් කා වණ්ණ සම්පන්නාවූ දැයි විචාළ කාකයාට සෙවෙල් මාත්‍රයක් කා ලත් දෙයෙහි සනෙතාෂයක් ඇති හෙයින් වණ්ණ සම්පත්ති ඇති බව්ට කාරණ වදාරන්නාහු ද ධම්මයෙන් ම වදාළහ. තව ද, භූරිදත්ත ජානනයෙහි ප්‍රඥා සම්පත්තියෙහි ගුණ දන්නාහු ද ධම්මයෙන් ම දන්හ. තව ද, මහාමඛාල ජානනයෙහි මනුෂ්‍යවැ සිටැ සියලු මනුෂ්‍යයන්ගේ හා දෙවියන්ගේ හා බ්‍රහ්මයන්ගේ සිත සැක හැරැ මඛාල ප්‍රශ්න වදාරණ සෙයෙක් ද ධම්මයෙන් ම වදාළ සෙයෙක.

තව ද. සනපජාඛින ජානනයෙහි සන පජාඛිනවැ මළ පුතනුවන්ට හඩන්නාවූ වාසුදෙව නම් බැනන් දුකැ ඔවුන්ගේ ශොක දුරුකරණ උපාය සිතා නුඹ්ල වියරු වෙස් ගෙණැ "සහ වක දෙව! සහවක දෙව" සි හඬා විටියෙහි දිවෙමින් තමන් වියරුහුණු බව ඇසූ වාසුදෙව නම් රජ්ජුරුවන් පුත්‍ර ශොකයට වඩා තමන් කෙරෙහි කළ ශොකයෙන් අවුත් නොප කවර සාවකට හඩන්නේද සි විචාරා මා අනික් සාවකට නොවෙ සි හඩන්නේ:-චතුම්මහාරාජයෙහි සාවටය සි කී කල්හි තෙපි අසුන කෙණහු ද? සදමඩලෙහි නුබ්ල සාවා කෙසේ ලැබේද?සි කී කල්හි මහරජ! මට වඩා උම්මත්තකයා නොපිය. මම වූ කලි පැණෙන්නාවූ සාවාට හඩමි. තෙපි වූ කලි"මේ නැනට ගියේය" "මෙනැන හුනනේය" යන විභාගයක් නැතිවැ ම මළ පුතනුවන්ට හඩන්නේ සි අවවාද කියා ඔවුන්ගේ සිත සොක දුරුකරණ සෙයෙක් ද ධම්මයෙන් ම ශොක දුරු කොටැ වදාළ සෙයෙක.

තව ද, මාතුපොසඛ ජානනයෙහි ඇත්වැ සිටැ දෙදළ අල සාරා කෙවි කොටැ සොඬ ඵලාඵල ඇදූ පිඬා කොටැ සොඬ සිදුවින් මැනියන් වහන්සේ ඇඟ නෙමා ගිම්නිවා අදනා පැනින් නොපමා කොටැ මැනියන් වහන්සේ රක්‍ෂා කොටැ බරණැස් නුවර රජ්ජුරුවන් තමන්ගේ රාජ්‍යය පුදා දඹදිව්හි මඩ්ඣල හයනිව සි ආරාධනා කළ කල්හිදු රාජ්‍යයෙහි අපෙක්‍ෂාවක් නොමැකොටැ අනාථවූ මැනියන් වහන්සේ පිණිස ම හඬා

නමන් වහන්සේගේ බස් ඇසූ රජ්ජුරුවන් ඒ ගුණෙහි පහන් වැ "තොපගේ මැනියන් රක්ෂා කරව"යි මුදා හළ කල්හි අඹුවූ මැනියන් වහන්සේ සිවි තැනට ගොස් සොඬින් ඇහනිවා පැන් ඉසැ පලාපල කවා ශොක දුරුකොටැ දුන් **අනඳමහ තෙරුන් වහන්සේ** තමන් වහන්සේගේ ඉඟි දුනැ උපස්ථාන කරණ පරිද්දෙන් මැනියන් වහන්සේගේ ඉඟි දුනැ උපස්ථාන කරණ සෙයෙක් ද ධම්මයෙන් ම උපස්ථාන කළ සෙයෙක.

තව ද, **ජුණහ ජාතකයෙහි බරණැස් රජවැ** කුමාර සම යෙහි **තක්ෂලා** නුවර ශිල්ප උගන්නට ගිය කල්හි උරයෙන් උරය ගැසි ගියාවූ බ්‍රාහ්මණයාට එපමණ පුරුදුකමෙක්හි ගුණ දුනැ ගම්වර පසෙක මිඩියෝ සියයෙක. සත්සියයක් හෙරිය මැණික් දහසකට වැඩියෙක. කුල ශිල ගුණෙන් අනුරූප අඹුවෝ දෙදෙනෙක. යනාදීන් බොහෝ සම්පත්හි දෙන්නාහු දුන් තමන්ගේ සස්නෙහි වැඳ පය පහළවන්නට **නවලොකොත්තර** ධම්ම දෙන බවට පුළු නිමිත්ත දක්වන්නාහු ද ධම්ම යෙන් ම දැක්වූහ. තව ද, 1 ධම්මදෙව **පුඤ්ඤ ජාතකයෙහි ධම්ම නම් කාමාවචර දිව්‍යපුත්‍රවැ** දිව්‍ය ලොකයෙහි අනුභව කරන්නාවූ පඤ්චකාම සුව තබා රථයක නැඟි මනුෂ්‍ය ලොකයෙහි ඇවිදින සතුටයන්ට කුසල්හි අනුසස් කියා සියලු **ජම්බුදීපවාසීන් දශ කුශල කම්මපථ** ධම්මයෙහි පිහිටුවන සෙයෙක් ද ධම්ම යෙන් ම පිහිටුවූ සෙයෙක.

තව ද, 2 **උදඤහදද ජාතකයෙහි උදඤ රජවැ** දෙලොස් යොදනක් පමණවූ **සුරිඤ්ඣන** නම් නගරයෙහි රාජ්‍යය කෙරෙමින් මහත්වූ ඓශ්වර්‍යයෙහි සිටැ දිව්‍යස්ත්‍රීන් සමාන රාජ කන්‍යාවන් හා සත්සියයක් හවුරුදු එක ගබ්ඩාවේ වෙසෙමින් ද ඇසිපිය හෙළා ලන ක්ෂණයෙක් ද කෙලඹ වසඟවැ ඔවුන් බුහුණ නොබලා බ්‍රහ්මවර්‍යාව රැකැ මරණින් මත්තෙහි ශක්‍ර භවනයෙහි ශක්‍රදෙවෙඳුවැ උපදනාහු ද ධම්මයෙන් ම දෙව් ලෝ ගියහ. තව ද, **පානීයජාතකයෙහි බරණැස් රජවැ** පසේ බුදුන් වහන්සේගෙන් බණ අසා පඤ්චකාමයෙහි ආදීනව දුනැ සත්යොදුන් **කසිරටයෙහි** හා දෙලොස් යොදුන් **බාරණසි රාජධානියෙහි** හා නානා ප්‍රකාර වස්තු කාම කෙලඹ කාමයෙහි අපේක්ෂා නැතිවැ සුදු බිත්ත බල බලා ධ්‍යාන හා

1 ධම්මජාතකය-සිං. 2 උදය-සඤ්ඤ-ආ.

අහිඤ්ඤ උපදවා ආකාශයෙහි වැඩ හිඳ අගමෙහෙසුන් බිස වූන්ට හා සියලු නුවර වැස්සන්ට බණ වදාරා හිමාලයට වැඩ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ. තව ද, **සුඛසඤ්ඤය ජාතකයෙහි සුඛසඤ්ඤය නම් රාජ කුමාරවෑ සූයෑ රජවීන්** වියලී ගියැ පිනිබිඳෙහි අනිත්‍යතාව දැකැ සියළු සත්ත්වයන්ගේ ආයුසංස්කාරය ද මෙසේ අනිත්‍යයැ යි ප්‍රත්‍යක්ෂ කොටැ ක්‍රමා ගත වූ රාජ්‍යය හැරැ පියානන් වහන්සේ අනුදන්වා හිමාලයට වැද මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ.

මෙසේ මාගේ සැමීන් විසින් මා එකගැන්තහු රක්‍ෂා කරණ පිණිස මෙන් මට සුව දන පිණිස මෙන් මට අභිමතාර්ථ සාධා දෙන පිණිස මෙන් මා ලවා ම සියලු ලොකාර්ථ කරවම් යි යන අභිප්‍රායයෙන් මෙන් අනෙක ජාතියෙහි පුරුදු කරණ ලද්දාවූ අමා මහ නිවන් සම්පත් සාධාදෙන ධම්ම රත්නය සරණ යෙම් යි **දහම් සරණ යා සුතු.**

තව ද, **දසරථ ජාතකයෙහි රාජකුමාරවෑ** පියානන්ගේ නියොගයෙන් අරණ්‍යයට ගොසින් තමන් වහන්සේ වලට වැඩි නවවන අවුරුද්දෙන් පියානන් වහන්සේ සැඟිසිටූ බව අසා "**සිඝලු සංස්කාර ධම්මයෝ අනිත්‍යහ**" යි ශොක ඉවසා වදාරා මාගේ පියානන් වහන්සේ මා වලට එන කල දෙලොස් හවුරුද්දකින් මා මළ කල්හි නොපගේ රාජ්‍යය නොපි ම ගන්ව යි වදාළ සෙයෙක. ඉදින් මම උන්වහන්සේ මළැ යි නව හවුරුද්දකින් ගියෙම් නම් **ගුරුවචනය** උල්ලඞ්ඝණය කළා නම් වෙම්. රාජ්‍යය ලොභයෙන් කුලජ්‍යෙෂ්ඨයන් කී බස් ඉක්මවම්දැ යි දෙලොස් හවුරුද්ද පිරෙණ තුරු ම වෙනෙහි වසන්නාහු ද රාජ්‍යය ලොභයට වඩා ධම්මයෙහි ම ලොභ කළහ. **තව ද, 1 සංවර මහාරාජ ජාතකයෙහි අමාත්‍යවෑ** තමන්ගේ අවවාද ලබා බාල රාජකුමාරයානන් වැඩිමහළු බැයන් දහසක් දෙනා සිටිය දී අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් රාජ්‍යය ගන්නා පරිද්දෙන් අවවාද දෙන්නාහු ද ධම්මයෙන් ම වූන්හ.

තව ද, **2 සුපාරක ජාතකයෙහි සුපාරක පණ්ඩිතවු** වඩබා මුඛ සාගරයට වන් මහණු තමන්ගේ සත්‍යබලයෙන් ධම්මයට දිවන තමන්ගේ සිත සේ පොළොව මුහුදු ඉක්මවා ගොඩෙහිදු දියෙහිදු දිවන පරිද්දෙන් දිවවා **පවුන් ගම්**

1 සංවර ජාතක. 2 සුපාරක ජාතක-සත්‍ය-ආ.

නැවියාගේ එළිපත ඇනී සිරිනා පරිද්දෙන් තමන්ගේ සත්‍ය ය ම ඒ නැවට රුවල් කොටැ මෛත්‍රී රසයෙන් ම මහපොළොව දුව කොටැ නැවෙහි නස්නා සත්ත්වයාට ජීවිත දානය දෙන්නා හු ද ධම්මයෙන් ම දුන්හ. තව ද, **මූලකුණාල ජාතකයෙහි** නිරිසන් සත්වැ කෙවිළිවැ සිටැ බුදුනුවණ හා එක්කොටැ කිරු කලහි අඩු නො පානා පරිද්දෙන් ගැණුන්ගේ අවගුණ දැනැ ඛණ වදුරන්නාහු ද ධම්මයෙන් ම විඳුළහ. තව ද, **සඳ්දසාල ජාතකයෙහි සද්දසාල නම් දිව්‍යරාජවැ** රජහට බණ කියා තමන්ගේ බඹුන්ගේ හා සියලු දෙවිතාවන්ගේ විමානයට වූ උපද්‍රව දුරු කරන්නාහු ද ධම්මයෙන් ම දුරු කළහ.

තව ද, **සමුද්දවාණිජ ජාතකයෙහි** වඩුවැ මහා සමුද්‍රයෙහි දිපාන්තරයකට වැදූ තමන් විනාශය කැමැත්තාවූ දිව්‍ය පුත්‍රයා සමුද්‍රෝත්තාර කොටැ මරණු කැමැතිවැ වඤ්චාවෙන් කී බස් නො ගිවිසැ තමන්ගේ වචන කරයන් මහ නැවට නහා ගෙණැ සමුද්‍රෝත්තාරයෙන් රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. තව ද, **සාම ජාතකයෙහි පණ්ඩිත මානවකවැ** තෘෂ්ණාවෙහි ආදීනව දැනැ තුන් රාජ්‍යයෙකින් අපවත් වී මී සි අසාධ්‍යවූ ශෝකාතිසාරයෙන් පීඩිතවූ රජ්ජුරුවන්ට අවවාද කියා ඔවුන්ගේ ශෝක දුරු කොටැ රජ්ජුරුවන්ගේ ශෛවත්‍රිය නුග බලා ධ්‍යාන උපදවා ආකාශයෙහි හිදැ රජ්ජුරුවන්ට දිවි දුන් හෙයින් කරන්නාවූ පූජාවෙහි අපෙක්‍ෂා නැතිවැ හිමාලයට ආකාශයෙන් වැඩැ මිහණවැ පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා බ්‍රහ්මලොක පරායණ වන්නාහු ද ධම්මයෙන් ම වූහ. තව ද, 1 **ජනසන්ධ ජාතකයෙහි** අඤ්ඤායන් ප්‍රාණාති පාතාදිවූ අකුශල කම්ම කොටැ නරක පරායණ වන්නාවූ **රාජානවයෙහි සිවැ** ධම්මයෙහි පිහිටුවා සහපිරිවරවැ දිව්‍යලොක පරායණ වන්නාහු ද ධම්මයෙන් ම වූහ.

තව ද, **මහාසුණ ජාතකයෙහි සක්‍රදෙවෙශ්වැ** මනුෂ්‍ය ලොකයෙහි අධම්ම පවත්නා පරිදි බලා **මානලීහු** බලු වෙස් ගන්වා තුමූ වැදි වෙස් ගෙණැ මිනිස් ලොවට බැසැ මනුෂ්‍යයන් ධම්මයෙහි පිහිටු වන්නාහු වැදිවෙස් ගත් තමන් හා බලු වෙස් ගත් මානලීහු හා දෙදෙන මිනිස් ලොව දඩවැදූ අධම්ම මෘග යන් මරා ලුහු බැඳ වූහ. තව ද, **මහාපදුම ජාතකයෙහි මහා පදුම කුමාරවැ** ගැහැණියගේ බස්ගත්ත වූ රජහු ප්‍රපාතයෙහි

1 ජනසන්ධව ශතකය-ඕං.

හෙළවාපි කල්හි ප්‍රධානයෙහි වසන දෙවතාවුන් ගසක් උඩින් හෙන සුවඳ මලක් බිම්හි යා නොදී අල්වා ගන්නා සේ නපුරා ගේ ලෙහි හෙළවා ගෙණැ රක්‍ෂා කරණ පරිද්දෙන් මහා පින් ඇතිවන්නාහු ද ධම්මයෙන් ම වූහ. තව ද, **මිත්‍රයා‘මිත්‍ර ඥානයෙහි රාජමාත්‍යවැ** බුදු නුවණින් පරීක්‍ෂා කළ කල්හිදු අඩුවැඩි නොපැණෙන පරිද්දෙන් **මිත්‍රා‘මිත්‍ර ලක්‍ෂණ** කියන්නාහු ද ධම්මයෙන් ම වදළහ.

මෙසේ මාගේ සැමියන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කොටැ මෙතෙහි කොටැ මට ම හිත දැව ඵළුවන පිණිස ලොවෙහි පවත් කොටැ වදළ ධම්මය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

තව ද, **අම්බ ඥානයෙහි චණ්ඩාලවැ** ඉපැදී තමන් අතින් නොකල්හි වෘක්‍ෂයෙහි ඵල ගන්නාවූ මනුෂ්‍යයක් උගන්නා අසත්පුරුෂ බ්‍රාහ්මණයා නොකල්හි අඹගස් ආදියෙහි ඵල ගන්වා සියලු ජම්බුද්වීපයෙහි වසන සත්ත්වයන් සේ ප්‍රසිද්ධවැ රජ්ජුරුවන් විසින් “මේකා අතින් උගනුදු සි” විචාළ කල්හි “වණ්ඩාලයකු අතින් උගත්මි”යි කිම් නම් බොහෝ දෙන මා කෙරෙහි සදිහාවනා නොකෙරෙති සි සිතා **තක්ෂලා** නුවර **දිසාපාමොක්ෂ** ආචාර්‍යයන් අතින් උගත්මි සි කියා චණ්ඩාලවූ ද මාගේ සැමියන්ට ආවමාන කළ කෘෂ්ණයෙහි මනුෂ්‍යයෙන් පිරිහී ලොක සම්මානයෙනුදු පිරිහී විනාශයට පැමිණෙන පරිද්දෙන් හීන ජාතියෙහි පවා අවමාන නොකට සුතුවැ පූජා වන්නාහු ද ධම්ම බලයෙන් ම ලොකෝත්තර වූහ. තව ද **එකඥන ඥානයෙහි ඒකක්ෂදෙවතාවැ** ඉපැදී කලහයෙහි ආදීනව හා සමගීමෙහි අනුසස් දක්නාහු ද ධම්මයෙන් ම දුටහ.

තව ද, **ජවන හංස ඥානයෙහි හංසරාජවැ** සුදුමැණික් ලය හා කැරිවැ බරණැස් නුවරට බැසැ බරණැසි රජ්ජුරුවන් ගේ සිංහාසනයෙහි වැඩැ හිඳැ කරඬු රයක් බැඳැ ගෙණැ මැදු වැඹෙක හිඳැ ගෙණැ සතර දිසාවෙහි සිටියාවූ අක්‍ෂණ වේදීවූ ධනුර්ධරයන් සතර දෙනා එක පැහැරැ විදිනා ශර වෙන වෙන තුන්න් ඩැහැ ගෙණැ අවුත් රජ්ජුරුවන් පා මුල්හි ලා තමන්ගේ ජවවෙග දුටු රජ්ජුරුවන් විසින් **“හංස පණ්ඩිත ශෙනි! නොපගේ ජවය දුටුමිහ. මෙයට වැඩි අනික් ජවයෙක් ඇද්දැසි”** විචාළ කල්හි මෙයට වඩා ශත ගුණෙන් සහස්‍ර

ගුණෙන් සතුටුයා මරහු මුඛයට දුවන ජවය අඩිකයැ යි අනිත්‍යතාව ප්‍රකාශ කොටැ රජ්ජුරුවන් දැනාදී සුචරිතයෙහි යෙදෙන්නාහු ද ධම්මයෙන් ම යෙදූහ. තව ද, **දූන ජාතකයෙහි පණ්ඩිත මාණවකවැ** තමන්ගේ ධම්මදෙශනා බලයෙන් හා දැඩ ප්‍රතිඥ බලයෙන් හා රජ්ජුරුවන් අතින් කනකාසුජලි ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ.

තව ද, 1 **කාලිඞබොධි ජාතකයෙහි කාලිඞබ භාරමාජ නම් අමාත්‍යවැ** තමන්ද බුදුවන්ට වැඩැ හිඳිනාවූ බෝමඩැ ඉද්දේ ආකාශයෙහි ඇත්පිටින් යන්නාවූ **කාලිඞබ චක්‍රවර්ත්ති** මෙහෙයූ ඇත්හු ද අකුසු පහරින් මියනතුරු එතන ඉද්දෙහි ආකාශයෙන් නොගිය කල්හි තුමූ බිමට බැසැ පරීක්ෂා කොටැ "මේ සවාසනා සව්කෙලශයන් නසා බුදුවන මහාපුරුෂයන් වැඩැ හිඳිනා ස්ථානය යි" කියා තමන් වැඩැ හිඳිනා තැන එදැම හැඳිනැ රජ්ජුරුවන් ලවා එතන්හි අටලොස්රියන් සඞ්ඝ සන්නිපාතයෙක- සත්රුවන්මය පිළිකඩය- සිසාරා සත්රුවන් වැලිය-සත්රුවන් දෙරටුය-දවස්පතා සුවඳමල් සැටයාළුස්ය යන මෙසින් පූජා කරවන සෙයෙක් ද ධම්මයෙන් ම කැරැවූ සෙයෙක.

තව ද, **අකිත්ති ජාතකයෙහි අකිත්ති නම් තාපසවැ කාර දිවසින** වෙසෙමින් බ්‍රාහ්මණ වෙශයෙන් තමන් කරා ආවාවූ ශක්‍රයාට නිරාහාරවැ නොලැණූ නොඇඹුල් කරපලා දන් දී තමන්ගේ ගුණයෙහි ප්‍රසන්නවූ ශක්‍රයා විසින් "නොපකාමැති වරයක් ගන්ව යි කී කල්හි මේ ජාතියෙහි පටන් වජ්‍රා' සනය නැඟී මුළුලොව ගළවන ජාති දක්වා අසත්පුරුෂයන් හා එක් නොවෙම්ව යි අසත්පුරුෂයන් නොදකිම්ව යි අසත්පුරුෂයන්ගේ බස් නොඅසම්ව යි සත්පුරුෂයන් දක්කෙහෙම් ව යි ඔවුන්ගේ බස් ඇසිය හෙම්ව යි කියා වරගන්නාහු ද ධම්මයට ඉදුරාම වර ගත්හ. තව ද, **නඞ්ගාරි ජාතකයෙහි නඞ්ගාරි පණ්ඩිතවැ** දුර්භාෂිතයෙන් නටුවාවූ **ආරාළ පිඞ්ගල** සුභාෂිතයෙන් රජ්ජුරුවන් අතින් ගැලවූණු **කින්නරයන්** හා දැකැ ලොකයෙහි සත්වයාට සුභාෂිතයෙන් වත ඉෂ්ට කියන්නාහු ද ධම්මයෙන් ම වදැළහ.

---

1 කාලිඞ ජාතක-අ.

තව ද, 1 රුරුමිග ජාතකයෙහි මුවබෑ ඉපැදුණ ගහ දියෙන් යන්නාවූ අසත් පුරුෂයා හොඬ දක්වා පිරින් ගෙණැ අවුත් ජීවිත දුන දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. තව ද, 2 සරභ මිග ජාතකයෙහි සරභ මෘග රජවැ තමන් මරන්නට ලුහු බදවා දිවන්නාවූ රජ්ජුරුවන් සැවරියන් පමණ වළහුනු කල්හි ඔවුන් පස්සෙහි දිවන පියවර ගඩ නොඅසා කුමක් වී දෝහෝ සි බලා වළ හුනු බව දැනැ මා මරන්නට දිවූහ සි මේ රජ්ජුරුවන් මේ වළින් නොනැහිම් නම් සසර වළෙහි හුනුමාවූ සියලු සතුවයා කෙසේ නහම්දු සි වළට පැනැ රජ්ජුරුවන් පිටැ හිඳුවා ගෙණැ ගොඩට පැනැ ජීවිත දුනෑ ද පිරින් ගෙණැ ගොස් සේනාවට නොදුරු තන්හි සිටුවා ඔවුන්ට පන්සිල් දි දශරාජ ධම්මයෙහි පිහිටුවා ඔවුන් ලවා මුළුලොවට ශාන්ති කරවන්නාහු ද ධම්මයෙන් ම කරවූහ.

මෙසේ මාගේ සවාමීන් විසින් අනෙක ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් පූරුදු කොටැ මෙනෙහි කොටැ වඩා අමා මහ නිවන් හි පහළවා මුදුන්පත් කොටැ සිටුවූ සඞ්ඝම් රත්නෂ ම සරණ යෙමි සි දහම් සරණ යා යුතු.

තව ද, සාලිඝෝදර ජාතකයෙහි ගිරාවැ මහා සෙත්‍ර යෙහි හැල් කා මවුන් පිණිස කණෙහි ලූ කොළක් සා හැල් කරල් මිටියක් නුඩින් ගෙණැ ගොස් හැල්කෙත ඇති බමුණ එ පවත් අසා බදු ගෙන්වා ගත්කල්හි ගිරා නුඩින් ඔවුන්ට බණ කියා දහසක් කිරි හැල්කෙත ධම්ම පූජාකොටැ ලදින් මලින් ගැලවී මවුපියන් හා සෙසු පරිවාරයෙහි ගිරවුන්ගේ කඳුළු මුසු මුනුණු අධික සනෙනාෂයට පමුණුවමින් වඩනාහු ද ධම්මයෙන් ම වැඩියහ. තව ද, චඤ්ඣිතනර ජාතකයෙහි කිනෙන රවැ තමන් වහන්සේගේ අඹුවූ චන්ද්‍රානම් කිනෙනරිය කෙරෙහි පිළිබඳ වූ සිත් ඇති බරණැස් රජහුගේ විෂ පීත ශරප්‍රහාරයෙන් මූර්ච්ඡිතවැ චන්ද්‍රා නම් කිනෙනරියගේ ශීල තෙජසින් ආවා වූ ශක්‍ර දෙවෙන්ද්‍රයා ශරීරයෙහි ඉසි අමෘත ජලයෙහි ආනුභාවයෙන් නොවිදි ශරීරයක් සේ ම සවසථවැ දිවි ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ.

---

1 රුරුජාතක-අ. 2 සරභ ජාතක-අ.

තව ද, මහා උක්කුස ජාතකයෙහි සිංහරාජවැ මිත්‍ර ධර්මය රක්ෂා කරන්නාහු ද ධර්මයෙන් ම රක්ෂා කළහ. තව ද, **උදපාල ජාතකයෙහි පුරෝහිතවැ** කුට වූ උදපාල නම් තාපසයාගේ කොහොන්කම් ප්‍රකාශ කොටැ අසථානයෙහි ප්‍රසන්නවූ රජ්ජුරුවන්ට අවවාද වදුරන්නාහු ද ධර්මයෙන් ම වදුළහ. තව ද, 1 **හිංසක ජාතකයෙහි මහාඛාපිත තාපසවැ** සහපිරිවරින් පැවිදුකම ගහිකොටැ ශපථ කරන්නාහු ද ධර්මයෙන් ම ශපථ කළහ. තව ද, **සුරුචි ජාතකයෙහි ශක්‍රදෙවෙන්‍දවැ සුමෙධා** දේවින්ගේ ශිලාචාර ගුණෙහි ප්‍රසන්නවැ මනුෂ්‍ය ලොකයට අවුත් පුත්‍රවර දී ඔවුන්ගේ මනොරථ මසන්න ප්‍රාපත කොටැ වදුරණ සෙයෙක් ද ධර්මයෙන් ම කොටැ වදුළ සෙයෙක.

තව ද, **පඤ්චුපොසථ ජාතකයෙහි තාපස්වීවැ** ජාතිමානය නිසා පසේ බුදුන් වහන්සේට නමස්කාර මාත්‍රයකුදු නොකොටැ ඒ පසේ බුදුන් වහන්සේ විසින් "මහා පුරුෂයානෝ මෙම කප්හි සම්මාසම්බුදු වන එකෙක්ය. එසේ හෙයින් කෘතාධිකාරවූ තෝ කුමක් පිණිස අභිමාන ඇතිවැ ගෙණැ ධ්‍යාන සමාපත්ති මාත්‍රයකුදු නොඋපදව සි වදුළහ." එකල්හිදු අභිමානයෙන් ම ඔබ නොවැන්දහ. මහා කරුණා ඇත්තාවූ ඒ පසේ බුදුන් වහන්සේ තෝ අභිමාන ඇත්තෙහි වී නම් මා සේ ම ආකාශයට පැනැ නැගෙ සි වදාරා තමන් වහන්සේගේ ශ්‍රීපාද ධූලි ජවා මඩලයෙහි ඉස්මින් ආකාශයෙන් වැඩිකල්හි ජාති ආදියට වඩා ගුණම ප්‍රධානවනැ සි සිතා අභිමානය හැරැ මම මාගේ අභිමානය නිසා පසේ බුදුන් වහන්සේ අතින් "මා බුදු වන්නේ කවර කල්හිදැ"සි විචාරාගත නුහුණු යෙම් සි සංවේගයට පැමිණැ භූනස්නෙහි ම හිඳැ භාවනා කොටැ පඤ්චා 'භිඥ අෂ්ටසමාපත්ති උපදවන සෙයෙක් ද ධර්මයෙන් ම උපදවා වදුළ සෙයෙක.

තව ද, **මහා මයූර ජාතකයෙහි රන්වන් මොණරවැ** තිරි සන්වැ සිටැ පවා දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් සාධුකාර නොහැක් කාවූ "බුදුහු ඇත. දහම් ඇත. කම් ඇත. කම්ඵල ඇත" යන සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා තමන් වහන්සේ මරන්නට බැඳූ වැද්දතුවන්ට හිස බිම බලවා පය උඩු බලවා වැඩැ හෙවැ

1 මහිස-සිං.

බණ වදාරා පසේ බුදුකොටැ බැඳ වැද්දත් කෙලෙස බඳින යෙන් ගළවා තමන් හා සියලු පෘථිවි බඳින මුක්ත කරවන් නාහු ද ධම්මයෙන් ම කළහ. තව ද, **නවඡඤ්ඡුකර ජාතක යෙහි වෘෂභදෙවතාවෑ** ඉපැදූ උපාය ශක්තීන් යුක්තවූ ශූර බලවත්වූ ව්‍යඝ්‍රයා දිනූ පරිදි දැන්නාහු තමන් අසාධාරණ ප්‍රඥා බලයෙන් බලවත්වූ සංසාරය මඩනා බවට පූර්ව නිමිත්ත දුටහ.

තව ද, **මහාවාණිජ ජාතකයෙහි වෙළඳවෑ** කෙළෙහි ගුණ දැනැ මරුභූමියෙහි නොයෙක් ඛන දුන්නාවූ වෘෂභයේ මූල් කපන්නට පටන් ගත්තාවූ වෙළඳුන් දැකැ හිමි සැනපූනු වෘෂභයේ පතක් පවා කඩා පියන බව **මිත්‍රද්‍රොහයෙහි** ඇතුළුන් වෙයි. එහෙයින් මෙතෙක් උපකාර කළාවූ වෘෂභයට ද්‍රොහ නො කරවයි වදාරා තමන් වහන්සේගේ අවවාදයෙන් නො වැළක්කාවූ වෙළඳුන් ගස මූල කපන්නටය සි කියා පටන් ගත් කල්හි එගස නාගරාජයා "කෙළෙහි ගුණ නොදන්නා දුර්ජනයෝ තමන්ට මෙතෙක් උපකාර කළාවූ වෘෂභය කපති. මොවුන්ට මේවිට ජීවත්විය නො දෙමි" සි සිතා තමාගේ ආනුභාවයෙන් මහ සේනාවක් මවා ඒ දුර්ජනයන් කෙරෙන් එකෙකුත් ගැළවිය නො දී හසම්කොටැ තමන් ඇදිකොටැ වදුළ අවවාදයෙහි ප්‍රසන්නවැ "කෙළෙහි ගුණ දන්නාවූ මේ මහා පුරුෂයාට පූජා කළ මැනවැ"සි පන්සියයක් ගැල්හි සත්රුවන් පූරා තමන් වහන්සේ ගැලෙහි වඩා හිඳුවා මාණවක වෙස් මවා ගෙණැ ගැල් පැදූ බරණැස් නුවරැ සිටුවා මහා පූජාකොටැ වැඳැ සමු ගෙණැ ගිය කල්හි ඒ සත්රුවනින් දැනාදී කුසල් කරණ තමන් කෙළෙහි ගුණ දන්නාහු ධම්මයෙන් ම විභ සොරවූ නයින් අතින් සත් රුවන් පූජා ලදහ.

"මෙසේ මාගේ සඞ්ඝීන් විසින් අනන්ත ප්‍රකාරයෙන් පූරුදු කරණ ලද්දාවූ ආශ්චර්‍ය්‍ය අද්භූත වූ ඉෂ්ටාර්ථ සාධක වූ ධම්ම රත්නය සරණ යෙමි සි **දහම් සරණ යා යුතු.**

තව ද, 1 **සාධීන රාජ ජාතකයෙහි සාධීන නම් රජවැ** මනුෂ්‍ය ශරීරයෙන් සිටැ ශක්‍රදෙවෙන්ද්‍රයා දහසක් සෙණිවයන් යෙදූ **වෛජයන්ත රථය** එළවා දෙව්ලොවට ගෙන්වා මහ පෙළහර කොටැ දෙව්ලොවට වැඩියාවූ සර්ෂයන් වහන්සේ දුටු දෙවෙන්ද්‍රයා සතුටුවන පරිද්දෙන් සතුටුවැ ආසනයෙන්

1 සාධීන ජාතකය.

පවරා මනුෂ්‍ය ශරීරයෙන් දිව්‍ය පඤ්චකාම ගුණ අනුභවකරණ පරිද්දෙන් හා දිව්‍ය රාජ්‍යය අඩියක් කොටැ බෙදා පියා දුන් කල්හි සත්සියයක් හවුරුදු දිව්‍ය සුව වළඳන්නාහු ද ධම්ම යෙන් ම වැළඳූහ. තව ද, **දසබ්‍රාහ්මණ ජාතකයෙහි කුරුරට ඉදිපන්** නුවර සුධර්ම්මිලනම් රජ්ජුරුවන් බුඩ විලාසයෙන් අග්‍ර දක්ෂිණෙය්‍යවූ සිල්වතුන් ගුණ හෙයින් පරීක්ෂා කොටැ විභාග කරන්නාහු ද ධම්මයෙන් ම විභාග කළහ. තව ද, **භික්ඛාචර මපරා ජාතකයෙහි හෙමවත** නම් **නාගසෙවා** රජ්ජුරුවන් අතින් 'පුරොහිතයා පිළිගෙණෑ පුරොහිතයා' අතින් තමන් වහන්සේ පිළිගෙණෑ එසේ පළිගත්නාවූ බත් පාත්‍රය තමන් වහන්සේ නො වළඳා අග්‍ර දක්ෂිණෙය්‍ය වූ පසේ බුදුන් වහන්සේට පිළිගන් වන සෙයෙක් ද දැන් තමන් වහන්සේ ලද්දාවූ නිර්වාණය සදෙ වක සමාරක සබ්‍රහ්මක ලොකයට දෙවන බවට පූර්ව නිමිත්ත දැක්වූහ.

තව ද, **මාතඞ්ගපණ්ඩිත** 1 **ජාතකයෙහි චණ්ඩාලවෑ** බ්‍රහ්ම විමානයෙහි මහාබ්‍රහ්ම විලාසයෙන් වැඩ තමන් වහන්සේ පිටින් උසුලා ගෙණෑ ගියාවූ **දෘෂ්ට මඞ්ගලිකාවගේ** දෙපත්ල සුඛකළ පැන් සියලු දඹදිව රජ්ජුරුවන් මුදුනට අභිෂෙක ජලය කොටැ දක්වන පරිද්දෙන් චන්ද්‍රමණ්ඩලය පලා ගෙණෑ මනුෂ්‍ය ලොකයට වැඩ අනුග්‍රහ කොටැ වදාරණ සේක් දැන් තමන් වහන්සේ සිතින් ඉසිපැ සතළුවයන්ගේ පතුල මුළු ලොවට මුදුන් මල්වන බවට පූර්ව නිමිත්ත දක්වූ සෙයෙක. තව ද, 2 **සීහාභ සම්භූත ජාතකයෙහි** තමන් වහන්සේ හා මිත්‍රධම්මය කළවුන් තුන් සතර ජාතියක් දක්වා අත් නොහරණ සෙයෙක් ද දැන් තමන් වහන්සේගේ ගුණයෙහි පහන් සත්ත්වයා **නිරුපධිශෂ නිර්වාණ ධාතුව** දක්වා අත් නොහරණ බවට පූර්ව නිමිත්ත දක්වූ සෙයෙක.

තව ද, **සිවිරාජ ජාතකයෙහි සිවි නම් මහාරජවෑ** දවස ලක්ෂයක් වියදම් කොටැ මහ දන් දී ඒ දානයෙහුදු අනෑපනවැ මේ යාචකයෝ මා කරා අවුත් රත්රන් හෝ ඉල්වති. අම්බරන් හෝ ඉල්වති, දැසි දාසීන් කෙණකුන් හෝ ඉල්වත්. නොපෑස උදුරා දෙව. නොපෑ ඔස කපා දෙව යි එක බසකුදු කියන යාචකයක්හු නො දක්නේ මාගේ ම අභාග්‍යයැ යි කියා ඉඳින්

1 කාලසෙනි. 2 සම්භූතජාතක-සි.

කිසිවෙක් අවුත් තමාට ගැනිවන්නට කී නම් මාගේ මාණික්‍ය රශ්මීන් රැඳි හිසැ මොවුන්න බහා තබා පියා ඔහුගේ දෙ පත්ල මා මුදුනෙන් පිළි ගෙණැ ගැනිවැ මෙහෙ කෙරෙමි. ඉඳින් යමෙක් මාගේ ශරීරයෙහි මස් ඉල්වූයේ වී නම් මාගේ **දානපාරමිතා** නැමැති මහවිල්හි වූ තරුණවූ නෙළුඹු දැලි සේ සුදුවූ ඇට පැණෙන තුරු සවිඝහයෙහි මස් ලියා පැස් පුරා දන් දෙමි. ඉඳින් යමෙක් මාගේ හිස ඉල්වූයේ වී නම් සහ වොටුනු වූ හිස මාගේ මගුල් කඩුවෙන් කපා පියා අඳි කියන් නට පටන් ගත්තාවූ සාධුකාර කපා පි පස්සෙහිදු දෙතුන් වටෙ හිදු කියන පරිද්දෙන් **සබ්බඤ්ඤුතඤාණ** දෙමි. ඉඳින් යමෙක් මාගේ දෙ ඇස ඉල්වූයේ වී නම් තමාගේ විල්හි හටගත්තාවූ මහනෙල් මල් දෙකක් යාචකයාට දෙන එකකුදු ලොභ ඇතිවැ දෙව සි මම වූ කලි කිසි ලොභයක් නැතිවැ ම මාගේ දෙ ඇස ම උදුරා දන් දෙමි.

මාගේ මේ දානාධ්‍යාශය කෙසේ සම්පූර්ණ වේ ද්‍යෝ හෝ සි මාගේ මනොරථය කෙසේ මස්තක ප්‍රාප්ත වේ ද්‍යෝ හෝ සි සිතා වදුරා ඒ උදුරවූ අධ්‍යාශයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ **පාණ්ඩුකම්බලශෛලාසනය** හුණු වූ කල්හි තමන්ගේ ආසනය හුණු වූ කාරණය පරීක්ෂා කරන්නාවූ **ශක්‍රදෙවෙන්ද්‍රයා** එ පවත් දැනැ මේ මහා පුරුෂයා මේ නියා සිතිවිල්ලක් සිතයි. හෙ ද මෙම කප්හි සවාසනා සවී කෙලාශයන් නසා බුදුවැ මුළුලොව ගළවන්නාවූ මහතෙක්ය. ඔහුගේ **දානා'භිරතිය** මස්තක ප්‍රාප්ත කළ මැනවැ සි අති බ්‍රාහ්මණ වේසයෙන් අවුදින් "තොපගේ ඇම දෙව"සි කී කල්හි බුදුහු බුදුවැ දිවඇස් ලත් දවස් සතුටක් සේ "ඒ ඇස උදුරා දෙව" යන බස අසා සතුටුවැ සියලු අමාත්‍යයන් සියලු අන්තඃපුර සත්‍රීන් සියලු රාජකුමාරයන් "සැමිනි! රාජ්‍යයක් දුන මැනව. හස්ත්‍යශ්ව රථ පදුනින් දුන මැනව. නානාප්‍රකාරවූ සප්ත රත්නයන් දුන මැනවැ සි මුළු දඹදිවට ඇසක් සේ සිටි නුඹ වහන්සේගේ ඇස් නුදුන මැනවැ"සි හඬවා හඬවා දෙ ඇස උදුරා දී ඒ දානයෙහි අනුසසින් බුදුවැ ලබන දිව ඇසට පූජා නිමිත්ත පාණ සේ දිව ඇස් ලබන්නාහු ද ධම්මයෙන් ම ලදහ.

තව ද, 1 **රොහණමිග ජාතකයෙහි** සුවර්ණ වර්ණවූ **මෘගරාජවැ** ද **හංස ජාතකයෙහි හංසරාජවැ** ද දැන් **ධර්මරාජවැ**

1 රොහණක මෘගජාතක-සිං.

බණ වදුරණ පරිද්දෙන් ධම්ම දෙශනා කරන්නාහු ද තමන් ගේ සාමිත්වයම ප්‍රකාශ කළහ. තව ද, 1 **සහනිගුම්බ ජාතකයෙහි** හිඟුල් වනයෙහි **ගිරාවෑ** තමන් හා එක්වැ උපන් ගිරා පැටව් හා කැටිවැ කසල්ලේ හෙවැ ප්‍රචණ්ඩ වාතයකින් අනික් ගිරව් ගොස් සොරුන් අතුරෙහි හුණු කල්හි තුමූ ආශ්‍රමයෙහි තපස්වීන් අතුරෙහි හි සොරුන් අතුරෙහි හුණු ගිරව් වලට ගියාවූ රජ්ජුරුවන් දැකැ "මේ රජ්ජුරුවන් මරා පියා ආභරණ ගණුව"යි සොරුන්ට නියොග කළ කල්හි ආශ්‍රමයට ආවාවූ රජ්ජුරුවන් දැකැ තුමූ තපස්වී කුමාර කෙණකුන් සේ මධුර ඵලාඵල ආදීන් පවරා තමන්ගේ ගුණයෙහි ප්‍රසන්නවූ රජ්ජුරුවන් විසින් තමන් වහන්සේගේ කුලයෙහි උපන් ගිරවුන්ට අභය දෙවා තමන් වහන්සේ වැඩූ සෘෂීන්ට දිවි පමණින් උපස්ථාන කරවා සුචරිතයෙහි පිහිටුවන සෙයෙක් ද බුදුරජවැ කොටැ වදුරණ ධම්ම කෘත්‍යය ගිරා රජවැ ද කොටැ වදුළි සෙයෙක.

තව ද, **හල්ලාතිය ජාතකයෙහි** 2 **හල්ලාතිය** නම් රජවැ හිමාලයයෙහි දඩ වැදූ එක රැයක් උනුන් නුදුටු කිනහරයන් දෙදෙනා සත්සියක් හවුරුදු උනුන් වැළඳැ ගෙණැ හඬන පරිදි දැකැ වදුරා හිමාලයෙන් රාජධානියට වඩනා සෙයෙක් ද මතු තමන් වහන්සේ **කොසොල්** රජ්ජුරුවන් හා **මල්ලිකා** දේවීන් ගේ කලහ සන්හිඳුවන්නට පූර්ව්වධම්ම කථාව දුටු සෙයෙක.

මෙසේ මාගේ සැමියන් විසින් අනන්ත ජාතියෙහි අනෙක ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද ධම්මය සරණ යෙමි යි **දහම් සරණ සා සුතු.**

තව ද, **සොමනස්ස ජාතකයෙහි** දිව්‍ය ලොකයෙන් චුතවැ **උත්තර පඤ්චාල** නම් නුවරැ **රෙණු නම් රජ්ජුරුවන්ගේ** අග මෙහෙසුන් බිසවුන් බඩැ පිළිසිඳැ ගෙණැ **සොමනස්ස නම් රාජ කුමාරවෑ** කුට ජටිලයාගේ වඤ්චා ප්‍රයොග නො දැනැ "ඔහු දිව ඇස් ඇති තපස්වීන් යැ"යි සිතන්නාවූ රජ්ජුරුවන්ගේ අඟුන කම් දැකැ මෙසේ වූ මූර්ඛයන් අතුරෙහි වසන බව සුදුසු නො වෙයි කියා ක්‍රමාගත රාජ්‍යය හැරැ හිමාලයට වැඳූ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ. තව ද, **වමෙපස්‍ය නාග රාජ කාලයෙහි** සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන්

1 හත්ථිකුම්භ ජාතකය-ඇතම්. 2 හල්ලාවිය-ඇ.

වට ඇති සප්වළු ශ්වාස මාත්‍රයෙකින් දවා පියන්නට සම්ර්ථවැ "සමාදන් වූ අට සිලයට විරොධයක් නොකෙරේමි"යි යන සිතින් වණ්ඩවූ අහිතුණ්ඩිකයා දළු උදුරා පියා කට දල් වාලා මුවෙහි ඔෂධ මිශ්‍ර කෙල වක්කරණ කල්හි තුම්බ ද තමන් සිත වෙපයෙ උදුරා පියා මෛත්‍රී නැමැති දිව්‍ය ඔෂධය ඔහු කෙරෙහි නමා ලන්නාහු ද ධර්ම්යෙන් ම නැමූහ.

තව ද, **මහාපලොභන ජාතකයෙහි** බ්‍රහ්ම ලොකයෙන් චූතවැ රාජකුමාරවැ ඉපැදූ කාමයෙන් දුරුවැ සත්‍රී සෘෂී මාත්‍රය කට ද හඬා නොසැනහී යෙදෙන ප්‍රාප්තවූ අවස්ථාවෙහි විද ගඩවූ ගණිකී සත්‍රියගේ ගීත ශබ්දයෙන් පැලැඹී කාමා'සාදය කොටැ පඤ්චකාමයෙන් මූර්චිතවැ හොස් "මෙසේ වූ රසයක් මා මුත් අනික් පුරුෂ කෙණෙකුන් අනුභව කට නොදෙමි"යි කඩුව හයා ගෙණැ විවියට වැදැ පිරිමින් මරා එ පවත් ඇසූ රජ්ජුරුවන් ඒ ගැණිය හා තමන් හා වලට නෙරපි කල්හි වලට වැදූ ආශ්‍රමයෙකැ වෙසෙමින් තමන් වහන්සේ එලාඑලයට වැඩි කල්හි ඒ දුඨිනවූ සත්‍රිය ආකාශචාරිවූ තපස්වියකුගේ ශිල හෙදය කොටැ ඔහු හා කැටිවැ හුන්කල්හි තමන් වහන්සේ අවුත් කඩුව හයා ගෙණැ ඔහු ලුහුබැඳවූහ. තපස්විහු හඹ මින් මුහුදු කොලට ගොස් ආකාශයට නැගෙණ ආකාරය දක්වා මුහුදු ලුණු කරදියෙහි හී ගැලෙන්නට වන් කල්හි තමන් වහන්සේගේ **වජ්‍රඥානයෙන්** "මේ ආකාශචාරිවූ තපස්වියෙක් වන. මා අඹු පිණිස නට්ටයේය"යි වදුරා පඤ්චකාමයෙහි ආදීනව සලකා එසේ වූ ප්‍රිය වූ සත්‍රිය ගෙණැ අවුත් මනුෂ්‍ය පථයෙහි සිටුවා තමන් වහන්සේ හිමාලයට වැදූ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍යවසානයෙහි බ්‍රහ්මලොකයෙහි උපදනා සෙයෙක් ද ධර්ම්යෙන් ම උපන් සෙයෙක.

තව ද, **හත්ථිපාල ජාතකයෙහි හත්ථිපාල කුමාරවැ** ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් හා පඤ්චකාමයෙහි ආදීනව වදුරා මහණවැ තමන් වහන්සේගේ ආශ්‍රමයෙහි සිසාරා සතිස් යොදනක් තැන් මහණ මෙහෙණුන් විසින් අතුරු සිදුරු නැතිවැ ගැවසි ගන්නා පරිද්දෙන් තමන් වහන්සේගේ ආශ්‍රයර්‍ථී දුටු සත් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යශ්‍රී හැරැ සහපිරිවරින් මහණවූ කල්හි ඔවුන් හා සමග පඤ්චා'භිඥ අෂ්ට සමාපත්ති උපදවා ජීවිත පර්‍යවසානයෙහි බ්‍රහ්ම ලොකයෙහි උපදනා සෙයෙක් ද ධර්ම්යෙන් ම උපන් සෙයෙක.

තව ද, **අයොඝර ජාතකයෙහි** අයොඝර පණ්ඩිත කාල යෙහි අයොඝර නම් රාජකුමාරවැ යක්ෂයන්ගේ උපද්‍රව දුරු කරණ පිණිස පියානන් වහන්සේ සොළොස් හවුරුද්දක් ම ගෙහි ලා රක්‍ෂා කොටැ නුවර පැදකුණු කර වූ දවස් සමඟ වූ රාජ්‍යය දැකැ මා මෙතෙක් දවස් මෙබඳු රාජ්‍යයක් නො දැකැ ය ගෙහි හුන්නේය. සසරෙහි ආදීනව වේ දැ සි බණ වදුරා දොළොස් යොදුනක් දිග ඇති සත්යොදුන් පළල ඇති ආශ්‍රමය තපස්වීන් විසින් නිරන්තර වන පරිදි දෙන් නමන් වහන්සේ ගේ අවවාද ඇසූ පියානන් වහන්සේ හා සියලු රාජ්‍යය හැරැ මහණවැ ජීවිත පර්‍යවසානයෙහි බ්‍රහ්මලොකයෙහි උපදනා සෙයෙක් ද ධම්මයෙන් ම උපන් සෙයෙක.

තව ද, **කිංඡඤ්ඤ ජාතකයෙහි** රාජ්‍යය හැරැ මහණවැ අඹ පලෙක්හි කළ ලොභයෙන් සත්දවසක් නිරාහාරවැ හිඳිනා සෙයෙක් රස තෘෂ්ණායෙහි ආදීනව ලොවට ප්‍රකාශ කොටැ දැන් වදරණ බණට දෘෂ්ටාන්ත දැක් වූ සෙයෙක. තව ද, **කුම්භ ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍රවැ මනුෂ්‍ය ලොකයට අවුත් සුරාපානයෙහි ආදීනව දක්වා පණිත් සහිතවූ රජ්ජුරුවන් සුරා පානයෙන් දුරු කරන්නාහු ද ධම්මයෙන් ම දුරු කර වූහ. තව ද, **ජයද්දිස ජාතකයෙහි** තමන්ගේ ප්‍රාණ පරිත්‍යාග කොටැ පියානන් වහන්සේට දිවි පුදා **පොඨිසාදයා** අතැහි එ තැන්හි ද තමන්ගේ හස්තසාරවූ ධම්මය වදුරා **පොඨිසාදයා** අතින් ගැළැවී ඔහු ද මිනි කෑමෙන් දුරු කොටැ පන්සිල්හි පිහිටු වන්නාහු ද ධම්මයෙන් ම පිහිටුවූහ. තව ද, **ඡද්දන්ත ජාතක** යෙහි විෂ පිනවූ ශරයෙන් තමන් විද්දවූ **සොණුත්තර** නම් වැද්දාට කපා දුන්නාවූ සවණක් රැසින් යුකතවූ දළින් **දුනපාර** මනාව දළ කළහ.

තව ද, **සමහවකුම්මාර ජාතකයෙහි සමහවකුමාරවැ** විටි යෙහි වැලි කෙළිමින් සිටැ සියලු **ජම්බුවීපයෙහි** බුඩිසම්පන්න යන් කියාගත නුහුනුවාවූ ප්‍රඥාය අතැ තුබූ වැලි දමා පියා සිටැ බුඩ **විලාසයෙන්** වදුරන්නාහු ද ධම්මයෙන් ම වදුළහ. තව ද, **මහාකපි ජාතකයෙහි වානරවැ** ගසට නැඟී "නිඹිරි පල කම්"යි අත්තෙන් වැරදු මහා ප්‍රපාතයෙහි හී හඬන්නාවූ පුරුෂයාගේ බැගෑ හඬ අසා මා සේ වූ කරුණු ඇති එකක්හු බල බලා සිටිය දී මොහු දුක් ගන්නා බව සුදුසු නො වෙයි සිතා

වදුරා වැලක් බැඳ ගෙණ ගොඩ සිටැ වළට පැනැ වළසිටැ ගොඩට පැනැ ශ්‍රමකොටැ පසුවැ ඔහු හිණ ගන්වා ගෙනැ ගොඩට පැනැ නැඟි ඔහු නහා විඩාවැ "තොප නහා විඩාවැ හියෙමි. මා නිදා පියන තුරු මට වන උපද්‍රවයක් ඇත බල ව"සි කියා ඔහු ඇලයෙහි නිදන්නට වැඩ හෙව.

කෙළෙහි ගුණ නොදන්නාවූ ඔහු තමාට දුන් ජීවිතදානය නොසලකා "මේ වදුරා පමාවැ නිදයි, මොහු මරා පියා මස් හැරැගෙණැ කකා ගිය මැනවැ"සි හිස පහණින් ඇනපි කල්හි මුහුණ වැටී හුණුවාවූ සම් අතින් නහා ගෙණැ ඔහු මුහුණ බලා ප්‍රිය පුත්‍රයන්හු හා බණින ලෙසින් "තොපට මා දුන් ජීවිත දානයට තොප මෙසේ වූ දුර්ජන කමක් කෙළේ කුම වද"සි ප්‍රිය වචන වදුරා "ඉඳින් මම මෝහට රැහැණ්වැ මහ නොපැයෙමි වී නම් මා සරණින් රැකෙන්නාවූ ලුව්ලොවට නිවිණ මාගියත් පැහැත නොහෙන්නෙම් වේ ද"සි සිතා වදුරා සියලු හිමාලයයෙහි වෘක්ෂ දෙවතාවන් මහාපුරුෂයානෙනි! තෙල දුර්ජනයා කෙරෙහි කරුණු නොකරව"සි කියව කියවා තොප කියන්නේ එක තමා ආත්මයට සිතන්නවුන් කළමනා දැය, මා කරන්නේ ලුව්ලොව රක්නවුන් කළමනා දැයැ සි වදුරා දේවතාවන් බස් නොගිවිසැ ඔහට මහ පානා සෙයෙක් ද ධර්ම්යෙන් ම මහ පැ වදුළ සෙයෙක.

මෙසේ මාගේ සවාමීන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද්දාවූ **ධම්මරතනය** මට අනුපාදි නිවන් පහරවා සියලු අභිමතාර්ථ සාධා දෙන්නාවූ **විනානාමා ණ්ඩායඝා**. එසේ වූ **ධම්මරතනය** සරණ යෙමි සි **දහම් සරණ යා ය්‍යුතු.**

තව ද, **උදකරහදය** ජාතකයෙහි **මහෞෂධ පණ්ඩිතයන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්** විසින් **උදකරක්ඛසයාට** මම බත්වැ **මහෞෂධ පණ්ඩිතයන්** නොදෙමි සි යන පරිද්දෙන් සර්ලොක ප්‍රියවන්නාහු ද ධර්ම්යෙන් ම ප්‍රියවූහ. තව ද, **පණ්ඩරක ජාතකයෙහි සවණ්ණහංසරාජයා** බොරු කිවා වූ දෙවදත්තයාගේ එම ශරීරයෙන් අපායෙහි හිමි දක්වන්නාහු දැන් තමන් වදරන්නාවූ මුසාවාදයේ ආදීනවයට දෘෂ්ටාන්ත දුටහ. තව ද, **සම්බුලා ජාතකයෙහි** කුෂට ඇත්තාවූ **හත්ථිසෙන නම් කුමාරයන්** හා කැවිවැ වලට ගොස් වල්හි දෙවතාවන් තමන්

කෙරෙහි අභිරති කළ කල්හිදු සඞ්ඝ පඤ්ච පානයෙන් දිව්‍යශ්‍රියෙහි අපෙක්ෂාවක් නොකොට තමන්ගේ සත්‍ය ක්‍රියායෙන් සමණන්ගේ රෝහ සන්හිදුවා ආ සම්බුලා නම් බිසවුන් වහන්සේ කෙරෙහි රජ්ජුරුවන් නිරා'දර වූ කල්හි ඔවුන්ගේ ගුණ රජ්ජුරුවන්ට කියා බිසවුන්ගේ ශ්‍රී සිර කරන්නාහු ද ධම්මයෙන් ම සිර කළහ.

තව ද, 1 **භණ්ඩුනිණ්ඩුක ජාතකයෙහි වෘක්ෂදෙවතාවෑ** සිටැ අධර්මිෂ්ඨවූ රජ්ජුරුවන්ට අවවාද දී දුක්පත් වූ සියලු ලෝ රැක්ෂා කොටැ ඒ රජ්ජුරුවන් දශ රාජ ධම්මයෙහි පිහිටුවන්නාහු ද ධම්මයෙන් ම කළහ. තව ද, **නෙසාදකුණ ජාතකයෙහි ජම්බු නම් පක්ෂිවෑ සිංහාසනා** රුඳවැ බ්‍රාහ්මණසිෂ්‍යයෙහි **ඉසිපතනයෙහි මිගදායෙහි** ධම්මාසනයට නැඟි ධම්මචක්‍රය පවත්වන විලාසයෙන් බණ වදාරා රජ්ජුරුවන් දශ රාජ ධම්මයෙහි පිහිටුවා ලොකා'ර්ථ කරණ සෙයෙක් ද ධම්මයෙන් ම කොටැ වදාළ සෙයෙක. තව ද, **සරභඞ්ග ජාතකයෙහි මනුෂ්‍යවෑ** සිටැ ශක්‍රාදීන්ගේ ශංසය දුරුකොටැ ප්‍රඥා වදාරණ සෙයෙක් ද ධම්මයෙන් ම වදාළහ. තව ද, **අලම්බුසා ජාතකයෙහි නාපස වෑ අලම්බුසා** නම් දිව්‍ය සත්‍රියගේ ශරීර ස්පර්ශයෙන් මුළුවැ තුන් හවුරුදද්දක් විසඟවැ ධ්‍යානයෙන් පිරිහී සංඥ ලත් ක්ෂණයෙහි පඤ්චකාම සෙවනය කළ බවට උකහාණ්ඩිතවැ නට ධ්‍යානය ඉපැදවූ **ඉසිසිඞ්ග නාපසයන්ගේ** කාමවිකාර දක්වන්නාහු ද දැන් තමන් වදාරන්නාවූ පඤ්චකාමා'දීනවයට මුල්කාරණ දුටහ.

තව ද, **සඞ්ඛපාල ජාතකයෙහි විෂඝෝර වූ නාගරාජවෑ** තමන් ගත්තාවූ අෂ්ටාඞ්ග ශීලයට භෙදයක් නොකරණ පිණිස තමන්ගේ ශරීරය අවතැනෙක් විදිනා **මොඤ්ඤුන්** කෙරෙහි මෛත්‍රී කරන්නාහු ද ධම්මයෙන් ම කළහ. තව ද, **චුල්ලසුතසෝම ජාතකයෙහි සුතසෝම නම් මහරජවෑ** හිසැ නරයක් දැකැ රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණ වූහ.

මෙසේ මාගේ සඞ්ඝයාණන් විසින් අනන්ත ජාතියෙහි අනන්ත ප්‍රකාරයෙන් පුරුදු කරණ ලද්දාවූ ධම්මරතනය සරණ යෙමි යි **දහම් සරණ ගා සූත්‍ර.**

---

1 සඞ්ඛපාලජාතකය-සිං.

තව ද, **නලිනී ජාතකයෙහි නාගයාවැ නලිනී නම් රජ කන්‍යාව** කෙරෙහි පෙලැඹී ශීලභෙදයට පැමිණ මහාවිනාශ යට සම්ප්‍රාප්තවූ යෑමේ කුමාරයන්ගේ ප්‍රවෘත්ති දැන්මෙන් තෘෂ්ණාවගේ අනිවාරියතාව ම දැක ලොවට තෘෂ්ණා වන සන්නාවූ ධම්මය ම පවත් කරන්නට උත්සාහ කළහ. තව ද, **උම්මාදගන්ධී ජාතකයෙහි සිව්රජවැ උම්මාදගන්ධීයගේ** රූපය දැකැ ම්සංඥවැ ද පරස්ත්‍රී සෙවනයෙන් වන ධම්ම විනාශය තමන්ට නො වැද්ද දී ධම්මය ම රක්‍ෂා කළහ. තව ද, **මහා බෝධි ජාතකයෙහි පඬිබ්‍රාජකයාවැ** ධම්මයෙන් යුක්ති විනිශ්චය කොටැ අඟුන ජනපද වාසීන්ගේ බසින් රජ්ජුරුවන් තමන් කෙරෙහි විමති ඇතිවූහ යි තමන්ගේ ප්‍රයෝගයෙන් පරීක්‍ෂා කොටැ ජීවිතය රක්‍ෂා කරන්නාහු ද ධම්මයෙන් ම රක්‍ෂා කළහ. තව ද, **සොණක ජාතකයෙහි අඞ්ගම නම් මහරජවැ** රාජ්‍යය හැරී මහණ වන්නාහු ද ධම්මයෙන් ම මහණවූහ.

තව ද, **සංකිච්ච ජාතකයෙහි සංකිච්ච නම් නාගයාවැ** පිතෘ ඝාත කම්ම කළා වූ රජ්ජුරුවන් අස්වසා බණ වදාරන්නාහු ද ධම්මයෙන් ම වදාළහ. තව ද, **කුස ජාතකයෙහි ප්‍රභාවතීන්** කෙරෙහි කළ අනුරාගයෙන් **කුසාවති** නම් රාජධානිය හැරී ඔවුන් පස්සෙහි යන්නාහු **දීපඞ්කර** පාදමූලයෙහි හස්ත ප්‍රාප්තවූ නිර්‍වාණ සම්පත් හැරී කරුණාව පස්සෙහි සසරට වන් ධවට දෘෂ්ටානත දැක්වූහ. තව ද, **සොණනන්ද ජාතකයෙහි** මවුපියන්ට උපස්ථාන කරන්නාහු ද ධම්මයෙන් ම කළහ තව ද, **චුල්ලහංස ජාතකයෙහි ද මහාහංස ජාතකයෙහි ද හංසරාජවැ** මලෙහි බැඳි තමන් මලෙහි නොබැඳුන ද සෙනහ පාසයෙන් බැඳිසිටින **හංස සෙනාධිපතීන්** ලදින් මලින් ගැලවී බැඳූ වැද්දාටත් උපකාර කළ මැනවැ යි සිතා රජ්ජුරුවන් කරා ගොසින් බණ කියා ශ්වේතච්ඡත්‍රයෙන් පූජාලදින් බැඳූ වැද්දා ටත් සම්පත් දෙන්නාහු පවා දැන් තමන් විදිනාට දුනු ගත්ත වුන්ට අමෘත මහා නිර්‍වාණය දෙන බවට පූර්‍වනිමිත්ත දැක්වූහ.

මෙසේ මාගේ සවාමි වූ බුදුරජාණන් වහන්සේ විසින් සියලු ලොකාර්‍ථචයෂ්‍යාව පිණිස කරුණායෙන් ප්‍රකාශ කොටැ භාවිත කොටැ පිහිට කොටැ තබා වදාළ **ධම්මරතනය සරණ** යෙමි යි **දහම් සරණ යා යුතු.**

තව ද, **සුධාභොජන ජාතකයෙහි** ශක්‍රදෙවෙන්ද්‍රවූ අදුනා 'හිරත වූ **කොසිඝයාගේ** තණ අගකින් තෙල බිඳු මාත්‍රය කුදු අනුන්ට නොදෙන්නාහු හික්මවා නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව දන්වා ලද්දාවූ තලඇට කුදු අනුන්ට නොදී නොකන පරිද්දෙන් දුනාහිරත කරණ සෙයෙක් ද ධර්ම්යෙන් ම කොටැ වදාළ සෙයෙක. තව ද, **සුතසොම ජාතකයෙහි** රාජ්‍යය පුදා ද සත්‍යය ම රක්‍ෂා කරණ සෙයෙක් ද ධර්ම්යෙන් ම රක්‍ෂාකළ සෙයෙක. තව ද, **නෙමිඝ ජාතකයෙහි නෙමිඝ කුමාරවූ** ප්‍රාණවධ ආදිවූ දුශ්චරිත කොටැ විඳිනා රාජ්‍යශ්‍රියෙහි කළකිරී නොහොඑවැ හොඑවැ නොබිහිරිවැ බිහිරිවැ නොපිඑවැ පිඑවැ සොළොස් හවුරුද්දක් සිතියමැ ඇඳ ලූ රූපයක් සේ වැසැ කාල කන්නි තැනත්තනු වළලා පියව සි කියන පරිද්දෙන් කිසි ඇසි පියක් සොල්වා ලති, අතක් පයක් සොලවා ලති, යනාදිවූ කිසි විකාරයක් නොකොටැ තමන් කැමැති **මහාභිනික්මන්** සාධා ගෙණැ මුළුලෝ ගළවන්නාහු ද ධර්ම්යෙන් ම ගැළවූහ.

තව ද, **මහාජනක ජාතකයෙහි** සත්දවසක් මුළුල්ලෙහි මුනුදු පීනා අනෙක ප්‍රකාරයෙන් දුක් ගෙණැ ලද්දාවූ **මිථිලා නුවරෙහි** රාජ්‍යය කෙරෙමින් පලහත් අඹ රුකකට අඹ ජාති කම්හ සි බොහෝදෙනා කළ විනාශ බලා ලොකයෙහි විපත්ති නම් මහත්වැ සිටි කෙණෙකුන්ට වන දෙයෙක් වනැ සි සම්පත්තියෙහි කළකිරී චක්‍රවර්ත්ති සමානවූ සම්පත්තිය හැරැ මහණ වන්නාහු ද ධර්ම්යෙන් ම මහණ වූ හ. තව ද, **සුවණ්ණ සාම ජාතකයෙහි සාම කුමාරවැ පිළිසක්ෂ** නම් රජ්ජුරුවන් විෂපිතවූ ශරයෙන් පහර කා ඒ ශර වෙදනාව ඉවසා අඬවූ මවු පියන් ගේ දුක් සිනා හඬන්නාහු ද ධර්ම් පිණිස හැඛූහ. තව ද, **නිමිරාජ ජාතකයෙහි නිමි මහ රජවැ** මනුෂ්‍යවැද සිටැ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ **වෛජයන්ත** රථයට නැඟී දෙව්ලොවට යන්නට සුදුසු වූ සාමර්ථ්‍යය ඇතිව ද හිසැ එකනරයක් දැකැ රාජ්‍යය හැරැ මහණ වන්නාහු ද ධර්ම්යෙන් ම මහණ වූ හ.

තව ද, **චන්දකුමාර ජාතකයෙහි චන්ද්‍ර නම් රාජකුමාරවැ බණ්ඩහාල** නම් පුරොහිතයාගේ බසින් යාගයෙහි මරන්නට ය සි කියා බඳනා ලදින් චන්ද්‍රාදේවීන්ගේ සත්‍ය ක්‍රියායෙන් ආවා වූ ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ ශක්තීන් තමන් හා යාගයට මරන්නට ගෙණ අනන්ත ප්‍රාණීන්ගේ දිවි ගළවා රාජ්‍යය ලබන්නාහු ද ධර්ම්යෙන් ම ලදහ. තව ද, **භූරිදත්ත ජාතකයෙහි**

භූරිදත්තනාම නාගරාජවෑ ශක්‍රසම්පත්ති යමාන නාගසම්පත්ති හැරැ මනුෂ්‍ය ලොකයට අවුත් පෙහෙවැ හෙවැ කිපී බැලූ බැලුම් මාත්‍රයෙනින් ම ලුළුලොව හසම කරන්නට සමර්ථව ද තමන් බිම ඇදෑ දික් කොටැ හොවා පාවිලිඹින් තළන්නාවූ **අහිතුණ්ඩිකසෘගේ** මූනුණ ඇස දල්වා බැලූව හොත් වෙස චිත්තයක් උපන හොත් බැලූ දෘෂ්ටියෙන් ම නිස්වුණු විෂ වෙග යෙන් මොහු නුට හොත් නපුරැ සි තමන්ගේ බලවත් වූ විෂය පිටත් විය නො දෙන පිණිස දෙර පියා ගන්නාසේ දෙ ඇස පියා හෙවැ කම් කටුල් විදැ ද ශීලභෙදයක් නො කරන්නාහු ද ධම්මයෙන් ම නො කළහ.

තව ද, 1 **මහානාරද කස්සප ජාතකයෙහි නාරද** නම් **මහාබ්‍රහ්මවැ අඩගාහි නම් රජ්ජුරුවන්ගේ** මිථ්‍යාදෘෂ්ටි බිඳැ ගුණ නම් නිවටාගේ දුළුබඩි දුරැ කොටැ ලුළුලොව සම්‍යක් දෘෂ්ටි යෙහි පිහිටුව වන්නාහු ද ධම්මයෙන් ම පිහිටුව වූහ. තව ද, **විධුර ජාතකයෙහි විධුරපණ්ඩිතවැ හිරන්දනි නම් නාග කන්‍යාව** කෙරෙහි ලොභ කළාවූ **පූණ්ණක නම් යක්ෂයා** සැට යොදුන් **පමණ කාළපබ්බතයට** නගා ගෙණැ තමන් ලය පලා පියා මස් ගන්මි සි පටන්ගත් කල්හි තමන්ගේ මධුර වූ ධම්මදෙශනා යෙන් තමාගේ ලෙහි මස් ගන්නට සිතූ යක්ෂයාගේ ලය තුබූ පළුබූ කොටැ ගන්නාහු ද ධම්මයෙන් ම ගත්හ.

තව ද, **උමංදුයෙහි මහෞෂධ පණ්ඩිතවැ** අටලොස් අක්ෂෞහිණියක් තමන් ගෙණ'වාවූ **බ්‍රහ්මදත්ත** රජ්ජුරුවන් තමන්ගේ එක බුඩි ශක්තියින් ලුහුබදවා අන්තයෙහි කාමවසග වැ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ රාජධානියෙහි හසුවැ ගියාවූ **වෙදෙහ** රජ්ජුරුවන් ලෙහි ඇවිලි ශොක'ගනි තමන්ගේ වච නා'නුස්මරණයෙන් නිවා සහ පිරිවර රජ්ජුරුවන් තමන් බුන් උමඟින් ගළවා ජීවිතදානය දෙන්නාහු ද ධම්මයෙන් ම දුන්හ. තව ද **වෙස්සන්තර ජාතකයෙහි වෙස්සන්තර මහරජවැ සුමෙධ නාපස**: කාලයෙහි පුරන්නට පටන් ගත්තාවූ සමතිස් පෙරුම්හි කුළු ගෙණැ සත් ඉඩෙකැ පොළොව කම්පා කොටැ මහ දන් දී බොධිසම්භාර ධම්මයන් මසුනක ප්‍රාප්ත කරන්නා හු ද ධම්මයෙන් ම කළහ.

---

1 බ්‍රහ්මනාරද කාශ්‍යප-සි.

මෙසේ මාගේ සැමීන් විසින් අනනන ජාතියෙහි අනනන ප්‍රකාරයෙන් පුරුදු කොටැ වජ්‍රාසනයෙහි පහරවා අත් නොහැරී ආවාවූ **දීපඞ්කර පාදමූලයෙහි** පටන් ධාතු පරිනිර්වාණය දක්වා ලොකාඛ්‍යයට ම සරහා සිටු වූ මා සේ වූ අනාථයන්ට ක්ෂෙම මන්ත්‍ර කොටැ තුබූ මාගේ ලයට අමෘත පරිෂෙකයක් බඳු වූ මාගේ කණට අමෘත මන්ත්‍රයක් වැනි වූ **සබ්බඤ්ඤුතඤාණ සරණ** යෙමි යි **දහම් සරණ යා සුතු.**

නව ද, මාගේ සැමී වූ නිලෝගුරු වූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ විසින් බුදු වූ සත් සති ඇතුලත්හි නමාට හිතොප දෙශ කරන්නා වූ ආචාය්‍ය කෙණෙකුත් නැතිවැ වසන බව සුදුසු නො වෙයි. මට ආචාය්‍ය වන්නට සුදුස්සෝ කවුරු දෝ හෝ යි සිතා වදුරා අවීචියෙහි පටන් ගෙණැ භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පටන් ගෙණැ අවීචිය දක්වා සසර අනනතා'පරිමාණ සක්වළෙහි මට ආචාය්‍ය වන්නා නඩා මා හා සමස්ථාන යෙහි සිටිනට ද එක ද සත්ත්වයෙක් නැත. සදෙවක ස මාරක ස'බ්‍රහමක ලොකයෙහි හැම මාගේ දැස පසසයෙහි සිටියහ. අනාචාය්‍යවැ වසන බවක් සුදුසු නො වෙයි.

එහෙයින් මට ආචාය්‍ය කා කෙරෙම් දෝ හෝ යි සිතා වදුරා මට [1] බැහැරින් ආචාය්‍ය වරුන් සොයන්නේ කුමකට ද? මාගේ සචමනුඤඤයෙන් දන්නා ලද්දාවූ සබ්බඤ්ඤය ම මට ආචාය්‍ය ස්ථානයෙහි තබම් යි සිතා වදුරා **නිලෝගුරු** වූ **නමන් වහන්සේට ගුරු නෙතුරෙහි නඩා වදාළ සබ්බඤ්ඤය** ම මට ශරණය. එසේ වූ ධම්මරතනය සරණය හියාවූ මට මනුෂ්‍ය'මනුෂ්‍යාදිවූ කිසි කෙණෙකුන් විසින් වන්නාවූ උපද්‍රවයෙක් දූරා'නිදූරය. එසේ හෙයින් ලුඑලොවට වජ්‍ර කවච වූ **ධම්මරතනය සරණ** යෙමි යි **දහම් සරණ යා සුතු.**

නව ද, මාගේ සැමී මැසි මදුරු කිඟිඹි කුහුඹු ආදිවූ ක්ෂුද්‍ර ප්‍රාණීන් කෙරෙහි පටන් ගෙණැ තුන්ගවූ පමණ උස ඇති **ඉන්‍ද්‍රදෙවෙන්‍ද්‍රයා** දක්වා දෙලොස් යොදුන් **මහාබ්‍රහමයන්** දක්වා යෙළසිඅයක් යොදුන් **ගරුඩයන්** දක්වා දහස් යොදුන් **ආනාපානදී** මනස්‍යයන් දක්වා සාරදහස් අවසියක් යොදුන් **රාහුඅසුරිඳු** දක්වා සිඅලු ලොව තමන්ගේ ඤාන ශක්තියෙහි කරුණා කුක්ෂියෙහි ලා ගෙණැ මම ය, මාගේ ය, මාගේ මිත්‍රයෝ ය, මට මඛ්‍යස්ථයෝ ය, මට අමිත්‍රයෝ ය, සත්‍රු ය, පුරුෂයෝ ය, ආය්‍ය

1 බැහරින්.

යෝ ඇ, අනාගතියෝ ඇ, දිව්‍යයෝ ඇ සිය නරයෝ ඇ අපායසථ යෝ ඇ, දසදිග් හාග වසින්විවූ අනන්තා'පරිමාණ සත්වලු පවත් නාවූ සියලු සත්තවයෝ රාජභය චෝරභයාදිවූ සියලු භයින් මුක්තවෑ, ජාති ජරා ව්‍යාධි ආදිවූ අපරිමාණ බ්‍යසනයෙහි රස නොදනු මෙලෝ පර ලෝ දෙක යෙහෙන් සාධා කෙසේ ගැලවෙද්දෝ හෝ කවර ලෙසෙක මොවුන් රක්‍ෂාවක් කෙරෙමි දෝ හෝ යි සිතා සාරාසඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි සසරට වැදී වෙහෙසී පෙළී සමතිස් පෙරුම් පුරා කෙළවර වජ්‍රාසනා රුඪිවෑ,

සවාසනා සවී කෙලෙශයන් නසා සව් නේ හෙවා දුනු බුදුවූ මා මෙතෙක් කල් දුන් ගත්තේ ලොව රක්‍ෂා කරණ පිණිස මුත් මා පිණිස නොවත්. මේ අනාථ ලොවට රක්‍ෂා වන්නට සුදුසු දෙයෙක් කිම් දෝ හෝ යි සිතා පරීක්‍ෂා කොටෑ වදුරමින් සියලු තත්තවතාක් තමන් වහන්සේගේ ඥානයෙන් පරීක්‍ෂා කොටෑ මේ අනාථ ලොව රක්‍ෂා කරන්නට කිසි දෙවතා කෙණෙකුට පිළිවන් නොවෙයි. කිසි බ්‍රහ්මයෙකුට පිළිවන් නොවෙයි. සෙසු නාග සුපණ්ණාදි සත්තවයන් අතුරෙන් එක්තරා එක් සත්තවයක් හට පිළිවන් නොවෙයි. මහා සාගරයෙහි පත්ලට බැසැ ද මෙර උසුලා සිටි ත්‍රිකූට පර්වතයෙහි යටට වැදී ද ආකාශයට නැගී ද සංසාර ව්‍යසනයෙන් සත්තවයා ගැලවා රක්‍ෂා ගන්නට සුදුසු එක ද කාරණයෙක් නොපැණේයි.

මෝඩුන්ට රක්‍ෂාව නම් මොවුන්ට සරණ නම් මොවුන්ට පියෝ නම් මොවුන්ට මවු නම් මොවුන්ට අනලොඹු නම් එක ම ධර්මය මුත් අන්දෑයෙක් නැතැ යි වදුරා,

"ධම්මෝ හවෙ රක්‍ඛති ධම්මචාරිං
ධම්මෝ සුචිණ්ණෝ සුඛ'මා'වහාති
එසා'නි සංසෝ ධම්මේ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී"යි

වදුරා ලොවට රක්‍ෂා කොටෑ ලොවට ප්‍රතිසරණ කොටෑ තිලෝ ගුරු සම්‍යක් සම්බුඩයන් වහන්සේ විසින් සිටුවා වදුළ ධර්ම **රත්නය සරණ** යෙමි යි **දහම් සරණ යා සුතු.**

තමා ශරණ ගියවුන්ට සියලු උපද්‍රව දුරුකරන්නාවූ ධර්ම **රත්නය සරණයෙමි යි දහම් සරණ යා සූත්‍ර.**

"ධම්මං සරණං ගච්ඡාමි-දහම් සරණ යෙමි.

ජාතක චරිත කථා සඞ්ග්‍රහය නිමි.

විතිය පරිච්ඡේදය.

තෘතීය පරිච්ඡේදය.

මෙසේ ශ්‍රද්ධා සම්පන්නවූ ජනයන්ට අනුග්‍රහ සඳහා දහම් දිගිකළ කෙණෙහි බොහෝ සත්ත්වයාට උපද්‍රව දුරුවන බව හඟවන පිණිස පිටකත්‍රයයෙහි පැණෙන්නාවූ කථාන්තර දක්වා දහම් සරණ වර්ණනා කෙරෙමි. ඒ කෙසේ ද? යත්:–

මාගේ සවාමී වූ මට කල්‍යාණ මිත්‍ර වූ මට ම සියලු දුකඃ ප්‍රතිකාරයට දිව්‍ය ඖෂධ වූ මාගේ ලයට අමෘත පරිෂේක වූ මාගේ ඇසට අමෘතාඤ්ජන වූ මා සසර වලින් නගන්නට අත් දී සිටි මට ම සිනහැතිවැ මට ම කරුණා ඇතිවැ මා එක නැනැත් තනූ ම ගළවන පිණිස මෙන් දිපඞ්කර පාද මූලයෙහි ම අත් පත් නිවන් සැප හැරී සසරට වත් තිලෝගුරු ගෞතම නොත්‍රයෙහි උපන් සම්මා සම්බුදු රජානන් වහන්සේ එක් සම යෙක්හි රජගහානුවර වෙළුවන විහාරයෙහි වැඩ වසන සේයෙක. එ සමයෙහි පුණ්ණ නම් දුගියෙක් රජගහානුවර සුමන නම් සිටානන් නිසා ජීවත් වන්නේය. ඔහුගේ ගෙයි මිනිස්සු නම්?–අඹුව හා උපනාග නම් දුව හා දෙන්න ම ය. එ සමයෙහි එක් දවසක් රජගහානුවර "සත් දවසක් කෙළි කෙළනේය"යි බෙර ලැවූහ. ඒ අසා සුමන සිටානෝ උදැස න ම ආවාවූ පුණ්ණ නම් දුගියා දැකැ දුරුව! අපගේ 1 පරිවාර ජනයෝ කෙළි නළු කෙළනා කැමැත්තෝ ය. නෙපි අද කෙරූ ද? බැළු මෙහෙකරුදැ යි කියා විචාළහ.

පුණ්ණ නම් දුගියා ද සවාමිනි! කෙළිනළු නම් සුව පතුන්ට මය. මාගේ ගෙයි සෙට දවසට 2 හඹු පිසන්ට ද සහල් නැත. එහෙයින් මට කෙළියෙන් ප්‍රයෝජන කිමෙක් ද? "ගොන් දුන හොත් සාන්නට යෙමි"යි කියා කිහ. නැවත සිටානන් විසින් එසේ වුවහොත් ගොන් ගෙණැ සාන්නට යව යි කී කල්හි ගොන් හා නඟුල් ගෙණැ සාන්නට යන්නේ නමා අඹුවට කියන්නේ, අද නුවර වැස්සන් කෙළි කෙළියැ දී මම බැළුමෙහෙ කරන්නට යෙමි යි අද මට වඩාලා බත් පිසැ ගෙණැ එව යි කියාලා කුඹු රට ගියේ. ඉක්බිති සැරියුත් මහතෙරුන් වහන්සේ සත්දව සක් නිරෝධ සමාපත්තියෙන් සමවැදී එයින් නැඟී අද කාට උපකාර කෙරෙම් දෝ හෝ යි බලා වදුරණ සේක් ඒ පුණ්ණ නම් දුගියා දැකැ "නැවත මෙ තෙම සැදැහැ ඇත්තේ දෝ හෝ

1 පරිජනයෝ. 2 කාපි යන්නට ද.

මට දන් දෙන්නට පොහොසත් දෙහෝ"යි බලා වදුරණ සේක් ඔහු සැදුහැ ඇති බව ද දන් දෙන්නට පොහොසත් බව ද දැනැ තමන් වහන්සේට දුන් දනින් ඔහුට මහා සම්පත්ති වන බව ද බලා වදුරා පා සිවුරු ගෙණැ ඔහු සිසානා නැනට වැඩැ එක්වළක් අසල 1 ලැහැබක් බලා බලා වැඩැ සිටි සෙයෙකි.

ඒ පුණ්ණ නම් දුගියා ද තෙරුන් වහන්සේ දැකැ අවුත් පසඟ පිහිටුවා වැඳැ 2 දුහවු දඬු කැමැති සේක් වනැ යි සිතා දුහවු දඬු කපා දී නැවත තෙරුන් වහන්සේ නමා අතට පාත්‍රයත් පෙරහන් කඩත් දුන් කල්හි පැන් කැමති සේක් වනැ යි සිතා පැන් පෙරා දිනි. ඉක්බිති තෙරුන් වහන්සේ මෙතෙම අනුන්ගේ පිටි පැලදෙර ගෙයක වසන්නේය. එහෙයින් මොහුගේ ගෙට ගියෙම් වී නමුත් මොහුගේ අඹු මා නො දන්නීය. එහෙයින් යම් නාක් ඕ නොමෝ ඒ බත් ගෙණේ ද ඒ නාක් මෙහි ම සිටිමි යි සිතා එ තැන ම මද විහසක් කල් යවා සිටැ ඔහුගේ අඹුව මඟට ආ බව දැනැ ඇතුළු නුවර බලා නික්මුනු සේක. ඔහුගේ අඹුදු අතර මඟ තෙරුන් වහන්සේ දැකැ "දනව සුදුසු දෙයක් ඇති දවසක් තෙරුන් වහන්සේ දක්නනො හෙමි. තෙරුන් වහන්සේ දුටු දවසක් දෙන්නට සුදුසු දෙයක් නො ලබන්නෙමි. අද දෙන්නට සුදුසු දෙයකුත් ඇත. තෙරුන් වහන්සේත් දුටිමි. තෙරුන් වහන්සේ මට කරුණ කොටැ වදුරණ සේක් දෙ හෝ යි සිතන්නී බත්බදන බහා නබා පියා තෙරුන් වහන්සේ පසඟ පිහිටුවා වැඳැ වහන්ස! මේ මිහිරිය නො මිහිරිය යි නො සිතා නුඹ වහන්සේගේ ගැත්තවුන්ට කරුණ කොටැ වදුළ මැනවැ යි ආරාධනා කළා.

ඉක්බිති තෙරුන්වහන්සේ පාත්‍රය පැ වදුරා බත් භාගයක් ගෙණැ ලූ කල්හි අනින් පාත්‍රය පියා ගෙණැ වළකා වදුළ සේකි. නැවත ඕ නොමෝ නුඹ වහන්සේගේ ගැත්තවුන්ට මෙලොවින් කරුණ නො කොටැ පර ලොවින් කරුණ කොටැ වදුළ මැනවැයි ආරාධනා කොටැ අහර මුළුල්ල ම පාත්‍රයෙහි පිළිගන්වා නුඹ වහන්සේ දුටු නිවන් දක්න හෙම්ව යි ප්‍රාර්ථනා කළාය. තෙරුන්වහන්සේ ද "එසේ ම වේවා"යි වදුරා එක් පැන් ඇති තැනෙකැ වැඩැ හිඳැ වළඳා වදුළසේකි. පුණ්ණ නම් දුගියාද සසින් විඩාවැ සහන්නට නො පොහොසත් වූයේ හොන් මුදු

1 ගෙබක් බලා. 2 දුවැව්-දුවටු.

හැරී පියා ගසක් මූලැ අඹුව එන පෙර මග බල බලා හුන් නේය. ඔහුගේ අඹුව ද නැවත ගෙට ගොස් බත් පිසා ගෙණැ ගෙණෙන්නී ඔහු දැකැ මේ තෙම සසින් විඩාව හුන්නේ බත් ලස් කෙළේ කුමටදැ සි මා මැරී නම් මා විසින් දුන් දන් සිස් වන්නේය.

එහෙයින් පළවූ කොටැ ම මෙසේ ඕහට කිව මැනවැ සි සිතා සුණණ නම් දුගියාට "සැමියය! අද එක දවසක් නොප ගේ සින පහදව, මා විසින් බොහෝ වේලේම නට බත් පිසා ගෙණැ ගෙණෙන්නෙම් අතර මහැ ධම්සෙනෙවි **සැරියුන් මහනෙරුන් වහන්සේ** දැකැ නට ගෙණෙන ඒ බත් ඔවුන් වහන්සේට පිළිගන්වා නැවත ගෙට ගොස් බත් පිසැ ගෙණැ ආම් සි තා සින පහදව සි කිවුය. ඉක්බිති සුණණ නම් දුගියා "කිමෙක් ද? නී කියන්නේ"යැයි විචාරා නැවත එපවත් කී කල්හි සාධු! සාධු!! යහපත කළසේය. මම ද අද දවස උන්වහන්සේට උදැසන දුවටි දඹු ඹුබ සොඛන පැන් ද දින් මී සි සතුටු වූ සිත් ඇත්තේ ඒ තමා අඹුව කී බස් පහන් සිතින් 1අනුමෝදන්වැ සා විඩාවැ බත් කැමෙන් විඩා වූ ශරීර ඇත්තේ අඹුව ඇකයේ හිස තබා ගෙණැ මදක් නිදැ පිබිදැ ඇත්මෑත් බලන්නේ තමාගේ 2 සාන කෙත්වත මුළුල්ලම කිණිහිරි මල් රැකක් සේ රන්වන්වැ පියා පැණෙන්නා දැකැ මෙමා සාන තැන්නාක් රන්වන්වැ පියා පැණෙයි. කිමෙක් දෝ හෝ කල් යවා බත්කැ හෙයින් මා ඇස් බමණ නියා වනැයි සිතා තමා අඹුව අතිනුදු විචාරා ඇ විසිනුදු "සැමිනි! මටත් මෙ පරිද්දෙන් පැණේ"යි කී කල්හි තෙමේ නැඟි සිටැ කුඹුරට ගොස් එක් මැටිපිඩක් ගෙණැ නගුළිසැ පැහැරී රත්රන් බව දැනැ **ධම්සෙනෙවි සැරියුන් මහනෙරුන් වහන්සේම** දුන් දනින් අද ම මෙබඳු විපාකයෙක් වී ඇ සි සතුටු වී.

• නැවත මෙපමණ ධන සහවා ගෙණැ වැළඳ ඉන්නට නො පිළිවනැ සි තමාට බත් ගෙණ ගිය බදුනෙන් රන් බදුනක් පුරා ගෙණැ රජගෙට ගොස් රජ්ජුරුවන් දැකැ "සැමිනි! අද මා සාන තැන් මුලුල්ලෙහිම රන්වන්වැ පියා තුබුයේ. ඒ ගෙන්වාගත මැනවැ"යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ "තෝ කවරෙක්හි ද? අද කුමන් කෙළෙහිදැ"යි විචාළෝය.

---

1 පිළිගෙණැ. 2 සාට කෙත්වත.

"සවාමිනි! මම පුණණ නම් දුගියෙක්මි. අද මම උදැසන **ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේට** දුවැරි දහු ද මුඛ සොධන පැන් ද දිනිමි"සි "මාගේ 1 අඹු ද මට ගෙණෙන බත් අතර මග දැකැ ඔවුන් වහන්සේට ම දන්දුනි"සි කී කල්හි "**ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේට** දුන් දන්හි විපාක අද ම දුටුයෙහි වේ ද"සි කියා නැවත "දරුව! අපි කුමක් කරමෝද සි විචාළෝ. සවාමිනි ! හැල් දහස් ගණන් යවා ඒ රත්රන් ගෙන්වුව මැනවැ"සි කීහ.

ඉක්බිති රජ්ජුරුවන්ගේ නියොගයෙන් රජ්ජුරුවන් සතු කොටැ 2 ගන්නා කල්හි ගත් ගත් දෙයම මැරිවැ යන්නේය. ඒ බව ගොස් රජ්ජුරුවන්ට කී කල්හි "නෙපි කුමක් කියා ගණුදැ"සි විචාරා "නුඹ වහන්සේ සතුය සි කියා ගණුම්හ"සි කී කල්හි "මම ඒ රනට කවරෙක්වෙම්ද? පුණණයා සතු කොටැ ගණුව"සි කියා රජ්ජුරුවෝ මිනිසුන්ට නියොග කොළෝ. ඉක්බිති රජ්ජුරුවෝ නුවර වැස්සන් කැටි කොටැ මෙතෙක් ධන මේ නුවර කාට ඇද්දැයි විචාරා "කාටත් නැතැ සි කිකල්හි නැවත මෙතෙක් ධන ඇත්නාවූ මෝහට කුමක් දෙන්නට සුදු සුදැයි විචාරා සිටුතනතුරු දෙන්නට සුදුසුයැ සි කී කල්හි ඔවුන්ට **ඛහුධන සිටානෝයැ** සි නම් දී සිටු තනතුරු දුන්හ.

ඉක්බිති ඒ සිටානෝ "සවාමිනි! මෙතෙක් කල් අනුන්ගේ ගෙයි විසුම්හ. දැන් අපට වෙනම වසන තැනක් දුන මැනවැයි ඉල්ලූහ. රජ්ජුරුවෝ ද ඔවුන්ට නැසී පියා නු බූ පෙර සිටු කෙණෙකුන්ගේ බිමක් දුන්හ. ඒ සිටානෝ ද ඒ බිමැකිප දවසකින් ගේ නංවා එගෙට වදන මඟුල් ද නමන්ට සිටු තනතුරු ලද මඟුල් ද එක් කොටැ කරන්නාවූ සත්දවසක් මුළුල්ලෙහි බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේට මහදන් දුන්හ. බුදුන් වහන්සේ ද බණ වදාළ සෙයෙකි. ඒ බණ අසා පුණණ නම් සිටානෝ ද ඔවුන්ගේ අඹුවෝ ද **උභතරා** නම් දියණියෝ ද සෝවාන්වැ නිවන් සුව ලදහ.

පසුව කල් යාමකින් එම නුවර **සුමන** නම් සිටානෝ මෙ කී පුණණ නම් සිටානන්ගේ දියනියන් ඉල්වා ඔවුන් නො දෙම්හ සි කී කල්හි "එසේ නො කියව; මෙතෙක් කල් නෙපි

---

1 අඹුවද, 2 ගත් කල්හි.

අප නිසා වැසැ මේ සම්පත් ලදුව; එහෙයින් අපගේ දරුවන්ට නොපගේ දියණියන් පාවා දෙව යි ඉල්වා නොප පුතනුවෝ සැදහැ නැත්තෝය. අපගේ දූ තුණුරුවන් හැර නොපවත්නිය. එහෙයින් නො දෙම්හයි කිවුය. ඉක්බිති බොහෝ සිටුවරුන් ආදි බොහෝ කුලපුත්‍රයෝ ගොස් ඒ සුමන සිටානන් හා 1 විශ්වාසකම් නො බින්ද මැනවැ යි ආරාධනා කොළෝය. ඔවුන්ගේ ආරාධනායෙන් පුණ්ණසිටානෝ නමන්ගේ දියනියන් සුමන සිටානන්ගේ පුතනුවන්ට ඇසැළ මසැ මැදි පොහොය හිදුවා දුන්හ.

ඕහට දුන් තැන් පටන් ගෙණ උනානරා නම් උපාසිකාවෝ සඞ්ඝයා වහන්සේ වරුන්දැ කරා එළඹෙන්නට ද දනක් දෙන්නට ද බණ අසන්නට ද නො ලබන්නාහු මෙසේ දෙ මස් දෙපෝයක් යැවූය. නැවත උනානරාවෝ එක් දවසක් තව මේ වස් වසන කලින් කී දවසෙක් ඉතිරිදැ යි තමාගේ කැවිවැ සිටිය වුන් අතින් විචාරා තව දෙපෝයෙක් ඇතැ යි කී කල්හි ඕ තොමෝ තමාගේ පියානන්ට කුමක් හෙයින් මා මෙබඳු දහ ගෙයකැ 2 දැමූ සෙයෙක් ද? මෙසේ වූවන්ට දිමට වඩා සන් ගසා අනුන්ට මිඩි කොටැ දෙන බව ඔහපතැ යි මෙ මට ආ තැන් 3 පටන් කොටැ සඞ්ඝයා වහන්සේ වරුන්දැගේ දැකුම් ආදිවූ කිසි පින්කමක් කරන්නට නො ලැබෙම් කියා යැවූහ.

ඉක්බිති සුණ්ණ නම් සිටානෝ මාගේ දියනියෝ දුක්පත්වැ ගියෝ වනැ යි සිතා පසළොස් දහසක් මසුරන් යැවූහ. රන් ගවන්නෝ ද මේ නුවර සිරිමා නම් කුනියක් ඇත. ඕතොමෝ දවස්පතා දහසක් ගන්නී. මේ රන් ගවා ඈ ගෙන්වා ගෙණැ තමන් සමනන් පාවා දි ලත් අවසරයෙක කුසල් කරන්නේය යි කියා යැවූය. උනානරාවෝ ද එකී පරිද්දෙන් සිරිමා නම් කුනිය ගෙන්වා ගෙණැ තමන්ගේ සමනන් කරා ගොස් "සඟමිනි! මේ දෙපෝයෙහි මාගේ මේ යෙහෙළි නොපට අත්පා මෙහෙ කෙරෙයි. මම මේ දෙපෝයෙහි දන් දෙනු කැමැත්තෙම්. බණ අසනු කැමැත්තෙම් යි කිව. ඒ සුමන සිටානන්ගේ පුතනුවෝ ද ඒ සිරිමා නම් කුනිය දැකැ ඈ කෙරෙහි ඇලුම් ඇතිවැ යහපතැ යි හිවිස්සෝය.

---

1 විස්වස්කම්. 2 දැසේක්ද. 3 පටන් කොට ගෙණ.

ඉක්බිති උත්තරාවෝද බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට ආරාධනා කොටැ කන්න බොන දෑ ආදි දන්දීමෙහි යෙදී දන් පිසන තැන ම යෙදී ඇවිදිනාහු යි. එක් දවසක් සුමන සිටානන්ගේ පුතනුවෝ ඒ නුවණ නැති තැනැත්නි කුමක් කෙරේ දෝ හෝ යි 1 කවුළුයෙන් බලන්නේ උත්තරාවන් ඩාදි යෙන් තෙම් දැලි වැකි අඟුරු කණුවක් සේ බත් මාලු පිසන්නට නියොග කොටැ ඇත මැත ඇවිදිනාවුන් දකැ මේ නුවණ නැති තැනැත්නි මෙසේ වූ තැන සම්පත්නි අනුභව නො කොටැ මෙතෙක් දුක් ගෙණැ ඇවිදිනි සතුටු සතුටුවැ ඇවිද්දි යි සි පියා එතැනින් ගියේ.

ඔවුන් එතැනින් ගිය කල්හි ඔහු සමීපයෙහි සිටි ඒ සිරිමා නම් කුනි "කුමක් බලා දෝ හෝ යි මොහු සි පියේ?" ඇසී උත්තරාවන් කෙරෙහි වෛර බැඳැ උඩුමාලෙන් බැසැ දන් පිසන තැනට ගොස් කැවුම් පිසිමින් සිටි 2 ඇතිළියෙහි කකියන තෙල් සාළුවෙන් උකා ගෙණැ උත්තරාවන් ඇලයට ගියා. උත්තරාවෝ ද ඒ කුනිය කකියන තෙල් සාළුවෙන් උකා ගෙණැ තමන් කරා එන්නිය දැකැ මාගේ යෙහෙළිඝ මට කළ උපකාරඝට මේ සක්වළ ඉතා කුඩාය. බඹලොව ඉතා මිටිය. මාගේ යෙහෙළිය ගේ ම ගුණ ඉතා මහත. මම මැ නිසා දන් දෙන්නට බණ අසන්නට ද ලැබෙමි. ඉඳුන් මැ කෙරෙහි රැහැණි යක් ඇත්නෙම් වීම් නම් මේ තෙලින් මා ඇඟ දැ යේව යි නො එසේ වීම් නම් නො දුව යි කියා මෙසේ ඈ කෙරෙහි මෙත් සිත් පැතිරී වූහ.

ඒ සිරිමා නම් කුනි ද තමාගෙන් කකියන තෙල් උත්තරාවන් ඔවුනොහි වත් කළා. එසේ හුණුවූ තෙල් පැන් සේ විය. මෙසේ සිත් නැත්නාවූ ගිනි ගෙණැ දිලියෙන තෙල් පවා ධර්මඥයන්ට අමෘත පරිභෝජයක් සේ සිහිල්වූ බව අසා මෙනෙහි කොටැ අපට ද සියලු උපද්‍රව මෙසේ ම දුරු කරම්හ යි සිතා සියලු සංසාරයෙහි පවත්නා සත්ත්වයන්ට දුක් දුරු කොටැ සුව ඵලවන්නාවූ ධර්මය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

උත්තරාකුමාරියගේ කථාව නිමි.

---

1 කවුළුයෙන්. 2 ඇතිලියෙන්.

බොධිසත්ත්ව කථා. "ධම්මං සරණං ගච්ඡාමි", දහම් සරණ ගියෙමි ..... නමා සරණ ගිය මේ ධර්මය තමා රැක්කවුන් රක්‍ෂා කරණ පරිදි මේ කථානන්තර යෙහුදු දත යුතු. හේ කෙසේ ද? යත්:-

මඬහල සම්‍යක් සම්බුධයන් වහන්සේ තමන් වහන්සේ බොධි සත්ත්ව භූමියෙහි සිටිකල්හි සවිනේ ගෙවා දැනැ සවා සනා සවී කෙලෙසයන් නසා බුදුවැ කළමනා බුඩ කෘත්‍යය තාක් මස්තක ප්‍රාප්ත කොටැ සූවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් ගේ අමෘත මහා නිර්‍වාණ සන්ක්‍ෂීනයෙන් වූ සන්තොෂය එක තින් බෙදූ වළඳූ කරුණාධුරයෙහි 1 මුදුන්පත්වැ පිරිනිවන් පෑවාවූ එක් සම්‍යක් සම්බුඩ කෙණෙකුන් වහන්සේගේ චෛත්‍යය දැකැ වදුරා මේ චෛත්‍යය නම් සවීඥ කෙණෙකුන්ගේ ධාතු නිධාන කළ චෛත්‍යයෙකැ යි යන 2 බැවහාර මාත්‍රයක් බව මුත් සකල ලොකාඑ තාක් එක් තැන් කොටැ බැන්දාවූ මහ නිධාන යෙකැ යි පිරිනිවියාවූ තමන්ගේ ශරීරයෙහි 3 ඇටින් පවා ලොකාඑ කරන්නාවූ මහා පුරුෂයන්ට මා විසින් මාගේ ජීවිතයෙන් පූජාවක් කළහොත් යහපතැ යි සිතා වදුරා සසර පමණින් තමන්ගේ සිත ශීලාදිවූ ගුණ ධර්මයෙන් වෙළා අනාථ සත්ත්වයන් කෙරෙහි පවත්නාවූ සෙනහයෙන් අදද කොටැ ඝන තෙජසින් දල්වා පිරිනිවියාවූ මහා පුරුෂයානන් වහන්සේව මම ද මාගේ ශරීරය පහන් පියල්ලෙන් වෙළා තෙලින් අදද කොටැ ගින්නෙන් දල්වා පහන් පූජා කෙරෙම් යි සිතා වදුරා දඩුවැටන් වෙළන්නා සේ සියලු ශරීරය කඩින් වෙළා තෙල් ගසා ගිනි අවුලුවා ලක්‍ෂයක් වටනා සවණී පාත්‍රයෙක සූවද තෙල් පුරා වැරි දහසක් එහි ම අවුලුවා හිසැ සිටැ දෙ පත්ල දක්වා සවී'ඩහයෙහි ගිනි අවුලුවා තුන් යමකින් යුක්තවූ රාත්‍රියෙහි නිස් පැය මුළුල්ලෙහි ඒ චෛත්‍යය පැදකුණු කොටැ වදුළ සෙයෙක.

එසේ ම සවී'ඩහයෙහි ඇවිලී ගින්න ඒ මහා පුරුෂයානන් ගේ සිත්හි පිරී තුබුවාවූ ධර්මයෙහි අනුසසින් ශරීරයට උපද්‍රව යක් කරන්නා නබා රොම කූප මාත්‍රයකුදු හුණු කොටැ පිය නොහින. පවනින් සැලෙන්නාවූ පෙති ඇති පියුම් ගබකට

---

1 මනුපත්වූ. 2 බෘවහාර මාත්‍රයක්. 3 ඇටෙක් පවා.

වන්නාවූ රාජහංසයකු සේ දිලියෙන්නාවූ ගිනි මඩයට වන්නාවූ මහා පුරුෂයානෝ ,නිරුපද්‍රවවැ' පහන් කොටැ වදාළ සෙයෙක.

ඒ අනුසසින් නමන් වහන්සේ බුදුවූ කල්හි අනූදහසක් අවුරුදු මුළුල්ලෙහි දසදහසක් සක්වළ ගබ කෘෂ්ණ පක්ෂ චාතුද්දසියෙහි දිලියෙන්නාවූ **ගන්ධමාදනපර්වතය** සේ ශරත් කාලයෙහි දිලියෙන්නාවූ **ලෝහිතකූසක** සේ හාත්පසින් නැහෙන්නාවූ රශ්මින් ගැවසී ගත්නාවූ **ජාතිරඛ මාණික්‍යයක්** සේ එකා'ලොක කොටැ වදාළ සෙයෙක.

මෙසේ ධර්මය නම් සිත් පිත් නැති ගින්නෙන් පොවා උපද්‍රවයක් වැද්දැනෝ දී ලොව රක්‍ෂා කරණ දෙයෙක. එසේවූ ධර්මය ද මෙනෙහි කොටැ සසර පමණින් රක්‍ෂා වන බව සත්පුරුෂ ධර්මයෙක. බුදු පසේබුදු මහ රහතන් වහන්සේ ද නමන් වහන්සේට ශරණ කොටැ තකා වදාළේ මේ ධර්මය මය. පෙරවූ අනන්තා පරිමාණ සම්‍යක් සම්බුඩයෝ ද දැන් පවත්නා **ගෞතම ගෝත්‍රයෙහි** උපන් **සර්වඥ දරුවෝ** ද මතුවන අප්‍රමාණ සම්‍යක් සම්බුඩයන් වහන්සේ ද නමන් 1ජීවමාන කල්හි ද පිරිනිවි කල්හි ද සියලු ලොකාඑ මෙම ධර්මය ම එල්බ කොටැ ගෙණැ වදාළ සෙයෙක. එහෙයින් යක්‍ෂයන් සේ පරුෂයන්ගේ ක්‍රොධ'ගනින් පිරී නිබෙන ලය තමා දුටු වේලෙහි අමා යෙන් පිරූ මහවිල් සේ සිහිල් කරණ පිණිස **දරුජන්‍ය චොර භය අග්නිභය**'දි භය සංඥා යෙනුදු මා කරා නොවැද්ද දී ධර්මයෙහි ගුණ නොදන්නාවූ සත්වයන්ට විෂ සේ පවත්නාවූ සංසාරයට ම අමෘතමය කොටැ මෙම ධර්මයෙන් ම 2 අත්වැඩ පරවැඩ මුදුන් පත් කොටැ අමා මහ නිවන් වැදූ සැනහෙන පිණිස ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ සා සුතු.**

"**බුද්ධං සරණං ගච්ඡාමි**", **දහම් සරණ යෙමි** යනාදිය නව ද අනන්ත දුකඛයෙන් ගැවැසි ගත්නාවූ මේ සංසාරයෙහි සියලු දුකින් මුකතාවැ බ්‍රහ්ම විමානයෙහි වසන්නාවූ බ්‍රහ්මයන්විලාශයෙන් යෙහෙන් වසන පිණිස මා සරණයට තැකුවාවූ මේ සඩ්ඛ්‍ය ලුලු ලොවට සරණ බව භගවන පිණිස තමන් වහන්සේ බඩහොත් කල්හි මළාවූ මැණියන් වහන්සේ හා එක්වැ සොහොනට දවන්නට ගෙණැ ගියාවූ **සඩ්ඛ්‍යවම සාමණේරයන්**

1 ඛරියමාන කල්හි. 2 ආත්ම වැඩ-හැම.

වහන්සේ සොහොන්හි දරුසැයෙහි ඇවිලිවූ ගින්නෙහිදු නො දැ රැකුනු පරිදි හඟවනු පිණිස ඒ **සංඝභව සාමණේරයන් වහන්** සේගේ කථාමෘතය දක්වම්. තමාට 1 සිනෙහැති ධර්මයට සිනෙ හැති බුදු රුවනට සිනෙහැති සඟුරුවනට සිනෙහැති සත්පුරුෂ යන් විසින් සිනෙහැතිව ඇසියයුතු. හේ කෙසේද? යත්:-

සංඝභව සාමණේර කථාව. සංඝභව සාමණේරයන් වහන් සේ නම් **සැරියුත් මහතෙරුන් වහන්සේගේ**අතැවැසිවූ සත්හැවිරිදි යෝම්දරුවානෙ කෙණෙක. උන්වහන්සේගේ මෑණියන් වහන්සේ උන්වහන්සේ බඩ හොත් කල්හි ම මළ සේක. මළාවූ ඔබ දවන කල්හි සියලු ශරීරය දැ හෙණෑ හොස් සෝම්දරුවානන් වැඩ හොත්තාවූ ගර්භ මාංශය ම සඤ්ඤ වලාගෙහි තුබූ පූර්ණ චන්ද්‍රමණ්ඩලයක්සේ ඇවිල නැහෙන්නාවූ ගිනි මධ්‍යයෙහි නො දැ තුබූ යේ. දවන මනුෂ්‍යයෝ නො දැ තුබුවාවූ ගර්භමාංශය දැකැ ගිනි මද පිණිස ය සි දෙතුන් නැනෙක හුලින් ඇනැ අඟුරු පිහිරා යට ලා පියා නැඟි ගියහ.

ගර්භ මාංශය ගින්නෙන් දත් ද මල දැ ඉඩවැ ගියාවූ රන් පිළිමයක් සේ රෝම මාත්‍රයකට ද උපද්‍රවයක් නො වූ කුමාරයෝ ගිනි මධ්‍යයෙහි විකශිතවූ පද්මයක් මධ්‍යයෙහි දිලිහි දිලිහී හුන්නාවූ රන්වන් හංසරාජයන්හු සේ වැඩ හුන්හ. පසුව සොහොන් නිවන්නට ගිය පුරුෂයෝ ගින්නෙහි වැඩහුන්නාවූ කුමාරයන් දැකැ විසමය පත්වැ ගෙණ'වුත් වැඩුහ. ඔබ සත් හැවිරිදි කල්හි කෙළිමඩලෙහි දී කැටිවැ කෙළනා කුමාරයන් විසින් "නොප බඩ හෝනා කල්හි ම නොපගේ මෑණියෝ මළහ. තෙපි ඔවුන් දරුසැයට නඟා දවන කල්හි ද නො දැ රැකුණුව" යන බස අසා "මාගේ මේ සා උපද්‍රවයෙන් රැකුණු ජීවිතය අසථාන සේ නො නසමි" සිතා නෑයන් අනුදන්වා **සැරියුත් මහ තෙරුන් වහන්සේ** කෙරෙහි මහණ වන්නට පටන් ගෙණ මහණ කරවන පිණිස හිසතේ බහන්නට යෙදී කරය හිස ඔබා ගත් කර අන්හිම සිවුපිළි සිඹියාපත් රහත්වූ සේක.

බුන්වහන්සේ මවුකුස්හි වසන කල්හි මෑණියන් වහන්සේ හා එක දරුසැයට නැඟූ කල්හි ඒ ගින්නෙන් රක්ෂා කෙළේ ද

1 සිනහැති-ඇ,

ඔබ ගිය ජාතියෙහි පිරූ සුචරිත ධර්මයමය. හුලින් පෙරළ පෙරළා අන්නා කල්හිදු ජීවිත විනාශයක් විය නොදී රක්ෂා කෙළේත් ඔබ පිරූ ධර්මය මය. එහෙයින් මේ සියලු උපද්‍රවයට වජ්‍ර කවචයක් වැ සිටියාවූ සබ්මිය මුත් අනිත් සරණෙක් සතුව යන්ට නොපැණේ යි දැනැ තමාට හිත කැමැත්තවුන් විසින් නිවත් හිමිකොටැ දහම් සරණ සා සුතු.

මහා කපින රාජ කථාව: "බුද්ධං සරණං ගච්ඡාමි," දහම් සරණ යෙමි. නවද ධර්මයෙන් සියලු සතුවයාට වන්නාවූ ඉෂ්ට සිද්ධිය දක්වන පිණිස මහා කපින රජ්ජුරුවන්ගේ කථාව දක්වනු ලැබේ.

ගේ කෙසේද ? යත් :-

මේ කපින මහනෙරුන් වහන්සේ පිටුමතුරා සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි කරණලද කුසල් ඇතිවැ සංසාරයෙහි ඇවිදිනා සෙයෙක් මේ කප්හි බරණැස් නුවරට නුදුරු තැන්හි වියන්නවුන්ගේ ග්‍රාමයෙක්හි වියන්නවුන්ට වැඩි මාළුවැ උපන්සේක. එසමයෙහි පසේ බුදුන් වහන්සේ වරුන්ද දහසක් දෙන අටමසක් හිමාලයයෙහි වැසැ වැසි සාර මසක් මනුෂ්‍ය වාසයෙහි වසන සේක. ඔබ එක් සමයෙක්හි ආකාශයෙන් බරණැස් නුවරට නුදුරු තැනකට බැසැ, වසන්නාවූ සෙනසුන් කරවන පිණිස වහල්වන්නට රජ්ජුරුවන්ට සැල කරවයි පසේ බුදුන් වහන්සේ අටදෙනෙකු යවා වදුළුසේක.

එසමයෙහි රජ්ජුරු වන්ගේ වප් මඟුලෙක් ආසන්නව විය. රජ්ජුරුවෝ පසේ බුදුන් වහන්සේ වැඩිබව අසා හෙන් නික්මැ වැදැ එකත් පස්වැ සිටැ වැඩි කාරණ විවාරා එ පවත් අසා අද අවකාශ නැත. සෙට අපගේ වප් මඟුල, තුන්වන දවස් වසන විහාර කරවම්හ. වස් වසවම්හයි කියා පසේ බුදුන් වහන්සේ නොපවරාම රජගෙට වන්හ. පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන් නොපැවරූ හෙයින් අනික් ගමකට යම්හ යි කියා නික්මුනු සේක.

එසමයෙහි ඒ ගමට වැඩිමහළු යටදක්වන ලද විසන නැනැත්තවුගේ අඹු කිසි කටයුත්තක් පිණිස බරණැස් නුවරට යන්නී වඩනාවූ පසේ බුදුන් අටදෙනා වහන්සේ දැකැ

"සඞ්ඝමිනි! නොවේලේ වැඩියේ කුමක් පිණිසද"යි විචාරා ඇදියෙහි පටන් ගෙණැ එපමත් අසා තමා ශ්‍රද්ධා සම්පන්න හෙයින් හා බුද්ධි සම්පන්න නෙයින් හා "සඞ්ඝමිනි! සෙට අපගේ ගෙන් වැළඳුව මැනවැයි පැවරුව. ඒ පසේ බුදුන් වහන්සේ 1 "නහ! අපි බොහෝ දෙනම්හ"යි වදාළසේක. ඕ තොමෝ "සඞ්ඝමිනි! හැමදෙනා වහන්සේ කෙතෙක් ඇති සේක්ද" යි විචාරා "දහ සක් දෙනම්හ"යි වදාළ කල්හි "සඞ්ඝමිනි! මේ ගමත් අපගේ 2 කුලගෙවල් දහසෙක. 3 එකී දෙන එකෙකී දෙනා වහන් සේට දන් දෙම්හයි වසන තැනුත් කරවම්හ යි ඉවසා වදාළ මැනවැයි පැවරුව.

එසේ පවරා ගමට වැද ගම්වැස්සන් එක්කොටැ ගම්මැද මඩුවක් කරවා පසේ බුදුන් වහන්සේ වඩා හිඳුවා වළඳවා තුන් මසක් එහිම වස් වසන පිණිස පවරා ගම්වැස්සන් එක්කොටැ දහසක් දෙනා වහන්සේට වෙන වෙන පන්සල් කරවා තුන් මසක් වස් වස්වා වස් අනතුයෙහි එකෙකී දෙනා වහන්සේට දහස් දහස් වටනා සිවුරු දෙවූහ. පසේ බුදුන් වහන්සේ වස් වසා අනුමෙවෙනි බණ වදාරා වැඩියේක. එහෙම් වැස්සෝ ඒ කළ කුශලයෙහි අනුසසින් මිය **තව්තිසා** භවනයෙහි **ඉණ** දිව්‍යපුත්‍ර වැ උපන්හ. ඔහු ඒ දිව්‍ය සම්පත්හි අනුභව කොටැ **ඛසුප් සම්මා සම්බුදුන්** දවසැ බරණැස් නුවර වෙන වෙන කෙළෙඹි කුලයෙහි උපන්හ.

ජ්‍යෙෂ්ඨ (වැඩි මහළු) පෙසකාරයා වැඩිමහළු කෙළෙඹි යාටම පුත්වැ උපන. ඔහුගේ අඹු ද ජ්‍යෙෂ්ඨ කුටුම්බික යාට ම දුවැ උපන. ඒ දහසක් ගැණු වැඩිමහළුවැ කුලගෙට යන් නාහු පෙරැ තමන් සැමියන් දහසක් දෙනාගේ ගෙටම ගියහ. එක් දවසක් ඒ දහසක් කුටුම්බිකයෝ **ඛසුප් සම්‍යක් සම්බුධ** යන් වහන්සේගේ බණ අසම්හ යි බණ පිරිස් හා කැවිවැ විහාර යට ගියහ. ඔවුන් විහාරයට වන් කෙණෙහි ම මහ වැස්සෙක් නැඟිය.

එහි තම තමන්ගේ වෙන වෙන උපස්ථාන කරණ සාම ණේර යන් කුලූපගයන් වහන්සේ ඇති උපාසක වරහු තමන් ගේ වහන්සේ වරුන් සතු පිරිවෙන් ආදියට වන්හ දහසක්

1. නැඟනියෙනි, 2. කුල දහසෙක. 3. එකි එකිදෙන. ඒ හැමදෙනා වහන්සේට.

උපාසක වරහු තමන් උපස්ථාන කරණ වහන්සේ වැන්දුවත් තමන්ට නැ වන වහන්සේ කෙණෙකුන් දුවත් නැති හෙයින් විහාර මධ්‍යයෙහිම සිටියාහ.

එසේ සිටිකල්හි ජ්‍යෙෂ්ඨවූ කුටුම්බිකයා අප වහන්සේ වැන්ට විහාරයක් නොකරවූ හෙයින් හා වෙන උපස්ථානයක් නොකරණ හෙයින් හා වැස්සෙහි වදනා තැනකුත් නොලද්දම් හ. හැමදෙන ම ධන රැස් කොටැ පිරිවෙනක් කරවම්හ යි කියා හැමදෙනා ගිවිස්සවා ගෙණැ ගැහැණුන් හා පිරිමින් හා එක් වැ ධන රැස්කොටැ දහසක් කූටාගාරයෙන් ශුක්‍රතවූ විහාරයක් කරවා බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට සත්දවසක් මහ දන් දී විසිදහසක් භික්ෂූන් වහන්සේට තුන්සිවුරු සරහා දන්දිනා.

ජ්‍යෙෂ්ඨවූ කුටුම්බික යාගේ අඹුතොමෝ හැමදෙන කළ පූජාවට වඩා කෙරෙමි යි සිතා අනෝජා මලට බඳුවූ පැහැ ඇති දහසක් වටනා වස්ත්‍රයක් හා අනෝජ මල් සුමුගක් හා ගෙණැ ගොසින් අනුමෙවෙනි බණ වදුරණ කල්හි අනෝජා මල්පුදා, ගෙණැ ගිය වස්ත්‍රය ශ්‍රීපාද මූලයෙහි තබා "ස්වාමිනි! මේ කුසලයෙහි අනුසසින් මා උපනුපන් තැන්හි මාගේ ශරීරය අනෝජා මලට බඳුවූ පැහැ ඇති වේව යි මම ද නමින් අනෝජ නම් වේම්ව යි පැතුව. සම්බුදුයෝ ද අනාගත ඥානයෙන් බලා වදුරා ඔවුන් පැතූ ප්‍රාර්ථනාව සිඩවන බව දැනැ තොප පැතුවාවූ ප්‍රාර්ථනාව සිඩවේව යි කියා අනුමෙවෙනි බණ වදාළ සෙයක්.

ඔහු හැමදෙන ම ආයු පමණින් සිටැ එසින් මිය දෙව්ලොව ඉපැදී අපගේ සම්බුදුන් වහන්සේගේ බුඩෝ'තපාදයෙහි දෙව් ලොවින් චුතවැ ජ්‍යෙෂ්ඨ කුටුම්බික තෙම කුක්කුටවති නම් රාජධානියෙහි මහාකපිණ නම් රජ විය. සෙස්සෝ ඔහු අමාත්‍යවැ උපන්හ. ජ්‍යෙෂ්ඨ කුටුම්බිකයාට අඹුවූ තැනැත්ති මදුරම සාගල නුවර රජ කුලෙහි උපන.

ඇගේ ශරීරය, කාශ්‍යප සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ ශ්‍රී පාදයෙහි පැතූ පරිද්දෙන් අනෝජා මලට බඳුවූ පැහැ ඇති හෙයින් ම අනෝජා නම් වූව. හෝ තොමෝ වැඩී මහාකපින රජ්ජුරුවන්ට අඹුවැ අනෝජ දේවිය යි ප්‍රසිඩ වූව. සෙසු ගැණු හුද අමාත්‍ය කුලෙහි වැඩී, ගිය ජාතියෙහි තමන් තමන්ට සැමියවූ වන්ටම අඹු වූහ. ඔහු හැමදෙන ම ගිය ජාතියෙහි මහාකපින රජ්ජුරුවන් හා කැටුවැ ම කුසල් කළ හෙයින් ආශ්චර්‍යවූ අද්භූත වූසම්පත්ති රජ්ජුරුවන් හා කැටිවැ ම අනුභව කරන්නාහ.

රජ්ජුරුවන්ගේ **මාලය මාලවාහනය පුෂ්පය පුෂ්පවාහනය සුපත්‍ර** ය යන නම් ඇති අස්සු පස්දෙනෙක් ඇත. රජ්ජුරුවෝ තුමූ **සුපත්‍ර** නම් අසුපිටට නැගෙති. ඉතිරි අසුන් සතරදෙනා පිටට අශ්වාරොහකයන් සතරදෙනකු යවා "තෙපි දෙතුන් යොදනකට ගොසින් සිසාරා ඇවිදු **බුඛරණාණ** හෝ **ධම්මරණාණ** හෝ **සඞ්ඝරණාණ** හෝ ලොකයෙහි පහළ වූ හස්නෙක් ඇත් නම් දනු එවයි" නහා යවති. ඔහු දවස්පතා සතර දෙන සතර දෙරින් නික්මැ තුන් තුන් යොදනෙහි සිසාරා ඇවිදු කිසි වානිවක් නොලදින් එති.

එක් දවසක් රජ්ජුරුවෝ **සුපත්‍ර** නම් අශ්ව රාජයා නැඟි අමාත්‍යයන් දහසක් පිරිවරා උයනට යන්නෝ දුරු කතරින් ආ හෙයින් විඩා විඩාවැ වදනා වූ පන්සියයක් වෙළෙඳුන් දැකැ මොහු විඩා විඩාවැ එති. නියතයෙන් අමුතු වානීවක් දනිති සිතා ඔවුන් කැඳවා කොයි සිට එවුදැයි විචාරා "**සාමිනි** අපි මෙතැනට එක්සිය විසියොදනෙක **සැවැත්** නුවර සිට එම්හ"යි කිහ. තොපගේ රට අමුතු වනීවක් ඇද්දැ යි විචාරා "සාමිනි! අනිස් අමුතු වානීවෙක් කුමක් දන්නමෝද? **බුදුරුවන්** ලෝකයෙහි පහළවී"යැයි කී කල්හි බුඛ යන නම කණ වැටී හෙන්නා හා සමඟ මහවතුරක් මැඩැගෙණැ පවත්නා සේ සව්'ඛයෙ මැඩැ ගෙණැ පවත්නාවූ ප්‍රීතියෙන් අවබි අවසථා නොදනැ ඇසූ බස් කුමක් බවත් නොදනැ මූර්ජිතවැ හියක්හු සේ කාලා'නතරයක් යවා දෙවනාවට ද කුමක් කිවුදැ යි ඒ විචාරා :—

"සාමිනි! බුදුරුවන් **ලොකයෙහි පහළවී**"යයි කීකල්හි දෙවනවටත් එසේම මූර්ජිතවැ තුන්වන වටත් එසේම විචාරා එසේම මූර්ජිතවැ සතරවන වාරයෙහි අවබි ලදින් "කුමක් කිවුදැ"යි විචාරා "සාමිනි! බුදුරුවන් ලොකයෙහි පහළ විය. කුලයෙන් ශාක්‍ය කුලයෙහි උපන් [illegible]රම්භකණෙක. වයසින් එකුන් නිස් හවුරුද්දෙහි මහණවූහ. මහණ[1]වන්නන් හැරී පියා ආයේ දෙදහසක් කොදෙව් පිරිවර ඇති සතර මහාවීප යෙහි චක්‍රවර්ති රාජ්‍යය ය. උපන් තැන් පටන් මෙතැන් දක්වා දෙවියන් පිදූ **පරසතු මල්** පිපින් වඩනා සේ වැඩියහ. බඹුන් නැඟු සේසත් යටැ වඩනා සේ වැඩියහ. රුවට තුමූමය. දහමට තුමූමය. 2 ආශ්චර්‍යයට තුමූමය. පරාක්‍රමයට තුමූමය.

1. එක්තෙක්. 2. [illegible]යට.

"ශීල සමාධි ප්‍රඥා යන තුන් ධර්මයන් එක්කොටැ වටා හැඹු රුවක් වැන්නහ. බොධිමූලයෙහි වජ්‍රාසනාරූඪවැ බුදුවන්නට යැයි වැඩ හුන්නවුන් ලඟ බදවන්නට ය යි යෙළසියක් යොදුන් 1ගිරිමෙඛලා නම් හසුනිනු නැති **මහා මාර සෙනාව** ගෙණැ දහසක් අතින් දහසක් ආවුධ ගැරැ ගෙණැ සසලා පියා දිවන **මහාමාරසා** කවින් නැඟ දුම්කඳු තමන් අසුවුබ යෙහි දෙවතාවන් කළුවැල් දුම් ලූ දුඹුරු සිදුරෙන් හැඟෙන දුම් කොටත් නොසිතූහ. සවාසනා සව් කෙලෙසයන් නසා බුදුවැ බ්‍රහ්මයාගේ ආරාධනායෙන් **දම්සක්** පවත්වා ක්‍රමයෙන් ලොකා'ඒ කෙරෙමින් සැවැත් නුවරට වැඩැ තමන්ගේ ගුණයෙහි ප්‍රසන්නවූ අනේපිඬු මහා සිටානන් විසින් සූපණස් කෙළක් ධන විසදම් කොටැ කැරැවූ **ජෙතවන මහා විහාරයෙහි** වෙසෙනි"යි දැන්වූ කල්හි :–

ඒ අසා "දරුවෙනි! මේ ජාතිය මුළුල්ලෙහි පතා නොලද්දූවූ හස්නෙක. මෙසේවූ මධුර හස්නක් මා කණ හෙළුවාවූ නොපට සතුටු පඬුරු දෙමි"යි ලක්ෂයකින් පූජා කොටැ නැ. ත ද "**ධර්මරත්නය ලොකයෙහි පහළවිය**" යනු තුන්විටෙකඅසා තුන් විටෙකැ මූර්ජාවැ සතරවන විටැ කුමක්කිවිදැයි විචාරා"සැමිනි! අප බුදුනු බුදු වූ හයි දැන්වූහ. සැමි දරුවානෝ තුමූ බණ වදාරනි. ඒ බණඅසා නිවන් රස නොවිඳා හැළුවෙන්නෝ නැත. තමන් ඉදිරියෙහි පොවා සඬම් රසයෙන් මත්වැ නැහි සිටැ විළි නැතිවැ නවා පියන පරිද්දෙන් බණ කියත්.

"දෙව්ලොවට වැඩිය, එම බණය. ඔඹලොවට වැඩිය, එම බණය. නාලොවට වැඩිය, එම බණය. සදෙව් ලොවට වැඩිය, එම බණය. සදෙවක සමාරක සබ්‍රහ්මක ලොවද එ දහමට හැනි පත් වූහ. එසේ වූ ධර්මරත්නය ලොකයෙහි පහළවිය"යි කී කල්හි ඒ හස්නට ද ලුණු තැනින් පූජා කොටැ නැවත එසේ ම **සඞ්ඝරත්නය** උපන්බව තුන්වෙනිවෙකැ අසා තුන්විටෙකැ මූර්ජාවැ සතරවන විටැ "කුමස්ද ? නොප කියන්නේ"යැයි විචාරා :–

"සැමිනි! ඒ සව්ඥයන් පුත්‍රවූ ඒ ධර්මයවූ පරිද්දෙන් පිළිපදනාවූ, සුප්‍රතිපන්නාවූ, 2 ප්‍රතිපත්තියට දිවි දුන්නාවූ **අට්ඨාරස පුදගල සඞ්ඝරත්නය ලොකයෙහි පහළවූහ.** සෝවාන් මාර්ගඵල, ඵලසඵල, සකෘදාගාමි මාර්ගඵල, ඵලසඵල, අනාගාමි

1. ගිරි මෙවුලා. 2. සුප්‍රති පත්තියට.

මාගිසථය, ඵලසථය, අහිත් මාඝීසථය, ඵලසථය යන සඞ්ඝ දරුවෝ අටදෙන තමන් වැද පිදුවන්ට වෙන වෙන ම **අටමහ නරකෙහි** හකුල් හෙළුමින් සිටගාහ. දැන් ඒ අටදෙනා නමින් ම **අටමහා නරකයම** සිස් වෙමින් සිටියේ. මෙසේ වූ **සඟු රුවන්** ලොකයෙහි පහළුවිය"යි දැන්වූහ.

එපවත් දැසූ රජ්ජුරුවෝ ඒ හස්නට ලක්‍ෂයකින් පූජා කළහ.

මෙසේ තුණුරුවන්හි නමටම තුන්ලක්‍ෂයෙන් පූජා කොටැ අමාත්‍යයන් දහස මුහුණ බලා "දරුවෙනි! මම තුණුරුවන් පහළුවිය යන හස්තුන් අස අසා නැවත හෙට නොයෙමි. මාගේ තුණුරුවන් උදෙසා මෙතැන්හි සිටැ ම හොස් මහණ වෙමි"යි කියා "ඇපින් නුඹවහන්සේ හා කැටිවැ මහණ වම් හ"යි අමාත්‍යයන් කී කල්හි වෙළෙඳුන් කැඳවා නෙපි මාගේ රාජ්‍යයට හොසින් **අනෝජා දෙවින්**ටත් මෙපවත් කියව. තොපට තුන් ලක්‍ෂයකින් පූජා කෙරෙති. ඒ පූජා පිළිගෙණැ දේවින්ට "රජ්ජුරුවෝ තොපට මේ රාජ්‍යය පාවා දුන්හ. තොප කැමැති පරිද්දෙන් ශ්‍රී අනුභව කරවයි කියව්. රජ්ජුරුවෝ **තුමූ** කොයිදැ යි තොප විචාලෝ නම් සවීඥයන් වහන්සේ උදෙසා මහණ වන්නට ගියබව කියවයි" කිහ. අමාත්‍යයෝද ඒ තමන් තමන්ගේ අඹුවන්ට එසේම අසුන් කියා යැවූහ.

ඉක්බිති රජ්ජුරුවෝ වෙළෙඳුන්ට සමුදී යවා අමාත්‍යයන් දහස හැරැගෙණැ **බුඩරතනය, ධම්මරතනය, සඞ්ඝරතනය,** යන තුණුරුවන්හි නම කිය කියා ප්‍රීතියෙන් පිණ පිණ සවීඥ යන් වහන්සේ වසන **සැවැත් නුවර** දිසාවට වැදැ වැදැ නික් මුණහ. සවීඥයෝද එදවස් ප්‍රත්‍යූෂකාලයෙහි **මහා කරුණා සමාපත්තියෙන්** නැඟී ලොව බලා වදුරණ සෙයෙක් "**මහා කපින රජ්ජුරුවෝ** තුණුරුවන්හි නමට ම තුන් ලක්‍ෂයකින් පූජාකොටැ රාජ්‍යය හැරැ නික්මුණහ. ඔහු අමාත්‍යයන් දහස හා කැටිවැ ම **සිවුපිළිසිඹියාපත් රහත්** වෙති යි දැන වදුරා:-

දීපඞ්කර පාදමූලයෙහි පටන් ගෙණැ **කුසිනාරා** යමහල දක්වා තමන් ගුණයට මැ ප්‍රියවැ ඇ හෙයින් **අකිත්තිං පණ්ඩිත** කල්හි තමන්ට **වර** දෙන ශක්‍රයා "අනින් අඤ්ඤයන් නොදකිම් වයි ඤුන සම්පන්න යන්ම දකිම්වයි" පැතූ හෙයින් **මහාකපිණ රජ්ජුරුවන්ගේ** එබදුවූ ගුණයට පූජා කොටැ පෙර ගමන් කළ

මැනවැ සි සිතා සදෙවක සමාරක සබ්‍රහ්මක ලොකයා මා පා මුලට එන බව මුත් මම අතුත් පෙරමගට යෙම්දැ සි යන ගමී යක් නැතිවැ තමන් වහන්සේගේ පාත්‍රා සිවුරු තමන් වහන් සේ ම අල්වා තෙණි එක්සිය විසියොදනක් තැන් ගෙවා **චඤ්ඣා** නම් ගංතෙරට වැඩැ නුගරුක් මුලැ සතර පට කොටැ සඟළ සිවුර අතුට ලා සවනක් ඔන බුදුරිස් විහිදුවා තමන්ගේ ශරීර වණීයෙන් ම රැඳි ගියාවූ ඒ නුගරුක දෙවතාවන්ගේ **නන්දන වනයෙහි** සපතරතන රශ්මින් රැඳි ගිය කලප වෘක්ෂය කට වඩා ශතසහස්‍ර ගුණයෙන් හොබවමින් සියලු **චඤ්ඣාගා** නම් ගංගාව එකහෙළා විරුවාපි වූ රත්රන් රසධාරාවක් සේ රන්වන් කෙරෙමින් සියලු ජලයෙහි මවිඝ කවිඝපයන් සවණක් ඔන බුදුරිසින් රඳ ශක්‍රයාගේ **නන්දනම් පුෂ්කරණියෙහි** ජල ක්‍රීඩාවට දෙවියන් මවා ගත්තාවූ මවිඝ කවිඝප රූප සේ ම මනොහර කෙරෙමින් ගාඩගායෙහි ජලාශ්‍රයවූ දේවතාවන්ගේ හා නදී තීරයෙහි වෘක්ෂාශ්‍රයවූ දෙවතාවන්ගේ හා ඇස් එක හෙළා තමන් වහන්සේ කරා අදිමින් රජ්ජුරුවන් එන පෙර මහැ බල බලා මහා කරුණ යෙන් තෙත්වූ ලයින් වැඩැ හුන් සේක.

එ සමයෙහි **මහාකපිණ රජ්ජුරුවෝ** ද දුරුකතර ගෙවා එන්නාවූ අතර මගෙහි මහා ගඩගාවකට පැමිණැ අමාත්‍ය යන්ට "දරුවෙනි! මේ කිනම් හඟෙක්දැ" සි විචාරා "සොඇමිනි! මේ **අරවිඣා** නමැති කී කල්හි මේ ගඩගාවෙහි ගැඹුර කොතෙක් ද? පලල කොතෙක් දැ සි විචාරා "සොඇමිනි! මේ ගඩගාව ගැඹුරෙන් ගවුවෙක, පළලින් දෙගවූ වෙකැයි කී කල්හී මේ ගඟින් අමාත්‍යයන් දහස හා අසුන් දහස හා මා හා මාගේ අසු හා එතරවැ යන්නට හොරු අතුළු ඇද්දැ සි විචාරා "සොඇමිනි! නැතැ සි කී කල්හි මට බැහැරින් නැවූ පහුරු ආදින් ප්‍රයොජන කිම්දැ සි මේ ගඩගාව ගැඹුරෙන් ගවු වෙක. පළලින් දෙගවුවෙකැ සි තෙපි ම කීවාවද? බුදු ඇස වත් නොපෙණෙන්නාවූ මහත ඇති සංසාර සාගරයට මහ නැවුවැ සිටියාවූ බුදුරුවන උදෙසා වේද? මා ආයේ. එහි අනු සසින් ම මේ දිය මට දිය නො වෙයි. තෙපි හැම දෙන ම බුදු රුවන් සිහි කොටැ ලා අසුන් දහස මෙහෙයා ලව" සි කියා තුමූ ද දෙහොත් මුදුනෙහි තබා ගෙණැ :-

සැවැත් නුවරෙහි ජේතවන මහාවිහාරය දිසාවට වැඳලා "නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස, නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස, නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" යි තුන්විටෙක බුදුන්ව නමස්කාර කොටැ අසුන් මෙහෙයා ලූහ. සියලු අස්සුම එබදු ගැඹුරුවූ දියෙහි ඉදුනිල් මිණි ගල්තලක් පිටැ දිවන්නා සේ දිව ගත්හ.

එසේ ම ගහින් එතරවැ ගෙණැ ගොස් අනික් ගඟකට පැමිණැ මේ කිනම් ගඟෙක් දැ යි විචාරා නිලවාහිනි නමැ යි කී කල්හි මේ ගඟ ගැඹුර පළල කෙතෙක්දැ යි විචාරා ගැඹුරෙනුත් පළලිනුත් දෙගවූවෙකැ යි කී කල්හි මා හා මාගේ අසුදහස හා අමාත්‍යයන් දහස හා එතරවන්නට සුදුසු වූ හොරු අඟුළු මෙහි ඇද්ද ? නැද්ද ? යි විචාරා "නැතැ" යි කී කල්හී "නම කී වන්ට සතුටු පවුරු කොටැ තුන් ලක්ෂයක් දී අනෝජා දේවි වැනි අඹුවන් හැරැ කුක්කුටවති නම් රාජධානිය වැනි රාජධානියක් හැරැ ඇසූ නමට ම දිවිපුදා සරණ ගියාවූ බුද්ධරත්නය මේ මුඛයෙහි තුබූ ගසින් එතර නොකෙරේ නම් ඔබෙහි තුබූ සංසාර සාගරයෙන් කෙසේ එතර කෙරේ ද ?

"එසේ හෙයින් මේ ගඟට මට මහ නැවූ නම් මා නිසා නැති ආ ධම්මරත්නයමය. නෙපි හැමදෙනා ම ඒ නිලෝගුරු සම්‍යක් සම්බුධයන් වහන්සේ විසින් වදාළ ධර්මය සිහි කොටැ එකවටම අසුන් මෙහෙයා ලව යි කියා තුමූ ද දෙහොත් මුදු නෙහි තබා ගෙණැ නම ඇසූවිට ම මාගේ ලෙහි අමා නමාපි වාවූ සඩ්ඪම්මරත්නය සරණ යෙමි යි මා ගිය ඒ ධම්මරත්නයෙහි අනුසසින් ම මේ ගඟ මත්තෙහි ඇදලූ අතළු ගලක් සේ දිය ලෙසින් නොසිටිව යි අධිෂ්ඨාන කොටැ "ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ" යන පදය කියමින් නහාගත් පය හා සමග අසු දියට මෙහෙයූහ.

අමාත්‍යයන් දහසගේ අස්දහස හා තමන්ගේ අසු හා එක පැහැරැ දිවන්නට වන්හු. රජ්ජුරුවන්ගේ අශ්වා' රොහණ මඬලයට වළඟොඩ නැති කොටැ තුබූ රාජ වීථියෙහි දිවන්නවුන් සේ ගැසූ ගැසූ කුරෙහි තට තට යන අනුකරණ ඝෙන් ගඩාගෙහි දියෙහි වසන්නාවූ දෙවතාවන්ට විස්මය එළවමින් නික්ම ගත්හ. එසේ ඒ ගඟ ධම්මරත්නයෙහි අනුසසින්

ආනුභාවයෙන් නික් මැ ගෙණැ තුන්වන ගඟට පැමිණැ මේ කිනම්දැ යි විචාරා **චඤ්ඣාඟා** නැමැති කී කල්හි මේ ගඟ දිග පළල කෙතෙක්දැ යි විචාරා ගැඹුරෙනුත් පළලිනුත් යොදන කැ යි කී කල්හි:

මේ ගඟට 1 අනික් නැවූ පසුරැ කුමට ද? බුදුසස්නට වන් දවස් පටන් ගෙණැ පිරිනිවන් පානා දවස් දක්වා සංසාර සාගරයෙහි නොඇලුනාවූ සඟුරුවන්හි අනුසසින් මාගේ අශ්වයෝ මේ ගඟ නොගැලී එතර වෙත්ව යි අධිෂ්ඨාන කොටැ දෙහොත් මුදුනෙහි නඛා ගෙණැ **"සුපට්පන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ"** යන බස හා එක්වැම අසුන් මෙහෙයා ගොස් එන කල්හි පවා වලෙහි ගොඩෙහි ශඛ්කාවක් 2 නැත. මේ ගඟෙහි දිවන කලම අපට සුවයැ යි අනුන් සිතන පරිද් දෙන් ගඟින් එතරවැ ඉදිරිය බැලුවාහු:-

නුගඟස පත් අතුරෙන් වෙළෙප් මැඩැ ගෙණැ සම් මැඩැ පි කඹුරැ උඳුනෙහි අඟුරු අතුරෙහි පැනැනැඟි ගිනි රැසක් සේ ආකාශයෙහි 3 වැනි ගිය බුදුරැස් බලමින් විසමය පත්වැ මේ අපදුටු විරූ රශ්මියෙක් නොවෙයි. සදු උදය වන්නාට පළමු අහසැ වැනි නැඟි ගිය සදරැස් දුටු විරුම්හ. හිරු උදා වන්නට පළමු අහසැ වැනි ගිය හිරු රැසඳු දුටු විරුම්හ. මේ එබදු රශ්මියෙකුත් නොවෙයි. නියතයෙන් මා ගැතිවැ නැඟි ආ සඞ්ඝ දරුවානන් ඇසට මම පැණීම් වනිම්. ඒ සඞ්ඝ දරුවානෝ තමන්ගේ **ත්‍රිභුවන චක්‍රවර්ති ඣමුන්** නොසිතා 4 ගුණයෙහි ප්‍රිය හෙයින් තමන් ගැනිහු පෙරමගට වැඩි දැවනැයි සිතා අස් පිටින් බැසැ ගෞරවයෙන් නැමි නැමි සව ණස් ඝන බුදුරැස් පිහිරා ගෙණැ ගොස් ශ්‍රීපාද මූලයෙහි වැනිරැ නඛ රශ්මි නැමැති අමා මහ ගඟෙහි ගැලී අමාත්‍යයන් දහස හා කැටිවැ වැඳැ එකත් පස්වැ හුන්හ.

එ සමයෙහි **සර්ඥයන් වහන්සේ** පෙර ඇසූ බුදුගුණයට දැන් දුටු බුදුරැවනට ම කළ පූජාවට සුදුසු කොටැ මධුරවූ ධර්මය එලවා අමාත්‍යයන් දහස හා කැටිවැ රජ්ජුරුවන් සෝවාන් කොටැ "එහි භික්ෂු භාවයෙන්" මහණ කොටැ ඔවුන් පිරිවරා වැඩැ හුන් සේක. 5 මෙසේ තමාගේ නම ඇසූ ශ්‍රද්ධා සම්පන්න

1. සෙසු නැව්. 2. ඇත. 3. නැඟි ගිය.
4. ගුණ ප්‍රිය. 5. මෙසේ සර්ඥයන් වහන්සේ.

යන් සතුටු පඬුරට ලක්‍ෂයකින් පූජාකරණ පරිද්දෙන් මාහැඟිවූ තමා සිරි කළවුන් උසුලන අසූන්ට පවා ගඩොලෙහි ජල අතළු ගල් සේ කරණ සැදුහැයෙන් ඇසුවන්ට අමා මහ නිවන් දෙන බම්රතනය සරණ යෙමි සි **දහම් සරණ** යායුතු.

ඉක්බිති ඒ වෙලෙදනු ද රාජධානියට ගොස් **අනෝජා දේවින්** දුකා තුණුරුවන් උපන් හසුන් දන්වා රජ්ජුරුවන් සේ ම දේවිනුදු තුන් වාරයෙකැ සතනාහයෙන් මූර්ජාවට පැමිණ තුන් ලක්‍ෂය බැගින් දුන් කල්හි තුණුරුවනට එක හෙළා දෙවින් අතින් නව ලක්‍ෂයකින් පූජා ලදින් රජ්ජුරුවන් තුණුරුවන්හී හසුන් අසා ම රාජ්‍යය බිසවුන්ට පාවාදී මහණ වන්නට ගිය බව දන්වූහ. දේවී ද එපවත් අසා අමාත්‍යයන් දහසක් දෙනාගේ අඹුවන් දහසක් දෙනා ගෙන්වා රජ්ජුරුවන් හා අමාත්‍යයන් දහස හා සියලු සම්පතුනි හැරී මහණ වන්නට ගිය බව කියා සංසාරය දරුණු වූයේ අපගේ රජ්ජුරුවන් හා අමාත්‍යයන් දහසකට මතු නොවෙයි. අපටත් එසේම දරුණුය. එහෙයින් දැන් ම නික්මුණ මැනවැ සි රථ දහසකින් නික්මැ රජ්ජුරුවන් එනර වූ පරිද්දෙන් ම තුන් ගව රථ දහසෙහි සක ද ගත් බූලි තෙමෙන තරම් එබෙන පමණක් 1අඳ ද නොවැ දැඩිවැ සිටි කල්හි එයින් එනර වැ රජ්ජුරුවන් දුටු පරිද්දෙන් නැගෙන්නා වූ බුබරශබ්ද දුකැ අනුමාන ඥානයෙන් සවීඥයන් වහන්සේ බව දැනැ බුබ රශබ්ද පිහිරා ගෙණැ වැඩැහුන් තැනට යන්නට පටන් ගත්හ.

එ සමයෙහි සවීඥයන් වහන්සේ මේ ගැණු බණ නොඅසාම සැමියන් දුටු නම් මහණ වැ හුන්නා වූ සැමියන් දුකැ ශොකා'තුර වැ ඉදුරා බණ අසා ගත නොහෙනි සි සිතා වදාරා මේ බිසවුත් ගැණු දහසත් තමන් තමන්ගේ සැමියන් නොදකිත්ව සි අධිෂ්ඨාන කොටැ වදාළ සෙයෙක.

සහ පිරිවරින් සවීඥයන් වහන්සේ වැදැ එකත්පස් වැ සිටැ "ස්වාමීනි! අපගේ **මහා ක්‍ෂත්‍රිය රජ්ජුරුවෝ** අමාත්‍යයන් දහසක් ගෙණැ ශ්‍රීපාද වදනට යැයි ආහ. ඔහු කොසිදැ සි විචාළ හ. එබස් අසා සියලු සත්ත්වයන් අමා මහ නිවනට ගෙණ යන්නා වූ උපායා'නන්තර දන්නාවුන් කෙරෙහි අග්‍ර වූ

1. වැද්ද ෙනාව.

සාමි දරුවෝ රජ්ජුරුවන් දැන් දැන් දක්නාව ද? නෙපි තෙල සේ ඉඳුව සි වදුරා එකත්පස්වැ හුන්නා වූ සහ පිරිවර වූ දේවින් කණ අමා නමන්නට ය සි පටන් ගත් සෙයෙක.

කෙසේ වූ බස් ද? කෙසේ වූ වියත් කම් ද? කෙසේ වූ ලඟන්නා ධම් යුකති ද? කෙසේ වූ මෙලෝ පරලෝ දැක්ම මෙක් ද? කෙසේ වූ අමාමහ නිවන් රසයෙහි ගැල්වීමෙක් ද? එබණ වදුරත් වදුරත් දේවින් පරිවාර සත්‍රින් දහස හා කැපිවැ ම සෝවාන් වූහ. ගංගිසැ වට වැස්සෙන් වැවන් පිරෙන්නා සේ බිසොවුන්ට වදුළ ධම්යෙන් රජ්ජුරුවෝ සහ පිරිවරින් සිවුපිළිසිඹියා පත් රහත් වූහ.

එ කෙණෙහි ම සවීඥයන් වහන්සේ බිසොවුන් ඇතුළු වූ හැහැණුන් තමන් තමන්ගේ සැමියන් දකිත්ව සි අධිශයාන කොටැ වදුළ සෙයෙක. ඔහු ද සෝවාන් වැ අවල ශ්‍රද්ධාවෙනි පිහිටා සැමියන් දැකැ පසහ පිහිටුවා වැදැ "සාමිනි! නුඹවහන්සේගේ පැවිද්ද මසාකප්‍රාපත වීය සි"කියා සවීඥයන් වහන්සේ අතින් පැවිද්ද ඉල්වා, සැවැත් නුවරට ඉොස් මෙහෙනු සස් නෙහි මහණ වව සි වදුළ කල්හි ක්‍රමයෙන් සැවැත් නුවරට අවුත් මෙහෙණ සස්නේ මහණවැ රහත් වූහ. සවීඥයන් වහන්සේ ද **මහාකප්පින මහනෙරුන් වහන්සේ** ප්‍රධාන කොටැ ඇති මහණ දහස පිරිවරා ක්‍රමයෙන් ජෙතවන මහා විහාරයට වැඩි සෙයෙක.

මහා කප්පින මහ නෙරුන් වහන්සේ සියලු ඉරියව්වෙහි තමන් වහන්සේ ලද්දා වූ ධම්ය සිහි කොටැ සුවයක් යහපත් නියා ය! සුවයක් යහපත් නියා ය! සි කිය කියා උදන් අනන සෙයෙක. ඒ ඇසූ භික්ෂූන් වහන්සේ සවීඥයන් වහන්සේ කරා එළඹැ "සාමිනි! **මහා කප්පිනයන්** හුන් සිටි තැන "අහෝ! සුඛං!! අහෝ! සුඛං!!" කියා උදන් අනති. තමන් අනුභව කළ රාජ්‍යශ්‍රී සිහිකොටැ කියන බවෙකැයි සිතමිහ සි දැන් වූ සෙයෙක.

ඒ අසා සවීඥයන් වහන්සේ **මහා කප්පින මහ නෙරුන් වහන්සේ** කැඳවා "**කප්පින** ය තා රාජ්‍ය ශ්‍රී උදන් අනන්නේ ඇද්දැ"සි විචාරා වදුරා ඔබ විසින් "සාමිනි! මා ඇතුළු වූ ඔළු ලෝ වැස්සන්ගේ සිත සාමි දරුවන්ට ම හැඟෙන්නේ වේදැ"සි දැන් වූ සෙයෙක. ඒ අසා සාමි දරුවෝ "මහණෙනි!

මාගේ පුතනුවෝ කාම සුඛයන් උදෙසා උදන් අනන්නේ නොවෙයි. තමන් ලද්දා වූ නවලොවුතුරා දහම් සිහි කරත් සිහි කරත් ලය ඉතිරි ගෙණ පවත්නා වූ ප්‍රීතිය ඉවසා ගත නොහී උදන් අනති" යි වදාරා:

ධම්ම පීති සුඛං සෙති විප්පසන්නෙනන්න චෙතසා
අරිය'ප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො.

යන ගාථායෙන් බණ වදාළ සෙයෙක. ඒ වදාළ බණ ඇසූ බොහෝ දෙනාට අමා මහ නිවන් සැඩිය. එසේ හෙයින් තමා සිහිකළ කල්හිත් සිත් නැත්තා වූ ජලයේ පවා දැඩි කොටැ පියන ලද්දාවුන් අනවරතයෙන් ප්‍රීති ඉවසා ගත නොහී උදන් අන අනා භිඳනා ඝානන වූ ප්‍රණීත වූ ධම්ම රත්නය මට සරණය යි **දහම් සරණ** ඝා සුතු.

ඉක්බිති ධම්ම ය සරණ ගියවුන්ට ඒ ධම්ම ය සියලු උපද්‍රව දුරු කරණ බව හඟවන පිණිස **සාමාවතීන්ගේ කථාව** දක්වනු ලැබේ. හේ කෙසේද? යත් :-

අතීතයෙහි **අල්ලකප්ප** නම් රට **අල්ලකප්ප** නම් රජ්ජුරුවෝ ද **වෙඨදීපයෙහි වෙඨදීපක** නම් රජ්ජුරුවෝ ද යන මොහු දෙපක්ෂයෙහි ඇත්තෝ කුමාර කාලයෙහි පටන් ගෙණ එක ගුරුන් 1 කෙරෙහි ශිල්ප ඉගෙණ තම තමන්ගේ පිය රජ්ජුරුවන් අඝාමෙන් දස යොදුන් දස යොදුන් රටට රජ වූහ.

ඔහු අතරතුරෙහි 2 ඔවුනොවුන් කරා එළඹැ එක්වැ හිඳැ එක්වැ සිටැ සුදුසු වූ ක්‍රීඩායෙන් දවස් යවන්නාහු උපදනා වූ සත්ත්වයන් ද මියන්නා වූ සත්ත්වයන් ද දැකැ සංසාර සඞ්ගරු පය දුනැ "මෙලොවින් පරලොවට යන්නා වූ සත්ත්වයන් පස්සෙහි යන්නා වූ එක ද වස්තුයෙක් නැත." "අධම්ම වශයෙන් සහජාත වූ නමා සතුය යි නමා වූ ශරීරය ද සත්ත්වයා හා කැටිවැ පරලොව නොයෙයි." එසේ හෙයින් සියල්ලම හැරිපියා යා යුතුය.

එසේ වූ සංසාරයෙහි සිටියා වූ අපට රාජ්‍යයෙන් ප්‍රයොජන කිම්දැයි ගිහි භෙය හැරැ මහණ වම්හ යි කියා තමන්

1. ගෙන්. 2. එවුනොවුන්.

තමන් සතු රාජ්‍ය ය අඹු – දරුවන්ට පාවා දී තාපස ප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදි වැ හිමාලයයෙහි එක්වැ වසන්නාහු එක් දවසක් ඔවුනොවුන් හා කැටිවැ බණින්නාහු අපි දෙදෙන රාජ්‍ය ශ්‍රී හැරී මහණ වන්නමු. ජීවනෝ'පායක් පිණිස මහණ වූ වමු නොවම්හ. එසේ මහණ වූ ඇපි එක තැන වසමෝ නම් දෙන්නකු එක තැන වසන කල්හි අලලාප සල්ලාප මාත්‍රය කුදු කරමෝ නම් ඒ අප පැවිදි වූවත් පැවිදි නොවූ වා හා සමය.

එ හෙයින් අප වෙන් වෙන්වැ විසුව මැනවැ යි තෙපි එක් පර්වතයෙක වසව. අපි එක් පර්වතයක වසම්හ. අඞ්ඩ මාස යෙන් අඞ්ඩ මාසයෙහි එක් වම්හයි කියා එසේත් එක්වීම **ඉණ සඞ්ඛණ්කාවට** කාරණය. එසේ හෙයින් දෙන්න ම එක්වැ නොවසම්හ. තෙපි තොපගේ පර්වතයෙහි ගිනි දල්වව. මම මාගේ පර්වතයෙහි ගිනි දල්වම්. ඒ සලකුණින් ඔවුනොවුන් ජීවත් වන බව දනුම් හයි නියත කළහ. ඔහු එසේ නියත කරණහු දවස් යවති. එසේ කාලා'නන්තරයක් ගිය කල්හි **වෙඨ දීපක තාපසයෝ** මියැ මහෙසාක්‍ය දිව්‍ය රාජවැ උපන්හ.

ඉක්බිති අඞ්ඩමාසයක් ගිය කල්හි **අලලකප්ප තාපසයෝ වෙඨදීපක තාපසයන්ගේ** පර්වතයෙහි ගිනි නොදැකැ සහාය තාපසයන් මළහ යි නියත කොටැ දන්හ. **වෙඨදීපක තාපසයෝ** මියැ දිව්‍ය රාජවැ උපන් ක්ෂණයෙහි තමන්ගේ අසාධාරණ වූ දිව්‍ය සම්පත්හි දැකැ "කවර කුශල කර්මයක් කොටැ දෝ මේ සම්පත් ලද්දේය" යි බලන්නාහු ගිය ජාතියෙහි රැක්කා වූ ශීලය ම දැකැ මා හා කැටිවැ සිල් රැක්කා වූ යාළු තාපසයන් බලා පියා යෙමි යි සිතා දිව්‍ය'තම භාවය හැරී මහි වෙසක් මවා ගෙණැ **අලලකප්ප තාපසයන්** හුන් තැනට ගොසින් වැඳැ එකත්පස්වැ සිටිය හ. ඔවුන් දැකැ තාපසයෝ කොයි සිටැ අවුදැ යි විචාළ හ.

ඒ අසා දිව්‍ය පුත්‍ර තෙම සැවැමිනි! මම දුර සිටැ එන්නා වූ මහි එකකි මි යි. සැවැමිනි! මෙතන්හි ක්ෂුදකලාව **තපස්** රක්ෂා කරණ ලද්දු ද? අනික් තපස් වී කෙණෙකුන් ඇද්දැ යි විචාරා මාගේ එක් තාපස කෙණෙක් ඇතැයි කී කල්හි දැන් ඌ කොයි දැ යි විචාරා "ඇපි දෙ පක්ෂයේ ඇත්තමෝ පොහෝ දවස් ඔවු නොවුන්ට උපද්‍රව නොවූ බව හඟවන පිණිස ඔවුනොවුන් ගේ පර්වතයෙහි ගිනි දල්වම්හ. මේ පොහෝයෙහි ඒ තාපස යෝ තමන්ගේ පර්වතයෙහි ගිනි නොදැල් වූහ. එයින් ඔවුන්

මළහ යි සිතම්හ"යි කී කල්හි සැමිනි! මම අනිකෙක් නොවෙමි. නුඹ වහන්සේගේ යහළු තාපස යෙමිහ. මම ඇ යි කියා මා රැක්කා වූ සිලයෙහි අනුසසින් දිව්‍ය රාජවැ උපන්මි යි, සැමිනි දක්නා පිණිස ආමි. මෙතැන්හි වසන්නා වූ සැමිනිට කිසි උපද්‍රවයෙක් ඇද්දැ යි විචාළේය.

අපට අනික් උපද්‍රවයෙක් නැත. ඇතුන් විසින් උපද්‍රවයෙක් ඇතැ යි කී කල්හි එසේ වුවහොත් ඇතුන්ට මෙසේ කළ මැනවැ යි කියා විණයේ තුන් නතන් පැලා තුන් මන්ත්‍රයක් උගන්වාලා වහන්ස! මේ නත ගසා මේ මන්ත්‍රය කී කල්හි හසුනිඳු පෙරළා සිටැ බලන්නටත් අසමර්ථ වැ පලා යෙති. මේ මන්ත්‍රය කියා මේ නත ගැසූ කල්හි පෙරළී බල බලා යෙති. මෙසේ මේ මන්ත්‍රය කියා මේ නත ගැසූ කල්හි ඇත් මුලට ප්‍රධාන වූ ඇත් තෙමේ ම නැමෙමින් නැමෙමින් ඇවිත් පිට දෙයි. මෙයින් නුඹවහන්සේට හැඟුණක් කළ මැනවැ යි. කියා ගියේ. එතැන් පටන් ඒ තාපසයෝ ඇතුන් පලා යන්නට සුදුසු මන්ත්‍රය කියා උන් පලා යන්නට සුදුසු නත ම ගසා තමන් සිතට අසමාධි කරන්නා වූ හසුනින් දුරැ කොටැ කාය චිත්ත සමාධි ලදින් යෙහෙන් පණිණ ශාලායෙහි වසන සේක.

එසමයෙහි 1 කොසඹැ රට පරන්තප නම් රජ්ජුරු කෙණෙක් 2 රාජ්‍යය කරණ කල්හි එක් දවසක් ගර්භිනී දේවීන් හා සමඟ ලහිරු අව් තප්මින් අබහ්‍ය'ව කාශයෙහි හුන්හ. දේවී හු රජ්ජුරුවන් පොරෝණ ලක්ෂයක් අගනා රතන කම්බල යක් පෙරවැ හිදැ රජ්ජුරුවන් හා 3 බැණැ බැණැ රජ්ජුරුවන් ඇතිල්ලෙහි තුබූ ලක්ෂයක් වටනා මුත්ද තමන් ඇතිල්ලෙහි ලා ගත්හ. එසමයෙහි හසුනිලිඛ නම් සකුණයෙක් ආකාශයෙන් යන්නේ රත් පලස පෙරවැ ගෙණැ හුන්නා වූ දේවීන් දැකැ මස් පිඩෙක් දෝ හෝ යන සංඥාවෙන් 4 හයා ගෙණැ යන පිණිස පියා විදහා ගෙණැ බස්නට වන.

රජ්ජුරුවෝ ඔහු බස්නා හඬින් නැඟී සිටැ ඇතුළු ගෙට වැදී ගිය හ. දේවී ගර්භිනී හෙයින් හා 5 සභාවයෙන් යම කට හය ඇති හෙයින් හා නැඟී යන්ට අසමර්ථ වූ වාය ඉක්බිති

1. කොසම්බ්‍යා නුවරැ. 2. රජ කරන්නාහ, ඔහු රජ කරන්නහු. 3. බණ බණා. 4. ගසා ගෙණැ. 5. සභාවයෙන් ම හය ඇති හෙයින් හා.

ඒ පක්ෂිතෙම අවුත් දේවීන් නිසා හස්සෙහි හොවාගෙණැ නමා ඇතුන් පස්දෙනකුට බල ඇති හෙයින් අයත්තයෙන් ආකාශයට නැඟි මස් කන පිණිස ගෙණැ ගියේ. දේවිදු මරණ භයින් භය පත්වැ ද ඉඳින් මම මෙතැන්හි දී හැඩිම් නම් මිනිසුන්ගේ හඬ නිරිසනුන්ට භය එළවන හෙයින් හෙළා පුව හොත් මමත් මාගේ ගර්භයත් බිමැ හි නසුම්හ. එහෙයින් යම් තැනෙක්හි තබාලා මා කන්නට පටන් ගණී ද එ තැන් හි දී මහත් කොටැ හඬා මොහු ලුහුබදවා පියම්හ යි සිතුහ.

පක්ෂිද හිමාලය වනයෙහි මදක් වැඩී මණ්ඩපා'කාරයෙන් සිටි නුග රුකෙක්හි වෙලෙප් අතුරෙහි දේවීන් හොවාලා පක්ෂීන් ගොදුරු ගෙණැ එක් තැනෙක්හි බැසැ හුන් කල්හි පෙරළී ආ මග බලාපියන බව සභාවයෙක් හෙයින් හෙද පෙරළී ආ මග බැලීය. දේවි ද "මෙවිට මොහු නෙරපියම්" සිතා අතින් අත පැහැරී මහත් කොටැ හඬා පක්ෂිහු ලුහු බැඳ වූ හ.

ඉක්බිති එදවස් ම හිරු හස්තයට යන වේලෙහි දේවීන්ට විළි පහරින්ට පටන් ගත. සියලු දිශාවෙන් ම සොරවූ ගථ්නා කරන්නා වූ මහා මෙඝ නැඟිය. සුවයෙන් වැඩ දේවීන් අස්වසා ලන්ට එක ද කෙණෙක් නැති හෙයින් රාත්‍රි යෙහි නින්දෙක් නම් නො විය. පහන් වැ ගිය කල්හි වැසි වලා පහවීම ද අරුණු නැඟීම ද ප්‍රසව වීම ද එකවිටම විය. දේවි ද මෙඝ සෘතුව ද පළුන සෘතුව ද අරුණු සෘතුව ද ගෙණැ උපන් හෙයින් පුතනුවන්ට **උදෙන කුමාරයෝ** යැයි නම් තැබූහ.

අල්ලකප්ප තාපසයන් වසන්නා වූ පණ්ණ ශාලාව ද ඒ නුග ගසට නුදුරු නැන්හි ය. ඔහු සභාවයෙන් ම වැසි දවස් සිත භයින් වනයට නො වැදූ ඒ ගස් මුලට ගොසින් පක්ෂීන් කෑ ඇට අවුලා ගෙණැ තළා පියා රස කකාරා ගෙණැ බොති. එයින් එදවස් ද "ඇට ගෙණෙමි"යි ගොසින් ගස මුල ඇට සොයන්නාහු උඩ අඩනා වූ කුමාරයන්ගේ ශබ්දය අසා උඩ බලා දේවීන් දැකැ තෙපි කවුරුදැ යි විචාරා "මම මනුෂ්‍ය ස්ත්‍රී යක්මි"යි කී කල්හි මෙතැනට කෙසේ අවිදැ යි විචාරා පක්ෂිහු ගෙණ පරිදි අසා එසේ වුවහොත් බැසැ පියව යි කියා දේවීන් විසින් "මාගේ ජාතියට විරොධයක් වෙති යි භය ඇත්තෙමි" යි

කී කල්හි තෙපි කවර ජාතියෙහි කෙණෙකුදැ යි විචාරා මම ක්ෂත්‍රිය ජාතියෙහි යැ යි කී කල්හි:-

මම ද ක්ෂත්‍රිය යෙමි යි කියා එසේ වූවහොත් ගසට නැඟි මාගේ පුතනුවන් බහා ගනුව යි කී කල්හි එක් පාර්ශ්වයෙකින් ගසට නැගෙන්නාවූ උපායා'නතරයක් ඉදිකොටැ නැඟි දරුවන් අල්වාගෙණැ බැසැ නැවත දේවීන් ද බහා ගෙණැ අග්‍රම පදයට ගෙණැ ගොසින් ශිල හෙදයක් නොකොටැ ම රක්‍ෂා කළහ. පණු පිළවුන් නොවන මිහා සවයං ජාත සාලින් හා ගෙණැවුත් (දී) රක්‍ෂා කෙරෙති.

මෙසේ ඔවුන් රක්‍ෂා කරණ කල්හි දේවීහු මම මා පක්‍ෂීහු ඩැහැ ගෙණැ ආ හෙයින් කිසි මනුෂ්‍ය වාසයකට සලකුණකුදු නොදන්මි. මේ තපස්වීන් හා මා හා කිසි විසඹාසයකුත් නැත. ඉඳින් මේ තපස්වීහු අප හැරැපියා බැහැරට පලා ගියෝ නම් අපි දෙපක්‍ෂයේ ඇත්තමු ම මෙහි ම මරණයට පැමිණෙම්හ. එහෙයින් මොහු අප නොහරණ පරිද්දෙන් ශිල හෙදයට පමුණුවා සැමි කොටැ ගත මැනවැ යි සිතා සඹාවයෙන් ම රසවත් වූ රාජ කුලයෙහි උපන් තාපසයන් සිවිල වූ වස්ත්‍රාදින් මනොහර වූ ලොහ කටයුතු වූ ප්‍රදෙශය දක්වා ශිල හෙදයට පමුණුවා එතැන් පටන් දෙදෙන ම 1 සමඟ වාසයෙන් වසන්නාහ.

ඉක්බිති එක් දවසක් තාපසයෝ නක්‍ෂත්‍ර යොගයක් බලන්නාහු **කොසඹෑ නුවර** රජ කරන්නා වූ **පරන්තප නම් රජ්** ජුරුවන්ගේ ජන්ම නක්‍ෂත්‍රයට වූ පීඩා දැකැ බිසවුන්ට කියන්නාහු භද්‍රාව! **කොසඹෑ නුවර** රජ කරන්නා වූ **පරන්තප රජ්ජුරුවෝ** මළහ යි කීහ. ඒ අසා දේවී සඞ්ගමිනි! කවර කාරණයකින් ද මෙසේ වදාළේය යි කීහ. තාපසයෝ කියන්නාහු නක්‍ෂත්‍ර පීඩාවක් දැකය. මා කියන්නේ:-ය යි කීහ. ඒ අසා බිසව් හඬන්ට පටන් ගත්හ.

තාපසයෝ කුමක් පිණිස හඬවිදැ යි විචාරා බිසවුන් විසින් **කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්** නමන් සමණන් බව කී කල්හි ඒ තපස්වීහු භද්‍රාව! ශොක නොකරව, උපන් සත්ත්වයන්ට මරණ නියතය යි කීහ. ඒ අසා බිසව උපන් සත්ත්වයන්ට මරණ නියත බව දනිම් ම ය. මා හඬන්නේ මාගේ

1. ඉහ වාසයෙන්

පුතනුවන්ට පියාණන් සතු රාජ්‍යය ලබන තරම් පිණක් නැති හෙයිනැ යි කීහ.

ඒ අසා තපස්විහු "එසේ වුවහොත් ශොක නොකරව. නොපගේ පුතනුවන් රාජ්‍යය ලබන උපායා'නතරයක් මම දනිමි"යි කියා රාජ කුමාරයන් කැඳවා **හස්තික්‍රාන්ත නම් විණාව** ඔවුන්ට දී **හස්තික්‍රාන්ත** මන්ත්‍රය උගන්වා නොයෙක් ඇත් දහස් හණක් නුග රුක මූලට කැපිවන දවස් කුමාරයන් කැඳවා ලා නෙපි මේ ඇතුන් එන්නාට පළමු කොටැ ම නුග රුක මත්තෙහි හිඳැ ඇතුන් මුළුල්ල රැස් වූ කල්හි මේ මන්ත්‍රය කිය කියා මේ තත ගසව. සියලු ඇත්තු පෙරළී බැලිය නොහී පලා යන්නාහ. එසේ ඇතුන් නැඟී ගිය කල්හි නෙපි ගසින් බැසැ මා කරා නැඟී එව යි කීහ. රාජ කුමාරයෝ ද එසේ ම කළහ.

දෙවන දවස් අද ගසට නැඟි ඇතුන් ආ කල්හි මේ මන්ත්‍රය කියා මේ තත ගසව. එසේ කල්හි හසුනිහු පෙරළී බල බලා යන්නාහ යි කීහ. ඔහු ද එසේ ම කළහ. ඉක්බිති තාපසයෝ බිසවුන් කැඳවා "නොපගේ පුතනුවෝ පියානන් සතු රාජ්‍යය ගණිති, මුන්ට හසුන් දී නගා යව"යි කීහ. බිසවු පුතනුවන් කැඳවා පුත නෙපි **කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්ගේ** පුතනුව වැ. නොපට මා දුරි ඇති කල්හි ම මා පළිහු ගසා ගෙණැ ආ බව කියා ඒ දෙශයෙහි 1 සෙනා පතීන්ගේ නම් සලකුණු මෙසේ කියව. ඉඳින් එසේ නො අද හත් නම් නොප පියානන් අත ලන මුන්ද හා පොරෝණ පලස හා දෙව යි නගා ඇවූහ.

කුමාරයෝ තාපසයන් කරා ගොසින් 2 මෙවිට කුමක් කෙරෙම්ද යි විචාළහ. තාපසයෝ අද නෙපි නුග ගස පාත අත්තේ හිඳැ මේ මන්ත්‍රය කියා මේ තත ගසව, සියලු හසුනින්ට රජ වූ ඇත් තෙම නොපට පිට දී අවුත් සිටී. නෙපි ඔහු පිටට නැඟී ගොස් පියානන් සතු රාජ්‍යය ගණුව යි කීහ. කුමාරයෝ තාපසයන් හා මැනියන් වැඳැ මන්ත්‍රය පිරිවහා පිට දුන්නා වූ ඇතු පිටට නැඟී ඇත්හුගේ 3 කණට "මම **කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්ගේ** පුතනු වෙමි. මට පියානන් සතු රාජ්‍යය ගෙණැ දෙව"යි කීහ.

1. සෙනාඹපතීන්. 2. මිට. 3. කණට කොට.

ඇත් එබස් අසා නොයෙක් ඇත් දහස් ගණන් කැටිවන පරිද්දෙන් මහත් කොටැ හැඩිය. ඔහුගේ හඬ හා කැටිවැ ම නොයෙක් දහස් ගණන් හසුනිහු කැටි වූහ. ඉක්බිති වැඩි මහළු ඇතුන් හා බාල ඇතුන් දුරුවන පිණිස ඊට සුදුසු හඬ හැඩිය. ඒ අසා එසේ වූ හසුනිහු දුරුවැ ගියහ. ඉක්බිති රාජ කුමාරයෝ යොධ හසුනින් දහස් ගණන් පිරිවරා ප්‍රත්‍යන්ත ග්‍රාමයට ගොස් "මම රාජ පුත්‍රයෙමි, සම්පත්තියක් කැමැති කෙණෙකුන් මා හා කැටිවැ එන්නේ යැ සි බොහෝ දෙනා කැඳවා ගෙණැ ඇ ඇ මනුෂ්‍යයන්ට උපකාර කෙරෙමින් රාජ්‍යය සම්පයට ගොස් "මා හා යුධ හෝ කරන්නේය. රාජ්‍යය හෝ දෙන්නේ ය"සි හසුන් යැ වූහ.

අමාත්‍යයෝ එ පවත් අසා "ඇපි රාජ්‍යයත් නො දෙමිහ. යුධයත් නො කරම්හ. අපගේ සවාමීන්ගේ බිසවුන් ගර්භිනි කල ම පක්ෂියෙක් ගසා ගෙණැ ගියේ. උන් ගෙණැ ගිය තැන මළ බව රැකුණු බව නො දනුම්හ. උන්ගේ පවත් දන්නා තුරු අප දෙන රාජ්‍යයත් නැත කරණ සටනුත් නැතැ"සි කිහ. ඒ අසා කුමාරයෝ එසේ වුවහොත් "මම ඒ බිසවුන් ගේ පුත්‍ර යෙමි"සි බිසවුන් කී පරිද්දෙන් අමාත්‍ය'දීන්ගේ නම් කියා එසේත් නො අදහන කල්හි රජ්ජුරුවන් ශ්‍රී හස්තයෙහි ලන මුන්ද හා පොරෝණ පලස හා පෑ. ඉක්බිති අමාත්‍යයෝ හදහා නුවර දෙරි හැරැ කුමාරයන් ඇතුළට ගෙණැ රාජ්‍යයට අභිෂේක කළහ.

"මේ උදෙන රජ්ජුරුවන්ගේ උත්පත්ති ක්‍රමයි."

තව ද, අජිත නම් 1 රට දුර්භික්ෂ සමයෙක්හි 2 ජීවත් වන්නට අසමර්ථ වූ කොකුහල නම් එක් මනුෂ්‍යයෙක් 3 කාපිත නම් එක් තරුණ පුත්‍රයක්හු හා කාලි නම් අඹුවක හා ගෙණැ කොසඹැ නුවරට ගොස් රක්ෂාවෙමි සි මඟට සුදුසු උපකරණ ගෙණැ නික්මින. ඔහු මාර්ගයෙහි යන්නාහු මාර්ගෝපකරණ නිමා යන්නා හා ශක්ති නැතිවැ ගොස් සා දුකින් පීඩිතවැ දරුවන් වඩාගෙණැ යන්නට නො පොහොසත් වූහ.

ඉක්බිති සැම් තෙම අඹුවට කියන්නේ තෙලි! ඇපි ජීවත් වමෝ නම් දරු කෙණෙකුන් වදා ගනුම්හ. මූ මහැ හැරැ පියා

---

1. රටක. 2. ජීවත්ව ගන්නට. 3. කාලිජී - ස - ර.

යම්හ සි කීහ. ඒ අසා මවුතොම පියන්ගේ ලයට වඩා මවුන් ගේ ලය මොළොක් හෙයින් "මෙ මා දිවි තබා මාගේ පුතනුවන් දිවි තබා හැරැ පියා නොහෙමි"සි කියා වැලි කළමනා කිම්දැ සි කී කල්හි තෙපි එක් විටෙක වඩා ගනුව. මම එක් විටෙක වඩා ගණිම් සි කියා එක් විටෙක මවු මල්දමක් සේ උරෙහි හොවා ගෙණැ යෙ සි. එක් විටෙක පියා වඩා ගෙණැ යෙ සි. ඔහු වඩාගත් ක්ෂණයෙහි ම ක්ෂුධාවට වඩා ඒ වෙද නාව බලවත් වේසි.

හෙතෙ ම වෙදනාව ඉවසා ගත නොහී නැවත නැවත අඹුවට කියන්නේ "ඇපි ජීවත්වමෝ නම් පුතුන් ලබම්හ. මොහු උසුලා ගෙණැ යතහොත් ඇපිත් මේ දරුවොත් ඇවොම දෙන ම මියම්හ. මොහු හැරැ පියා යම්හ"සි කියා හෝද නැවත නැවත වළකා වෙහෙසි පියා පසුව මුහෙන් නොබිණුව. කුමාරයා ද පියා ඔරින් මව ඔරට මවු ඔරින් පියා ඔරට ගොස් විඩාවැ නිදන්නට පටන්ගත. 1 පියෙ ඔහු නිදන බව පළමු කොටැ දැනලා කුමාරයා එක් ගසක් යටැ කොළ ඇතිරියෙක්හි හොවා පියා නැඟි හියේ ය. මවු පෙරළි බලන්නී පුතු නොදැකැ "මාගේ පුතනුවන් කොයිදැ සි දමා පියා අවිදැ"සි සොඇමිනි! මා නොනසව. මම මාගේ පුතනුවන් නැතිවැ ජීවත් නොවෙමි. මාගේ පුතනුවන් ගෙණෙව"සි හඬන්නට පටන් ගත. ඇගේ හඬ 2 බලා නැවත කුමාරයා ගෙණ ය.

මෙ පමණ තැනක පුතනුවන් හැරැ පියා හිය හෙයින් හවා'නතරයෙහි සත් ඉඩෙක 3 හරණ ලද. **අකුශල කම් නම් මඳ දෙයෙකැ සි නොසිතිය යුත්තේ ය.** ඔහු දෙ මහල්ලෝ යන්නාහු එක් **ගොපලු ගමකට** පැමිණි ය හ. එ දවස් ම ගොපල්ලාගේ දෙනුන්ට කළ මනා මහා මහුලෙක් එළඹැ සිටියේය. ඒ ගොපල්ලාගේ ගෙයි එක් **පසේ බුදුකෙණෙකුන් වහන්සේ** නිබඳයෙන් ම වළඳන සේයෙක එ දවස් ගොපලු **පසේ බුදුන්** වහන්සේ වළදවා මහුල් කෙළේ. ඒ මහුල්හි ද බොහෝ කිරිබත් තන් කරණ ලද. ගොපලු තෙම මඟිවැ ආ ඔවුන් දැකැ කොයි සිටැ අවුදැ සි විචාරා එ පවත් හැම අසා මොළොක් වූ ලය ඇති කුලපුත්‍ර තෙම ඔවුන් කෙරෙහි කරුණා කොටැ බොහෝ හෙළහිතෙල් හා කිරිබත් දෙවී ය.

---

1. පියා. 2. හඬ අසා. 3. දැමීමට පැමිණියේ ය.

අඹුතොමෝ කිරිබත් හෙණැ සැමිනි! "මම තොප ඇතොත් ඇත්තෙමි. බොහෝ කලක් සසින් උන්නව. බඩ පුරා බත් කව"සි හෙළහිතෙල් උඹ දිශාවට නමාලා නොමෝ හෙළහිතෙල් මද දිශාවෙන් බත් කැව. සැම බොහෝ කොටැ බත් කා සත් අට දවසක් සාවැ හුන් හෙයිත් ආහාර තෘෂ්ණාව ඉවසාගත නොහින. ගොපලු තෙම ඔවුන්ට බත් දෙ, තෙමේ කිරිබත් කන්ට පටන් ගත. මහි පුරුෂතෙම ඔහු බල බලා හුන්නේ යට මැස්සෙහි හොත්තා වූ බැල්ලට ගොපල්ලා දෙන කිරිබත් පිඩ බලා "දවස දවසා මේ බත් පිඩ ලබන බැල්ලක් කුශල් කළ නියාය"සි සිතා රාත්‍රියෙහි කිරිබත 1 දිරවා ගත නො හී මිය එම බැල්ලගේ බඩැ උපන.

ඉක්බිති අඹු තොමෝ ම සැමියා දවා එම හෙණි ම බැළ මෙහෙ කොටැ සාල් නැළියක් ලදින් ලත් සාල් නැළිය පිසැ **පසේ බුදුන් වහන්සේට** දන් දිලා මේ පින් නුඹ වහන්සේගේ මළ හැත්තවුට වේව සි කියා, මා මෙහි ම විසුව මැනව. මාගේ සැමි දරු වූ පසේ බුදුන් වහන්සේ නිබදයෙන් මෙයට වඩනා සෙයෙක. පිළිගන්වන්ට දෙයක් ඇත මැනව. නිබදව දුකැ දුකැ ශ්‍රී පාද වැඳැ වැඳැ වසන්නෙමි මෙහි ම වෙසෙමි සි බැළ මෙහෙ කොටැ විසුව. ඒ බැළිද සත්වෙනි අවවෙනි මස කුකුරුවකු වදා සුව. ගොපලුතෙම කුකුරට නිබදයෙන් එක් දෙනකගේ කිරි තබා දින. 2 කුකුරා නොබෝ කලකින් වැඩි මහත් විය.

ඉක්බිති **පසේ බුදුන් වහන්සේ** වළඳන වේලෙහි කුකුරට නිබද ම බත් පිඩක් තබා දෙන සෙයෙක. කුකුරුතෙම බත් පිඩ නිසා පසේ බුදුන් වහන්සේ කෙරෙහි සෙනහ කෙළේ. ගොපලු ද දවස් පතා දෙ වේලෙහි ම පසේ බුදුන් වහන්සේට උපස්ථානයට යන්නේ අතර මඟැ චණ්ඩ මෘගයන් ඇති තැනැ බිමත් ගසත් දණ්ඩත් ගසා පියා මහත් කොටැ හඬ ගසාපියා චණ්ඩ මෘගයන් ලුහුබදව සි. බලු ද ඔහු හා කැවිව යෙ සි. එක් දවසක් නොපලුතෙම පසේ බුදුන් වහන්සේට "සැමිනි! මට අවකාශයක් නැනිද මේ බල්ලා එවාලූ සලකුණෙන් වැඩිය මැනවැ"සි සැලකොටැ තමාට අවකාශයෙක් නැති දවස් "පුත! ගොස් මාගේ සැමීන් වඩා එව"සි කියා බල්ලා යව සි.

---

1. ඉවසාගත නොහී. 2. කුකුරුවා.

ඔහු කී එක බස ම ගිවිස ගෙණැ නික්මැ සඟමි දරුවා ගස කොළ දණ්ඩ ගසා චණ්ඩ සත්ත්වයන් දුරු කරණ තැන්හි දී තෙමේ මහත් කොටැ බුරා චණ්ඩ සත්ත්වයන් දුරු කෙරෙමින් පසේ බුදුන් වහන්සේ වසන තැනට ගොස් පන්සල් දොරැ සිටැ තුන් විටෙක හඬා නමා ආ බව සැලකොටැ ඇතුළට වැද එකත් පස්වැ සිටැ වැදැ හොවී. පසේ බුදුන් වහන්සේ ද වළඳන 1 වේලා වනැ සි නික්මුණු කල්හි බුර බුරා චණ්ඩ සත්ත්වයන් දුරු කෙරෙමින් අභිමුඛයෙහි යෙ සි. අතුර තුරෙහි පසේ බුදුන් වහන්සේ ඔහු විමසනු පිණිස අනික් මගකින් වඩනට පටන් ගන්නා සෙයෙක. ඉක්බිති බලුතෙම අභිමුඛයෙහි මග අහුරා සිටැ ගෙණැ බුරා නො වැඩිය දෙ සි.

එස් දවසක් පසේ බුදුන් වහන්සේ ඔහු වලක්ව වලක්වා වැඩැ බල්ලා පසින් ඉවත ලා පියා නික්මුණු සෙයෙක. බලු නො වැලකැ වඩනා දකැ පසු පස්සෙහි දිවැගෙණැ ගොස් සිවුරු කණ ඩැහැගෙණැ ඇදැ මගට ගෙණ ඇ. මේසේ පසේ බුදුන් වහන්සේ කෙරෙහි බලවත් වූ 2 සෙනහ ඇති කොටැ එස් දවසක් පසේ බුදුන් වහන්සේ සිවුරු හෙත්තම් කරණ පිණිස ගොපල්ලා අතින් සමුගෙණැ ආකාශයට නැඟි වඩනා බලමින් **තිරිසනුන් නම් මිනිසුන් සේ තුඩින් එසක් කියා සිතින් එසක් සිතන චක්‍ර බුද්ධියක් නැතිවැ සෘජු බුද්ධි හෙයින්** වඩනා පසේ බුදුන් වහන්සේ බලා බුර බුරා සිටැ ලය පැලී මියැ තමා කළ අනික් කුශලයක් නැත ද පසේ බුදුන් වහන්සේ කෙරෙහි කළ සෙනහයෙන් **නව නිසා භවයෙහි** මහෙශාක්‍ය දිව්‍ය පුත්‍රවැ ඉපැදැ දිව්‍ය සත්‍රීන් ලක්ෂ ගණන් පිරිවරා දිව්‍ය සම්පත්හි අනුභව කරන්නට පටන් ගත.

එහෙයින් සත්පුරුෂයන් විසින් ඉතිරි කරණ ලද කුසල් නැද්ද ? තුණුරුවන්හි සෙනහ මාත්‍රයක් කොටැ ද අසාධාරණ වූ අනුපම වූ දිව්‍ය සම්පත් අනුභව කරන්නට උනසාහ කළ මැනව.

එසේ උපන්නා වූ ඒ සොඟඟ අනුත් කණට කොදුරා බණන කල්හි ශබ්දය දෙලොස් යොදනක තැන් පැතිරී සිටී. සභාවයෙන් බණන කටහඬ සියලු දස දහසක් ඔදුන් දෙව්ලොව පැතිරී ගෙණැ සිටී මේ හැම බලුවැ පසේ බුදුන්

1. වේලාව සලකා. 2. සෙනහ කොටැ.

වහන්සේට රක්ෂා පිණිස බිරු බිරුමෙහි අනුසස ය. එහෙයින් ම ඕ හට සොළොස දිව්‍ය පුත්‍රයි කි නම් තුබූහ.

හෙතෙම එවෙනි මහත් වූ දිව්‍ය සම්පත්හි අනුභව කරන්නේ "මේ ආහාර අනුභව කරණ වේලය"යි නොදැනැ සිහි මුළාව ආහාර සෂයින් මියැ කොසඹැ නුවර නාගර ශොභනා වකැ කුසැ පිළිසිඳැ ගත. හෝතොමෝ වැදූ දවස් දැසිය! මා වැදූයේ දුවක ද පුතකුදු දැයි විචාරා පුතෙකැ යි කී කල්හි එසේ වුවහොත් මොහු කුල්ලෙක ලාලා කසළ ගොඩට දමා පියව යි කියා දම්මවාපුව. මොහු බලුවැ උපන් කල පසේ බුදුන් වහන්සේට රක්ෂා පිණිස බිරු බිරුමෙහි අනුසසින් සිසාරා ගෙණැ හින්නා දහස් ගණන් කපුටු බල්ලෝ මොහු ඇඟැ තුඩ 1 ඔබා ලන්නටත් සමර්ථ නොවූහ.

මෙසේ ධම්මය නම් නමා රක්ෂා කරන්නා වුන්ට රක්ෂා කරන්නේය යි දත්තා වූ සත් පුරුෂයන් විසින් ධම්මය සරණ යෙමි යි **දහම් සරණ යා සුතු.**

එසේ ම ඔහු කසළ ගොඩෙහි ඔත් කෙණෙහි පිටත යන්නා වූ එන් පුරුෂයෙක් රැස්වැ ගෙණැ හුන්නා වූ කවුඩු බල්ලන් දැකැ මේ කිම් දෝ හෝ යි පරීක්ෂා කරන්නේ කුමාරයා දැකැ පුත්‍ර සෙනහ උපදවා පුත්කොටැ වඩා ගෙණැ ගෙට ගියේ ය. එ සමයෙහි **කොසඹැ නුවර සිවානෝ** රජගෙට යන්නාහු රජගෙයි සිටැ ගෙට යන්නාහු පුරෝහිතයා දැකැ "ආචාර්‍යයෙනි! අද වක දවස නකත් පරීක්ෂා කළාදැ යි විචාරා පරීක්ෂා කෙළෙම් යි කී කල්හි විශෙෂ කිම්දැ යි "අනික් විශෙෂයෙක් නැත. අද මෙ නුවර උපන් කුමාර කෙණෙක් ඇත්නම් මහසිටු නැන් ලැබෙනි"යි කිය.

ඒ අසා සිවානෝ නමන්ගේ අඹුවන්ටත් ප්‍රසව ආසන්න බව දැනැ ගෙට යවා වැදූ දෝ හෝ නොවැදූ දෝ හෝ යි විචාරා නොවැදුව යනු අසා රජ ගෙට ගොස් රජ්ජුරුවන් දැකැ අවුත් තමන්ගේ මිඩියක කැඳවාලා ඇට දහසක් දීලා 2"නෝ සියලු නුවර බලා අද උපන් දරු කෙණෙකුන් ඇතහොත් හැරැ ගෙණැ එව"යි යැවී ය. හෝ තොමෝ සියලු නුවරෙහි ඇවිදිනී කසළගොඩ හොත් දරුවන් වඩා ගෙණැ ආ ගෙට ගොස්

1. නබා ලන්නට. 2. කොල සියලු නුවර.

දහස දී දරුවන් ගෙණැ සිටාණන්ට පැව. සිටානෝ "මාගේ අඹුවන් දුවක ලදහොත් මෝ ගට විවාහ දී රක්ෂා කෙරෙමි"යි ඉඳින් "පුතනු කෙණෙකුන් උපන්නු නම් මොහු හැරැ පියමි"යි වඩන්නට පටන් ගත්හ.

ඉක්බිති සිටානන්ගේ ඇඹනියෝ පුතකු වැදූහ. සිටානෝ ද "මොහු ඇතහොත් මාගේ පුතනුවන්ට සිටු තනතුරු නොලැබෙන්නේ වේදැ යි, සිතා එම මිඩිය කැදවා "මොහු ගෙණැ ගොස් ගොපල්ලන් ගෙරි පිටත් කරණ වේලෙහි ගොවුදෙහි ගෙරි නික්මෙන කඩැ හෝවා ලව" එසේ කල්හි ගෙරිම මොහු මැඩැ මරන්නාහ යි නහා යැවූහ. ඕ නොසින් කුමාරයා ගොවුදි කඩෙහි හෙවූහ. එ දවස් පෙරැ හැම ගෙරින්ට පසුව ලා යන වැඩි මහළු ගොන් හැමදෙනාට පළමුව නික් මැ කුමාරයන් සතර කකුල හස්සෙහි ලා ගෙණැ ගොන් යන තුරු උපද්‍රවයක් විය නො දී සිටියේ.

ගොපලු ගොනු සිටි කාරණය පරීක්ෂා කරන්නේ කුමාරයන් හොත්තවුන් දැකැ "මහ පිණැ'නි දරු කෙණෙකුන් ලදිමි" යි වඩා ගෙණැ නමාගේ ගෙට ගෙණැ ගියේ. මෙතෙ ම තමා බලවැ උපන් ජාතියෙහි පසේ බුදුන් වහන්සේට චණ්ඩ සාහස යන් දුරුකරණ පිණිස බිරු බිරුමෙහි අනුසසින් අඤ්ඤවූ ගොණුන් අතින් පොවා මෙ බඳුවූ රක්ෂා ලදහ.

එසේ හෙයින් ධම්මය සේ ලොවට රක්ෂාවට සුදුසු අනික් වසතුවක් නැති හෙයින් තමහට සෙනහ ඇති සත්පුරුෂයන් විසින් ධම්ම ය පුරා ධම්මය ම සරණ යා සුතු.

ඉක්බිති සිටානන්ගේ මිඩිය ගොසින් සිටානන්ට එ පවත් දැන් වූහ. සිටානෝ ද එ පවත් අසා දහසක් යවා ඔහු ගෙන්වා ගෙණැ එම මිඩිය අත යවා පන්සියයක් ගැල් යන මහ හෙවූහ. හැමදෙනාට 1 පළමු ගැල්ලා පළමු කොටැ විය. ඉක්බිති ඒ ගැල් දෙවුවාගේ ගැල්හි යෙදූ ගොන්හු දරුවන් හොත් තැනට ගොසින් විය කරින් හෙළා පියා වතු කම් කරන්නාහු නැවත යොදා ලා මෙහෙ යුව ද වතු ම කොටැ අරුණු නැඟූහ.

ඉක්බිති ගැල් දෙවුවා පෙරළි "ශික්ෂිත ගොණුන් අද මේ සම භූමියෙහි නො යාහී වතු කොටැ පහන් කෙළේ කුමක්

1. වැඩී මහට

පිණිස දෙ හෝ''යි සිතා පරීක්ෂා කරන්නේ හොත්තා වූ දරු වන් දැකැ ''මහා භාග්‍ය දරු කෙණකුන් ලැබුම්''යි තමාගේ ගෙට වඩා ගෙණැ ගියේ. මෙ තැන්හි ද සම භූමියෙහි පන් සියක් ගැල් පැකිල සිටිනා පරිද්දෙන් ඔහුගේ රක්ෂාවට වජ්‍ර ප්‍රාකාර වූයේ ඔහු රක්ෂා කළා වූ ධම්මය ම ය.

එ හෙයින් මෙසේ අසරණ ස්ථානයෙහි සරණ වන්නා වූ ''ධම්ම රතනය සරණ යෙමි''යි **දහම් සරණ ඟා සූත්‍ර.**

නැවත සිටානෝ එ පවත් අසා දහසක් දී ගෙන්වා ගෙණැ ඇ ම අතැ ''මොහු ගෙණැ ගොසින් අම්බු සොහොන්හි ගස් කොළ අතුරෙහි හොවාපියා'' එ තැන්හි මොහු කඩුබු බල්ලෝ හෝ කා මරන්නාහ. යක්‍ෂයෝ හෝ ගෙණැ යන්නාහ. එහි මොහුගේ පවත් දැනැ එව සි එහි නගා යැවූහ. හෝතොමෝ ඔහු අම්බු සොහොන් වලට දමා පියා එකත් පස්වැ හැළී ගෙණැ සිටියහ. එසේ වූ විජන ස්ථානයෙහි සතිස් යොදනෙක පැතිරී ගෙණැ සිටියා වූ පිරිසින් රැකවල් ලද චක්‍රවර්ති මහ රජතුමා සේ කුමාරයා නිරුපද්‍රව හොත් කල්හි එක් එළු පල් ලෙක් එළුවන් උනාගෙණැ එතැනින් යෙමින් සිටියේ.

එ සමයෙහි එක් එළියක් යන මගින් ඇලවැ ඇලවැ කොළ පත් කකා යන්නී ඔත්තා වූ කුමාරයන් දැකැ ඔවුන්ගේ ධම්ම බලයෙන් උපන්නා වූ සෙනහ බලයෙන් නැම් ගොස් දෙ දන බිමැ ඇනැ ගෙණැ හය පක්ෂ පාතයෙන් රාජ කුමාර කෙණකුන් කිරි පොවන කිරි මවක සේ තනය 1 කට තබා කිරි පොවන්නට පටන් ගත්තී. එළු පල්ලා නෙරිනට වනත් නො යෙ සි. ඉක්බිති එළුපල් එළිය කෙවිටින් ඇනැ බැණැ ගෙණැ යෙමි සි සිතා එනනට ගියේ හොත්තා වූ කුමාරයන් දැකැ ''මහා දෙව ඇත්තා වූ පුතනු කෙණකුන් ලදිම්''යි සිතා වඩා ගෙණැ ගෙට ගියේ.

ඉක්බිති සිටානෝ එ පවත් අසා නැවත දහසක් දී ඔහු ගෙන්වා මෙතෙම මෙසේ මරාගත හැකි කෙණෙක් නො වෙ සි. මොහු පළිත මස්තකයෙහි හෙළා පියා එසේ කල්හි පළිත ඝ්‍රාතයෙහි ගැසි මියන්නේ ය සි යැවිය. හෝතොමෝ පළිතයට නැඟි කුමාරයා හෙළුව. ඔහු හෙන්නහු ම බලවැ

1. කටලා.

පසේ බුදුන් වහන්සේට කළ රක්ෂායෙහි අනුසසින් කෙළිපෙ දක් බිම හිය නො දී අත හෙළුවා ගන්නා සේ හුනු ලැහැබැ මොළොක්වූ ශාඛායෙන් පිළිගෙණැ එසමයෙහි **එක් නල කාර ශෙක්** නමාගේ පුතු හා කැටිවැ 1 හුණ දඩු කපන්නට ගියේ කුමාරයන් ශාඛා'ග්‍රයෙහි හොත්තාවුන් දකැ. වඩා ගෙණැ තමාගේ ගෙට ගියේ. සිටානෝ ද එපවත් අසා නැවැත දහසක් දී කුමාරයන් ගෙන්වූහ.

මෙසේ බලවැ පසේ බුදුන් වහන්සේට කළ රක්ෂායෙහි අනුසසින් මෙතෙක් උපද්‍රවයෙන් කුමාරයන් ගැළවුනු බව ඇසූ සත්පුරුෂයන් විසින් ධම්මය සේ වූ රක්ෂා වරණයක් ලොවට නැති බව දැනැ අප්‍රමත්තවැ එම ධම්මය ම පුරා එම ධම්මය ම සරණ සා ගුනු.

මෙසේ සිටානෝ මෙතෙක් මෙතෙක් උපාය කරත් කරත් කුමාරයෝ වැඩුනාහ. වැඩුනාවූ කුමාරයන්ට **සොසකාය** යි නම් කළහ. කුමාරයෝ සිටානන් ඇසැ ගසා ලූ කටුවක් සේ වැටහුනාහ. ඇස දැල්වා ඉදුරත් බලා පියැ නො හෙති. නැව ත ද කුමාරයන්ට මරණ උපායන් සිතන්නාවූ සිටානෝ තමන් ගේ ම ගෙට වලන් ලන්නාවූ කුඹලා කැඳවාලා කවර දවසකැ සුල ලසිදුසි විචාරා සෙට ය යි කී කල්හි එසේ වුවහොත් මේ දහස ගෙණැ අපට එක් කටයුත්තක් කරව යි කියා කවර කට යුත්තෙක් ද සාමිනි! කී කල්හි මාගේ එක් 2 අවජාත පුත්‍ර යෙක් ඇත. ඔහු තා කරා එවා ලන්නා හා ගබඩාවෙහි ලා ගෙණැ පොරොවකින් කඩකඩ කොටැ කපා පියා සැළියෙක ලාලා වලන් පලහන සුලයෙහි ලා පිය. මේ දැස නොපට නිකම් 3 අත් පඹුරුය. මේ කටයුත්ත සිඹවූ කල්හි කරන්නාවූ උපකාර මම් ම දන්නෙම් වේදැ යි කිහ.

කුඹලා ද "යහපත, සාමිනි! මේ කවර බැරි දෙයෙක් දැ යි" කියා ගිවිස්සේ. සිටානෝ දෙවන දවස් **සොසකාය** කැඳවාලා "මේම රූයේ කුඹලාට කටයුත්තක් කිම්. නෝ හොසින් රූයේ කී කටයුත්ත නිහඬ කරන්නට කුඹලාට කියවයි" කියා යැවූහ. ඔහු යන්නහු කෙළි මඩලෙහි සිටියාවූ 4 සිටා නන්ගේ ගෙහි වැදූ පිත් තෙමේ දකැ කොයි යවුදැ යි විචාරා

1 හුණ පොතු. 2 අව ලක්ෂණ. 3 අත්ලස් පඹුරුය.
4 සිටානන්ගේ වැදූ පුතහුවෝ.

"අප්පාගේ මෙහෙ වරෙක. කුඹල්ගෙට යෙම්"යි කී කල්හි මේ කොල්ලෝ කෙළි මඩලෙහි මා බොහෝ කොටැ පර දවා පිහ. නුඹ ඔවුන් හා කෙළි කෙළැ දැන් මාගේ පැරදුම් ගෙවන්නේ. "මම කුඹල්ගෙට ගොස් නුඹගේ කටයුත්ත කොටැ ගෙණැ එමි"යි කියා **සොසකයන්** කෙළි මඩලෙහි හිටු වා තෙමේ කුඹල්හලට ගොස් ඊයේ අපගේ පියානන් වහන් සේ කී කටයුත්ත නිහඬ කළ මැනව"යි කිහ.

කුඹලා සිටානන් කී පරිද්දෙන් ම කුමාරයා මරා පියා වලන් පළහන සූලයෙහි ලා පියය. **සොසක කුමාරයන්** ද දිවාභාගය මුළුල්ලෙහි කෙළැ සවස ගෙට ගොසින් සිටානන් විසින් "හැයි? පුත! කුඹල්ගෙට ගියාදැ යි? කී කල්හි තමන් යන්නවුන් වළකා පියා සිටානෝ පුතනුවන් ගිය බව කී කල්හි දෙහොන මුදුනෙහි තබා හඬා ගෙණැ කුඹල්ගෙට ගොස් කුමාරයන් මළ පවත් අසා මහත් වූ ශොකයෙන් ආතුර වූහ. **නමා කෙරෙහි මෙපැයක් නැන්නවුන්ට මෙප කළවුන්ට වන් නාවූ විපතනිස නො වළකා ගත හැකි බව මේ කථාවෙන් අසා සත්පුරුෂයන් විසින් මෙප නම් දෙයක් නො කටයුතුය.**

මෙසේ බලවැ පසේ බුදුන් වහන්සේට රක්ෂාව පිණිස බිරු බිරුමෙහි අනුසසින් කුමාරයෝ මෙවෙනි මිතු වඩයෙන් ගැළවී දිඝායුෂකවැ මතු මහා සම්පතනි අනුභව කරන්නට 1 වහල්වූයේ ජාත්‍ය'නතරයෙහි මොහු පිරූ සුචරිත ධම්මය මය. එහෙයින් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා සසරෙහි රක්ෂා හා අභිමතවූ සියලු අනුභව හා අනතයෙහි **අමෘත මහා නිර්වාණය** කැමැති සත්පුරුෂයන් විසින් ධම්මය ම පුරා "දහම් සරණ යෙම්"යි 2 **දහම් සරණ යා යුතු.**

මෙසේ නොයෙක් ලෙසින් කුමාරයන්ගේ භාග්‍යය නිශ්චය වූව ද සිටානෝ කුමාරයන් ඉදුරාත් බලා පිය නො හී "කවර ලෙසකින් මොහු මරා ගණිම් දෝ හෝ"යි සිතා මාගේ ගම් සියයකට මුදලිවැ සිටින තැනත්තනුට කියා මරම් යි සිතා **සොසක කුමාරයන්** කැඳවා පුත! මේ පත ගෙණැ ගොසින් අපගේ **ගම්මුදලින්ට** දී ලව යි කියා "තෙල අපගේ කාල කණ්ණි පුත්‍රයෙක. තුලු මරා පියා මඩොර යෙක්හි ලා පුව හොත් තමන්ට කළමනා සත්කාර මම් ම දන්මි"යි කියා කුමා රයන් අකුරු නො දන්නා හෙයින් පත් දිලා යවන්නෝ පලා

1 ඉතතුවූයේ. 2 ධම්මය.

බතුත් නොලා "අතර මග අපගේ යාළු සිටානන්ගේ කෙණෙක් ඇත. ඔවුන්ගේ ගෙට වැදී බත් කා ගෙණෑ යව"යි නහා යැවූහ.

කුමාරයෝ ගොස් අතර මගැ සිටානන්ගේ ගෙට වැදී ඔවුන්ගේ ඇඹේනියන් දුකැ නම් සලකුණු කියා **සොසක කුමාරයෝ** නම් තොපි දැ යි කී කල්හි එසේය යි කිහ. ඔවුන් දුටු ඇසිල්ලෙහි ම සිටානන් ඇඹේනියන්ට ඔවුන් කෙරෙහි පුත්‍ර සෙනහ උපන. එසමයෙහි සිටානන්ගේ සත්වුමු පායෙක්හි ලා ලා එක් මෙහෙකරණ එකෙක් පාවා දී රක්‍ෂා කරණ දියනි කෙණෙක් ඇත. සිටු දියනියෝ තමන්ගේ මිඩිය ඒ වේලෙහි කිසි කටයුත්තක් පිණිස වෘපාර විථියට ගවන්නාහ. ඇයන්නිය දුකැ සිටානන්ගේ ඇඹේනියෝ ඇ කැඳවා නි යන මෙහෙවර තබා මාගේ පුතනුවන් පතුල සෝධවා යාන් අතුට එහි හොවා ලව යි කිහ. ඕ ඒ මෙහෙවර කොටැ කල් යව්, සිටු දියනියන් සම්පයට ගියහ.

සිටු දියනියෝ කල් යැවූ කාරණය විචාරා **සොසක කුමාරයන්ට** නුඹහේ මැනියන් කී මෙහෙවර කොටැ කල් යැවීම් යි කී කල්හි නම කණ වැටහෙන්නා හා ම උපන්නාවූ සෙනහයෙන් පිරිහියාවූ සිත් ඇතිවූහ. ඔහුද අනික් කෙණෙක් නොවෙති. මේ කුමාරයන් බලුවැ 1 උපන් කාලයට පළමු උපන් ජාතියෙහි අඹුවැ පසේ බුදුන් වහන්සේට මෙහෙකළ තැනැත්තහ. එහෙයින් ගිය ජාතියෙහි ඇඹේනියන් හෙයින් ම සෙනහ කොටැ උන් අත යමක් ඇද්දැ යි විචාරා කුරුහුලා කණ බැඳලූ පතක් මුත් අනිකක් නැතැ යි කී කල්හි කාත් නොදන්වා කුමාරයන් ඔත් තැනට ගොස් පත උනා පියා කියවා හසුන් දුකැ කම්පාවැ මා නුදුටුවුව හොත් මාගේ සැමියන්ගේ ජීවිතය නවුයේ වේදැ යි සිතා ඒ පත හිරා අනික් පතෙක **"අපගේ ගම් සියෙක්හි නියුක්ත මුදලියාමය. මාගේ පුත්‍රවූ සොසක කුමාරයන් 2 නා බලා එවිම්. නෙල අපසතු ගම් සියසෙන් ම පඩුරු හැරගෙණැ ජනපදවාසිවූ සිටානන්ගේ දුවනියන් හා විවාහ කරවා ගම්මැද දෙමහල් පහයක් කරවා එහි උන් ලවා එපවත් කියා එවා මා අතින් මහා ප්‍රසාද ලබන්නේය"**යි පත ලියා කුරුහුලෙහි බැඳැලූහ.

---

1 උපන් ජාතියට. 2 කොලොව යැවීම්.

කුමාරයෝ බත් කා සැතපී නික්මැ ගම්මුදලිහු දැකැ ඒ පත් දුන්හ. හෙතෙම ඒ පත දැකැ සතුටුවැ එසේම විවාහ කරවා පායෙහි ලා එපවත් සිටානන්ට කියා එවිය. සිටුතෙම එපවත් අසා මා කළු කළු දෙයෙක් සිඩ නො වනා වනැ සි ශොකයෙන් ඇතිවූ අනිසාරයෙන් පීඩිත විය. **සොසඤ්ඣ කුමාරසන්**ගේ ඇඹෙනියෝ ද සිටානන්ගෙන් ආ හස්නක් මට කියා මුත් උන්ට නො කියව සි නියොග කළහ. සිටානෝ ද මේ විට ඌ මාගේ වසතුවට හිමි විය නො දෙමි. සි තමාගේ එක් නිෂ්ඵත්ත යක්ඛ කැඳවා මාගේ පුතනුවන් මා දක්නට ද කැඳවා ගෙණැ එව සි කියා යැවිය.

සිටු දියනියෝ එපවත් අසා සිටානෝ රෝගයෙන් දුර්වල යෝ ද බලවත්හු ද සි විචාරා "තව ආහාර කා හෙති"සි කී කල්හි **සොසඤ්ඣ කුමාරසන්ට** එ පවත් නො දන්වා "මා කී කල යන්නේය. මා කියනතුරු මෙතැන්හි හිඳුව"සි ඔහු එක් තැනෙක්හි සුවසේ හිඳුවූහ. මෙසේ ම දෙවරෙකැ හිඳුවූහ. තුන්වන වරැ රොගය බලවත්වැ ගිය කල්හි ගිය තැනැත්තේ සිටානන්ට රෝග බලවත් වූ බවත් එක් කබල් තබා එක් කබල් පහකරණ බවත් කිය.

එ පවත් අසා සිටු දියනියෝ මේ යන්නට සුදුසු කලැ සි ගම් සියයෙහි පඬුරු හැරැ ගෙණැ නික්මැ තොපගේ පියානන් බලම්හ සි එන්නාහු මෙතෙක් වසතු හැරැ ගෙණැ යන්නට කල්ය සි කියා වසතුව තමන්ගේ කුලෙහි තබා සැමියනි! තොපි තොපගේ පියානන් දුටුවිට වැඳලා පාමුලැ සිටුව. මම ඉස්දෙරැ සිටිම් සි කියා ගෙට වදනා විටම ගෙය සිසාරා තමන් ගෙන් රැකවල් ලවා ඇතුළට වැදී සිටානන් වැඳැ තුමූ ඉස් දෙරැ සිටියහ. කුමාරයෝ පා මුලැ සිටියහ.

එ සමයෙහි සිටානන් පය මැඩැ හුන් තැනත්තහු සැමියනි! නුඹගේ පුතනුවෝ අවුය සි කී කල්හි ඇස් දල්වා කුමාරයන් බලා තමාගේ **ලිඝන්නවුන්** කැඳවා වසතුවෙහි සඩ්ඛ්‍ය විචාරා "ධනය සතළිස් කෙළෙක. මෙතෙක් විපද චතුඃපඤ්ඤාශය" යනු අසා "මෙතෙක් වසතු මාගේ පුතනුවන්ට නො දෙමි"සි කියන්නට පටන් ගත්තේ කුමාරයන්ගේ භාග්‍යයෙන් දෙම් සි කියා පිය. සිටු දියනියෝ එපවත් අසා පෙරළා අනිකක් කීවොත් නපුරැ සි සිතා උන්ට සිහි නැතිවැ හඬන්නා සේ "මී නියා අවමඞගල්‍ය බස් දැන්ම වදුරන්නේ කුමටදැ"සි ලෙහි

අඩාගෙණැ හී ලය ගිසින් ගැනැ එතන්හිම මරා පුව. රජ්ජු ජුරුවෝ සිටානන් මල බව් අසා දවා "උන්ගේ දරුකෙණෙක් ඇද්ද"සි විචාරා "**සොසඝ** නම් පුතනු කෙණෙක් ඇත. ජීවත් කල්හි ම ඇති වසතුව උන්ට ම පාවා දී මළහ" යනු අසා "ඔවුන් කැඳවව" සි කැඳවූහ.

එ සමයෙහි රාජඔහණයෙහි වැසි වැසැ දිය හෙළාපිය. කුමාරයෝ රජ්ජුරුවන් කැඳවූ හෙයින් යන්නෝ දියට නොබැසැ දිය පැනැ පියා නැඟී ගියහ. ගොසින් රජ්ජුරුවන් දැක වැඳැ එකත් පස්වැ සිටියහ. "**සොසඝසෝ** නම් තොපි ද"සි විචාළ කල්හි "එසේය"සි කිය. නෝ ශොක නොකරව, තට සිටුතැන් දෙමි දැන් ගෙට යා සි සමූ දුන් කල්හි ගෙට යන්නෝ අඳී පැනැ පියා ගිය දියට බැසැ පියා නැඟි ගියහ. රජ්ජුරුවෝ දෙක ම බලා සිටැ ඔහු කැඳවව සි කැඳවා "තොපි අඳී දියට පැනැ ගෙණැ ආයේ කුමට ද? පසුව දියට බැසැ ලා ගියේ කුමක් පිණිස ද"සි විචාරා සැමිනි! "අඳී කුඩා කොල්ලන් කෙරෙහි ඇතුළත්වැ අනාථපනවැ ඇවිදිනා හෙයින් දිය පැනැ ගෙණැ ආමි. දැන් සැමින් සිටුතනතුරු දෙම්හ සි වදාළ කල්හි 1 ආපත වුවමනා වේ දැයි දියට බැසැ ලා ගියෙමි සි" කී කල්හි රජ්ජුරුවෝ ඉතා ඛෙයඃ සම්පන්නවූ කටයුතු දන්නාවූ පුරුෂයෙකැ සි එ වේලෙහි ම සිටුතැන් දී නුවර පැදකුණු කරවා ඇවූහ.

ගෙට වදනා සිටාහන් දකැ "මෙතෙක් සම්පත්හි මා නිසාය ලද්දේය"සි ඇඹෙනියෝ සි පිහ. සිටානෝ සි පූ කාරණ විචාරා එපවත් අසා "මෙතෙක් තැන් අනන්තරයෙන් ගැළවුනේ මා ගිය ජාතියෙහි කළ කුසලින් වේ ද? එහෙයින් අප්‍රමාදවැ කුසල් කළමනා වේදැ සි" දවස් පතා දහසක් වියදම් කොටැ දන් දී **සොසඝ සිටානෝය** යන නමින් අද දක්වා ම ලොක ප්‍රසිඛ වූහ.

මොවුන් බලුවැ **පසේ බුදුන් වහන්සේට** රඤා පිණිස ඛිරු ඛිරුමෙන් දිව්‍ය ලොකයෙහි දිව්‍ය සම්පත්හි අනුභව කොටැ මනුෂ්‍ය ලොකයෙහි මෙතෙක් උපද්‍රවයෙන් ගැළවී සිටු තනතුරු ලදින් මහා සම්පත්හියට පැමිණි කථා ඇසූ සත්පුරුෂයන් විසින් උපන් සතඔයාට ඛම්මය ම මුත් අනික් සරණයෙක්

1 අමාපත වුවමනා.

නැතැයි නියත කොට සියලු සත්ත්වයාට සියලු උපද්‍රව දුරු කොටැ සියලු සම්පත්හි එළවන්නාවූ ධර්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා සූත්‍ර.**

මෙසේ **ශොසක සිටාණන්** පහළවූ සමයෙහි **භද්‍රවති නම් නුවරැ භද්‍රවති නම් සිටාණෝ ශොසක** සිටාණන් හා ඔවුනොවුන් නො දැකැ ම මිත්‍රවැ හිඳිනාහ. දෙපක්ෂයෙහි ඇත්තෝ ම ඔවුනොවුන්ගේ රටින් ආවාවූ වෙළඳුන් අතින් ඔවුන්ගේ සිරුරු අසා ඔවුනොවුන්ට පැහැදී යවා විශ්වාසය සථිර කළහ. එ සමයෙහි **භද්‍රවතිය සිටාණන්ගේ** ගෙයි **අතිවාතක රොගයක්** උපන. සිටාණෝ රොගයෙන් දුසි දුසාදින් ඇතුළුව හැම මියන්නට වන්කල්හි ඇඹැනියන් හා 1 දියනියන් කෙණෙකුන් කැඳවා ගෙණැ ගෙහි භිතනි බිදැ ගෙණැ නික්මැ අපගේ මිත්‍රවූ **ශොසකැ නුවරැ** හිඳිනා **ශොසක සිටාණන්** නිසා ජීවත් වම්හ යි අවුත් මාගෝ'පකරණ සඳිණ්වැ ගිය හෙයින් ඉතා දුප්පත්වැ වාසා'තපයෙන් වියලී! **ශොසකැ නුවරෙහි** ශාලාවට අවුත් ඇපි ඉතා දුප්පත්වැ හිඳම්හ. මෙසේවූ දුප්පත් වෙශයෙන් ගොසින් අපගේ මිත්‍රයානන් කෙසේ දක් මෝ ද? ඔහු අපගේ මිත්‍රයානෝ දවස් පතා දහසක් වියදම් කොටැ දන් දෙත් ල. ඔවුන්ගේ දන් හලට අපගේ දියනියන් යවා දන් බත් ගෙන්වා ගෙණැ කා මදක් ශරීරය පුෂ්ටි කොටැ ගෙණැ යම්හ යි සිතා ම දියනියන් දන් සැලට යැවූහ.

සිහා සිටි දියනියන් දැකැ තොපට කී කොටසක් 2 දුන මනාදැ යි කී කල්හි තුන් කොටසක් උව මැනවැ යි කියා තුන් කොටසක් ගෙණැ අවුත් මවු පියන් හා එක්වැ කන්නට බැසැ හුන්හ. මැනියන් හා දියනියන් දෙන්න "දුක නම් දෙය මහ තුන්ටත් වන දෙයෙක. නුඹ ජීවත් වුවහොත් අපිත් සුවසේ ජීවත් වම්හ. අප නො බලා මේ ආහාරය නුඹම කැව මැනවැසි" තුන් කොටස ම සිටානන් කැවූහ. සිටාණෝ 3 සිස් කසින් බත බොහෝ කොටැ කා දිරවා ගත නොහී අළුයම් වේලෙහි මළහ. මැනියන් හා දුවනියන් හා දෙන්න ම ශොකයෙන් හඬා වැලපැ උදැසන මැණියෝ ශාලාවෙහි හිඳැ දියනියන් සිහා යැවූහ.

---

1 දියනි කෙණෙක්හු. 2 උවමනා දැසි. 3 සිස්බසින්-ර.

දියනියෝ එදවස් "නොපට කී කොටසක් උවමනා දැ සි කී කල්හි දෙකොටසක් ගන්මි සි ගෙණැ අවුත් තමා ගෙණ දෙකොටස මැනියන් කැවූහ. මැනියෝ ද එසේ ම දිරවාගන නො හී මළහ. හෝ නොමෝ හඬා වැලපැ අනිස්දැ සිහා ගොස් "කී කොටසක් ගන්නදැසි" කී කල්හි එක කොටසක් ගන්මි සි කිව. 1 දන් දෙන **කෙළෙඹියා** ඇ තුන් දැ තුන් පරිද් දකින් දන් ගත් නියා හැඳිනැ පෙරවි දැ තුන් කොටසක් ගෙණැ රීයේ දෙකොටසක් ගෙණැ අද එක කොටසක් ගන්නට තිගේ කුසැ පමණ දත්තේ අදසි? කීය. ලජ්ජා සම්පන්නාවූ සිටු දියනියෝ පරිභව අසා සමා කොට ගත නොහි සාමිනි! මට ම ගත් කොටසෙක් නො වෙසි. මාගේ මැනියන් හා පියානන් හා ඇති දවස් උන්වත් එක්ක ගනිමි. අද මා හුද කලා හෙයින් මට ම ගන්මිසි කියා තමා වූ පරිදි කිව.

කෙළෙඹියා එපවත් අසා ශොකයෙන් හඬා වැලපැ සිටා නන්ගේ දියනියන් සනහා පියා ගෙට කැඳවා ගෙණැ ගොසින් දූ තනතුරෙහි තැබිය. හෝ නොමෝ දන්හල 2 අරගල අසා කෙළෙඹියන්ට "මේ අරගල සන්සිඳුවා දන්දිය නොහැකි දැ"සි විචාරා නො පිළිවනැසි කී කල්හි "මම එක් උපායක් කිය මි"සි කියා මේ දන්හල එකක්හු වැදැ එකක්හු නැඟි යන පරිද් දෙන් දෙ දෙරන් කරවව. එක් දෙරකින් වත් තැනැත්තහු දන් හැරැ ගෙණැ අනික් දෙරින් නැඟි යන්නට කියව. එසේ කල්හි අරගල නො වෙසි කිව. ගේ එසේ කොටැ අරගල සන්සිදවිය.

සොසඞ සිටානෝ දන්දෙන කුටුම්බිකයා තමන් කරා ඇ කල්හි "මාගේ දානශාලාවේ අරගල නැත්තේ දන් නැති හෙයින්දැ සි" විචාළහ. ඔහු විසින් **සඳ්ධකිස සිටානන්ගේ** දියනියන්ගේ පවත් කී කල්හි එසේවුව මාගේ ශාළිනුවන්ගේ දුවනියෝ වෙත්දැ සි ගෙන්වා පන්සියක් පරිවාර සත්‍රින් දී තමන්ට දූ කොටැ වැඩුහ. හෝ **සාමාවති** නමින් ප්‍රසිඩ වුව. එක් දවසක් නුවරැ උතසවයක් කෙළනට සැසි කියා ඔ පන්සියයක් පරිවාර සත්‍රින් ගෙණැ රාජ'ඩහණයෙන් නික්මුනාහ. රජ්ජුරුවෝ පරිවාර සත්‍රින් හා **සාමාවතින්** දැකැ උපන්නාවූ සෙනහ ඇතිවැ **සොසඞ සිටානන්ගේ** දියනියෝය යනු අසා සිටා නන්ට තමන්ගේ දියනියන් අපගේ අන්තඃපුරයට එවන්නේ යසි කියා යැවූහ.

---

1 දන් විඛාන කරණ. 2 අගිල.

සිටානෝ "අපගේ දරුවන්ට රාජ කුලයෙහි විසීමෙන් දුක් වෙයි" එහෙයින් නො දෙම්හ යි කීහ. රජ්ජුරුවෝ එපවත් අසා කිපි සිටානන්ගේ ගෙහි අස් ඔබ්බා සිටානන් හා ඇඹෙනියන් මතු පිටත් කළහ. **සාමාවති** අවුත් එපවත් අසා අජ්ජුරුවන් කී බස් නො ගිවිස්නේ නපුර. මා හා මාගේ පරිවාර හා රජ්ජුරුවන්ට දුන මැනවැ යි කීහ. සිටානෝ නොප ගිවිස් සහොත් කරම්හ යි ගිවිස්සහ. රජ්ජුරුවන්ට එපවත් කියා යැවූහ. රජ්ජුරුවෝ යහපතැ යි **සාමාවතින්** පරිවාර සත්රින් පන්සියයක් දෙනා හා ගෙන්වා **සාමාවතින්** අභිෂෙක කොටැ තමන්ට **අඟමෙහෙසුන්** තැන්හි තුබූහ.

මෙසේ මවු පියන් ආදී සැම දෙනා ම නට කල්හි **ද කුසල්** ඇත්තවුන් තමන්ගේ කුසලින් ගැළවී සම්පත් ලද පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් උපන්නාවූ සියලු සත්ත්වයන්ට සියලු සම්පත්තියට ධම්මය මුත් අනික් 1 කාරණයෙක් නැතැ යි දැනැ මෙම ධර්මය ම රැස්කොටැ සියලු ලොවට රක්ෂා සථානවූ ධම්ම ය ම **සරණ** යෙමි යි **දහම් සරණ සා සුතු.**

මෙසේ සාමාවතින් හිඳුවූ **උදෙන රජ්ජුරුවන්ගේ වාසුල දත්තා** නම් අනික් දේවී කෙණෙකුන් ඇත. ඒ දේවී **උදෙනි යෙහි චණ්ඩ ප්‍රජ්ජොත්තන රජ්ජුරුවන්ගේ** දියනියෝය. ඔවුන් **උදෙන රජ්ජුරුවන්ම** අඹුවූ පරිදි කෙසේද? යත්:-

උදෙනියෙහි චණ්ඩ ප්‍රජ්ජොත්තන රජ්ජුරුවෝ එක් දවසක් උයන්හි සිටැ එන්නාහු තමන්ගේ සම්පත්තිය බලා මනුෂ්‍ය ලොකයෙහි අනික් කිසිවක්හට මෙබඳු සම්පත්තියෙක් ඇද්දැයි කියා විචාරා අමාත්‍යයන් විසින් මේත් කවර සම්පත්තියෙක් ද? කොසඹෑ නුවරැ උදෙනි නම් රජ්ජුරුවන්ගේ සම්පත්තිය මෙයට වඩා ශතසහස්‍ර ගුණයෙන් අධිකය යි කී කල්හි එසේ වුව හොත් ඔහු ගන්ම් යි කීහ. දේවයිනි! ඔවුන් ගන්ට නොපිළිවන. ඒ රජ්ජුරුවෝ **භද්‍රවති ක්‍රාන්ත**[1] නම් ශිල්පයක් දනිති. මන්ත්‍රය පිරිවහා විණව 2 ගහා නො කැමැති ඇත් කෙණෙකුන් ලුහුබදවා පියවා පියනි කැමැති ඇත් කෙණෙකුන් අල්වා ගණිති.

ඉදින් ඒ රජ්ජුරුවන් සාඩන්නා කැමැති වුවහොත් දන්ඩෙන් ඇතෙකු ඉදි කොටැ ඒ රජ්ජුරුවන්ට ආසන්න සථානයෙහි සිටුවුව මැනව. ඒ රජ්ජුරුවෝ හසති වාහනයෙක

---

1 සරණෙක්. 2 ගසා.

අශ්ව වාහනයෙක නම ඇසූකල දුරටත් ගොසින් ගණිති. එසේ දුරට ගිය කල්හි ඒ රජ්ජුරුවන් අල්වා ගත හැකැ සි සිහ. චණ්ඩප්‍රජ්‍යෝත රජ්ජුරුවෝ මේ යහපත් උපායෙකැ සි දණ්ඩෙන් ඇතෙකු ඉදිකරවා සිතියම් කරවා ඇතු කුසැ මිනිසුන් සැවදෙනකු සක්මන් කරණ පරිද්දෙන් සලසා රජ්ජුරුවන්ගේ විජිතයට ආසන්නා ස්ථානයෙහි හැරී පූහ. හසති ලණ්ඩ ද ඒ ඒ ස්ථානයෙහි රැස් කර වූහ. ඉක්බිති එක් වැද්දෙක් ඒ ඇතු දැකැ මේ ඇත් අපගේ උදෙන රජ්ජුරුවන්ට සුදුසු ය සි හසති නුගේ රූප සම්පන්නි රජ්ජුරුවන්ට හොස් කිය. රජ්ජුරුවෝ ඔනු ලවා ම මඟ පාවා ගෙණැ ඇතකු නැඟි සහපිරිවරින් නික්මුනාහ.

චණ්ඩ ප්‍රජ්‍යෝතයෝ ද උදෙන රජ්ජුරුවන් නික්මුනු බව අසා තුමූ ම නික්මැ මධ්‍යයෙහි මඟ සිස් කොටැ දෙ දිසාවෙහි සෙනඟ සිටුවා ලූහ. උදෙන රජ්ජුරුවෝ චණ්ඩ ප්‍රජ්‍යෝත රජ්ජුරුවන් ආ බව නො දැනැ ඇතු ලුහුබඳවා ගත්හ. ඇතු ලෙහි සිටි මනුෂ්‍යයෝ යන්ත්‍රයෙන් ඇතු හැරී ගෙණැ දුවන්නට පටන් ගත්හ. රජ්ජුරුවෝ මන්ත්‍රය මතුටැ විණැව ගසා ද ඇතු රඳවා ගත නො හී අසකු නැඟි ඇතු ලුහුබඳවා ගන්ට වන්හ. රජ්ජුරුවන් යුහුමැ දිවගත. සෙනාව පසුව ගියහ. එසමයෙහි දෙපාශ්වයෙහි සිටි චණ්ඩ ප්‍රජ්‍යෝත රජ්ජුරුවන්ගේ සෙනාව උදෙන රජ්ජුරුවන් මැද්ද කොටැ අල්වා ගෙණැ නමන්ගේ රජ්ජුරුවන්ට පාවා දුන්හ.

උදෙන රජ්ජුරුවන්ගේ සෙනාව ද රජ්ජුරුවන් සතුරන්ට හසු වූ බව දැනැ එතැන්හි ම කඳවුරු බැඳැ උන්හ. චණ්ඩ ප්‍රජ්‍යෝතයෝ ද උදෙන රජ්ජුරුවන් ජීවග්‍රාහ කොටැ ගත්වා එක් දග ගෙයෙක්හි ලවා ලා තුන් දවසක් මුළුල්ලෙහි ජය පානය බොන්නට පටන් ගත්හ. උදෙන රජ්ජුරුවෝ තුන් වන දවස් තොපගේ රජ්ජුරුවෝ කුමක් කෙරෙත්ද සි රැකවල් සිටි පුරුෂයන් විචාරා සතුරු රජ්ජුරුවන් ගත්මි සි මදයෙන් ජය පානය බොනි යනු අසා "තොපගේ රජ්ජුරුවන් කරන්නේ ගැහැණුන් විසිනුත් නො කළමනා දෙයෙක. සතුරන් අල්වා ගත් කලැ මරා හෝ නො පියා හැරී හෝ උන් දුක් පත් කොටැ හිඳුවා කුමන ජයපානයක් බොන්නේය" සි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ උදෙන රජ්ජුරුවන් හුන් තැනට අවුත් එසේ කීයේ සැබෑදැ යි විචාරා "සැබවි. මහරජ!" යි කී කල්හි එසේ වුවහොත් තොප හරුම්හ තොප දන්නා මන්ත්‍රය අප උගන්වව යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ මන්ත්‍රය උගන්නා පරිද්දෙන් උගණුත් හොත් දෙම්. උගන්නා කල වැන්ද මැනවැ යි කීහ. ඒ අසා චණ්ඩ ප්‍රජෝතන රජ්ජුරුවෝ මන්ත්‍රයක් පිණිස මම තොප වඳිම් ද? මන්ත්‍රය නො උගන්වත් හොත් රාජාඥ කරවම් යි කීහ. ඒ අසා උදෙන රජ්ජුරුවෝ **"මාගේ ශරීරයට තොපගේ ආඥාව ලබන්නා බව මුත් සිතට නොවැටෙන්නේ වේදැ යි"** කැමැති, ආඥාවක් කරනුත් නො වදනා කෙණෙකුන්ට මන්ත්‍රය නො උගන්වම් යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ මේ මන්ත්‍රය කෙසේ උගණිම්දෝ හෝ යි සිතා මේ මන්ත්‍රය අනුන් උගන්නා බව සුදුසු නො වෙයි මාගේ දියණියන් **වාසුලදත්තාවන්** උගන්නා ගෙණැ උන් අතින් මම උගන්මි යි සිතා රජ්ජුරුවන්ට අපගේ ගෙහි කුදක් ඇත. ඈ කඩතුරාවෙන් මූවාවේ සිටුවාලා උගන්වව යි කීහ. රජ්ජුරුවෝ කුදක වුව මැනව, පිළෙක වුව මැනව, මා වදනා කෙණෙකුන්ට දෙම් යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ දියණියන් **වාසුලදත්තාවන්** හුන් තැනට ගොස් 1 පුතඬ! ශෛවන කුෂට ඇති එකෙක් අනඬි මන්ත්‍රයක් දනී. නෙපි කඩතුරාවෙන් පිටත සිටැ ඒ මන්ත්‍රය ඉගෙණැ ගණුව යි කීහ. මෙසේ රජ්ජුරුවෝ ඔවුනොවුන් කෙරෙහි අනුරාගයක් 2 කෙරෙති කියා වළහා කඩතුරාවක් අදවා දියණියන් කඩතුරා මූවායෙහි හිඳුවා මන්ත්‍රය උගන්වති.

මෙසේ කිප දවසක් ගිය කල්හි **උදෙන රජ්ජුරුවෝ වාසුලදත්තාවන්** මන්ත්‍රය වරදවා කියන්නා හා දුෂටවූ කුද! තිගේ තොල හා දිව් බොල්වැ ගියේ ද? දවස් පතා කියවාත් මන්ත්‍රය වරදවා කියනු යි කීහ. ඒ අසා බිසවු කිපී ශෛවන කුෂටය, කුමක් ද? තා කියන්නේය! අප සේ වූවොත් කුදුන් කෙරෙහි ඇතුළත්හු දැයි කඩතුරාව ඔසවා පියා ඔවුනොවුන් බලා ඔවුනොවුන්ගේ සැරුප විචාරා දැනැ රජ්ජුරුවෝ වළහා කී වන්හ යි නිශ්චය කොටැ ඔවුනොවුන් කෙරෙහි අනුරාග ඇතිවැ ජවනිකාව අතුරෙහි දී ම ඔවුනොවුන් හා සෘඬාර රසානුභව කළහ. එතැන් පටන් ගෙණැ මන්ත්‍ර ඉගෙණීම් නම් දෙයෙක් නැති විය.

---

1 පුත. 2 කෙරෙති ඕතා.

චණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ ද පුත! මන්ත්‍රය උගතුදැ සි විචාරා උගන්මින් සිටියෙම් සි කී කල්හි උගන්වා සි බුවෙන් නොබැණැ හිඳිනාහ. එක් දවසක් උදෙන රජ්ජුරුවෝ වාසුල දත්තාවන්ට "හද්‍රාව, ගැහැණුන්ට සැමියන් කරණ උපකාර මවු පියෝ ද කුසෙහි ඔත්තෝ ද දහස් ගණනුදු කොටැ ගත නොහෙති. ඉඳින් මට මාගේ ජීවිතය ගළවා දුනු නම් මාගේ අන්තඃ පුර පන්සියයට තොප ප්‍රධාන කොටැ අග මෙහෙසුන් කෙරෙමි සි"කිහ්. ඒ අසා බිසවු මහරජ! මම තොප ගළවම්. තොප වූ කලි තොප කී බිස සථිර කරව සි කියා පියානන් කරා ගොස් වැඳලා සිටියහ.

මන්ත්‍රය උගණුදැ සි කී කල්හි උගන්මි, ඒ මන්ත්‍රයට උප චාර පිණිස තරු සලකුණෙන් ගන්නා එක් ඖෂධයෙක් ඇත්ල. ඖෂධය හැරැ ගන්නට යන වේලෙහි නැගෙන්නා අසකු දෙවුව මැනව. කැමැති දෙරකින් යන වේලෙහි නොවළකන පරිද්දෙනුත් සම්මත කරවා වදාළ මැනවැ සි කිහ. ඒ අසා රජ්ජුරුවෝ මන්ත්‍ර ලොභයෙන් යහපතැ සි කියා ගිවිස් සාහ. රජ්ජුරුවන්ගේ ද එක් දවසකට පණස් යොදනක් තැන් යන්නාවූ භද්‍රවති නම් ඇතින්න්ක, සැට යොදනක් තැන් යන්නාවූ භාභ නම් අසෙක. 1 නෙලකණ්ඩිය 2 මුදුකෙසිය යන අශ්වයෝ දෙදෙනෙක් යොදුන් සියක් යන්නාහ. නාලාගිරි නම් ඇතෙක් 3 යොදුන් එකසිය විස්සක් යන්නේය. මෙසේ පස්වාහනයෙක් ඇතිවිය.

හෙද රජ්ජුරුවන් ගිය ජාතියෙහි වේලා ආසන්නවැ ගිය කල්හි පසේ බුදුන් වහන්සේ කෙණෙකුන්දුට බත් පාත්‍රයක් හැරැ ගෙණැ යුහුව දිවැ ගෙණැ ගොස් පිළිගැන්වූ කුසලින් ඇතිවිය. ඉක්බිති එක් දවසක් ඒ චණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ උයන් කෙළියට යයි නික්මුනාහ. උදෙන රජ්ජුරුවෝ අද පලා ගිය මැනවැ සි සිතා භද්‍රවති නම් ඇතින්න පිටට පැනැ නැඟිලා බිසවුනුදු ඇතින්න පිටැ නඟා ගෙණැ සම් පසිම්බියෙහි මසුරන් පුරා එම ඇතින්න පිටැ නඟා ගෙණැ නික්මැ ගත්හ. චණ්ඩ ප්‍රජ්‍යොත රජ්ජුරුවෝ ද එපවත් අසා පස්සෙහි පිරිස් මෙහෙයූහ. රජ්ජුරුවෝ ද පිරිස් එන්නා දැකැ ඇතින්න

1 චෙලකංසි. ඔ. අ.ක. 2 මුඤ්ඣ කෙසිය. 3 යොදුන් සියයක්

පිටැ නුබු පසිම්බිය උනා හෙළා සුහ. සෙනාව ඛන ලොහ යෙන් රන් ගණුම්හ යි හැවිලිය දී රජ්ජුරුවෝ තමන්ගේ සෙනාව හුන් තැනට ගොස් වැඳ ගියහ. ඉක්බිති සෙනාව රජ්ජුරුවන් වඩා නුවරට ගෙණැ ගියහ. රජ්ජුරුවෝ ද නුවර වැඳ තමන් කි පරිද්දෙන් ම **වාසුල දත්තාවන්** අග මෙහෙසුන් කොටැ රාජ්‍යය කරන්නාහ.

මෙසේ කුසල් කළවුන්ට කිසි විපත්තියක් වුව ද ඒ දුරු වන බව ඇසූ සත්පුරුෂයන් විසින් ධම්මය ම සරණ කොටැ සියලු සංසාර ව්‍යසනයෙන් ගැලවෙම්හ යි සිතා **ධම්මය ම සරණ යා යුතු.**

තවද, අනික් **මාඝඤ්ඣි** නම් එකක් රජ්ජුරුවන් සමීප යෙන් අග මෙහෙසුන් තැන් ලදහ.

හේ කෙසේද? යත්:–

හෝ තොමෝ **කුරුරම මාඝඤ්ඣිය** නම් බමුණකුගේ දුවක. ඇගේ මවු මාඝඤ්ඣි නම. පිළි පියෙ ද මාඝඤ්ඣිය නම. ඒ මාඝඤ්ඣි නම් බ්‍රාහ්මණී තොමෝ අධිකවූ රූප ඇත්තිය. දිව්‍ය ඛනාවක් සේ මනොහරය. ඇගේ පියේ තමාගේ දුවට සුදුසු සැමි කෙණෙකුන් නො දක්නේ බොහෝ ඛන ඇති මහා පරිවාර කුලෙන් තමා දුව හිදුවම්හ යි වතීනා කළ ද නෙපි මාගේ දුවට නුසුදුස්සව යි පරිහව බැණැ යවති.

මෙසේ කල්හිය කල්හි සතර අපායෙහි අකුලු හෙළිං සදෙව් ලොවට අගුල් හළ බඹ ලොවට රජ මහවත් හැසූ නිවන් පුරය තමන් වසන විහාරය සේ මුළු ලෝවැස්සන් සුව යෙන් වදනා පරිද්දෙන් කළාවූ පිරිනිවන් පෑ පසු පස්වැදහ සක් මුළුල්ලෙහි තමන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් විසිරැ ගියැ ධාතු මරහු ඇසැ හුණු 1 දුවානල සේ සත්පුරුෂයන් ඇසට කර්පූර සලාක සේ සංසාර විෂයට අද්ද ගුළිකා සේ කළාවූ **මහා පුරුෂයාණන් වහන්සේ** ප්‍රත්‍යූෂ කාලයෙහි ම **මහා කරුණාසමාපත්තියෙන්** නැඟි ලොව බලා වදුරණ සේක් **මාඝඤ්ඣි** නම් **බ්‍රාහ්මණයා හා** අඹුවට **අනාගාමී ඵලයට** උපනිශ්‍රය දැකැ තමන් වහන්සේගේ පා සිවුරුතමන් වහන්සේ ම හැරැ ගෙණැ **මාඝඤ්ඣි බ්‍රාහ්මණයා** වහනි පූජා කරණ තැනට වැඩි සේයෙක.

---

1. ගදුලසේ.

බ්‍රාහ්මණ තෙම දිව්‍ය ලොකයෙහි සපත රත්නමය වූ කලප වෘක්ෂයෙකැ පිල්මරා හෙළාහුන් ඉඳුනිල මයූරයන් දෙදෙ නෙක් සේ නීලකාන්ති නමන්නාවූ විශාලවූ ඇස් දෙකින් හොබනාවූ බ්‍රඛ්‍රිය මුළුලොවට දැනැ නාසිකා නැමැති සඛණ්ඩ සාමිහයෙහි නගා බැඳවූ ධජ පතාකා දෙකක් සේ තෙඩුනාවූ බැම සඟළින් යුකතවූ රන්ගල් අතලයෙකින් වැටී හුනුවාවූ මහා හැල්ලක් සේ නළල මැද වැටී හුනු අතිධවලවූ ඌර්ණ රොම ධාතුයෙන් මනොහරවූ ප්‍රවාල සාගරයෙහි රළින් වැසෙන සඳ මඩලක් සේ රත්වූ අධර කාන්තියින් වැසි වැසි නිබෙන්නාවූ ශ්‍රී මුඛයෙන් සියලු ලෝවැස්සන්ගේ නෙත් සිත් බදනාවූ මුහුණෙකින් හොබනාවූ පෙරවි රත් සිවුරු විදහෙණැ දුවන්නාවූ සඛණ්ඩ වණ්ඩවූ රශ්මීන් බැලූ බැලූවන්.ඇසැ 1 අමා නමන්නාවූ බුදුරැව දැකැ මේ පුරුෂ රත්නය හා සම 2 පුරුෂයෙක් නැත.

මොහු සිප ගෙණැ විදගුඩ මධුර ක්‍රීඩායෙන් රාත්‍රිය ගැවූ ගැහණිය ගැහණිය නම. මෝ හට මාගේ දුව දෙම් යි සිතා **බුදුන් වහන්සේ** කරා එළඹැ මහණ! මාගේ එක දුවක් ඇත. ඈ මම සුදුසු සැමියෙණෙක් නැති හෙයින් මෙතෙක් කල් ගෙහි ලා රැක්‍ෂා කොටැ ගෙණැ හුන්මි. දැන් නොපගේ රුව දුටු නියාවට ඕ නොපට සුදුස්සියැ. නෙපි ඇට සුදුස්සව. මම ඈ නොපට පාදපරිචාරිකා කොටැ දෙමි. මා ඈ කැඳවා ගෙණැ එනතුරු මෙතැන්හිම සිටුව යි කියා දිවැ දිවැ ගෙට ගොසින් තමාගේ අඹුවට බ්‍රාහ්මණිය! නව කුමක් කොටැ හුන් නෙහිද? නිගේ දුවට සුදුසු සමණන් කෙණෙකුන් දැකැ මග සිටුවා ලා ආමි. නිගේ දුව සරසා ගෙණැ වෙලෙව්ව එයි කියා දුව හා අඹුව කැඳවා ගෙණැ නික්මින.

බමුණු නික්මෙන්නාහා ම සියලු නුවර වැස්සෝ මේ බමුණු පෙරැ අහු, **මඝබ, කාශි, කොශල, වජ්ජි, මල්ලාදිවූ** සියලු දෙශයෙහි බොහෝ උත්තම පුරුෂයන් තමා දුව හිඳුවම් හ යි කී කල උන්ගේ රූපවූ නියා අසා මාගේ දුවට නෙපි නුසුදුස්සහ යි කියා විවාහ නො කොටැ අද තෙමේ ම මාගේ දුවට සුදුසු සමණ කෙණෙකුන් දිවිම් යි දුව කැඳවා ගෙණ එයි. ඒ කෙබඳු පුරුෂ රත්නයෙක් දෝහෝ යි බැලුව මැනවැ යි පස්සෙහි

---

1 අමා ඔවන්නාවූ. 2 පුරුෂ කෙණෙක්.

හුන්හ. එ සමයෙහි ඝොමිදරුවෝ ඌ සිටුවාලා ගිය තැනැ නො සිටැ එ තැන්හි ශ්‍රීපාදඝ ඔබාලා ඒ පියවර පැණෙන පරිද් දෙන් අධිෂ්ඨාන කොටලා ඔබ්බෙහි වැඩසිටි සෙයෙක.

බුදුන් පියවර එබූ තැන පැනෙව සි කියා අධිෂ්ඨාන කළ හොත් මුත් නො පෙනෙයි. මෙතෙක් දෙනාම පෙනෙව සි කියා අධිෂ්ඨාන කළ කලැ ඔවුන්ට මුත් සෙස්සවුන්ට ජාත්‍යන්ධ යන්ට චන්ද්‍ර මණ්ඩල සූය්‍ය මණ්ඩල නො.පැනෙන්නා සේ නො පැනෙ සි. මෙතෙක් කල් නිබෙව සි අධිෂ්ඨාන කළ කලැ සතර මහාදිව එකහෙළා මහවැසි වැසැ වතුරු හෙළා නමුදු කෙස ගක් හා තැනකට උපද්‍රවයක් නො වෙයි. මහමෙර උදුරා පියන වෙරම්බ වාතයෙනුදු ඒ පියවර එබූ තැන්හි ලෙහෙඩිත් තක සා ධූලි සුඛිත්තකුදු නො සෙල්වෙයි.

ඉක්බිති බැමිණිය බමුණට නොප දුටු තැනැත්තෝ කොයි දැයි විචාළාහ. බමුණු මෙතැන්හි ම හිටුවාලා ගියෙමි. දැන් ඔහු * එහි නැතැ සි කියා වැඩැ සිටි තැන බලන්නේ ඔබාලා වැඩි පදලණ් දැකැ මේ උන් ඔබාලා ගිය පියවරය සි ඝොමිදරුවන්ගේ පියවර පැය. බැමිණී පියවර බලා පියා නමා වෙදත්‍ර ශයෙහි ප්‍රාප්ත හෙයින් හා ලක්ෂණ මන්ත්‍ර දන්නා හෙයින් හා පියවර ලකුණු බලා "බමුණ! තෝ කුමක් කියයි ද මේ ගැණුන්ගේ තන නැමැති මස් ගඩුයෙහි තමන්ගේ ලැම්බිය පහරවා අපවිත්‍ර කරණ කෙණෙකුන් එබූ පියවරෙක් නොවෙයි මෙ දෙතිස් කුණප කොටසෙකින් යුක්තවූ ගැහැණියක. බොල් කෙල පිරුණු මුඛයෙහි තමන්ගේ මුඛය තබා කාමා'තුරවැ වෙහෙසෙන කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි.

අභිමතවූ ගැහැණියක කී සලකුණට නො අවුත් ඇ හිස තුබූ මල්දම් පිපිතොල හයා බැදුම් කා රාත්‍රිය මුළුල්ල සනාද බරින් සිස් කරණ කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි. තමාට දුර්ලභවූ ගැහැණියක නො ලදින් කාලා'නන්තර යෙකින් ඇ පියවර එබූ බිමක් ලදින් ඒ බිම රජස් හිස එව ගෙණැ සවිඤඤය ඒ බිම ගසා පෙරළෙන එකක්ඛුගේ පියවරෙක් නො වෙයි. හැම පියවර ඇත් පියවර හෙත් ම මැකෙන්නා සේ සදෙව සමාරක සබ්‍රහ්මක ලොව තමන් පසින් යට කොටැ පි කෙණෙකුන්ගේ පියවරෙක. රාගයට දුරුවූ මෙහ යට විශවූ මොහයට අදෘශ්‍ය'ක්ෂජන ගැහූ ධම්මයට කල්‍යාණ

* ඉසි.

මිත්‍ර වූ පාපයට ද්‍රෝහිවූ බුඩියට සහායවූ මෛත්‍රියට සෝමිවූ කරුණාවට කුල දෙවතාවූ, නිවණට වමත් දකුණත් හඟවා මඟ කියන ධම්මයට අග රජ කරණ අනන්තා'පරිමාණ සත්වලි විෂය ක්ෂෙත්‍ර කොටැ ඇති කෙළ ලක්ෂයක් සත්වලි ඇතැ ක්ෂෙත්‍ර කොටැ ඇති දසදහසක් සත්වලි ජනවි ක්ෂෙත්‍ර කොටැ ඇති ධම්ම චක්‍රවර්ති නෙණෙකුන්ගේ පියවරෙ කැබි කිව.

ඒ අසා බටුණ බැමිණිය! තෝ පයැ ඔත් දියෙහි කිඹුලුන් ගන්නා එකක් හිද? එසේවූ රුවක් ඇති කෙණෙක් නම් පඤ්ච කාම තබා පියා නපස් කෙරෙත් දැයි කිය. බැමිණි! තෝ කුමක් කියයි ද? **මහා සුරාඝෝ** මෛත්‍රිය කරුණාය මුදිතාය උපෙක්ෂාය ඇති අඹුවන් සතරදෙනා හැර පස්වන අඹුවක නිදුවන එකෙක් නො වෙයි කිව. බමුණු ඒ අසා ඇත් මෑත් බලනුයේ ඇලවැ ලා මුළුලොව අළලා සලාගත් අමා පිඬක් සේ වැඩ සිටි බුදුන් වහන්සේ දැකැ * "අර! මූය, මා කී තැනත් තෝ ය" යි ගොස් නොපට අඹුකමට මඳුව ගෙණ මියි කිය.

සෝමිදරුවෝ එබස් අසා නාගේ දුව විසින් අපට ප්‍රයෝ ජනයෙක් නැත. ඇත. යන දෙකම නො වදුරා බමුණ! තට එකක් කියම්හ. සඳ නැගෙණ සාගරයට දැනි මොහොරුන් ගෙන් භයක් නොවන්නා සේ **යසෝධරාවන්** වැනි අඹුවක් හා **කිඹුල්වන්** නුවරම සසරෙහි කළකිරී හයින් නො වනුම්හ. හස්ත ප්‍රාප්තවූ චක්‍රවර්ති රාජ්‍යය හැර පියා සතළිස් දහසක් අඹුවන් හුන් රාජ්‍යයෙන් මඬ්‍යම රාත්‍රියෙහි අසකු නැඟි ගෙණ දිවන්නම්හ. සැපින්නන්හු හොත් සුඛසෙක ලොහ නො කොටැ දිවන්නා සේ දිවුම්හ. සහවුරුද්දක් අප පස්සෙහි ඡායාවක් සේ ඇවිදින මරහු අපගේ කාමවිතර්කයකුදු සොයා ගත නො හියමැ යි කියා කැහැල මල් රැකැ ගෙණැ හුන් කැණහිලකු සේ සිටැ වෙහෙසවැ නැඟි පියා හියේ.

සහවුරුද්දක් මහා වියඹ කොටැ අනන්තයෙහි **වජ්‍රාසනයට** නැඟී මාර පරාජය කොටැ වාපොළොවෙහි පටන් අකණිට්ඨ බඹලොව දක්වා දසදහසක් සත්වලි මදයෙන් සලන්නාවූ ඇතක්හු පිටට නැඟි රා බී මත් ආරොහකයකු සේ සලා පියා බුදුවුම්හ. අනන්තයෙහි පියාට වූ පරිහව පසිදු වම්හ යි කියා ආවාවූ මරහුගේ දුවු **නෘත්‍යාය, අරතිය, රාගාය** යන දිව්‍යස්ත්‍රීන් හුන් දෙනාගේ එවෙනි හුන් මුහුණට අනිත්‍යය, දුඃඛය

* ඉර,

අනාතමය, යන තුන් ලකුණ ම යෙදූ බවමුත් රාගයක් නොයෙදූ වම්හ. ඇසක් බලා ලොභ කරන්නමෝ නම් මුළු ලෝ වැස්සාගේ සිත් තමා කරා වදනට අඩවාලූ කොවැ තුබූ ඉදුනිල් මිණි කවුළු සේ ඒ ඇසෙහි ලොභ නොකරමෝ ද?

බැමයෙක ලොභ 1 කරමෝ නම් නිලිපුල් මල්හි මිහි බිමත්වැ රොද බැඳැගෙණැ හොත්තාවූ බමර වැල දෙකක් සේ ඒ ඇස ඇලයෙහි චිත්‍ර විත්‍යාසයෙන් තුබූ බැමසහළෙහි ලොභ නොකරමෝ ද? කන් වැලෙක්හි ලොභ 1 කරමෝ නම් එය වස වහිනි මාරයා මුළුලොව බඳන්නට හෙළි කනක පාස දෙකක් බඳුවූ එකන් වැලැ ලොභ නොකරමෝ ද? අධරයෙක්හි ලොභ 1 කරමෝ නම් ඒ රූප නැමැති සාගරයෙහි ලසඳවැ හටගත් තාවූ පබළු දළුවක් බඳුවූ ඒ අධරයෙහි ලොභ නොකරමෝ ද? සවෙනි දිව්‍ය ලොකයෙහි මාර සත්‍රුන් මවන රූවක් වූව. ඒත් අප වැනි කෙණෙකුන් 2 බදන්නට යැයි මවන රූවක් වූව. එබඳුවූ වලැ එබඳුවූ රහසැ එබඳුවූ රැයෙකැ. එබඳු ලසඳ පහ නෙක. ඔවුන් දැකැ අමුසොහොණට දමා ලූ මිනීකුණු තුණක් කොටැ සිතා අවුත් දැන් තාගේ දුවය යි කී අශුචි හා මුත්‍ර පිරූ බදුනෙහි ලොභ කරමෝ ද? ඒ එසේවූ කුණක් සිප ගන්නා තබා අප පය පහරුත් කැන ඇත්තම්හ යි වදාළ සෙයෙක.

බණ වදුරත් වදුරත් බමුණ හා අඹුව හා දෙන්න **අනාගාමි** වූහ. බමුණගේ දූ **බුදුන්** වදුරණ බස් අසා "නොකැ මැනි කල නොහින්ද වම් යි නො කියා අපිස්කම්[1] පානේ අප වැන්නන්ට ද? අසුචි බඳනක් කොටැ බෙණෙත් ද? මට සුදුසු සැමියකු කෙරේ හුන බිණු පරිහවයට සුදුසු වෙර පහකොටැ ගන්නෙමි වේදැ යි" **සමාමදරුවන්** කෙරෙහි වෛර බඳ. මවු පිය දෙදෙන ඇ ගෙණැ ගොසින් 3 සුළු පියාට පාවාදී 4 බුදු සස්නට වැදූ මහණවැ **රහන්වූහ.** සිලිපියේ මැ **කොසඹැ නුවරට** ගෙණැ ගොසින් **උදෙන රජ්ජුරුවන්ට** පාවාදින. **උදෙන රජ්ජුරුවෝ** ද මැගේ රූප සම්පත්හි බලා උපන්නාවූ සෙනහයෙන් අභිෂෙක කොටැ පන්සියයක් ගැහණුන් පරිවාර කොටැ දී අග මෙහෙසුන් තැනැ තිබ්බිය.

---

1 නොකර මෝනම්. 2 දනන්නට යයි. 3 සිළුපියාට.
4 බුදුගස්නෙහි පැවිදිවැ.

එසමයෙහි ඝොසඝ සිටානෝය, කුක්කුට සිටානෝය, පාවාරිය සිටානෝය යි ඝොසඛෑ නුවර සිටුවරු තුන්දෙනෙක් ඇත. ඔහු වස් වසන කල ආසන්නාවූ කල්හි පන්සියක් තාපසයන් හිමාලය වනයෙන් බැසැ නුවර පිඬු සිහා ඇවිදින්නවුන් දැකැ පැහදූ වළඳවා සාරමස වස් වස්වා වස් අන්තයෙහි නැවත වස් වසන සමයෙහි එන පිණිස ප්‍රතිඥ කරවා නහා ඇවූහ. එතැන් පවන් අටමසක් හිමාලයයෙහි වැසැ සාරමසක් ඔවුන් සම්පයෙහි වෙසෙති.

ඔහු එසේ කල්යාමකින් හිමාලයයෙන් එන්නාහු අතර මහැ මහනුග ගසක් මුල හුන්හ. එහි වැඩි මහළු තාපසයෝ මේ සා නුගගස මහෙශාක්‍ය දෙවතාවකු වූව මැනවැ යි. ඔහු අප වළඳන පැනක් දුනහොත් යහපතැ යි සිතූහ. දෙවතාවා තාපසවරුන් පැන් වැළඳවිය. නැවත නහන පැන් දුනහොත් යහපතැ යි සිතූහ. දෙවතාවා නහන පැහුදු එළවිය. ඉක්බිති වළඳන ආහාරයක් දුනහොත් යහපතැ යි සිතූහ. දෙවතාවා ආහාර එළවිය. ඉක්බිති තාපසයෝ මේ දෙවතාවා අප සිතූ යමක් ම දෙයි ඔහු දුටුමෝ නම් යහපතැ යි සිතූහ.

ඉක්බිති වෘෂ දෙවතාවා ගස කඳ පළා ගෙණැ තමාගේ දිව්‍ය වෙශය දැක්විය. තාපසයෝ තාගේ සම්පත්තිය ඉතාම යහපත. කවර කුශලයක් කෙළෙහිදැ යි විචාළහ. හෙතෙම තමා කළ කුසල් මදහෙයින් කියන්නට මැලි මැලිවැ නැවත නැවත තාපසයන් විචාළ කල්හි ගිය ජාතියෙහි අනේපිඬු මහාසිටානන්ට ගැතිවැ එකරැයක්වූ පෙහෙයෙන් මියැ අඩාල පෙහෙයෙහි අනුසසින් තමා වෘෂ දෙවතාවැ උපන් බව කියා මා වහල්වූ අනේපිඬු මහ සිටානෝ බුධරතනය ධම්මරතනය සඞ්ඝරතනය යන තුණුරුවන්හි මමත්ව ඇත්තාහ යි කීය.

තාපසවරු එබස් අසා පෙරැ බුදුන් වහන්සේ ලොකයෙහි උපන් බව නොදනැ දුන් දෙවතාවා අතින් තුණුරුවන් නම් අසා රතනත්‍රයයෙහි භක්තින් හා ප්‍රීතින් හා ප්‍රසාදයෙන් හා පිරී ගියාවූ සිත් ඇතිවැ හැමදෙන ම දෙහොත් මුදුනෙහි තබා ගෙණැ නැඟී සිටැ දෙවතාව ! "තුණුරුවන් නමෙක් ද තා කියන්නේ" යයි කියා තුන්වටෙක්හි ම දෙවතාවා එසේය යි කී කල්හි බුධය යන ශබ්දය පොවා දුර්ලභය එසේවූවන්ගේ දැක්මෙහා බස් ඇසිමෙහැසි කියාල ඒ අති දුර්ලභය. එහෙයින්

ඒ **සුවාමිදරුවානන්** වැඩ හුන් තැනට යම්හ. යන්නමෝ ද අපට බොහෝ උපකාර කළ සිටුවරුන් තුන්දෙනාගේ ගෙට වැද ආහාර වළඳාගෙණැ යම්හ යි කියා ඔවුන් කරා වැද ආහාර වළඳා අපි යම්හ යි කියා වස් වසන කලවුව කෙදුව වඩනේ යයි සිටුවරුන් කී කල්හි **"තුණුරුවන් ලොකයෙහි පහළවිය. ඔබ යම්හ"** යි කිහ.

එසේවුවහොත් ඇපිත් කටයුතු කොටැ ගෙණැ එම්හ යි කී කල්හි තොප කටයුතු කරණ කලින් අපට කල්යෙයි. තෙපි තොප කළමනා කටයුතු කොටැ ගෙණැ පසුවැ එව්. අපි පළවූ ගොස් අපගේ **සුවාමිදරුවන්** දකුම්හ යි පළවූකොටැ ගොස් සවීඥයන් වහන්සේ දැකැ මහා ප්‍රසාදයෙන් සතුති කොටැ කන් නිවා සිත් නිවා බණ අසා හුනස්නෙහි ම හිඳැ සිවු පිළිසිඹියා පත් රහත්වැ එහි භික්ෂුභාවයෙන් මහණවැ බුඬ **ශාසනය** බබුලුවා විසූ සෙයෙක.

මෙසේ ශ්‍රඬාසම්පන්නවූ මහා පුරුෂයන් කණ හුණු කෙණෙහිම අමා මහනිවන් සාධා දෙන්නාවූ ධම්මරත්නය සරණ යෙමි යි **දහම් සරණ** යා සුතු.

ඉක්බිති **කොසඹෑ** නුවර සිටුවරු තුන්දෙන ද පන්සියක් පන්සියක් ගැලින් නොයෙක් දුනෝ'පකරණ නහා ගෙණැ **සැවැත් නුවරම** අවුත් **සුවාමිදරුවන්ගේ** ශ්‍රීපාද දැකැ මධුර්වූ ධම්ම කථා අසා තුන්දෙන ම **සෝවන් ඵලයෙහි** පිහිටා අඞී මාසයක් දන් දී **සවීඥයන් වහන්සේ කොසඹෑ** නුවරට වඩනට ආරාධනා කොටැ **සුවාමිදරුවන්** විසින් **"සවීඥයෝ ශූන්‍යාගාරයෙහි ඇලෙති"** යි වදුළ කල්හි "සුවාමිනි! වදුළ අභිප්‍රාය හැඟිණ. වඩනට ආරාධනා කොටැ එවූ කල වැඩිය මැනවැයි සැලකොටැ **කොසඹෑ** නුවරට ගොස් **ඝොසඝ සිටානෝ ඝොසඝාරාමය** කැරැවූහ. **කුක්කුට සිටානෝ කුක්කුටාරාමය** කැරැවූහ. **පාවාරික සිටානෝ පාවාරිකාරාමය** කැරැවූහ. මෙසේ තුන්දෙන තුන් විහාරයක් කරවා **සුවාමිදරුවන්** වඩනට හසුන් යැවූහ. **සුවාමිදරුවෝ** ද සානුව කරුණයෙන් **සැවැත් නුවර** සිටැ **කොසඹෑ නුවරම** වැඩි සෙයෙක.

ඉක්බිති සිටුවරු තුන්දෙන ම බුදුන් වැඩි පවත් අසා මහා පූජා කෙරෙමින් පෙර ගමන් කොටැ විහාරයට වඩා ගෙණැ ගොස් මුරයෙන් මුරයෙහි **සුවාමිදරුවන්ට** උපස්ථාන කෙරෙති.

සතළව කරුණාශයන් නෙත්වූ ලය ඇති. සුමිදරුවෝ එකෙ කී දවස් එකෙනී දෙනාගේ විහාරයෙහි වයන සෙයෙක. මෙසේ කල් යන කල්හි ඒ සිටුවරුන් තුන්දෙනා නිසා වසන් නාවූ සුමන නම් මාලාකාරයෙක් සිටුවරුන් කරා එළඹැ සුවා මිනි! මම බොහෝ කලක් නුඹ තුන්දෙනා වහන්සේට උප සථාන කොටැ සිටියෙමි. මට ඊට සුදුසු අනික් ප්‍රත්‍යුපකාර යෙක් නොකළ මැනව. එක් දවසක් වළඳන පරිද්දෙන් බුදුන් වහන්සේ මට හළ මැනවැ යි කියා. සිටුවරනු ඔහුගේ බස් ගිවිස්සහ.

හෙතෙම සර්‍වඥයන් වහන්සේ පවරා දුනෝ'පකරණ සැප විය. එ සමයෙහි උදෙනි රජ්ජුරුවෝ දවස් පතා සාමාවතින් පලඳනට මල් ගන්නා පිණිස අට මස්සක් තබා දෙන්නාහ. ඒ රන් ගෙණැ සාමාවතින්ගේ බුජ්ජුත්තරා නම් මිඩියක් දවස් පතා මල් ගෙණවුත් සාමාවතින්ට දෙයි. එ දවසැ සුමන මාලාකාර නෙම සාමාවතින් කෙරෙහි සිටැ මල් ගන්නට ආවාවූ බුජ්ජුත්තරාව දැකැ "අද මම් ගෞතම නොත්‍රයෙහි උපන් සර්‍වඥයන් වහන්සේ දන් දී වැළඳූ අන්නයෙහි සුවද මලින් සර්‍වඥයන් වහන්සේට පූජා කෙරෙම්. තෝ සිටැ වළඳ වන තැනැ කටයුතු කොටැ ඉනිරි මලක් ඇත 1 අන්නයෙහි ගෙණැ යා යි කියා.

හෝ තොමෝ එබස් අසා ගිවිස්සාහ. සුමන මාලාකාර නෙම බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේ වළඳවා අනුමෙවෙනි බණ වදාරණ පිණිස පාත්‍රය ගෙණැ සිටියේ. ඒ වේලෙහි ඛණ්ඩ චක්‍රවර්ත්තිවූ සුමිදරුවන් වහන්සේ මධුර සවරයෙන් නානා නය මනොහරවූ ධම්මදෙසනා කරන්නට පටන් ගෙණැ වදාළ සෙයෙක. බුජ්ජුත්තරා නොමෝ බණ අසා සිටිවිට ම දහසක් නයින් හෙබියාවූ සෝවන් ඵලයෙහි පිහිටා අමා මහ නිවන්රස විඳැ සෙසු දවස් අටමස්සෙන් සතර මස්සක් සඟවා ගෙණැ සතර මස්සෙක මල් ගෙණැ යන්නී. එදවස් සොරසිත් සහ මුල්වැ උපුළ හෙයින් අටමස්සෙහි ම මල් ගෙණැ ගියා.

සාමාවති මල් බොහෝ වා දැකැ හැයි? දෙවයෝ අපට මල් මිළ බොහෝ කොටැ දුන්නුදැයි විචාළා. ඉක්බිති බුජ්ජුත්තරා නොම සවාමි දියනි! මම 2 මෙනෙක් දවස් මලට ගෙණැ

1. පස්සෙහි. 2. මෙවක්.

ඝන අව මස්සෙන් සතර මස්සක් සොරා ඇරැගෙණැ සතර මස්සෙක මල් ගෙණෙමි. අද මා මල් ගෙණෙන්නට ගිය මාලාකාරීන්ගේ ගෙයි පන්සියක් පරිවාර හැරැ ගෙණ වැළඳුරන්වන් සඟමිදරුවාන කෙණෙක් තුන්ලොවට එකහෙළා පලදවාලූ නිලකඵක් වැන්නහ. මුළුලෝ වැස්සන් එක්වැ එක්කෙණෙකුන් බැලූ කෙණෙක් අනික් කෙණෙකුන් නොබලා දිවි පමණින් බල තෝනිනිදු බලා නිමවා පිය නොහැකි රූ ඇත්තාහ.

එක් ලඝු අට සැව දහසක් යොදුන් මහමෙර මුරුත මල් කැලයෙකින් වසාලූවා සේ එවැනි රන්වන් ශරීරය 1 රත් සිවු රෙකින් වසා පෙරවැහැත්හ. පබළු සයුරෙහි ඉඳුනිල මණි වළඹුවූ සලා වැටුමක් සේ සිවුරු හස්සෙන් මිණි නිල්වන් පාත්‍රයක් ධරුහ. සිසි නොබෙණෙති.* රැහැණි රැහැණිවැ නොබෙණෙති. ඇත මැත බල බලා නොබෙණෙති. අහර ගෙණෙන්නට යන්නවුන් එන පෙරමඟ නොබලති. පාත්‍රයෙන් පිටත ඇස නොහෙළති. අපගේ ගෙයි දන් කා ඝන බමුණන් ලාලා ලූ මාළුවට ලාලා ලූ බත් සැන්දට කරණ කයිවාරු සේ බත් මාලුවෙහි කරණ 2 වණිනා නැත්තාහ.

අතින් හැරැගත් පිඬින් එක හුලකුත් පාත්‍රයෙහි නොහෙළා පිඬ් කෙරෙති. ශ්‍රීමුඛය පිටින් එක හුලකුදු පිටත් කොටැ නොහෙළති. දෙ තොලෙහි ඇලෙන දෙයෙක. දෙ තොලින් පිටත් වන දෙයෙක. දත ඇලී ගන්නා දෙයෙක යන නම් නැත. හිඳැ වළඳූ. වැළඳූ පාත්‍රය තුබූම සෝඛා. වැළඳූ ඉක්බිත්තෙහි බණකට පටන් 3 ගත්හ. මෙලොවින් පරලොවින් නො පැ දෙයෙක් නැත. ව්‍යවහාරයෙන් පරමාර්ථයෙන් වැළහූ දෙයෙක් නැත. 4 මී පුයෙන් අව කෙණෙක් සේ එ ගෙට 5 වනු වනුවෝ ධර්ම රසයෙන් මත්වැ නටමින් සිටියහ. කිරි බොන බාලයෝ චතුර්භේදයෙහි පාරප්‍රාප්තයන් සේ අර්ථ රස විඳිමින් හොත්හ. එ ගෙයි මියන් කැරපියන් මැස්සන් කිඹිකුහුඹුවන් දක්වා හැම ඔවුන් ම රස දන්නා බණ පිරිස්වැ ගියහ.

---

1 රත්. 2 කයිවාරු. 3 ගත්නුව. 4 මී පුයෙන් අවනත සෙයින්. 5 වතු වන්නන්. * රැහණි-රැහණිවැ.

මම ද ඔවුන්ගේ බණ අසා අමා මහ නිවන් රස වැළඳිමි. පණිවායට අහස් පොළෝ සේ දුරුවිමි. මාගේ දිවි මා ම හැරී ගන්නට නො සිතන්නා සේ අනුන් සතු වයතුවක් හැරී ගන්නට නො සිතන්නවුන් කෙරෙහි ඇතුළත්විමි. මේ සංසාර හසර පසිඳා මුසවා වට වස දී ලීමි. සුරාපානයට මාගේ මුඛය අදෘශ්‍ය කෙළෙමි. පෙර කළ සොරකමට ක්ෂමාකළ මැනව. අද අවමස්සෙහි, ම මල් නො වළහා ගෙණම් සි කිව. ඒ අසා **ඝාමාවතී** ප්‍රිනින් පිනා ගොස් "පුත! නී පූ **අමෘත මහා නිර්වාණ රස** අප විසිනුත් පියහැකි දැ"සි කිව.

ඒ අසා බුද්ධුන්නරාවෝ:-එසේය. ඒ පිය හැක්කැ සි කියා සොළොස් කළයක් සුවඳ පැනින් නහා එක් සුදක් හැඳැ එක් සුදක් පෙරවැ පැනැවූ ධම්මාසනයෙහි හිඳැ ගෙණැ විජිනිපත්‍ර යක් අතින් අල්වා ගෙණැ පන්සියක් ගැණුන් හා පරිවාර සත්‍රින් හා සාමාවතින් හා කැඳවා **සර්ඥයන් වහන්සේ** වදුල පරිද්දෙන් ම බණ කිහ. ඒ බණ අසමින් ම පන්සියක් දෙනා හා සාමාවතින් හා ගුනස්නෙහි ම හිඳැ සෝවාන් වැ **බුද්ධුන්න රාවන්** වැඳැ ගෙණැ හෙවැ "මෙබඳු නිවන් රසයක් දුන්නාවූ තෙපි අද පටන් ගෙණැ අපගේ මැනියව! පිටතට ගොස් දවස් පතා වදුල බණ අසා ගෙණැ අපට කියව සි කිහ. **බුද්ධුන්න රාවෝ** එලෙසින් ම බණ ඉගෙණැ 1 පිටකත්‍රය ධරවූහ. ඉක් බිති **සර්ඥයන් වහන්සේ** බහුශ්‍රැතවූ උපාසිකාවන් 2 අතුරෙහි **බුද්ධුන්නරාවෝ** අධිකයහ සි **එතදග්‍රස්ථානයෙහි** තබා වදුල සෙයෙක.

මෙසේ බුදු තුඩින් ඇසුව ද ඒ තුඩින් ඇසුවන් අතින් ඇසුවද කවර ලෙසකිනුදු **අමාමහ නිවන්** නොවරදවා සාධා දෙන්නාවූ ධම්ම රත්නය සරණ යෙමි සි **දහම් සරණ** යා සුතු.

ඉක්බිති ඒ පන්සියයක් සත්‍රිහු බුජ්ධුත්තරාවන්ට අම්ම! "ඇපි **සර්ඥයන් වහන්සේ** දක්නා කැමැත්තම්හ. ගඞ මාලාදින් පූජා කරණු කැමැත්තම්හ. **සර්ඥයන් වහන්සේ** අප දක්ව ව"සි කිහ. ඒ ඇසූ **බුද්ධුන්නරාවෝ** ආයිංවෙනි! "රජගෙය නම් ඉතා බැරිය" නොප 3 ගෙණැ පිටතට යන්නට නොපිළිව නැසි" කිහ. ඒ අසා **ඝාමාවතින්** ඇතුළුවූ පන්සියයක් දෙන අම්ම! අපගේ **සර්ඥයන්** නො දැක්මෙන් අපගේ ජීවිතය නිහඬුල

1. පිටකත්‍රය දැරිවූහ. 2 කෙරෙසි. 3 පොස්.

නො කරව. **සම්බුදුන් වහන්සේ** දක්වව යි කිහ. ඒ අසා බුජ්ජු තතරාවෝ එසේ වුවහොත් තොප වසන්නාවූ ගබඩාවෙහි බිත්ති දෙදෙනෙකු නො බලන පරිද්දෙන් ජිදුර කොටැ තබා ගෙණැ ගද දුම් මල් පහන් ආදී රැස් කොටැ ගෙණැ සිටැ **සම්බුදුන් වහන්සේ** සිටුවරුන් තුන්දෙනාගේ ගෙට වඩනා වේලෙහි දැකැ වැඳැ පුදව යි කිහ.

ඔහු එසේ කොටැ වඩනාවූ සම්බුදුන් වහන්සේ දැකැ වැඳැ පිදූහ. **මාගන්දි තොමෝ** තමාගේ ප්‍රාසාදයෙන් නික්මැ මොවුන්ගේ ප්‍රාසාදයට අවුත් වෙන වෙන ගබඩාවෙහි තුබූ සිදුරු දැකැ මේ කිමෙක්ද යි විචාරා සම්බුදුන් කෙරෙහි ඈ වෛර 1 බඳ බව නොදන්නාවූ ඔවුන් විසින් **සම්බුදුන් වහන්සේ** දැකැ වැඳැ පුදන පිණිස කළ ජිදුරැයි කී කල්හි මාගේ සතුරුවූ **ශ්‍රමණ ගෞතමයෝ** 2 මෙයට අවන්හ. දැන් ඔවුන්ට හා ඔවුන්ට උපස්ථාන කරන්නාවූ මේ පන්සියයක් දෙනාට හා කටයුතු දන්මි යි සිතා රජ්ජුරුවන් කරා එළඹැ මහරජ! සාමාවතීන් ප්‍රධාන කොටැ ඇති පන්සියයක් දෙන පිටත අනාචාරයක් ඇත්තාහ. දෙතුන් දවසකින් තොප දිවි නැතැ යි කියා රජ්ජුරුවන් නො අදහන කල්හි මාගේ බස් නො අද හු නම් ගොසින් උන් වසන්නාවූ ගබඩා පරීක්ෂා කරව යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ ඔවුන් වසන්නාවූ ගබඩාවලට ගොසින් ගබඩාවෙක පාසා 3 සිදුරු දැකැ මේ කුමක්ද යි විචාරා එපවත් කී කල්හි සිදුරු හස්ස සියලු ගබඩාවෙහි ම උසින් ජාලා කවුළු ලැවූහ. එසමයෙහි **මාගන්දි තොමෝ** ඔවුන්ට කිසිවක් කරන්නට අසමර්ථවැ ඔවුන්ට මා කිසිවක් කොටැ ගත 4 නොහෙතුත් **ශ්‍රමණ ගෞතමයන්ට** ම කටයුත්තක් කෙරෙමි යි නුවර වැස්සන්ට අත්ලස් දී **ශ්‍රමණ ගෞතමයන්** සිහාවන් කල්හි හැම තොප තොපගේ ගැති මිඩියන් හැරැ ගෙණැ පරිහව බැණැ ලුහුබදවා පියව යි කිව.

ඒ අසා රත්නත්‍රයයෙහි ප්‍රසාද නැති මනුෂ්‍යයෝ සිහා වැඩි **සවාමිදරුවන්ට** පරිභව බණින්නට පටන් ගත්හ. ඒ අසා **අනඳ මහ තෙරුන් වහන්සේ** "සවාමිනි! මේ නුවර වැස්සෝ **ඉතා රත්නත්‍රයයෙහි** ප්‍රසාද නැතිවැ පරිභව බෙණෙති. මේ

---

1 බැඳි. 2 මේ ගෙට. 3 පහසා. 4 නො පොහොසත් වුවත්.

නුවර හැරී අනික් නුවරකට යම්හ කී දැන් වූ සේයෙක. ඒ අසා **සච්ඡයන් වහන්සේ** ආනන්දය! අප ගිය ඒ නුවර වැස්සොත් පරිහව බෙණෙත් නම් අනික් කොයි යමෝ ද? යම් තැනෙක්හි අධිකරණයෙක් උපන් නම් ඒ සන්හිඳි ගිය කලැ අනික් තැන කට 1 යන බව සුදුසුයි. මම සඬ්ගාමයට වන්නාවූ ඇතකු වැන්නෙමි. යුඬයට වන්නාවූ ඇතු 2 යතර දිසාවෙන් වස් නාවූ ශර වර්ෂාවත් 3 ඉවසා කරන්නා සේ දුස්සීලයන් බිණූ පරිහව ඉවසා කරණ බව මට ම සුදුසුයැයි බණ වදාළ සෙයෙක.

දෙසා වදාළ බණ සම්ප්‍රාපතවූ පෂිදට බොහෝ වැඩ සෑහිය. මෙසේ බණ වදාරා **ආනන්දය! සච්ඡයන් විසෙකි උපන් 4 අපවාදයෙක් සත්දවසකින් ඔබ්බෙහි නොසිටී සි** වදාළ සෙයෙක. ඉක්බිති **මාගන්දි නොමෝ සච්ඡයන්** එනුවරින් නොවඩනා හෙයින් සච්ඡයන් වහන්සේට උපස්ථාන කරන්නාවූ පන්සියයක් ගැණුන්ට ම 5 ව්‍යසනයක් කළ මැනවැයි සිතා රජ්ජුරුවන් රහ බොන තැන් සිටැ උපස්ථාන කරන්නි තමාගේ සිලිපියා හුන් තැනට නොමළ කුකුළන් අවදෙනකු හා මළ කුකුළන් අට දෙනකු හා ගෙණවුත් හිණි හිසැ සිටැ තමන් ආ බව රජ්ජුරුවන්ට 6 දන්නවා ඇතුළට වන මැනවැයි කී කලත් නොවැදූ පළමු නොමළ කුකුළන් අවදෙනා එවා පසුව මළ කුකුළන් එවුව මැනවැ යි හසුන් එවා චුල්ලූපස්ථායකයාට ද තමා කිවස් කරණ පරිද්දෙන් අත්ලස් දුන්හ.

මාගන්දික බ්‍රාහ්මණ ද අවුත් පිටත සිටැ කියා එවා අව මැනවැ යි කී කල්හි රා බොන තැනට නො වදිමි යි කියා පිටත සිටියේ. **මාගන්දිතොම** පළමු කොටැ ම අත්ලස් දුන් චුල්ලූපස්ථායකයා කැඳවා මාගේ සිලිපියා සිටි තැනට යාසි නහා යැවුව. හෙතෙම ගොස් උෆ 7 පාවා දුන්නාවූ නොමළ කුකුළන් අවදෙනා ගෙණවුත් "සාමිනි! පුරොහිතයන් එවූ පඬුරු යැයි" රජ්ජුරුවන්ට දැක්වීය. රජ්ජුරුවෝ අපට මේ යහපත් අවුලෙක. නා ලවා පිසවමෝදැයි විචාළහ. **මාගන්දි** තොම සාමාවතින් ඇතුළුවූ පන්සියයක් දෙනා හිඳිති. ඔවුන් ලවා පිසවා ගෙන්වුව මැනවැ යි කිව. රජ්ජුරුවෝ ඒ අසා "අනුන්ට නොදී තෙලෙ තමන් ම අපට පිසැ එවන්නේය"යි කියා යැවූහ.

---

1 නැඟී යන බව. 2 ඇතකු. 3 වර්ෂාවක්. 4 අපරාධයෙක්.
5 බැහැයයක්. 6 දන්වා එවා. 7 දුන්නාවූ.

ඒ අසා ශාසනයෙහි අති ප්‍රසාදවැ සත්‍රිහු "අපි ප්‍රාණ වධ නොකරම්හ"යි පෙරළා යවාපූහ. ඒ අසා **මාගන්දි** මහරජ! මේ තොපට ය යි කී හෙයින් නොපිසූ බව මුත් ශ්‍රමණ ගෞතමයන්ට යයි කියා යැවුවහොත් දැන් 1 දැන් පිසෙනි"යි කීහ. රජ්ජුරුවෝ එසේ වුවහොත් මෙසේ ම කියව යි නගා යැවූහ. ආදිම අත්ලස් ගත් වුල්ලූපස්ථායකයා නොමළ කුකුළන් සහ වාපියා මළ කුකුළන් ගෙණැ ගොසින් එපවත් කිය. ඔහු අසා "මේ අපට සුදුසු ය"යි ගිවිසැ බුදුන් වහන්සේට දන් ඉදිකොටැ යැවූහ. **මාගන්දි** රජ්ජුරුවන්ට නුඹට ය යි කී කලැ නොපිසන නියාත් බැලුව මැනවැ යි කියා සිටුවූව. රජ්ජුරුවෝ ඒ අසා ඝෂමා කොටැ මුවෙන් නොබැණැ හුන්හ.

ඉක්බිති **මාගන්දි** නවත් නවත් කුමක් කරම් දෝ හෝ යි සිතා වෙහෙසෙයි. එසමයෙහි රජ්ජුරුවෝ **සාමාවතිය, වාසුල දත්තාය, මාගන්දිය** යන තුන්දෙනාගේ තුන් ප්‍රාසාදයෙහි මුර යෙන් මුර තබා එකි එකී මුරයෙහි සත් සත්දවස් ශ්‍රී අනුභව කොටැ යෙහෙන් වෙසෙති. එ සමයෙහි **මාගන්දි** තොම සෙට හෝ 2 අනිද්දා හෝ රජ්ජුරුවෝ **සාමාවතින්ගේ** ප්‍රාසාදයට යෙති කියා දැනැ තමාගේ සිලිපියාට කියා යවා දලෙහි 3 ඔසඩ ගල්වා විෂ නැති කළ නයෙකු ගෙන්වා ගෙණැ රජ්ජුරුවන්ගේ විණයෙහි සිදුරෙන් ඇතුළෙහි ලා පියා මල් වටෙකින් සිදුර පියාලා සපියා දෙතුන් දවසක් නිරාහාර කොටැ රජ්ජුරුවන් කරා ගොස් අද කාගේ ප්‍රාසාදයට වඩනේදැ යි විචාරා සාමාවතින්ගේ ප්‍රාසාදයට යයි කී කල සැමිනි! ඊයේ නපුරු සිහිපනයක් දිටිමි. ඔබ නොවැඩිය මැනවැ යි වළකා රජ්ජුරුවන් නොවැළකැ යත් යත් "ආවක් කැවිව දක්ම්. මමත් එම්"යි කියා කැටුවැ ගොස් රජ්ජුරුවන් සාමාවතින්ගේ ගෙයි බත් අනුභව කොටැ යෙහෙන් නිදන්නට පටන් ගත් වේලෙහි නොමෝ සක්මන් කරණ ලෙසින් ඇවිදැ සිටැ ලා විණ සිදුරෙන් මල්වට හයා ගත.

නිරාහාරවැ හොත්නාවූ සපියා පණ කොටැ ගෙණැ විණ වෙන් නික්මැ හැදූ වැටි ගින. නොමෝ ආදි නොදන්නා එකක සේ හඬා සසලා පියා සැමිනි! සපියෙකැයි රජ්ජුරුවන් සුබුද්දැ "නුඹ කාගේත් බස් නොගිවිසැ මේ දුෂ්ට සත්‍රින් කෙරෙහි ම ඇලුනු සේක"යි නොයෙක් ලෙසින් රජ්ජුරුවන්

1 දන් පිසති. 2 කියදුහෝ. 3 ඖෂධ.

හිවිස්සුය. රජ්ජුරුවෝ නතනවය නොදනැ කියුනාහ. සාමා වනි රජ්ජුරුවන් කියුනු බව දැනැ පන්සියයක් පරිවාර සත්‍රින් කැඳවාලා "රජ්ජුරුවෝ නිඤ්ඤාරණයෙනි කිපියහ. මෙතැන්හි අපට අනික් සරණෙක් නැත. **අපගේ සාමිදරුවු සළිඹුයෝ නමා කෙරෙහි මෙඝ කළවුන්ට මෛත්‍රී කරණ බව සියලු උප ද්‍රව නොවැද්ද දෙන දිව්‍ය ඖෂධයෙකැයි වදල සෙයෙක.** එහෙයින් අප අපගේ ආත්මයෙහි ද මේ රජ්ජුරුවන් කෙරෙහි ද අපට බොරු වරද නහන්නාවූ බැම්ණිය කෙරෙහි ද සම සිත් වූව මැනවැයි" අවවාද කුන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ බලවත්වූ රාජ කෝපයෙන් නැඟි සිටැ දැහක් දෙනා නහන බහන මැඩ හඟු දුන්න නහාලා විෂ පොවා පී ශරය එහි තබා ගෙණැ හී දණ්ඩ සාමාවතින්ගේ ලයට අභිමුඛ කොටැ හයා ගෙණැ අත හැරි පිහ. ඒ සිත් පිත් නැති ශරය ද සාමාවතින්ගේ මෛත්‍රී ආනුභාවයෙන් පහිලිය සාමාවතින් දසාවට ගොසින් මුවාත රජ්ජුරුවන් දසාවට දිවන්නට වන. රජ්ජුරුවෝ එවිට හිය තමන් දසා වට දිවත් දිවත් "මේ සිත් පිත් නැති ශරය පොවා සාමාවතින් ගේ ගුණ දන්නී. මම් මය ඔවුන්ගේ ගුණ නො දන්මි"යි දුන්න හෙළා පියා දෙහොත මුදුනෙහි තබා ගෙණැ "දේවීනි ! අඤ්ඤ නවූ මා රක්‍ෂා කරව. නෙපිම මට සරණ වව. තොප සරණ යෙමි"යි කිහ.

ඒ අසා සාමාවති "මම තොප සරණ යෙමි" නො කියා "දේවයෙනි! මා සරණ යන්නේ කුමට ද? තුන් ලොවට එක හෙළා සරණවූ නමන් කි පරිද්දෙන් පවත්නාවූ ලයට විදි ශරය පොවා පෙරළි විද්දවුන් දසාවට යන පරිද්දෙන් කරන් නාවූ ගුණ ඇති **සළිඹුයන් සරණ යව**"යි කියා රජ්ජුරුවන් සරණ ගන්වා ඒ සරණ ගියාවූ රජ්ජුරුවන් බුදු පාමොක් මහා සඞ්ඝයා වහන්සේ පවරා දන් දී සාමාවතින් කැඳවා "තොප විසින් මට මේ සා ලාභයක් වූයේය. තොප කැමැති වරයක් ගන්ව සි කී කල්හි "මට අනික් වස්තුවකින් ප්‍රයොජන නැත. **සළිඹුයන්** නිබඳයෙන් මාගේ ගෙට වැඩැ බණ වදාරණ පරිද් දෙන් ආරාධනා කළමැනවැ සි කිහ. රජ්ජුරුවෝ **සළිඹුයන් වහන්සේට** ආරාධනා කළහ.

සවාමිදරුවෝ එබස් අසා "මහරජ! **සම්බුදුයෝ** නිබඳ යෙන් එක තැනකට යෙති යනු නැත. මුළුලොවට කරුණා යෙන් උපන් **සම්බුදුයන් වහන්සේ** එක තැනකටු නියතව ගිය හොත් අනාථවූ ලොවට මහා අලාභ වන්නේය"යි වදාරා **අනඳමහතෙරුන් වහන්සේට** සම්මත කොටැ වදාළ සෙයෙක. **අනඳ මහතෙරුන් වහන්සේ** පන්සියයක් දෙනා වහන්සේ ගෙණැ අනතඃ පුරයට වැඩැ බණ වදාරණ සෙයෙක. තෙරුන් වහන්සේගේ ධම්ම අසන්නාවූ **සාමාවතිය** ප්‍රසන්නවූ සිතින් ධම්මයෙහි වූ ප්‍රිති සෞමනස්‍යයෙන් පන්සියයක් වස්ත්‍රයෙන් පූජා කළහ. ඒ අසා රජ්ජුරුවෝ ද බොහෝ වස්ත්‍රයෙන් පූජා කළහ.

මෙසේ අචෙතසාවූ ශරය පොවා අනුන් කෙරෙහි මෙත් සිත් කළවුන් ලඝට නෝ වැද්ද ගි පගිලිය පෙරළි හොස් කිසි උපද්‍රවයක් කට නොහී ගුනුබව ඇසූ සත්පුරුෂයන් විසින් උපන් සතඔයන්ට ධම්මයමුත් අනික් සරණයෙක් නැතැ යි කියා නිශ්චය කොටැ අනවරතයෙන් තමන්ට උපන්නාවූ දුඃඛ යන්හි දුඃඛ දුරුකරණ පිණිස සියලු සසර සුව එළවන පිණිස 1 අමෘත මහා නිර්‍වාණ සුව සිඹවන පිණිස දහම් සරණ යෙම් යි **දහම් සරණ යා සුතු.**

ධම්මං සරණං ගච්ඡාමි, දහම් සරණ යෙමි.

තවද, මහා සමුද්‍රයෙහි නැව රක්‍ෂා කරණ නැවියා එම නැවින් රැකෙන්නා සේ තමා රක්‍ෂා කරන්නවුන් රක්‍ෂා කරණ "ධම්මය ශරණ යෙමි"යි **දහම් සරණ යා සුතු.**

හේ කෙසේද? යත්:-

එක් සමයෙක්හි **පසේනදි කොසලයෝ** සම්‍යොහරණයෙන් සැදී සම්‍යොහරණ විභූෂිතවූ **එක සුණඛයින** නම් ඇතකු නැඟි මහත්වූ රාජානුභාවයෙන් මහපොළොව පෙරළන්නාක්හු සේ මහා සමුද්‍රය උතුරු වන්නාක්හු සේ සපතකුල පර්‍වතය උදුරා නහන්නාක්හු සේ මහා කොලාහලයෙන් නුවර පැදකුණු කරන්නාහ. එ සමයෙහි රාජ්‍ය රක්‍ෂායෙහි නියුක්ත පුරුෂයන් විසින් ගසා දුරුකරණු ලබන්නාවූ මහාජනයා ගිය ජානි යෙහි මහත් මහත් කුසල් කළාවූ රජ්ජුරුවන්ගේ රාජ්‍යශ්‍රී බැලුව මැනවැ යි ලොභයෙන් පෙරළි පෙරළි සිටැ බලන්නාහ.

---

1 සියලු.

එසමයෙහි එක් අනාථ මිනිසකුගේ අඹුවකුදු සත්මහල් පායෙක්හි මතු මහල් තෙලෙහි සිටැ ජාලා කවුළුව හැරැ රජ්ජුරුවන් බලා රජ්ජුරුවන් තමන් බැලූ ක්ෂණයෙහි දෙර පියා ඇලවැ ගත. එසමයෙහි රජ්ජුරුවන්ට ඒ බුහුණ බලා වලා වැසි ගිය සඳක් සේ වැටහිනි. ඈ කෙරෙහි පිළිබඳ සිතැ'ත් නාවූ රජ්ජුරුවෝ ඇතු පිටින් වැටී හෙන්නාක් සේ ශොකා'තුරවැ ශුභූවැ නුවර පැදකුණු කොටැ රජගෙට වැද "මා නුවර පැදකුණු කරණ වේලෙහි අසවල් නැන ප්‍රාසාදයෙහි මතු මහල් තෙලෙහි 1 සිටි ගැහණියක නෝත් දුටුයෙහි වේදැ සි" කියා ඇගේ සැමියන් ඇති බවත් නැති බවත් හොස් දැනැ එවැනි පුරුෂයෙකු යැවිය.

හෙතෙම සස්වාමික භාවය දැනැ රජ්ජුරුවන්ට දන්වීය. රජ්ජුරුවෝ එසේ වුවහොත් ඇගේ සැමියා කැඳවාගෙණැ එව සි යැවූහ. හෙතෙම රජ්ජුරුවෝ නා කැඳවූහ සි කියන්නා හාම මාසේ වූ අනාථ එකකු රජ්ජුරුවෝ කුමක් පිණිස කැඳවත්ද? මාගේ අඹුවන් නිසා මට භයෙක් උපන්වනැ සි භය පත්වැ රජ්ජුරුවන් කරා හොස් වැදැ සිටියේය. රජ්ජුරුවෝ "අද පටන් ගෙණැ මට සෙවය කරව"සි කිවූය. හෙතෙම ස්වාමිනි! මම මාගේ කටයුතු කොටැ ළා දුන මනා අය දී වැදගිඳිනා අනාථයෙකිමි. මට රාජසෙවයෙන් ප්‍රයෝජන නැතැයි කියා රජ්ජුරුවෝ කෙසේත් සෙවය කළ මැනවැ සි කවුළුවක් හා පලඟයක් දෙවූහ.

හෙතෙමෙ මේ රජ්ජුරුවෝ උපායා'නතුරයෙකින් මා මරා පියා මාගේ අඹුවන් හැරැ ගන්නා කැමැති වන්නාහ සි සිතා අප්‍රමාදවැ රාජ සෙවය කෙරෙයි. රජ්ජුරුවෝ ඔහුගේ දොස යක් දැකැ ගත නොහී කාමරාගය වඩත් වඩත් මෝහට දොස යක් ආරොපණය කළමැනවැයි සිතා ඔහු කැඳවා "මෙ නැනට සතර ගවුවෙක ගහෙක් ඇත. එහි මෙ නම් තොටට හොස් සවසැ මා නහන වේලාවට කවුළුල් මහනෙල් ආදිවූ සුවඳ මල් හා අරුණුවන් මැටි ගෙණැ එව. නොගෙණැව හොත් නා දිවි නැතැයි" කිවූය. හෙතෙමේ ආඥ සම්පන්න රජ්ජුරුවන් කී බස නො කොටැ හෙම් සි නො කියා ගෙණෙම් සි සවු ගෙණැ අරුණුවන් මැටි නම් 2 නාලොවැ ඇති දෙයෙක. ඒ මට කෙසේ ලැබේදැයි මරණ භයින් භයපත්වැ ගෙට හොස්

1 දුවු. 2 නාගලොවැ.

අඹුවට බත් උදවුදැ යි විචාරා උදුනෙහිය යි කී කල්හි බත් පැසෙනතුරු ලස්වන හෙයින් සාලුවෙන් දොනා දිය ඇලකර වා පියා සමහව මාලුඇතකින් කැද කැද බත් මල්ලෙක ලා බැඳ ගෙණ නික්මින.

යන් යන් අතර මහදී ම හුණු සුමින් පැසින. හෙතෙම බත උනාපියා නොඉදුල් කොටැ මද බතිරිසක් ඇලකොටැ පියා බත් කන්නේ අතර මඟ සා විඩාවැ ගිය මඟියන්හු දැකැ ඔහු බත් කවාලා තෙමේත් බත් කා එක් බත් පිඬක් හැරැ ගෙණැ දියෙහි මසුන්ට දන් දී මහත් කොටැ "මේ ගඩහාවෙහි වයන්නාවූ නාඟ සුපණී දෙවතාවන්ටය මා දන්වන්නේ! රජ්ජුරුවෝ මා මරණ පිණිස නාලොවින් ඔත් නොලැබෙන් නාවූ කඩුපුල්මල් හා 1 අරුණුවන් මැවි ගෙණෙන්නට කීහ. මා මඟියාට දුන් බත කුසල් හා මසුන්ට දුන් බත් මිට කුසල් හා හැමදෙනාම අනුමෝදන්වැ මට කඩුපුල්මල් හා අරුණු වන් මැවි දෙවයි හඬ ගැසිය. ඒ අසා ගඩහාවෙහි අධිගෘහී තවූ නාගරාජයා ඔහු 2 හඬ අසා යහළු වෙසයෙකින් ඔහු කරා අදුදින් තා කළ පින් මට දෙව යි 3 තුන්විටෙක පින් ඉල්වා ගෙණැ ඔහුගේ ලෙහි මරණ භය ද අඹු ශොක ද නිවා අරුණු වන් මැවි හා කඩුපුල්මල් හා දින.

වැඩි කුසලයක් නොකොටැ මඟියාට ලූ බත්පිඬෙහි හා මසුන්ට ඉසැලූ බත් පිඬෙහි අනුසසින් නාගරාජයන් පවා මෙසේ ප්‍රසන්නවැ මේ සත්වයාගේ දුක් දුරුකොටැ ජාති ශත සහස්‍රයෙකිනුදු මිනිසුන් විසින් 4 නොලැබිය හැක්කාවූ අරුණු වන් මැවි හා කඩුපුල්මල් දී කළාවූ ශාන්ති ඇසූ සත්පුරුෂයන් විසින් මේ සංසාරයෙහි සිටියාවූ සත්වයන්ගේ සියලු උපද්‍රව සංසිදුවන්නට ධම්මය සේ වූ පිටිවහලෙක් නැතැ යි කයින් වචසින් මනසින්ම එම සඬම්මය වැඳැ දුදැ එම සඬම්මය මෙනෙහි කොටැ එම සුචරිතයෙන් සුව විඳුම්හයි නිශ්චය කොටැ මෙබඳු සංසාරයෙහි නිවී සැනහී යෙහෙන් විසුව මැනවැයි **සඬම්මයම සරණයා සුතු.**

රජ්ජුරුවෝ ද ඒ මිනිසා මෙහෙවර යවාලා "මිනිස්සු නම් බොහෝ උපාය දන්නාහ. ඉදින් කිසි උපායකින් හේ ඒ අරුණුවන් මැවි හා කඩුපුල් මල් ලත් නුවුදු මේ නුවරට

1 අරළුවන් මැවි. 2 ඝඬ ගයන හඬ අසා. 3 තුන්වරිටෙක. 4 විසිතුදු.

වැද්ද නුදුන්න මැනවැයි කියා නුවර දොර වේලා පසම් හෙළවා ඇහ. හෙද අවුදින් පිහිදෙර, දැකැ තුන්විටෙක හඬගහා පියා කොයි යෙම් දෝ හෝ යි සිතා සහුරුවන් නම් ඉතා මොළොක්වූ සිත් ඇති සෙයෙක. ඔබ ගොසින් රාත්‍රියට නිදම් යි විහාරයට ගොස් එක් පහසු තැනෙක්හි 1 වැද හොත්තේය. ඒ රාත්‍රි යෙහි රජ්ජුරුවෝද ඒ ගැහැණිය කෙරෙහි පිළිබඳ සිතින් නිදි නොලබන්නාහු "මාගේ ගැත්තකුගේ අඹුවක පිණිස මා මෙතෙක් දුක් ගන්නේ කුමක් පිණිස ද? පහන් වන්නා හා ම ඔහු මරවා පියා අඹුව ගන්මි යි සිතා හොත්තාහ.

එ සමයෙහි සැටයොදුන් **ලොහකුම්භ නරකයෙහි** උපන් නාවූ බලවත් අකුසල් කළ පුරුෂයෝ සතර දෙනෙක් උදුන්හි ලා ලූ සහල් සේ උඩුයටියාවැ පැසෙන්නාහු තිස්දහසක් හවුරුද්දෙන් පත්ලට බැසැ තිස්දහසක් හවුරුද්දෙන් උඩට නැඟි ඔවුනොවුන් දැකැ තමන් පෙරැ කුසල් නොකළ බව හා දැන් කුසලට ආසාව ගිය බව හඟවා එකෙණී ගාථා කියම්හ යි සිතා සම්පූර්ණ කොටැ කියාගත නොහී එකෙණී 2 අකුර කියා නැවත නරකයෙහි ගැලි ගියහ. රජ්ජුරුවෝ ඒ අසා කවර විපැත්තියෙක් වේ දෝ හෝ යි මහා භයින් භයපත්වැ රාත්‍රිය මුළුල්ලෙහි දල්වා ලූ ඇසිපිය නොලා ඉඳැ පහන් කොටැ උදැසනක් සේ ම පුරොහිතයන් කැඳවා එපවත් කිහ.

පුරොහිතයා සතර අකුරු අසා සිටැ මේ බුඩ විෂය බව මුත් තමහට විෂය නොවන බැවින් ඔබ සිතා ගත නොහී නොදන්මි යි කිව හොත් මට ලාභා'නන්තරාය වෙයි සිතා මහරජ! ඉතා බැරි සඩපනයෙක. නොපගේ ප්‍රාණයට විනාසයෙක් පැමිණෙයි කිහ. ඒ අසා දිසුණුවැ භයපත්වූ රජහු කළමනා කිම්දැ යි කී කල්හි ඇත් අස් ආදි ප්‍රාණීන් කෙරෙන් සියක් සියක් මරා යාග කළමැනවැයි කිය. ඒ අසා රජ්ජුරුවෝ මුළුලොව මරුත් මා ගැළවෙන බව යහපතැයි ප්‍රාණීන් කැපිකරවන්නට පටන් ගත්හ. පළමු කොටැ පන්සියයක් හොත් හා පන්සියයක් වස්සන් හා පන්සියයක් නාඹුන් හා පන්සියයක් තිරළුවන් හා පන්සියයක් පලෙළුවන් හා උගුරු කපන පිණිස බැඳැ සිටුවා ගත්හ.

සියලු දුසකම්කරයෝ මරණ භයින් තැතිගැනැ හඬ හඬා කම්මානන්ත කරන්නට පටන්ගත්හ. මහ පොළොව ඉදිරී යන්

1 සැනපි. 2 අකුරු.

කෝලාහලයක් සේ මහා කෝලාහල පවත්වමින් සිටියේ. "එ සමයෙහි මල්ලිකා දේවීන් රජ්ජුරුවන් හුන් තැනට ගොස් ශ්‍රී මුඛය දුර්මුඛ කාරණ කිම්දැ"යි විචාරා එපවත් අසා මහ රජ! තෙපි හැමකල්හිම අඹ බාලයව. මෙසේවූ සැපනයක් දුටු කල්හිම ශ්‍රුතාගත වහනියක් සේ ඉපිළ ගියාවූ ශොක ඇත්තවුන්ගේ ලය අමා මහ මෙඝයක් නිවාලන්නා සේ තමන්ගේ වචනයෙන් නිවාලන සේ දන්නා සවීඥවූ සවාමිදරුවන් කුමට නො විචාළාදැ සි කිහ. රජ්ජුරුවෝ ඒ අසා ශ්‍රුතුවැ ගමන් ඇති වාහනයකට නැඟි මල්ලිකාදේවීන් හැරී ගෙණැ විහාරයට ගොස් සවාමිදරුවන් ශ්‍රීපාද වැඳැ එකත් පස්වැ හිදැ මළාන්හු සේ එක බසකුත් නො බෙණෙසි.

ඉක්බිති නිහුවන හෘදය නිවීපනවූ සවාමිදරුවෝ තමන් වහන්සේම මධුරවූ සඬර විහිදූ මහරජ! "ඉතා දහවල් වේ ලෙහි කොයි සිට ද? එන්නේය:–සි විචාරා වදාළ සෙයෙක. ඒ අසා රජ්ජුරුවෝ මරණ භයින් භයපත්වැ මුවෙන් නොබැණැ හුන්නාහ. ඉක්බිති මල්ලිකාදේවි එපවත් සවාමිදරුවන්ට දැන්වූහ. ඒ අසා සවාමිදරුවෝ මහරජ! මෙසේවූ සැපනයක් දුටුයේ ඇද්දැයි විචාරා වදාළ සෙයෙක. රජ්ජුරුවෝ ඇත සවාමීනි! සි කියා කෙසේවූ සැපනයෙක්ද? තොප දුටුයේ:–යසි කී කල්හි තමන් දුටු පරිද්දෙන් දැන්වූහ. සවාමිදරුවෝ එපවත් අසා මහමෙර සා වැරියක් සතර මහාසාගරයෙහි දිය පමණ තෙලඟලා පහනක් අවුලුවා ගෙණැ සතරරියන් හබඩාවට වන් එකකු සේ තමන් වහන්සේගේ අනාවරණඥානයෙන් සතර අකුරු පරීක්ෂා කොටැ මතැනක්හු මැඩැ පූ ලයෙකැ සහස්‍රපාක අමෘත තෙලයක් 1 හාන්නා සේ මහරජ! "මේ නිසා තොපට වන්නාවූ භයෙක් නැතැ"යි අස්වසා අස! මහ රජ, මොහු සතරදෙන කසුප් සම්මා සම්බුදුන් වහන්සේ දවසැ සතළිස් කෙළක් පමණ ධන ඇති සිටුදරුවෝ සතර දෙනක.

ඔහු එතෙක් ධනයෙන් තමන් තමන් පිහිටවූ කිසි කුසලයක් නොකොටැ පඤ්ච දුශ්චරිත කොටැ අවීචි මහානරකයෙහි ඉපිදූ එක් බුඩානන්තරයක් මුළුල්ලෙහි පැසි කම්මාවශෙෂයෙන් ලොහොකුඹු නරකයෙහි ඉපිදූ තිස්දහසක් හවුරුද්දෙන් පත්ලට බැසැ තිස්දහසක් හවුරුද්දෙන් මත්තට නැඟි ඔවු'නොවුන් දැකැ එතෙකී ගාථා කයම්හයි සිනා:–

1 ගල්වන්නාසේ.

"දුජ්ජීවිතං අජීවිමහ-සෙ සනෙන න දදමහසෙ
විජ්ජමානෙසු භොගෙසු-දිපං නාකම්ම අන්තනො"

යන මේ ගාථාව කියනු කැමැත්තේ "දු" යන්න මතු කියා ගැලී ගියේ.

"සකිං වස්ස සහස්සානි-පරිපුණ්ණානි සබ්බසො
නිරයෙ පච්චමානානං-කදා අන්තො භවිස්සති"

යන ගාථාව කියනු කැමැත්තේ "ස" යන්න මතු කියා ගැලී ගියේ.

"නාස්සි අන්තො ක්වනෝ අන්තො-න අන්තො පතිදිස්සති
නදුහි පඨමං ඨානං-මම තුස්සහංච මාදිස!"

යන ගාථාව කියනු කැමැත්තේ "න" මතු කියා ගැලී ගියේ.

"සො හි ඤත්ත ඉතො ගන්ත්වා-සොතිං ලබාන මානුසිං
වදඤ්ඤූ සීලසම්පන්නා-කාහාමි කුසලං බහුං"

යන ගාථාව කියනු කැමැත්තේ "සෝ" යන්න මතු කියා ගැලී ගියේ.

මොහු සතරදෙන තමන් පෙරැ පරස්ත්‍රී සෙවනාදී දුශ්චරිත කරම්හි සි කුසල් නො කළබවට පශ්චාත්තාපනායෙන් මේ ගාථා සතර කිහ. ඉන් නොපට වන උපද්‍රව නැනැසි වදළ මසයෙක. ඒ අසා රජ්ජුරුවෝ පරස්ත්‍රී සෙවන නම් බැරිය. පවෙක් වනැසි කියා පරස්ත්‍රී සෙවනයෙහි දොෂ දැනැ මාත් ඒ පාපයෙන් දුරුවුව මැනවැසි සිතා "සාමිනි! රැ මේ සැපතය දුටු වේලෙහි පටන් කොටැ හසින් නිදි නොලත් හෙයින් රාත්‍රිය නම් මෙසේ දික් දෙයක් වනැ සි ඊයේ රැ මම දන්මි සි දැන්වූහ.

ඒ පුරුෂයා ද මෙතැනදී මාත් වැද බිණුව මැනවැසි සිතා "සාමිනි! රජ්ජුරුවන්ට රාත්‍රිය 1 දික්වූ බව හැඟුනේ ඊයේ රැය. යොදන දික් දෙයක් බව හැඟුනේ ඊයේ දවාලැසි දැන්විය. ඒ අසා සාමිදරුවෝ නිදි නො ලබන්නාහට රාත්‍රිය දුරැ. විඩා නැනැත්තවුට යොදනෙක් නම් දුරැ. ධම්ම නො දන්නා අඥානයාහට සසර දුරැසි කියා බණ වදුරණ සෙයෙක.

1 දික්වූ පරිදි.

"දීඝා ජාගරතො රත්තී-දීඝං සන්තස්ස යොජනං
දීඝො බාලානං සංසාරෝ-සද්ධම්මං අවිජානතං"

යන ගාථායෙන් බණ වදාළ සෙයේක. දෙසනා කෙළවර ඒ පුරුෂයා ඇතුළුවූ බොහෝ දෙන අමා මහ නිවන් පසක් කළහ.

රජ්ජුරුවෝ ද ශොකයෙන් මිදී රජගෙට ගොස් මරන් නටගැසී බැඳැ සිටුවූ ප්‍රාණීන්ට අභය දී උනා හළහ. සියලු නුවර ප්‍රතිමයවූ සොම්නස්හි ගැලී ගැලී 1 ගියේය. තිරිසන්වූ මසුන්ට ලූ බත් පිඬක් හා යාචකයාට දී ලූ බත්පිඬෙහි 2 පමණින් සියලු දුඃඛයෙන් 3 ගැළවී අමා මහ නිවන් දැකැ නිවී සැනහී සුවපත්වූ මේ පුරුෂයාගේ කථාව ඇසූ සත්පුරුෂයන් විසින් ධම්මය සේ සතුවයන්ට පිහිටයෙක් නැතැයි දැන ඒ ධම්මය අප්‍රමාදයෙන් පුරා එම ධර්මයෙන් අධික සතොසෝ ලබම් හයි සිතා නිශ්චය කොට **දහම් සරණ** යා යුතු.

තව ද බොධිමූලයෙහි වැඩැ හුන්නාවූ තමන් වහන්සේ දනන්ට යැයි කියා ආවාවූ **වසවත්තිමාරයා** පවා හිරු හසනයට නොයන තුරු 4 ලුහුබැඳවූ සෝමිදරුවානන් වහන්සේ තමා ගේ විමානයෙහි හුන්හ යි නිපි වෙහෙයෙන් දිව අවුත් රාත්‍රියක් මුළුල්ලෙහි උපක්‍රම කළාවූ **ආලවකයා** හා නවවිධ වෂීාවකින් හා ප්‍රචණ්ඩවූ ගිනි ගෙණ දිලියෙන වෙලාගුඩයෙන් හා කිසි උපද්‍රවයක් කොටැ ගත නොහි මහණ තා ප්‍රශ්නයක් විචාරම් යි ඒ ප්‍රශ්නය කිවහොත් ගැලවෙන්නේයි. නො කිවහොත් තා හද වනට අත ලා ලා මැඩැ විසරු හෝ හෙළා පියම්. ලය හෝ පලා පියම්. කකුල හෝ අල්වා ගෙණැ ගඩාගෙන් පාශ්චයට හෝ ගසා පියම්. තාගේ ප්‍රාණය රක්ෂා කරන්නා කැමැත්තෙහි නම් මා විචාළ ප්‍රශ්නයක් කියයි දැයි කියා කුමක් කළ කලැ සුව එළවේ ද යි කී කල්හි සවී ධම්යෙහි අප්‍රතිහතවූ බුඩි ඇති සෝමිදරුවන් විසින් යක්ෂය ! අපට කරණ උපද්‍රව පස්ස කොටැ තා කැමැති ප්‍රශ්නයක් විචාරයි සවීඥ ප්‍රවාරණයෙන් පවරා වදාළ කල්හි ප්‍රශ්න විචාරන්නට පටන් ගත් ආලවකයා සිත් ගෙණැ ඒ ධම්ය ඇසූ ක්ෂණයෙහිම ඕහට අමා මහ නිවන් දෙනු කැමැත්තාවූ ප්‍රඥ ඇත්තවුන් කෙරෙහි අග්‍රවූ කරුණ ඇත්තවුන් කෙරෙහි අග්‍රවූ අසයානුසය දන්නවුන් කෙරෙහි

---

1 ගැලි ගැලී සිටියේ. 2 මිවෙහි. 3 මිදී. 4 ලුහුබැඳලූ.

අග්‍රවූ සම්‍යක්සම්බුදුරුවන් විසින් සියලු සත්ත්වයන් වහන්සේ විසින් මේ ප්‍රඥාය විසඳූ ක්‍රමය පරම්පරා කොටැ බුඩ පරම්පරා දෙශනාවට අවිරුඬ කොටැ ධර්ම්මව්‍යවහාරයට අවිරුඬ කොටැ ප්‍රඥාය විසඳන්නට පටන්ගණ්නා "යක්‍ෂය! තා නොකිවහොත් අපට උපද්‍රව කරම්හ යි කියා ප්‍රතිඥා කළාවූ තා විසින් කුමක් කළ කල්හි සුව එළවේ ද"යි විචාළේය.

ඒ අසා ලොකයෙහි ධර්ම්මය කළ කල්හි සුව එළවව යි කියා වදාරා ඔහු සිත් ගෙණ්නා මුළු ලෝ සිත් ගෙණ්නා සුවයට මූලකාරණය යි කියා සත්ත්වයන් වහන්සේ විසින් සත්ත්වතාඥානයෙන් හිමි කොටැ වදාළාවූ ධර්ම්මය ම සරණ යෙමි යි **දහම් සරණ යා සූත්‍ර.**

තවද 1 ධර්ම්ප්‍රිය වූ 2 ආත්මභිත තත්පර වූ පරහිතයෙහි දෙළු ගත්තා වූ සත්පුරුෂයන් විසින් සසර වැටහිහී අනවසිත වැ දුග්ගන්නාවූ අඥානයන් සේ නොවැ බුදුරුවනට ගැති වූ තැන් පටන් සඟුරුවනට දිවි දුන් තැන් පටන් දහම් සරණට දිවි දුන් තැන් පටන් නසින් හා එක්වැ වැසැ ද ඔවුන් හා කෙළි කෙළැ උපද්‍රව නොවිඳ යෙහෙන් වසන්නාවූ විෂ වෛද්‍යවාරයන් සේ සොර වූ සංසාරයේ හිදැ කිසි උපද්‍රවයක් නොවිඳ යෙහෙන් වසම්හ යි සිතා ධර්ම්මයෙහි ගුණ දැනැ ධර්ම්ය සරණ යම්හ යි සිතා තත්පරවැ අප සරණ ගියාවූ ඒ ධර්ම්ය තමා රක්කවුන් රක්ක හේ දෝ නොහේ දෝ හෝ යන සංශයක් ඇතහොත් ඒ සංශය දුරුකරණ පිණිස අසඳෘශ්‍යකොණ්ඩඤ්ඤ මහතෙරුන් වහන්සේගේ කථාව ද අසා ධර්ම් ලොභය රක්‍ෂා කරණ පරිදි නිශ්චය කොටැ දත යුතු.

හේ කෙසේ ද? යත්:-

මෙයට එකානූවන කප්හි දහමට ල ඇති ලොව රක්මෙහි උතසාහ ඇති සම්‍යක්සම්බුදුරුවන් පිරිපැ පරාර්ථයෙහි නිතෙතසාහීවූ වියත් කම්හි මතුපත්, කරුණෙයෙහි තෙරපත්, ප්‍රඥයෙහි මුල්බට භගවත් අහිත් සම්‍යක් සම්බුඩ වූ 3 විදර්ශි නම් සම්‍යක්සම්බුදුරුවෝ අද දක්වා තමන්ගේ නම කී මාගේ ලය සනහන පිණිස ලොකයෙහි පහළ වූ සෙයෙක.

---

1 ධර්ම්ය ම ප්‍රියවූ. 2 ආත්ම භිතවූයෙහි. 3 විදර්ශින.

එ සමයෙහි චූළකාළ ය මහාකාළ ය යන 1කෙළෙඹි දෙබෑ කෙණෙක් මහත්වූ හැල් කෙතක් වැපිරිවූහ. ඉක්බිති එක් දවසක් චූළකාළ තෙමේ හැල් කෙතට ගොස් එක් හැල්ගබක් පලා ඇතුළෙහි තුබූ ඇට කා බැලීය. ඒ ඕහට අතිමධුරවැ වැටහිනා. හෙතෙමේ මෙසේ වූ මධුරයක් බුදුපාමොක් මහ සඞ්ඝයා වහන්සේට දුන මැනවැ යි සිතා වැඩිමහළු බෑනන් කරා එළඹ බැනෙනි! ලොකයෙහි අතිමධුර රසයකට සුදුස් සෝ සම්‍යක් සම්බුධයන් සේ විනා අනික් කෙණෙක් ඇද් ද? අද මම හැල්කෙතට ගොස් ලාවූ හැල්ගබ පලා ඇතුළු කා බැලිමි. එසේවූ මධුරයෙක් නැතිවැ වැටහිනා. එසේ හෙයින් හැල්පලා හැල්ගැබ ගෙණැ බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේට දන් දෙම්හ යි කීය.

ඒ අසා මහාකාළ තෙම 2"මල! නොප කියන්නේ කිම්ද? බඩකුඹුරෙහි ගොයම් පලාපියා දන්දුන් කෙණෙක් පෙරත් නැත. මතුත් නැත. දැනුත් නැත. නිකම් ඉඳිව. පැසෙන ගොයම් නො නසව යි කීය. ඒ අසා චූළකාළ තෙම නැවත නැවත දන් දුන මැනවැ යි ආරාධනා කෙළේ.

ඒ අසා මහාකාළ තෙම නොප මෙසේ ගත්නැඟි බැවින් කුඹුර දෙකොටසක් කොටැ බෙදූ පියා මා සතු භාගය නො අල්වා නොප සතු කොටසින් කැමැත්තක් කරව යි කීය. ඒ අසා චූළකාළ තෙම යහපතැ යි කුඹුර බෙදූ ගෙණැ බොහෝ මිනිසුන් වත්කම් කොටැ ගෙණැ හැල්ගැබ පලවාලා කරල් හැරී ගෙණැ පැන් නුමුසු කිරින් පැසවා හෙළහිතෙල් මිහි ශ්කීරා ආදිවූ මධුර ද්‍රව්‍ය මුසු කොටැ බුදු පාමොක් මහාසඞ්ඝයා වහන්සේට මහදන් දී වැළඳූ අතර මඞ්‍යයෙහි සවීඥයන් වහන්සේගේ ශ්‍රීපාදඝ වැඳැගෙණැ හෙවැ "සාමිනි! මේ අඟහස්දන හෙතුකොටැ ගෙණැ මම මතු සවීඥ කෙණෙකුන්ගේ පළමු ධම්දෙශනාව ම පිළිගත හෙම්ව යි" ප්‍රාර්ථනා කෙළේ.

ඒ අසා සවීඥයන් වහන්සේ නා සිතුවා නට ඉඩවේව යි වදාරා අනුමෙවෙනි බණ වදළ සෙයෙක. හෙතෙමේ දන්දී බණ අසාලා කරල් පලා හැරිගත්තාවූ සිස් හැල්කෙත බලන්නට යෙමි යි කියා ගියේ එකෙණෙහි ම ඔහු හදහා දුන්නා වූ

1 කෙළෙඹියෝ. 2 මල්.

දානයෙහි අනුසසින් සියලු හැල් කෙත කරල් පලපලා හැර ගත් මුහුනින් දෙ දියුණු තුන් දියුණු කරල් නැති සියලු හැල් කෙත ඉස්සන් ඉනිරිගිය මුහුදත් සේ සඬ්ඛ වලා වැනි ගිය අහසක් සේ රත්වූ කරලින් පිරී ගොස් මුහුදුන්නාවූ දානය පින් අනුමෝවන්නට වැදුම් ගෙණැ කර නමා ගෙණැ සිටින සේ කරල් බරින් නැම් ගොස් එකහෙළා හැල් ගැබ සලක් පැසෙන් නට වන.

හෙතෙම් දුරදිම හැල්කෙත දැකැ මා දුන්නාවූ දානය මෙසේ මහාඵල මහානිසංස දෙයෙක් වනැ සි පසාදවශ ප්‍රීතින් පිනා ගොස් දියුණු දියුණු එම දානයෙහි ම උත්සාහ ඇතිවැ සුලු සමයෙහි සුලු අගහස් දින. ගම් වැස්සන් හා කැවිවැ අගහස් මහදන් නම් දනක් දින. දන සමයෙහි වෙන ම දනක් දින. කොළකන්දෙහි ලන කලැ වෙන ම දනක් දින. කොළ නහන සමයෙහිදු වෙනම දනක් දින. කලපිට වී මැඩැ කැවි කරණ සමයෙහිදු වෙන ම දනක් දින.

කොටගෙට වී ගෙණ සමයෙහිදු එසේ ම මහදනක් දින. මෙසේ ඔහු නවවරෙක්හි නවමහ දනක් දෙන කල්හි කරල් හැරගත් තැන කරලින් පිරී යෙයි. වී හැරගත් තැන විසෙන් පිරී යෙයි. දන් දී මෙ නම් දෙයෙක් අධ්‍රුව්‍ය යනු නො විය. දන් දුන් සේ මෝහට වූ සමෘඩිය බලා සෙසු මහජනයා ද දානයෙහිම සොතසාහ වූහ.

ධම්ම නම් තමා රක්‍ෂා කළුවුන් රක්‍ෂා කරන්නේය.

"ධම්මෝ හවෙ රක්‍ඛති ධම්මචාරිං
ධම්මෝ සුචිණ්ණෝ සුඛමාවහාති
එසා නිසංසෝ ධම්මස්ස සුචිණ්ණස්ස
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී"

යනු හෙයින් ම දක්වනලද. මෙසේ ධම්ම නම් තමා රක්නා වුන් රක්නේය සි නිශ්චය කළා වූ සත්පුරුෂයන් විසින් ආනමාළු යට වෙන උපායා'නන්තරයක් නො සිතා පරාළුයට වෙන උපායා නන්තරයක් නො සිතා සුවයෙන් සුවයෙහි ප්‍රීතියෙන් ප්‍රීතියෙහි හැලී දුකෙකැ රස නො දැනැ අයතනයෙන් අභිමනාළු සිඛ කොටැ කෙළවරැ අමාමහ නිවන්සුව විඳිනා පිණිස දහම් සරණ යා සුතු.

මෙසේ බුලඤාල තෙම විපස්සි නම් සම්‍යක් සම්බුඩ සඞ්ඝ දරුවානන්ගේ කල්හි අග්‍ර ධර්ම පතා අහසස් දන් නවයක් දුන් නාහ. මෙයින් කප් ලක්‍ෂයකින් මත්තෙහි හංසවතිනම් නුවර ලොකොත්තරවූ ගුණ ඇති පදෙමාන්තර නම් සම්‍යක් සම්බුඩ යන් වහන්සේ දවසැ සත් දවසක් මහදන් දී ඒ සඞ්ඝදරුවන් ගේ ශ්‍රීපාදය වැදැ ගෙණැ හෙවැ අග්‍ර ධර්ම ප්‍රතිවෙධය පැතූහ.

මෙසේ පතා ක්‍රමයෙන් දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි ශ්‍රී අනුභව කෙරෙමින් අපගේ සම්‍යක් සම්බුඩයන් වහන්සේ දවසැ කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණවැ ශාක්‍යසිංහවූ මාගේ සඞ්ඝදරුවානන් දෙවතාවන්ගේ ආරාධනායෙන් මවු කුසැ පිළිසිඳැගෙණැ ක්‍රමයෙන් ලුම්බිනි වනයෙහි ප්‍රසූතවැ සාලවෘක්ෂමූලයෙහි වඩා ආ කල්හි සුඛොදන මහරජානන් වහන්සේ ලක්‍ෂණ පරීක්‍ෂා කරන්නට දක්වූ කල්හි මේ සඞ්ඝදරුවානෝ සවාසනා සඒ කෙලෙසයන් නසා බුදුවැ මුත් නො නවත්නා කෙණෙකැ යි දැනැ බුදුන්ගේ මහාභිනිෂ්ක්‍රමණයට පළමුවැ මහණවැ සහවූ රුද්දක් මහාවීර්‍ය කරන්නාවූ සඞ්ඝ දරුවානන් වහන්සේට උපස්ථාන කොටැ ඔවුන් වහන්සේ දුෂ්කර ක්‍රියායෙන් ඉෂ්ට යෙක් නැතැ යි මහා වීර්‍ය හැරැ ඖදාරික ආහාර අනුභව කොටැ ශරීරයෙහි බලගන්වන්නට පටන් ගත් කල්හි:–

1 එතෙකින් බුදුවිය නොහෙන වන්හ යි ශංසය කොටැ උරුවෙලායෙන් නික්මැ බාරාණසියෙහි ඉසිපතනාරාමයෙහි මිනදුයෙහි වැඩැ හිඳැ පසුව ක්‍රමයෙන් ශරීරයෙහි බලගන්වා වෙසඟ මැදි පොහෝ දවස් අජපාල මූලයෙහි වැඩැ හිඳැ සුජාතාවන්ගේ කිරිපිඬු පිළිගෙණැ නෙරඤ්ජරා නම් නදිතීරයෙ හිදී වළඳා ගඩොයෙහි පාත්‍රය හැරැ ශුභ නිමිත්ත පරීක්‍ෂා කොටැ පාත්‍රය උඩුගං බලා ගිය කල්හි එකාන්තයෙන් බුදුවෙ මි යි නිශ්චය කොටැ සල්වෙනෙහි දිවා විහාර කොටැ සවස් වේලෙහි දෙවියන් සැදූ මගින් බොධිමූලයට වැඩැ මහීකා නාව පලා ගෙණැ නැංගාවූ තුදුස්රියන් වර්‍ත්‍රාසනයෙහි මනඃශිලා තලයෙහි හිදගත් 2 කෙශර සිංහයක්හු සේ වැජඹවමින් සඞ්ගීය මනෝඥ පාතාලය යන ත්‍රිභුවනය තුන් මහල් එක ගඳකිළියක් සේ පූජාමය කෙරෙමින් වැඩහිඳැ පිඬුවූ නාක් දිව්‍ය බ්‍රහ්මයන් ලුහුබඳවා ගෙණැ ආවාවූ මරසෙනඟ

1 ඉසිසූන්. 2 හෘෂ්කර සිංහයක්හු සේ.

පහනෙහි නැසි හෙන පලඟුන් සේ තමන් වහන්සේගේ ප්‍රතාපයෙහි ගසා බිම් සැපිලියා කොටැ මරහු නැති **ගිරිමෙඛලා** නම් ඇත්තු අතින් **පාරලිය** වනයෙහි ඇත්තු කරණ වැදුම් පිදුම් සේ වූ වැදුම් පිදුම් ලදින්:-

දහසක් අතින් දහසක් ඇයුධ ගෙණැ දිවූ **වසවත්** මරහු තමන්ගේ අනුපම සත්‍ය විලාසයෙන් ලුහුබදවා ජයගෙණැ අරුණෝදයයෙහි සවාසනා සවීකෙලඟයන් නසා බුදුවැ ක්‍රම යෙන් සත්සති යවා **අජපාලයෙහි** වැඩැ හිදැ දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනා පිළිගෙණැ ශ්‍රීපාදය වැදැ ගෙණැ හොත්තාවූ සහම්පති මහා බ්‍රහ්මයාට ධර්මදේශනා කරණ බවට ප්‍රතිඥදී **ආළාරකාලාමයන්** හා **උදඋකරාම පුත්‍රයන්** නැති බව දැනැ වදාරා "ඉනිබ ආදී බණ කිවමනා පස්වග මහණුන්වයෑ, ඔහු දැන් කොහි වෙසෙද්දෝ හෝ"යි පරිඝාෂකොටැ.

බාරාණසියෙහි ඉසිපතනයෙහි මිගදායයෙහි වෙසෙති යි දැනැ 1 ශ්‍රීපාදයෙන් එතැනට වැඩැ ධර්මාසනාරූඪවැ මුළුලොව **එක පැහැරැ** අමායෙහි ගල්වමින් ජාතිදුකට ගිනි දෙමින් ජරා දුකට සෙන හෙළමින් ව්‍යාධි දුක් සහමුලිනුදුරමින් මරණ දුකට අපුනඋපව ප්‍රතිකාර කෙරෙමින් අෂ්ටා'ඛහමාගීය රාජමා ගීය කෙරෙමින් ශාන්ති පුරයට අටලොස් කෙළක් මහබඹුන් වදනා උතුසව පුර කෙරෙමින් අද දක්වා මින් ඔබ්බෙහි පස් වාදහසක් දක්වා වදාරන්නා තබා වදාළ පාළිය පොත් බලා පිරිවහන්නවුන් අතින් ඇසූ මා ඇතුළුවූ සියලු සතුන් දෘෂ්ට ධර්ම වේදය, අපරාපරීය වේදය, උපපද්‍ය වේදය, සියලු සම්පත්ති හා යොදමින් වදාළාවූ **ධර්මඝක් පැවතුන් සූත්‍රය** අසා අග්‍ර ධර්ම දේශ නා අසා අමා මහ නිවන් පසක් කළ සෙයෙක.

මෙසේ මේ ධර්මය නම් තමා පිරූ දවස් පටන් ගෙණැ අමා මහ නිවන් දක්වා සතළුවයා අත් නො හැරැ සියලු ඉෂ්ටයට මුල්ව සිටිනේයැයි දැනැ තමා වෙන වෙන ම සැපතට උතුසාහ නො කොටැ සියලු සම්පත්ති වදනා **මහාමාර** නවුදු සියලු සම්පත්ති පිටිවතුරු ගන්වන්නාවූ **අමෘතමහාමේඝ** නවුදු මෙම ධර්මයයැ යි නිශ්චය කොටැ තමා සිහිකළ විට ම සුව එළ වන්නාවූ ධර්මරත්නය සරණ යෙමි යි **දහම් සරණ** යා සුතු.

---

1 ශ්‍රීපාද ග්‍රන්ථයෙන්. ශ්‍රීපාදග්‍රන්ථයන්.

තවද දහම් සරණ යන්නාවූ සත්පුරුෂයන් විසින් ධර්මය තමා රක්නාවුන් රක්නා පරිදි හා සියලු සම්පත්හි සාධා දෙන පරිදි හා අසා දුනැ දහම් සරණ යාමෙහි උත්සාහ වඩනා පිණිස මේ කථානන්තරය දක්වමි. ඒ සාවධානවැ සහෞරවවැ ඇසියයුතු.

හේ කෙසේ ද? යත්:—

අනිතයෙහි මඟඛ රට මවල ගමැ එක් මාණවකයෙක් ගම ඇත්තවුන් කර්මාන්ත කරණ තැනට ගොස් තමා සිටින තැනැ පස් පසින් සම කොටැ කටු පහණ කසළ ආදිවූ දැඟ දුරු කොටැ රමණීය කොටැ ගෙණැ සිටියේ අනිකෙක් එතැනට අවුත් ඔහු අතින් ඇනැ 1 යතා පියා නෙමේ එතැනැ සිටැ ගත හෙතෙමේ ඔහු කෙරෙහි වෙෂයක් නො කොටැ තමා සිටි තැනින් පහවැ ගොස් අනික් තැනක් එසේම රමණීය කොටැ ගෙණැ සිටියේ එතැනැ සිටියාවූ ඔහුදු අනිකෙක් යතා එතැනැ සිටැ ගත.

හෙතෙමේ ඔහු කෙරෙහිදු කොපයක් නොකොටැ අනික් තැනක් රමණීය කොටැ ගෙණැ සිටියේ එතැනැ සිටියාවූ ඔහුදු අනිකෙක් යතා පියා සිටැ ගත. ඒ ඔහු කෙරෙහිදු කොපයක් නොකොටැ අනික් තැනක් ඉදිකොටැ ගෙණැ සිටියේ. මෙසේ ආ ආ මිනිස්සු ඔහුට ගෙඩි දී සිටි සිටි තැනින් නෙරපා පියා තුබූ තුබූ සිටගත්හ.

හෙතෙමේ හැම හැමදෙනා කෙරෙහි ම මෛත්‍රී කොටැ මා නිසා මෙතෙක් දෙන සුවසේ සිටිඝහ. මේ මට මෙලොවින් පරලොවින් ඉෂ්ට සාධා දෙන්නාවූ කුශල කර්මයක් වුව මැනවැ යි සිතා දෙවන දවස් උදැසනක්සේම නැඟි සිටැ උදැල්ලක් හැරැ ගෙණැ කලව්ටි මැඩිල්ලක් සාතැන් රමණීය කොටැ සම කෙළේය. එදවස් එතැන්හි බොහෝ දෙන අවුත් සිටගත්හ. ඒ තෙමේ එහි සිටියාවූ ඔවුන්ට සිත, සමයෙහි සිත දුරුකරණ පිණිස ගිනි දල්වා දින.

ඉක්බිති යහපත් තැනෙහ් නම් හැමදෙනාට ම ප්‍රියවන. මා මෙතැන් පටන් ගෙණැ මහමං සකස් කොටැ හැමදා මැනවැයි සිතා උදැසනක්සේම නැඟි සිටැ උදුරා හැරැ පියයුතු කසු

1 ගඟාපියා.

මුල් ආදිය ද උදුරා දුරුකැඳියුතු කටු පහණ ආදි දුරුකොටැ මහ මං සම කෙරෙයි. ඔහු එසේ කරන්නාහු අනිකෙක් දැකැ "යහළු තොපි කරන්නේ කිමෙක්ද"යි විචාළේ. හෙතෙමේ මට සියලු සම්පත්හි සාධා දෙන්නාවූ සසරැ සිරිතෙන් මානයෙහි දෙව්ලොව හැරැ සිටුවන්නාවූ කෙළවරැ අමා මහනිවන්හි සිටුවන්නාවූ සියලු සුවයට මූලකාරණ වූ මඟ 1 සම කෙරෙමි යි කියා කිව.

ඒ අසා "මෙසේ වූ ඉෂ්ටයක් නොපි කරා නම් ඒ ඉෂ්ටය මටත් වන බව යහපත් වේ ද? මමත් තොප හා කැටිවැ මෙම ඉෂ්ටය සාධමි"යි හෙද ඔහු හා කැටිවැ එම කුශල කර්මය කරන්නට පටන්ගත. එතැන් පටන් දෙදෙනා එක්වැ එම කුශල කර්මය කරන්නාහ. ඔවුන් දැකැ අනිකෙකුදු එසේම පටින් ගත. අනිකෙකුදු පටන් ගතැ යි දෙනිස් දෙනෙක් එක් වූහ. ඔහු හැමදෙනා හුදලු ආදිය හැරැ ගෙණැ මහ මං සකස් කරන්නාවූ යොදුනක් යොදුනක් නැන් යන්නාහ.

ඔවුන් මෙසේ කුසල් කරන්නවුන් දැකැ එගමට වැඩිමහළු තැනැත්තෝ "මේ මනුෂ්‍යයෝ නොකට යුත්තෙහි යෙදී ඇවිදිනාහ. හැම දෙන ම මට වලින් මනුෂ්‍යමාංශාදීන් ගෙණෙන් නම් හෝ රා ඉදිකොටැ ගෙණෙන් නම් හෝ අනිස් එබදුවූ සුදුසුවූ කර්මාන්තයක් කෙරෙත් නම් හෝ මටත් කිසි ලාභයක් වන්නේයැ යි සිතිය. එසේ සිතා කුසල කර්මයෙහි යෙදී වසන මිනිසුන් දැකැ කැඳවා කුමක් කොටැ ඇවිදුදැ යි විචාළෝය.

ඒ අසා මනුෂ්‍යයෝ "සැමිනි! අපි දෙව්ලොවට යන 2 මහවත් හෙළිකරම්හ යි කිහ. ඒ අසා ගම් වැඩිමහළු මනුෂ්‍යයෝ මෙසේ වූ නොකටයුතු කුමක් පිණිස කරා ද? වලින් මාංශාදිය හෝ ගෙණෙව මැනව. සුරා කර්මාන්තාදී හෝ කළ මැනවැ යි කිහ. ඔහු කී අනාචාර බස් නොගිවිස්සහ. ඒ නැවත නැවත කියා ද ගිවිස්සා ගත නොහී රජ්ජුරුවන් කරා ගොස් "සැමිනි! බොහෝ සොරු එක්වැ ගෙණැ ගම් පැහැරැ ඇවිදිනි යි කිහ. ඔවුන් අල්ලා ගෙණැ එවයි කී කලැ අල්ලා ගෙණැ ගොස් රජ්ජුරුවන්ට පැය.

---

1 හෙළිකරම්. 2 මහමං.

රජ්ජුරුවෝ කිසිවක් නො විචාරා ම මද නැඟි ඇතුන් ලවා තුලුන් මඩවා පියව සි කීහ. ඒ අයා හැමදෙනාට වැඩිමහළු මෂ නම් මාණවක තෙම සෙස්සවුන්ට "දරුවෙනි! අපට මෙතැනට මෙත්‍රී මුත් අනිස් සරණෙක් නැත. තෙපි කිසිකෙණෙකුන් කෙරෙහිත් කොප නො කොටැ අප මරවන රජ්ජුරුවන් කෙරෙහි ද අප නො කළ වරද කළහ සි කී ගම් වැඩිමහල්ලා කෙරෙහි ද අප මඩනට දිවන ඇතු කෙරෙහි ද අප අපගේ ආත්මයෙහි ද සම සිත්ව සි කියා ඔහු මෙසේ ම මෛත්‍රී කරන්නට පටන් ගත්හ.

ඉක්බිති ඔවුන් පිළිවෙළින් සිටුවා මතැත්හු මෙහෙයුහු මදයෙන් අඬවැ සුරා පානයෙන් දියුණු වූ ක්‍රොධ ඇති ඒ ඇත් තෙම තමාගේ සෙය තමා අන්මින් ඇත් ගොවුවන් ලුහුබදවමින් බලවත්වූ වෙගයෙන් දිව ගත්තේ ඔවුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් විදුරු පව්වෙක්හි ගැසී නැවැත්තාක්හු සේ මහත් වූ ඝකන ඝමෙක්හි ඇනී සිටියක් සේ සිටියේ. රජ්ජුරුවෝ එපවත් අසා බොහෝ මිනිසුන් දැකැ හසින් නොවන්නා වනැ සි මොවුන් වෙන වෙනම කළාලින් වසාලා මඩවා පියව සි කීහ. ඒ අසා ඔවුන් කළාලින් වසා ඇතුළ ලා ලූහ. ඔහුද ආදියට වඩා ලා දියුණුවූ මෛත්‍රී කළහ. ඇත් 1 ආදිවිටට වඩා ශත සහස්‍රගුණයෙන් පසුබස්නට වන.

රජ්ජුරුවෝ එපවත් අසා මේ කාරණයක් වූවමැනවැ සි නෙත්වා ඔවුන් නොසොර බවත් සුචරිතයෙහි තත්පරවැ වසන බවත් ගම්මුදලිහු වෛරයෙන් නී බවත් අසා "දරුවෙනි තොපගේ ගුණ තිරිසන්වූ ඇත් පවා දත. මිනිස්වූ ඇපි දුන ගත නුහුනුවම්හ. අප නො දැනැ කළ වරද ඝමා කරවසි ඝමා කරවා ගම්මුදලිහු ඔවුන්ට ගැති කොටැ දී ඇත්හු ඔවුන්ට නැගෙන්ට ප්‍රසාද කොටැ දී එම ගම ද ඔවුන්ට බම් පූජා කොටැ දින.

ඔහු මෙතෙක් බම්පූජා ලදින් මේ අපට අපගේ 2 සුචරිත බලයෙන් ඉහ ජාතියෙහි ම ලද්දාවූ සම්පත්තිය එහෙයින් අපට මෙතෙක් සම්පත්තියට කාරණවූ කුශලකම් නොපමාව කළමැනවැ සි දියුණු දියුණු කරන්නට පටන් ගත්හ. මෙසේ බම්ය නම් ඉහ ජාතියෙහි ම සත්තවයාහට රාජ භයය හසුනි

1 ආදියට. 2 සුචරිත බම්යෙන්.

හයය මරණභයය යනාදිවූ සියලු භය දුරුකොටැ සියලු සම්පත්හි එළවන්නේය යි දත්තාවූ සත්පුරුෂයන් විසින් කුශල කර්මයෙහි ප්‍රමාද නොවී මහ පොළොවට වඩා සත්ත්වයාහට පිහිටවූයේ ධර්මය ම යැයි දැනැ සෑණයෙකින් ම සියලු අභිමතාර්ථ සාධා දෙන පිණිස **දහම් සරණ යා සුතු.**

මෙසේ මේ ජාතියෙහිම තමන් කළ කුසල්හි පල ලද්දාවූ ඒ දෙනිස් දෙන වාරයෙන් වාරයෙහි ඇතු නැඟි යන්නාහු ඉහ ජාතියෙහි කළ කුසල් පල ලද්දාවූ අප අප්‍රමාද නොවැ වඩ වඩා කුසල් කළමනා වේ ද? එහෙයින් අපි හැමදෙනම එක්වැ ගෙණැ සතර මං සඤ්ඤයෙහි බොහෝ දෙනා සැතපෙන්නට සුදුසුවූ ශාලාවක් කරවම්හ යි මනත්‍රණය කොටැ කර්මාන්ත දන්නාවූ 1 වඩුවකු කැඳවාලා ශාලාවක් කරවන්නට පටන්ගත්හ. ගැහැණුන් කෙරෙහි අධිකවූ ඇල්මක් නැති හෙයින් කරවන ශාලාවෙහි 2 පින් ගැහැණුන්ට නුදුන්හ.

මෂ මානවකයන්ගේ ගෙයි **නඤ්ඤය චිත්‍රාය සුධර්මාය සුජාතාය** යන අඹුවෝ සතරදෙනෙක් ඇත. ඔවුන් අතුරෙන් **සුධර්මා** නම් අඹුතොමෝ ශාලාවෙහි කර්මාන්ත කරන්නාවූ වඩුවා හා මනත්‍රණය කොටැ "බැණෙනි! මේ නගන්නාවූ ශාලාවට මා නායක කොටැ ගණුව යි කියා අත්ලස් දුන. ඒ "යහපතැ"යි කියා ගිවිසැ පළමු කොටැ ම කැණී මඩලයට ගන්නාවූ දුවය දියබහා වියලා ගෙණැ සැස පියා විද පියා කැණී මඩල ඉදිකොටැ "මේ ශාලාව **සුධර්මා** නමැ"යි කැණී මඩලෙහි අකුරු කොටා කඩෙකින් වසා තබා ශාලාවෙහි කර්මාන්ත කරවන මාණවකයන් කැඳවා මම මෙතෙක් දවස් සිහි නැතිවැ කැණී මඩලෙහි සඤ්ඤ නොකිමි. 3 ඉනිඛ අලුත් දණ්ඩක් කපා කැණී මඩලයක් කොටැ ගන්ට කල්නැත පෙරම කොටැ තුබූ කැණී මඩලයක් ඇති නැතැනකින් සෙව්ව මැනවැයි කීය.

ඔහු සොයා ගෙණැ යන්නාවූ සුධර්මාවන්ගේ ගෙහි කැණී මඩලක් දැකැ දහසක් දී ඉල්වූහ. හෝ තොමෝ දහසකට නොදී මුව ශාලායෙහි පින් දෙව් නම් කැණී මඩල දෙමි යි කිව. ඒ අසා ඔහු ඇපි ගැහැණුන්ට පින් නො දෙම්හ යි කීහ. ඒ අසා වඩුතෙමේ "ඛඩ්ලොව තබා සෙසු ගැහැණුන් නැති

1 වඩුවන්. 2 ඛම්. 3 ඉනිඛ්ඛ.

නැනෙක් නැත. ගැහැණුන් කුසල්හි එක් නො කරන්නේ කුමක් පිණිස ද? පින් දී කැණේ මඩල ගත මැනවැ"යි කීහ. ඒ අසා ඔහු කැණේ මඩල ගෙණැ ශාලාව නිමවා තුණක් කොටැ බෙදූ එක් භාගයෙක්හි අනාථයන් වසන නැනක් ඉදිකළහ. එක් භාගයෙක්හි සුව පතුන් වසන නැනක් ඉදිකළහ. එක් භාගයෙක්හි රෝගීන් වසන නැනක් ඉදිකළහ.

දෙතිස් දෙනම දෙතිස් කොළඹුවක් තබා ඇතුළට ආගන්තුකයෝ අවුත් යමක්හුගේ කොළඹුවෙහි හුන්නෝ වී නම් ඔවුන් උන්ගේ ගෙට ම ගෙණයාසි සංඥකළහ. ඉක්බිති එකී පරිද්දෙන් ඇරැගෙණැ ගිය කල්හි තමන් තමන්ගේ කොළොඹුවෙහි හුන්නවුන්ට තුමූ තුමූ උපස්ථාන කරන්නාහ. **මඝමාණවකයෝ** ශාලාවට නුදුරු නැන්හි කොබෝල්ලිල ගසක් හිඳුවා ඒ මූලැ බොහෝ දෙනා හිඳිනට පහණක් ලූහ.

ඉක්බිති නන්දා නම් අඹු **සුධර්මා** නම් අඹුතොමෝ තමන්ගේ ශාලාවට නිමිවැ ගත්තාහ. මාත් එක් කුශලයක් කළ මැනවැ සි සිතා ශාලාවට 1 වනුවන්නන් පැන් බොන පිණිස තමන්ගේ නමින් **නන්දා නම් පොකුණක්** බිඳුවූහ. **චිත්‍රා**තොමෝ මා කළමනා කිම් දෝ හෝසි සිතන්නී ශාලාවට වැදූ සැනපී යනවුන් මල් පැලැඳැ යන පිණිස මල් වත්තක් කරවූව. සුජාතාවෝ තොමෝ ඉතිරියන් කුසල් කටදී මඝමාණවකයන්ගේ නැදිමයිලන් දරු අඹුවෙමි. උන් කළ කුසල් මට එන්නේ වේදූ සි කිසි කුසලක් නො කළාහ.

මෙසේ මඝමාණවකයෝ මවුන්ට උපස්ථාන කිරීමය පියන්ට උපස්ථාන කිරීමය කුලෙහි වැඩියන්ට ආදර කිරීමය සබා බස් කිමය නොරළු කොටැ බිණීමය කේලාම් නොකිමය මසුරු නොවීමය වෙළී නොවීමය යන මේ කුශලධර්ම සතෙහි ඉපදී ඒ ජාතියෙන් චුතවැ නිදූ පුබුදු එකක්ඛ සේ තව්තිසා දෙව්ලොව ශක්‍රදෙවෙන්ද්‍රවැ උපන්හ.

මෙසෙයින් කුසල් නම් දෙය කළ ජාතියෙහිදූ සියලූ උපද්‍රව දුරු කොටැ 2 සුව විඳ දෙවන ජාතියෙහිදූ කැමැති සම්පත්හි සාධා දෙනබව දත්තාවූ සත්පුරුෂයන් විසින් ධර්මයමුත් සතනවයාහට අනික් සරණෙක් නැතැ සි දැනැ ඉන්‍ද්‍රජාලයෙහි පානා දෙයක් සේ සියලූ අභිමතාර්ථ වහා සාධන පිණිස **දහම් සරණ ඇති සුතූ.**

---

1 අවවුන්. 2 සුව දී.

මෙසේ ඔහු ශක්‍ර දෙවෙන්ද්‍රවැ උපන් කල්හි ඔහු හා කැටිව කුසල් කළ මිත්‍රයෝ ද එහි ම දිව්‍ය පුත්‍රව උපන්හ. මොවුන්ගේ නියොගයෙන් ශාලාව කළාවූ වඩුතෙමේ විශ්වකර්ම දිව්‍ය පුත්‍රව උපන. එ සමයෙහි තව්තිසා භවනයෙහි අසුරයෝ වසන් නාහ. ඔහු අහිනව දිව්‍යපුත්‍රයෝ උපන්හ යනු අසා දිව්‍ය සුරාපාන සැදූහ. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ තමාගේ පිරිස කිසිවක්හු නොබොන පිණිස 1 සංඥ කෙළේය. අසුරයෝ පානයෙන් මත්වූහ.

ශක්‍රයා මොවුන් හා එක්වැ වළඳන රාජ්‍යයෙන් මට ප්‍රයොජන කිම්දැ සි පිරිසට ඉහි කොටැ ඔවුන් 2 කකුල් අල්වා මහා සමුද්‍රයෙහි ගස්වා පියා ඔවුන්ගේ කුසල්හි ආනුභාවයෙන් මහ මෙර යටැ **අසුරවිමානය** පහළවිය. ශක්‍රදෙවෙන්ද්‍රයාට හිය ජානියෙහි මෂ මාණවක කලැ කළ සුචරිතයෙහි ආනුභාවයෙන් දසදහසක් යොදුන් **තාවතිංසා** දෙවිනුවර පහළවිය.

ඒ දෙවිනුවර මැදෙහි හිය ජානියෙහි මිනිසුන් සැතපෙන්නව ශාලාව කැරැවූ අනුසසින් තුන්සියයක් යොදුන් උස ඇති ඛවජයෙන් හොබනාවූ සත්සිඳයක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදය පහළවිය. එහි රනයටැ මැණික්මය දද කෙළනේය. පබලුමය යටැ මුතු දද කෙළනේය මුතුමය යටැ පබලුමය දද කෙළනේය. සත්රුවන් යටැ සත්රුවන් දද කෙළනේය.

මෙසේ ශාලායෙහි අනුසසින් සපත රනනමයවූ වෛජයන්ත ප්‍රාසාදය පහළවිය. මිනිසුන් සැතපෙන්නට හිදුවාලූ කොබෝලීළ ගස අනුසසින් සිසාරා යොදුන් සියයක් පමණ එව ඇති පරසතු රුක පහළවිය. ඒ ගසමුලැ මිනිසුන් සැතපි ඉන්නට ලූ ගල අනුසසින් පරසතු රුක්මුලැ දිග සැටයොදුන් පළල පණස් යොදුන් බොළ පහළොස් යොදුන් **පාණ්ඩුකම්බල සිලාසනයක්** පහළවිය.

මනුෂ්‍ය ලොකයෙහි සිටි සමයෙහි ඔවුන්ගේ නියොගයෙන් ශාවකයන් පිටින් ගෙණ හිය ඇත් **එරාවණ** නම් දිව්‍ය පුත්‍රවැ උපන. හෙතෙමේ ශක්‍රයා උයන් කෙළනට යනකලැ දෙතිස් දෙනා හිඳිනව හවු හවු පමණ වටඇති දෙතිස්කුඹක් ම

1 ආඥ කෙළේය. 2 කකුල් ගස්වා.

වන්නේය. මැද ශක්‍රදෙවෙන්ද්‍රයා හිඳනට සුදර්ශන නම්වූ නිස් යොදුන්වූ කුඹක් මවන්නේය. ඒ කුඹ මත්තෙහි දෙලොස් යොදුන් රුවන් මණ්ඩපයක් මවන්නේය. හෙතෙමේ ධ්වජපතාකා කිංකිණීක ජාලාදිවූ නොයෙක් අලඞ්කාරයෙන් හොබනේය.

මණ්ඩප මධ්‍යයෙහි යොදනක් පමණ මිණි පලඟක් වන්නේය. ඓරාවණ තෙමේ මේ දෙනිස් කුඹින් එකෙකී කුඹකට දළසත සතම වන්නේය. එහි එකෙකී දළ පණස් පණස් යොදුන් දිග ඇත්තේය. එහි එකී දළැ සත් සත් දිවපොකුණු වන්නේය. එකෙකී පොකුණෙහි සත්සත් නෙලුම් ඟසය, එකෙකී ඟස්හි සත් සත් නෙලුම්මල, එකෙකී මල්හි සත් සත් පෙනිය, එකෙකී පෙත්තෙහි මධුරවූ නෘත්‍ය ගීත වාද්‍ය පවත්නාවූ දිව්‍ය සත්‍රිහු සත් සත් දෙනාය, මෙසේ හාත්පසින් පණස් යොදුන් පමණ තැන්හි ඇතුගේ දළින් එකරගමඬල වන්නේය.

මේසේ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ 1 බුදුතුඩෙකිනුදු කියා නිමවා පිය නොහැකි සම්පත්හි නිබඬ කොටැ තුන් කෙළහැට ලක්ෂයක් හවුරුදු අනුභව කරන්නේය. මහමං හැමදැ එක ශාලාවක් නඟා එක පොකුණක් කරවා මගිනට උපස්ථාන කළ මානුයෙකින් ශක්‍රදෙවෙන්ද්‍රවැ උපන්නාවූ ඔහු ලද්දාවූ සම්පත්හි ඇසූ සත්පුරුෂයන් විසින් සියලු සතුවයාහට ධර්මයමුත් අනික් සරණෙක් නැතැ යි නිශ්චය කොටැ මෙලොවින් පරලොවින් නිවන් හිම් පහරවා සියලු සම්පත්හි සාඩා දෙන පිණිස **දහම් සරණ** යා යුතු.

සුධර්මා ද මියගොස් එම නඳිනිසා භවනයෙහි ම උපන. එසමයෙහි නවසියයක් යොදුන් පමණ සුධර්මා නම් වූ දිව්‍ය සභාව පහළවිය. සියලු දිව්‍ය ලොකයෙහි ඒ දිව්‍යසභාවට වඩා රමණීයවූ අන් ස්ථානයක් නැත. මසින් මසට අටදවසක් බණ ඇසිම ද එහි ම පවත්නේය. නන්දා ද මිය ගොස් එහි ම උපන. ඇ ගිය ජාතියෙහි 2 කැණවූ පොකුණ පහළවිය. චිත්‍රා ද මිය ගොසින් එහි ම උපන. ඇට ද ගිය ජාතියෙහි කැරැවූ මල්වත්තෙහි අනුසසින් පන්සියයක් යොදුන් පමණ චිත්‍රලතාවනය පහළ විය.

---

1 බුදුමුවෙකිනුදු. 2 කැරැවූ.

සුජානාවෝ වනාහි මියැ ගොසින් තමා විසින් කළ නොසුකුසලයක් නැති හෙයින් එක් පළිනයක් අස කදුරෙක්හි කණකෙකිනිවැ උපන. ශක්‍රදෙවෙන්‍රුතෙමේ තමන්ගේ පරිවාර සත්‍රින් බලා **සුබම්‍රා** ය **නන්‍රා** ය **චිත්‍රා** ය යන තුන්දෙනා දැකැ **සුජානා** කොයි ගොසින් උපන් දෝ හෝ යි කියා බලන්නේ ගිය ජාතියෙහි කුසලක් නො කොටැ කණකෙකිනිවැ උපන් බව දැකැ ඈ ලවාත් කුසල් කරවා මෙහි උපදවා ගතමැනවැ යි සිතා තමන්ගේ ශක්‍රාතම භාවය හැරැ අනික් වෙසක් මවා ගෙණැ ඒ කණකෙකින්න හුන් තැනට ගොස් "තෝ මෙහි කුමක් කොටැ වෙසේද"යි විචාළේ.

හෝ තොමෝ "සැබැමිනි! තොපි කවුරුදැ යි විචාළාය. ඒ අසා ශක්‍රදෙවෙන්‍රුතෙම "මම ගිය ජාතියෙහි නිට සැම්වූ මෂ **මාණවක සෙමි**"යි කිව. ඒ අසා කණකෙකිනී "සැබැමිනි! නෙපි කොයි උපනුදැ යි විචාළා. ශක්‍රදෙවෙන්‍රුතෙමේ මම ගිය ජාතියෙහි කළ කුසලින් තව්තිසා භවනයෙහි අසාධාරණවූ සම්පත්හි ඇති ශක්‍රදෙවෙන්‍රුවැ උපනිමි. නි හා කැවිවැ මට අඹුවැ 1 විසූ **සුබම්‍රාව** හා **නන්‍රාව** හා **චිත්‍රාව** හා උපන් තැන් දන්නිදැ යි කියා නො දන්මි. සැබැමිනි!යි කී කල්හි ඔහු ද තමන් කළ කුසලකම්යෙන් මියැ මට අඹුවැ දිව්‍යස්‍රිවැ උපන්හ. ඔවුන් බලන්නට වරෙයි ඈ අත්ලෙහි හිඳුවා ගෙණැ ගොස් නන්‍රා නම් පුෂ්කරණී තෙර හිඳුවාලා අනික් තුන්දෙනා කරා ගොස් සුජානාව කුසල් නො කොටැ වූ නියා බලවයි පෑය.

ඔහුද, "ගිය ජාතියෙහි කුසල් නො කොටැ ශරීර මණ්ඩනය ම කොටැ ලත් තුඩත් බලව. නියමට කල පයක් බලව යි යනාදින් වෙහෙසන්නට පටන් ගත්හ. හෝතොමෝ ශක්‍රදෙවෙන්‍රයා ආවවුට "මොහු මා වෙහෙසති; මා ගෙණ ගොස් මගේ පොකුණෙහි ම ලා පියව"යි කිව. ශක්‍රදෙවෙන්‍රතෙමේ ඈ පොකුණෙහි හිදවාලා නිගේ යෙහෙළියන් කුසල් කොටැ දෙව්ලොව්හි උපන්බව දුටු බැවින් තෝ ද මා කී අවවාදයක් කොටැ පන්සිල් රක්‍ෂාකර යි පන්සිල් දී ගියේ.

හෝ ද තමා ගත්තාවූ පඤ්චශීලයෙහි අප්‍රමාදවැ එතැන් පටන් ගෙණැ මළ මසුන් මුත් නොමළ මසුන් නො කයි. ශක්‍රතෙමේ ඈ පරීක්‍ෂා කරණ පිණිස මළමස් වෙස්මවා ගෙණැ

1 වුත්ත.

හොත්තේය. කණකෙකිනී මේ මළමසෙකැ යි ගලන්නට පටන් ගත. එසමයෙහි නකුට සලාලීය. හෝතොමෝ නො මළ වනැ යි හළ. නැවත ඇගේ අභිමුඛයෙහි බඩ පැලා හොත. නැවත හෝතොමෝ ගලන්නට වන.

හේතෙමේ උගුරට වදනා කලැ නකුට සලාලීය. එවිට හැරපුව. මෙසේ ඈ පරීක්ෂා කොටැ ශක්‍රදෙවේන්‍ද්‍රතෙමේ දිව්‍ය තම්භාවයෙහි සිටැ නී මම පරීක්ෂා කරන්නට ආමි යි මෙසේ ශීලය රක්ෂා කෙරෙහි නම් නො බොහෝ කලකින් දිව්‍යලොකයෙහි මා සම්පයෙහි ම උපදනේ වෙහිදැ යි කියා ගියේ හෝ ද මළමසුන් ලැබිම් දුලීභ හෙයින් ආහාර නො ලදින් මියැ තමා රැකි සිලයෙහි අනුසසින් නිරිසන් යොනියෙන් ගැලවී බ්‍රාහ්මණයිගෙහි කුඔල් ගෙයක කුඔලකුට දුවවැ උපන.

ඈ පහළොස් සොළොස් හැවිරිදි විය‍ට පැමිණී කල්හි ශක්‍රදෙවෙන්‍ද්‍රතෙමේ කොයි උපන්දෝ හෝයි පරීක්ෂා කරන්නේ කුඔල් ගෙයි උපන් බව දැනැ මා දැන් ඔබ ගිය මැනවැයි සිතා කැකිරි 1 පලසේ සත්රුවන් ගැලක් පුරා ඒ ගැල පැදගෙණැ බ්‍රාහ්මණයිගට වැදූ කැකිරි ගන්ව යි හඬහඬා මිලගෙණ අවන්ට "මම අනික් මිලයකට නො දෙමි; පන්සිල් රක්නා කෙණෙකුන් ඇත දෙමි යි කියා කුඔල්දුව අවුදින් සිල්රක්න කෙණෙකුන්ට දෙනහොත් මට දුන මැනවැ යි කී කල්හි නි පිණිස ම මා ගෙණ ඛනය යි සත්රුවන් ඇට දී තමා ශක්‍රදෙවෙන්‍ද්‍ර බව 2 දන්වා අප්‍රමාදවැ සිල් රක්ෂා කරව යි කියා දෙව් ලොවට ගියේ.

හෝ නොමෝ ඒ ජානියෙහි අඛණ්ඩ පඤ්චශීලය රක්ෂා කොටැ එයින් චුතවැ තමා රැකි ශීලයෙහි අනුසසින් අසුර භවනයෙහි අසුරෙන්‍ද්‍රයාහට දුවවැ සියලු අසුරභවනයෙහි තමා හා සමවූ රූපයක් ඇති අනික් සත්‍රියක් නැතිවැ සියලු සම්පත්තීන් සමෘඩ්ධව. ඔය ජානියෙහි නො කළ කුසලින් කණකෙකිනිවැ ඉපදූ අමු කුඩමස්සන් කා ජීවත්වෙමින් සත්පුරුෂයන්ගේ අවවාද පිළිගෙණැ රක්ෂා කළාවූ සිලයෙහි අනුසසින් ක්‍රමයෙන් මේසා සම්පත්තියක් ලද බැව් ඇසූ සත්පුරුෂයන් විසින් ලොකයෙහි සත්වයාහට ඛේදය මුත් අනික් පිටිවහලක් නැතැ යි නිශ්චය කොටැ සියලු ඉෂ්ටයට සියලු සම්පත්තියට

1 සක්සේ. 2 සඟවා.

සියලු සතෙකුගයට සියලු අධිපත්‍යයට මූලකාරණවැ සිටියාවූ ධර්මය අපට සරණය යි නිශ්චය කොටැ **දහම් සරණ යා සුතු.**

ඉක්බිති ඇගේ පිය **වෙපචිත්ති** නම් අසුරෙන්ද්‍ර තෙමේ විවාහ පිණිස ආ අසුරයන්ට නෙපි මාගේ දියණියන්ට නුසුදුස්සව යි ඇ කිසිවක්හට නොදී මාගේ දියණියෝ තුමූ ම තමන් හට සුදුසු සැමි කෙණෙකුන් සොයා ගණිති යි කියා අසුර සෙනාව රැස්කරවා නෙපි ම නොපට සුදුසු කෙණෙකුන් සොයා නන්ව යි කියා ඇ අනට මල්දමක් දුන. එකෙණෙහි ශක්‍ර දෙවෙන්ද්‍රතෙමේ සුජානා කොයි උපන් දෝ හෝ යි බලා එප වත් දැනැ ඇ දැන් මා හොසින් ගෙණෙව මැනවැ යි මහලු අසුර වෙසක් මවා ගෙණැ පිරිස් කෙළවර සිටියේ.

හෝ නොමෝ නමාට සුදුසු සැමියකු සොයම් යි ඔහු දැකැ ගිය ජානියෙහිවූ පුරුදුකමින් ඇතිවූ බලවත්වූ සෙනහය එතුරක් සේ මැඩැ ගෙණැ එත් එත් මට සුදුසු සැමිහු නම් මොහුම ඇයි අනැ නුබු මල්දම ඔහු කර බහාලූහ. අසුරයෝ ද "අපගේ රජ්ජුරුවෝ මෙතෙක් දවස් අප නුසුදුස්සහ යි නුදුන්හ. දැන් දියණියෝ තමන්ගේ මුත්තණු කෙණෙකුන් වැනි මහල්ලා සුදුස්සායැ යි නෝරා ගත්හ. 1 මෙහමය උන් සුදුසු"ඇයි අපහාස කෙරෙමින් නික්මුණහ.

ශක්‍රදෙවෙන්ද්‍රයාද සුජානාවන් අත අල්වා ගෙණැ ආකාශයට පැන නැඟි ශක්‍රාත්මය මවා ගෙණැ මම ශක්‍රදෙවෙන්ද්‍රයා යැයි හඬ ගසා පියා නික්මින. ඒ හඬ අසා අසුරයෝ අප බැඳිය. ඔහු ගණුම්හ යි සියලු අසුර සෙනාව හැරැ ගෙණැ ලුහු බදවා ගත්හ. ඒ වේලෙහි **මාතලි** සඬ්ගාහකතෙමේ **වෛජයන්ත** රථය සදා ගෙණැ අවුත් අතරමග සිට ගත. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ රථයට නගා ගෙණැ නවිහිසා පුරයට අභිමුඛවැ නික්ම ගත.

එසේ අසුර භයින් දුවන්නාවූ ශක්‍රයා හිඹුල්වනයට ලඟවැ ගිය ක්ෂණයෙහි වෛජයන්ත රථයෙහි සක්හඬ ඇසූ ගරුඬ පොතකයෝ භයපත්ව හඬන්නට පටන් ගත්හ. ශක්‍රතෙම් හඬන ගරුඬ පෝතකයන්ගේ ශබ්දය අසා මේ කුමක්දැයි විචාරා රථසක හඬ අසා භයපත්ව හඬන්නාවූ ගරුඬ පොතක

1 ඒ එසේමැයි.

යන්ගේ ශබ්දය යනු අසා මා හුදකලා එකස්හුගේ ජීවිතය පිණිස මෙතෙක් දෙනාට දුක් කුමක් පිණිස දෙමි ද? මාගේ ජීවිතය නැසිත් මොවුන්ට භය දුරුවන බව යහපතැ යි සිතා මාතලිහට "මාතලිය! අනුන්ට දුක් දී රක්ෂා කරන්නාවූ ජීවිත යෙන් අපට ප්‍රයොජන නැත. රථය මේ මහින් වළකා අසුර යන් දිසාවට ම මෙහෙයව යි කීය.

ඒ අසා **මාතලිතෙමේ** දහසක් සෙකිවයන් යෙදූ වෛජ යන්ත රථය පෙරළා අසුර සෙනාව අභිමුඛ කොටැ පැලිය. පස්සෙහි දිවන්නාවූ අසුර සෙනාව වෛජයන්ත රථය පෙරළී දිවන්නා දැකැ අසුර පුරයෙහි පටන් ගෙණැ බිඳිහියාවූ රථය පසු නොබලා දිවැ දැන් පෙරළී සිටගත. නියතයෙන් ම දිව්‍ය සෙනාව අවන්හ යි බිඳි හොස් එකපැහැරැ අසුරපුරයට හොස් රථය දිසාව පෙරළී බලන්නට ද නො පොහොසත් වූහ. ශක්‍ර දෙවෙන්ද්‍රයා ද සුජාතාවන් දෙව්ලොවට ගෙණැ හොස් අඩු තුන්කෙළක් අඹුවන්ට අහතැන්හි තැබිය.

හෝ ද ශක්‍රදෙවෙන්ද්‍රයා කරා එළඹැ "සාමිනි! මට මේ දිව්‍ය ලොකයෙහි මවුපිය කෙණෙක්වත් බැහැණි බුහුනන් කෙණෙක්වත් නැත. නුඹ වහන්සේ යම් තැනකට වඩනා වේලෙහි මා ගෙණැ මුත් නො වැඩිය මැනවැ යි වර ඉල්වූව. හෙතෙමේ යහපතැ යි ප්‍රතිඥ දින. මෙසේ වසන සමයෙහි අසුරයෝ අප වසන්නේ දිව්‍ය පුරයෙහිමයැයි සිතන්නාහු චිත්‍ර පාටලී වෘක්ෂයෙහි මල්පිපී යන්නාහ. මේ දෙව්ලොව නොව නැයි ශක්‍රයා අප බැඳිවන. ඔනු හොසින් ගණුම්හ යි සෙනාව හැරැ ගෙණැ නික්මුණහ.

ශක්‍රදෙවෙන්ද්‍රතෙම එනැන්හි මුහුදු දියෙහි නයින් රැක වල සිටිවිය. ඉක්බිත්තෙන් ගුරුළන් සිටිවිය. ඉන් මත්තෙහි කුම්භාණ්ඩයන් සිටිවිය. ඉන් මත්තෙහි සතර දිගැ සතර වරම් මහරජ්ජුරුවන් සිටිවිය. **නවතිසා** භවනයෙහි නුවරැ දොරැ වජ්‍රායුධ ගත්තාවූ තමා වැනිවූ ශක්‍රප්‍රතිමා සිටිවිය. අසුරයෝ කෙතෙක් ජයගෙණැ අවි නමුදු ඉන්ද්‍රප්‍රතිමා දුටු පස්සෙහි බලා පියන්නට අසමර්ථවැ බිඳි හොසින් ශක්‍රයාහට ජය ගෙණැ දෙන්නාහ.

මෙසේ මේ ශක්‍රයා ගිය ජාතියෙහි මඝමාණවකවැ නමා සිටිනට පහළාගත් නැනැ සිවුපිය නොනී අනුන් අතින් ගෙඩි කෑ පරිදි කෙසේ ද? දුගිවැ මහමං හැමදෑ කළාවූ සුචරිත යෙහි බලයෙන් ලද්දාවූ දෙදෙව් ලොව සම්පත්හි හා ප්‍රසාද හා උයන් හා පොකුණු හා අඹුතුන් කෙළක් අඹුවන් හා රථ හා හසතින් හා සියලු සමෘඩීන් ඇසූ සත්පුරුෂයන් විසින් උපන් සතුවයාගේ සුව විඳිනට ධර්මයමුත් අනික් ගත්‍යන්තරයක් නැති බව දැනැ සියලු සුව එයින් ම සිඛෘකාවැ සියලු අනිමත ඔට එම සම්පත් වාර නැසෙත්‍ර කොවැ අනවරතයෙන් **දහම් සරණ යා සුතු.**

තවද සුචරිත ධර්මය සතුවයා රැකො කරණ පරිදි දන්නා කැමැති සත්පුරුෂයන් විසින් මද ධර්මයකින් බොහෝ රැකො හා බොහෝවූ සමෘඩි හා වන බව දිව්‍ය සම්පත්තියෙන් හා ආයු ශක්තියෙන් හා පිරිනී ආ ශක්‍රදෙවේන්ද්‍රයා සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳැ ගෙණැ හොත් සුචරිත මාත්‍රයෙකින් ලද්දාවූ තුන් කෙළ සැට ලක්‍ෂයක් අවුරුද්දට ආයු හා දෙදෙව්ලොව දිව්‍ය සම්පත්හි හා තුදුස් කෙළක් ප්‍රාණීන් හා කැටුවැ ලද්දාවූ අමෘත මහා නිර්‍වාණසම්පත්හි හා අසා ප්‍රාණ විනාශයෙක් තුබූ තැනෙක්හි සම්පත්හි පිරිනීමක් වන්නට තුබූ තැනෙක්හි සංසාරයෙන් ගැලෙවෙන්නට සුදුසුවූ උපායාන්තර යක් සිතන තැනෙක්හි එළඹැ සිටි අන්තරාය දුරුකරන්නට සුදුසුවූ ද පිරිහෙන සම්පත්හි සථිර කොවැ ලන්නට සුදුසුවූ ද සසර පමණින් නුහුන්විරූ අමෘතමහා නිර්‍වාණ රසය අනුභව කරන්නට සමර්ථවූ ද සඞ්ඝමය ම අපට සරණ යැයි එකඟ සිතින් ඇදහිලි ඇති සිතින් **දහම් සරණ යා සුතු.**

මෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා ආයුශක්තියෙන් පිරිනී දිව්‍ය සම්පත්හින් පිරිනී අවුත් සම්‍යක් සම්බුඩයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳැ තමාගේ සම්පත්හි නැවත ලදින් අමෘතමහා නිර්‍වාණ රසානුභව කොවැ නිර්‍ව සැනසී අභිමතාර්‍ථ සාධාගත් පරිදි කෙසේ ද? යත්:—

එක් සමයෙක්හි ධර්මස්වාමිවූ ධර්මධ්වජ වූ දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ භගවත් අර්හත් සම්‍යක් සම්බුඩවූ ගොතම ගොත්‍රයෙහි උපන් අනාවරණඥාන ඇති සර්‍වාඥදරු වානන් වහන්සේ මගධ ජනපදයෙහි **රජගහානුවරම** පැදුම්

දිස්ගි අඛිසණ්ඩ නම් බමුණුගමට උතුරු දිස්ගි ඉන්ද්‍රශාල නම් ගුහායෙක්හි වැඩවසන සෙයෙකැ. එසමයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර යාහට සම්‍යක් සම්බුඩයානන් වහන්සේගේ ශ්‍රීපාදය දැකැ නිවී සැනසී ගත මැනවැ යි අභිප්‍රායයෙක් ඇතිවිය.

මෙහි ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ සවීඥයන් වහන්සේ බොහෝ සේ ම දන්නේය. ඒ ශක්‍රදෙවෙන්ද්‍රයා නොමැදවූ දෙවතා සන්නිපාතයෙක් සවීඥයන් දැවස නැත. සියලු දෙවතාවන් කෙරෙන් ශක්‍රයා සමාන අප්‍රමාදවූ දෙවපුත්‍රයෙකුදු නැත. එසේ කල්හි සවීඥයන් දක්නට නොහිය විරු එකක් හට මෙන් සවීඥයන් දක්නට උත්සාහ කුමක් පිණිස උපන්නේ ද? යත්:—

එසමයෙහි වනාහී ශක්‍රදෙවෙන්ද්‍රයාගේ ආයුෂය ක්ෂීණ විය. හෙතෙම් 1 පඤ්චචූළී නිමිත්තයන් උපන්කල්හි මාගේ ආයුෂ ක්ෂය වියැයි දත. යම් දෙවපුත්‍ර කෙණෙක් සුළුපටු කුශලකර්මයෙන් දෙවලොකයෙහි උපන්නා ද ඔහු මෙයින් චුත වැ කොයි උපදුමෝ දෝ හෝ යි භයින් ත්‍රාසාපන්න වෙති. යම් කෙණෙක් බොහෝ කුසල් කොටැ දිව්‍ය ලොකයෙහි උපන්නා ද ඔහු තමන් විසින් දෙනලද දන් ද රක්නාලද සීල ද කළ භාවනාද දැකැ මෙයින් චුතවැ මත්තෙහි දිව්‍ය ලොකයෙහි ඉපදී මහත් වූ දිව්‍ය සම්පත්හි අනුභව කරම්හ යි සිතා භය නැති වන්නාහුය.

ශක්‍රදෙවෙන්ද්‍රයා වනාහී මරණාවූ පූර්වනිමිති දැකැ දස දහසක් යොදුන් පමණ ඇති දිව්‍ය නගරය ද දහසක් යොදුන් උස ඇති **විජයොත්** පහය ද තුන් සියයක් යොදුන් උස ඇති සුධර්ම දෙව් සහය ද යොදුන් සියයක් උස ඇති පරසතු රුක ද සැට යොදුන් පමණ පාණ්ඩුකම්බල ශෛලාසනය ද අඩුතුන් කෙළක් නාටක ස්ත්‍රීන් ද දෙදෙව්ලොව දිව්‍යපෂීත් ද **නන්දන** වනය ද **චිත්‍රලතා** වනය ද **පාරුෂක** වනය ද යන මේ ආදීවූ සියලු සම්පත්තිය බලා මාගේ මේ මහත්වූ සම්පත්තිය නස්නේ යැයි භයින් ත්‍රාසාපන්න විය.

ඉක්බිත්තෙන් යමෙක් මාගේ හෘදය නිශ්‍රිතවූ ශොක ශල්‍යය උදුරා මේ ගිය සම්පත්තිය තරකරන්නට ශ්‍රමණයෙක්

1 පඤ්චමහා පූර්වනිමිත්ත.

වත් බ්‍රාහ්මණයෙක්වත් බ්‍රහ්මයෙක්වත් මේ ලෝක ඇද්දෝ හෝ කි පරීක්ෂා කරන්නේ අනික් එක් කෙණෙකුන් නොදකා සච්ඡයන් වහන්සේ සම්‌බුදු වූ දැනැ සච්ඡයෝ වනාහි අප වැනි දහසක් දෙනාට උපන්නාවූ ශොක දුරුකොටැ සම්පත්තිය සථිර කරන්නට සමර්‍ථයෝ යැයි සිතා සච්ඡයන් දැක්ම පිණිස උතුසාහ ඉපද වියැ යි දතයුතු.

මෙසේ සච්ඡ දර්‍ශනයෙහි උත්සාහවූ ශක්‍රදෙවේන්‍ර සියලු සත්‍වයාහට උපන් භය, දුරුකරන්නට සමර්‍ථ වූ භගවත් වූ අර්‍හත් වූ සම්‍යක් සම්බුදු වූ අනාවරණඥාන වූ සමන්තචක්‍ඛුස් ඇති සර්‍වාම්දරුවෝ දැන් කොයි වසන සේක් දෝ හෝ කි පරීක්ෂා කරන්නේ මගධ මණ්ඩලයෙහි රජගහනුවරට පැදුම් දිග අම්බසණ්ඩ නම් බ්‍රාහ්මණ ග්‍රාමයට උතුරුදිග වෙදිස නම් පර්‍වතයෙහි ඉසිගිලි නම් ගුහාවෙහි වැඩවසන සෙයෙකැ යි දැනැ දෙදෙව්ලොව දෙවතා හා කැවිවැ යන පිණිස "නිදුක්නි! සියලු සත්‍වයන්ට උපන් භය දුරු කරන්නට සමර්‍ථ වූ සච්ඡයන් වහන්සේ දක්නට යෙමි. නෙපිදු හැමදෙන මා හා කැවිවැ එව"යි කැඳවිය.

මෙයට පළමු කොටැ ශක්‍රදෙවේන්‍රතෙම සච්ඡයන් සරල ග්‍රාමයෙහි වැඩවසන කල්හි තෙමේ හුදකලාවැ සච්ඡයන් දක්නා පිණිස යැයි හිතේ. සච්ඡයෝ ද මොනුගේ ඥාන්‍ය තව පිරිපක්ව නුවුයේ කිපදවසක් හිඳකලැ ඉසිගිලි ගුහායෙහි වාසයකරණ කල්හි පඤ්චපූර්‍ව නිමිත්ත දැකැ මරණ භයින් ත්‍රාසවැ චාතුම්මහාරාජිකා ය, තාවතිංස ය යන දෙදෙව්ලොව දෙවතාවන් හා සමග එළඹැ ප්‍රඥා තුදුසක් විචාරා කෙළවරහි 1 තුදුස් කෙළක් පමණ දෙවතාවන් හා සමග සෝවාන් පෙලෙහි පිහිටන්නේ යැයි සිතා අවකාශ නොකොටැ වදාළ සෙයෙක.

හෙතෙම එහෙයින් මා හුදකලාව හිඳ හෙයින් සච්ඡයෝ පළමු අවකාශ නොකොටැ වදාළදැ ය. එකාන්තයෙන් මාගේ මාර්‍ගඵලයට උපනිශ්‍රයෙක් නැතිවන. එක් කෙණෙකුන්ගේ මාර්‍ගඵල ප්‍රතිවේධයට උපනිශ්‍රයෙක් ඇති කල්හි චක්‍රවාට පර්‍යන්ත කොටැ සිටි පර්‍ෂදට ද සච්ඡයෝ ධර්‍මදේශනා කොටැ වදාරණ්දැ ය. දෙදෙව්ලොව දෙවතාවන් අතුරෙන් නියත කොටැම

1 අසූ දහසක්.

කිසි කෙණෙකුන්ගේ උපනිශ්‍රය ඇති වන්නේය. සවීඥයෝ ඔහු නිසා ධර්මදේශනා කොටැ වදාරණ දැය. ඒ අසා මම මාගේ දෙම්නස් සංසිදුවම්හි කිතා තමාට සහාය භාවය පිණිස ඒ දෙවතාවන් කැඳ වියැයි දනගනුතු.

හේ දෙවතාවෝ ද "දෙවරිනි! සවීඥයන් දක්නා පිණිස යමිහ. බුඩොත්පාදයෙක් නම් දුලබය. යම් හෙයකින් නෙපි "පවිතක්‍රීඩාවට යමිහ. නදී ක්‍රීඩාවට යමිහ"යි යනාදින් නොකියා අප මෙබඳු වූ සථානයෙහි සොඳ ද එහෙයින් නොපට ඉඳටයෙක් වේව"යි කියා ඒ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනය උත්තමාඩහයෙන් පිළිගත්හ. ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රතෙම පඤ්ච ශිඛ දිව්‍යපුත්‍රයා වෙන ම උපස්ථාන කොටැ කැඳවා ගෙණැ තව්තිසා වැසි දෙවියන් විසින් පිරිවරණ ලද්දේ බලවත් පුරුෂයක්හු දික්කළ අතක් වක් නොකරණතුරු වක් කළ අතක් දික් නොකරණතුරු තව්තිසා භවනයෙන් අන්තර්ධානවැ වෙදිස පළුනයෙහි පහළවිය.

මෙහි පඤ්චශිඛ නම් ගන්ධර්වදිව්‍යපුත්‍රයා වෙන ම කුමක් පිණිස ශක්‍රමදවෙන්ද්‍රතෙමේ කැඳවූ ද? යත්:-

නමාට සවීඥයන්ගේ අවකාශ කරණ පිණිසය. ඒ ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ. දෙදෙව්ලොව දෙවතාවන් ගෙණැ නමා ම සවීඥයන් වහන්සේ කරා එළඹෙන බව සුදුසු නොවෙයි. මේ පඤ්චශිඛ නම් ගන්ධර්ව පුත්‍ර වනාහී සවීඥයන් වහන්සේ කෙරෙහි වලඳහයහ. කැමැති කලවිටැ ගොසින් ප්‍රශ්න විචාරණ අසම එහෙයින් මොහු පළමුකොටැ සවීඥයන් සමීපයට යවා මොහු විසින් කරවනලද අවකාශ ඇත්තෙම් සවීඥයන් කරා එළඹැ ප්‍රශ්න විචාරම්හි කිතියය. මෙසේ අවකාශ කරණ පිණිස ඒ පඤ්චශිඛයා වෙන ම කැඳවියැ යි දනගනුතු.

ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රයා දෙවතාවන් හැරැ ගෙණැ වෙදියපවිතයට වැද ගිරියකල්හි සිංහල පවිතය එක පැහැරැ කප්ගිනිගත් රුවන් මෙරක් සේ දිලිනි නිසේ. ඒ පවිතය සමීපයෙහි ගම්වල මිනිස්සු ද ආලොකය දකිමින් ලොමුදැහැගත් නාවූ ශරීර ඇතිවැ ඒ ආලොකොත්පත්තියට හෙතු සොයන් නාහු 1 අනික් හෙතුවක් නොදැකැ මහෙශාක්‍ය දෙවතාවක් නෝ මහාබ්‍රහ්මයෙක් හෝ අද සවීඥයන් ප්‍රශ්න විචාරණ

1 සිතන්නාහු.

පිණිස ද බණ අසන පිණිස ද ආවනැ සි සිතා අපට වූයේ මහත් වැඩලාභයෙක. යම් හෙයකින් මේ දෙවතාවන් ශ්‍රද්ධා දුරුකරන්නාවූ සවීඥයෝ අපෙ‍ගේ ග්‍රාමය සමීපයෙහි විහාරයේ වාසය කෙරෙද්ද ඇපිද ඔවුන්ට උපස්ථාන කරන්නට ලබ මෝ ද එහෙයින් අපට වූයේ මහා ලාභයෙකැ සි සිතා උපන් නාවූ සොම්නසින් ගතවූ රොමොදගම ඇත්නාහු දෙහොත් මුදුනෙහි තබා වැඳ සිටියහ.

ඉක්බිති ශත්‍රුදෙවෙන්‍ද්‍රතෙම මරණ භයින් භයපත්වැ අවිනු දිනු දිනිදු බුදුන් වහන්සේ වැඩහුන් තැනට නො විචාරා වැදැ පිය නොනී පඤ්චශිඛ නම් ගන්ධර්ව පුත්‍රයා කැඳවා "පඤ්ච ශිඛය! තුන්ලොවට එකාචාර්‍යවූ එකස්වාමිවූ සවීඥයන් වහන් සේ වැඩහුන් තැනට අපසේ වූවන් නො විචාරා වැද්ද නොහැක්ක. නෝ ගොසින් සවීඥයන් වහන්සේ‍ගේ සිත් දැනැ පහදවා අප ආ බව දන්වා අවකාශ ඉල්වා එව" යි කියා යැවීය. ඒ අසා පඤ්චශිඛ ගන්ධර්ව පුත්‍රතෙම තමාගේ සඞ්ඛ්‍යමය වූ 1 පුෂ්කරණී ඇති ඉන්‍ද්‍රනීල මණ්මයවූ දඬුඇති රජතමයවූ තත් ඇති ප්‍රවාලමය වූ 2 වෙඡ්චක ඇති තුන් ගවුවක් පමණ 3 බෙ දඬු විණව අල්වා ගෙණැ සවීඥයන් වහන්සේ වැඩහුන් **ඉඤ්ජ ශාලාගුහාවම** එළඹැ මෙතැන මා සිට ගෙණැ විණව ගයන කලැ බුදුන් වහන්සේට නුදුරු නොව 4 ලඟැයි සිතා බලා සිටැ ගෙණැ විණව ගය ගයා බුද්ධගුණ යුක්තවූ ද ධර්මගුණ යුක්ත වූ ද සඞ්ඝගුණ යුක්තවූ ද තමාගේ සිත ඇති කාමගුණ යුක්ත වූ ද ගාථා කියා විණව ගයන්නට පටන් ගත.

ඔහු කී ගාථා මෙසේ දතයුතු.

"වන්දෙ තෙ පිතරං භද්දෙ! නිච්චබ්‍රහ්මං සුරිය වච්චසෙ!
යෙන ජානාසි කල්‍යාණි ආනන්‍ද ජනනී මම!

වාතොව 5 සෙදනං කන්තෙනා පාණියංව පිපාසිතෙ
අඩ්ඨිරසි! පියා මෙසි! ඛන්තිමා අරහතා'ම්ව.

ආතුරයෙසව භෙසජ්ජං භොජනං ව ජිඝච්ඡතෙ
පරිනිබ්බාපය මං භද්දෙ! ජලන්ත ම්ව වාරිනා.

සිනොදකිං පොක්ඛරණිං ඡන්නං කිඤ්ජක්ඛරෙණුනා
නාගෙ ඝම්මා'භි තන්තොව ඔගහෙ තෙ එන්‍ද්‍රදරං!

1 පුෂ්කර 2 වෙඡ්චක. 3 බෙලුව පාණ්ඩු. 4 ලඟැයි. 5 සෙදකං-සෙවනං.

අච්චඬකුසෝ ව නාගොව ජිතමෙම තුතත තොමරං
කාරණං නපපජාන්‍යාම් සම්මතෙතා ලකඛණූ රුයා 1

නඞි ගතිත විතෙතා'සම් චිතතං විපරිණාමිතං
පටිගනතුං න සකෙකාමි! වඬක ඝසෙනාව අම්බුජෙ

වාමොරු සජ මං හදෙද! සජ මං මනුලොචනෙ!
පළිඝසජ මං කලතණී! එතමෙම අභිපතථිතං

අපපකො වත මෙ සනෙතා කාමො වෙලලිත කෙසියා
අනෙක භාවො සම්පාදි අරහනෙතව දකඛිණ

යමෙම අතථී කතං පුඤඤං අරහනෙතසු තාදිසු
තමෙම සබබඩහකලතණී තයා සඛිං විපචචතං!

යමෙම අතථී කතං පුඤඤං අසමිං පුථවි මණඩලෙ
තමෙම සඛඩඛකලතණී තයා සඛිං විපචචතං!

සකයපුතෙතාව ඣානෙන එකොදි නිපකො සතො
අමතං මුනි ජිගිංසානො තමහං සූරිය වචචසෙ

යථාපි මුනි නනෙදය පතවා සමෙබාධිමුතතමං.
එවං නනෙදය කලතණී මිසසිහාවඩගතො තයා!

සකෙකා ච මෙ වරං දජා තාවතිංසාන මියසරෙ
නාහං හදද වරෙයතහෙ එවං කාමො දළෙහා මම!

සාලංව න චිරං ථුලලං පිතරං නෙ සුමෙධසෙ
වනදමානො නමසසාමි! යසස සෙ තාදිසි පජා".

මෙසේ ඔහු ඒ කියා විණ ගැයූ කල්හි ත්‍රිභුවනයෙහි 2 ප්‍රශංසම්පන්නයන් කෙරෙහි අග්‍ර වූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ!-"පඤචසිඛය! තාගේ විණයෙහි තත හඬ හා කණය මධුරනාදය හා දෙක හැනෙයි. මේ රත්නත්‍රයයෙහි ගුණ හා කාම ගුණ හා එක් කොටැ ගාථා 3 කවරෙක් බැන්දෙහි ද"යි විවාළසේක.

ඒ අසා පඤචසිඛ ගඹුවී දිව්‍යපුත්‍රතෙම "සවාමීන් බුදුවැ උරුවෙලායෙහි නෙරඤජරා නදිතීරයෙහි අජපාල නිග්‍රොධ මූලයෙහි වසන කලැ මම තිමාරැ නම් ගඹුවී පුත්‍රයාගේ දූ වූ

1 ලකඛණූදශ. 2 විෂ. 3 කවරකල.

නමින් **සද්‍දා** නම් වූ ශරීරප්‍රභායෙන් සූයඃමණ්ඩලය වැනි වූ හෙයින් **සුරියවච්ඡසා** නම් වූ දිව්‍යසත්‍රිය කෙරෙහි සෙනහ ඇත්තෙමි. ඕ මා හැරැ පියා **මානලි** නම් දිව්‍යපුත්‍රයාගේ පුත් වූ **ශිඛණ්ඩි** නම් දිව්‍යපුත්‍රයාට සෙනහ කෙරෙයි. මම ඈ කෙසේ ලැබ ගණිම් දෝ හෝ යි සිතා අනික් උපායාන්තරයක් නොදැකැ මම් ම මාගේ විණාව හැරැ ගෙණැ මා සිනෙහැති තැනැත්තියගේ පිය වූ **තිම්බරු** නම් 1 ගන්ධර්ව රාජයා කරා ගොස් විණාව ගයා මේ ගී බැඳැ ගෙණැ කිමි යි දැන්වීය.

මා මෙසේ නුඹවහන්සේගේ ගුණ 2 කියා විණා ගැයූ කල්හි මා සෙනහකරන්නාවූ **සුරියවච්ඡසා** නොමෝ මා සිටි තැනට අවුත් තා ගුණ කියා විණා ගැයූ සර්ව්ඥයන් වහන්සේගේ නම් ඇසූ විරූ බවමුත් ඉදුරා නොදුටු විරිමි. නොප මෙබඳු වූ බුදුගුණයක් කියා මා සිත සතුටුකළ බැවින් මමත් තා සිත සතුටුකෙරෙමි යි අද එක දවසක් මා හා කැටුවැ වසව යි එක් වටෙන මා හා කුම්සැප අනුභවකළා. එදා පටන් ගෙණැ අද දක්වා නැවත ඒ සුව නොලද්දෙමි යි දැන්වීය.

ඉක්බිත්තෙන් මෙසේ බුදුන් වහන්සේ හා **පඤ්චසිඛයා** හා බණත් බණත් ශක්‍රදෙවෙන්‍රතෙම මාගේ මෙහෙවර ගියාවූ පඤ්චසිඛතෙම ඒ තබා පියා තමාගේ සිත ඇති දුක් බුදුන් වහන්සේට දන්වයි. විද්දතු නම් විළි නැත්තාහ. බැණැ බැණැ සිටැ අනික් විකාරයක් දක්වී නමුත් නපුරැ යි සිතා පඤ්චසිඛයා කැදවාලා ''පඤ්චසිඛය! නෝ සර්ව්ඥයන් වහන්සේ කරා එළඹැ ''සාමිනි! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සාම්දරුවන්ගේ ශ්‍රීපාද වඳ''යි මාගේ හා දෙවියන්ගේ වැඳි මෙන් බුදුන් වහන්සේ වැඳැ ගෙණැ හෝ''යි කිය.

ඒ අසා **පඤ්චසිඛතෙම** සර්ව්ඥයන් වහන්සේ කරා එළඹැ 'සාමිනි! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සාම්දරුවන්ගේ ශ්‍රීපාද වඳ''යි වැඳැ ගෙණැ හොත්තේය. සාම්දරුවෝ ඒ අසා ''දිව්‍ය මනුෂ්‍යාදිවූ සියලු සත්ත්වයෝ ම සුව කැමැත්තාහ. එහෙයින් අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙන්‍රතෙම සුවපත් වේව''යි වදාළසේක. ඉක්බිති ශක්‍රදෙවෙන්‍රතෙම සර්ව්ඥයන් විසින් අනුදන්නා ලද්දේ **ඉන්ද්‍රශාල** ගුහාවට වැඩ සර්ව්ඥයන් වහන්සේ වැඳැ එකත්පස්වැ

1 ගාන්ධර්ව දිව්‍යරාජයා කරා. 2 කිය කියා.

සිටියේ තව්තිසා වැසි දෙව්යෝ ද ඉඳුශාල ගුහාවට වැඳ සළිඳුයන් වහන්සේ වැඳැ එකත්පස්වැ සිටියෝ.

එසමයෙහි දෙවතාවන්ගේ ආනුභාවයෙන් සම නොසම වූ ඉඳුශාලගුහාව එක පැහැරැ සම්වැ හිඳියේය. හකවූ ඉඳුශාල ගුහාව මහත්වී හිඳියේය. අඳුරුවූ ඉඳුශාලගුහාව එක පැහැරැ 1 ආලොකවැ හිඳියේ. ඉක්බිති ශක්‍රදෙවෙඳුයා එසේ සිටි සම යෙහි සළිඳුයන් වහන්සේ "බොහෝ වූ පඤ්චකාමානුභව ඇති බොහෝ වූ දෙවතාවන්ගේ 2 විනිසව ඇති ශක්‍රදෙවෙඳුයා අප කරා මනුෂ්‍යලොකයට ආ බව ඉතා ආශ්චර්‍ය යැ"යි වදාළසේක.

ඒ අසා ශක්‍රදෙවෙඳුතෙම "සවාමීනි! මම සවාමීන්ගේ ශ්‍රී පාද දකින්ට එනු කැමතිවැ හුන් නමුදු තව්තිසා වැසි දෙව් යන්ගේ නොයෙක් කටයුත්තෙහි හී ගෙණැ සවාමීන් දක්නට එන්නට නොපොහොසත් විමි. තව ද එක් සමයෙකැ සවාම් දුරුවෝ **සැවැත්නුවර සරලාගෘහයෙහි** වැඩ වසන සෙයක. එසමයෙහි මම සවාමීන් දක්නා පිණිස යැයි **සැවැත් නුවර** හිඳෙමි. එසමයෙහි සවාම්දරුවෝ එක්තරා සමාධියකින් යුක්තවැ වැඩහුන් සෙයෙක.

"එසමයෙහි **වෛශ්‍රවණ** මහරජ්ජුරුවන්ට පාරිවාරිකාවූ 3 **භූඤ්ජති** නම් දිව්‍යසත්‍රියක් සවාම්දරුවන් ශ්‍රීපාද වැඳ වැඳ එකත්පස්වැ සිටිය ඉක්බිති මම ඒ භූඤ්ජති නම් දිව්‍යසත්‍රියට "නඟ! අමාත්‍යයන් හා පරිවාර සහිත වූ ශක්‍රදෙවෙඳු තෙමේ සවාම්දරුවන්ගේ ශ්‍රීපාද හිස් තබා වඳී"යි කියා මාගේ වැඳි මෙන් වඳුව"යි කියා කීමි. මා එසේ කී කල්හි භූඤ්ජති නම් දිව්‍යසත්‍රිය "සළිඳු සවාම්දරුවෝ සමාධියකින් වැඩහුන් සේක. එ වේලෙහි සළිඳුයන් වහන්සේගේ ශ්‍රීපාදය දක්නට කල් නොවේ"යි කිව.

"ඈ එසේ කී කල්හි මම ඈට "නඟ! එසේ වුවහොත් සවාමීන් සමාධියෙන් නැඟි 4 නිකම් හුන් වේලෙහි "අමාත්‍ය යන් සහිත වූ පරිවාර හා සමඟ ශක්‍රදෙවෙඳුයා සවාම්දරුවන් ගේ ශ්‍රීපාද තමා මුදුනෙහි තබා වඳී"යි කියා මාගේ වැඳීමෙන් වඳුව"යි කීමි. ඈ මාගේ වැඳීමෙන් ශ්‍රීපාදය වැඳිබව සවාම් දරුවන් සිහිකොටැ වදාරන්නේ ඇද්ද?යි දුන්විය.

---

1 ආලෝක සහිතවිය. 2 විනිසම-විනිශවය. 3 භූඤ්ජති. 4 නික්ම.

ඒ අසා සඟමිදරුවෝ "ශක්‍රදෙවෙන්‍ද්‍රය ! ඒ භූසඤ්ඤි නම් දිව්‍යසත්‍රිය තාගේ වැඳිමෙන් මා වැඳුබව සිහි කෙරෙම්. තවද මම එදවස් තාගේ රථයෙහි නිම් වළල්ලෙහි හඬින්ම ඒ භාව නායෙන් නැහෙම්"යි වදාළ සෙයෙක. ඉක්බිති ශක්‍රදෙවෙන්‍ද්‍ර තෙමේ සඟමිනි ! සම්‍යක් සම්බුඩයන් වහන්සේ ලෝකයෙහි උපන් කල්හි අසුරකාය පිරිහෙයි. දිව්‍යලොකයෙහි දෙවතාවන් විසින් පිරිහී යෙයි කියා අපටත් පළමුව උපන් දෙවතාවන් අතින් ඇසූ විරිමි. දැන් ඒ මාගේ ඇසින් ම ප්‍රත්‍යක්ෂ කොටැ දිටිමි. සඟමිදරුවන් උපන්නැන් පටන් ගෙණැ අසුරකාය පිරිහී ගියේ. දෙවතාවන් විසින් දෙව්ලොව පිරී ගියේ.

"තවද, මෙම කපිලවාස්තු පුරී ශාක්‍යකුලයෙහි උපන් 1 ගොජිකා නම් රාජකන්‍යාව බුඩ රත්නයෙහි ධම් රත්නයෙහි සඩ්ඝ රත්නයෙහි පහන. ශීලය සම්පූණී කොටැ රක්‍ෂා කළා. හෝ තොමෝ ගැණුබැවිනි කලකිරී පුරුෂත්වයෙහි ලොභ කොටැ කාය හෙද මරණින් මත්තෙහි සුගතිවූ සඟීලොක යෙහි තව්තිසා වැසි දෙවියන් කෙරෙහි උපන. එහි උපන් නාවූ ඔහු 2 ගොජක දිව්‍යපුත්‍ර යැයි කියා නම් හෙයින් සියලු දිව්‍යපුත්‍රයෝ දත්හ. අනික් භික්‍ෂු තුන්දෙනෙකුදු සඟමින්ගේ ශාසනයෙහි බඹසර රැකැ කාය හෙදයෙන් මරණින් මත් තෙහි ඡඤ්ඣි දෙවනිකායෙහි උපන්හ.

"ඔහු ද සිත්කලුවූ පඤ්චකාම සුඛානුභව කෙරෙමින් අතර තුරෙහි ඇ කරා උපස්ථානයට යන්නාහ. එසේ ආවාවූ ඒ දිව්‍යපුත්‍රයන් තුන්දෙනා දැකැ ගොජක නම් දිව්‍යපුත්‍රතෙම "කොල! තෙපි සඟීඥයන් වහන්සේගේ බණ කවර දිසාවට ඔනුණ ලා ලා හිදැ ඇසූ ද? මාසේ වූ ගැණීයක් පොවා තුණු රුවන්හි කළ ප්‍රසාද මාත්‍රයෙකින් ගැණු බැවින් මිදී පිරිමිවැ ශක්‍රදෙවෙන්‍ද්‍රයාට පුත්වැ උපන්මි. තෙපි වූ කලි සඟමිදරුවන් ගේ ශාසනයෙහි බඹසරවස් රැකැ පවා හීනවූ ඡඤ්ඣි නිකාය යෙහි උපන්නව. තොප සේ වූවවුන් ඇසැ පහළ සේ ම නපුරු සි කියා.

"ඒ අසා තුන්දෙනා කෙරෙන් එකෙක් එම දිව්‍යලොක යෙහි කාමානුභව කෙළේය. දෙදෙනෙක් ඔතුගේ බස් අසා සංවෙගයට පැමිණැ භාවනා වඩා බ්‍රහ්මපුරොහිත නම් බ්‍රහ්ම

1 ගොපිකා ගොසිකා. 2 ගොපක.

පුරයෙහි උපන්හ. ඉක්බිති ඒ **සොජඤ** නම් දිව්‍යපුත්‍රතෙම "සාමීනි, මනුෂ්‍යලොකයෙහි පඤ්චකාමයෙන් ඉක්මැ පැවැත් නාවූ ශාක්‍යසිංහවූ සම්බුදුරු කෙණෙක් ඇත. උන් ගේ දරුවූ මේ දෙවතාවෝ තුන්දෙන හීනවූ ගන්ධර්ව නිකාය යෙහි උපන්හ. එයින් දෙදෙනෙක් මාගේ බස් අසා සංවේග යට පැමිණැ භාවනා කොටැ **බ්‍රහ්මපුරෝහිත** නම් බ්‍රහ්මලොක යෙහි උපන්හ. මෙසේ ජාතියකින් ජාතියකට ගියවුන් පවා ඒ ධර්මය සිහිකළ ක්ෂණයෙහි බ්‍රහ්මාත්මභාව ලබන කල්හි එම ජාතියෙහි ඔවුන් අභිමුඛයෙහි හිදැ බණ අසන්නවුන්ට කවර නම් සැකයෙක් නිබේ ද? එසේ හෙයින් සතර ආශ්‍රවයන් දුරු කළාවූ සම්බුදුරජාණන් වහන්සේ දත්තාවූ පඤ්චමාරයන් දිනු වාවූ සම්බුදුරජාණන් වදුළුහ"යි මට කිව.

"මෙසේවූ ධර්මයෙහි අනුසස් දත්තාවූ මම ඒ ධර්මයෙහි කළ හැදහිල්ලෙන් ඒ ධර්මය පසක් කෙරෙමි යි යන සිතින් ආමි. ඉදින් අවකාශයක් ලදිමි නම් සාමිදරුවන් ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙමි"යි දැන්විය.

ඒ අසා සාමිදරුවෝ "මේ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ සිත බොහෝ කලක් ශුද්ධවැ තුබුයේ. මෙ තැන්හි ප්‍රශ්නයක් විචාරා නම් හිත කාරණයක් මුත් අහිත කාරණයක් නො විචාරයි. තමා විචාළ ප්‍රශ්නය මා විසඳූ කලැ ද වහා දැන ගන්නී"යි සිතා වදාරා **මඝෞෂධ කුමාර** කාලයෙහි ද **සමිඳව කුමාර** කාලයෙහි ද තමන් නගහාවැ සිටැ විසඳ ප්‍රශ්න තුන්ලෝවැසියන්ට උගහට හෙයින් **සකුණ ජාතකයෙහි** පක්ෂිවැ සිටැ විසඳූ ප්‍රශ්න අනුන් හෝ මහාබ්‍රහ්මවැ සිටැ කියන්නට නො පිළිවන් හෙයින් සංශයක් නැතිවැ:–

"ශක්‍රදෙවෙන්ද්‍රය! නෝ කැමැති යම් ප්‍රශ්නයක් අප විචාරා. ඇපි අපගේ සම්බුදුනාඟනයෙන් කිරා පියා ධර්මයට අර්ථයට අවිරුද්ධ කොටැ නා සිත් සනහා දුඃඛිතයන්ගේ දුක් නිවන්නා කැමැති අපගේ මනොරථය මස්තකප්‍රාප්ත කොටැ විසඳම්හ"යි වදාළ සෙයෙක.

ඉක්බිති සම්බුදුරුවන් වීසින් කරණලද්දාවූ අවකාශ ඇති ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ ප්‍රශ්න විචාරන්නේ:–"සාමීනි! සමහර මනුෂ්‍යකෙණෙක් වෛර සහිතවැ අනුන්ට දණ්ඩනය කෙරෙමින් බොහෝ සතුරන් ඇතිවැ සලෙළිවැ වසන්නාඟ ද

(ඔව්හු) "වෛරයන් නැත්තම්හ. දණ්ඩනය නො කරම්හ. සතුරන් නැත්තම්හ. වෙහෙ නැත්තම්හ"යි සිතති. ඔහු කවර පාපධර්ම බලයෙකින් මෙසේ සිතත්දැ"යි විචාළේ.

ඉක්බිති සභාමිදරුවෝ "දෙවෙන්දුය! එසේවූ සත්ත්වයෝ ඊර්ෂ්‍යා හා මාත්සර්‍ය්‍ය බලයෙන් එසේ සිතන්නාහ යි වදුළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්දුතෙමේ "සභාමින් වදුළ පරිදි ඉතා යහපත. මේ විෂයයෙහි මට සංශය දුරු විය යි සතුටුවැ වදුළ බණ බුදුනොත් පිළිගෙණැ මත්තෙහිදු ප්‍රඥා විචාරන්නේ නුඹවහන්සේ වදුළ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය දෙක කුමක් ඇති කලැ වේ ද? කුමක් නැති කලැ නො වේ දැ"යි විචාළේ.

ඒ අසා සභාමිදරුවෝ "දෙවෙන්දුය! ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය යන මේ දෙක ප්‍රිය වසතු අප්‍රිය වසතු දෙක මුල් කොටැ වේ දැයි වදුළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්දුතෙම ඒ ප්‍රිය අප්‍රිය දෙක ජඤ්ඤය මුල් කොටැ ඇත්තේ යැයි වදුළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්දුතෙම "ජඤ්ඤය තෙම කුමක් මුල් කොටැ ඇත්තේදැ"යි විචාළේ. ඒ අසා සභාමිදරුවෝ ! දෙවෙන්දුය! ජඤ්ඤය තෙම විතර්කය මුල් කොටැ ඇත්තේ යැයි වදුළ සෙයෙක. ශක්‍රදෙවෙන්දුතෙම "සභාමිනි! විතර්කය කුමක් මුල් කොටැ ඇත්තේදැ යි විචාළේ.

ඒ අසා සභාමිදරුවෝ "දෙවෙන්දුය! විතර්කය නාමඤ්ඤ සම්ප්‍රයුක්තවූ ද සංඥාකොටස මුල්කොටැ ඇත්තේ යැයි වදුළ සෙයෙක. ඉක්බිති ශක්‍රදෙවෙන්දුතෙම සභාමිනි! කවර ලෙසෙක පිළිපන්නාවූ මහණතෙම නාමඤ්ඤය සම්ප්‍රයුක්තවූ සංඥාවගේ අනුත්පත්තියට කාරණවූ නිවන් මගට පිළිපන්නා නම් වේ දැයි විචාළේ. ඒ අසා සභාමිදරුවෝ සම්බුද්ධත්වයන් සම්ඵස්සනාඤාණයෙන් අලළා අමෘතමහා නිර්වාණ මාර්ගය වදාරන්නට පටන් ගෙණැ වදුළ සෙයෙක. කෙසේ ද? යත්:-

"දෙවෙන්දුය! යම් පුරුදු කටයුතුවූ සොම්නසැ යි දෙම්නස ඇයි සොම්නස දෙකක් කොටැ කියමි. එහි යම් සොම්නසක් 1 පුරුදුකරන්නාහට කුශලධර්මයෝ වඩ්ද, අකුශලධර්මයෝ පිරිහෙද්ද, එසේවූ සොම්නස පුරුදු කටයුත්තේය. යම් සොම්නසක් සෙවූනාහට අකුශලධර්මයෝ වඩ්ද, කුශලධර්මයෝ පිරිහෙද්ද, මෙසේවූ සොම්නස නො සෙවිය යුත්තේය.

---

1 පුරුදුකළ.

එහි සවිතකී සවිචාර සොම්නස අවිතකී අවිචාර සොම් නස යන මෙයින් අවිතකී අවිචාර සොම්නසම උත්තම ය. තව ද යම්සේ දෙමිනසක් පුරුදු කරන්නාහට කුශලධර්මයෝ වඩිද්ද, අකුශලධර්මයෝ පිරිහෙද්ද, මෙසේ වූ දෙමිනස සෙවිය යුත්තේය. තව ද යම් දෙමිනසක් සෙවුනාහට අකුශල ධර්මයෝ වඩිද්ද, කුශලධර්මයෝ පිරිහෙද්ද, මෙසේ වූ දෙමිනස නොසෙවිය යුත්තෙය.

එහි සවිතකී සවිචාර දෙමිනස, අවිතකී අවිචාර යන දෙ කින් අවිතකී අවිචාර දෙමිනස ම උත්තම ය. යම් උපෙක්ෂා වක් පුරුදුකරණ කල්හි කුශලධර්මයෝ වඩිද්ද, අකුශලධර්මයෝ පිරිහෙද්ද, එසේ වූ උපෙක්ෂාව පුරුදු කටයුත්තේය. යම් උපෙ ක්ෂාවක් පුරුදුකරණ කල්හි අකුශලධර්මයෝ වඩිද්ද, කුශල ධර්මයෝ පිරිහෙද්ද, එසේ වූ උපෙක්ෂාව නුපුරුදු කටයුත්තේය. සවිතකී සවිචාර උපෙක්ෂාය, අවිතකී අවිචාර උපෙක්ෂාය, යන දෙකින් අවිතකී අවිචාර උපෙක්ෂාව ම උත්තම ය.

මෙලෙසින් නුපුරුදු කටයුතු ධර්මයන් නුපුරුදු කොටැ වසන්නාවූ සත්පුරුෂතෙම තෘෂ්ණා සම්ප්‍රයුක්ත වූ සංශුවගේ දුරුකිරීමෙහි පිළිපන්නා නම් වෙයි වදාළ සෙයෙක. මෙසේ වූ අසාධාරණ වූ බුඩඟුන විලාසයෙන් යුක්ත වූ ප්‍රශ්න ව්‍යාකරණය ඇසුවා වූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම අධික වූ ධර්මප්‍රසාදයෙන් යුක්තවැ නැවත ද ප්‍රශ්න විචාරන්නට යැයි පටන්ගත්තේ:– "සාමිනි! නුඹ වහන්සේගේ සස්නෙහි ප්‍රාතිමොක්ෂ සංවරශීලය රක්ෂා කරන්නට පටන් ගත්තේ නම් කෙසේ වූ මහණදැ යි විචාළේ. ඒ අසා සාමිදරුවෝ ඔහුගේ ලය සනහමින් බුඩඟුනයෙහි පිහිටා ඒ ප්‍රශ්නය ද මෙසේ විසඳන්නට පටන් ගත් සෙයෙකි.

ඒ කෙසේ ද? යත්:–

"ශක්‍රදෙවෙන්ද්‍රය! මම කාය සමාචාරය ද පුරුදු කටයුත්තේ ද වෙයි, නුපුරුදු කටයුත්තේ ද වෙයි යි දෙලෙසකින් සිටියේ යයි කියමි. වාක් සමාචාරය ද එසේ ම දෙලෙසකින් සිටියේ යයි කියමි. පර්‍යේෂණාව ද එසේ ම දෙලෙසකින් සිටියේ යයි කියමි. එහි යම් කාය සමාචාරයක් යම් වචී සමාචාරයක් යම් පර්‍යේෂණයක් පුරුදුකරන්නාහට අකුශලධර්මයෝ වඩිද්ද කුශලධර්මයෝ පිරිහෙද්ද, එසේ වූ තුණ නුපුරුදු කටයුත්තේය.

යම් කායසමාචාරයක්, යම් වචීසමාචාරයක්, යම් පයෝගසම්පත්තියක් සෙවූනාහට කුශලධර්මයෝ වඩ්දී, අකුශලධර්මයෝ පිරිහෙද්දී, එසේ වූ තුණ පුරුදු කටයුත්තේය. මෙසේ නුපුරුදු කටයුතු ධර්මයන් නුපුරුදු කොටැ පුරුදු කටයුතු ධර්මයන් පුරුදු කොටැ වසන මහණතෙම **ප්‍රාතිමෝක්ෂ සංවරශීලය** රක්ෂා කරන්නා නම් වෙයි වදාළ සෙයෙක.

මෙසේ සුභාම්දරුවන් වදාළ ධර්මය අසා සතුටුවූ ශක්‍රදෙවෙන්‍රතෙම වදාළ ධර්මය මුදුනෙන් පිළිගෙණැ නැවත ප්‍රශ්න විචාරන්නේ:–සුභාමිනි! සුභාම්න් වදාරණ ධර්මය මා ඉතා ලගන්නී. එසේ හෙයින් මම සුභාම්න් නැවත ප්‍රශ්න විචාරන්නා කැමත්තෙම්. සුභාම්න්ගේ සස්නෙහි වසන්නාහු මහණතෙම කෙසේ **ඉන්‍ද්‍රිය සංවරශීලය** රක්ෂාකරන්නා නම් වේ දැ යි විචාළේ. ඒ අසා සුභාම්දරුවෝ දෙවෙන්‍රය! මම ඇසින් දැක්කයුතු රූපය, කණින් ඇසියයුතු ශබ්දය, නාසයෙන් ආඝ්‍රාණය කටයුතු ගන්ධය, ජිව්හායෙන් වින්දයුතු රසය, කයින් වින්දයුතු සප්‍රශ්‍රීය, මනසින් වින්දයුතු ධර්මය යන මේ සයම සෙඛ්‍ය අසෙඛ්‍ය යයි කියා දෙලෙසකින් සිරියේ යයි කියම් යි වදාළ සෙයෙක.

ඒ අසා ශක්‍රදෙවෙන්‍රතෙම තමා යටැ ඇසූ ධර්මදේශනාව වූ නියාවට අනුසාරයෙන් ම ඥානය මෙහෙයා මෙසේ වූවමැන වැයි අනුමානයෙන් දැනැ "සුභාමිනි! සුභාම්න් සංක්‍ෂේපයෙන් වදාළාවූ මේ වචනයෙහි අර්ථ මට විස්තාරයෙන් මෙසේ හැඟිනා. මේ රූපාදී ආලම්බණ සයින් යමක් සෙවූනාකල්හි කුශලධර්මයෝ පිරිහෙද්දී, අකුශලධර්මයෝ වඩ්දී, එසේ වූ රූපාදී ආලම්බණය නොසෙවිය යුත්තේය. යම් බදුවූ රූපාදී ආලම්බණයක් සෙවනය කළකල්හි අකුශලධර්මයෝ පිරිහෙද්දී, කුශලධර්මයෝ වඩ්දී, එසේවූ රූපාදී ආලම්බණය පුරුදු කටයුත්තේය. යනු සුභාම්න් වදාළ දෙශනායෙහි අභිප්‍රාය මෙසේ හැඟෙයි. එහෙයින් ඒ විෂයයෙහිත් සංශය දුරුවිය.

මෙබදු වූ මරණ භයකින් වියවුල්වැ සුභාම්දරුවන් කරා නැගී ආවා වූ මාගේ මනොරථය මස්තකප්‍රාප්ත විය. එහෙයින් වදාළ ධර්මයෙන් සතුටුවැ ගත්තෙම්. තව ද ප්‍රශ්නයක් විචාරන්නා කැමැත්තෙම්. සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ම එක් අදහසක් ඇත්තෝ ද? එක ආචාර ඇත්තෝ ද? එක ම ලබ්ධි ඇත්තෝ දැ යි විචාළේ.

ඒ අසා සඞ්ඝදරුවෝ සඒඤ්ඤානඤ්ඤයෙන් කිරා සියලු ඛමී තනතුවය අලලා ඒ ප්‍රශ්නය විසඳූ විචාළාවූ ඔහුගේ ලය නිවා මෙසේ බණ වදාරන්නට පටන් ගෙණ වදාළ සෙයෙකි. "ශක්‍ර දෙවෙන්ද්‍රය! සියලු සතුබ ලොකයෙහි සතුවයෝ වෙන අද හස් ඇත්තාහ. එකස්හට අභිමත දෙයෙක් එකස්හට අභි මත නොවෙයි. යමක් යමෙක්හට අභිමත වී නම් ඒ තෙම එය ගෙණ ව්‍යවහාර කරන්නේ:-'මේ මෑ සැබවූ; සෙස්ස බොරු ය'යි කියයි. එහෙයින් සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එක අදහස් ඇත්තෝ නොවෙති යි වදාළ සේක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "සඞ්ඝාමිනි! වදාළ සේ ඔහපත, තව ද සඞ්ඝාමින් විචාරම්"යි සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයෝම නිඒාණ නිෂ්ඨා කොටැ ඇත්තෝ දැයි විචාළේය. ඒ අසා සඞ්ඝදරුවෝ "දෙවෙන්ද්‍රය! යම් ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙක් තෘෂ්ණාක්ෂය කරන්නා නිඒාණ මාර්ගයෙන් ගොසින් සංසාරයෙන් මිදී සිටියෝද එසේ වූවෝ නිඒාණ නිෂ්ඨා කොටැ ඇත්තාහ. එහෙයින් ඒ හැම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නිඒාණ නිෂ්ඨා කොටැ ඇත්තෝ නොවෙති යි වදාළ සේක. ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රතෙම සතුටුවැ "තෘෂ්ණාතොමෝ සතුවයාගේ සිත ඇතුළෙන් දූෂණය කරණ හෙයින් ගඩක් සේ සිටියේ සතුවයාහට තෘෂ්ණාව හා සමාන රොගයෙක් නැත. තෘෂ්ණාව හා සමාන ශල්‍යයෙක් නැත. ඒ ඒ භවයෙහි ගෙණ ගොස් සතුවයා උපදවන්නී ද තෘෂ්ණාම ය. සඞ්ඝදරුවන් කරා අවුත් මේ විචාළ ප්‍රශ්න විචාරන්නට ඇති කියා සෙසු ශ්‍රමණබ්‍රාහ්මණයන් කරා ගියකලැ ප්‍රශ්න විසඳීම නබා අවකාශ මාත්‍රයකුත් නොලැබෙයි එසේ වූ ප්‍රශ්න සඞ්ඝදරුවෝ අද මට විසඳූ වදාළ සෙයෙකැ යි දැන්විය.

ඒ අසා සඒඤයන් වහන්සේ "දෙවෙන්ද්‍රය! තෝ ප්‍රශ්න අනුනුත් විචාළ විරිදැ"යි වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "සඞ්ඝාමිනි! බොහෝ වල්හි වසන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා ගොසින් මම මේ ප්‍රශ්න විචාරම්. ඔහු මා විචාළ ප්‍රශ්නය කියා ගත නොහී තෝ කවරෙක්හි දැයි විචාරති. මමද ඔවුන්ට ශක්‍රදෙවෙන්ද්‍රයෙමි යි කියමි. ඒ අසා ඔහු නෙපි කවර කුසලයක් කොටැ ශක්‍රදෙවෙන්ද්‍රවැ උපනුදැ යි විචාරා මා විසින් ම මා කළ කුසල් කී කල තුමූ ඒ අසා සතුටුවැ ගෙණ ඒදිනාහු මට ම අනවැසි වෙත්. මම ඔවුන්ට අනවැසි නොවෙමි"යි දැන්විය.

"මම සඞ්ඝාමිදරුවන්ගේ ප්‍රඥා විසඳිම් අසා සෝවාන්වෑ අමාමහනිවන් දැකැ මත්තකප්‍රාප්ත වූ මනොරථය ඇතිවිම්"යි දුන්වීය. ඉක්බිති සඞ්ඝාමිදරුවෝ මෙබඳු වූ සතුටෙක් පෙර නට ඇතිවූ විරිදු යි විචාරා වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "සඞ්ඝාමිනි ! අනික් කුමක් දන්වම් ද? එක් සමයෙක්හි අසුරයන් හා මා හා බලවත් වූ යුද්ධයක් ඇතිවිය. ඒ යුද්ධයෙහි අසුරයන් ලුහුබඳවා පියා මම ජයගත්තෙමි. එ ජයගත්තාවූ මම දෙවතාවන්ගේ දිව්‍ය ඕජසත් අසුරයන්ගේ අසුර ඕජසත් හැර මා අයනි වී යැ යි මහත්වූ සතොසයට පැමිණි ඒ ජයමද යෙන් වූ සතොසය මා සසරින් ගැලවිය නොවන හෙයින් ඉතා ලාමකය දැන් සඞ්ඝාමිදරුවන්ගේ ධර්මදෙශනාව අසා මටවූ සතුටු මා අමෘතමහා නිර්වාණයෙහි සිටුවාලිය. එහෙයින් මේ ප්‍රීතියට වැඩි ප්‍රීතියක් නුදුටු විරිමි යි දන්වීය.

නැවත ද සඞ්ඝාමිදරුවෝ ඔහු ලවා ප්‍රීති සිංහනාද කරවනු ැණිස "දෙවෙන්ද්‍රය! නෝ කෙතෙක් ප්‍රයොජන සලකා මෙසේ සත්වුවේ ද"යි වදාළසේක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම "සඞ්ඝාමිනි! මම ප්‍රයොජන සයක් සලකා නුඹ වහන්සේගේ ධර්මය අසා මහත් වූ සතොසයට පැමිණියෙමි යි ඒ තමා ලද්දා වූ ප්‍රයොජනය දක්වන්නට පටන්ගතු. හේ කෙසේ ද? යත්:-

"සඞ්ඝාමිනි! ශක්‍රාත්මභාවයෙන් ගැලවී මියැ අපායෙහි හෙන්නට සිටියෙම් පඤ්ච පූර්ව නිමිත්තයන් දැකැ මරණ භයින් භයපත්වැ සඞ්ඝාමින් ශ්‍රීපාදමූලයට හඬා වැදී ගියෙම් බණ අසා ශ්‍රීපාදය වැඳැ ගෙණැ හෙවැ මිය. සඞ්ඝාමින් ආයු බොහෝ වෙවයි වදාළ බසින්ම නැවත තුන්කෙළසැටලක්ෂයක් හවුරුද්දට ආයු ලදින් නැවත පිරිහුණුවූ 1 ශක්‍රාත්මය ලදිමි. එහෙයින් මේ පළමු වන ප්‍රයොජනය සලකා සඞ්ඝාමින් කෙරෙහි මහත් වූ සතොසයට පැමිණියෙමි.

තව ද, මෙ තැන්හි බණ අසා මා සතර අපායෙහි හකුල් හෙළා සෝවාන් වූ හෙයින් හා මතු මෙයින් චුතවන සමයෙහි මනුෂ්‍යලොකයෙහි මට අභිමත වූ ක්ෂත්‍රියාදි වූ කුලයෙක්හි ඉපැද ගණිමි. එහෙයින් මේ දෙවෙනි ප්‍රයොජනය සලකා මහත් වූ සතොසයට පැමිණියෙමි.

---

1 ශක්‍රත්වය.

තව ද මේ තැන් පටන් හි ගෙණැ 1 මා මහත් වූ නුවණ ඇති සඞ්ඝාමිදරුවන්ගේ පුතස්නු හෙයින් සිහිනුවණින් යෙදී ධර්මයෙහි වහස කෙරෙමි. එහෙයින් මේ තුන්වන ප්‍රයොජනය සලකා මහත් වූ සතොසයට පැමිණියෙමි.

තව ද මෙසේ ධර්මයෙන් වසන්නාවූ මම ශුන පරිපාකයට පැමිණැ කෙළවර සියලු කෙලෙසුන් නසා රහත්වැ අමා මහ නිවන් දකිමි. මේ සතරවන ප්‍රයොජනය සලකා ද මම මහත් වූ සතොසයට පැමිණියෙමි.

තව ද මතු මේ ජාතියෙන් චුතවැ මනුෂ්‍යලොකයෙහි උපදිම් නමුදු නැවත ද එයින් චුතවැ දිව්‍යලොකයෙහි දෙවතාවන්ට උත්තමවැ උපදිමි. මේ පස්වන ප්‍රයොජනය සලකා ද මම මහත් වූ සතොසයට පැමිණියෙමි.

තව ද සත් ජාතියක් දිව්‍යමනුෂ්‍ය ලොකයෙහි යවා පියා අන්තයෙහි **උඛංසොත අකනිට්ඨ** ගාමිවැ අකනිටා බඹලොවැ සිටැ නිරාමිස ප්‍රීතිසුඛය අනුභව කෙරෙමි. මේ සවෙනි ප්‍රයොජනය සලකා ද මම මහත් වූ ප්‍රීතියට පැමිණියෙමි.

"සඞ්ඝාමිනි! මම මෙතෙක් කල් අසම්පුණී වූ මනොරථඇති වැ සියලු ධර්මයෙහි සැක ඇතිවැ මේ කෙසේ දෝ හෝ සි මේ කෙසේ දෝ හෝ සි යන සැක ඇතිවැ විසිමි. මා සිත ඇති සැකය දුරුකරණ පිණිස බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා ගොසින් ප්‍රශ්න විචාළම්නම් ඔහු තුමූ මට ශිෂ්‍ය වන බව මුත් මා තමන්ට ශිෂ්‍ය කොටැ ගත නොහෙති. දැන් සඞ්ඝාමිදරුවන් දැකැ සැක දුරු කොටැ ප්‍රශ්න විචාරා බණ අසා සඞ්ඝාමිදරුවන්ට උපස්ථාන කොටැ සංසාර භයින් හා මරණ භයින් හා මුක්තවිමි තෘෂ්ණා ශල්‍යය දුරුකළාවූ අප්‍රති පුද්ගල වූ මහා වීර්‍ය්‍ය වූ ආදි ත්‍යබන්ධු වූ සඞ්ඝාමින් ශ්‍රීපාද මා මුදුනෙහි තබා වඳිමි. දෙවතාවන් හා සමග බ්‍රහ්මයාට කරන්නා වූ යම් ආදරයෙක් ඇද්ද එයට ශතසහස්‍ර ගුණයෙන් වඩා ආදර කෙරෙමි.

ලොකයෙහි සම්‍යක් සම්බුද්ධයෝ නම් නුඹ වහන්සේමය, අනුත්තර ශාස්තෘඤ්ඤ නම් නුඹ වහන්සේමය. දෙවියන් සහිත වූ ලොවැ නුඹට ප්‍රති පුද්ගලයෙක් නැතැ සි කියා මෙසේ බුදුන් වහන්සේට සතුති කොටැ බුදුන් වහන්සේ මැදයෙහි ම

1 මේ.

සිටැ **පඤ්චසිඛයා** කැඳවා **පඤ්චසිඛය**! තෝ මට බොහෝ උපකාර කෙළෙහි බුදුන් වහන්සේ කරා පළමු අවුත් මට අවකාශ ඉල්වා දිනි. එහෙයින් තා මට අද පටන් ගෙණැ පිය තැන්හි තබම්. තා සියලු ගඹ්ධර්ව නිකායට රජ කෙරෙමි. තට අභිමත වූ "**භද්‍රා** නම් සූරිය වච්චසාවන් තට දෙමි යි ඔහුගේ මනෝරථය මස්තකප්‍රාප්ත කොටැ බුදුන් වහන්සේ කෙරෙහි ඇති භක්තිය 1 සිතූ පිරී ඉතිරෙත් ඉතිරෙත් ඉවසාගත නො හි අත ඛිමැ ගසාලා "**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**" යි තුන්විටකැ උදන් අනා බුදුන් වැඳැ පැදකුණු කොටැ තමාට වූ වරපලට යි පියා දෙව්ලෝ ගියේ.

මෙසේ පඤ්ච පූර්ව නිමිත්ත දැකැ මරණ භයින් භයපත්වැ හඬා වන් ශක්‍රදෙවෙන්ද්‍රයා කණ හුනු කල්හි ඕහට අමා මහ නිවන් දුන් නටුවාවූ තුන්කෙළ සැට ලක්ෂයක් හවුරුද්දට ආයු පෙරළා දුන් පිරිනුනාවූ දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රත්වය සිරකළ ශක්‍රයා හා කැටිවැ 2 තුදුස් කෙළින් දෙවියන්ට අමා මහනිවන් දුන් දුඃඛිතයන්ට සරණ වූ සියලු සම්පත්තියට මුල් වූ සවිනේ ගෙවා දත් සඟමිදරුවන් වදාළ ධම්මරත්නය සරණ යෙමි යි **දහම් සරණ යා සූත්‍ර.**

තවද මේ ධම්මය ඇසූ සත්ත්වයාගේ සියලු දුක් නිවන පිණිස ප්‍රේතයන් කණ හුන් කල්හි ද ඔවුන්ට අමා මහනිවන් හා සඟී සම්පත්තිය සාධාදුන් පරිදි එක් කථාන්තරයකින් දක්වම්. ධම්මයට සිනහැනි බුදුරුවන්හි සඟුරුවන්හි පහන් සිත් දී වසන සත්පුරුෂයන් විසින් හේ මෙනෙහි කොටැ ඇසිය යුතු. හේ කෙසේ ද? යත්:—

එක් සමයෙක්හි මාගේ සඟමිවූ බුදුරජානන් වහන්සේ **සැවත් නුවර** නිසා **ජේතවන මහා විහාරයෙහි** වැඩවසන සෙයෙක. ධම්මයෙහි ලොභයෙන් තමන් වහන්සේ සිසාරා වැඩහුන් මහණන් වහන්සේට නිර්‍වාණ ගුණයෙන් මිශ්‍රවූ ධම්මඇකට පටන් ගෙණැ වදාළ සෙයෙක. කවර වේලෙක්හි පටන්ගත් බණෙක් ද? යත්:—පසුබත් දේලෙහි නුවරැවැසි මහජනයා සිත්හි ධම්ම සන්තොෂ රස එවැ දෙශනායෙන් සනහා ඔවුන් යළා ප්‍රඥප්ත වර බුඩාසනයෙහි පූර්ව ලොකධාතු බලා පළක් බැඳැ වැඩැ හිඳැ ගදකිළි පිරිවෙන්හිදි පටන් ගෙණැ වදාළ

1 සිතා. 2 අසූදහසක්.

බණෙක. බණ වදාරා සවාමිදරුවන් වූ නියා කියත්:–අමා වහන සදමඩුලු ඇතුළු 1 කොපුල රැදවූ රහු අසුරිදු සෙසින් මිහිරිවූ අමා මහ දහම් තමන්ගේ ශ්‍රී මුඛයෙහි අනාතගීතකරවූ සවීඥ සවාමිදරුවෝය, වදාරණ බණ කියත්:–බැමිණි විසා සාඝ වැනි හඝක් නැතිවන සමයෙහි වදුල් බැදැ ගෙණැ ලෝවැස්සන් සනහා වස්නා මහා මෙඝයක් සෙසින් බොහෝ කලක් පුරුදුවැ සංසාර වැසනඝට ප්‍රතිපක්ෂවූ සවභාව මධුරවූ අමා මහ නිවන් දෙන ධම්මහෙයින්, අසන්නවුන් කියත්:– සිංහ තෙල් වත්කළ කනක පාත්‍රසේ ලෙහි හුනු ධම්ම නොනසා රක්ෂාකරන සඟුරුවන්, වදාරණ බුදුරුවන් එපැලඟ අසන සඟුරුවන් එපැලඟ හියහ. ඒ පිඬුවූ තුණුරුවනට කවර උපමාඝක් එළවම් ද? කවර මිළයක් කෙරෙම් ද? කවර වණිනාවක් කෙරෙම් ද ?

මේ තුණුරුවන් වණිනාකරන්නාවූ මම ප්‍රතිරූපදෙශවාසයෙහි ඵල ලදිම් සි හිය ජාතියෙහි පින් නොකළ එකෙනිම්,නොසිතම්.මධුරවූ මකරඳුයෙන් පිරුණුවූ තුන බුමු රන් පියුමෙක්හි කුසුම ගඩිඟයෙන් කුසුම ගඩිඟයෙහි හඬා හියහ. කෙළි කෙළනා මත් බමරුන් සෙසින් මධුරවූ ගුණ නැමැති මකරඳුයෙන් පිරුණුවූ තුණුරුවන් නැමැති තුන් බුමු පියුම්හි හී බුදුපියුමෙන් දහම් පියුමට දහම් පියුමෙන් සඟුරුවන් මහපියුමට හී සතුති ගිත නැමැති හඬ පවත්වම්න් ගුණ මුවරද උකා බොමින් එහි නිමා වුදු නොදක්නා මම ද තෘපතියකට නොයෙමි සි ම්හිරින් ම්හිරි දක්මි සි අමායෙන් අමා දක්ම් සි තුණුරුවන් එක් තැන් වූ සතක් ලදිම් සි තමා බොන පැන් මදවූව ද හඬාබස්නා මහගඟ දැකැ පීනා දිවන පිපාසිතයක්හු සෙසින් මා කියන ගුණ මදවූව ද මේ තුණුරුවන් දැකැ මහත්වූ අභිලාෂයෙන් දිවැ ගොස් වන්ම් සි තුණුරුවන්ගි ගුණ බැවින් සත්පුරුෂයන් රැස්වූ සභාවක් බැවින් සිනහැතිවැ ඒ සඩම්මය ඇසිය යුතු.

සැවැත්නුවර නිසා ජෙතවන මහාවිහාරයෙහි වැඩවසන්නාවූ සවාමිදරුවානන් වහන්සේ සවස් වේලෙහි ගඳකිළි පිරිවෙන්හි වැඩැ හිඳැ පිඬුවූ මහණුන් වහන්සේ වරුන්දැට බණ වදාරන්නට පටන් ගත් සේකි. බලවැ බුරණ බිරුම් ද දහම් කොටැ බුරනුවන් දහමට සැරහුන බුදුරජහු තුමින් දෙදරන්නට පටන්ගත් බණ මෙබදු විලාසයෙකින් සිරියේ යැ සි කෙසේ

1 සොල්ඹ රැදවූ-කොපොල.

කියා නිමවලී ද? ඒ තුඩ ට සැරහුන ධර්මය ය, ඒ ධර්මයට ම සැරහුන ඒ තුඩය, ඒ ධර්මරත්නයට ම සුදුසු කොටැ සමනිස් පෙරුමෙන් සරහා නිමවූ ඒ රූපකායය, ඒ අනුපමවූ විලාස යෙන් වැඩැ හුන් සම්බුදරුවෝ නිර්වාණය වර්ණනාකරන්නට පටන් ගත්හු ලු.

සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි ඒ රසය ම ලොවට දෙන්නට වෙහෙසී ඇවිදු දැන් ඒ ලොවට වළඳවන දැය. එහි රස කෙලෙසකින් වදාරත් හෝ නිවන් මිහිර වදාරන්නෝ ද? තමන් ශ්‍රී බුඩියට නැඟි මිහිරම නො වළහා වදාරද් ද? ඒ නිවන් මිහිර කවරලෙසකින් වදාරා නිමවූ හෝ නිර්වාණ දෙශනා නම් සියලු ධර්මයෙහි අභිෂෙක දෙසනාෂෙක. බුදුහු නම් ධර්ම දෙශනා කරන්නවුන් කෙරෙහි අග්‍රප්‍රාප්තවූ සම්බුදරුකෙණෙක. ඔහු වැඩැ හිදැ වදාරති. නිවන් කි යම් ද? ධර්මදෙශනා ශ්‍රියෙහි අස්තවන මහුල් කෙරෙහි සි කියම්. නිවන් මිහිරක් බැවින් ඔවුන් බයක් බැවින් ඒ තුඩටවත් නිවන් අසනුවන් සිතට කෙසේ මිහිරිවැ වැටහිණී හෝ? පෙරැ නිවන් දුටුවන් ඒ නිවන්රස ම විඳුනා පරිද්දෙන් නිවන් නො දුටුවන් ඒ නිවන් රසයට කෙළඟලන පරිද්දෙන් බුදුවූ සම්බුදරුවෝ නිවන් වදාරන්නට පටන් ගත්හු.

සුවිසි දහසක් යොදුන් ගැඹුරු මහ මුහුදෙහි ඇවිදගත් නිමිති මහුල් කෙළියක් සෙයින් ඒ ඒ ගැඹුරු නිවණට වන් ඔවුන්ගේ දෙශනාව නො හැකිළී පෙලඹෙන්නට වන්ලු. නිවන් දෙනි, ලෝවැස්සා අනින් නැකිවිලි ලත් බුදුහු තමන්ගේ දෙන නිවන් කවර මිහිරක සලකා වදාරත් දෝහෝ අපී දැන් වීමෙහි අනුන් සතට නැඟිම්හි අසනුවන්ට උත්සාහ වැඩිම්හි අසනුවන් සතුටුකිරීම්හි සිරි නැති කොටැ මිහිරි තුබූ තුබූ නැනට වැද අළලා අසන්නවුන් මුනුණ බල බලා නො සතුටු මුහුණ සතුට ඕ මින් සතුටු මුහුණ දියුණ දියුණ සතුටු ඕමින් බණ වදාරන්නට පටන් ගත්හු.

ඉක්බිති **සුනඛඛස්සමාතා** නම් **ප්‍රේතියක්** හඩන දරුවන් මෙසේ නලවන්ට පටන්ගත. ඕ එතනට කෙසේ ආ යකින් නක් ද? යත්: එක් උකුලෙකින් ගත් දුවෙක, ඇඟිල්ලෙහි එලෙන පුතෙක, සා ඟිනි ගත කුසයෙක, බැහැහැපත් සිතෙක. වෙවුලුම්ගත් ඇගෙක, දුන්මුහුදෙහි ගසන රළ සියලු ප්‍රේත

1 කැකිරිලි.

ලොකයෙහි දුක් නාස් පිඬුවැ මූතිනිමත්මැ ගත්තාස් බදු මහා විප්‍රකාරයට පැමිණ් සෙයෙක. කන්නට බොන්නට සොයන්නේ මලමූත්‍රමාත්‍රයෙක. හෙද අමා සේ දුර්ලභවන පරිද්දෙන් ගිය ජාතියෙහි පින් නොකළ පරිදි ය.

"එව, කව, බොව" යන බසක් ඇසුව තමන්ගේ පිනින් පහළවූ සත්රුවන්හි හඬ ඇසූ සක්විත්තස්හු සේ සතුටු සතුටුවැ දිවැ ගොසින් නැවත 'නැත' යන බස් ඇසූවිට ලෙහි ඇවිල්ල කපින් පලන ගිනි කදය, කම්බල් ඇති හෙයින් දුස්විඳිනට තුබූ ඇට හා සම මිස නෙසූ ශරීරය වූවමනා දෑ නැතිවැ වෙවූලන ඇගෙක, දුක් මූහුදෙහි ගසන රැළ් සෙයින් ඉපිළී ගිය පරුලපතු පෙළය, පිට ඇලීගිය බඩසමය, ලදනිය කන්නකුදු උදුරා නොකෑ දෙන දරුවෝ දෙන්නෙක. සංසාර නැමැති චිත්‍රකාරයා තමාගේ සිතියම්හි නිමාව පානට සරහා සිටුවා වූ වාක් වැනි ප්‍රෙත රූපයෙක.

මෙබදුවූ හෝ නොමෝ **ජෙතවන විහාර** පිටිපස්සෙහි අසුචි කෙල සොටු සෙම් සොයමින් ක්‍රමයෙන් විහාරයෙහි දෙරටුවට අවුත් බුඩවීවි අභිමුඛයෙහි සිටිවි. බුදුන් වහන්සේ වැඩහුන් ගඳකිළිය දුට බුදුන් පිරිවරා හුන් මහණුන් දුට බුදුන් දකුත් රැස් වූ මහණුන් දකුත් බණ අසම් සි සිතා ද? යත්. එසේ නොවෙයි. වැළි කුමක් සිතූ ද? යත්:–මේ නැන්හි රැස් වූවෝ බොහෝ මහණහ. එකානතයෙන් කන බොන දෑ බෙදන තැනක් වූව මැනැව. එ නැන්හි පාත්‍රමුවවිරින් වැගිරී ගිය යම්තම් දෙයක් ලදහොත් යෙහෙකැ සි ඇතුළු වෙහෙරට වදනව පටන්ගත.

විහාර රක්‍ෂායෙහි සිටිය දෙවතාවෝ ද ගිය ජාතියෙහි කළ කුසල්මුල් ඇති සකින්නකැයි ඇතුළට වදිනිය නොවැළකුහු. ඇතුළට වන. බණ අසන මහණ පිරිස් ඇයට ලඟවූව. ඒ මිහිරි හඬ කණ වැටී හින. ඇතුළට වන්නා සයින් ගොදුරු සොයාවූව. බුදුන් වදුරන්නා කව ! බොව ! යන බසක් නොවත්, ඒ හඬ අසා ඇට වූ අස්වසෙක් නැති වේ ද? යත්:–එසේ නොසිනිය යුතුය. සඞ්ඝාමිදරුවන්ගේ මිහිරි හඬ කණ හුන්විට ම හිවි ආදි බිදෑ ගෙණු ගොස් ඇටමිදුලෙහි පැහැරී සිටී ඛාය ඉතිරී සිත් නිවා සනහා සොම්නස් ඉතිරෙන්නට වන. ඇට වූ සොම්නස් කියත්, ඒ දහමට සුදුසුය. ඒ දහම් කියත්

ඒ බුදුරුවනටම සුදුසුය. ඒ බුදුරුවන් කියත්, කප් සියයක ද දහසක ද යන හිමක් නැති කොටැ ද සාරාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි බෙහෙවින් බෙහෙව ගන්නා මතු පැමිණියාවූ සමතිස් පෙරුමට සුදුසු ය.

ලද කන බොන දෙයක් නැතිවැ ද ඒ මිහිරි හඬ කණැහුනු **ශක්‍රදේවෙන්ද්‍රයා** අනුභව කරණ අමා වැළඳූ **සුජාතා** නම් අසුරකන්‍යාව සේ හෝ නොමෝ සා දුක් නිවෙත් නිවෙත් ප්‍රීතින් පිණ ගියා ල. ඒ සත්තොෂයෙහි මහත වෙන නොකියම්. සියලු සසරෙහි දුක්ගන්නා මා ඇතුළුවූ සියලු සත්ත්‍වයන්ට සිතට ද ඒ දුක් නිවා ගෙණැ මෙබඳු සන්තොෂයෙක් ම වේවාදි කියා ප්‍රාර්ථනා කෙරෙම්.

එ දවස් අළුයම් වේලේහි ඒ මහා කරුණාසමාපත්තීන් නැඟි ලොව බලන්නවුන්ගේ ඥානජාලයට හෝ ම අසු වූ වන ඈ ම එන පෙරමඟ බලාහුන් වන් හ. ඈ නිසා ම ඒ බණට පවන් ගත වන්හ. තුමූ හුන්හු ල. හිඳිනුදු බණ කිය කියා හුන්හු ල. දුස්පත් කෙණෙක් ල. ඔහු ද එ තැනට ගොසින් වැද ගියේ ල. දුක් නම් දෙයෙක් තුබූ පිරින් තිබේ ද? ලයෙක් නම් නො සැනහී තිබේ ද? වරින් සැට යොදුන් ශ්‍රීගාන්නවාතමෙඝධාරාවෙක්හී වැටී හුනු කනමැදිරියක සා ගිනි පුපුරන් සේ සවා මිදරුවන්ගේ මිහිරි හඬ කණ හෙත් ම ඒ දුක් නිවී ගියේ. ඒ ලය සැනහී ගියේ.

එ වැනි රුවක් ඇසින් දුට එවැනි ශබ්දයක් කණින් ඇසුව ඇසින් විඳුමනා මිහිරක් සොයත්. **ශක්‍රදේවෙන්ද්‍රයා** ද එතෙකින් වැඩියක් සොයා ගත නොහෙති යන පරිද්දෙන් ම මිහිරිවූ බුදුරු දුටු කණින් වින්දමනා මිහිරක් සොයත් **සහම්පති මහාබ්‍රහ්මයා** ද එතෙකින් වැඩියක් සොයා ගත නො හෙති යන පරිද්දෙන් ම මිහිරිවූ දහම් ඇසුව ඒ ඔසින්නට වූ වර පල! ඈ ලද ඇස් ඈ ලද කන් මෙ මිහි මා ඇතුළු වූ සියලු සත්ත්‍වයාහට අමා මහ නිවන් දක්වා වාසනා වේව යි දුක්පත්වැ හොස් ගුළු සත්වලෙහි දුක් වෙන වෙන ම නිවා පියන්නට සමළු වූ තුණුරුවන් එස්වූ මා හා සමාම් මඩුල්ලට වැඳ ගිය මහබුහුදට දමාපු ගිනි පෙණෙහෙල්ලක් සේ ඒ තුණුරුවනට දමා ලූ සිත නිවී සැනහී ගියේ.

අවීචි මහා නරකයට වැදූ ඒ ගිනි නිවා, වැසි වස්වා වතුරු හෙළුවා පැසෙන සතුන් ලඝ අස්වසා සා දුක් නිවා එන මුඝලන් මහතෙරුන් තමන් පාපිස්නා බිසි කළාවූ බුදුරජානෝ හිඳැ බණ වදුරති. ඒ ලඝ නිවී ගියේ. සැනහී ගියේ. වඩදිඝ මුහුදු 1 ඝතා එත් එත් පිරී ඉනිරී ගිඝ කලපුවක් සෙයින් ඒ දම් යතා 2 ගොස් ; වදුත් වදුත් ඒ ලඝ සොම්නසින් පිරී ගියේ. ආදිවූ දුක දුක් පමණින්ම ඇට මහත් අස්වස් වී. ඝඬා, ඝමුනා දෙක එස් වූ තැන්හි දිය පිරුමක් සෙයින් ඒ රූපරසඝ හා ඒ ධම්රසඝ හා එක්වූ තන්හි සොම්නස් බොහෝ වී. මෙසේ මතු ලබන නිවන් සුව නබා ඇසූ කෙණෙහි ම ප්‍රෙත ඝන් ලෙහි පහල පොවා එතෙක් දුක් නිවා මෙතෙක් සුව සර හා ලන්නාවූ ධම්රත්නඝ සරණ යෙමි සි **දහම් සරණ** ඝා **සුතු.**

ඈ මෙසේ සඩමීයට කන් ඔබූ කොටැ අසමින් සිටි සම යෙහි ඇතිල්ලෙහි එලුනු පුතු හා ඇකයෙහි හුන් දුව හා සයින් හඬා ඇදූ පැදූ චිත්ත විඝෙප කොටැ බණ ඇසිඝ නො දෙති. හෝ තොමෝ දරුවන්ට මෙසේ කියා සැනහූ ල. පනැස්හි සිහිල් දිඝ හා කැටුව වදනා සඝියන් නගුට ගෙණැ දුරඝසන් නා සේ බුදුන් වදුරණ මිහිරිවූ බණ වදනා කණට දරුවන් හඩනා හඩ නො වැද්ද දී දුරට ගැසූ ඕ තොමෝ නො හඬව් දෙ දරුවෙනි මේ ව්හාර සම්පඝෙහි සොටු සෙම් ගොදුරු සොඝා ඇවිදූ නො ලදින් ආ අපට දෙව්බඹුන් හා එක්වැ බුදුන් වහල් කොටැ බුදුහු දහම් අම ඔද වළඳවති. ඒ ඇපි කණිපුට යෙන් උකහා බොමින් සිටි යම්හ. මේ හඩ ගිරිනි ගන්න කලෙක් නො වෙයි.

"සිත් සනහා මිහිරි විදිනා කලෙක් බැහින් නො හඬව් දරුවෙනි! ජාතිඝ මුළුල්ලෙහි වැල්මී වෙනෙන් වැල්මී කා වැඩි පුත්‍රප්‍රෙමයෙන් බුරුල්ලෙහි කිරිගැන් වූ දෙනක පුතුන් දකුත් කිර් සිඳින් ඉනිරී වැහිරී ගිඝ මිහිරි කිරෙක් සෙයින් සසර පම ණින් ජාති පරම්පරායෙන් බොධිපාක්ෂික ධම් නැමැති වැල්මී වෙනෙහි ඇසිරී ආ අපගේ බුදු වූ මැනියන් වහන්සේ කරුණා නැමැති බුරුල්ලෙහි පිරිසිදු සඩම් නැමැති ක්ෂීරඝ අපි විනෙඝ පුත්‍රඝන් දකුත් පිරී ඉනිරෙන්නට වදා. මම ඒ උකහා බොමින් සිටියෙමි. මා වියවුල් නො කර වූ එහෙයින් නො හඬව් දරුවෙනි!

---

1 පතා. 2 එත් එත්.

"දෙව්ලොව අමා වළඳන්නනුදු මේ දහම්රස නො ලද් දවස් ඒ අමායෙහි අරුවිගන්නා පරිද්දෙන් මිහිරි දහම් රසය අප කණ මැඩැ වත්කෙරෙමින් වැඩහුන් බුදුරජානන් වහන්සේගේ බුඩ විලාසය බලව උන් වදුරණ බණට කන් දමව නො හඬව්! දරුවෙනි!! චතුමධුර වත්කොටැ හැනූ ගද හැල්සා ලෙහි බත් කන තැනැත්තහු ද හැනිගිය හකුරක් සෙයින් මෙමා විඳි දහම් රසය අතරතුරෙහි තොපගේ හඩ වැටී හෙන්නා හා කණ ඕරිහෙයිනි. එහෙයින් නො හඬව්. දරුවෙනි!

"බඹුන් බඹලෙව්හි නො ලද සැනහුම් දෙවියන් නඳුන් උයන්හි නොලද සැනහුම් තමා දෙරවුයෙහි එලිපත පිනූ විට ම සහමුලින් නමාලන වෙහෙර බුමකට 1 වනුම්හ. එහිදු එකතැන්හි මඩුලු බැඳ තුණුරුවන් දුටුම්හ. තුන් ලෝ වැස්සන් සිත් නිවන්නට හැඟෙන තුණුරුවන් අප තුන්පුන මවුන් පමණක් ලය නිවන්නට අසම්ඵැයැයි නො සිතව්. නො හඬව් දරුවෙනි! කියන බණෙක මිහිරක් අසව්. වැඩහුන් විලාසෙක මිහිරක් බලව් අසා හුන් සහ පිරිසෙහි සන්හුන් කමක් බලව්.

"මා වැනි ප්‍රෙතියෙකුගේ පොවා ගොදුරු සන්න නැතිවැඩන පරිද්දෙන් මිහිරිවූ බණක් අසා සිටියෙමි. ඒ අසන්නාවූ මා සිත වියවුල් නො කරව්. සියලු සසරදුක් නාක් දනන්නට ඇණි කොටැ ගත් නාක් වැනිවූ තුණුරුවන් එකතැනට රැස් විය. සමහිස් පැරැම් නළින් තුන්ලෙව්හි තුබූ මිහිර එකතැනට උරාගත්නාක් බඳුවූ බුදුරුවෙක් පැණෙයි. ඔවුන් වදුරණ බණෙහි හඬක් හා නොප හඬන බැගෑ හඬක් හා දෙක එකතැනට නො යෙදෙයි නො හඬව්. දරුවෙනි!

"අප විඳින දුක් වූ නියා විඳිමින් සිටි අප තබා ප්‍රෙතලොකයෙහි දුක් වූ නියා මෙසේ ඇසි ඇසුවනුදු විඳිමින් සිටි චක්‍රවර්ති සම්පත් හැරැපියා දහම් සොයා වල්වදනා පරිද්දෙන් එබඳුවූ දුක් විඳිමින් සිටි ඇපි මේ දහම් පසක් කෙරෙමින් සිටියම්හ. බඹ සැපත් විඳින්නනුදු ඒ සැපත් දුකැයි සිතා සුවකොටැ නකා ගත් නිවන්හි ගුණවුව. ඒ බුදුහු ම වදුරමින් වැඩහුන් සෙයෙක. නිවන් නම් අප සේ වූ දුක්පතුන්ට ම කළු දෙයෙක්

1 වදුළිහ.

වන. බුදුහු නම් අප සේ වූවන් කෙරෙහි ම කරුණෙන් ඇරැඹූ කෙණෙකුන් වැන්නාහ. දෙව්බඹුන් නිවන් පතන්නේ දෙව් බඹ සුව නො මිහිරින් නො වෙයි. වැළි කුමක් පිණිස ද? යත්.— ඉන් ගිලිහී ගිය දවස් අප උපන් ප්‍රේතලොකයෙහි ඉපදූ සමෝ දෝ හෝ යන හයින් ය.

"මෙසේ හෙයින් නිවන් මිහිර අපට හැඟෙයි. එසේවූ නිවන් බුදුහු වදාරති. ඒ අසා සොම්නසින් මාගේ ලය පිරී ඉතිරෙයි. ගොදුරෙක යන බස් අසා පියා හොවා දිව විඩා වම්හ. නිවනය යන නම අස අසා සිටිතැන්හි සිටැ නො අසත්. එහි අප ප්‍රිති නොවිඳුත් නො යෙදෙයි. ඔවුන්ට දරු වෝ ඉතා ප්‍රියයහ. ගැහැණුන්ට සැමියෝ ඉතා ප්‍රියයහ. ඒ දෙපක්‍ෂයට වඩා මේ ධර්මය මට ඉතා ප්‍රියය. හෙද මට නිෂ්කාරණයෙහි ප්‍රිය නො වෙයි. අප විඳිනා දුක් සියලු දුක් නෙවන හෙයින් ප්‍රිය ය. සඩර්මයසේ දුක් නිවන්නට දරුවෝ ද අසමර්ථයහ.

"ඉදින් ප්‍රිය පුත්‍රයෝ දුකින් ගලවත් නම් තෙපි දෙදෙන මා කුමක් පිණිස දුකින් නො ගලවම් ද? තොප මට ප්‍රිය පරිදි අනිත් කෙසේ කියම් ද? මෙ වැනි සා දුකින් පෙළී පවා ලද නිය කනු පමණක් බෙදා නොදී වළකා නොකන පරිද්දෙන් ප්‍රිය වත් මාගේ ශරීරය තමහට බරවැ වැටහෙන පරිද්දෙන් දුර්වල වූව ද නොප උකුලෙහි ලා ඇදූ ගෙණැ ඇවිදිනා පරිද්දෙන් ප්‍රියවූ දරුවෝ දුකින් ගලවත් නම් තෙපි මා කුමක් පිණිස දුකින් නො ගලවව් ද? මෙසේ හෙයින් නා විසිනුදු නිවිය නොහැකි දුක් මේ ධර්මය ඇසූ පමණින් නිවෙයි. ජරාමරණාදිවූ සියලු දුක් නිවන්නාවූ සඩර්මය අස අසා සිටියෙම්. තෙපි නොහඩව්. මාගේ ලය සොම්නසින් ඉතිර ගිය සේ බලව්. දෙනුවන් නහවාගෙණ වැහිරෙන දළු සෝ කඳුලෙන් යුකතවූ මේ ඇසින් වැහිරෙන සතුටු කඳුලු බලව්. සියලු ශරීරය මැඩැ ගෙණැ පැනැ නැඟි ලොමුදහ බලව්. මේ මිහිර විඳැ මා සැන හෙන කෙස් නො හඬව්. තෙපිදු මේ මිහිර විඳුව"යි කිව.

ඒ අසා බණට කන් යොමා බුදුරුවෙහි ඇස් හෙළා ඒ මිහිරෙහි රස දන් පිලවා ආදිවූ මව හා කැපිවැ විළුට බැසැ පැන් බී පුරුදුව ගත් මහත් මුවපොල්ලන් පසුව මවට පළමු දිවගන්නාසේ දැන් මවගේ නියෝගයෙන් බණ අසා බණෙහි මිහිර දැනැ ඒ රස විඳ නෙමේ මෙසේ කියා "අම්ම! පිළිවෙත්හි

නුමුලා හිතාහිතය, අපායාපාය, කතීව්‍ය කතීව්‍යය, කුශලා කුශල විභාගය යන සියල්ල නොමුලාව දන්නා හෙයින් සියලු දෙව්මිනිස්සුන්ට ශූනාලොක් දෙක සසරවැනි අපායෙන්හි පර තෙර දුටු ශ්‍රෙයමණ්ඩල වැනි මහනත් ශ්‍රීහස්ත නෙලෙහි රෙඛා සේ අයත්තයෙන් බලන මේ හිමියානෝ බණ වදුරති. එවැනි බණ නො ඇසූ විරූ බැවින් ඇපි මෙබඳුවූ දුකකට පැමිණ ඇවිදුම්හ. එසේ හෙයින් ඇපි තොප අසන බණට බාධා නො කරම්හ. තෙපිදු බණ අසව. බණ ඇසීමට වැඩි සුවයක් නැති බව අපටත් හැඟේ"යි කිව.

ඒ අසා මවු සමාධින් සිටැ බණ ඇසුව සමයෙහි බණ අසන සියලු පිරිස් මුහුණ බලා සිත් බල බලා සථාන දැනැ බණ වදුරණ සළුඟයන් වහන්සේ ඒ දෙපුතු මවුන් සෝවාන් වන්නට කුසල් ඇති බැව් දැනැ චතුඃසත්‍යය ප්‍රකාශ කොටැ වදුරා මරණ භයින් දෙදෙව්ලොව දෙවතාවන් හැරැ ගෙණැ හඬා අවුත් වන් ශක්‍රදෙවෙන්දුයාට දුන් තරමින් ම අමා මහ නිවන් දී වදාළ සේක. ඕ සිවි පියෙහි ම සිටැ සෝවාන්වැ පුත්හට මෙසේ සතුති කෙරේ.

"තමා වැදූ දරුවන් නුවණැති බව ම ඉතා යහපතෙක. මපුතනුවෝ බුදුරජානන් වහන්සේ වදුරණ බණ පිළිවිදැ විදැ අසා සිවියාහ. ඇවිලෙන කුසගිනි නිවූ නියා බලත් අහර සොයන්නට ම කලක් වැනි බව මුත් බණක් අසන්නට නො කල්ය. වයස් බලත් තෙමේ බාලයා සාදුන් නො බැලීය. වයස් නො බැලිය. බුදුන් වදුරණ ධර්මය ම බැලිය. ඉදින් මේ මාගේ පිනත් අතර තුරෙහි හඬ හඬාලා නම් "අම්ම! එව"යි ඇදූ ඇදූ ලා නම් සතින් බිම කකුල් ගස ගසා හඬා නම් මට බණ ඇසිම් කොයි ද? දන්නා අමා මහ නිවන් කොයි ද? ම පුනනුවෝ එසේ වූ ඇවිටිලියක් නො ගෙණැ මා හා කැටිවැ බණ ඇසූහ. එසේ වූ මාගේ පුනනුවෝ සුවපත් වෙත්ව යි අද මම මේ සසරින් එතරවිම්. චතුඃසත්‍ය ප්‍රතිවෙධ කෙළෙම්"යි පුත්හට සතුටුවැ උදන් අනුව.

පැවි ද බණ අසා සෝවාන්වැ අමා මහනිවන් දිට. සෝවාන් වූ ක්‍ෂණයෙහි ම ප්‍රෙතාත්මය නැතිවැ දිව්‍ය ශරීරය පහළ විය. ප්‍රෙතදුක් නැතිවැ දිව්‍යසම්පත්හි පහළ විය. සෝවාන් වූ දෙදෙනාගේ කුශල බලයෙන් උකුලෙහි හුන් දුවට ද එම

දිව්‍යශරීරය ද දිව්‍යසම්පත්තිය ද පහළ විය. තුන්දෙනා ම ගඳකිළියට නුදුරුනන්හි ම දිව්‍යවිමන් ලඳින් දෙවේලෙහි තුණු රුවන් වැඳැ යෙහෙන් විසූහ. මේසේ නමා කණහුනු කෙණෙහි අමා මහනිවන් රස සිත්හි එව ප්‍රෙතාත්මභාවයෙන් ගළවා දිව්‍යත්ම දී සත්ජාතියෙකින් මත්තෙහි සියලු බුදු පසේබුදු මහරහතුන් වහන්සේ අමා මහනිවන් පුරයට ගෙණැ ගොස් නිවා සනහාලන්නට සමර්ථ වූ ධර්මරත්නය සරණ යෙමි යි **දහම් සරණ යා යුතු.**

තව ද, සඞ්ඝය නමා රක්ෂාකළුවුන් රක්ෂාකරණ බවහුහ වන පිණිස මාගේ සැමිදරුවූ බොධිසත්වයන් වහන්සේට නොයෙක් ජාතියෙහි සම්ප්‍රාපනවූ උපද්‍රව ධර්මබලයෙන් නුවූ බව හඟවා සියලු සත්වයා සිතට ධර්මයෙහි අනුසස් දක්වා දහම් සරණ යවන පිණිස මාගේ සැමිදරුවූ බොධිසත්වයන් වහන්සේගේ ජාතිකානතාරය හැර දක්වම්. හෙද සුවකැමැති සත්පුරුෂයන් විසින් සිනහැනිවැ ඇසිය යුතු එහි පළමුකොටැ මාගේ සැමිදරුවන් සාව උපන් කල්හි ගින්නට වැදූ ධර්මබලයෙන් වන් ගින්නෙහි සිහිලවුන් ජාතකය දක්වම්. හෙද බොධිසත්ව වූ සැමිදරුවන්ගේ ගුණ බැවින් සෙනෙහින් ඇසිය යුතු. හේ කෙසේ ද? යත්–

අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රජකරණ සමයෙහි මාගේ බොධිසත්ව වූ සැමිදරුවානන් වහන්සේ දීපඞ්කර පාදමූලයෙහි පටන් සමතිස් පෙරුම් පුරා සම්මාසම්බුදුවැ මුළුලෝ ගළවමිහ යි නිසා කළ ප්‍රතිඥව මයනක ප්‍රාපත කරණ පිණිස ජාතියෙන් ජාතියෙහි ඇවිදිමින් මෙ සමයෙහි ලද වූ පලලවයෙන් හා සුපිපි මල් කැනින් හා මල් 1 ගැබැ කෙළනා බඹරුන් විසින් හා අතු අගැ කෙළනා කෙවිල්ලන් විසින් හා වෙලෙප් අගැ කෙළනා මොණරුන් විසින් හා රුක්මුලැ කෙළනා මුවපොල්ලන් විසින් හා වැලිතලා යෙහි කෙළනා නොයෙක් ජාතියෙහි චතුෂ්පදයන් විසින් හා විල්කෙළැ කෙළනා හංසයන් විසින් හා සක්වාලිණිය්‍යන් විසින් සැයංජාත වූ හැල්කෙතට හඬා වැහිරෙන ගිරවුන් විසින් හා ඇතින්නන් හා ඇත්පොවුවන් මැද මදුඹැවැ වන යෙහි සුඛවිහාරකරණ සතරවන දසායෙහි සතරවන සොහා

1 මල්අඟ.

යෙහි සිටි භද්‍රජානි හසුනින් විසින් හා සථාන'සථානයෙහි පණී ශාලායෙහි වෘක්ෂමූලයෙහි පර්වතගුහාවෙහි නදීතීරයෙහි ඉඳ භාවනා කරණ තපස්වීන් විසින් හා මනොහර වූ එක් මහවන යෙක්හි සහවැ උපන් සෙයෙක.

වනයෙහි එක් දිසාවෙක පර්වතයෙක, එක් දිසාවෙක නදී තීරයෙක, එක් දිසාවෙක ප්‍රත්‍යන්ත ග්‍රාමයෙක, එක් දිසාවෙක සථාම්දරුවන්ගේ වදුරෙක, කැණහිලෙක, මස්කාවෙකැයි යන සහඵවෝ තුන්දෙනෙක් වූහ. ශෂපණ්ඩිතයන් වහන්සේ ඇතුළු වූ පණ්ඩිතවරු ඝතරදෙන ම එක්ව වසන්නාවූ නම නමන් ගොදුරු ගන්නා තැනින් ගොදුරු ගෙණැ සවස්වේ ලෙහි එකතැනට රැස්වන්නාහ. එසේ රැස් වූ 1 ඔවුන්ට ශෂ පණ්ඩිතයන් වහන්සේ දන් දුන මැනැවැ. සිල්රක්ෂ මැනැවැ. පෙහෙවූව මැනවැයි අවවාද පිණිස ධර්මදේශනා කොටැ වදුරණ සෙයෙක.

ඉතිරි පණ්ඩිතවරයා තුන්දෙන බොධිසත්ත්වයන් වහන් සේගේ අවවාද ගිවිසැ දුශ්චරිතයෙන් දුරුවැ තම තමන් වසන්නාවූ වනලැහැබට වැදී ධර්මයෙන් දවස් යවන්නාහ. මෙසේ වසනකල්හි. එක් දවසක් බොධිසත්ත්වයන් වහන්සේ ආකාශය බලා චන්ද්‍රමණ්ඩලය දැකැ වටුවැ උපන් කල්හි, පවා මහාබ්‍රහ්මයා සේ මෙදහුය දන්නා නුවණැති හෙයින් සදෙහි අද දවසට කලායෙන් 2 අඩුය. සෙට දවසට සොළොස් කලාව පිරී මැදිපොහොය ලැබෙන්නේයැ යි නිශ්චය කොටැ අනික් පණ්ඩිතවරුන් තුන්දෙනා කැඳවා සෙට මැදිපොහෝ දවස ය. නෙපි තුන්දෙනා ම සිල්සමාදන්වැ ගෙණැ බිසපත් වැ ශීලය රක්ෂාකරව යි සීලයෙහි පිහිටුවා දුන්නාවූ දැනයෙක් ඇත්නම් ඒ මහාඵල වන්නේය. එහෙයින් යාචකයන්හු ආ කල්හි නොප අනුභවකරණ ආහරයෙන් ශක්ති පමණක් දන් දී අනුභවකරව යි වදාළ සේක.

තුන්දෙන ම සථාම්දරුවන් වදාළ අවවාද ගිවිසැ තමන් වසන තැන්හි වැසැ උදැසනක් සේම මස්කාවා ගොදුරු සොයා යෙමි යි කියා නික්මැ ගංතෙරට ගියේ. එසමයෙහි එක් බිලිවැද්ද දෙක් රේමසුන් සත්දෙනෙකු බාගෙණැ වැලින් අමුනා ගංතෙර

---

1 ඔවුනොවුන්ට. 2 අඩුව.

වැල්ලේ සඟවාලා මස් ගෙණීමට යට ගහට ගියේ. මස් කාවා ඉවගෙණැ ලා වැලිපිරාලා පියා රේමසුන් සත්දෙනා දැකැ නගා ගෙණැ බොධිසත්වයන් වහන්සේගේ අවවාද මුදුනෙන් පිළිගත් හෙයින් අනුන් සතු දෙයක් නොගණිමි සිතා තුන්වෙනිකැ මෙයට හිමියෝ ඇද්දෝ හෝ නැද්දෝ හෝ සි හඬ ගහා හිමියන් නොදැකැ මස් ඇවිනූ වැල ඩැහැගෙණැ තමා වසන තැනට ගෙණැ ගොස් වේලාවට වළඳම් සි වන ලැහැබෙහි මස් තබාලා තමා රක්ෂාකරණ ශීලයට ආදියෙන් මධ්‍යයෙන් අන්තයෙන් කිසි බණ්ඩ වී ද්‍රෝ හෝ නොවී ද්‍රෝ සි කියා ශීලවිරෝධයක් නොදැකැ තමාගේ ගුරුවූ සසපණ්ඩිත යන්ගේ අවවාදයට විරෝධයක් නොකොටැ මා ශීලය රක්ෂාකළ පරිදි ඉතා යහපත. සත්පුරුෂ සමාගමයෙහි බලයෙන් මා රක්ෂාකළා වූ ශීලය හෙතුකොටැ ගෙණැ මේ නිරිසන් ආත්ම භාවයෙන් ද ගැලවෙමි. මතු සුවර්ගමොක්ෂ සම්පත්හි දු ලැබෙසි. ශීලය ආවර්ජනා කොටැ හුන්නේ:–

කැණහිල් ද නික්මැ ගොදුරු සොයා ගොස් කුඹුරු රක්නා එකස්හුගේ පැලැ තුළු මස් හුල් දෙකක් හා එක් ගොයකු හා එක් 1 දිගෙඩියක් දැකැ මෙහි හිමියෝ ඇද්දෝ හෝ නැද්දෝ හෝ සි තුන්වෙනි හඬ ගහා හිමි කෙණෙකුන් නැති හෙයින් දී ගෙඩියෙහි උගය කරලා ගෙණැ ගොසි හා මස් හා කපින් ඩැහැ ගෙණැ තමා වසන වනලැහැබට ගොසින් වේලාවට කම් සි තබාලා තමාගේ ශීලය පරීක්ෂා කොටැ තමා රක්ෂා කළා වූ ශීලයට බණ්ඩයක් ජිද්‍රයක් සබලයක් කල්මාෂයක් නැති බව දැනැ තමාගේ ගුරුවූ සසපණ්ඩිතයන් වහන්සේගේ අවවාද මුදුනෙන් පිළිගෙණැ මා මේ ශීලය රක්ෂාකළ පරිදි ඉතා යහපතැසි කියා ශීල ය පරීක්ෂාකොටැ කොටැ හුන්නේ:–

වදුරු ද වලට වැදු අඹකැනක් කඩා ගෙණැ අවුදින් වේලාවට කම් සි වන ලැහැබෙහි තබාලා තමාගේ ශීලය පරීක්ෂා කොටැ හුන්නේ:–

බොධිසත්වයන් වහන්සේ වූ කලි "මා බැහැරින් දුකින් සොයන අහර නැත. වළඳන වේලා ආසන්න වූ කලැ ලැහැබින් නික්මැ හිතණ කාලා සිල් රක්ෂාකෙරෙමි"සි සිතා ලැහැබ

1 දි කෙණ්ඩියක්.

වැඩැහුන් සෙයෙක් අප සේ වූවනුදු නිවන් වැනි දුර්ලභ වස්තුවක් ලැබ ගණුම්හ යි සිතුවමුනා කලැ සසර වැනි එතර බිය නොහැකි තැනෙකින් තමන්ගේ ශබ්දය අසා හොත් මඟුන් පවා එතර වූව මනා කලැ තමන්ගේ විහාරයට වන් ප්‍රෙතයන්ගේ ප්‍රෙත ශරීරය පෙරළී දිව්‍ය ශරීරයට පැමිණෑ දිව මනා කලැ පස්වාදහසක් මුළුල්ලෙහි තමන්ගේ නම කිය කියා යන් නවුන්හොත් මරණමඤ්චකයට ම කැමැති දෙවිලොවකට අව මැනවැ යි නිල්ව නලවා සිටින දිව්‍යස්ත්‍රීන් විසින් ගැවසී ගත් නාවූ රථයක් සඳිවස්ලොකයෙන් අවුත් සිටිය මනා කල්හි ආභරණයක් නැති සඳමඬලට තමන්ගේ පිළිබිඹු වැනි විසිතුරු ආභරණයක් පැළැඳැ මනා කල්හි:-

"මම අද පෙහෙව ගෙණ හුන්නෙමි. දැනය නම් සිල ගෙහි පිහිටා ගෙණැ දුන් කලැ මහා ඵල වන්නේය. අද මා කරා යාචක කෙනෙක් අවු නම් මා කන තණ උන්ට දිලන්ට නොපිළිවන. අනිත් මිනිස්සුන් කන්නට දුදුස්ස ආහාරයෙකුදු මා කෙරෙහි නැත. බල! මාගේ ශරීර මස් එක යාචකයක්හු සඟ නිවා කන්නට ඇත. මාගේ දැනයෙහි ලොල් වූ මනොරථය මුදුන්පත් වන්නට සුදුස්ස කුසලෙක් ඇත නම් මා අත් බලා වසන්නාවූ මෙලොව සසරින් ගැළවෙන්නට සුදුස්ස භාග්‍යයෙක් ඇත් නම් මාගේ දැනපරමාඵ පාරමිතාව මසකප්‍රාප්ත වූවමනා වී නම් සියලු ලොව නිවා සනහාලුව මැනැවැ යන මාගේ මනදෙළ මුදුන් පත්වූව මනා වී නම් අද මා කරා යාව කයක්හු අවහොත් යහපතැ"යි ආවජ්නා කොටැ වැඩැ හුන් සෙයෙක.

මෙසේ සිතුවාවූ බොධිසත්ත්වයන් වහන්සේගේ දැනාඩ්‍ය ශයෙහි බලයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පාණ්ඩුකම්බලසිලාසනය උෂ්ණාකාර දැක්විය. ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ මා නොකැමැති සේ මාගේ ආසනය හුණු වන්නට කාරණ කිම් දෝ හෝ යි ආවජ්නා කරන්නේ සම්බෝදරුවන්ගේ දැනාඩ්‍යශයෙන් හුණු වූ බව දැනැ මේ මහාත්මයා සම්ප්‍රාප්තවූ යාචකයක්හුහට ශරීරමාංශය දෙමි කියා සිතා හුන්නේය. මේ සිතු අදහස කෙසේ වූ අදහසක් දෝ හෝ මේ අදහස සැබෑ වී නම් මෙසේ වූ වවුන් ලද ලොව සේ කුසල් කලෝ ඇද්ද? සියලු ලොකයෙහි ජීවිත ලද්දවුන් කෙරෙන් මෙසේ වූ ජීවිත ලද්දෝ ඇද්ද? සසරදුකට මෙසේ වූ ඖෂධයෙක් ඇද්ද? අමා මහනිවන් පුරයට මෙසේ වූ

රජමහ වනක් ගසන්නෝ ඇද්ද? නෑඹණාවට මෙසේ වූ මුහුණම්රිකුම් කරන්නෝ ඇද්ද? පරාථයට මෙසේ අභිෂෙක කරන්නෝ ඇද්ද? ධර්මයට මෙසේ දිවි දුන් සිනහැත්තෝ ඇද්ද? මේ මුත් පරීක්ෂා කට ශ්‍රුතු දෙයක් ඇද්ද? මෙසේ වූ මහා පුරුෂයන් මුත් අනික් දුක්කයුත්තෝ බිණ්ඩයුත්තෝ ඇද්ද? මේ උපන් අදහස මා ගොස් පරීක්ෂා කළ මැනැවැ"යි සිතා:-

පළමුකොටැ මස්කාවා වසන තැනට ගොස් බ්‍රාහ්මණවෙ සයෙන් සිටැ කුමක් පිණිස අදූ යි විචාළ කල්හි "පණ්ඩිතයෙනි! අද පොහෝදවස් පෙහෙවගන්නට සුදුසු ආහාරයක් නො ලදිමි. ඉදින් කිසි ආහාරයක් ලදිම් නම් ඒ වළඳා පෙහෙව ගන්නා කැමැත්තෙමි"යි කීය. ඒ අසා **මස්කා පණ්ඩිතයෝ** මාගේ ගුරු වූ සසපණ්ඩිතයන් වහන්සේ යාචකයන්හු දුට හොත් ශක්‍රාපමණින් දන් දෙවැයි වදුළ සෙයෙක. මේ ද අවුත් සිටියේ යාචකයෙක. මෝහට මාගේ ඇති දෙයෘධර්මය නො වළහා දන් දුන මැනවැ යි සිතා බ්‍රාහ්මණය මාගේ රෙහෙ මස්සු සත්දෙනෙක් ඇත. ඔවුන් වළඳා පෙහෙව ගෙණැ මේ වනයෙහි හිඳැ යෙහෙන් මහණ ධර්ම කර'යි කිහ.

ඒ අසා ශක්‍රබ්‍රාහ්මණ තෙම තව ඉතා ම උදැසන වූව. පසුව් දන්නෙම් වේදූ යි කියා **කැණහිල් පණ්ඩිතයන්** කරා ගොස් මෙසේ ම සිටැ කුමක් පිණිස අයි දූ යි කී කල්හි එ පවත් කියා ඒ අසා ශෘගාලපණ්ඩිතයෝ බ්‍රාහ්මණය! මාගේ හුල්පැලහු මසක් හා ගොයකු හා දී ගෙඩියක් ඇත. ඒ ගෙණැ වළඳා යෙහෙන් වනයෙහි වැසැ තපස් කරව"යි කීය. ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ ඔහුදු විමසා **වානර පණ්ඩිතයන්** කරා ගොස් මෙසේ ම සිටැ ඔවුන් විසින් විචාරණ ලද්දේ එ පවත් අසා **වානරපණ්ඩිතයෝ** ද "බ්‍රාහ්මණය! මාගේ අඹකැනක් හා ගඩොලයෙහි සිඟිල් පැන් හා ඇත. අඹ කා පැන් බී හී ගෙණැ යෙහෙන් මහණ ධර්ම කරව"යි කිහ.

ඒ අසා ශක්‍ර බ්‍රාහ්මණ තෙම පසුව දන්නෙම් වේ දූයි කියා බොධිසත්වයන් කරා එළඹ සිටියේ. සසර පමණින් යාචකයන් ම සෙනහයෙන් ම බලන්නට කළ දැසක් හා ඔවුන් හා මධුරකථා කරන්නට කළ තුඩක් ඇති හෙයින් බොධිසත්වයෝ ශක්‍රයා මුහුණ බලා බ්‍රාහ්මණය! කුමක් පිණිස 1 අයි දැ"යි

1 අදූයි.

විචාරා වදාළ සේක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙම පණ්ඩිතයෙනි! ඉතා ම සසිමි. අදැ පෙහෙව ගන්නා කැමැත්තෙමි. අහරක් සොයා ආමි සි කීය.

ඒ අසා බොධිසත්ත්වයෝ සවිඥානයෙහි එක පැහැරී කෙළින් සිටගත්තා වූ සියලු රෝම ඇතිවැ එසේ වූ ප්‍රියවචනයක් කී ඔහුගේ මුහුණ බල බලා ඇසින් වැගිරෙන සතුටු කඳුලෙන් යුක්තවැ "බ්‍රාහ්මණය! ආසේ ඉතා යහපත. දුටුදුක්ම ඉතා ප්‍රියය. අප සිතූ 1 සිතක් හා තොප කී බසක් හා දෙක ගැහෙන පරිදි අපගේ දෛවයෙන් වූ බව මූත් අනික් ලෙසකින් නො වූය. සාමිහ සි කියා ආවා වූ තොපට අපගේ කවර ධාන්‍යයෙක් ඇත් තෙන් දෙමෝ ද? මිනිසුන් කන්නට සුදුසු වූ අපගේ ඇතිවැ තුබු යේ නම් අපගේ ඇහමස් ම ය. කිසිවුක් නැති මේ ජාති යෙහි තබා 2 මුළුලොවට ඊශ්වර වූ දවසක් ඇතත් දන් දී පියන්නා කැමැති ඇසෙක් හෝ ඉසෙක මසෙක් හෝය. ඉදින් තෙපි අප මරා ගන්ව සි කිමෝ නම් තොප අත ප්‍රාණවධය බැ දෙන්නේය. එහෙයින් තොපි ගොස් එක් නැනෙක ගින්නක් දල්වා ලව. අප අපගේ මනදෙළු පුරා එහි හි පැලහී ගිය කලැ යෙහෙන් අනුභව කොටැ මහණ දම් පුරා" සි 3වදාළ සෙයෙක.

ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ අධික වූ විස්මයට පැමිණ එක් නැනකට ගොස් මහා අගුරු රැසක් මවාලා බොධිසත්ත්වයන්ට දන්වීය. ඒ අසා සත්ත්වාදරුවෝ වැඩහොත්තාවූ තණ ඇතිරියෙන් නැගි සිටැ පෙහෙවස් ගෙණ අගිහෙක භූමියට නික්මැ ගත්තාවූ රාජකුමාරයන්හු සේ සතුටු සතුටුවැ නික්මැ අගුරු රැස් බලා පියා තමන්ගේ ශරීරය ද බලා සසින් සිටි බ්‍රාහ්මණයා මුහුණ ද බලා ලොකයෙහි සත්ත්වයාගේ ප්‍රාණයට වඩා ප්‍රිය වූ දෙයක් නැත. මම ඒ ප්‍රාණයෙහි අපෙක්ෂාවක් නැතිවැ මේ ගින්නෙහි හි පැලහී මස් දන් දෙමි.

මෙහි අනුසසින් මතු මාගේ ඇතින් විසිරෙන්නී දුටු 4 බියලී මුං බියලි තලඇට සා ඇට ගෙණ පූජා කළෝ ද සසර දුකින් මිදී අමා මහනිවන් දකිත්ව සි රාගාග්නීන් ද්වේෂාග්නීන් මෝහාග්නීන් තැවී දෙමිනස් පත් මුහුණන් මුලුලොව වැස්සන්ට නොපා ඒම් වසි රාජභය චෝරභයාදී වූ කිසි භයකින් දුක්පත්වී හඬන ලෝවැස්සාගේ කඳුලු මුසු මුහුණන් දැක්ක නොහැම්ම සි

1 සිත හා. 2 මුළුපොළොවට. 3 පුරවූහී. 4 පියලි.

මා එක තැනැත්තහු ගැසූ නිවන්මග සූවිසි අසඛ්‍යයක් සත්ත්වයා නො හැකිළී වදනා පරිද්දෙන් මහත් වේ වයි.

"මරහු හැරැ අනික් කෙණෙක් මා කරා අවුත් භයින් වෙව්ලා නො දිවෙත්ව යි, මාගේ කරුණා ජාලයෙහි හසු වූ සතෙක් අමා මහ නිවණට වැදූ මුත් සසරෙහි දුකට පාත්‍ර නො වේ ව යි, කී කී බසෙහි නැඟු නැඟු පියවරෙහි බැලූ බැලූ දිසා යෙහි:ලොකාඑමුත් අනිකක් කට නො හෙම් වයි, නිද නිදා සිහි නෙඳුදු මාගේ නම සිහිකළ සත්ත්වයෙක් ඇත් නම් ඔහු මා වන් අමා මහනිවන් පුරයට ගෙණැ ගොසින් මුත් නො නවතී ව යි, මා මේ අඟුරු රැසට පනන පිනුම ම මා වශ්‍රාසනයට නහා මුත් නො නවතිව යි.

"මෝහට මා දෙන ශරීරමාංශය මතු මා මුළුලොවට අමා මහනිවන් දෙන බවට පූර්වනිමිත්ත වේව යි, මේ ජාතියෙහි පටන් ගෙණැ බුදුවැ අමා මහනිවන් දක්නා ජාති දක්වා මාගේ සුවයෙන් මුළුලොවට සුවපත් කට හෙම්ව"යි කියා මෙසේ 1 සර්ඥත්වඥානයෙන් කුළුගෙණැ ප්‍රාර්ථනා කොටැ සියලු සත්ත්වයන් කෙරෙහි පවත්නාවූ කරුණායෙන් මා ගින්නෙහි පැලහෙන කලැ මාගේ ශරීරයෙහි කිසිප්‍රාණීන් කෙණෙකුන් දැගිඝහොත් නපුරු යි කියා සිතා වදුරා තුන්විටෙක ශරීරය පොළා පයා පිඟුම් විලකට වදනා රාජහංසයක්හු සේ ගිණි ගෙණැ දිලියෙන සාලඟුරු රැසට පැනපි සෙයෙක.

සචාම්දරුවන්ගේ ධර්මාලයෙහි බලයෙන් අවීචි වහනියක් සේ දැඩි වූ ඒ ගින්න ද ශරීරයෙහි රෝමකූපමාත්‍රයකුදු හුණු කරන්නට අසමර්ථ විය. ලක්ෂයක් වටනා රත්පලස් මත්තෙහි හුන්නාවූ රාජකුමාරයක්හු සේ රත්ගල් තලෙහි හුන්නාවූ කෙශර සිංහරාජයක්හු සේ වැඩැහිදැ ශක්‍රයා මුහුණ බලා කොල! තාගේ මේ ගිනි ඉහිරි ගිනි සේ නො වෙයි. හෙල්මැලි ගැබින් සදුන් පල්ලෙන් මැඳ මාරුතයෙන් හිමකනිකායෙන් සිහිල් තාක් ගෙණැ පිඬුකොටැ වටා දැල් වූ ගින්නක් වැන්න. මේ කුමක්දැ යි විචාරා වදාළ සෙයෙක.

---

1 සර්ඥතාඥානයෙන්.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ බ්‍රාහ්මණ වෙශය හැරැ පියා ශක්‍රවෙශයෙන් සිටැ "මහාපුරුෂය! මම බ්‍රාහ්මණයෙක් නොවේමි. දෙදෙව්ලොව දෙවතාවන්ට අධිපති වූ ශක්‍රදෙවෙන්ද්‍රයෙමි. තොපගේ ගුණ මහිමාවෙන් මාගේ **පණ්ඩුකම්බල සිලාසනය** හුණුවැ ගිය හෙයින් තොපගේ දැනාඩ්‍යාශය පරීක්ෂා කරන්නට 1 ආයි සි දැන්විය. ඒ අසා සඩ්ඪාමිදරුවෝ සිහියා "තෝ නම් එකසත්වලෙස්හි එක ශක්‍රයෙක. තා තඛා අනන්තාපරිමාණ සක්වළ අනන්තාපරියන්ත ශක්‍රයෝ කැවිවැ ද මාගේ දැනාඩ්‍යාශයෙහි අඩුවක් දැක්කහන නොහෙන්නා හ. ජීවිතයෙහි සෙනහයක් ඇත්නෙම් එම් නම් සෙනහයෙන් ශරීරයක් රැක්ක මැනවැ යි සිතම් නම් මට සුවයෙක් කැමැත්තෙම් එම් නම් දුක්පත් මුළුලොව කෙසේ ගළවම් ද? මේ ලොවට කෙසේ සිනහැත්තෙමි යි සිතම් ද? මා ආශ්‍රය කළාවූ ලොව කෙසේ ගැළවෙද්දැ යි වදාළ සෙයෙක.

මේ අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ "සඩ්ඪාමිදරුවානෙනි! තොපසේ වූ මහාපුරුෂයාන කෙණෙකුන්ගේ ගුණ මද දවසක් පවත්නා බව සුදුසු නොවෙයි. කල්පානන්තයක් දක්වා මුළුලොවට 2 ප්‍රකට්වූව මැනවැයි සිතා සදම්ඩලෙහි බොධිසත්වයන්ගේ රූපය හැදැ බොධිසත්වයන් වඩා ලෙහි හොවා ගෙණැ වසන්නාවූ වනලැහැබෙහි ම3 හොවාලා වැදැ පැදකුණුකොටැ ජීවිත ඇත්නවුන්ට ඇස් ලද්දවුන්ට නොපසේ වූව න්ගේ දුක්ම වාසනා වේව යි පතා දෙව්ලොවට ගියේය.

මෙසේ නිරිසන්වැ උපන් සඩ්ඪාමිදරුවන්ට පොවා ධර්මයෙහි බලයෙන් ඒ ගිනි නිවිල්වූ බව ඇසූ සත්පුරුෂයන් විසින් සියලු උපද්‍රවයෙන් ගැළවී අනිමත සම්පත්හි සාධාකයින් සිතින් සුව විඳිනා පිණිස සඩ්ඪිය ම 4 මෙනෙහි කොටැ **ධර්මය සරණ යා සුතු.**

තවද, සියලු බුදු පසේබුදු මහරහතන් වහන්සේ වරුන්ද මුළුලොවට රක්ෂාවට තැකූ සියලු දුඃඛයට ප්‍රතිපක්ෂ වූ සියලු සත්වයාහට ආවාහන මන්ත්‍රවූ සියලු ලොකාර්ථයට මූලප්‍රතිඥාවූ සඩ්ඝිය තමා රක්නවුන් රක්ෂාකරණ පරිදි හගවතුන් පිණිස මාගේ සඩ්ඪාමිදරුවූ සම්‍යක් සම්බුඩයන් වහන්සේ බොධිසත්ව භූමියෙහි සඩ්ඝබ්‍රාහ්මණ කල්හි පරතෙරක් දැකනත නොහැක්කාවූ මහාසමුද්‍රයෙහි නැවූ බිඳී පොවා ධර්ම බලයෙන් එහි

1 ආමිසි. 2 ප්‍රකාශ. 3 ඔවැලා. 4 මුල්කොටැ.

පිහිට ලද්දාවූ සඞ්ඝබ්‍රාහ්මණ චරිතය දක්වා දහම් සරණ යාමේහි සත්පුරුෂයන්ට උනසාහ වඩවනු කැමැත්තෙමි. ධර්ම බලයෙන් සසරදුකින් ගැලවෙනු කැමැති සත්පුරුෂයන් විසින් බෝධිසත්ත්‍වව ගුණ ශ්‍රේෂ්ඨ වූ ධර්ම මහත්ත්‍වය හඟවන්නා වූ මේ කථාව සිතෙහැතිවැ ඇස්ය යුතු.

ඒ කෙසේ ද? යත්:–

දීපඞ්කරපාදමූලයෙහි හයාත්‍රාපත්ත වූ නිර්‍වාණසම්පත්තිය හැරැ මා ඇතුළු වූ මුළුලොව ගලවන පිණිස සංසාර සාගරයට වන්නා වූ සඞ්ඝාමිදරුවානන් විහන්සේ ජාතියෙන් ජාතියෙහි ලොකාළු කෙරෙමින් දිව්‍ය මනුෂ්‍යලොකයෙහි සංසරණය කරණ සෙයින් මේ කප්හි මෞලිනී නම් නුවරැ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රජකරණ සමයෙහි තමන් වහන්සේ සංඛ නම් බ්‍රාහ්මණවැ මහාධන සම්පත්තීන් යුක්තවැ සතර නුවර දොරැ හා නගරමධ්‍යයෙහි හා තමන් වහන්සේගේ මෙ දොරැ හා මේ තැන්හි දන්හැල් කරවා එකි එකි දන්හල්හි ලක්ෂයක් බැගින් සලක්ෂයක් ධන විසදම් කොටැ මහදන් දෙන සෙයෙක.

එසේ මහදන් දෙන සඞ්ඝාමිදරුවෝ එක් දවසක් මාගේ දැනය ඉතා මහත. ක්‍රමයෙන් මේ ධනය ක්ෂීණවැ ගිය කල්හි දන් දී ගන්නට නො පිළිවන. එසේ හෙයින ධනය ක්ෂීණ වන්නාට පළමුකොටැ නැවු යාත්‍රා කොටැ සඞ්ඝාහුම්යට ගොසින් ධනය ගෙණෙව මැනවැ යි සිතා වදුරා නැව ඉදිකරවා බඩු පුරවා ගමනට සැරහී සිටි අඹුදරුවන් කැඳවා මා එන තාක්කල් මාගේ දැනය අබඳා කොටැ පවත්ව යි අවවාද දී වදුරා වහන් සගළක් ශ්‍රීපාදයෙහි ලා නෙණැ කුඩයක් හිසට කරවා ගෙණැ බොහෝ දැසකම්කාරයන් විසින් පිරිවරණලදුව නැවු නැඟී වදුරන්නේ පටුන් ගම් අසිමුඛවැ නිස්මැ වදුළු සෙයෙක.

එසමයෙහි ශාඳමහන් පව්වෙහි වසන්නා වූ එන් පසේබුදු - කෙණෙකුන් වහන්සේ සමුද්‍රයාත්‍රාකරණ පිණිස නිස්මැ ගත් නාවූ සඞ්ඝාමිදරුවානන් දිව ඇසින් දැකැ දැනයෙහි ලොල් දැ මේ බුබාඞ්කුරසෘ යාත්‍රා පිණිස යැයි නිසම්න. ඕහාට සමුද්‍රයෙහි වන්නාවූ අන්තරායෙන ඇද්දෝ නැද්දෝ නෝ යි පරීක්ෂා කොටැ වදුරණ සෙයෙක් පැමිණෙන අන්තරායෙක් ඇතැ යි කියා දැනැ වදුරා මෙතෙම මා ගියහොත් තමාගේ වහන් සගළු හා කුඩය

හා මට දන් දී එහි අනුසසින් මහා සම්පත්තියෙහි නැවුම්බුන් නැන්හි සත්රුවන් පිරුනු මහා නැවු ලදින් පිහිට ලබන්නේයැ යි ඕහට මා අනුග්‍රහ කළ මැනවැ යි සිතා වදුරා ආකාශයෙන් අවුත් බොධිසත්වයන්ට නුදුරුතැනට බැසැ ප්‍රණීතවූ වාතා'ත පෑහි සාලඟුරු ඇතිරියක් වැනි හුණුවැල් මැඩැ ගෙණැ වඩනට පටන්ගත් සෙයෙක.

බොධිසත්වයෝ පසේබුදුන් වහන්සේ දැකැ මේ මා දුටුයේ පුණ්‍යක්ෂේත්‍රයෙක. අද මා මේ පුණ්‍යක්ෂේත්‍රයෙහි කුසල් බීජ යක් වපුරණ බව සැලසුම් යැයි සිතා වදුරා පසේ බුදුන් වහන්සේ කරා එළඹැ පසඟ පිහිටුවා වැඳැ "ස්වාමීනි! මට අනුග්‍රහ පිණිස මැක් මේ ගසමුලට වැඩැ සිටිය මැනවැ යි ආරාධනා කොටැ රුක්මුලට වඩා ගෙණැ ගොස් එහි වැලිගොඩක් කොටැ ඒ වසා උතුරුසළුවක් අතුරා පසේ බුදුන් වහන්සේ එහි වඩා හිඳුවා වැඳැ සුවඳ කොටැ පෙරහා ගත්තාවූ පැනින් ශ්‍රීපාදය සෝදවා සුවඳ තෙල් පය ගල්වා නමන් වහන්සේගේ වහන් දෙක ගළවා සුවඳ තෙලින් වතා ශ්‍රීපාදයෙහි ලාලා කුඩය ශ්‍රී හස්තයට පළඳනවා "ස්වාමීනි! මේ කුඩය හිසට කොටැ ගෙණැ මේ වහන් ශ්‍රීපාදයෙහි බහා ගෙණැ සුවසේ වැඩිය මැනවැ යි වදාළ සෙයෙක.

පසේ බුදුන් වහන්සේ දැ:-

"චේතනං පත්ථනං තුයහං ඛිප්පමේව සමිජ්ඣතු
සබ්බෙ පූරෙන්තු චිත්තා සඛාපප්පා චනෙ'පණ්ණරසි යථා"

යන ගාථායෙන් අනුමෙවෙනි බණ වදුරා මදනැනක් ශ්‍රී පාදයෙන් වැඳැ "මෙසේ මහඇඟි තැනැකට වන මා දන් දුන් නේ"යයි බොධිසත්වයන්ට ප්‍රසාද වඩන පිණිස බොධිසත්ව යන් බල බලා සිටියදී ම ආකාශයට පැනැ නැඟි පච්චණි වලා හක පඬිකනී මැඩැ ගෙණැ ශක්‍රමාන පඬිනෘව ම වැඩි සෙ යෙක.

බොධිසත්වයෝ ද ඒ ආශ්චර්‍යය දැක වදුරා මා දුන්නා වූ දානය ඉතා සඵලයැ යි මහත්වූ සන්තෝෂයට පැමිණි සෙයෙක. එසේ අධික වූ සන්තෝෂයට පැමිණ ස්වාමිදරුවෝ නැවූ නැගී සමුද්‍රයෙහි නිස්මුණු සෙයෙක. සත්දවසක් සමුද්‍රයෙහි ගියාවූ නැව දිය දැකැ පියා දිය ඉසද උතුකොටැ පයන්නට අසමර්ථ වූ මහාජනයා මරණ භයින් තැතිගනිවැ තමන්ගේ ඉෂ්ටදෙවතා වන්ගේ නම් කිය කියා හඬන්නට පටන් ගත්හ.

එ සමයෙහි සඞ්ඝමිදුරුවෝ ජානි ජානියෙහි නැවූ බිදුනු කලැ ඉහුදෙනි දිය කෙළනා විලෙස්හි දිය හොරුවක් පෙරළී ගිය කල්හි ඒ විල පිහිනන්නවුන් හය නැතිවැ පිහිනන්නා සේ මහා සමුද්‍රයෙහි පිහිනා පරිචය ඇති හෙයින් කිසි භයක් නො කොටැ තමන් වහන්සේගේ එස්අතවැස්සකු හැරී ගෙණැ සඞ්ඛයෙහි තෙල් ගල්වා ශකීරා හුනු හා එළකිතෙල් බඹ පුරා මෙහෙ නිමවා අතවැස්සා හා කැටිවැ මහා කුඹට නැඟි එවේලෙහි කිසි චකිතකමක් නැති හෙයින් කුඹ මත්තෙහි වැඩ සිටැ අපගේ හිමි නුවර මේ දිසාවේයැ යි දිසාව හිමි කොටැ ලා නැවුහි සෙසු හිණවියෝ සතළුවන් මඩිය කඩුපයන්ට හොඳුරුවෙමින් සිටියදී ම මඩිය කඩුපයන් විසින් එන්නා වූ උපද්‍රවයෙන් තමන් වහන්සේ ගළවා අතවැස්සා හා කැටිවැ ම ඉස්බත් තැන් පැනැ ගෙණැ ඇත වැටී හී බුනුදු පිහිනන්ට පටන් ගෙණැ වදාළ සෙයෙක.

එසේ බුදුදු පිහිනන්නා වූ සඞ්ඝමිදුරුවන් වහන්සේට සත් දවසක් ඉක්ම ගියේ. එසේ වූ මහා සමුද්‍රයෙහි පිහිනන්නා වූ සඞ්ඝමිදුරුවන් වහන්සේ ද තමන් වහන්සේ දැනසිලාදී වූ පූර්ව රිත ධර්මයෙහි ලොල් වූ සිත් ඇති හෙයින් හා කුශලධර්මයෙහි පමා නොවැ ලුණුදියෙන් ශ්‍රී බුධය සොඩා පියා පෙහෙවැ වදාළ සැසෙකැ.

එ සමයෙහි සතරවරම් මහරජ්ජුරුවන් විසින් මහා සමුද්‍රයෙහි නැවූ බිඳි නස්නා තෙසරණ ගිය කෙණෙකුන්වත් මවූ පියන් රක්‍ෂාකරණ කෙණෙකුන්වත් සෙසු ශීලාචාරසම්පන්නා කෙණෙකුන්වත් ඇතහොත් රක්‍ෂාකරව යි සිටුවන ලද්දා වූ මණිමෙඛලා නම් දිව්‍යස්ත්‍රිය තමාගේ ඓශ්වර්‍යයෙහි මදයෙන් සත් දවසක් මහා සමුද්‍රය පරීක්‍ෂා නො කොටැ සතවන දා බලන්නී පිනිනන්නා වූ බොධිසත්වයන් දැකැ මේ මහා පුරුෂයානන් මුනුදෙහි හුනුයේ අදින් සත්දවසය. ඉදින් මුන්ට කිසි උපද්‍රවයෙක් වූයේ වී නම් ම රම් රජ්ජුරුවන් විසින් මට මහා උදහස් දුයේය. මම් ද මහත් වූ ගර්‍හාවට පැමිණෙයේ වෙමි. එහෙයින් ඒ මහා පුරුෂයා පිනනා තැනට වෙලෙව්ව ගිය මැනැවැයි සිතා නානා'ග්‍ර රසභොජනයෙන් පිරූ රන්පාත්‍රයක් හැරී ගෙණැ වාත වෙගයෙන් ගොස් පිහිනන්නා වූ බොධිසත්වයන් අභිමුඛයෙහි ආකාශයෙහ සිටැ 'ඛ්‍රාහ්මණය! නෝ සත් දවසක් මුළුල්ලෙහි නිරාහාර වී. මේ දිව්‍යභොජනය අනුභව කරව යි කිව.

ඒ අසා සඞ්ඝභේදකයෝ ආකාශය බලා ආකාශයෙහි සිටියා වූ දිව්‍යසන්‍නිය ද ඇ අත තිබූ දිව්‍යභෝජනයෙන් පිරුණු සුවඳ පාත්‍රය ද බලා සත්දවසක් නිරාහාරවැ ද ඵුඤ්ඣිත්වා විඩා වැ ද දිව්‍යභෝජනය ඇති නම් අප අසා ද ගෙණ දිව්‍යභෝජනය දුකැ ද මට දිව්‍ය භොජනයට ද වඩා අවශ්‍යයෙන් මා රක්‍ෂා කරන්නාවූ ශීලය යැයි සිතා වදාරා "නිගේ දිව්‍යභෝජනය හැරැ ගෙණැ යව. මම පෙහෙවින්. මේ වේලා නොවේ"යි වදාළ සෙයෙක.

ඒ අසා පස්සෙහි පිහිණන්නා වූ අතවැසි තෙම දෙවතා දුව තමාට නො පෙණෙන හෙයින් බණ වදාරන්නා වූ බොධිසත්ත්‍වයන්ගේ කටහඬ අසා මාගේ සඞ්ඝභේදකයෝ ඉතා දුබුම්ල හෙයින් සත් දවසක් ඵුඤ්ඣිත්වා විඩාවැ මරණභයින් භයපත්වැ නන්දෙඩන වන්හ. ඔවුන් අස්වැසුවැ මැනවැ යි සිතා, සඞ්ඝමිනි! තෙපි බොහෝ ඇසූ විරූතැන් ඇත්තව, බොහෝ ධර්මයෙහි ප්‍රවීද්දව! බොහෝ ශ්‍රමණබ්‍රාහ්මණයන් දකා පරිචය්‍යව. එසේවූ තෙපි නො හැඬුව මනා තැන හඬව. මා ඔත් අනික් තොප හා බණන කෙණෙකුත් නැත. "මම පෙහෙවින්, ඔත් හැරැ ගෙණැ යව"යි කියා තොප නන් දෙඩන්නේ කා හා දැයි කියා.

ඒ අසා බොධිසත්ත්‍වයෝ දෙවතා දූ මෝහට නො පෙණෙන වනැ යි සිතා වදාරා "කොල! මරණෙහි භය ඇත්තෝ නම් කයින් වචයින් මනසින් අකුශලයක් කළ කෙණෙක් වෙද් ද? මා මාගේ අවසථා දන්නා පටන් කොටැ මෙ තැන් දස්වා පඤ්චශීලය විරෝධයක් කළ තැනක් නැත. දැනැදි වූ සුචරිත ධර්මයෙහි යෙදී විසූව මම කුමක් පිණිස මරණෙහි භය කෙරෙමි ද? මා නම් බිණු දැ නැත. මේ ආකාශයෙහි සිටියා වූ දෙවිදුනු බදු වූ බැමයෙන් හොබනා වූ සවීඩහයෙන් ශොභන වූ දිව්‍යභරණයෙන් විභූෂිත වූ දිව්‍යසන්‍නියක් සුවඳ පාත්‍රයෙන් දිව්‍ය භොජන හැරැ නෙණැ මට බත්කන්නට ආරාධනා කෙරෙති. මම මා පෙහෙවූ හෙයින් මේ බත් කන වේලා නො වෙයි කියා බත් නො කම්; හැර නෙණැ යා යි කිම් යි වදාළ සෙයෙක.

ඒ අසා අතවැසි තෙම "සඞ්ඝමිනි! මෙසේ වූ දුඃඛයකට පැමිණියා වූ තොපට දෙවතා කෙණෙක් පෙණුනෝ වී නම් උන්ට

නමස්කාර කොටැ අපට මේ දුකින් ගැලවීමෙක් ඇද්ද? නැද්ද? කියා විචාරව සි කියය. ඒ අසා බොධිසත්ත්වයෝ කී සේ යහපතැ සි සිතා වදාරා දෙවතා දුව මුනුණ බලා මා ප්‍රිය චක්ෂු සින් බල බලා සිටි. මේ දිව්‍යභොජනය අනුභව කරව සි කියන්නා වූ නෝ දිව්‍යස්ත්‍රියෙක් හි ද? මනුෂ්‍ය ස්ත්‍රියෙක් හිදැ සි විචාරා වදාළ සෙයෙක.

ඒ අසා මණ්ඩෙබලා නොමෝ සතරවරම් රජ්ජුරුවන් ගේ නියොගයෙන් මහා සමුද්‍රයෙහි රක්‍ෂායෙහි සිටියා වූ මණ්ඩෙබලා නම් දිව්‍යස්ත්‍රි නම් මමය. නොපට රක්‍ෂා පිණිස මෙ තැනට ඇමි නොප කැමැති කැමැති වස්තුවෙක් ඇත් නම් ඒ ගත්වසි කිව. ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ මේ දිව්‍යස්ත්‍රි නොමෝ කිසි කෙණෙකුන් නැත්තා වූ මේ සමුද්‍රයෙහි නොපට කැමැති වස්තුවක් දෙමි සි කිය සි. මා කළ කුසලයක් නිසාදෝ හෝ තමාගේ දිව්‍යානුභාවයෙන් දෝ හෝ සිතා වදාරා "දිව්‍යස්ත්‍රිය! මා කළාවූ යම් කුසලයෙක් ඇත් නම් ඒ සියලු කුසලයට නෝ ඉම්බයෙහි. මෙබදු වූ මහා සමුද්‍රමධ්‍යයෙක්හි නොප කැමැති යම් වස්තුවක් නෙණැ මේ දුකින් මිදී සුවපත් විසි කියන්නේ මාගේ කවර කුශලකර්මයෙක්හි බලදැ සි විචාරා වදාළ සෙයෙකා.

ඒ අසා දිව්‍යස්ත්‍රි නොමෝ "බ්‍රාහ්මණය! මා නොපට මෙ තෙක් සම්පත්හි දෙමි සි කියන්නේ අනික් නොපගේ බලයක් වත් මාගේ බලයක්වත් සිතා නොවෙසි. නොප මේ නැවට නැගෙන දවස් හුණු වැල්ලෙහි වඩනා පසේබුදුන් දහන්සේ ගේ ශ්‍රීපාදයෙහි ලා ලූ වහන් සඟලෙහි අනුසසින. මේ මහා සමුද්‍රයෙහි නොපට වහල්වැ සිටියේ ඒ දැනයැ සි දන්වුව. ඒ අසා බොධිසත්ත්වයෝ තමන් වහන්සේ දුන් දැන්ය සිහිකොටැ සතුටුවැ ධර්මය නම් මෙසේ සත්ත්වයාහට වහල් දෙයෙක් වනැ සි අධික වූ ප්‍රසාද උපදවා, තව ද මා මාගේ නුවරට ගොසින් කුසල් කළ මැනවැ සි සිතා මණ්ඩෙබලාවට නෝ ඉදින් මාගේ කුසලබලයෙන් ම මට වහල් වන්නේ වී නම් මහ නැවක් මවා මා ඒ නැවට නහා ගෙණැ ගොස් මාගේ නුවර ම සිටුවව සි වදාළ සෙයෙකා.

ඒ අසා දෙවි දූ සතුටුවැ අට ඉස්බක් පමණ දිග ඇති සතර ඉස්බක් පමණ පළල ඇති සතරියන් පමණ යටින් විසඟටක් පමණ පළල ඇති ඉඳුනිල මණිමය වූ තුන් කුඹෙකින්

හොබනා සඛණ්ඩිමය වූ යොත් හා රිවි හා පළුපත් හා ඇති නැවක් මවා දත් දෙන පිණ්ඩිය වයතු සොයා යාත්‍රා කෙරෙයි වේ ද? මෙ වැනි මහා පුරුෂයන්හු ඔුනුද හුනුයේ. එහෙයින් මේ ජාතිය මුළුල්ලෙහි අතීක් තැනකින් ධන නො සොයා දත් දෙන පරිද්දෙන් නැව සත්රුවනින් පුරා බොධිසත්වයන් සිප ගෙණ ලෙහි හොවා ගෙණ නැවැ සිටුවා ලුව. පස්සෙහි යන්නාවූ අතවැස්සා වෙන කුසලයක් නො කළ හෙයින් මුහුණ නො බැලුව. බොධිසත්වයෝ ඒ බව දැනැ නැව වැඩ සිටැ තමන් වහන්සේ කළ පින්කම් ඔහු අනුමෝදන් කරවා වදාළ සෙයෙක. හෙ ද පින් 1 අනුමෝදන් විය.

දෙවතා දූ ඔහු ද වඩා ගෙණ ගොස් නැවැ සිටුවා බොධිසත්වයන්ගේ මෞලිනි නම් රාජධානියෙහි ගෙණ ගොස් සිටුවූව. ඉදිරියෙහි පිහිනන්නන් මෙම කපැ බුදුවන ජාති යෙහි **බෝධිසත්ව** ඔරසයෙහි උපන් සම්මුදුරුවන්වූව. පස් සෙහි පිහිනන්නන් උපස්ථානකරන්නවුන් කෙරෙහි අග තැන් ලබන ජාතියෙහි දිවි දුදු දස්කම් කළ **අනුරුද්ධ මහතෙරුන්** වූව. අවුත් සිටැ නැවු මවන්නන් බුදුවන ජාති **අග්‍රශ්‍රාවිකා** වන 2 **පුල්වන්** මහතෙරිනීන් වහන්සේ වූව. මෙ වැනි ශාන්ති සමාධියෙක් එ තැන්හි නො වැ කො තැන්හි වේ ද? එසින් සත්රුවන් නැවින් ගොඩ දකැ තමන් වහන්සේගේ නුවරට වැඩියාවූ සම්මුදුරුවෝ එම සත්රුවන් ගෙණ දිවි පමණින් දැනාදි වූ කුසල් කොදැ සඟලොක පරායන වූ සෙයෙක.

මෙසේ මැදූ මුහුදෙහි නැවු බුන් තන්හි පොවා ධර්මය ම සහචරයාහට වහල් වන බව ඇසූ සත්පුරුෂයන් විසින් එළඹැ සිටියාවූ උපද්‍රව දුරුකොටැ සියලු සම්පත්තීන් යෙදී සියලු දුක්ඛි රස නොවිඳැ පඤ්චේන්ද්‍රියයන් සංඛිදුවා සුව විඳැ අන්තයෙහි අමා මහනිවන් සුවයෙහි කුළුහන්නා පිණ්ඩිය සැදැහැයෙන් හා නුවණින් යෙදූ **දහම් සරණ** යා සුතු.

තව ද, මේ ධර්මය තමා රකුවා කළවුන්ට එළඹැ සිටියා වූ සියලු උපද්‍රව දුරුකොටැ ශාන්ති කරණ බව හඟවන පිණ්ඩි මාගේ සම්මුදුරුවන් වටුවැ උපන් කල්හි උන්වහන්සේ වයන් නාවූ වනය එකහෙළා දවා ගෙණ අවාවූ ලැවියන්ට ඔබගේ ධර්මබලයෙන් නිවුනු පරිදි කියා කුශලධර්මයෙහි සත්පුරුෂ

1 අනුමෝ විය 2 පුල්වන්.

යන්ට උත්සාහ වඩවමින් ඒ කථාව ද බුදුගුණෙහි ප්‍රිය ඇත්තා වූ සුවර්ණයෙහි ඇලුම් ඇත්තා වූ සත්පුරුෂයන් සොහා ඇතිවිෑ ඇසිය යුතුය. හේ කෙසේ ද? යත්:-

අතීතයෙහි මගධරට එක වන ලැහැබෙක්හි බොධිසත්ත්ව යෝ වටුවෑ ඉපද මව්කුසින් නික්මෑ බිජුවට පලා ගෙණෑ පිටත් වන සේයෙක් ම රත්පලස් වටක් සාවෑ නික්මුණු සෙයෙක. ඉක්බිති මව්පිය දෙපසෙහි ඇත්තෝ බොධිසත්ත්වයන් කසල්ලෙහි හොවාලා තුමූ නොසිටින් තුඩින් ගොදුරු ගෙණෑ අවුත් බොධිසත්ත්වයන් රක්ෂා කරන්නාහ.

එ සමයෙහි බොධිසත්ත්වයෝ පියා හඬා ආකාශයෙහි යන්නටවත් පසින් බිමාඇන්නට වත් ශක්ති නැති සෙයෙක. එසමයෙහි සෝමිදරුවන් වැඩෑ හොත්තාවූ කසල්ල ඇලයෙහි වන ලැහැබ මහත් වූ ලැවිහින්නෙක් ඇවිල ගෙණෑ දුම්න් හා ගිනි පුපුරෙන් හා සියලු ආකාශය පුරමින් සියලු වනලැහැබ මැඩෑ ගෙණෑ පවත්නාවූ "තට" "තට" යන අනුකරණයෙන් ඒ වනෂට වදනා අග්නි දෙවතාවාගේ අභිමුඛයෙහි ගසන්නාවූ 1 බලවත් හඬ සේ ක්‍රෑර වූ නාද පවත්වමින් ගස්අගින් ගස් අගට දිවන්නා වූ වදුරන් ලුහුබදවා ගෙණෑ යන්නා සේ ගසින් ගස ඇවිල ගනිමින් මරණභයින් භයපත් වූ ව්‍යාඝ්‍රයන් හා මුවන් හා ඔවුනොවුන් කෙරෙහි විරොධ නැතිවෑ එක මඟෑ ලුහුබදවමින් ගිනි ගත්තා වූ කද ඇඟ කඩා ගෙණෑ හෙත් හෙත් පුලුටු ගත්තාවූ ඇතුන් හා ඇතින්නන් හා ඇත්පැටියන් හා දැහ ඉවසා නත නොනී මහහඬින් හඬම හඬවා සියලු වනයෙහි දිවමින් කලාපාත වැනිසට සසඬිකෙරෙමින් බොධිසත්ත්වයන් වැඩෑ හොත්තා වූ කසල්ලට අසන්නා විය.

එ සමයෙහි සියලු පැණිහු මරණභයින් භයපත්වෑ ආකාශයට පැනෑ නැඟි ඉස් ලූ ලූ දිශාවෙහි දිවගත්හ. බොධිසත්ත්වයන් වහන්සේගේ මව්පිය දෙපසෙහි ඇත්තෝ ද අත්පත් නිවන් හැරැ තමන් ඇතුළු වූ ලොව රක්ෂාකරන්නට සසරගින්නට වන්නාවූ සෝමිදරුවන් හැරැ පියා නිකම් ගිය්නෙහි කළු හඩින් වැඩෑ හොත් සෝමිදරුවන් පෙරළා නොබලා ආකාශයට පැනෑ නැඟි පලා ගියහ.

---

1 බලවත්.

එ සමයෙහි සාමිදරුවෝ වැඩ හොත් කෑල්ලෙහි ම වැඩ හෙවෑ මේ කිමෙක්දෝ හෝ සි කියා බලා වදුරණ සෙයක් සියලු වනලැහැබ මැඩෑ ගෙණ ඒ ඒ ගස්හි විමන්හි වසන්නා වූ දෙවතාවන් ලුහුබදවා පියන පිණිස බුරන්නා සේ මහත් කොදෑ බුරා බස්නා වූ ලැව්ගින්න දුකැ "ඉතිරි පක්ෂීන් සේ පියා ඇතහොත් පියා හඬා ගෙණ ආකාශයෙන් හොස් ගැළවී යමිහ. පය ශක්තියක් ඇතහොත් පසින් හොස් ගැළවී යමිහ. එසේ යන්නට පාදයෙහි දු ශක්තියෙක් නැත. අප වැදූ මවු පියෝ ද මරණහසින් බියපත්වැ අප හැර පියා නැසි යියහ.

"මෙ නැන්හි අපට එක ද සරණෙක් නැත. අප කළමනා කිම් දෝ හෝ"සි සිතා වදුරණ සෙයක් එසේ ම වටු වැ උපන් කලෙක්හි මහා බ්‍රහ්මයා දන්නා පරිද්දෙන් වෙදත්‍රයය ගෙවා 1 දන්නා වූ නුවණ නමින් කෙරෙහි ම ඇති හෙයින් මට පියා යෙන් ප්‍රයෝජන කිම් ද? පසින් ප්‍රයෝජන කිම් ද? මවුපියන් විසින් ප්‍රයෝජන කිම් ද? මේ ලොකයෙහි ශීල ගුණ නම් දෙයෙක් ඇත. සත්‍යගුණ නම් දෙයෙක් ඇත. අනිතයෙහි පාරමිතා පුරා බෝමුල වැඩ හිඳ සව්‍යසනා සම්පත්ති, විමුක්තිඤාණදර්ශන සම්පන්නා වූ දයා ය, සත්‍ය ය, යෝනිසෝ ය, සාරණා ය යනාදිවූ සියලු 2 සත්පුරුෂගුණයෙන් යුක්ත වූ සතුරෝ ය, මිතුරෝ ය, මධ්‍යස්ථයෝය යන සියලු ලොව තමන්ගේ ආත්මය හා නොවෙනස් කොදෑ බලන්නා වූ සම්බුදු වූ සර්වාමිදරුවන් ඇති බව සත්‍යය. ඔවුන් විසින් වදුරණ අම්මහ නිවන් ගෙණ දෙන ධර්මරත්නය ඇති බව සත්‍යයය. ඒ ධර්මය වූ පරිද්දෙන් පවත්නා වූ සඟුරුවන් ඇති බව සත්‍යයය.

"මා ආකාශයට නැගී යන්නට සුදුසු පියාපත් නැති බව ද සත්‍යයය. 3 බිම නැගී යන්නට සුදුසු පාවත් නැති බව ද සත්‍යයය මාගේ මවුපියන් දෙදෙනා මා හැර පියා නැගී ගිය බව ද සත්‍යයය. මා ද සෙසු පක්ෂියන්හු සේ ලාමක නොවැ මාගේ ඒ කලෙහි ගත් දහසින් මුළු ලොවකට දහම් දෙසන්නට සිටි එකතු බව ද සත්‍යය. ඉදින් මා එක නැනැත්තහු දැයය කලැ මේ වනයෙහි සෙසු ප්‍රාණීන්හු රැළවෙත් නම් පිඟුම්ගබකට වදනා රාජහංසයන්හු සේ නිවී සැනහී මේ ගින්නට වදනා බව සත්‍යයය. මේ මුළුලොවට මා මුත් 4 ලය ඇත්තන් නැතිබව

---

1 දක්නාවූ. 2 සත්පුරුෂ ගුණයෙන්. 3 කිමි-කිමින්. 4 ල ඇත්තවුන්

සතැයය. වටුවැ නොත්තා වූ මාගේ ලෙහි ගත් ධර්මය මහා බ්‍රහ්මයන් ලෙඳිදු නැති බව සත්‍යයය. මේ සත්‍යයෙන් මේ ලැව්ගින්න පසුබසිව"යි කියා සත්‍යක්‍රියා කොටැ වදාළ සෙයෙක.

මෙසේ බොධිසත්වයන් වහන්සේ සත්‍යක්‍රියා කරත් ම ඒ සා මහත් ලැව්ගින්න පසුබැස ගෙණැ ගොස් වැඩෙහොත් තැනට සියාරු සොළොස් 1 කිරියක් පමණ තැන් දුරුවැ ගියේ. සඟමිදරුවන්ගේ ධර්මයෙහි බලයෙන් ඒ වේලෙහි පටන් කප නස්නා දවස් දක්වා එ තැන්හි තණපතුත් ද ගිනි නොඇවිල ගත් විරිය. මෙසේ සඟමිදරුවෝ 2 සත්‍යක්‍රියායෙන් තමන් වහන්සේ කරා දවූ ගිනි පසුබස්වා වදාළ සෙයෙක.

මෙසේ මේ කථාව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය නම් සියලු උපද්‍රව දුරුකරන්නාවූ රක්ෂා මන්ත්‍රයෙකැ යි නිශ්චය කොටැ සියලු උපද්‍රව දුරුකොටැ සියලු අභිමතාර්ථ සාධන පිණිස දහම් සරණ යම්හ යි **දහම් සරණ යා සුතු.**

තව ද, සඬමය සේ සත්ත්වයාහට වහලක් නැති බව හඟවා සියලු සත්ත්වයා දහම් සරණ යවන පිණිස මාගේ සඟමිදරු වූ ගෞතම ගොත්‍රයෙහි උපන් සඬම්වර චක්‍රවර්ති සඟමින් වහන්සේ වනයෙහි විලෙක්හි මස්වැ ඉපැදී පොවා සියලු දඹදිව එකහෙළා 3 රත් කබලකට හසු වූ මකුළුවක සේ දමන්නට පටන්ගත්තා වූ දිහාගිම් තමන් වහන්සේගේ ධර්මබලයෙන් වැසිවස්වා මුළුලොව ශාන්ති කළා වූ මස්දුයෙහි කථාව දක්වම්. ඒ බොධිසත්ව චරිතය ද අසා ධර්මයෙහි අනුසස් දැනැ **දහම් සරණ යා සුතු.**

හේ කෙසේ ද? යත්:-

අතීතයෙහි **කොසොල්රට** එක් කදුරෙක්හි බොධිසත්ව යන් වහන්සේ මස්වැ උපන් සෙයෙක. මස්වැ ඉපැදී සියලු මසුනට රජවැ **මෛත්‍රිය, කරුණාය, මුදිතාය, උපෙක්ෂාය** යන සතර බ්‍රහ්මවිහාරයෙන් යුක්තවැ බ්‍රාහ්මී ධ්‍යානයෙන්හි බ්‍රහ්මකුමාරයන් පිරිවරා ධ්‍යානරතියෙන් දවස් යවන මහා බ්‍රහ්මයක්හු සේ වසන සෙයෙක.

---

1 රියනක්. 2 සත්‍යක්‍රියා බලයෙන්. 3 තත්.

එ සමයෙහි මහනියගෙක් ඇති විය එසින් ලොව පෙළන්නට පටන්ගත්හ. ආහාරයෙන් හෙන්නාවූ එක ද ජලබිඳු වෙක් නැතිමැ ගියේ. ජ ඒ සථානයෙහි වැව් අවුණු හෝ කඳුරු විල් ආදි වියලී වලල් හැසෙන්නට පටන්ගත්. යම්තම් වළතැනෙක් සිටනත් ජලයෙක් ඇත් නවුදු හිරු රැසින් නැවී විරුවාපු ලොහොදිය සේ හුණුවැ ගිය හෙයින් මස්කැස්බෝ සැලියේ ලා උදුනට නහා පත්ලෙහි ගිනිකළු කල්ඳ එකහෙළා පැසි මියන්නාසුන් සේ පැසි මියන්නට පටන්ගතහ.

වලල් සිදුරට වත් මසුන් හඬුයෙන් රිදී කොදු අදිඑවා 1 ඇදගන්නා සේ කොකුන් හා කඩුබුවන් හා ඇදු කන්නට පවන්නත්හ. ගොඇම් යන නමෙක් නැතිවැ ගියේය. වැසි නැති අහස බලා හඬන වැසි ලිහිණියන් හා පැන් නැති විල් බලා හඬන විල්ලිහිණියන් හා එනය එක කොලාහල කරන්නට පටන්ගත්හ. මොණරුය, හංසයෝය, වලිකුළෝය යනාදී පක්ෂීහු සිහිල් සෙවනක් නොලදින් ඔදුනොදින්ගේ පියායට හිස් ලා ගෙණැ විසලී වැහිරෙන්නට පටන්ගතහ.

හුණුවැලි පිටැ පා 2 ඔබාගත නොහෙන්නා වූ වතුපොද යෝ ඔබිනොබ දිවෙමින් දිවි එල්වා ගෙණැ ආනමින් ගල් සෙවනෙහි හිස් ඇතැ ඇතැ සිටැ වෙවුලන්නට පටන්ගතහ. හිමින් නැවී ගිය හසුනිහු අනික් පැනක් නොලදින් තමන්ගේ පොකුරග පැන් ම ඉසැ සිට බමන්නට පටන්ගත්හ. එ සමයෙහි සාමිදරුවානන් වහන්සේ මේ සත්වලොකයාට වූ මහා දුක් සංහිඳුවා ලන්නට මා මුත් අනික් සමර්ථයෝ නැතැ සිතා වදුරා වැඩැ හොත්තා වූ කඳුරෙහි වූ පැන් හිඳි ගිය හෙයින් මඩපලා ගෙණැ ඉහුනිල මණ්ඩූකමහයක් සේ වැසිරැ සිටැ යහපත් කොටැ ගිනිවර කළ මැණික් දෙකක් සේ දෙ ඇස දල්වා ආකාශය බලා වැසිවලා දෙවියාහට හඬනහා ගැත්තන්නට නියොග කරන්නා වූ සාමිදරු කෙණෙකුන් සේ වැසි වස්වන්නට ආරම්භකොටැ වදුරණ සෙයෙක්:-

"කොල. වැසිවලා දෙවිය, මාසේ වූ ඛම්ජඨ එකක්හු නැයන් හා කැවිවැ හිමින් නැවේමින් සිටියදි නෝ දිව්‍ය විමාන යෙහි දිව්‍ය සුව අනුභව කෙරෙහි ද? නට වැසි වස්වන්නට නියොග කරන්නාවූ මම තාගේ ගුණයක් නකා නියොග

1 අවුළුවා ගෙණැ 2 පා තබාගත.

නො කරමි. මාගේ මේ ලෙහි පෙළඹෙන්නා වූ ගුණ හෙණෑ සත්‍යක්‍රියා කොටැ නා ලවා වැසි වස්වන්නට ප්‍රයොග කෙරෙමි යි මා උපන්නා වූ මත්ස්‍ය යොනි නම් මහත් මස්නු කුඩා මසුන් අනුභව කොටැ ජීවත් වන්නාහ. එසේ වූ ජාතියෙක උපන්නා වූ මම මා බිජුවට ගැබින් පිටත් වූ තැන් පටන් හෙණෑ අද දක්වා සුන්සාලැටක් සා ප්‍රාණියකුදු දිවි නො නසා දෙරින් දෙරැ පිඬු සිහා වළඳන්නා ධුතඞ්ගධර තපස්විවර කෙණෙකුන් සේ ඒ ඒ තන්හි සෙවෙල් වළඳා ජීවත්වීමි.

"පඤ්ච දුශ්චරිතයෝ ම මට මහා සමුද්‍රයෙහි මෙතෙරට එතෙර දුරු සේ දුරය. මාගේ ජීවිතය මට ඉතා ප්‍රිය සේ ම සියලු සත්ත්වයාගේ ජීවිතය ද මට එසේ ම ප්‍රිය ය. මා වසන මේ කඳුරෙහි වසන්නා වූ මදුන්ට සුවඳක් වූ ද සුවඳුන් බව හා දුකක් වූ ද දුන්දුන් බව මුත් මම වෙන දුකෙක. සුව යෙක යන දෙයෙක්හි රස නො දනිමි. බුදුවැ මුළුලොව ගළ වළිහ සි යන සිත එක වෙක්හි ද නොර නො කෙළෙමි. මේ සත්‍යයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්ව සි යන සංඥාව මා සිත හා පුරුදු කෙළෙමි. ආහාර සංඥා ය, භය සංඥා ය, මෛථුන සංඥා ය යන තුන් සංඥායෙන් යුක්ත වූ නිරිසන් යොනි යෙහි ඉපදූ ද අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය යන තුන් සංඥාව ම මෙනෙහි කෙළෙමි. මේ සත්‍යයෙන් මේ ඝෝෂයෙන් පෙළී ගියා වූ සත්ත්වයන්ගේ කන් නිවා ගම්භීර නාද පවත්වමින් වැසි වස්වා කඳුඩු ආදි වූ වණ සත්ත්වයන්ට ගොචර වූ මා හා මාගේ නෑයන් හා ගළුව" සි කියා වදාළ සෙයෙක.

සර්වාමිදරුවන් සත්‍යක්‍රියා කළ ක්ෂණයෙහි ම වැළඳ සුවරියට සාධුකාර දෙන්නා සේ ගම්භීර වූ නාද පවත්වමින් වැඩ හොත්නා වූ පොකුණ ඉද්දෙහි අනස ඉද්දෙහි විදුලියෙන් රන් කම් කළා සේ මෙඝපටල නැමැති වියන් අදිමින් ඝන වූ දෙව් දුන්නෙන් ධර්ම පූජාවට තොරණ නගමින් දශදිශා භාගයෙහි දිවන්නා වූ බලාවැල නැමැති පුඤ්ඤාඤ්ජලී ලමින් ශත පටල සහස්‍රපටල මහාමේඝ නඟා මුළුලොව නිවා සනහා බොඳි සත්ත්වයන් ඇතුළුවූ සියලු සත්ත්වයාගේ සිත් සනහා වැසැ වැව් අමුණු ආදි පුරමින් සියලු සත්ත්වයාගේ ඇස් ඉනිරී වැගිරෙණ සතුටු කඳුලු හා එක්වැ ම නොඑක් ජාති ජලධාරාවෙහි වතුරු හෙළී ය. මුළුලොව නිවී සැනහී ගියේය.

මෙසේ මාගේ සැමිදරුවන් මස්වැ ඉදැ ද පොවා තමන් වහන්සේගේ ධර්මබලයෙන් ගිම් නිවා වැසි වස්වා ඉඳිලොවටත් තමන් වහන්සේට ත් ශාන්ති කළ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් සියලු දුක් අස්වසා සියලු සුව ළඟවන්නට ධර්මය සේ වූ අනික් දිවෙහෙදයක් නැතැ යි නිශ්චය කොටැ ඉහලොවින් පරලොවින් සියලු අහිමනාපී සාධා නිවෙන සැනහෙන පිණිස ධර්මය ම සරණ යමිහ යි රැ පහන අප්‍රමාද වැ ලත් ලන් අවසරයෙහි එම ධර්මය ම සරණ යමිහ යි **දහම් සරණ** යා සුනු.

තව ද, ධර්මය රැස් කළ සහෝදයාහට ඒ ධර්මය කාලාන්තරයෙකින් දෙන්නා වූ සැබෑ සම්පත්ති මොක්ෂ සම්පත්ති තබා ඉහජාතියෙහි ම දෙන්නා වූ ඉෂ්ට ඵල භවන පිණිස මාගේ සැමිදරු වූ බොධිසත්ත්වයන් වහන්සේ සිවිරජ වැ ඉපැදූ අති දේශනයෙන් ආ ශ්‍රාවකාගම්‍යයාහට තමන් වහන්සේගේ මසැස් දෙක උදුරා දුන් දී එහි අනුභසින් ඒ ජාතියෙහි ම දිවඇස් ලද්දා වූ සිවිඤාණඝෂ දස්වා සත්පුරුෂයන්ට කුශල ධර්මයෙහි උනන්සාහ වඩවයි:- ඒ කථාව ද සොහ ඇතිවැ ප්‍රසාද ඇතිවැ අසා සැබෑ මොක්ෂ සම්පත්ති සැඩිය සුනු.

හේ කෙසේ ද? යත්:—

අතීතයෙහි සිවිරට අරිඤ්ඤපුර නුවරැ සිවි නම් මහ රජ්ජුරුවන් රජකරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් 1 කුසැ පිළිසිඳැ හෙණැ ක්‍රමයෙන් ප්‍රසවයට පැමිණ් සෙයෙක. පිය මහරජානෝ ද සැමිදරුවානන්ද සිවිකුමාරඝෂ යැයි නම් තුබ්බහ. සැමිදරුවෝ ද ක්‍රමයෙන් වැඩි ශිල්ප උගන්නා වයසට ආ කල්හි **තක්ෂලා** නුවරට ගොස් උගතමනා සියලු ශිල්ප මස්තකප්‍රාප්ත කොටැ නැවත ඒ පියානන් වහන්සේගේ රජ්‍යයට අවුත් පියානන් වහන්සේට ශිල්ප දක්වා ස්ථවරජ තනතුරු ලදින් ක්‍රමයෙන් පියානන් වහන්සේගේ ඇවැමෙන් මහරජවැ අභිෂෙක කොටැ:-

දශරාජ ධර්මයට විරොධයක් නොකොටැ දවස දවස තමන් වහන්සේගේ සතුටු මුහුණ සියලු සත්ත්වයාහට සතුටු පඬුරු කොටැ දී උන්ගේ සතුටු මුහුණු තමන් වහන්සේගේ ඇස් පඬුරු කොටැ ලැබෙමින් අනික් නැනෙක්හි වූ වෙදනාවට ද

1 ඛඬැ.

කදුලු ගන්නා ඇසක් සේ අනුන්ට වූ දුකට ද තමන් වහන් සේ දුක්පත් වෙමින් තමා අතින් 1 ඉන් වූ පැලගොයමට ද ගොවීන් වපුල 2 වප් ගොයමට ද සම සිතින් දියපානා සෙත්‍ර සඟම් තැනැත්තන්හු සේ තමන් වැදූ දරුවන් කෙරෙහි ද සියලු සත්ත්වයා කෙරෙහි ද සමකරුණ පවත්වමින් එක්ඇසක් රත්නා පිණ්ස අනික් ඇස උදුරා බලකම්නතා නො කරන්නා සේ තමන් ගේ රාජ්‍යය රක්ෂා කරමිහ යි අනුන්ගේ රාජ්‍යයට පීඩාවක් නො කරමින්:-

රා වූ ආරූහයකු නැති මතැතන්හු සේ නුවණ නැති උඩ තැ වූ අමාත්‍යයන්ගේ බසින් ලෝවැස්සා නො නසමින් ගත් ගහටඨ යි නො තබා කරල් කඩා හැරිනන්නා සේ 3 ඉපැද වූ තැනැත්තහුටිය යි නො තබා සත්ත්වයාගේ වසතු පැහැරි නො ගන්මින් වැදූ මව්න්ගේ නාහාවෙශය හා සමකොටැ පර සත්‍රීන්ගේ නාහාවේශය නො බලමින් දහස්ගණන් අරළුයෙන් පිහිට 4 ලත් මහ නුගහසක් සේ මන්ත්‍රී ය, අමාත්‍යයෝ ය, සුව රජ්ජුරුවෝ ය, සෙනාපති ය යනාදි වූ උපස්ථාන පුරුෂවිශෙෂය හෙතුකොටැ ගෙණැ රාජ්‍යයෙහි සථිර ප්‍රතිෂ්ඨා ලැබෙමින්:-

ධර්මයෙන් යුක්ත වූ කාරණයෙන් සප්තබොධ්‍යඞ්ග ධර්ම යන් වඩන්නා වූ අපිස් යොගාවචර තපස්වී කෙණෙකුන් ස දශ රාජ ධර්මයම විරොධයක් නො කොටැ සඟාමත්‍යාමාත්‍යාදි වූ සප්තාඞ්ග සමෘඩ්ධියට පමුණුවමින් ධර්මයෙන් රාජ්‍යය කොටැ වදුරණ සෙයෙක් තමන් වහන්සේගේ ඉඩිකා වූ දුනාතිරතිය හෙතුකොටැ ගෙණැ නුවරැ සතර වාසල්දොරැ හා නුවරමඬ්‍ය යෙහි හා මාළිගාදොරැ හා මේ සතැන්හි දන්හැල් කරවා දවස් පතා එකි එක් දන්හලට එකි එකී ලක්ෂයක් බැගින් සදන් හලට සලක්ෂයක් වියදම් කොටැ මහදන් දෙමින් අටවක්හි තුදුස්වක්හි පසළොස්වක්හි හා දන්හලට තමන් වහන්සේ ම වැඩැ දන් බලා වදුරණ සෙයෙක.

මෙසේ සියලු දඹදිව්හි නහුල් උඩබදවා මහදන් දෙන සඟම්දරුවානන් වහන්සේ එක් මැදි පොහෝ දවසක් උදැසන ම නගනලද්දු වූ සෙතවැස්ත්‍ර ඇති සංහාසනයෙහි වැඩ හුන් සේක. තමන් වහන්ගේ විසින් දුන්නා වූ දානය ආවර්ජනා කොටැ මා විසින් හාදුන් දෙයත් නැතැ යි කියා නිශ්චය කොටැ

1 ඉන්දූ (ඉලවූ). 2 පැලඟෙ. ඉමවද. 3 ඉපවූ. 4 ගන්.

"මා විසින් බාහිර වස්තුයෙන් නුදුන් දෙයක් නම් නැත. මට මේ දනින් අධික වූ ප්‍රියයෙක් නො එළැවිති මම වූ කලී මාගේ ශරීරයෙහි ඇතුළත දෙයෙකින් දනක් දෙන්නා කැමැත්තෙමි. මාගේ භාග්‍යයෙන් ඇත් නම් මා නිසා ගැළවෙන ඉඹි ලෝ වැස්සාගේ භාග්‍යයෙයක් ඇත් නම් අද කිසි 1 යාචකයෙක් අඬදින් මාගේ ශරීරයෙහි නමක් කී නම් ඉතා යහපත:–

"ඉදින් කිසිවෙක් අවුත් මාගේ හදවත ඉල්වූයේ වී නම් මම් ම මාගේ ලය පලාපියා ප්‍රසන්න වූ ජලයෙන් නළ හා එක් කොටැ පිඟුමන් උදුරා ගන්නා එකක්හු සේ ලොහිත බින්දු වහ රුව වහරුවා හදවත උදුරා දන් දෙමි. ඉදින් මාගේ ශරීර මාංශයක් ඉල්ලූ එකෙක් ඇත් නම් හිසැ සිටැ දෙපතුල දක්වා සවිඤ්ඤාණ ඇට හෙළා ලියා පියා පැස්පුරා දන් දෙමි. ඉදින් කිසිවෙක් මාගේ ශරීරයෙහි ලෙහෙසෙහි නම කියේ වී නම් යනතුරෙහි දී පෙළාපියා බදුන් පුරා ලෙහෙ දන් දෙමි. ඉදින් කිසිවෙක් මද ගැනිවා සි කියේ වී නම් මාගේ රාජ වෙශය හැරී පියා හිසතේ බැඳැ කැසපට ගන්වා මා ගැනි බව මම් ම අස්වා ඔහුගේ ඉසි දුනා ගැනිමෙහෙ කෙරෙමි.

"ඉඳින් නිසිවෙක් මාගේ ඇස් ඉල්වූයේ වී නම් ප්‍රසන්න වූ ජලයෙන් පිරුණු විලෙකින් රතුදුල් මල් දෙකෙක් උදුරණ එකක්හු සේ දුනාභිලාෂයෙන් ප්‍රසන්න වූ මාගේ මුහුණින් දුස උදුරා ඇදැ ගෙණැ දන් දෙමි"යි ඉටා බැඳ සොළොස් කළයක් සුවඳ පැනින් නහා මේ නිමවා සවිලඬ්කාරයෙන් විභූෂිතවැ නානාවිධ රස භොජන අනුභව කොටැ උසන් කෙළියට යන්නා වූ ශක්‍රයාට සදෘ නිම වූ වෙරාවණයා සේ සදෘ ගෙණ අවුත් සිටුවූ මහුලැත්හු පිටට නැඟි දානශාලාවට නික්මැ වදාළ සෙයෙක.

ඉක්බිති සඞ්ඝාමිදරුවන්ගේ දානාධ්‍යාශය බලයෙන් ශක්‍ර දෙවෙන්දුයාගේ පණ්ඩුකම්බල ශිලාසනය හුණුවිය ශක්‍රදෙවෙන්දු තෙම 2 මා නො කැමැති කරවා මාගේ ආසනය හුණුවන්නට කාරණ කිම් දෝහෝ සි කියා පරීක්ෂා කරන්නේ සඞ්ඝාමිදරුවන්ගේ දානාධ්‍යාශය දැකැ අද දවස් මහතානන් වහන්සේ සම්ප්‍රාප්ත වූ යාචකයන්හු ඇස් ඉල්ලූ නොත් ඇස් උදුරා දෙමි සි සිතූහ. ඔහු තමන්ගේ දානාධ්‍යාශය බලවත්

1 යාචක කෙණෙක්. 2 තමා.

හෙයින් මෙසේ සිතුව බව මුත් සිතූ පරිද්දෙන් උදුරා දී ලන්නට සමර්ථයෝ දෙදෙනෝ ය. අසමර්ථයෝ දෙදෙනෝ ය. ඉක්බිති පරීක්ෂා කෙරෙමි සි සිතා ජරාප්‍රාප්ත වූ අඬ බ්‍රාහ්මණයකුගේ වෙසින් ශක්‍ර විලාසයෙන් දන්හලට වඩනා සත්ත්වයන්ගේ අඳුම්බයෙහි නොවැඩී සිටැ හෙණැ අත නඟා ජය ශබ්දය පවත්වා ඇඟි ඵොඳ කෙළේ.

සත්ත්වයෝ ඔහුගේ ශබ්දය අසා "නියතයෙන් වසතුවක් ඉල්වන යාචකයෙක් වී නම් දන්සලට ගොසින් සිටගනී මොහු අතරමඟ සිටැ උස්කොටැ ආඟිඵොදී සිටියේ අවුත් වතුවක් ඉල්වන පිණ්සය"යි සිතා වදාරා ඔහු කරා සතුටු සතුටුවැ ඇතු මෙහෙයා බවුණු කුමක් කියයි දැයි විචාරා වදාළ සෙයෙක. ඒ අසා ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ "මහරජ! නොපගේ දානාඛ්‍යාශය සියලු ලෙවිහි එකෘහළා පැතිරිගෙණැ සිටි. එසේවූ නොපගේ කීර්තිඝොෂාව ඇසුවා වූ මම මා කනහෙසින් ම්ට අනික් වසතුවකින් ප්‍රයොජන නැතැ යි සිතා නොපගේ එක් ඇසක් මට ඉල්වා ආවි ඉදින් ඇස දුන්නු නම් නොපටත් එක් ඇසක් නිබෙ සි. මමත් එක් ඇසක් ලබම්"යි දන්වීය.

ඒ අසා සත්ත්වයෝ සුළං පිරූ තොලබෝ විතක් සේ ප්‍රීතින් පිරී නියා වූ සවිඥාණ ඇතිවැ මාගේ දෙවැය ඉතා මහත් සේ ය. මා සිතූ සිත මයාකප්‍රාප්තවන පරිදි ඉතා අශ්චර්‍ය්‍ය සේ ය. බුදුවැ සවිඥානඥාන නැමැති ඇස ලබන්නට අද මාගේ ඇස උදුරා යාචකයාගේ අත තබා බිඳුවට වප්පුරණ පරිදි ඉතා අවශ්‍යය. මා රක්ෂා සි සිතූ ත්‍රිලෝව එකාන්තයෙන් රක්නා වැනි ම් සි නිශ්චය කොටැ අභිෂෙක්ෂට වොටුනු වඩා ආවාවූ මඳුල් මෙහෙ නැනැත්තහු මුහුණ බලන සන්තොෂයට වඩා ශත සහස්‍ර ගුණයෙන් අධික වූ සන්තොෂයෙන් බවුණ මුහුණ බලා ඔහුගේ බස් අසන පිණ්ස "බ්‍රාහ්මණ කාවිසිනුත් දිපිය නො හැකි ඇස ඉල්වා මා කරා එවුවෝ කවුරුදැ සි වදාළ සෙයෙක.

ඒ අසා බ්‍රාහ්මණ තෙම මහරජ මා එවුවෝ අනික් කෙණෙක් නොදෙනි. මා කන බව හා නොප දන්සොඬ බව හා දන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම් නෝ ඇස් නැතිවැ කුමට දුක්

1 පිණ්ස ඝියාවූ.

ගණී ද? සිව්රජ්ජුරුවන් කරා ගොසින් ඇසක් ඉල්වා ගණැයි කියා එවූ හෙයින් ආමි යි දත්විය. ඒ අසා මා ඇතුළු වූ සියලු සත්වයාගේ ලෙහි ශොකාදුඃඛ නිවා අමා ගල්වන්නට පටන් ගත්තා වූ සවාමිදරුවන් වහන්සේ මාගේ දුනාඩ්කශය ශුභ්‍ර දෙවෙඳුයාත් දත්වනැයි සතුටුවැ–

"බ්‍රාහ්මණය, ඇස් ඉල්ලා ආවාවූ තාගේ මනොරථය මසත කප්‍රාපතවේවා යි. එක ඇසක් ඉල්වා ආවාවූ තට ඇපි දුස ම දෙම්හ"යි වදුරා අද මා දන්හලට ගොසින් සලඤයක් විසදම් කොට දෙන්නාවූ මහාදුනයෙන් ප්‍රයොජන කිම්ද? රජගෙට ගොසින් ඇස් දන් දෙමි යි සිතා "බමුණ තා ඇස් වූව මැනව යි කී විට ම අප දුස නා සතුවිය. 1 ඉනිබ උදුරා දිලන තුරු තොප කෙරෙන් පිරිවුළු කොටැ ගෙණැ අප කෙරෙහි තුබූ ඇස් හා සමය. මේ දුසය, වරෝ රජගෙට යම්හ"යි බමුණා කැඳවා ගෙණැ ඇතු වප්‍රාඩකුසයෙන් නමා තමන් පුරුදුවූ රජ ගෙයි මග පොවා වහා නො ගෙවෙන සියක් යොදුන් දහසක් යොදුන් කතරක් සේ සිතා වදුරා ශ්‍රී පාදයෙන් ම ඇතු අවුලුවා ගෙණැ හැරී ගෙණැ යන්නා සේ යුහුබ මෙහෙයා ගෙණැ ගොස් රජගෙට වැදූ සිංහාසනයේ වැඩහිඳැ ශ්‍රී ශරීරයට පිළි යම් කොටැ සිවි 2 සිවඣ නම් මහවෙදුනන් කැඳවා මාගේ දුස උදුරා පියවයි වදුළු සෙයෙක.

එසේ වදුළ හඬ ඇස් උදුරා පියවයි වදුළ හඬයි කුමට කියම්ද? ඔළු ලොව ම නස්න මරහු කණ ඇහුල් ගසන හඬ යැයි කියම්. සසර දුක් නසා හෙන 3 සිහිල් හෙන ගිගිරි හඬ යැයි සිතම්. නිවන් පුරෙහි දෙර හැරිහිඟ හඬඟ යි සිතම්. සඟී ලොකඥට ඝන ගිණි තෙරපන හඬඟ යි සිතම්. එසේ සවාමීන් වදුළ බස ඇසූ සියලු නුවර වැස්සෝ අපගේ සවාමි අද ඇස් උදුරා දෙනදැල යි අසා චණ්ඩාලයන් කෙරෙහි සිටැ රාජකුමාරයන් අන්තඃපුරස්ත්‍රීන් දක්වා රාජාඩඟණයෙහි වැහිරී ගොස් "සවාමිනි, නුඹ ඇස් උදුරා දන් දුන් කලැ 4 ඇස් කණ මවුන්ට බඩහැල්වා පානා දරුවන්ගේ දුක් මවට නො පැණෙන්නා සේ අපට වූ දුකක් කෙසේ පැ ගන්නමෝ ද?

"තෙල ඇස නැති මුහුණ බලා කෙසේ අපගේ ඇස් වහවා ගන්නමෝ ද? නුඹ වහන්සේගේ දුසට නොසිතන

1 ඉනිබ්බ 2 ජීවඤ නම්–සිව්ඤ. සඤ. ජා. 3 සිහිල් ගිගිරිහඬ. 4 ඇස් නට.

සෙයෙක් නම්වූ නුඹ වහන්සේගේ ඇස් නැති මුහුණ දුටුවිට ම ශොකයෙන් ම මුලින් ඉපිරී යන්නාවූ අපගේ ඇසට සිතා වදාළ මැනව. ඉදින් නුඹගේ ඇස ඝඟපත නුඹට නො පැණේ නම් පහසින් පනිනුත් නුඹගේ දැස බලාලුව මැනව. මෙසේ වූ දැසක් නුඹට තරම් බව මුත් මේ කණුට තරම්ද ? මේ ඇස දන්දිලා පස්කම්රස අනුභවයෙහි සෙවද බිඳු ගත්තා වූ ලිහිල් වෑ වැගිරී ගියා වූ හිසකෙහෙ ඇති, රසයෙන් රත්ව ගියාවූ නෙත්‍ර යෞවනසථවූ අඹුවන් මුහුණු කවර ඇසින් බලන්නේද?

"නුඹගේ රූවින් ඔබාලූ හස්වැනි නුඹ උරෙහි ද දරුවන්ගේ අලුත හවගන්නා දත් කොද කැකුලෙන් මනොහර වූ මුහුඳ මුහුණු කවර ඇසින් බලන්නේද? මිනී මස් කා දිවි රක්ෂා කරන්නා වූ යකක්හු සේ ලොව නසා තමා රක්ෂා කරන්නා වූ රජක්හු ඇස් උදුරතොත් මූ හිස නොදී ඇස් දෙන සේ යයි කම්පාවන්නාවූ සතුවයා අද නුඹ ඇස් දෙනි යනු අසා නුඹ රජ්ජුරුවන් කෙණෙකුන්යැ යි නො සිතා අපගේ පියා නෝ ඇස් උදුරා දන් දෙත්ල. අපගේ මෑනියෝ ඇස් උදුරා දන් දෙත්ලැ යි හඬා අවුත් නුඹගේ රාජාඩහණයෙහි වැගිරී ගියහ.

"නුඹගේ එක දැසට සිතා කදුලු ගෙණැ මුහුණ සපණ අතින් ඉදිම ගියාවූ නුඹගේ ගැත්තන්ගේ ලක්ෂ කොටි ගණන් ඇස් බලා වදාළ මැනව. මේ එක් දිසාවෙක හඬා වැගිරෙන අන්තඃපුර සත්‍රින් බලන්නේ මැනින් හඬා වැගිරෙන නුඹගේ ප්‍රිය පුත්‍රයන් බලන්නේ මේ හඬා වැගිරෙන කුරුන් කුදුන් බලන්නේ. අධම පක්ෂයෙන් නුඹගේ මැදිරියෙහි හුන් ගිර වුන් සැළලිහිණියන් පොවා හඬන වලාම් හඬ අසන්නේ. ඇස් ගණිම් යි කියන බමුණා හා ඇස් දෙම් යි කියන නුඹ වහන්සේ හා දෙන්නා ම සතුටුබව මුත් අනිත් මේ රාජධානියෙහි සතුටු සතක්හු නැතිවැ හැම එක වලාම් පැදුරෙහි පෙරළෙන පරිදි බලා වදාළ මැනව සිතා වදාළ විට දෙන්නට හසති අශ්ව රත්නාදිවූ සියලු සම්පත්හි ඇත්. ඒ දෙත් මුත් ඇස් නො දී වදාළ මැනවැ යි කීහ.

ඒ අසා සඟාමිදරුවෝ "කොල, අද මට සිතා හඬන්නා වූ තෙපි මා මරහු මුඛයෙහි හෙනකළු වළකාගත හෙවුදැ? බුදුව මුළුලොව ගළවන්නට සිතන්නා වූ මා දන් නො දෙවා

තොපගේ ශක්තීන් බෝමැඩැ හිදුවා බුදුකොටැ 1 පියහෙවුද? ඇස් දිව මැනවැ යි සිතා නම් දිව්‍යචක්ෂුස ම දුවමැනවැ යි සිතන බව මුත් මේ ඇසෙහි ආසා නො කරව. අද දත් දිය නොදී වළකන්නා වූ තෙපි මා බුදුවිය නොදී වළකන්නාවුන් හා සමඟව. එසේ වූ කල තොපට සෙනහ ඇති නියාඟ නො වන්නේවේද? ඇස් ඉල්වා ආවා වූ යාචකයාහට ඇස් නො දෙම්. අනිකක් දෙම් යි යන බසක් කියම්ද?

"එහෙයින් මාගේ දැනඟට අනන්තරාය කරන්නට තොප එක්රටෙක ඇත්තාවුන් තබා අනන්තාපරිමාණ සත්වළු අනන්තාපරිමාණ දිව්‍යබ්‍රහ්මයන්ට ද නො පිළිවන. එහෙයින් සිසැ 2 නොවෙහෙසී සිටුව"යි වළකා සිවක නම් මහාවෛද්‍යයා කැදවා මට සිඛවන්නා වූ බුඩහාවයට වහල්වව. මා නිසා ගැළවෙන්නා වූ ඔළුලොවට කරුණා කරව. මාගේ බුඩශ්‍රීන් සැරහෙන්නා වූ ඔළුලොවට ආභරණ සපඟව. තොප හා මා ඇසැ ඔබාලන්නා වූ සැත බුදුරුවැ ඇස් තබන තෙල්ලෙකැ යි සිතන බව මුත් සැතෙකැ යි නො සිතම්. එහෙයින් මාගේ ඇස් උදුරා දත් දෙව තෙපිත් ඒ පින්හි සරිවව. මාගේ මනොරථඟ මසාක ප්‍රාපකරව"යි වදාළ සෙයෙක.

ඒ අසා සිවක නම් මහාවෛද්‍යයෝ:-"සාමිනි, ඇස් දත් දීලීම් නම් ඉතා බැරි දෙයෙක. 3 සී බුඩින් විමසා පියා පිළිවන්වුව හොත් කොටැ වදාළ මැනවැ"යි දන්වූහ. ඒ අසා සාමිදරුවෝ, "සිවකය, දැනවිඟයෙහි මට පරීක්ෂා නම් දෙයෙක් නැත. තමා ඇස හෙළන සැතෙක් ඇත් නම් ඒ මා ඇස රසාඤ්ජන ගල්වන කපුරු ලාවක් කොට සිතම්. නෝ මා නොවිචාරා යාචකයාගේ මනොරථඟ මසාක ප්‍රාපකරවැ"යි වදාළ සේක.

ඒ අසා සිවක තෙම මාගේ සාමීන් දන්හි කළ ලොහයෙන් ඇස් දී මුත් නො නවත්මි වදුරත් 4 ඉනිබ මේ ඇසැ සැතක් හෙළාලන බව දැදුසු නො වෙයි සිතා නිල්මහනෙල් මලෙක්හි බෙහෙත් සුන්නක් බහාලා දකුණු නාසාපුටයෙන් මේ මල්හිඹැ වදාළ මැනවැ යි දන්විය. බොධිසත්වයන් වහන්සේ මහනෙල්මල් හිඹුත් හිඹුත් ඖෂධයේ බලයෙන් ඇස සිටි නැනින් ඉගිල පෙරලී ගියේ. බලවත් වූ වේදනා පවත්නට පටන්ගත.

---

1 ලිය. 2 නොවෙසිඟ. 3 ශ්‍රී බුඩින්. 4 ඉනික්බ,

වෙදතෙම සැමියාණෙනි, වේදනාගෙහි රස නොදත් හෙයින් ඇස් දන් දෙමහ යි සිතා වදාළසෙයෙක් වී නම්දු දැන් වේදනාගෙහි රස දත් බැවින් වැළකියසේක්වී නම් යහපතැයි සිතා සැමියිනි, පරීක්ෂා කොට වදාළ මැනව. නැවත ඇස තුබූ පරිද්දෙන් තබාලන්නට මට නො බැරියැ යි දැන්විය. ඒ අසා සැමියාණෙනි "කුමක් ද තා කියන්නේ? දෙරැ කප්රුක් හිදුවන තැන තණ උදුරන්නෝ තණ ගසට බඩ කකියැ වද්ද? මම සවීඥතාඥාන නැමැති ඇස පිහිටුවන්නට මේ ඇස උදුරන්නේ නම් එහි අපෙක්ෂාවක් කෙරෙම්ද? කල් නොයවා "උදුරා පියව"යි වදාළ සෙයෙක.

ඒ අසා සිවක වෙදතෙම නැවත බෙහෙත් ගල්වා හිඹිනට දිනා. හිඹුත් හිඹුත් ඇස තුබූ තැනින් ඉදිරි ඇසිපිය මත්ත දක්වා පලා ආය. සඒඛාය මැඩැ ගෙණැ බලවත් වූ වේදනාව පවත්නට පටන්ගත. නැවත සිවක තෙම "සැමියිනි, නැවත මේ ඇස තුබූ පරිද්දෙන් තබාලන්නට මට පිළිවනැයි දැන්විය. ඒ අසා සැමියාණෙනි ඇස සීරකරම් යි කියන තාගේ බසින් මාගේ කණට දුක් දී.එන් ඇසක් රක්ෂා කෙරෙම්යි දෙකණකට පිඩා නොකර ඇස උදුරා පියව යි වදාළ සෙයෙක. ඒ අසා සිවක තෙම බෙහෙත් ගල්වා මහනෙල්මල දිනා. එවිට හිඹුත් හිඹුත් ඇස ඉදිරි වැටිනිනා. නහරෙහි එලීගෙණැ දානපාරමිතාව ඇසිපියෙහි බැඳලා එල්වා ගෙණැ කෙළනා කෙළිපෙදක් සේ බම්මන් සිටියේය.

මහාපුරුෂයානන් වහන්සේ තුබූ ඇසින් ඒ ඇස බලා බලා රන්හලෙකින් හිඟුල් හැල්ලක් හෙන්නා සේ ලය නහවා ගෙණැ වැහිරෙන ලෙහෙ බලබලා ඇස ඉල්වා ගෙණැ සිටි යාචකයාගේ මුහුණ බලබලා ලය ලෙහෙයෙහි ගැලෙත් ගැලෙත් තමන් වහන්සේ සොම්නස් හැලිහැලී වැඩහුන්සේක. නැවත සිවක තෙම සැමියිනි ඇස තුබූ පරිද්දෙන් තබාලීම මට පිළිවනා. පරීක්ෂා කොටැ වදාළ මැනවැ යි දැන්විය. ඒ අසා සැමියාණෙනි ඇස ඉල්වා ආවාවූ යාචකයා හා මා හා දෙන්නාගේ සොම්නස හා එක්කොටැ මේ නහර කපා හැරී පියව"යි වදාළ සෙයෙක.

අනතඃපුරස්ත්‍රීන් හා අමාත්‍යයන් හා රාජකුමාරයන් හා රටවැස්සන් එක පැහැරී පාවුල්හි පෙරළෙන්නට පටන්ගත්හ.

එකොණෙහි සඞ්ඝාමිදරුවෝ තුබූ ඇස දියාවෙනි බැමය බිඳ රැහ ණිවැ වෙදහු මුහුණ බලා කල් නො යව යි වදාළ සෙයෙක. ඒ අසා වෙදතෙම වමත්ලෙහි ඇස රදවා ගෙණැ දකුණතින් සැත අල්වා ගෙණැ නහර කපාපියා ඇස ගෙණැ ගොස් බොධිසත්ත්වයන් ශ්‍රී හස්තයෙහි තබාලීය.

මේ වේලෙහි මහාපුරුෂයානන් වහන්සේ තුබූ වමැසින් උදුරා පි දකුණැස බලබලා දුක්පත් සතුන් දුකින් මුදන්නා කැමැත්තෙමි. අසරණ්වූ ලොව රක්ෂාකරන්නා කැමැත්තෙමි. එසේ වූ මට මේ ඇස් දන් දී මා බුදුවැ කරන්නා වූ ලොකාර්ථයට කාරණ බවමුත් මට අනික් සම්පත්තියකට කාරණ නොවෙ යි සිතා වදාරා අත්ලෙහි තුබූ ඇස පෙරළ පෙරළා බලාපියා ඇස පැහැය නො මිරිකී යනතුරු බමුණාට දිලුවමැනවැ යි සිතා මෙසේ එයි බමුණ කැඳවාලා තමා අත්ලෙහි තුබූ ගිනිගෙණැ දිලියෙන යවටක් අතුන් අත හෙළාපියන එකක්හු සේ ශ්‍රුහුශ්‍රුහුවැ සතුටු සතුටුවැ හෙළන්නා සේ ලෙහෙයෙන් රැඳිගිය ඇස බමුණ අතැ තබාලා.

''බ්‍රාහ්මණය, මේ මාගේ මුහුණ පිහිටි ඇස් දන් දෙන්නෙමි දිව්‍යසම්පත්තියක් මනුෂ්‍යසම්පත්තියක් නො පතමි. මේ ජාතියෙහි පටන් ගෙණැ මා බුදුවන ජාති දක්වා සුවපත් සත්ත්වයෙක් මාගේ නම සිහිකෙළේවි නම් ඔහුගේ සුවය දියුණු කොටැ 1 පිටිවතුරු ගැන්විය හෙම්වයි දුක්පත් සත්ත්වයෙක් මාගේ නම සිහිකළේවි නම් ඒ මා සිහිකළ සිත හා කැටිවැ කැටිවැ ම ඔහු විඳිනා දුක් ම පෙරළි ඕහට පඤ්චේන්ද්‍රියයන් සනහන්නා වූ සුව බවටයේව යි නිරුපධිශෙෂ පරිනිර්වාණ ධාතුයෙන් පිරිනිවෙන දවස් දක්වා මාගේ කණැ දුකින් හඬන සත්ත්වයන්හුගේ බැගෑ හඬෙක් නො වේවයි මාගේ දෙ ඇස ඇතිතාක් මානයෙහි දුක්පත්වූ සත්ත්වයන්හුගේ මිරිකී ගියාවූ මුහුණක් නො දකිම්ව යි.

''ඇස් දන් දෙව, හිස් දන් දෙව, තොපගේ අඹුදරුවන් දන් දෙව යි එන්නාවූ නා සේ වූ යාචකයෝ මාගේ මිදුලෙන් නැතොර නො වෙත්වයි. රහ බොන අවණෙක පසුවැ ගිය බමණ මත්වලුවන් සේ මා සරණ ගිය ලොව සුවයෙන් මත්වැ

1 පිටිවකු රෑවා.

අවසථා නො දැනැ දුකෙක්හි රස නො දැනැ නිවන් දක්වා සස රෙහි මිහිරි කෙළි කෙළිත්වයි සිතූ ක්‍ෂණය හා කැවිවැ ම අහි මත වසතුවක් ලැබීමෙන් සතුටුවන බව මුත් කැමැති වසතු නො ලැබීමෙන් සතානවයා දුක් නො ගණිත්වයි.

"මුවරද පිරුණු පියුම්හි ලත්නා බමරුන් සේ අඹුදරුවන් ඇති යහන්හි මුත් එකලා යහන්හි දුක් ගෙණැ හෝනා සතාව යෙක් මාගේ කණ ඇතිතාක් කල් නො ඇසේවයි රජදරුවන්ට මෙහෙ ගත්නාවූ මාළුයෙහි රස බලනා 1 අරක්කැමියකු සේ බුදු වැ ලෝ වැස්සාට දෙන නිවන් සුවයෙහි ආදිකොට රස බැලිය හෙම්ව යි මෙතෙක් මුත් මා පතන අනික් සම්පතනියෙක් නැත. ඇස නට සම සිනින් ම දින්මි. මා මුහුණෙහි තුබූ වමැසට වඩා තා අනට ගිය දකුණැසට ම සිනහැත්තෙමි.

"කොට ගෙයි තුබූ බිජුවටට වඩා කුඹුරෙහි වූ බිජුවටුන් බොහෝ ප්‍රයොජන සිඩවන්නා සේ මා කෙරෙහි තුබූ ඇසට වඩා තා කෙරෙහි පිහිටුවා වූ ඇසින් මට බුඩතාවය සිඩවන් නේදැයි සිතා වදුරා නෙලෙ ගනැ"යි ඇස බමුණා අත නබාවූ සේක. බමුණු ඇස හැරිගෙණැ තමාගේ කණ ඇසට ලග කොටැ පැලිය. එවේලෙහි ම ශක්‍රානුභාවයෙන් ඇස අධික වූ වණීයෙන් යුකතවැ සථිරවැ පිහිටා ගියේ. බොධිසතාවයෝ වමැසින් බමුණාගේ දකුණැස බලාලා මා වමැස'ත් එකවට උදුරා ගෙණැ නො දුන්නෙහි ලාබ ලදිමි. ඉනික්බ ඒ ඇස නිබි කුමක් කෙරේද? ඒ උදුරා දෙමි යි ලෝවැස්සන් හඩව හඩවා ඒ ඇසත් උදුරා දන්දී වදාළ සෙයෙක.

ශක්‍රයා ඒ ඇසත් තමාගේ ඇසැ පිහිටුවා ගත්. එවිට සඩා ඕදරුවෝ ඔහුගේ මුහුණ බලන අනික් ඇසක් නැති හෙයින් ඇලයෙහි සිටියාහු විචාරා ඇස පිහිටා ගිය බව අසා සතුටු සතුටුවැ ලය 2 සතහවා ගෙණැ වැගිරෙණ ලේ දිය කෙළි දවස් මුගධවූ පුරසත්‍රින් ලෙහි නමාපි කුඩකුම ජලයට වඩා අධි කවූ ප්‍රිති කරණකොටැ සිත සිතා ඉනික්බ ය යි බමුණාට සමුදී වදාළ සෙයෙක.

බමුණු මහජනයා බලබලා සිටියදී නුවරින් නික්මැ දෙව් ලොවට ගියේ. බොධිසතාවයන් වහන්සේ ඇස් දන් දී වදාළ

1 අරක් සැමියකු. 2 සතහවා

නොබෝ දවසකින් ම ඇස්වළ පුරා මස් පිරී ඇස සුවවැ හියේ. සැමිදරුවෝ කීප දවසක් මාලිගයෙහි වැඩහිඳලා ඉනිබ අකිවූ මට රාජ්‍යයෙන් ප්‍රයොජන කිමෙක්ද? අත් පා මෙහෙකරණ එකක්හු මතු හැරැ ගෙණැ උඉනට ගොස් මහණවැ තපස් කෙරෙමි යි අමාත්‍යයන්ට වදාළසේක.

අමාත්‍යයන් රන් සිවිගෙයකින් වඩා ගොස් මඟුල් පොකුණු තෙරැ බඩා හිඳුවා සිසාරා රැකවල් ගෙණැ සිටියහ. බොධිසත්ත්වයෝ දැස ඇතහොත් උඉන්හි මධුර වසතු බලම්ගි සිත එකඟ නො වෙයි. අද මා දුන් දන් එකඟවැ සිහි කොටැ ගන්නට ඇස් නැති සේ ඉහපනැයි සිතා තමන් වහන්සේ දුන්නාවූ දැනයද ඒ හෙතු කොටැ ගෙණැ මතු සිඩවන්නාවූ බුඩනත්ඩය ද බුදුවූ පසු සිඩවන්නාවූ ලොකාඊය ද සලකා සලකා ප්‍රීතියෙහි ගැළී නිවෙමින් සැනහෙමින් වැඩහුන්සේක. එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පණ්ඩුකම්බලසිලාසනය හුණු විය.

ශක්‍රතෙම ආවර්ජනා කරන්නේ ඒ කාරණය දැකැ සිව්රජ ජරුවන්ට වරයක් දී ඔවුන්ට නැවත ඇස් දී අවමැනවැයි සිතා දෙව්ලොවින් අවුත් බොධිසත්ත්වයන් වැඩහුන් තැනට හුදුරු තැන ඇත් මැත් බලා සක්මන් කරන්නට පටන්ගත්හ. සැමිදරුවෝ සක්මන් කරණ පියවර හඩ අසා මේ කවරෙක්දැයි විචාරා වදාළ කල්හි ශක්‍රදෙවෙන්ද්‍රතෙම "මම දෙදෙව්ලොව දෙවතාවන්ට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍ර යෙමි. මා අතින් කැමැති වරයක් ගනුව මහරජ"යි දැන්වීය.

ඒ අසා සැමිදරුවෝ "දෙවෙන්ද්‍රය, අපගේ කවර සම්පත්තියක් නැති හෙයින් කුමක් ඉල්වමෝද? මෙතැන්හි අඞ්ග හෙයින් මියන්නා කැමැත්තම්හයි වදාළසේක. ඒ අසා ශක්‍රතෙම "මහරජ, නෙපි මියන්නටම සිතා වර නො කැමැත්තාද? ඇස් නැති හෙයින් මියන්නා කැමැත්තාදැ"යි විචාරා ඇස් නැති හෙයිනැයි වදාළ කල්හි "මහරජ, දන් නම් දෙය පරලොව ම සුවදෙනබවමුත් ඉහලොව නොදෙයි කියා නැවත පරලොවිනුත් ඉහලොවිනුත් ඛ්‍රීයතෙම අඊ සිඩ කෙරෙයි. නෙපි එක ඇසක් ඉල්වා ආ යාචකයාට දැසක් දුන්හ. එහෙයින් සත්‍යක්‍රියා කොටැ ඇස් ලබව"යි දැන්වීය.

ඒ අසා සඬාම්දරුවෝ "දෙවෙන්දුය, තෝ මට ඇස් දෙන්නා කැමැත්තෙහි නම් අනිස් උපායක් නොකොටැ මා පිරූ ධර්මයෙහි අනුසසින් ම මට ඇස උපදනේයයි සිවිසැ වදාරා "ශක්‍රයා විසින් මහරජ, මම දිව්‍යරාජවැ සිටැ ද දහසක් නුවණැස් ඇතිවැ ද 1 ධර්මඤ කෙණෙකුන්ට ඇස් දී ගත නොහෙම්. එහෙයින් තොපගේ සුචරිත ධර්ම බලයෙන් ම සත්‍යක්‍රියාකරවයි දැන්විය. ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ යහපතැයි සිවිසැ මා ඇතිවූනාක් තැන් පටන් කෝටැ අද දක්වා මා කරා නොයෙක් වයතු ඉල්වා එන්නාවූ යාචකයන් මුනුන බලන වේලෙහි සතුටු කඳලෙන් රැඳි ගිය සනෙත්තාඝයෙන් පිරිගිය උතුසවයෙන් නළල නටන්නාවූ ඇසින් බැලූයේ ඒම් නම් මට ඇස් පහළවෙවයි කියා සත්‍යක්‍රියාකොටැ වදාළ සෙයෙක.

එසේ වදාරා තුඩ ඇදූ නොඟන්නාතුරු ම ගිරූ රැස් හෙත් හෙත් පිපි විහිදි ගිය පඤ්චවණී පදමයක් සේ පළඹුවන ඇස පහළ විය. ඒ ඇසින් සඬාම්දරුවෝ නිදූ පුබුත් එකක්හු සේ සියලු වසතු බලමින් දෙවන ඇසට සත්‍යක්‍රියා කරණසේක් මා ඇස් ඉල්ලා ආවා වූ බ්‍රාහ්මණයාහට ඇස් දන්දෙන්නට යැයි උදුරණ වේලෙහිත් ඇස නහර කපන වේලෙහිත් ඇස ඕනට දී පි පස්සෙහිත් මේ තුන් තන්හිම දුක්පත් වූ මුළුලොවට වැඩ කෙරෙම්හයි යන මනොරථය නිරන්තරවැ පැවැත්තේ වීනම් ඇස් උදුරා මා අත තබාලූ වේලෙහි මා අත්ලෙහි පිරිගිය ලෙහෙ මතු මාගේ බුදුරුව පැහැගණ හිඟුල් චෛත්‍යයන් කොටැ සිතා විද විදැ හුන්නෙම් වීම් නම් මේ සත්‍යයෙන් මට දෙවෙනි ඇස පහළ වේවයි සත්‍යක්‍රියා කොටැ වදාළසේක.

ඒ ක්ෂණයෙහි මතු සඬාම්දරුවන්ගේ පහළවීමට දෙවෙනුවැ ධර්මරත්නය ලොකයෙහි පහළවන බවට පූර්වනිමිත්ත පානා සේ දෙවන ඇස 2 පැනී ගියේ. මෙසේ පහළවූ දස මිනිස් ඇසයයි නොද කිය හැක්ක. දිව ඇසයැයි නොද කිය හැක්ක. සඬාම්දරුවන්ගේ සත්‍යයෙන් උපන් හෙයින් එ සත්‍ය පාරමිතා චක්ෂුස් නැමැති ඇස්දෙක පහළවූ ක්ෂණයෙහිම ශක්‍රදෙවෙන්දුයාගේ ආනුභාවයෙන් සියලු රාජපර්ෂද එතැනට කැවිවැ ගියහ.

---

1 අධර්මඤ.

* දූසං කාම න කෙවලං සම්පරායත්තමෙව දියති දිට්ඨිම්මිකත්තායපි පවත්තෝ හොති-

2 පහළවැ ගියේ.

එසේ කැපි වූ මහජනයා මධ්‍යයෙහි ශක්‍රදෙවෙන්ද්‍රතෙම ශක්‍රාත්මභාවයෙන් ආකාශයෙහි දිලිහි දිලිහී සිටැ බොධිසත්ත්ව යන්ගේ ගුණයෙහි ප්‍රසන්නවැ "මහරජ! ලොකයෙහි දන් නම් නොප දුන් දනය. සබා නම් නොප කියන සබාමය. දිවි නම් නොප ලත් දිවිය ගැත්තෝ නම් නොපගේ ගැත්තෝ ම ය. මසැසක් දිලා එම ජාතියෙහි ම පවුරුය පළිනය, වෘක්‍ෂය, ඝනා දින් විද ගෙණැ රාත්‍රියෙහි ඝනාන්ධකාරයෙහි සිසාරා සියස් යොදුනෙහි රූප දැන්නා ඇස් ලදුව. දෙව්ලොව නන්දනොද්‍යානය කට ගිය ගමනකට වඩා මිනිස්ලෝවැ නොප වසන උයනට අ බව ම මට සන්තොෂයට කාරණය. සියක් යොදුනෙහි සිටැම කර බැඳලූ ගරවිල් කුණක් සේ දුගඳ වූ මේ මිනිස් ලොවට අයෙම් නොප දුටු හෙයිනා.

"ආකාශ ගඞ්ගායෙහි කලට පිපි ගිය රත් පියුමෙක්හි නුණු බමරක්හු සේ ඉනා සන්තුෂ්ටයෙමි. සත්පුරුෂයන්ට නොප වැන්නවුන්ගේ දැකුම් වාසනාවේව යි නොපි ද නො ප මාවැ කුසල් කරව"යි අවවාද දී දෙව්ලොවට ගියේ. ඉක්බිති බොධි සත්ත්වයන් වහන්සේ ඇස් ලද හෙයින් සතුටු වූ මහ ජනයා පිරිවරා අසුරයන් ලුහුබඳවා පියා ජයගෙණැ ජය මද යෙන් මත් වූ දෙදෙව්ලොව දෙවතාවන් පිරිවරා දෙව්නුවරට වැදූ **වෛජයන්ත ප්‍රාසාදයට** නැඟෙන ශක්‍රදෙවෙන්ද්‍රයා සේ නුවරට වැදූ **සුචන්ද්‍රක** නම් ප්‍රාසාදයට නැඟි තමන් වහන්සේ ඇස් ලත් බව අසා සතුටුවැ නොයෙක් පඬුරු ගෙණැ රාජාඩ්ගණයෙහි රටවැස්සෝ රැස්වූහ. රැස් වූ බව අසා ධර්මයෙහි අනුසස් සියලු සත්ත්වයාහට පෑව මැනවැ යි රාජාඩ්ගණයෙහි මණ්ඩපයක් කරවා ඒ මණ්ඩපයෙහි වැඩැගිඳැ සියලු නුවර වැස්සන්ට තමන් වහන්සේ ලද ඇස් පෑ "සුචරිත නම් මෙසේකටයුතු දෙයෙක. දුනය නම් මෙසේ දියයුතු දෙයෙක. තෙපි හැම දෙන ම මා බලා මා ලද මේ ඇස් ම දුශ්චාන්න කොටැ ගෙණැ සුචරිත ධර්ම පුරා මෙලෝ පරලොවින් සුව අනුභව කරව යි අවවාද දී වදාළ සේක.

මෙසේ සම්මාදරුවන් ඒ ජාතියෙහි කළ සුචරිත ධර්මයෙන් ඒ ජාතියෙහි ම ඇස් ලත් බව ඇසූ සත්පුරුෂයන් විසින් ධර්මය නම් පරලොවට ම විපාක දෙයි නොසිතා ඉහලොවත් පරලොවත් සියලු අභිමතාර්ථ ධර්මයෙන් සාධා නිවී සැනසී කෙළවර අමාමහ නිවන් දක්නා පිණිස ධර්මය පුරා ධර්මය ම මෙනෙහි කොටැ **දහම් සරණ යා යුතු.**

තව ද, ධර්මය පරලොව නො යන තුරු ඉහලොකයෙහිදී ම සියලු උපද්‍රව දුරුකොටැ සියලු අභිමතාර්ථ සාධා දෙන බව හගවන පිණිස මහාසමුද්‍රයෙහි කිසි සරණෙක් නැත්තා වූ ස්ථානයෙහි ධර්මබලයෙන් ධර්මජයන් වහල් ලත් පරිදි හගවා **සිලානිසංස ජාතකයෙහි** කථාව දක්වම්. හෙ ද තුණුරුවන්හි පහන් ලත් සත්පුරුෂයන් විසින් සිත් දී කන් දී නමා ඒ කථාව අසා රත්නත්‍රය ය. සරණ යා යුතු.

හේ කෙසේ ද? යත්:-

අතීතයෙහි **කකුසඳ** සම්මා සම්බුදුන් වහන්සේගේ බුඩරාජ්‍යයෙහි සෝවාන් වූ එක් උපාසක කෙණෙක් එක් 1 කරණැවෑමි යක්ෂ හා කැටිවැ මහා සමුද්‍රයෙහි යාත්‍රාකරණ පිණිස නැවූ නැංගාහ. ඉක්බිති ඒ කරණැවෑමියාගේ අඹුතොම සොම්නි! මුන්ට වූ සුඛදුඃඛයෙක් ඇත් නමුදු නුඹ වහන්සේ ම පිළිබඳ යසි කරණැවෑමියා ඒ උපාසකයන්ට පාවා දුනැ සි.

ඉක්බිති නැව සත්වැනි දවස් බිඳිණියේ. උපාසකයන් හා කරණැවෑමියන් හා දෙන්නා ද එක් පෝරුයෙක්හි හෙවැ පිහිනා ගෙණැ එක් දිවිසිනකට නැහි ගියහ. ඒ කාරණැවෑමියා ප්‍රසීන් මරා තෙමේ මස් කා උපාසකයන්ටත් මස් දෙසි. උපාසකයෝ මට ඉන් ප්‍රයොජන නැතැ සි නො කා මේ ලොවෙහි අප සේ වූ දුඃඛිතයන්ට තුණුරුවන් මුත් අනික් සරණෙක් නැතැසි සිතා එකපරාක්‍රමයෙන් සංසාර සාගරය පිහිනූ සරණ ගියවුන්ට නිවන්හි පහරවා සුව දෙන තෘෂ්ණා වසඟ වූ 2 දුක් විඳිනා මව්කට 3 වද බෙහෙත් දුන් සියලු ලොව ගලන්නා වූ මරණ නැමැති රාක්ෂසයා මුව බාණෙහි හෙට්ටි මුළුලොවෙහි එකාලොක කරණ ධර්ම නැමැති ප්‍රදීපයක් කරුණ නැමැති තෙල් එව ප්‍රඥ නැමැති වැටියෙහි අවුළුවා මොහාන්ධකාර නසා මුළුලොව එකාලොක කළ මුලෙහි වත්කළ පැනට ලසනා වළ දන දලුවක් සේ ලෝවැස්සාගේ සුවයට තමන් මුහුණ සතුටු කරණ පා පියුම් සිහිකළ පමණින් සියලු සතුවයාගේ හිසෙහිදු පා පියුම් කරණ නෙලුම් පතින් වැගුරුණු දිය සේ ලෙහි නො හැල්වා කෙලෙසුන් දුරු කළ බසින් මිහිරි රුවින් මිහිරි ගුණයෙන් මිහිරි බුදුරුවන් සරණ ගෙමි සි බුත්සරණ ගියේ.

---

1 කරනවැහැම්මක්. 2 දුක්වඳිනා. 3 වනා බෙහෙත්.

ඒ සඞ්ඝාමිදරුවන් විසින් වදුරණලද සොන් දෙශයෙහි වූ 1 ජාන ශක්තිරාවක් සේ ආදියෙන් මඩ්‍යයෙන් අන්තයෙන් මිහිරි වූ මුඛදට වැදූ නිමායන මහගහක් සේ නිවණට වැදූ බුන් අතු රෙහි නොරදන ලියද්දෙහි පිහිටාගත් පැන ගොයම් සුහුබුල් කරන්නා සේ ලෙහි පිහිටා ගෙණැ ශීලාදි ගුණධර්මයන් සුහු බුල් කරණ සියලු දුඃඛයට රක්ෂා මන්ත්‍ර වූ ධර්මරත්නය සරණ යෙම් යි **දහම් සරණ** ගියේ.

ඒ සඞ්ඝයන් වහන්සේගේ ධර්මපුත්‍ර වූ වෘෂභරාජයා පසු පස්සේ ක්ෂෙම මාර්ගයෙන් ගියා වූ වෘෂභරාජයන්සේ ඒ සම්මා සම්බුදුරජානන් වහන්සේ පස්සෙහි අෂ්ටාඞ්ගමාර්ග ප්‍රතිපත්තීන් ගොසින් නිවන් පුරවන් **ශීල, සමාධි, ප්‍රඥා** ආදි ගුණධර්මයන් වපුළ මහකෙතක් බඳු වූ සියලු දුඃඛයට අතලොඹු වූ සඟුරුවන් සරණ යෙම් යි **සඟසරණ** ගියේ.

මෙසේ ඔහු රත්නත්‍රයෙහි ගුණ සිහිකරත් කරත් තුණුරුවන් සිහිකිරීමෙහි අනුසසින්ඒ දිවසින්හි උපන්නා වූ නාගරාජ තෙම තමාගේ ශරීරය සත්රුවන් මහ නැවක් කොටැ මැවීය. මුහුදෙහි ආරක්ෂාගත් දෙවතාවා නියමුවෙස් ගත. නැව සත් රුවනින් 2 පිරිණ. මහනැවුහි මැවුනා වූ තුන්කුඹ ඉඳුනීල මණ්මය විය. රුවල සුවණ්මය විය. සොන් කඹ රජතමය විය. පලු හා රිපි සුවණ්මය විය.

සමුද්‍ර දෙවතාතොමෝ නියමුවෙසින් නැවු සිටැ තෙණැ නැවු නැති දඹදිවි යන්නෝ ඇද්ද යි තුන්වරක් 3 හඬ ගැවුව. උපාසකයෝ ඇපියම්හ යි කියා කිහ. සමුද්‍ර දෙවතා එසේවුව හොත් අවමැනවැයි උපාසකයන් අත අල්වා ගෙණැ නැවට නැංගාහ. උපාසකයෝ නැවැ සිටැ කරණැවැමියාට හඬගැවුව. සමුද්‍ර දෙවතාවා ඒ අසා මේ නැව තොපට ම ලැබෙනබව බුන් කරණැවැමියා නො ලැබෙයි කියා කිව. ඒ අසා උපාසකයෝ එයට කාරණ කිම්දැයි විචාළහ.

සමුද්‍රදෙවතා රත්නත්‍රයයෙහි ගුණ සිහිකලයෙන් ම මේ නැව මැවිනා. එහෙයින් සීලාදි වූ ගුණයන් ගැති කරණැවැමියා මේ නැවට නැගෙන්නට නො පිළිවනැයි කිව. ඒ අසා

---

1 සජාත. 2 පිරුණ. 3 හඬගැවිය.

උපාසකයෝ මා ගිය තුණුරුවන් සරණෙහි කුසල් තෝත් අනුමෝ වයි කියා කරණුවැමියාට කීහ. හෙද දෙහොත වුදුනෙහි තබා ගෙණැ අනුමෝ වෙමි සැමිනි! යි පින් අනුමෝ විය. සමුද්‍රදෙවතාවා මිවිට ඔහුත් ගන්මි යි නැවට නගා ගෙණැ දෙදෙනා ගෙණැ ගොස් බරණැස් නුවර ලා දෙදෙනා ගේ ගෙහි ධන පුරා සත්පුරුෂ සමාගමයෙහි අනුසසින් සීලාදි ගුණයක් නැති කරණුවැමියා පොවා මුහුදු බත් නො වැ ගැල විනැසි උපාසකයන්ගේ ගුණ කියා නාගරාජයා තමාගේ විමා නයට ම ගියේ.

උපාසකයෝ ද කරණුවැමියා ද කුසලයෙහි අනුසස් දැනැ දිගුණ දිගුණ කුසල් කළහ. මෙසේ රත්නත්‍රයයෙහි සරණ ගමන නම් පරලොවට නො ඇවා ඉහලෙවිහි ම සියලු දුඃඛ දුරු කොටැ සියලු සම්පත්හි සාධා දෙන්නේ යැයි දත්තා වූ සත්පුරුෂයන් විසින් තුණුරුවන් සරණ ගොස් ඒ සරණය ම මෙනෙහි කොටැ එම කුසලින් සියලු අභිමතාර්ථ සාධා එම ධර්ම ය ම වහල් කොටැ ගෙණැ මනෝරථ සිද්ධකරණ පිණිස දහම් සරණ යෙම් යි දහම් සරණ යා යුතු.

මෙහි ධර්මය තමා රක්ෂා කළවුන් රක්ෂා කොටැ සියලු සම්පත්හි සාධාදෙන පරිදි දක්වන පිණිස නොයෙක් කථා නන්තර දක්වනලද මෙතැන්හි ඒ ධර්මය තමා රක්ෂා කළවුන්ට ආයුශකත්හි සාධා දෙන පරිදි දක්වන පිණිස ධර්මපාල බොධි සත්ත්වයන් වහන්සේගේ චරිතය එළවා දක්වමි. ඒ කථාව නැමැති අමා බොන පිණිස සත්පුරුෂයන් විසින් කන් නමා සාවධානවැ ඇසිය යුතු. හේ කෙසේ ද? යත්:-

අතීතයෙහි බාරාණසියෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රජකරණ සමයෙහි ඒ නගරට ධර්මපාල නම් එක්ගමෙක් ඇති විය. එගම ධර්මපාලකුලය තමා එහි වසන හෙයින් ධර්මපාල නම් ලද, එහි කුසල ධර්මදශයක් රක්ෂාකරණ හෙයින් ධර්ම පාල කියාය ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණයෙක් වෙසෙයි. ඒ බ්‍රාහ්මණයා ගේ කුලෙහි අධම පක්ෂයෙන් දූසකම්කාරයෝද දන් දෙති. සිල් රක්ෂා කෙරෙති. පොහෝ දවස්හි පෙහෙවෙති.

එසමයෙහි මාගේ සැමිදරු වූ බොධිසත්ත්වයන් වහන්සේ ඒ කුලෙහි පිළිසිඳ ගත් සේක. පෙර ම ධර්මපාල වූ සැමිදරු

වන් දියුණු ධම්පාල කුලයෙහි පිළිසිඳ ගත්තවුන්ට ධම්පාල යයි නම් කළහ. ඉක්බිති සාමිදරුවන් ශිල්ප උගන්නා වය සට පැමිණි කල්හි පියානන් වහන්සේ දහසක් දී ශිල්ප උගන් නා පිණිස තක්ෂලා නුවරට යවා වදාළ සෙයෙක. සාමිදරු වෝ ගුරුදක්ෂිණා දහසක් හැරී ගෙණ පියානන් වහන්සේ වැඳැ සමුගෙණ ගොස් දිසාපාමොක් ආචාර්‍යයන් කෙරෙහි ශිල්ප උගන්නා සෙයෙක් පන්සියයක් මාණවකයන්ට ප්‍රධාන වූ සේක.

එසමයෙහි දිසාපාමොක් ආචාර්‍යයන්ගේ වැඩිමහල්ල පුත නුවෝ මළහ. ආචාර්‍යයෝ මාණවකයන් පිරිවරා බොහෝ නෑයන් හා කැටිවැ හඬමින් සොහොන්හි සිටැ පුතනුවන් දවති. එහි ආචාර්‍යයෝ ද නෑයෝ ද රටවැස්සෝ ද එක හෙළා හඬති. ඒ ධම්පාල කුමාරයන්වහන්සේ ම නොහඬා පන්සියයක් මාණවකයන් එබඳු වූ බාලකුමාරයෝ තමන් ලද වයස්හි ම මවුපියන් කෙරෙන් වියෝ වැ මළහ යි කිය කියා හුන් කල්හි "දරුවෙනි! නෙපි බාලකුමාරයෝ මලෝයැයි කුමට කියවිද? බාලකල්හි මිය යන බව සුදුසු නොවන්නේ වේ දැයි වදාළසේක.

ඒ අසා මාණවකයෝ "හැයි, කුමාරයෙනි! නෙපි සියලු සතුවයන්ට මරණ එකානන්න බව නොදනුදැයි කිහ. ඒ අසා ධම්පාල කුමාරයන් වහන්සේ සියලු සතුවයන් මරණින් මැකෙන බව දනිම්මය. එතෙකුදුවුවත් මහලු කල වුත් ලදරු කලැ අපගේ කුලයෙහි මියන්නන් නුදුවු විරිමි. මේ අපගේ කුලධම්යෙකැයි වදාළ සෙයෙක. ඒ අසා විස්මයපත් වූ අන වැස්සෝ එ පවත් ගොස් දිසාපාමොක් ආචාර්‍යයන් සැළකළහ.

ආචාර්‍යයෝ ද ධම්පාල කුමාරයන් වහන්සේ කැඳවා "දරුව! නොපගේ කුලයෙහි බාලයන් නොමියන්නේ සැබෑ දැයි විචාරා සැබව යි වදාළ කල්හි මේ කුමාරයෝ ඉතාම අශුචි යෂ වචනයක් කියති. මොවුන්ගේ පියානන් කරා ගොස් විචාරා සබා වී නම් මාත් ඒ ධම්යෙහි පිහිටා ගත මැනවැයි සිතා පුතනුවන්ගේ ශරීර කෘත්‍යය කොටැ සත් අට දවසක් යවා ගෙණැ ධම්පාල කුමාරයන් වහන්සේ කැඳවා "පුත! මම් බැහැරට ගොසින් පියා එන්නා කැමැත්තෙමි. මා එන

තුරු අතවැස්සන් ශිල්ප උගන්වව සි නියොගකොටැ එක් එළු වක්හුගේ ඇට හැරැගෙණැ දෙවා පියා සුවඳ කොටැ පසිඹියෙහි ලා ගෙණැ එක් අතවැස්සකු කැඳවා ගෙණැ නක්ෂලා නුවරින් නික්මැ ක්‍රමයෙන් එම ගමට ගොස් ධම්පාල කුමාරයන්ගේ ගෙය කොසිදැයි කියා විචාරා ගෙණැ ගොස් දෙර සිටියහ.

ඔහු දුටුවහු ගොස් ධම්පාල කුමාරයන්ගේ ගුරුන් වහන්සේ වැඩිදැ යැයි පියානන්ට කීහ. පියානෝ අවුත් ගෙට ගෙණැ ගොස් ආගනතුක සත්කාර කොටැ කවා පොවා සුවයෙන් බැණ හුන් සමයෙහි නොපගේ පුතනුවෝ ධම්පාල කුමාරයෝ ඉතා බුඩි සම්පන්නයහ. වෙද ත්‍රයයෙහි ද අෂ්ටා දශ විද්‍යා ස්ථානයෙහි ද මස්තකප්‍රාප්ත වූහ. එතෙකුදු වුවත් එක් රොග යෙකින් මියගියහ සි කීහ. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය වුව ශොක නො කළ මැනවැයි කීහ.

ඒ අසා මහා ධම්පාල බ්‍රාහ්මණයෝ අතින් අත්ගසා සි පියා මහත්කොටැ සෙන්නට පටන්ගත්හ. දිසාපාමොක් ආචාර්‍යයන් සෙන්නේ කුමක් පිණිසදැයි කී කලැ මිනිස්ලොවැ මියන බාලයන් බොහෝ හෙයින් නොප වැනි කෙණෙකුන්ගේ දරුකෙණෙකුන් මියත් මුත් මාගේ පුතනුවෝ නො මියති කීහ. ඒ අසා දිසාපාමොක් ආචාර්‍යයෝ මේ නොපගේ පුතනුවන්ගේ ඇට දැකත් නො හදහව් දැයි 1 පසිඹියෙහි තුබූ ඇට ඇදැ එලියෙහි ලා ලූහ. මහධම්පාල බ්‍රාහ්මණයෝ ඒ බල්ලකුගේ හෝ, එළුවකුගේ හෝ ඇටමුත් මපුතනුවන් ඇඟ ඇට නො වෙයි කීහ.

ඇට හෙළියෙහි ලාලූ ඇසිල්ලෙහි එගෙහි සිටි මිනිසුන් කෙරෙන් අප්පිඩි ගසා නො සිටුකෙණෙක් නැත. ඒ දැකැ දිසාපාමොක් ආචාර්‍යයෝ කවර සුචරිතයෙක්හි බලයෙන් නොපගේ වංශයෙහි ඇත්තවුන් පරමාර්‍ථ වළඳන්නාවූ සුචරිත ධර්ම කියන්නාහු "ආචාර්‍යයෙනි! අපි දශකුසලපථ ධර්මයන් නො ඉක්මෙම්හ. බොරු නො කියම්හ. පව් නො කරම්හ. සියලු දුශ්චරිතයෙක් ඇත් නම් ඒ පුරුදු නොකරම්හ. සත්පුරුෂ ධර්ම අසත්පුරුෂධර්ම දෙක ම අසාපියා අසත්පුරුෂධර්ම දුරුකොටැ

1 පසුම්බියෙහි.

සත්පුරුෂධර්මයෙහි හැසිරෙම්හ. දන් දෙන විටත් දන් දෙන්නට පළමුත් දන් දුන් පසුත් තුන් තන්හි ම එකාකාරයෙන් සතුටුවම්හ. ශ්‍රමණ බ්‍රාහ්මණ යාචකාදීන්ට ශක්‍ති පමණින් දන් දෙම්හ.

"ඇපි අපගේ අඹුවන් ඉක්මැ නො වතුම්හ. අපගේ අඹුවෝද අප ඉක්මැ නො පවතිති. අපගේ අඹුන් හැර සෙස්සවුන් කෙරෙහි බඹසර රකුම්හ. අපගේ කුලෙහි සුශීල වූ සත්‍රීන් බඩ පිළිසිඳෙන්ත් දරුවෝ නුවණැති වෙති. බහුශ්‍රැත වෙති. අපගේ සියලු කුටුම්බය පරලොව පිණිස කුසල් කරම්හ. අප තබා අපගේ කුලෙහි හැනි මිනිසෝ ද පරලොව සිඛතරණ පිණිස ධර්මයෙහි හැසිරෙන්නාහ. ධර්මය ම තමා රක්‍ෂාකළුවුන් රක්‍ෂා කරන්නේය. සහපත් කොටැ පුරුදු කරණ ලද්දූවූ ධර්මය දුගතියට යා නො දී ඉහලොවින් පරලොවින් සුව දෙන්නේය. එහෙයින් මාගේ පුතනුවෝ නිදුක් නිරොගි සුව පත්හ. මේ අනික් කෙණෙකුන්ගේ ඇට ඇ"යි කිහ.

ඒ අසා ආචාර්‍යයෝ විස්මයට පත්වැ මා ආ සේ ඉතා සහපතැයි නැගී සිටැ ක්‍ෂමාකරවා මේ එළුවකුගේ ඇටය. තොප ගේ පුතනුවෝ වූ කලි කිසි දුකක් නැතිවැ නිරොගිවැ හුන්නහ. තොප රක්නා ධර්මය අපටත් දෙව යි පතෙකැ ලියා ගෙණැ නක්‍ෂලා නුවරට ගොස් ධර්මපාල කුමාරයන් වහන්සේ සියලු ශිල්පයෙහි මස්‍තකප්‍රාප්ත කොටැ මහාපරිවාරයෙන් පියානන් වහන්සේ කරා නහා යවූහ.

මෙසේ ධර්මය නම් පරලොවට නො යවා ඉහලෙව්හි ම මරණ දුඃඛ දුරුකොටැ සියලු උපද්‍රව දුරුකොටැ පරමාර්‍ථ වළඳවා සතුටයා සුවපත් කරවන බව ඇසූ සත්පුරුෂයන් ධර්මයෙහි ම පිහිටා ධර්මයම මෙනෙහි කොටැ සියලු අභිමතාර්‍ථ සාධන පිණිස **දහම් සරණ යා සුතු.**

තව ද සත්පුරුෂයන්ට හස්‍තසාර වූ බුදු පසේබුදු මහරහතන්ට අසාධාරණ ආභරණ වූ සියලු ලොවට අවුතු පඬුරු වූ සවාසනා සියලු කෙලෙසුන් නැසූ බුදුන් ලොවට ගෙණ මහ පඬුරු වූ සියලු භවදුඃඛ නැමැති වහනිය නිවා වස්නා මහා මෙඝයක් බඳු වූ සියලු අභිමතාර්‍ථ සිද්ධියට අසාධාරණ වූ කාරණ වූ සියලු අනර්‍ඝ නැමැති වෑදින්ගේ චිකිත්සා පිණිස සළඳු

නැමැති මහා වෛද්‍යයානන් වහන්සේ දුටු අෂ්ටාඞ්ග ආශුඡේද තන්ත්‍ර වූ බැහැරින් නො අවුත් ලෞකිම පිහිටා ගෙණැ සියලු ගිතයෙහි මුල් බස්වන්නා වූ බුදුන් නූපන් කප්හි අප්‍රකාශවැ නිබී බුඩොත්පාදයක් දුටු දවස් ප්‍රකාශවන්නාවූ කරුණ ඇති ලෙහි ම හටගන්නා වූ දුර්නයන්ට අරුවි උපදවා.

සත්පුරුෂයන්ට ම මධුරවැ වැටහුනා වූ නමා පුරන්නවුන් ගේ ශරීරයට දුටුවිට ම මොහු ධර්මඥ කෙණෙකැයි කියා හඟවන්නා වූ සඞ්ගීය නමා රැක්කවුන් රක්ෂාකරණ බව හඟවන පිණිස මාගේ සහෝදරුවානන් මහා පඬිතයෙක්හි පොවා පිහිට ලද්දවූ **මහා පදුම ජාතකයෙහි** කථාව දක්වා සත්පුරුෂයන්ට ධර්මයෙහි උත්සාහ වඩවමි. දුක් විඳිනා නො කැමැති සුව විඳිනා කැමැති නිවන් නැමැති අග්‍රඵලයක් ලබන්නු කැමැති සත්පුරුෂයන් විසින් ඒ ධර්මකථාව අසා ධර්මයෙහි පිහිටා ඉහ ලොවින් පරලොවින් සුව වින්ද යුතු.

හේ කෙසේද? යත්:-

අතීතයෙහි බාරාණසියෙහි **ඛ්‍රහ්මදත්ත** නම් රජ්ජුරුවන් රජකරණ සමයෙහි මාගේ සහෝදරු වූ බොධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් ඛඩැ පිළිසිඳැ ගත් සේක. එසේ උපන්නා වූ සහෝදරුවානන් වහන්සේගේ මුහුණ පිපී ගියාවූ පද්මයක් සේ මනොහර වැ ශොභාවත්වැ තිබෙන හෙයින් පදමකුමාරයෝ යැයි නම් තුබූහ. සහෝදරුවෝ වැඩී සියලු ශිල්ප උගත් සෙයෙක. ඉක්බිති බොධිසත්වයන් වහන්සේගේ මෑනියන් වහන්සේ මළසේක. රජ්ජුරුවෝ අනික් බිසෝ කෙණෙකුන් අගබිසෝ තැන් තබා පුතනුවන්ට සුව රජ තැන් දුන්හ.

කාලානන්තරයෙකින් රජ්ජුරුවෝ ප්‍රත්‍යන්තය සංගිදුවන්නට යන්නෝ බිසවුන් කැඳවා යුඩ භූමියෙහි ආදීනව හඟවා මා එනතුරු මෙහි ම වසව යි කියා බිසවුන් ඇතුළු වූ සියලු රාජ්‍යයෙහි රක්ෂාවට බොධිසත්වයන් සිටුවා තුමූ ගොස් සියලු සතුරන් ලුහුබදවා ජනපද සඞ්ඝ කොටැ අවුත් සැරහී නුවර වදනා පිණිස නුවරින් පිටත 1 කදවුරු බැඳ හුන්හ. බොධිසත්වයන් වහන්සේ පියරජ්ජුරුවන් ආ බව දැනැ සියලු නුවර සඳ ඇතුළු රජගෙයි පිරිමසන සේක් හුදකලා බිහිවුන් හුන් තැනට වැඩිසේක.

---

1 කදයුරු.

බිසවු බොධිසත්ත්වයන්ගේ රූපාගුප්‍රාප්තවූ ආත්ම භාවය දැකැ බොධිසත්ත්වයන් කෙරෙහි පිළිබඳ වූ සිත් ඇති වූහ. බොධිසත්ත්වයෝ බිසවුන් වැඳැ "අම්ම, නුඹවහන්සේට කට ශ්‍රුතු කිම්දැ"යි විචාළහ. ඒ අසා බිසවු කාමරාගය ඉවසාගත නොහී මට අම්ම යයි නා කියන්නේ යයි නැඟි සිටැ අන අල්වා ගෙණැ නමන් සිත ඇති අනුරාගය හඟවා යහනට ඇද්දහ. බොධිසත්ත්වයෝ, "අම්ම, නුඹ මාගේ පියානන් වහන්සේගේ අඹුවන් නබා සෙසු පරසත්‍රී කෙණෙකුන්ගේ මුහුණ ද කෙලෙස වසඟවැ නො බැලූ විරීමි. මෙබඳු වූ අනර්‍ථයක් කෙසේ කෙරෙම් දැයි වදාළ සේක. බිසවු දෙවරෙක තුන්වරෙක ගිවිස්වා නො ගිවිස්නා හැම තෝ මා කීවා නො ගිවිස්සෙහි නම් රජ්ජුරුවන්ට කියා නාගේ ගිස කප්පවා ගන්මිසි 1 සැරසුනා. ඒ අසා බොධිසත්ත්වයෝ මාගේ ඛමීය මාගේ ලෙන් නො ගියේ වී නම් මාගේ ගිස ගියේ නමුත් කිම් දැයි වදාරා පිටතට වැඩිසේක.

බිසවු ඉඳින් මේ පළමුකොවැ පියානන්ට දන්වී නම් මාගේ දිවි නැත. මම ම පළමු කොවැ කියම් යි බත් නොකා 2 මලෙන් කිළිටි කඩක් හැඳැ ගෙණැ ශරීරයෙහි නඟවුණකොවැ රජ්ජුරුවන් අවුත් මා විචාළ කලැ ලෙඩ බව කියව යි රවා නිතොරවන ගැණුන්ට කියා නො බැණැ හොත. රජ්ජුරුවෝ ද අවුත් නුවර පැදකුණු කොටැ ප්‍රාසාදයට නැඟි දෙවින් විචරා ලෙඩහ යනු අසා ශ්‍රී ඝහන් ගඬියට වැද දෙවිනි, නුසුව කිම්දැ යි විචාලෝ. බිසවු දෙතුන් විටෙක නො බැණ පසුව "හැයි, රජ්ජුරුවෙනි, කුමක් විචාරා ද? සැමියන් ඇති අඹුවෝ නාම් අප සේ වෙද්ද ? අපාසු නො විචාරා තොප සතු අඹු කෙණෙකුන්ගේ අපාසු විචාරව යි කිව.

ඒ අසා රජ්ජුරුවෝ "දෙවිනි, කුමක් තොප කියන්නේය. ඝමක්ඛු විසින් තොපට පරිභවයෙක් වී නම් ඔහු ගිස කපා උගුරෙහි ලෙහෙයින් මාගේ ක්‍රොධාග්නිය සන්හිඳුවා ගන්නට වෙලෙහි ඔහුගේ නම කියවයි කීහ. ඒ අසා බිසවු නුඹ පසල් දනවු සාඩන්නට යන කලැ නුවර රක්‍ෂාවට සිටුවා ගියේ කා දැයි පදුමකුමාරයන් වේදැ යි කී කල්හි උඹ මා වසන තැනට අවුත් මම තොපගේ මවු මි. මා හා අනාචීයක් නො කරවයි කියව කියවා මා ඔත් අනික් රජෙක් ඇද්දැයි නිට සැමියම් නම්

1 සැහැලුනා. 2 ලොම් කිළිටි.

මම් යයි මාගේ ෆිසැ කෙහෙ ඇදූ හෙළා පියා ඇත් මැත් බලා හැදූ තමන්ගේ බස් නොහිවිස්නා හෙයින් මෙතෙක් වියරු කොටැ හිඳහයි කිව.

ඒ අසා රජ්ජුරුවෝ පරීක්ෂා නොකොටැ ම දණ්ඩෙන් ගසා ලූ ආශිවිෂයක්හු සේ කිපි පියා ක්‍රොධය ඉවසා ගත නොහී රාජපුරුෂයන් කැඳවා ගොස් පදුමකුමාරයන් බැඳලා මා කරා ගෙණෙව යි කිහ. රාජ නියොග ලත් රාජපුරුෂයෝ බොහෝ දෙන රැස්වැ සියලු නුවර මැඩැ ගෙණැ යන්නවුන් සේ ගොස් බොධිසත්ත්වයන්ට ගෙඩි දි පිටිතොල හයා බැඳැ වධ්‍යයන් ගෙණ යන පරිද්දෙන් කරැ රත්මල් බැඳලා මර මරා ගෙණැ යන්නට වන්හ.

බොධිසත්ත්වයෝ රාජපුරුෂයන්ට මම මාගේ පියානන් වහන්සේට අපරාධයක් නොකෙළෙමි යි වදුර වදුරා දෙවින් ගේ මේ දුෂ්ටකමෙකැ යි සිත සිතා වඩනා සේක. රජ්ජුරුවෝ ගැහැණියකගේ බස් ගෙණැ මහාපදුම කුමාරයන් මරවත් ල යි අවුත් බොධිසත්ත්වයන් පාමුල හී හඬන්නට වන්හ. මෙසේ ගෙණැ ගොස් බොධිසත්ත්වයන් රජ්ජුරුවන්ට දැක්වූහ. රජ්ජුරුවෝ කුමාරයන් වැනි රූපයක් බලා ද මේ මාගේ බිස දුන්ට අනර්‍ථකළ නැනැත්තෝ වේ දැයි සිත සිතා ඉවසා ගත නොහී මේ මාගේ පුත්වැ සිටැ මාගේ අඹුවන් හා අනර්‍ථ කෙළේ මොහු හැරැ ගෙණැ ගොස් සොරුන් හෙළන පවිත ඝට නඟා මහාප්‍රපාතයෙහි හෙළා ඇට 1 රැරූ කොටැ පියව යි කිහ.

ඒ අසා බොධිසත්ත්වයෝ "සැමිනි, මම් එබඳු වූ අපරාධයක් නොකෙළෙමි. ගැහැණියකගේ බස් ගෙණැ මා නොනසව යි කියා රජ්ජුරුවන් හිවිස්වා ගත නුහුනුවහ. ඉක්බිති සොළොස් දහසක් අන්තඃපුර ස්ත්‍රීහු ද සෙසු අමාත්‍යයෝ ද රාජ කුමාරයෝ ද "දේවයිනි, පදමකුමාරයෝ ඉතා ආචාරසම්පන්නය හ. තොපගේ රාජ්‍යයට දායාද වැ සිටියහ. ඔවුන් පරීක්ෂා නොකොටැ නොමරව. තමා දුටු දෙයක් නැතිවැ අනුන් කී බස් හිවිසැ දණ්ඩනය කරණබව රාජධර්ම නොවෙයි. පරීක්ෂා නොකොටැ නිග්‍රහ කරන්නා වූ රජහට විනාශය නොබොහෝ කලකින් ම වන්නේය.

---

1 තුතු කොට.

"දණ්ඩනය කළ මනාවුන් කොා කළමනාවුන් නොා හදු නන්නා වූ රාජමාගීයෙහි සම විසමසථාන නොා දැකැ පැකිලෙන්නා වූ ජාත්‍යන්ධයා සේ කටයුත්තෙහි පැකිලෙන්නේය. ගැත්තවුන් පරීක්ෂා නොා කොටැ මේ මහත් වරද ය මේ කුඩා වරදය යි නිශ්චය කොටැ පරීක්ෂා කොටැ දණ්ඩනය කරන්නා වූ රජ ලොක රක්ෂාවට සුදුසු වන්නේය. රජහු නම් හුදෙක් දඬින් නොා වූව මැනව. හුදෙක් මෝලොකුත් නොා වූව මැනව. මධ්‍ය ම ප්‍රතිපත්තින් ලොක රක්ෂා කළ මැනව. රාගයෙනුත් බොරු කියන්නෝ ඇත. ද්වේෂයෙනුත් බොරු කියන්නෝ ඇත. ගැහැණියකගේ බස් හෙණැ කුමාරයන් නොා මරව"යි ආරාධනා කළහ.

රජ නොා ගිවිසැ සියලු නුවර හඬව හඬවා අනිත් කෙණෙකුන් ලවා හෙළුවහොත් නුවර වැස්සෝ එක්වැ වැලකූ නම් නපුරැ යි නෙමේ ම ගොස් බොධිසත්ත්වයන් ගිස බිම බල්වා පය උඩු බලවා අල්වා හෙණැ මහාප්‍රපාතයෙහි හෙළුවාහ්‍ය. පඬිතයෙන් හෙන දෙ අතුරෙහි සවාමිදරුවෝ මාගේ අකුසල් බුත් මේ මුන්ගේ වරද නොා වෙයි. මට බොරු කී මැනියොත් ඒ බොරු ගිවිසැ මා හෙළන්නා වූ පියානොත් සුවපත් වෙත් වයි ඉහලොවින් පරලොවින් දුකඛ යෙක රස නොා විඳැ අනාථ යෙහි අමාමහ නිවන් දකිත්ව යි අකාරණයෙහි මට භය කළ අනඵ කළ මැනියන් පියානන් ඇතුළු වූ සියලු සත්ත්වයාහට මෙසේ වූ දුකෙක් නොා වේව යි මම ද මේ මෛත්‍රියෙහි අනුසසින් මෙමා නැසු මවුපිය දෙදෙනා ඇතුළුවූ සියලු සත්ත්වයා සංසාරසාගරයෙන් ගලවන පරිද්දෙන් බොධිපක්‍ෂාඞ්කාරූඪවැ සම්‍යක්‍සම්බුදුබව කොටැ භණිම්ව යි මෙසේ මෛත්‍රී කොටැ වදාළ සේක.

සවාමිදරුවන්ගේ මෛත්‍රී බලයෙන් ම පඬිතයෙහි අධිගෘහීත වූ දෙවතාවා "සවාමීනි! මා සිටියදී නොා බව නොා බව යි කියමින් උඩ නගා ලූ පුතක්ඛු දෙකිසිල්ලට අල්වා ලෙහි හොවා ගන්නා මවක සේ දෙකිසිල ලවා හෙණැ ලෙහි හොවා ගත. සවාමිදරුවෝ ජලක්‍රීඩා දවස් විල් තෙරැ සිටැ දියට පැන්න එකක්ඛු සේ පඬිතයෙන් ගිළිහී දෙවතාවන්ගේ ලෙහි පිහිටා ගත් සේක. මෙසේ ඍණයක් කළාවූ මෛත්‍රී බ්‍රහ්මයද පඬිතයෙන් බුහුවා වූ සවාමිදරුවන්ට වහල් වූ පරිදි ඇසූ සත් පුරුෂයන් විසින් සියලු සත්ත්වයන්ට දුඃඛයක් සමහ වූ කල්හි

ධර්මය සේ වූ පිහිටෙක් නැතැයි කියා දැනැ දුක්පත් කල්හිදු සුව පත් කල්හි දු අප්‍රමාද වැ මෛත්‍රී ආදි වූ ධර්මය මෙනෙහි කොටැ එම ධර්මයෙහි වහළින් සියලු ඉෂ්ටාර්ථ සාධන පිණිස **දහම් සරණ යා යුතු.**

මෙසේ මල්දමක් සේ බොධිසත්වයන් තමාගේ ලෙහි හොවා ගත්තා වූ දෙවතාවා පර්වතපාදයට වඩා ගෙණැ ගොස් එහි නාගභවනයෙහි නාගරාජයාගේ පණ ගබැ වඩා හිදුවා ලුව. නාගරාජතෙම බොධිත්වයන් වහන්සේ නාගභවනයට වඩා ගෙණැ ගොස් තමාගේ සම්පත්හි දෙකක් කොටැ බෙදා පියා බොධිසත්වයන්ගේ සුචරිතධර්මයට පූජා කොටැ එක් කොටසක් දිනා. සුධාම්දරුවෝ එහි එක් භවුරුද්දක් වැසැ ශක්‍ර සම්පත්හි සමාන වූ සම්පත්හි අනුභව කොටැ මනුෂ්‍ය පථයට යන්නා කැමැත්තෙම්. කියා නාගරාජයා මහාපුරුෂයා නෙනි! තොප කොතනට වඩා ගෙණැ යෙම්දැ''සි කී කල්හි මහණවන්නා කැමැත්තෙම්. හිමාලයට ගෙණැ යව සි වදාළ සෙයෙක.

නාගරාජතෙමේ යහපතැ සි කියා ගිවිසැ සුධාම්දරුවන් හිමාලයයට ගෙණැ ගොස් වඩා සිටුවා පැවිදිවන්නට සුදුසු වූ පිරිකර දී සවු ගෙණැ නාගභවනයට ගියේ. සුධාම්දරුවෝ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චාභිඥ අෂ්ටසමාපත්හි උපදවා බහන ක්‍රීඩායෙන් වසන සේක. එ සමයෙහි බාරණසි යෙහි වසන්නා වූ එක් වැද්දෙක් වනයෙහි ඇවිදිනේ බොධිසත්වයන්ගේ පර්ණශාලාවට ගොසින් බොධිසත්වයන් හැඳින "සුධාම්නි! නෙපි පදුමකුමාරයාව දැ සි කියා එසේ යැ සි වදාළ කල්හි ශ්‍රීපාද වැඳ කිප දවසක් එහි වැසැ බරණැස් නුවරට ගොසින් "සුධාම්නි! නුඹ වහන්සේ ගලින් හෙළාපි සුතනුවන් වහන්සේ හිමාලයෙහි තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ පඤ්චාභිඥ අෂ්ට සමාපත්හි උපදවා හිමාලයයෙහි වසන සෙයෙක. මම ඔබගේ ආශ්‍රම පථයෙහි කිප දවසක් වැසැ 1 ආම් සි කියා.

ඒ අසා රජ්ජුරුවෝ විසමයපත්වැ මහාබලකාය පිරිවරා පර්ණශාල සමීපයට ගොස් නුදුරු තැනෙක්හි කඳවුරු බැඳ අමාත්‍යයන් පිරිවරා පර්ණශාලාවට වැදැ කාෂ්ඨවන ප්‍රතිමාවක් සේ පර්ණශාලාචාරයෙහි වැඩැ හුන්නා වූ බොධිසත්වයන්

1 අසිම් සි.

වහන්සේ දැකැ ශ්‍රීපාදය වැඳැ එකත්පස්වැ හුන්හ. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් හා මිශ්‍රුරු කථාව කොටැ 1 ඵලාඵලයෙන් ආමන්ත්‍රණය කොටැ වැඩැ හුන් සෙයෙක.

ඉක්බිති රජ්ජුරුවෝ "පුත! මා තොප ශතපොරිසප්‍රපා තයෙහි හෙළාපුව. දිවි ලද්දේ කෙසේදැ යි කියා විචාළහ. සඬාම්දරුවෝ ඒ අසා තමන් වහන්සේ ධම්ඛලයෙන් ගැලවුනු පරිදි පිළිවෙළින් වදාළසේක. රජ්ජුරුවෝ ඒ අසා විස්මය පත්වැ රාජ්‍යයෙන් පැවැරුහ. බොධිසත්ත්වයෝ පඤ්චකාම යෙහි ආදීනව දක්වා "මහරජ! මා සේ වූ 2 ශුඛ සත්ත්වයන්හු ගේ ගුණ තොප නො දන්නේ මාගේ මැනියන් වහන්සේ නොසිතූ සිතක් කියා තොප සිතට නගා මට එබඳු අනර්ථයක් කෙලෙන් ගෘහසථවැ සිටි හෙයින් වේද? එහෙයින් මට ගෘහසථ සම්පත්තීන් ප්‍රයොජනයෙක් නැත. යාවජීවයෙන් ඛ්‍යාන ක්‍රීඩා කොටැ අන්තයෙහි බ්‍රහ්මලොකයෙහි ඉපද ප්‍රීති සුව අනුභව කෙරෙම් යි වදාරා තෙපි වූ කලී මතු දශරාජ ධම්මයට විරොධයක් නො කොටැ රාජ්‍යය කරව යි අවවාද දී වදාළ සේක.

රජ්ජුරුවෝ ද බොධිසත්ත්වයන්ගේ ශ්‍රීපාද වැඳැ හඬා වැලැපැ වැඳැ සමුගෙණැ රාජ්‍යයට යන්නෝ අතර මහදී ම මාගේ එබඳු වූ ප්‍රිය පුත්‍රයාන කෙණෙකුන් කෙරෙන් වියෝ වූයේ ඒ දුෂට සත්‍රිය වේදැ යි කියා අතර මග බිසවුන් හෙන්වා ගෙණැ ප්‍රපාතයෙහි හෙළා පියා තුවරට වැද බොධිසත්ත්ව යන්ගේ අවවාදයෙහි සිටැ දශරාජ ධම්මයෙන් රාජ්‍යය කොටැ කම් වූ පරිද්දෙන් හියේ. බොධිසත්ත්වයන් වහන්සේ ද අපරිහීන ධ්‍යානවැ බ්‍රහ්මලොක පරායන වූ සෙයෙක.

මෙසේ මාගේ සඬාම්දරුවන් පළිතයෙන් හුනුවන් දෙව නාවා 4 ලෙහි හොවා ගත්තේ ද, ඔවුන්ගේ ලෙහි තුබූ ධම් බලයෙන් මය. ඉක්බිති තමාගේ ලෙන් ගෙණැ ගොසින් නාග රාජයාගේ පණ ගැසියෙහි හිඳුවා හියේ ද ධම්මයෙහි බලයෙන් මය. නාගරාජයා නාග භවනයට ගෙණැ ගොසින් තමාගේ දිව්‍යසම්පත්තීන් දුන්නේද ධම්මයෙහි බලයෙන් ම ය. සඬාම් දරුවන් පඤ්චාභිඥ අෂටසමාපත්ති උපදවා අන්තයෙහි බ්‍රහ්ම

1 ඵලාඵලයෙන්. 2 ශුඛා සත්ත්වයන්හු.
3 ලවාගත්තේද.

ලොකපරායන වූයේ ද ධර්මයෙහි බලයෙන් ම ය. මෙසේ ධර්මයෙන් නම් සියලු සත්වයාහට සියලු උපද්‍රවයන් මිදෙන්නේ යැයි දත්තා වූ සත්පුරුෂයන් විසින් රාජ භය චොර භයාදිවූ සියලු උපද්‍රවයන් සංහිදුවා සියලු සම්පත්හි සාධාදෙන්නාවූ ධර්මරත්නය සරණ යෙමි යි **දහම් සරණ** යා යුතු.

තවද ධර්මය නමා රැක්කවුන් රක්ෂා කරණබව භගවන පිණිස මාගේ සවාමිදරු වූ බොධිසත්වයන් වහන්සේගේ ධර්ම බලයෙන් මරතු මැවූ සහලතුරු වලැ ඇත්බුමු පිසුම් පිපියා වූ **බදිරඛාර ජාතකයෙහි** කථාව ද 1 දක්වමි. හෙද ධර්මයෙහි සෙනහ ඇත්තා වූ සත්පුරුෂයන් විසින් සෙනහ ඇතිවැ ඇසිය යුතු. හේ කෙසේද? යත්:-

අතීතයෙහි බාරාණසියෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රජකරණ කල්හි බොධිසත්වයන් වහන්සේ බරණැස් නුවර සිටු කුලෙහි ඉපදී නානාප්‍රකාරවූ වයසට සුදුසු වූ අලඞ්කාරාදීන් දිව්‍ය කුමාරයන්හු සේ වැඩී සියලු ශිල්පයෙහි මස්තක ප්‍රාප්තවැ පියානන් වහන්සේගේ ඇවැමෙන් සිටුතැන් ලදින් නුවර 2 දෙර සතරැ හා නුවරැ මඩ්‍යයෙහි හා තමන් වහන්සේගේ ගෙදෙරෙහි හා සතැන්හි සදන්හලක් කරවා මහදන් දී වදරණසේක. පොහෝ දවස් පෙහෙවැ වදරණ සේක.

එක් දවසක් බොධිසත්වයන් වහන්සේට පෙරවරු වේලා **පිණිස** නානාග්‍ර රස ඖජන ලබා වූ කල්හි හිමාලයයෙහි වසන්නා වූ එක් පසේබුදු කෙණෙකුන් වහන්සේ සත්දවසකින් නිරොධ සමාපත්තියෙන් නැඟි වේලා සලකා අද බරණැස් නුවර සිටානන්ගේ ගෙට යම්හ යි නිශ්චය කොටැ නාලිය දුවටු දඬු වලඳු අනුනන් විලින් ශ්‍රී මුඛය සෝධා රත්ගල් තෙලෙක්හි සිටැ සිවුරු වැලඳැ හෙණැ සෘද්ධිමය වූ පාත්‍ර චීවර ධරා ආකාශයෙන් අවුත් බොධිසත්වයන්ගේ ගෙදෙරැ වැඩ සිටිසේක.

බොධිසත්වයන් වහන්සේ බුදුන් වහන්සේ දැකැ වදරා ආසනයෙන් නැඟි සිටැ අධික වූ ආදර දක්වා පාත්‍ර හෙණෙන් නට ඇලයෙහි සිටි මෙහෙකරුවෙකුට නිමන්ත්‍රණ කොටැ වදලා සේක. ඒ ඇසිල්ලෙහි ම පාපිෂ්ඨ වූ මාරතෙම ඊර්ෂ්‍යාවෙන් නැඟි නටනවා සිටැ සත්දවසක් නිරාහාර වූ මේ පසේබුදුහු අද

1 ඇර දක්වමි. 2 සතරමහ වහසල්හි හා.

අහරක් නොලද්දහු නම් මියෙති. මොහුනුත් නිරාහාර කොටැ මරමි. සිවානන්ටත් දැනානන්තරාය කෙරෙමි යි සිතා අවුත් සිවානන්ගේ ගෙදොරැ හා පසේබුදුන් වහන්සේ මඞ්ගයෙහි අවීචි මහානරකය ඉපිළ ගියාක් බදු වූ මහත් වූ සාලඟුරු වලක් මවා දුරැ සිටැ බැලූවන් ඇස් පිපිරැ පලායන පමණ රැසින් හා සියලු ආකාශයට නැඟෙන දුමින් හා භයඞ්කාර කොටැ දක්වා තෙමේ නොපෙණී ආකාශයෙහි සිටගත.

පාත්‍රය ගෙණෙන පිණ්ඩිය නිස්මුණු පුරුෂතෙම දොරැ ගිනිවළ දකිමින් ම මහහඬින් හඬා පසුබසැ හී බොඹියතළු යන්ට එපවත් දන්වීය. සඞ්ඝාමිදරුවෝ එපවත් අසා අනිකකු යවා වදුළ සෙයෙක. හෙද එසේ ම හඬා පසුබට. මෙසේ ක්‍රමයෙන් සියලු මිනිසුන් පසුබට කල්හි තමන් වහන්සේ මේ නියතයෙන් මාගේ දනට අනන්තරායක් කරන්නට සිතුවා වූ වඤ්චනීතිමාරයාගේ විකාරයෙකැයි සිතා වදුරා මේ මාරතෙම තමාගේ වෙෂයට වෙෂය දන්නා බවමුත් තමා සේ වූ මරුන් කෙළලඤ්ඡයක් විසිනුත් මාගේ දැනයට අන්තරායක් කොටැ ශක්ත නොහැකි බව නොදනී යි සිතා වදුරා මාගේ දැනාඛ්‍යාශය හා මරහුගේ ශකනිය හා දෙකින් වැඩියක් බලමි යි.

තමන් වහන්සේට ඉදිකළ බත අල්වා ගෙණැ ගෙන් නිස්මැ සහලඟුරු වලැ කෙළවරැ සිටැ ගෙණැ ආකාශය බලා භයඞ්කර වෙෂයෙන් සිටියා වූ මරහු දැකැ "කොල! මේ සහල ඟුරු වල මැවූයෙහි නෝ දැයි විචාරා මම යයි කී කල්හි ඔහුත් පිණ්ඩිය මැවීදැයි විචාරා නොපගේ දැනයට අන්තරාය කරණ පිණ්ඩිය හා පසේබුදුන් දිවිගන්නා පිණ්ඩිය යයි කී කල්හි "කොල නා සිතූ දෙක ම අද සිඳ විය නොදෙමි. නාගේ ශක්තිත් මාගේ ශක්තිත් දෙක බලා සිව"යි වදුරා පසේ බුදුන් වහන්සේට "සඞ්ඝාමිනි, අද මම මේ සහලඟුරු වල හිස බිම බල්වා පය උඩ බල්වා ලාහී ක්ෂණයෙහි මකුළු ඔතයක් සේ දැමියෙමි නමුදු මා සිතූ දනට අන්තරායක් නොකෙරෙමි. නුඹ වහන්සේ අහර පිළිගත මැනවැයි කියා අඟුරු වල මත්තට ශ්‍රීපාද දීක්කළ සේක.

ඒ ක්ෂණයෙහිම අසූරියනක් පමණ සහලඟුරු වල පලා ගෙණැ සත්ඵලු පිඟුමෙක් නැඟී ශ්‍රීපාදය පිළිගත. ශ්‍රීපාද පිඟුමිහි ඔබාලූ ක්ෂණයෙහි ම නැංගා වූ රේණු සඞ්ඝාමිදරුවන්ගේ

රන්වන් වූ ශ්‍රී ශරීරය තවරා ගෙණෑ නැගී මරහු මුහුණ ගැසී ඇස්වසා ගෙණෑ දුවන්නට පටන් ගත. බොධිසත්වයෝ පිසුම් මැඩැ ගෙණෑ ගොස් පසේ බුදුන්ා වහන්සේගේ පාත්‍ර යෙහි ආහාරය 1 ඇවිසි සේක. පසේ බුදුන් වහන්සේ අහර පිළිගෙණෑ අනුමෙවෙනී බණ වදාරා හිමාලයයට වැඩි සේක. මර ද තමාගේ මනොරථය පුරා ගත නොහී දෙම්නසට පැමිණෑ තමා වසන තැනට ම ගියේ.

මහාපුරුෂයානන් වහන්සේ ද එදවස් ප්‍රාප්ත වූ පළිට ද "සුවරිත ධම් නම් ඉහජාතියෙහි ම මෙසේ අර්ථ සිද්ධියට කාරණයයි ධම්දෙශනා කොටැ වදාරා ධම්යෙහි අනුසස් දක්වා ගෙට වැඩිසේක. මෙසේ ධම්ඡඨයන්ගේ ධම්යෙහි බලයෙන් මර දෙව් පුත්හු මැවූ සහලහුරු වළ බිදැ ගෙණෑ බොධිසත්වයන් ගේ ශ්‍රීපාදය පිළිගෙණෑ සත්බුමු පිසුම් නැගී පවත් ඇසූ සත් පුරුෂයන් විසින් ධම්ය සේ සත්වයාහට පිහිටයෙක් නැතැයි කියා නිශ්චය කොටැ ධම්ය මුල්කොටැ සියලු අර්ථසිද්ධිය කරණ පිණිස දහම් සරණ යා යුතු.

නවද කරුණාවට හෙතු ගෙය වූ දහමට ල ඇති වූ අසන් නවුන් කන්හි අමා නමන මධුර ධම් දෙශනා ඇති බැලූ බැලූ වන් ඇස් නිවන මනහර රූ ඇති සිතන්නන් සිත නිවන මන හර ගුණ ඇති දෙව් බඹුන් මුදුනෙහි කෙළනා පාපිසුම් ඇති ලොකසාම් වූ ශාක්‍යසිංහ වූ පරදුඃඛ දුඃඛිත වූ අනුශාසක වූ අවයවාදි වූ ධම්රාජ වූ සමන්තභද්‍ර වූ ෂඩභිඥ වූ ලඝට 2 සැන හැලිවූ සසරට ප්‍රතිපක්ෂ වූ නිවණට දෙර හළුවා වූ සඛගියට හිණිපෙනි පෙළ වූ අපායට හකුල් හෙළු වියත්කම්හි අගතැන් පත් වූ මුළු සක්වළ සකුන් දැල් වූ ඇස්හි පැනි යන්නා වූ සිතූ සිත්හි බැඳි යන්නා වූ 3 වැඩියක් ඇවිලයන්නා වූ ඇස ලූලූ දිශාවට සියලු සැපත් දී ලන්නා වූ ඒ සර්වාඥරුවානන් වහන්සේ විසින් අතීතකාලයෙහි දානමය පුණ්‍ය ක්‍රියායෙන් යුක්ත මේ විශ්වන්තරජාතක කථාව ගෙණ හැරැ දක්වම්. තමහට සිනැහෑති නිවන්පුර වදනා කැමැති සත්පුරුෂයන් විසින් සාව ධානවැ කන් නමා ඇසිය යුතු.

හේ කෙසේ ද? යත්:-

පෙර දඹදිවැ සිවි රට ජයසුරා නම් නුවරෙක් විය. එපුර සමපත් නැමැති මහඹුහු ද මැද බිඳෙන රළුපෙළ සේ නිරන්තර

1 ඇවුස්සූ සේක. 2 සිඳහගැනි වූ. 3 බැඳියක්.

රයෙන් දිවන්නා වූ පනන්නා වූ අශ්වයන්ගේ හෙෂාරවයෙන් එක කොලාහලය. එසේම නානා ප්‍රකාර වූ සච්ඡිකඹල අතුළා වූ නොයෙක් රථයෙහි චක්‍ර නාදයෙන් හා හසති නාදයෙන් හා ශඛ්ඛනාදයෙන් හා එකනාද ය. සන්තුෂ්ට වූ සත්‍රී පුරුෂයන්ගේ නානා ප්‍රකාර වූ මඩ්ගලයෙහි හා නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඩ්ගයෙහි ගසනලද 1 මිහිඟු බෙරෙහි ගම්භීර ධීර නාදයෙන් ශ්‍රවණ රමණීය ය. ප්‍රවීණ විණාකාරයන්ගේ විණා සඩ්රූපයෙන් සාඩම්බර ය.

නානා ප්‍රකාර වෙෂභූෂණයෙන් යුක්ත වූ සම්පත්තීන් හා අනූන වූ යෞවනයෙන් උද්‍යම වූ රූපයෙන් මනොහර වූ කුල යෙන් අනින්දිත වූ විද්‍යායෙන් පරිශුඛ ද සැරහුම්හි තන්වැසි වූ කෙළියෙහි විදග්ධ වූ අනතරඛ බාහිරඛ වූ කාරියෙහි ප්‍රමාණයක් නැත්තා වූ ගැණුන් හා පිරිමින් විසින් ගැවසිගත්තා වූ මෙසෙයින් සියලු සම්පත්තීන් ගැවසි ගත්තා වූ සමෘඩ්ධ ඇති ඒ ජයතුණ නුවරැ රජකරණ 2 සඳ නම් රජෙක් විය.

හෙතෙම මහාකුලීන හෙයින් හා දෛවය සත්‍යය යන මෙයින් හා අභිමත වූ කාඝ්‍ය සාධා ගැන්මෙහි දක්ෂ හෙයින් හා කිවා කරණ අමාත්‍යයන් ඇතිවැ දශරාජධර්මයෙන් කොප්‍ය නොවැ රජකරණ සමයෙහි ශක්‍රදෙවෙඳු තෙමේ තමාගේ පුරසත්‍රීන් කෙරෙන් එක් සත්‍රියක් කැඳවා කියන්නේ පෘථිවියෑ යම් වසතුයෙක් නිට ප්‍රිය ද ඒට දශවරයක් ගනැ යි කීය. සත්‍රිය කියන්නී දෙව්රජ! තට නමස්කාර වේවා යි. පොළොවෙහි සිරි මහාවෘක්ෂයක් පහකරණ මහ පවනක් සෙයින් තොපගේ මේ දිව්‍යපුරයෙන් මා පහකරවනු ද? මා විසින් කවර පවක් කරණ ලද්දේදැ යි කිව.

සක් දෙව්රජ කියන්නේ නිවිසින් පව්කරණ ලද්දේ නොවෙයි. මට අප්‍රිය නොවෙයි. තිගේ පින් ද ඇසු ද පිරිහුන. එහෙයින් කිමි. නී කෙරෙන් වියෝවීමෙක් වෙයි. මාගෙන් දශවරයක් ගනැයි කීය. සියලු දෙවියන්ට ප්‍රධාන වූ සක් දෙව් රජ මට වර දෙනු කැමැත්තෙ හි වී නම් තව වැඩෙක් වෙයි. තා කියන සිවි රට සඳමහරජුන්ගේ නෙවෙස්නෙහි වෙසෙම් වයි. එක් හැවිරිදි මුවපොල්ලන්ගේ දිගුනිල් පැයෙන් යුක්ත වූ ඇස් බඳු වූ තුන්වයස ම අතිනීල වූ ඇස් ඇති වෙම්ව යි. දෙව්

1 මියෙඟු, 2 සඤ්ජය.

දුනු මෙන් බැමලිය ඇති වෙම්ව යි. සුසහිදෙවි ය යි යන නමෙක් ඇති වේව යි. සියලු රජුන් විසින් පූජිත කරන්නා වූ යශස් කීර්තියින් පිරිවර ඇති වෙම්ව යි.

සියලු යාචකයන්ගේ අඛ්‍යාශයට යොග්‍ය වූ නොමසුරුවූ ඇස් ආදි ඉල් වූ කලැ නොදෙමි යි නොකියන උතුම් වූ වසතු දෙනු වූ ගුණෙන් යුකත වූ රූපයෙන් යසසින් ප්‍රිය වූ පුතකු ලැබෙම්ව යි. මා ගර්භනී වූ කලැ සම කොටැ ගා යෙදූ දුනුම්ටක් සෙයින් මාගේ මධ්‍යමාඛයය නුඋස් නොමාත් වේ ව යි. දෙව්රජ! මාගේ පයොධරයෝ දෙදෙන නොහී උඩුබලා සිටිත්ව යි. මා හිසැ නර නොනැගේව යි. මා වෙරැ දැලි නොනීව යි. රාජ අපරාධ කළවුන් වධකයකුත් වුව මරණින් ගළවම් යි සිතූ කලැ මාගේ සැමි ඔවුන් හරිත්ව යි. මයුරයන් කොස් ලිහිණියන් රැව් පිළිරැව් දෙනලද උතුම සත්‍රින් විසින් ගැවසි ගත් කුරුන් කුදුන් ලදරුවන් 1 සසලා බල තුන් අරක්කැමියන් හා කිලිගුන් විසින් වනන අවනනලද සත් රුවනින් වෙසතුරු වාර කවුළුයෙන් හෙබි රාජමන්දිරයෙහි පසඟතුරු රැවින් විදුනා ලද නොයෙක් මධුර පාන "කව! බොව! යන ජනයන් ඇති සදමහාරජුන්ගේ මෙනී ගුණෙන් සමෘඩ වූ සිවිරට සදමහරජුන්ට අගමෙහෙසුන් වෙම්ව"යි කියා මේ දශ වරය ගතු.

එසද සක්දෙව් රජ කියන්නේ සච්චාධිෂ්ඨයෙන් හොබනා වූ **සුසහිදෙවිය!** මා විසින් දුන්නා වූ දශවරය හෙණැ සදමහා රජුන්ගේ සමීපයෙහි වසව යි දෙව්රජ සමුදිනා. ඉක්බිති ඒ දිව්‍යසත්‍රී දෙව්ලොවින් මියැ අවුත් **මද්‍රරට** ක්ෂත්‍රියකුලෙහි උපන. හෝ නොමෝ සදමඩුලු වැනි මුහුණක් ඇත්තිය. දිගු පුළුල් නුවන් ඇත්ති ය. කොඳ කැකුළු වැනි දත් ඇත්ති ය. රන් වන් වූ ශරීර ඇත්ති ය. මනාව වට වූ පයොධර ඇත්ති ය. යනාදීන් වණිනා කරත් කරත් කියා ගෙවා 2 ගත නොහැකි රූ ඇත්ති ය. අලුත් වූ යෞවන ඇත්ති ය. මහත් වූ ඓශ්වර්‍ය ඇත්ති ය.

සාරාසඛ්‍ය කප් ලක්ෂයකින් මත්තේ බුදුන්ට මවු වෙමි **පතා** ආ මතු **මහාමායාදෙවි** වන එයින් හොස් **මාතෘදිව්‍යපුත්‍ර** වැ එහි 3 සිටැ නිවන් පුර වදනාවුන් ඔවුන්ගේ ගුණ කවුරැ කියා

---

1 කුඩාසලා. 2 නිමවා. 3 ඊසිවැ.

නිමවා ගණිද්ද? මෙසේ දෙවගනක මෙන් විය පැමිණෙ වසන කල්හි සඳමහරජානෝ බිසවුන්ගේ මහාරූප ශොභා අසා මහ පෙරහරින් ගෙන්වා තමාට අගමෙහෙසුන් කෙළේ. මෙසේ දෙදෙනා සුවයෙන් වැසෑ රජකරණ සමයෙහි පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනි වූ මතු බුදුවන මහතානෝ සියලු ලෝ වැසින් සසරින් මුදනු සදහා දෙව්ලොවින් සැවැ අවුත් සූසනිදෙවින් බඩැ පිළිසිඳැ ගත්හ. ඔවුන් පිළිසිඳ ගත් කෙණෙහි ම සැට දහසක් පමණ කුමාරවරු ඒ ඒ අමාත්‍යයන්ගේ ගෙහි පිළිසිඳ ගත්හ.

මහබෝසතානෝ මවුකුසැ පිළිසිඳ ගණුත් ම මවු බිසවුන්ට මේ නියා දෙලෙක් උපනි. දවස සලකුණයක් වියදම් කොවැ සදන්හලක් කරවා දිළිඳු යාචකයන්ට දන් දෙන දෙලෙක් උපන. සහවැ ද පොවා තමන් කරා ආ යාචකයාහට ඝිනි මැදව පැනැ ඇඟැමස් පළහා දන් දෙන්නා වූ සිවි රජවැ තමන් කරා ඇස් ඉල්වා ආ ශක්‍ර බ්‍රාහමණයාහට නිලුපුල් මල් සඟළක් බදු වූ තමන්ගේ දැස ලෝවැසියන් හඬව හඬවා සිය අතින් උපුටා දන් දෙන්නා වූ මහතානන් දශපාරමිතාවන් මුදුන්පත්වැ සිටැ මවුකුසැ පිළිසිඳැ ගත්තාවුන් මී නියා දෙලෙක් උපදිනි යනු කවර ආශ්චර්‍යයෙක් ද?

ඒ හිමියානන් මවුකුසැ පිළිසිඳ ගත් දවස්පටන් දඹදිවැ නොයෙක් රජයෙහි රජදරුවන් එවන සත්රුවන්1 ආදි නොයෙක් පඬුරෙන් අතුරු නැතිවැ සදමහරජානන් බිසවුන්ට උපන් දෙළු අසා නුවර සදන්හල් කරවා බිසවුන්ට උපන් දෙළු නිවා යාචකයන් සිත් නිවා දන් දෙන කල්හි ක්‍රමයෙන් දසමස් පිරුණු සඳ බිසවුන් නුවර පැදකුණු කරණ දෙලෙක් උපන. ඒ සඳමහරජානෝ එ පවත් අසා ඇමැත්තන් කැඳවා නුවර සදවන්නාහු කළු වැලි පියා සුදුවැල්ලෙන් තවරා දෙරැ දෙරැ කෙහෙල් තොරණින් රන් තොරණින් රිදී තොරණින් සත්රුවන් තොරණින් පිළි තොරණින් සදා කේල් නැඹිලි ධ්වජ පතාකායෙන් සදා නැන නැන පුන්කලස් තිරිකුඩම්2 තබා වට වටැ පහන් නංවා මෙසේ සියලු නුවර දෙවි නුවරක් සෙයින් සදා මනහර කොටැ රථයක් සාදවා බිසවුන් එහි හිඳුවා මහත් ශ්‍රීන් මහත් වූ පෙරහරෙන් රාජවීථියට බවහ.

1 රත්රුවන්. 2 නිරුකුඩම්,

එවිට ම රන් කරඹු රිදි කරඹු රන් පැන රිදි පැන ගෙණැ සදුට පළමුව ගමන්ගත් තරුකැලසේ දස මෙහෙතැන් පිරිවරා ගත්හ. එසේ ම දෙපසැ සිටැ සලන සුදු චාමර රන්තල් වැට රිදි තල්වැටින් වසන්නාසා සියවෙසින් ආහ සි සිතම්. සරසුන් විසින් ගත් සුදු සේසතින් එදා ඒ පුරය ජත්‍රමයවැ ගියේ සැ සි සිතම්. කිරිමුහුදු ඔද වැඩි දිවන රළ සේ එපුර වේගි දුවන අස් පතරින් හා පවීනොපම වූ හසත්‍යාලඞ්කාරයෙන් සැදුනු ඇත් කැලයෙන් හා රන් රිදී මය වූ පස්වණස් පැහැයෙන් හා දිලියෙන ධජ පතාකායෙන් විසිතුරුවූ ඇතුන් අසුන් ගොන් ආදින් අදනා මනහර රථ පෙළින් හා සත්රුවන්මය පිල් කඩපෙළින් හා ධජ පතාකා හා රන් රිදී කැටපත් පෙළින් හා රන්රුවන් කලස් පෙළින් හා එනුවර බලනුවන්ට අමෘතාඝාතයක් වැන්නැ සි සිතම්.

ඒ සත්රුවන් මඩුයෙහි සිටැ නවන මනහර ශොවුන් රූපත් සත්‍රින් නට නවා නගන අතින් දිව්‍යශ්‍රීන් කැඳවනි සි සිතම්. රැකවල් බලමින් ඒ ඒ අත දිවන කුරු කුදු පෙළින් හා සහවාසි නපුංසකයන් විසින් පිරිවරණ ලද මෙහෙ තැනුන් විසින් මනහර ය. බලතුන් ගසන බලත් හඬින් හා ඒ ඒ තැන මඩුලු බැඳැ ගසන හෙරි තූර්‍යනාදයෙන් හා අසුන්ගේ හෙෂාරවයෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා එකනිඝෝෂ ය. මෙසේ මහත් පෙරහරින් බිසවුන් නුවර පැදකුණු කෙරෙමින් **ව්‍යාපාර විප්‍රියමවන්** සඳ බිසවුන්ට විළි පහරින්නට පටන් ගත.

එ පවත් ඇසූ **සඳමහරජානන්** විසින් එ කෙණෙහි ම විසිතුරු මඩුවක් කරවා වටතිර බඳවා රැකවල් ලැබූ කල්හි ලොවට ඇසක් බඳු වූ යාචකයන්ට ධනරාශියක් බඳු වූ පිරූ පාරමිතා ඇති එ හිමියානෝ මවු කුසින් උපදමින් ම මැනියන්ට "අම්ම! දන් දෙන්නට සුදුසු දෙයෙක් ඇද්ද"සි කියා අත් දික් කළහ. මෙසේ ඒ භූවනෙක ශෙඛර වූ **වෙසතුරු කුමාරයන්** කී තෙපුල් කවර නම් සතෙකුගේ කණට අමා නොවේ ද? කවර නම් සතෙක් සතුටු නොවෙද් ද? කාට නම් අප්‍රිය වෙද් ද?

එ බස් ඇසූ මැනියෝ දහසින් බැඳි පියල්ලක් මහතානන් දික් කළ අතැ නබාලූහ. එදහස ගෙණැ කිරිමවුන්ට දන්

දුන්හ. ඒ ආශ්චර්‍ය්‍ය පුරුෂ වූ මහානාන් උපන්දෑ ම ඔවුන් ගේ කුශල බලයෙන් කෙලාසකූටය සේ රිදී පර්වතයක් සේ ද ඉතා ධවල වූ 1 **පණ්ඩර** නම් මඟුලැත් පොව්වකු දෙව්යෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්හල්හි ලා ගියහ. බොධිසත්ව යන්ගේ පිය මහරජානෝ පුතනුවන්ට නම් තබන්නා වූ චතු වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා ව්‍යාපාරවිපියෙහි උපන් හෙයින් **වෙස්සන්තර කුමාරයෝයැ** යි නම් තබා මෙබදු උත්තම පුරුෂලක්ෂණ ඉපදී ම නො වන්නේ ය. ඇමැත්තන් කැඳවා මුළුනුවර පරීක්ෂා කරවා 2 එකදෑ උපන් කුමාරයන් සැවදහසක් දෙනා ගෙන්වා පුතනුවන්ට පිරිවර කොටැ ලක්ෂණ සම්පන්නා කිරිමවුන් තෝරා ගෙණැ උන්ට මහාවිභව තබා දුන්හ.

මෙසේ සැටදහසක් කුමරුවන් පිරිවරා කෙළනා බෝසතා නන් නකත්තරු මැද බබලන පුන්සඳහු මෙන් කුමාරාභරණයෙන් සැදී රාජ්‍යශ්‍රීන් දිලිහි දිලිහී වඩනා කල්හි තමන් එක් හැවිරිදි වයස තමන් පැළැන්දෑ වූ ලක්ෂයක් වටනා ආභරණ කිරිමවුන්ට ම දන් දුන්හ. පියමහරජානෝ ඒ පළඳනා දන් දුන් බව අසා සතුටුවැ මහ ඇඟි පළඳනා කරවා පළඳවති. බොධිසත්වයෝ තමන් පැළඳ වූ පළඳනා අවුත් දන්ගන්නා වූ සිඟන්නන් නැත්තෙන් නවවරෙක කිරිමවුන්ට ම දන් දුන්හ. තුමූ වයසින් ලද බොලඳ එක් හැවිරිද්දෙය. තව ම වුවෙන් නො හළ කිරි සුවදය.

මේ නියා දැනාඩ්‍යතයෙන් මුළුලෝව කවුරු කෙරෙද් ද? මෙසේ වූ අද්භූතයක් දුටු විරුවෝ කවුරු ඇද් ද? මෙ වැනි ආශ්චර්‍යයක් ඇසූ විරුවෝ ඇද්ද? මෙසේ විස්මය වූ දැනසම්භාර ඇති ඒ මහතාන් හා එක් වෙම්හ යි. ඒ උතුමා උපන් උපන් තන්හි ම උපදුමෝව යි මෙබදු අදහසෙක් සියලු සත්වයන්ට වාසනා වේවා.

මෙසේ දන් කෙළි ම කෙළි කොටැ දන් දී අට හැවිරිදි වයස් වූ කලැ **වෙසතුරු කුමාරයෝ** වෙසතුරු වූ ප්‍රාසාදයෙහි * ශ්‍රී යහන් මසුනකයෙහි පළක් බැඳැ වැඩහිඳැ සිතන්නාහු:— "මම ඉපැදුණු දැන ක්‍රීඩායෙහි සුව නො විඳැ දවස් ගණනෙක්

1 පණ්ඩර ඇ. 2 උපන්දෑ. * (පහනට දවස.)

නිකම්ම ගියේ. ඒ දැන් අට හවුරුද්දෙක. නවත් දවස් මෙසේ ම යේද්දෝ හෝදි සිත්නන්නාහු මෙසේ මහ වතුරක් මෙන් මා දෙන රන් රිදී ආදී දැන ප්‍රවාහය කැටකැබිලිති සේ මා සිත් නොපිණවති. ඉදින් යාචකයෝ ඇවිත් සිටැ "මහරජ! නාගේ ඇස් උදුරා දෙව යි කිවු නම් දිඟු පුළුල් වූ නිල් වූ නුවන් දෙක තල් ලොදු දෙකක් සේ උදුරා අත තබා ලම්. ඉදින් මාගේ හෘදය මාංසය ඉල් වූ නම් තිඛුණු ඝසත්‍රයෙන් මාගේ ලය පලා පියා හදවත දන් දෙම්. එසේ ම යමෙක් ලේ ඉල් වී නම් තෙලි ඝත්ති ලා පෙළා පියා මාගේ ශරීරයෙහි ලේ දෙම්හ. යමෙක් මස් ඉල් වී නම් මඟුල් කඩුවෙන් ලිය ලියා පැස්පුරා මස් දන් දෙම්මය. යමෙක් අවුත් සිටැ මට ගැනි මෙහෙ කරයි කී නම් මුළුරට මා මුන්ට ගැනිබව දනුව යි අස්වා කියා ගැනි වෙම්ම ය"යි මෙසේ සිතත් සිතත් දෙලක්ෂ සතළිස් දහසක් ඝනකඩ මහ බොල් පොළොව අනෙක ගජ්නා කෙරෙමින් අත් බමරක් සේ සතුටුවැ නටන්නට වන.

එක් ලක්ෂ අට සැවදහසක් යොදුන් උස ඇති මහාමෙරු පර්වතය ද ඒ මහතානන්ගේ දැන චෙතනා බලයෙන් තමාගේ කුළු අත් ඔසවා වඳිමින් නටන්නට වන. ඒ මහතානන්ගේ මහත් වූ අධ්‍යාශය බලව යි කියන්නාක්හු මෙන් සප්තකුලපර්වතයෝ කුල්මතින් නටමින් ඔවුනොවුන් ඇඟැ ගැසෙන්නට වන්හ. සුවාසූ දහසක් යොදුන් ගැඹුරු ඇති මහමුහුද තමාගේ රළ නැමැති අතින් සත් රුවන් ඉසැ ඉසැ මහත් සොම්නසින් නටන්නියක මෙන් නටන්නට වන. මේ ආශ්චර්‍යය දුටු වා වූ මිනිසුන් පටන් ගෙණැ මහබඹුන් දක්වා එක පැහැරී රඟ මඬලක් මෙන් කෙළිනට වන්හ.

මෙසේ මහපොළොව ගුගුරුවා දන් දෙන බෝසතානෝ සඳුන් රුක අතුඅගැ ලෙලෙන කළුවැල් ලියක් සේ තමන් රූප ශ්‍රී ප්‍රශුලතායෙන් හොබවමින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණැ සූසැට ශිල්පයෙහි හා අෂ්ටා දශ විද්‍යාස්ථානයෙහි නිපුණ වූහ. ඒ සමයෙහි පියමහරජානෝ පුතනුවන්ගේ රූපශ්‍රී යශස් කීර්ති බලා පියා ප්‍රිති සාගරයාගේ උත්පාතික වෙශයෙන් මාගේ පුතනුවන්ගේ 1 රාජ්‍ය ශ්‍රී මා ඇස් හමුයෙහි ම කොටැ මාගේ නුවන් දුරිද්‍රය හළ මැනවැයි සිතා චෙතිය රට

1 රාජවිභූම.

රජ්ජුරුවන්ගේ දූ වූ සියලු සත්‍රීන්ගේ රූප එකතැනට කැටි කොටැ මවාලූ රූපයක් බඳුවූ සියලු රූපශ්‍රියෙන් දිලියෙන මදුරු දෙවින් ගෙන්වා මඟුල් කොටැ මහබෝසතානන්ට අග මෙහෙසුන් කොටැ පාවාදී වොටුනු පළඳවා රාජ්‍යය පාවා දුන්හ.

පිය මහරජානෝ පුතනුවන්ගේ රාජ්‍යශ්‍රී බල බලා සතුටුවැ වසන්නාහ. මහා බොධිසත්වයෝ ද සතර සඞ්ග්‍රහ වතින් දශරාජධම්මයෙන් වියෝ නොවැ ධම්මයෙන් රාජ්‍යය කොටැ සත තයෙන් මවුපිය දෙදෙනා වැදැ පුදු උපස්ථාන කොටැ සියලු යාචකයන්ට සඳන්හල් කරවා අනෙක ප්‍රකාරයෙන් දන් දී රාජ්‍යශ්‍රියෙන් දිලියෙමින් වසන්නාහු එසමයෙහි පුතනුකෙණෙකුන් හා දියනි කෙණෙකුන් ලදින් චතුර්වේදයෙහි නිපුණ වූ බමුණන් ගෙන්වා ගෙණැ පුතනුවන්ට **ජාලිය කුමාරයෝ** යයිද දියනියන්ට **කණ්හජිනාවෝ** යයි ද නම් තබා මෙසේ සුවයෙන් රජකරණ කල්හි:-

චෙතියරට රජුන් හා **ජයතුරු නුවර** රජුන් හා රටවැස්සන් හා මෙසේ සතුටුවැ දෙනුවර වැස්සන් හා නො වෙනස්වැ වසන සමයෙහි **කළිඟුරට** වැසි නැතිවැ **දුර්භික්ෂ භය** විය. **කළිඟු රට රජ්ජුරුවෝ** තමන් ඇමැත්තන් කැඳවා කියන්නාහු "වැසි නැති, කුමක් කරමෝදැ"යි කිහ. ඇමැත්තෝ කියන්නෝ කැමැති දෙයක් දන් දෙන්නෝ **වෙසඟනතර රජ්ජුරුවෝය**. උන්ගේ දෙවියන් විසින් දුන් සවීශෙවත මය වූ, **පණ්ඩර** නම් වැසි වස්වන මහානුභාව ඇති හැලි ඇතෙක් ඇත. ඔහු ගෙන්වුවහොත් අපගේ රට වැසි වැසැ දුර්භික්ෂභය සංහිඳෙයි කිහ.

එසඳ රජ්ජුරුවෝ වෙදත්‍රයයෙහි නිපුණ බමුණන් අටදෙනෙකු ගෙන්වා ගෙණැ කියන්නාහු:-"බමුණෙනි! **වෙසඟනතර** රජ්ජුරුවන්ගේ වැසිවස්වන හැලි ඇතෙක් ඇත. ඒ ඇතු ඉල්වා ගෙණැ එව"යි කිහ. බමුණෝ ද රජු අතින් සවුගෙණැ නොබොහෝ දවසින් ගොස් **සිවිරටට** වන්හ. බුඩාඬකුරවූ **ඒ වෙසතුරු මහරජානෝ** එදවස් පොහෝදැ දන් දෙන්නට සතරදෙරැ සතර දන්හල් විචාරන්නට යන්නාහු සුවද පැණින් නහා ඉස් සොඩා සළුපෙරලා සළුහැදැ ගද විලවුන්ගෙන් සුසැට ආභරණයෙන් සැදී දෙවෙනි විලාසයෙන් සිටැ ඇතු ගෙණෙයි කිහ.

ඇතු ගෙණෙන්නාහු සතරපය සතර ලක්ෂයක් වටනා පළඳනායෙන් සද, යට බඩ ලක්ෂයත් වටනා පලසකින් වසා පිට රන්දැල් මුතුදැල් රිදිදැල් කිකිණිදැල් මිණි රස් පෙළින් හා මේ ආදි සත්රුවනින් ඇතු සද එළවූහ. රන්හිණින් 1 ඇත් කඳට පැනැ නැඟි දළපුඩු සේසත් හිසට කරවා සත්රුවන් සෙමර ඝලවා රජ සුවරජ මහ ඇමැති මඩුලු පිරිවරා සිවුරඟ සෙනඟ පිරිවරා **ශක්‍රදෙවෙන්ද්‍රයා** සෙයින් පුවිදිඟාවෙහි දන්හලට යන රජ්ජුරුවන් බමුණෝ දැකැ දනට රැස් වූ සිහන්නන් බොහෝ දෙනා සෙයින් දකිනට ගහටය සි බමුණෝ අවදෙන දකුණු දිගැ දන්හලට යන මහැ උස්ගොඩෙක සිටියහ.

රජ දකුණු දිගැ වාසල් සම්පයෙහි සිටි බමුණන් අවදෙනා දැකැ උන් සිටි දිඟාවට ඇතු නැමූහ. බමුණෝ අට දෙන අත් නඟා **"ජයතුභවං මහාරාජ! වෙස්සන්තර"**!! යනාදින් ආශීර්ද කළහ. **වෙසතුරු** මහරජතෙම මේ බමුණෝ මද දෙයක් ඉල් වති සි ඇතු ඇසනා කොටැ මෙහෙයා සිටැ බමුණෙනි! නොපි කැමැති දනක් ගන්ව"සි කිහ. ඉක්බිති බමුණෝ !කියන්නාහු සියලු සතුබයන්ට මවු පියන් බදු වූ රජ්ජුරුවෙනි! තෙල ඇතු අපට දන් දෙව"සි කිහ. එබස් අසා රජ තෙම මේ බමුණෝ මා-ශරීරයෙන් භාගයක් නො ඉල්වූහ. ඇස් උපුටා දෙව සි නො කිහ. ඇඟින් මස්කපා දෙව සි නො කියා ඇතු ඉල්වති සි මදක් දෙමිනස්වැ:-

"යහපත! නොප කැමැති ඇතු නොපට දන් දෙමි"සි සතු වුවැ ඇතු සදන්නා වූ ලක්ෂයක් වටනා රන්පලසකින් පිට සද ලක්ෂයක් වටනා මුතුදැලය, ලක්ෂයක් වටනා මිණිරස්සුදම් පෙළ ය, ලක්ෂයක් වටනා රන්දැල ය, ලක්ෂයක් වටනා මැණික් දැල ය ඇලයෙහි බහාලන දෙලක්ෂ වටනා දෙමිණි ය, ලක්ෂයක් වටනා කණිහාරණය ය, වටංසක නම් තුන්ලක්ෂ වටනා රන්මල් තුණ ය, කුඹසැදූ ආභරණ ලක්ෂයෙක, සුණඹයේ යට සොවැත්ත ලක්ෂයක් වටනේය. දෙදළ සැදූ ආභරණ දෙලක්ෂයෙක. සතර පය පළඳනා සතර ලක්ෂයෙක. වාලධිය සැදූ පළඳනා ලක්ෂයෙක. යටබඩ සැදූ පලස ලක්ෂයෙක. හෙළෙහි මුතුදැල් ලක්ෂයෙක. කුඹ එබූ මැණික හා මුදුනේ මැණික හා කණඩයේ මැණික හා පිට මැණික හා මේ සතර මැණික අනඝීය. ඇස් අකුස්ස දෙක අනඝීය.

---

1 ඇත්කුඹට.

මෙසේ වෙසතුරු කොටැ ඇතු සඳ, තවද ඇතු බත්කවන කටාරය ලක්‍ෂයක් වටනේය. ඇතු පිටට නැගෙන රන්හිණ ලක්‍ෂයක් වටනේය. මේ ආදි අනඤ්ඤ පළදනා හැරැ සුවිසිලක්‍ෂයක් පළදනායෙන් ඇතු සඳ, ඇත්වෙදුන් ඇත්රැවියන් 1 ඇතු එවැ පන්සියයක් කුලවාසින්ද ඇතු නාවන කවන පොවන ඕහට සියලු කළමනා මෙහෙයට පරිවාරජනයන් දී බමුණන්ට ප්‍රසාද දී සිත් ගෙණැ රුවන් කෙණ්ඩියෙන් අතැ පැන් එව ඇතු බමුණන්ට දන් දුන්හ.

ඒ මහනානන් ඇතු දන් දෙත් ම මහමෙර නැම් නම සකාර කෙළේ. මහපොළොව සතුටුවැ ගුගුළේ. ඉක්බිති බමුණෝ ඇතු නැඟි රාජ වීථියට බටහ. නගරවාසිහු කැපිවැ කියන්නාහු තෙපි නො බා අපගේ දිව්‍ය ඇතු ගෙණැ යාහු සි කීහ. එබස් අසා බමුණෝ කියන්නාහු **වෙස්සන්තර රජ්ජුරු වන්**ගේ මේ ඇතු දන් ලදුම්හ; තොප කෙසේ වළකුමෝද්ද"සි තුඩවැඩ බැණැ ඇතු නැඟි ගෙණැ ගියහ.

එසද රජ බමුණු වෙළඳ ගොවි ආදිහු හා අධිකාර සෙනෙවිරත් ඇපා මාපා මහලැන යන පඤ්ච ප්‍රධාන මහාමණ්ඩලිකයෝ ද මුළු මුළුවැ ගෙණැ රැස්වැ තනනාමින්, පුපුරමින්, දත් කමින්, මුළු නුවර අලළා ගොස් කිපි **වෙස්සන්තර** මහරජානන්ගේ පියානන් **සඤ්ඤමහරජානන්** කරා ගොස් හඬාපි "සාමිනි! අප දන්වන්නක් ඇසුව මැනව. සුවිසි ලක්‍ෂයක් වටනා ආභරණයෙන් සැදුනාවූ සියලු ඇත් ලකුණෙන් බබලන්නාවූ සළොඬඟ ඛවල වූ වැසි වස්වාපියන පමණ මහත් වූ අනුභාව ඇති දෙවියන් විසින් දුන්නා වූ මනුෂ්‍ය ලොකඝට දුලීහ වූ හසති ශ්‍රියෙන් දිලිඹෙන ඇත්රුවන තොප පුතනුවෝ බමුණන්ට දන් දුන්නෝ වේ ද?

"සාමිනි! තමන් සැදුහැවැ 2 සැරහී දන් දෙත් තෙසු ඇතුන් දිපිය නො හැකි ද? අසුන් දිය නො හැකිද? නොයෙක් රන් රුවන් දිය නො හැකි ද? මිනිසා ලොවට වැඩ කරු වූ මේ ඇතු දන් දුන්නේ කුමකට ද? රටින් යන වෙළඳුන් සේ අපරීක්‍ෂා කෙරෙති. දැහැමින් සෙමින් රාජ්‍යය කොටැ අප රක්‍ෂා කෙරෙහි සිතුනියා යහපත් නියාඇ"සි කියන්නා වූ

---

1 රැහැයන්. 2 කනකා

නගරවාසින් දැකැ සදමහරජ නගරවාසින්ගේ රැහැණි බල වත; කළමනා කිම්දෝ හෝ"යි සිතා බාලයන් විසින් නොකළමනා දෑ කළවුන්ට නොප කී දඬුවමක් කරන්නෙම් වෙමි දැ"යි කීහ.

එසඳ නගරවාසිනු සංගිඳි කියන්නාහු **වෙස්සන්තර** රජ්ජුරුවන් දගගෙයි ලත් නොපිළිවන. දිවිගණුත් නොපිළිවන. අපගේ රට හිදැ අප නැසූ නැනැත්තන් රටින් දුරුකොටැ වංකගිරි පර්වතයට යවනු මැනව. අද ම යැවිව මැනවැ"යි කීහ. **සඳමහරජානෝ** සිතන්නාහු දැන් ශ්‍රුත්ට මිහිරිකොටැ කියා යවාපියා පසුව දුටුවක් දකුම්හ යි සිතා මහජනයන්ට කියන්නාහු "අද දවසට රඳ අඹුදරුවන්ට සමුදී සෙට යන පරිද්දෙන් සිතව"යි කීහ. එ බස් ඇසූ නගරවාසිනු වැදැ සඬාම්නි! "නුඹ වහන්සේට හැඟුනක් කළ මැනවැ"යි කීහ.

එසඳ **සඳමහරජ්ජුරුවෝ** මහාශොකීවැ නගරවාසින් කිපුණු බැව් මපුතුන්ට කියව යි 1 **ඣානා** නම් ඇමැත්තා යවූහ. ඇමැති ගොස් ඒ වෙසතුරු **මහරජානන්** වහන්සේ දිව්‍යවිමානයක් මෙන් සැදුනු ප්‍රාසාදයෙහි රාජ කුමාරයන් පිරිවරා ඇතු දන් දුන් සතුටු සොම්නසින් පිණ පිණ ශරත් කාලයෙක්හි නැඟි පූර්ණ චන්ද්‍රමණ්ඩලයක් සෙයින් වැඩහුන් **වෙසතුරු** හිමියානන් දැකැ ඝිය ඇමැති වැඳැ පියරජ්ජුරුවන් කියා එවූ හසුන් හඝ ඇතිවැ නොකිය හී ශ්‍රීපාද වැඳැ නැඟි නොසිටියේය. බොධිසත්ත්වයෝ අත අල්වා නහා සිටුවා කියහ යි වදාළ සේක.

ඇමැති කියන්නේ "සඬාම්නි! ඇතු දන් දුන්හ යි නගරවාසිහු කිපි බොහෝ දෙන රැස්වැ නුඹවහන්සේගේ පිය මහරජානන් වහන්සේ වෙත පැමිණැ නුඹවහන්සේ මේ නුවරින් සෙට **වංකගිරි** පර්වතයට යවන්ට **සම්මත** කළහ යි කීහ. ඇමැත්තාගේ බස් අසා **වෙසතුරු මහරජානෝ** සි පියා වදාරන්නාහු මා අතින් ඇස් ඉල්වා එත් මනාමය. ඌස් ඉල්වා එත් මනාමය. ලේ ඉල්වා එත් මනාමය. ඇඟින් අඬියක් ඉල්වුව මනාමය; සත්කඩක් කොට කපත් මනාමය. මාගේ ශරීරය වෙන් වෙන් කොටැ දෙම් නම් බාහිර වසනු වූ ඇතු දන් දුන්හ යි මට වරද කොටැ සිව්රට වාසිහු රැහිණි වූ නම් ඒ මට මැනවැ යි සිතා මාගේ දෙන දන් නොනවත්ම්. දුක් බොහෝ වූ ගළවන්නට දුලීහ වූ සංසාරයෙහි උපන්හට දුන

1 පත්තාක.

ඵල සුව නැත් නම් අනික් තෙසු සුවයෙක් නම් නැත. පින් නො කටහැක්කැයි නගරවාසිහු කිපුනහු නම් වනවාසයට යන බව ඉතා මැනව. නගරවාසින් කීවා කරම්හ. උන් කීවා මුදුන්පත්වේව යි ඔහු බොහෝ කලක් ජීවත් වෙත්ව යි. ඇසිල්ලකුත් මා පිණිස සියලු ජනයා කලකිරීමෙක් නො වේව"යි වදාරා;-

"**ඛණතා** නම් **අමාතා්‍ය** ඝ! බල එකෙක් මපියානන් වහන්සේට කියම්. නුවරවාසින් කැමැත්තොත් සෙට **සප්ත සතසහ මහදන්** දී පියා අනික්දා වලට යනු කැමැත්තෙමි. එපවත් මපියානන් වහන්සේට කියව"යි වදාරා **ඛණතා** නම් ඇමැත්තා යවා තමන් අස සිටි සෙනෙවිරදුන් කැඳවා දස් දැස්සන් ඇතුන් අසුන් රථ සත්සියයක් සත්සියයක් බැගින් කැපිකරව යි නියොග කොවැ හුනස්නෙන් නැඟි සිංහවිලාසයෙන් මද්දදෙවීන්ගේ බිසෝ ගෙට ගොස් ශ්‍රී යහන් මසතකයෙහි වැඩහිඳ බිසවුන් කැඳවත් ම අවුත් ශ්‍රිපාද වැඳ නැඟි සිටැ රන්ලියක් සේ සිටි මද්දදෙවීන්ට කියන්නාහු "බිසවුනි, තොපගේ දෙමවුපියන් ගෙන් ගෙණ නොයෙක් රන්රුවන් රක්ෂාකොට තබව යි කිහ.

බිසවු කියන්නාහු "සැමිනි! නුඹවහන්සේ පෙරැ දන් දෙන්නට කියත් මුත් නහා තබන්නට නො කියන සේක ද්න් කුමක් සදහා මෙසේ වදාළදැ යි සැක කොටැ පිළිවිසුයෙන් **වෙසසනතර** රජ්ජුරුවෝ! කියන්නාහු සොදුර! නහා නිවිම නම් දන් දිමය, දන් නො දෙන්නාහු විලිකුන් පලයෙහි බැඳගත් දිමිනිල්ලක් වැන්නහ. තුමූ නොදකිති. අනුන් නොදකා දෙති. එසේ වූයේ පරලොවට වසනු නහා නොතබන්නාහු නම් වෙයි එසේ හෙයින් නහා තබයි කීයේ නම් දන්දෙන සදහාය. මහා තපස්වීන් අනාථයන් නැමැති කෙත්වතැ ඛන නැමැති බිජු වට වපුට බොහෝ රැස්කරන්නට කීයෙමි වෙමිදැයි කිහ.

බිසවු කියන්නාහු නුඹවහන්සේ මා හැම වේලෙහිම දන් දීමෙහි සිත් ඇති බව දනුත් මට අමුතුව මෙබස් කියන්නට කාරණ කිම්දැ යි කිහ. එසද වෙසතුරු මහරජානෝ සිත ඇත්ත කියන්නාහු "සොදුර! අපගේ ඇතු අප දන්දුන්හ යි නගරවාසිහු කිපී අප මේ රට නො හිදැ දී **වංකගිරි වනයට** යන්නව සම්මත කළෝල. එසේ හෙයින් ඇපි වනයට යම්හ. අප වලට ගියහ යි දැළ සෝ දුකින් නො හැවී සුවසේ ජීවත්වැ

1 දරුවන් දෙබිගින්නන් කෙරෙහි බියපත්වැ සොඳුර තොප දිවි රැක්මෙහි සිහිඇතිව්ව. අප ගිය කලැ තොප රක්ෂා කරණ සැමි කෙණෙකුන් ඇත. උන්ට කීකරුවැ අත් පා මෙහෙ කරව. තව ද දරුවන් කෙරෙහි බියපත්ව"යි කීහ.

කාමරතියට **අනඛකයා** බදුවූ ශ්‍රීයට විඝණුහු බදුවූ සරසැ නියට **බ්‍රහ්මයා** බදුවූ රූපශ්‍රීන් දිලියෙන **මද්‍රිදෙවින්ම්** සැමි වූ ඒ වෙසතුරු රජුන් මෙසේ කියත් ම බිසවුන් ලෙහි පැනැ නැඟි ශොකයින්නෙන් තැවෙමින් කඳුළු ඉසැ ඉසැ මද සුලඟින් වැනෙන්නා වූ රන් ලියක් සෙයින් වැනෙමින් ඉකිබිඳුම්න් ලය අල්වා ගෙණැ මේ නම් කුමන බසෙක්ද යි සැමිදරුවානෙනි, මෙසේ නො ඇසිය යුත්තක් මා:කණත් හිනිද? නුඹ වහන්සේ හා වියෝවැ වන ජීවත්වීමට වඩා නුඹ හා කැටිවැ මියන මර ම උත්තමය. මේ නියා රාජ්‍යශ්‍රී කැටිවැ බෙදූ වළඳූ නුඹ කෙරෙන් අග මෙහෙසුන් ශ්‍රීලදින් දැන් නුඹ වලට යාදී අපි මෙ නුවර හිඳින්නන් කෙරෙම්ද යි මාගේ දෙදරුවන් වඩාගෙණැ නුඹට පළඹුකොටැ මා යන බව නොදන්ද ද? සැමිනි"යි කියමින්:-

තම ලෙහි ඇවිල ගත් ශොක ගින්න මහතානන් හා කැටිවැ යෙමි යන සිත් නැමැති දිය එවා නිවා පියා සිතන් නාහු "දන් නැමැති සත් ක්‍රියාව දෙශයැ යි කී නගරවාසින් සිත් නන්නට නො පිළිවන. නුඹ වහන්සේ වනාන්තර මැද වඩන මැනවැ"යි කියා බිසවු වන වණීනා කියන්නාහු "රජ්ජු රුවෙනි! මල්පිපී වැනීගිය රමණී වනමැද හඬා වැගිරෙණ හැලි කඳුරු මුහුලු බැඳ සිටිනා මුවදෙනුන් මැද මත රැව්දෙන වෙහෙල් මුවන් දක්නා වූ අපට රාජ්‍යශ්‍රී සඳහන් නො වෙයි. සෙබවුන් මැද බැහැවී නැවුම් ගත් මොණරුන් දකුත් අපට රාජ්‍යශ්‍රී සිහි නො වෙයි. ඇතිනි මුළු පෙරදුරි කොටැ සන සනහා යන මදුතුන් හා නොයෙක් මල්පල්ලෙන් ගැවසී ගත් හෝ වැල්ලෙහි සිටැ ලැහැන් බැඳැ කෙළනා මස්කැල හා නොයෙක් වනමල් පැලඳ මඬුලු බැඳැ ලියගි නඟන ලිය කිනුනරාවන් මැද නැවුම් ගත් කිංපුරුෂයන් දකුත් රජය සිහි නො වෙයි.

"පිපී සිටිනා සපු නා පනා පුවඟු හොමුවඟු සල් සළල අතරු දෙවිදුරු නදන් සඳුන් තුවරලා ආදී නොයෙක් රුක්

1 දරු දෙදෙනා කෙරෙහි.

රජුන් දක්නා අපට කවර නම් රාජ්‍යශ්‍රියෙක් සිහිවේ ද? කවර නම් දුකක් සඳහන්වේ ද? වනමල් පැළඳගෙණ රුක්සෙව නින් රුක් සෙවනට ගොස් කෙළනා දරුවන් දෙබිඳින්නන් දකුත් අනික් කවර නම් දුකක් සිහිවේ ද? සොඹිනි! නුඹව හන්සේ පන්සල්හි වඩා හිඳුවා වනමුල් එලාඵල කඩාගෙණ ඊම මට හාරයැ"යි කීහ.

එසඳ සුසුනිදෙවි ද සෙහෙළිනියන් බස් අසා පුතනුවන් කෙරෙහි කළ ශොකයෙන් හඬමින් කියන්නාහු සෙලින් හි මියෙම්මය.* සිරිහි කා මියෙම්මය. ගිනිවැදූ මියෙම්මය. මාගේ මිදවරදකුත් නැති පුතනුවන් වනානතර යවන් නොහැම්මෙම්. නගරවාසින්ගේ කියමන් ගෙණැ මපුතුන් දන් දුන් දෙඟයට වනානතර යවා නම් මි සැලූ කල මැස්සන් පලන්නා සේ තොපගේ රාජ්‍යනස්නේවේද? තොප පුතනුවන් නොවැලකුනම් මා දිවි නොතබම්"යි හඬන බිසවුන් දැකැ **සඳමහ රජ්ජුරුවෝ** ද ශොක පත්වැ නුවරවාසින්ගේ ක්‍රොධ බලවත් බැව් දැනැ පුතනුවන් දන් වනානතරයට යවම්. නෝ දන් රැහැණි නොවව. නොබෝ දවසෙකින් මාගේ පුතනුවන් වනානතර ඇවූ නගරවාසින් ලවා ම ගෙන්වා ගණිම්"යි කියා ශොක සංසිඳුවූහ.

වෙසඟනතර රජ්ජුරුවන් දුක්පත්වූවා දැකැ මම මේ දුක් නො බලම් යි කියන්නකු මෙන් හිරුද හැඟවුනා. මෙසේ එදා රාත්‍රිය යවා 1 අල්ලේ දවස් ඇමැත්තෝ අවුත් වැදැ සිටැ "සොඹිනි! **සතසතු මහදන්** සරහනලදු යි දැන් වූහ. එබස් ඇසූ මහබෝසතානෝ සිරුරු කිස නිමවා මෙහෙනිමවා රජ ගෙයි රැකවල් හරවා සියලු යාචකයන් රජමිදුලේ රැස්කරවා දානසම්භාර කැවි කොටැ ඇතුන් සත් සියයක් අසුන් සත් සියයක් රථ සත් සියයක් මී ගොන් සත් සියයක් මී දෙනුන් සත් සියයක් ගොන් සත් සියයක් කිරි දෙනුන් සත් සියයක් හා රාජකන්‍යාවන් සත් සියයක් හා කම්මිත්තන් සත් සියයක් කෙල්ලන් සත් සියයක් කොල්ලන් සත් සියයක් හා මෙසේ එකි එකි දෙයින් සත් සියයක් සත් සියයක් බැගින් දන් දී රෑවන් තුබූ ගබඩාවලැ දෙර හරවා තොප කැමැති වයතු ගණුව යි නියොග කළහ.

---

* විසං මෙ ඛාදිකං. ජා- 1 දෙවන දවස්

යාචකයෝ ද සුපිපි පියුමකට වදනා බඹර කැලඹ් මෙන් රන් රිදී මුතු මැණික් තෝඩු ශංඛලා නිසර රුවන් මුදු රුවන් වළලු මේ ආදි වයතු කැමැති කැමැති සේ උකහ ගන්නට වන්හ. සමහරු පටකඩ පට්ටෝල දෙවාඟ පිඩාම් සළුපිළි මේ ආදි පිළිසඹඩම් ගෙණැ යන්නෝ සියඇ් දහස් ගණන. මෙසේ ඒ මහතානන් **සතසතු** මහදන් දෙන කෙණෙහි මහ පොළොව ගුගුරා නැංගේය. මහාමෙරු පර්වතය සතුටුවැ නටන්නාක් මෙන් සැලෙන්නට වන. **සපනකුට පර්වතයෝ** ද හුයාපි වෙයග බඩයක් සේ නැම් වැදුම් ගත්හ.

ඉස්බිනි මද්‍රී දෙවි තමන්ගේ පළඳනා පෙරහර පාදඟුලි පාදකටක, පස්රු, පස්පෙරහර, එක්වැටි, පාදමුදු, රන්මරවඩි, පාඩගම්, හිනි, කෙස්වැල, සිරවළලු, දෙපටවිදහ, අඟුල්ලාසර, බාහුමුතු, වැලමුතු, ගළමුතු, මැණික්මාලා, කනපසෙවි, කන් දස, අගනිලක, මිණිදුම්, නිල්මාත්‍රක, ඔටුනු මේ ආදි පළඳනා ධන ධාන්‍ය සියලු යාචකයන්ට දන් දුන්හ. මෙසේ එ දවස් දන් දෙන්නෝ යාහි අල්ලෙ දවස් **වෙස්සන්තර රජ්ජුරුවෝ** අඹුදරුවන් කැඳවා ගෙණැ පියානන් මැනියන් වැඳැ සමු ගෙණැ සිටියහ.

බොධිසත්වයන් මැනියෝ මද්‍රීදෙවින් දැකැ දුක්පත්වැ කියන්නාහු "යෙහෙළිනියෙනි! දන් දුන් දෙඟයට මපුතුන් යා දෙව. නොපි නොයව. වනාන්තරයෙහි දුන් ඉතා බෙහෙව. **ජාලිය කුමාරයන්** හා **කණ්හජිනාවන්** හා තොප හිය කලැ මහා බ්‍යසනය. දරුවන් රක්ෂා කිරීම යම් පමණ ඉතා දුකැ"යි කිහ. මද්‍රීදෙවී කියන්නාහු මාගේ සැමියන් හා වල වසන්නේ ගමවසන්නාට වැඩි සුවය. කැවිවැ ගමන් යන කලැ ගෙයි හුන්නා වැන්නැ"යි කිහ.

බොධිසත්වයෝ **මද්‍රී දෙවින්** මුනුණ බලා කියන්නාහු සොඳුර! වල වසන කලැ මහත් භය ඇත. ඒ හිමාලයයෙහි දැර පිඹුරෝය යන සත්වයෙණෙක් තමන්ගේ දරණින් යොදුන් දෙයොදුන් වල් පොවා වටා ගෙණැ තමන් මුඛයට පත්වූ සිංහ ව්‍යඝ්‍රයන් ද ඇතුන් ද අල්වා ගෙණැ ගැලපියෙති. සොඳුර! එවල සෙල් පිටැ හිදැ සිංහනාද කරණ සිංහයන්ගේ හඬින් කන් පැලීයන්නා වැන්න. ව්‍යඝ්‍රයන්ගේ ගර්ජනා ල පැලීයන්නා වැන්න. යක්ෂ රාක්ෂ ප්‍රේතයන් විසින් ද භය ඇත.

ශරීරයෙහි ඇට දක්වා විදුලේ බොන මදුරුවෝ ද ඉතා බෙහෙව. ඇතුන් පොවා ගසාගෙණැ යන ඇත් ගිජුලිහිණියෝ ද ඉතා බෙහෙව. ඇසනෙක් දුටද ගැළවී නො යාදෙන වලසුන් විසින් ගහණය. බොහෝ බැණැ කිම් ද? ඒ වෙනෙහි සත්‍රින්ට වයන්නට බැරිය සි කියෙන් මද්‍රී දෙවි කියන්නාහු "සාමිනි! වදුල හැම දුක් ගෙණැ වෙසෙමි"සි කිහ.

එසද බොධිසත්ත්වයෝ කියන්නාහු බාලදරුවන් කැට පහණ නො ඇවිදුවා සුවයහන් හෝනවුන් ගල්පහණ පිටැ නොහොවා ධවලචාමරයේ පවන් විදුනවුන් අවුම්සු දැඩි දුලඟ ඇඟ නොගස්වා රාජ භොජනයෙන් බත් කැවුන් වනමුල් වන ඵල නො කවා දරුවන් මපියානන්කෙරේ හිදුවා එව සි කියෙන් "සාමිනි! මම නුඹ වහන්සේ නො දුකැ නො හැම්මෙමි; දරුවෝ මා නොදුකැ නො හැම්මෙති කිහ. මෙසේ දෙමාල්ලන් හා කථාකරණු ඇසූ ඵුසතිදෙවි පුතනුවන් වෙනෙහි ගන්නා දුක් සිතමින් යෙහෙළනියන් හා දෙදරුවන් ගන්නා වැසන සිතමින් මහහඬින් හඬා පෙරළෙන්නට වන්හ. සොළොස් දහසක් පුරාඬනාවෝ ද නගරවාසිහු ද ප්‍රචණ්ඩ වාතයෙන් එක පැහැරැ පොළොව වැගිරැ ගිය සල්වනයක් මෙන් එක පැහැර හඬා වැනිරැ ගියහ. එකෙණෙහි ඇමතියෝ මනහර කොටැ රථයක් සදා වඩනා කල් දන්වූහ. එසද මද්‍රී දෙවි සම්මණන්ට පළමුකොටැ දියනියන් වඩා ගෙණැපුතනුවන් ඇතිල්ල අල්වා ගෙණැ ගොස් රථයට පැන නැංහහ.

පසුව මහ බෝසතානෝ දෙමවුපියන් වැදැ සමුගෙණැ පුරසත්‍රින්ට සමුදී සියලු ජනයාට අවවාද කෙරෙමින් ඍෂිමාකෙරෙමින් තමන් කළ පින් අනුමෝදන් කරෙමින් මහජනයා හඬ හඬා සිටියදී රථයට පැනැනැඟි රථය පැදගෙණැ රාජවීථියෙහි යන්නාකු ආ ආ වන්ට පින්දී නෙපි හැම්දෙන දැනාදී පින් කරව. සියලු සංඝාර ධර්මයන් අනිත්‍ය සේ දුඃඛ සේ අනාත්ම සේ සිතව. සම්පත් නම් අලපත නෙලුම්පත ඔත් දිය සේ අස්ථිර සේ සිහිකරව. මරණ තමා කෙරේ එනබව සිහිකරව. ඔවුනොවුන් හා විවාද නොකොටැ ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරව. අප කළ බිණ්ඩ දෙයක් ඇත. ඍෂිමා කරවයි කියා මෙසේ ප්‍රිය නෙපුලෙන් අවවාද කොටැ නුවර වැස්සන්ට සමුදී වදුරා නුවරින් පිටත්වැ උතුරුදිග බලා ගමන් ගත්හ.

මෙසේ වඩනා බුඩාඩකුර මහතානන් නුවර පෙරළි බල
මි සි සිතූ ක්ෂණයෙහි ම මහපොළොව පෙරළා ගෙණැ මුහුණු
නුවර දිශාවට නිඛිය. එසඳ බෝසතානෝ තමන් මවූපියන්
ගේ ප්‍රාසාදාදි පූරසම්පත් බලා සතුටුවැ මෙසේ වඩනා කල්හි
ජූඡතිදෙවි සිතන්නාහු මපුතනුවෝ වොටුනුමාලාදි රාජාභරණ
ඛන ඛාන්‍ය සොළොස් වරෙක දන් දී මද්‍රිදෙවි හා දෙදෙන
හුන් කලට වනාන්තරය වන. මපුතුන් දෙන්නට යසි ඛන
ඛාන්‍ය වස්ත්‍රාභරණයෙන් දහසක් හැල් පුරා ගැවූහ. මෑණියන්
එවූ වසතු බලා සතුටුවැ "මද්‍රි දෙවිනි! රථය සිඟන්නන් කරා
පදව සි කියා රථය පදවාළු වසතු සිඟන්නන්ට දන් දෙවා වන
න්තරයට නික්මුණහ.

එසඳ බමුණෝ දෙදෙනෙක් වෙස්සන්තරරජ්ජුරුවෝ ඉවසා
සේ දන්දෙත්ල යන හඬ අසා නුවර වැදූ පිළිවිසැ වංකගිරියට
වැඩිබව අසා රැහැණිවැ අතසලා පියා යන කල ගෙණැ ගිය
දෙයෙක් ඇද්දැ සි විචාරා රථය මිස අනිකක් නැතැ සි යනු අසා
දිවෙමින් ගොස් ඇසසනක වඩන බෝසතුන්දැකැ පිනැති රජ්
ජුරුවෙනි! සිටුව සිටුව සි හඬලූහ. බොධිසත්වයෝ ඒ අසා
සතුටුවැ මද්‍රිදෙවින් හා දරුවන් හා බිමැ සිටුවා සෙඤ්ඣව අශව
යන් දෙදෙනා බමුණන්ට දන් දුන්හ. බමුණෝ බොධිසත්ව
යන්ට ආවඩා අසුන් ගෙණැ ගියහ. දෙවතාවෝ සතුටුවැ මල්
වැසි වැස්වූහ.

ශක්‍රදෙවරජු නෙම දිව්‍ය පුත්‍රයන් සතරදෙනෙකු කැඳවා
කියන්නේ වෙස්සන්තරරජ්ජුරුවෝ තපසට යන්නෝ මහදී රථ
අශ්වයන් බමුණන්ට දන් දී පයින් වඩිති. නෙපි ගොස් ඒ
රථය අදුව සි නියොග කෙළේ. දිව්‍ය පුත්‍රයෝ සතර දෙන
රොහිත නම් අස් වෙස් මවා ගෙණැ රථයෙහි යෙදී දෙවියන්
රථය අදිනා කල්හි අනික් බමුණෙක් පෙරසේම අවුදින් කියන්
නේ වෙස්සන්තර රජ්ජුරුවෙනි! සිටුව සි හඬලීය. එහඬ අසා
මහතානෝ රථය නැවතූහ. බමුණු අවුත් කියන්නේ "රජ්ජු
රුවෙනි ඉතා වෘඩයෙමි. රොගීමි. ගමනින් මිරිකිනිමි. තෙල
රථය දෙව සි ආශීර්වාද කෙළේ. බොධිසත්වයෝ සතුටුවැ
අඹුදරුවන් බහා බමුණට රථය දන්දුන්හ. "බිසවු පයින් නො
යාහෙති; දරුවෝ දුක්පත් වෙති" නොසිතා ඒ මහතානන් ඒ
රථය දන් දෙන් ම රථය අදිමින් සිටි දෙවියෝ අන්තර්ධාන වූහ.

මද්දදෙවී දරුවන් දෙබිගින්නන් අත් අල්වා ගෙණැ වනාන්ත රයට නික්මුණහ. බොධිසත්වයෝ ජාලිය කුමාරයන් මම වඩම්. කණ්හජිනාවන් නෙපි වඩව සී කියා දෙදෙනා දෙදෙන වඩා ගෙණැ 1 කවුපහණ ගල් බොරළු මඩිමින් හුණු වැල්ලෙහි ගොස් සෙවනා වඳිමින් දෙළුන් හැලි වැද නහමින් ලිය මළුයෙහි වැදැ සැනැපෙමින් ඔවුනොවුන් හා කෙළිමින් යෙමින් නමන් දුන් දන් සිහිකෙරෙමින් සතුටුවැ සතුටුවැ වඩනා සතර දේනා දුටු දුටුවන් විසින් ඔවුන්ගේ සිසුමැලිකම් දැකැ "යන්නේ කොහිදැ"සී විචාරා චංඛගිඳි පවිතයට යසී යනු අසා කමපාවැ කඳුලු මුසු මුහුණින් යුකතවැ හඬන්නවුන්ට අවවාද කෙරෙමින් වඩනා කල්හි මහත් පකා පැහී දැකැ දරු වෝ එයට ඇවිටි ගෙණැ හඬති; බොධිසත්වයන්ගේ අනු භාවයෙන් අඹ දඹ කෙසෙල් හිවුළු කටු එරම්ණිය නාරන් දෙඩම් මේ ආදිවූ වෘක්ෂ තෙමේ ම නැම් ඵලාඵල දරුවන් අත තිබෙසී.

මෙසේ බෝසතාණෝ දරුවන් කැමැති කැමැති දෑ දෙමින් පොකුණු පතැස් විල් තෙරැ සැනැපෙමින් වැඩැ දෙවතානු භාවයෙන් මග ගෙවමින් ගොස් මද්දදෙවින්ගේ දෙමවුපියන් ගේ චෙතිය රට ජයතුර නුවර නිස්යොදුන් මහ ගෙවා පස් වරු ශාලාවට වන්හ. මද්දදෙවී ශාලාව හැමදෑ බොධිසත්ව යන් හෝනා ආසනය පනවා වඩා හිඳුවා පත්ලෙහි ධූලි පිස පියා දරුවන් දෙදෙනා අසැ හොවා නගරවාසින්ට ද පැනුන මැනවැ සී සිතා නුදුරුව සිටියහ. බොධිසත්වයෝ තමන් ගේ නුවර ආ හෙයින් අප හැරැ ගියේ දෝ හෝ සී සිතුව හොත් සුදුසු තැනෙහි සී සිතා බොධිසත්වයන්ට පැනී පැනී සිටියහ.

එසේ සිටියා වූ බිසවු යන එන්නෝ දැකැ වැදැ නගර වාසිහු රැස්වැ සිටැ චෙතිය රජ්ජුරුවන්ට දැන්වූහ. චෙතිය රජතු ඇතුළුවැ සැවදහසක් රජදරුවෝ අවුත් බොධිසත්වයන් පා පිට හඬා හුනුහ. හඬා නැවත සිටැ කියන්නාහු "දෙවයිනි! කිමෙක් ද? නොපට ලෙඩදුක් නැද්ද? තොප පියානන් සඳ මහ රජ්ජුරුවන්ට දුක් නැද්ද? නුවරවාසින්ට පීඩා නැද්ද? මේ නම් කුමන විසමයෙක් ද? කවර නම් විපත්තියෙක් ද?

1 සෙල් බැව්ල්.

මේ නියා අනාථ ගමනක් නොපටත් වී ද? දෙවසිනි! නොප නැඟි ආ වාහන කොයි ද? ඇත් අස් රථ සෙනාව කොයිදැ"යි විවාළහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු "මාගේ දෙමවුපියන්ට ත් නගරවාසින්ට ත් ලෙඩදුක් නැත. බල එකෙක් නම් **සෙලාශකුමය** සේ සවීඩග බවල වූ සුවිසිලක්ෂණයක් පළඳනායෙන් හොබනා වූ පරිවාර සහිත මාගේ **පිඹා** නම් ඇළි ඇතු **කලිඟු රම** වැසි බමුණන්ට දන් දුන්හ යි සිඹිරම ඇත්නෝ මපියානන් ව ද මට ද කිපී මා රවින් ගිය මැනවැ යි කිහ. එසේ හෙයින් ආම් යි කිහ. රජ්ජුරුවෝ ඒ අසා ආසේ ඉනා මැනවැ යි සතු වුවැ සිව්රට ඇත්තන් ආරාධනා කොටැ ගෙණැ යන තුරු අප ගේ රට රජකළ මැනවැ යි චෙතිය රජ්ජුරුවන් හා සැටදහ සක් රජදරුවෝ ආරාධනා කළහ.

බෝසතානෝ කියන්නාහු "රාජ්‍යය නො කෙරෙමි. නො පගේ රට මා රාජ්‍යය කරත් අප නෙරපූ රජ්ජුරුවන් තුමූ නව නා ගෙණැ රාජ්‍යය කරවති යි නොප කෙරේ වසිර බැඳැ උනුන් හා යුඛ කොටැ දෙරට ඇත්තෝ විරෝධ වෙති. එසේ නො කරමි. වංඛගිරි පර්වතයට නපසට යන බව මැනව. වලැ විසිමට සුදුසු තැනක් වේව යි කිහ. "විචාරා කියම්හැ රජ ගෙට වැඩිය මැනවැ"යි කිහ. බෝසතානෝ රජගෙට නො යම්හ යි කිහ.

මෙසේ කියා ඇතුළු නුවරට නොවඩනෙන් එම සාලාව දිව්‍යවිමානයක් සේ සදා සැටදහසක් රජදරුවෝ සාලාව සිසාරා රැකවල් ගත්හ. බොධිසත්ත්වයන් සුවඳ පැනින් නහවා සළු පෙරළා සළු හඳවා රස භොජන වළඳවා රෑ ලැගැ පහන් වූ කලැ වංඛගිරි පර්වතයට යම්හ යි කිහ. එසඳ රජ්ජුරුවෝ කියන්නාහු "නුඹවහන්සේ වඩනා කලැ පෙර ගමන් පසු ගමන් කරන්නට එන්නෝ බොහෝ දෙනය. මහ වල් කප පා මං හෙළිකරණ්නෙක් වැඩ භුන මැනවැ"යි වළකා සත් දවසක් එහි හිඳැ මං හෙළිකළ කලැ වංඛගිරියට යම්හ යි කිහ. බොධිසත්ත්වයෝ නික්මුනාහ.

චෙතිය රජ්ජුරුවන් හා සැටදහසක් රජදරුවන් සමග ගෙණැ සුළුවනය පසලොස් යොත්නක් ගෙවා ගොස් මහ වනය පසලොස් යොත්නක් නැන් ඉදිරියෙහි තබා මහවනය

සම්පයෙහි සෙනාපතියකු රැකවල් සිටුවා දකුණත ඔසවා මහ කියන්නාහු:–"සාමිනි! මෙතැන් සිටැ ඉදුරා දකුණුදිග බලා ගියකල නගා සිටුවූ නිල් වලාකුළක් සේ තෙලෙ පෙණෙන එලාඵලයෙන් විපුල වූ විපුල නම් පර්වතය ය. ඒ පර්වතප්‍රාන්ත යෙහි සිටැ බැලූ කලැ ඒ නොයෙක් සුගන්ධ ගන්ධයෙන් සම්බන්ධවූ ගන්ධමාදන පර්වතය ය.

"සාමිනි! ඒ පර්වතය වටා නදුන්, සදුන්, කළුවැල්, කිණිහිරි, සපු, දුනුකේ, වැටකේ, නා, පනා ආදී නොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිතය. ඊ සැතැපි තොප අඹුදරුවන් එලාඵල කවා ගෙණැ ගිරි උඟලෙන් බටැ සිහිල් පැන් බී ශරීර කලාන්ත නිවා ගෙණැ ඉන් ඔබ්බට වැඩිකල්හි ඉන්ද්‍රනීලමණි පර්වතයක් සේ බබලන මහත් නුග ගසක් ඇත. ශර්කරා පරයන මධුර රස ඇති නුගපත් අනුභව කොටැ ඒ නුගගස මුලැ සැතැපි ගෙණැ එයින් ඔබ්බට යන්නාහු සතරඟුල් උස් ඇති රතිඳු ගොවිවන් සහිත නිල් වූ මහත් හිතණ වනය.

"සාමිනි! ඒ ගෙවා වැඩිකල්හි පස්පැහැයෙකින් භින්නාවණි ඇති පියුමෙන් හා ඇඹුලු ඉපුලු හෙල්මැල්ලෙන් හා ගැවසී ගත් නිල්වූ දියසළායෙකින් ඉදුනිල්මිණි අතල පැරපූ මී බී උදම්වූ බඹරගණයා විසින් උදම් වූ හංසශ්‍රේණීන් විසින් විරාජමාන වූ සිවුරැස් පොකුණෙක් ඇත. ඒ පොකුණට දකුණුදිග එලාඵලයෙන් අවඤ්ඤා වූ වංඝගිරි පර්වතය ය. එගල්පසක පන්සල් කොටැ ගෙණැ ඛීණ සුවයෙන් දවස් යවමින් අඹුදරුවන් හා සමගවැ වාසය කළ මැනවැයි මහ කියා සැටදහසක් පමණ රජදරුවෝ වැදැ සමුගත්හ.

එදවස් ම ශක්‍රදෙවෙන්ද්‍රතෙම තමාගේ දහසක් නුවණැස් බහාලා මනුෂ්‍යලොකය බලන්නේ අප මහබෝසතාණන් සතසතක මහ දන් දී වංඝගිරි පර්වතයට තපස් කරන්නට නික්මුනු බැව් දැකැ විශ්වකර්ම දෙවිපුත් කැඳවා කියන්නේ:–"වෙස්සන්තර රජ්ජුරුවෝ ද මද්‍රී දෙවි ද තපස්කරන්නට වංඝගිරි පර්වතයට යෙති. තෝ ඒට ගොස් පන්සල් දෙකක් හා සක්මන් මළු දෙකක් හා කේළිවනයක් හා ඵල වෘක්ෂයන් හා මලාමැලි වෘක්ෂයන් හා අඳුන් දිවි සම් රිවි සුඹුළු නිදබු කෙණඬ සැරයටි පැස් පුළුලුමල් සුඹල්කරු යහුල් මේ ආදි නිමවා තපස් කරන්නවුන්ට කැපය සි ඍද්ධියේ අකුරු ලියා පන්සල වට නිස්ඟවුවක් මානයෙහි වඟුන් වලසුන් සිංහයන් අවලක්ෂණ යක්

බ්‍රූ ප්‍රේතයන් ලුහුබැඳැ එසී කියා නියෝග කෙළේ. එසේ හෙයින් ම විශ්වකර්ම් දෙව්පුත් මේ කී ලෙස සියල්ල ම නිර්මිත කොටැ දෙව්ලොවට ගියේ.

බෝධිසත්ත්වයෝ චෙතිය රටවාසින් කී නාක් සලකුණෙන් ගොස් සැනපි ගිඳිමින් සිටිමින් සතරැස් පොකුණට ගොස් පොකුණේ විස්තර බලා නෙපි මෙනැන සිටුව සි මද්‍රිදෙවින් පොකුණුතෙරැ සිටුවා දකුණුදිග හසරක් දැකැ ඒ හසරින් ගොස් විශ්වකර්මයා නිම වූ පන්සල දැකැ මහතානෝ සිතන්නා වූ ශක්‍රයා අප ආ බව දත්වනැසි සිතා තමන් වහන්සේ අත තුබූ රන් කඩුව ද දුන්න ද තබාපියා පන්සල ඇතුළට වැදූ භික්ෂූන් ලියා තුබූ අකුරු දැක කියවා බලා කැප බැව් දැනැ එහි හිදැ ජටාබැඳැ හන්සලු ගළවා හැරැවල් කලාහැදැ අදුන් දිවිසම් ඇහැඳැ පෙරවැ පාත්‍රයක් ගෙණැ සැරයටිත් අතින් ගෙණැ සක්මන් මළුයේ සක්මන් කෙරෙමින් සිටියදී මද්‍රිදෙවින් බොඩි සත්ත්වයන් ලස්වූයෙන් සතරැස් පොකුණෙන් නික්මැ බොඩි සත්ත්වයන් ගිය හසරින් අවුත් තාපස විලාස ගෙණැ සිටියා වූ සමණන් දැකැ ල පැළී යන පමණ ශොකයෙන් හඬා ගෙණැ බිම නී සවාමිනි! නුඹ පෙර සිවිරට ආදී වූ ජම්බුවිපයෙහි ඉනිසුන් විසින් වුඹ සඳමහරජ්ජුරුවන් යුතනුවෝ වෙස්සන්තර රජ්ජුරුවෝය සි කට කට නුඹගේ රූපශ්‍රී කියනු ඇසීම්.

මාගේ සිය ඇසින් ම නුඹගේ රාජ්‍යශ්‍රී දිටිම්. සවාමිනි! දැන් මේ නියා තපස්වේසයක් දිටිම්. පෙර නුඹ රජ්ජුරුවම්හ සි ශ්‍රසිඩවැ දැන් තපස්වීය යන නම් වීය. පෙර මිණිකොඩලෙන් බබලන සහ වොටුනු පලන් තෙල ගිය දැන් දළමඩුල්ලට පොවා සුදුසුවී වන. පෙර දළ මුත්හර හා එකාවැළ පලන් තෙල උරය දැන් මුවසම් ලන්නට සුදුසුවී වන. පෙර කසිසලු හන් තෙල උකුළු ලූ දැන් නිය සහිත අදුන් දිවිසම් ගන්ට සුදුසුවී වන. මේ නියා වේසයක් මා දක්නට මා සතුවූ නියාය. මෙසේ වූ දෙයෙක් නුඹටත් වී වන. මේ නියා විලාසයක් දුටු මා ලය හැම්මෙන නියාය සි හඬා වැලප ශොක සංගිදුවා ගෙණැ මාගේ සමණන් ගත් තවුස්වෙස් මාත් ගතමැනවැ සි සිතා ජාලිය කුමාරයන් හා කෘෂ්ණාජිනාවන් හා කැඳවා ගෙණැ අනික් පන්සලට වැද තමන් හන්සළු ගලවා හැරැ අදුන්දිවිසම් රිවිසුඹුළු ආදී වල්කලා හැඳ පෙරවැ හිසැ ජටා බැඳැ ජාලිය කුමාරයන් හා කෘෂ්ණාජිනාවන් හා දරු දෙන්නා අදුන් දිවිසම් රිවිසුඹුළු

හදවා ගිසැ ජවාමඩුලු බැඳැ තුන් දුනු මවුන්. බෝසතානන් කරා අවුත් වැඳැ නැගිසිටැ කියන්නාහු වහන්ස! නුඹ අතින් මා ගන්නා වරයෙකැයි වර ඉල්වන්නාහු මම වනමුල් වනඵලා ගෙණෙන්නට යෙමි. මා ඵලාඵල සොයා යාදී පෙරවරු නුඹ වහන්සේ දරුවන් දෙදෙන රකුසා කළු මැනවැ යි කිහ.

බෝසතානෝ යහපතැයි කියා උන්ට වරදී කියන්නාහු මයිදු තොප කිසින් ගන්නා වරයෙක. වේලේ ඔත් නො වේ ලෙහි මාගේ පත්සලව නො වදුව යි කියා ඔවුනොවුන් විසින් වරලදින් වසන කල්හි මද්‍රිදෙවි වනමුල් වනඵලා ආදී වූ ඵලා ඵල ගෙණහැර බෝසතානන් වළඳවා අත්පා මෙහෙ කොටැ සත්මසක් විසූ කල බෝධිසත්වයෝ දන් ගන්නා සිහන්නන් නැත්තෙන් දුක්පත්වැ පරහට සුවදෙන්නට උපන් මහතා නෝ වනමුල් වනඵලා ඇද්ද? දන් ම ඔත් සෙසු සුවයක් සුව කොටැ නො අමකන්නාහ. මෙසේ වසන සමයෙහි කලිඟු රට වසන ජූජකනම් බමුණෙක් අටලොස් හැවිරිදි වයස සිට සිහන්නේ වෘඩ අවසථාව දක්වා සිහා සිහා සියක් කළුන් මසුරන් උපදවා අනාථ එක් බමුණකු කෙරේ තබලා ගියේ.

මෙසේ කල්යාමෙකින් බමුණු අවුත් තමාගේ රන් දෙව යි කියා. ඒ කියන්නේ මා අනාථ විසින් රන් විකොටැ කෑම්. තාගේ රනට මේ මාගේ දුව අමිනතනාපනා නම් බැමිණිය තට අඹුකොටැ දෙම්. ඈ ගෙණැ යා යයි කිය. ඒ බමුණු තමා අනික් ලැබෙන දෙයක් නැත්තෙන් බැමිණිය ගෙණැ 1 දුන්නිමිතන නම් ගමට කැදවා ගෙණැ ගොස් තමාට අඹු කොටැ වෙසෙයි. සැමියාහට සුවසේ මෙහෙකොටැ සිත්සේ වෙසෙයි. මෙබලා එගම් ලදරු බමුණෝ තම තමන්ගේ අඹුවන්ට රැහණිවැ කියන්නාහු වෘඩ බමුණාට මෙවැනි සත්‍රියක් උෂ සිත් සේ මෙහෙ කොටැ වෙසෙයි. නෙපි අපට කවර මෙහෙකරුදැ යි කියා තමන් තමන්ගේ අඹුවන්ට බොහෝ ගහට කෙරෙති.

එක් දවසක් අමිනතනාපනා නම් බැමිණිය තොට දිදැ කැ එගම් නෙසු බැමිණියෝ කියන්නාහු පවුකිළිය තෝද දත් නුනු නර මහල්ලකුට මෙහෙ කෙරේදැයි මේ කඩදත් මහල්ලාට නි

1 දුනනවිඨබ්‍රාහ්මණ ගාමවාසි.

පාවාදුන් නිගේ දෙමවුපියෝ නිට සතුරෝ වන්හ. තෝ උන්ට අප්‍රිය යෙයි වන්නි නෝ පින් නොකළ නැනැත්නියක් වන්නෙහි තෝ හිය ජාතියෙහි කවුඩවන්ට පිඬු දුන් කල නිලෑ බත් කෑයේ මහළු කවුඩයෙක් වන. එසේ හෙයින් නි මෙනර මහල්ලාට අඹුවුයේය. යෙහෙළා මෙසේ වූ 1 ජර හම් මාල්ලා හා එක්වැ පඤ්චකාම විෂයෙහි කවරනම් ඇල්මෙක්ද ඌ කඩදත් දල්වා ගෙණැ සෙන වේලෙහි නිට කවරනම් සමාධියෙක් ද? කිඹුල් පිටක් සේ කොරසැඩිවූ ඌගේ ශරීරයේ ගැව් කවර අස්වසෙක් ද? සොඳුර! නිගේ මොළොක් වූ ශරීර මිරිකා ඒ බමුණු 2 කනවටුවාට මෙහෙ කොටැ දුක් නොගෙණැ නි සේ වූ අසිරුප වූ ලදරු සැමියෙකු සොයා ගනුව සිකිහ.

එසේ නමහට පරිහව බනන්නා වූ ගැනුන් හා බලා හඬා වැලැපැ මිශ්‍රඛුරු ඛුරුලා නමා පැනට ගෙණැ හිය කළඝ ගල් කැටෙක පැහැරි බිඳැ පියා අත පෙරවා ගෙණැ බමුණු මහල්ලාට තතනම්න් දත්කම්න් සපා කොද බෙණෙම්න් ගෙට ගොස් බමුණු මාල්ලා නා සේ වූ කෙලතොල්ලන් කෙරෙහි ඛුන්නේ විපාක අද ලදිම්. යාපත් සරණක මා ආයේය, අද මේ ගම් සඟ (ක්) දැරියෝ එක්ව ගෙණැ මා හිස බොල් කෙල ඕනෑ සේ මට උන් නොකි පරිහවයෙක් නැත. නා කෙරෙහි හිද මෙසේ වූ බස් අසන්නාට වඩා කරවැල් ලා ගෙණැ මිය යාම යහපත. සිරිහිකා මියයාම යහපතැයි කිව.

ඒ අසා බමුණු මහලු තමා දත් වැහිරගියත් අඹුසොඬි හෙයින් ම කී බසැට කම්පාවැ සොඳුර! තෙපි රැහණී නොවව. දරන් මම ම ගෙණෙම්. දියත් මම් ම ගෙණෙම්. සෙසු කළ මනා යම් මෙහෙයක් ඇත. මම් ම කෙරෙම්. අද පටන් තෙපි මේ මෙහෙ නොකරව යි කිය. බැමිණී ඒ අසා සැබව සැමියන් අනින් අන් මෙහෙගන්නා කුලෙක මා උපන්නා නැත. එම්බල තට උපායක් කියම්. මහා යසස් ඇති ගුණෙන් සම්පන්න වූ වෙස්සන්තර නම් මහරජ ඉවසා දන් දෙයි. උන්ගේ වසතු ගෙණැ අනාථයක් සුව විඳින්නේය. දැන් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙයි. තෝ ඔබ ගොස් මට මෙහෙකරණ වහලුක් ගෙණෙයි නම් හිඳිම්.

---

1 ජරාමල්ලා. 2 කනාටුවාට.

නැත මාගේ දෙමව්පියන්ගේ ගෙට ම නැගී ගොස් අනික් මාසේ ම ලදරු වූ දැස් දසුන් විසින් සම්පන්න වූ පුරුෂයකු කෙරේ හිඳිමි. තා බලා බලාසිටියදී ඌ හා මා කෙළනා කල මාල්ල නා සිනට සුවයෙක් නැත්තේවේදැයි කිව.

එ බස් අසන්නා ම බමුණා ලය ඉපිල හිනා. ල පිරුණු ශොකයෙන් මූහත් කොටැ මිශුඩුරු හුරුලා කියන්නේ සොදුර! මම ශකති නැත්තෙමි. වෘඩයෙමි. වංකගිරි පවීතය ඉතා දුරුය. නො යාහෙමි. ගෙයි කළමනා මෙහෙ මම් ම කෙරෙමි. තෙපි ඒට අසමාඩි නො වව සි කියා කිය. ඒ අසා බැමිණී කියන්නී තොප සඩ්ගාමභූමියට නො වැද ම පැරැදී එකකු වැන්නෙහිය. 1 ජඩ වූ තඩ්ඩවිපිමැලිය, මට කාන්තාලදු නො පිරිවා ගොස් රජ්ජුරුවන් අතින් කෙල්ලන් කොල්ලන් ගෙණෙ සි කියා බමුණා වෙරෙලෙකසි, ඌ හින්ද සිටිය නොදී ඇත් මැත් ගැසෙම් හවමින් වෙසෙසි.

බමුණු අඹුව කරණ ගහටයෙන් ඇ කෙරෙහි කළ හසින් ගහපත ගොස් වහල් ගෙණෙම් ගිවිස වලින් දරු ගෙය පුරා ලා දිය ඇදූ වලන් පුරුලා ගෙය සිසාරා වැටකොට ඇට බත් බුලත් තබලා ගමනට සැරහී සිටැ අඹුව තුන්වටෙක සිසාරා පැදකුණු කොටැ වැදැ පසුබැස සතර තැනෙක බැස හෙවැ වැඳැ ඇ කෙරෙහි කළ හසින් හැකිළි හැකිළි සිපගෙණැ නිකට ගෙණැ හා ඇට කියන්නේ සොදුර! මම ලස් නො වම් එමි. තෙපි බියපත් නොවසි සමුගෙණැ වහන්සඟළුක් පයලා කුඩමහල්ලක් අතින් ගෙණැ කෙණ්ඩයෙකින් පැන් හා මහට ගත් උපකරණ පසිය කරට නඟා ගෙණැ අඹුදූරි කර පෙරළී සිටැ බල බලා වදිමින් වංකගිරි පවීතයට ඇන මහට ගොස් මගදී සිනාපියා සිවිරටට වැදූ නො දිවිම් නම් පසුව වංකගිරි පවීතයට ගෙමි කියා සිවිරට ගොස් වැදූ කියන්නේ **මෙසස නතාරසෝ** කොසි දූ සි විවාලේ.

නගරවාසී ඒ අසා කිපී නව දන් ගැන්මෙහි නො නවතු දූසි අපගේ සවාමින් රවින් යවන පරිද්දෙන් කළුව, නව ද කුමට පිළිවිස්වාදූසි කැටපහණ ගෙණැ ලුහුබැඳගත්හ. බමුණු වැටිහෙවමින් පිරිහෙමින් නොල් බොල් සිදැගෙණැ දනඋතු

---

1 කඩදත් කොරසැමි තඩ්ඩවිපි කම්මැලිය.

වැලමිටි ලොලාගෙණැ දිවන්නේ උතුරුදිග බලා ම දිවගනී. ඔහු මග නොහදුනා රුදු දේවතාවෝ බෝසතුන්ගේ **දානපාර මිනාව** පුරණු සඳහා වංඝගිරි පර්වතයට මග පෑහ.

බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස් හිරමුදුන්වේලෙහි **වෙනියපුත්‍ර** නම් සේනාපතිතු සිටි රැකවලට ගියේ ඒ සේනාපතිතුගේ 1 දිනබල්ලෝ බමුණා දැකැ සිසාරා ගත්හ. බමුණු හය ඇතිවැ මහත් කොටැ හඬා සසලා පියා තුපිණාපසිය ද කුඩය ද සැරයටිය ද කෙණ්ඩිය ද වහුත් පතුල් ද හෙළාපියා ගිසසේ උදුරා දිවගෙණැ ගොස් ගසට පැනැ නැඟි ගස්පිට හිඳ හඬන්නේ මෙසේ කියා හඬයි. පඤ්චමහා ගඩහාවන්ට මහාසාගරය බදුවූ වැසිලිහිණියන්ට මහාමේඝයක් බදු වූ පිපාසිතයන්ට මහා ගඟක් බදු වූ රෝගීහට දිව බෙහෙදක් බදු වූ ඝන වූ අඳුර පතරට ප්‍රදීපයක් බදු වූ යාචකයන්ට කප්රුකක් බදු වූ සිතූ සිතූ දෙයක් දෙන චින්තාමාණික්‍යයක් බදු වූ මගීන්ට සිහිල් සෙවනක් බදු වූ හැම සත්ත්වයන්ට පින් පැන් මඩුවක් බදු වූ ඉල්වූ දෙයක් නැතැ යි නො කියන්නා වූ මහත් පඤ්චපදුමයෙන් සැදුනු පොකුණක් බදු වූ ඝ්‍යලු සතුන්ට සම සිත් වූ **වෙස්සන්තර** රජ්ජුරුවෝ කොයිදැයි හඬලීය.

'**වෙනියපුත්‍ර** නම් සෙනාපති බමුණාගේ හඬ අසා අවුත් බමුණා දැක කියන්නේ, තමන්ගේ රජය හැරැපියා මේ හිමවත තපසට නැඟි ආ රජ්ජුරුවන් සොයා ආයේ බිසවුන් වත් දරුවන් නා කරා හේය යි කිපි පිටිතොල දතින් කමින් මිටි සරහමින් වටපිට බලමින් අවුත් දුෂට වූ බමුණා දැන් දැන් තා දිවි ගණිමිදි දුන්න හා විෂ පෙවූ කනුගීය තුඩයෙ ලා ගෙණැ සොර! දැන් දැන් තාගේ හෘදමාංශය ලේ වමිව වමිවා කඩා ගෙණැ පඤ්චසකුණයන්ට බිලිදෙමි. දුෂට බමුණ තාගේ බඩ වැල් හැරගෙණ තුන්මංසුල පනක් සේ සිසාරා තාගේ පඤ්ච මධුර මාංශයෙන් හා තාගේ ග්‍රීවයේ ලෙහෙයෙන් දෙවියන්ට බිලි දෙමි. සල්ව සල්වා පන් දැන් තා ඇඟමස් කප කපා තෙල බල්ලන්ට දී කවමි. වහා තෙලගසින් බැසැ පියයි කීය.

බමුණු මරණ භයින් භයපත් වූයේ අනික් වදනා නැනක් නැත්තේ මහහඬින් අඩා බොරුවක් කියා මා මූ අතින් ගැලවුන මැනවැයි සිතා කියන්නේ මා එසේ මැරිය නොහැක්ක. මම දුනයෙකිමි. මද වරදකුත් නැත්තෙමි. මා දිවි නොගන්ව මද ඇසිල්ලක් මාගේ බස අසව.

---

1 කිනබල්ලෝ,

සඳමහ රජ්ජුරුවන් හා සිවිරටවාසින් සැදැහැයෙන් වෙස්සන්තර රජ්ජුරුවන් ගෙණා මැනවැ යි කී හෙයින් එස්වන් බිස වුන් වලප්නා හෙයින් මවුපිය දෙදෙනාගේ ශොක බලවතින් වංකගිරි පර්වතයට ගොස් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ සිරුර දන්නා සඳහා යව යි නගරවාසින් හා රජ්ජුරුවන් හා කී හෙයින් ආම් කීය.

ඒ අසා වැඳිසුත් සතුටුවැ යමයන් සේ වටලාගත් දිනබල්ලන් ගසැ බැඳැ ඉෂ්ඝ නම් බමුණා ගසින් බාගෙණැ පල වූ මස් හා අල මී හා මියුරු ආහාර කවා ගමන් ශ්‍රමදූහ නිවා සතප්පා ගෙණැ බමුණා නිස්මුණු කල මඟට මී ලබුවක් පුරා දී මස්පිඩියක් ද දී පසු ගමන් කොටැ දකුණත ඔසවා බෝසතානන් වසන දසාවට මහ කියන්නේ බමුණ! තෙල හිය වලාකඩක් සේ දුරින් පෙනෙන ගඳමහන් පවුවය ඒ ගල පසෙකැ කිහිරි කුඹුක් නුග ඇසතු කෙලින්ද ගිවුළු බෙලි අඹ දඹ බස්ම් එල් කෙල් කවුළුරම්ණීය නදුන් සඳුන් සපු දුනුකේ නා පනා සලල අගරු දෙවිදුරු මේ ආදි මල් පල්ලෙන් සැදුනේය. හැලිගසා දිවන මනහර ගං හෝ ආදියෙන් සැදුම් ලද්දේය. මල්පල් ලෙන් ගැවසිගත් ලියකිදුරු කෙවිල්ලන්ට ගෙයක් සේ සිත් කලු වූ ගලතෙලෙන් 1 රමණීයය. ඒ ඒ වනයෙන් නොගෙක් ඵලාඵල කම්න් හඬා වැගිරෙන නොයෙක් සිහිල් දියෙන් නහම්න් පැන් බොමින් ගියකල ඔද්දේ පොකුණක් පඤ්චපදුමයෙන් සැදුනේය. නෙළුම්පත් සිවැ වගුල මල්රෙහෙණු වැල්ම් ශකීරා සෙසින් කම්න් ගොස් මඟ ලැගැ රාක්ෂයන් විසින් ගහන වූ වනානන්තරයේ විපුල් පර්වතයේ අච්චුත නම් තපස්වීන් වසන පන්සලට වැදූ සැනැපී උන් අනින් මඟ පිළිවිස්වා ගනැ යි කියා සුලුවනය විසතර කොටැ මඟ කියා නැවැත්ත.

බමුණු උඹ කී පරිද්දෙන් ම ගොස් විපුල නම් පර්වතය සමීපයෙහි පන්සලට ගොස් වැඳැ තපස්වීන් දැක සුවදුක් පිළිවිස්නේ කරුණු (කි)මද මැසි මදුරුවන් විසින් දුක් නැද්ද! දිවියන් වලසුන් සිංහ ව්‍යාඝ්‍රයන් විසින් උපද්‍රව නැද්ද? ඵලාඵල ලැබේදැ යි විචාරා සිටියේ. තපස්වී කියන්නාහු තා කී තාක් දෙයින් දුක් නැත. ඵලාඵල ලැබෙමි යි කියා මොහුගේ ගමන් ශ්‍රමදූහ නිවා ඵලාඵල කවා සැනපී හුන්කල කියන්නාහු බමුණු වනානන්තරයට කුමක් සඳහා අසිදැයි විචාලාහ. බමුණු කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවන් කරා ආම් යි කීය.

---

1 ගල්කුලෙන්-ජා.

තපස්වී කියන්නාහු රාජ්‍යය හැරපියා තපස්කොටැ වල අවුත් හුන්නන් කරා වස්තු ඇත්තෙක් අයිදැ යි කීහ. බමුණු කියන්නේ, තාපසයෙනි! වසතු සඳහා ආයෙම් නො වෙම්. ඒ වෙසතුරු රජුන් බාලකල අකුරු කරවීම්. දැන් මා නොදක්නේ සත්මසය. බලාපියන සඳහා ආමි යි කීය.

මෙසේ කියා එහි ලැගැ පහන් වූ කල තපස්වී තමන් බොරු නො දන්නෙන් මු කී බස් සැබෑ දෝහෝ යි සිතා මඟපා නාහු, බමුණ! මෙසේ ගියකල දකුණින් හසරින් ගොස් **වංකගිරිපබ්බතය** අසන්නායට ගිය කල චතුරශ්‍ර පොකුණෙක් ඇත. ඒ විල පස්පියුමෙන් සැදුනේය. ඒ පොකුණ සිසාරා අඹ දෙඹ කීන කුඹුකින් සජ්ජිතය. නිල් මහමේ කල නැගූ වලා කඩක් බබලන්නා වැන්න. එනැන සුළඟින් පැහැරී කදුබැඳි තිබෙන මල්රැස බමර පියා පහරින් නිනිව වැගිරෙන මල මුවරදය. මල්කෙසුරු කඩා පුරා කා මත්වැ කුල් නා කෙවිල්ලන් ඇති ඒ ඒ පළුන ඝිඹරයෙහි ලිය ගී නහා නවන ලියකිදුරන් ඇති. ඒ ඒ දෙලන ලියමඩුයෙහි රිසි සේ කෙලනා විදුඹර ඝෝය. බමුණ! රන්ගිරිකුළු මුදුනෙහි මුළු බැඳැ නවන මොනර කැන. මුව බැඳි යන ඇත්කුලය. තොල්ලෙන් තොලු තබා ඔවුනොවුන් සනහ සනහා යන නොයෙක් මුවරලය. බමුණ! ඒ ඒ දෙලන විලිඤවැ තිබෙන ඇත්දල පමණ පලඇති කේල් වනය මහදිය කළු සා පල ඇති කොස් වනයය. විලිඤවැ හී වැගිරෙන ඕඅඹ කැනය. පුවක්කද සා මහත් දඩු ඇති උක් වනයය. බමුණ! තෝ මේ වනයට වැදැ තා කැමැති ඵලාඵල අනුභව කෙරෙමින් සැනපෙමින්! වංකගිරි පබ්බතයට ගොස් පන්සලට වැදැ වෙස්සන්තර රජ්ජුරුවන් දකි යි කීහ.

බමුණු ඒ අසා සතුටුවැ තුන්විටක් කොටැ සෘෂින් වැඳැ සමුගෙණැ කී සලකුණෙන් ගොස් සතරැස් පොකුණ ද වන ඝද දැකැ ඒ වනයෙහි එක් ගිරිගුහායක් දැකැ බමුණු සිතන්නේ මේ වේලෙහි **වෙසතුරු** රජ්ජුවන් හුන් තැනෙට ගියෙම් නම් වනමුල් වනඵලා ගෙණැ හැරී වේලාවට වළඳනි. සන්ති නම් දනට වාරණයහ. දනට බාධා කරන්නාහුය යි සිතා මේ ගුහායෙහි අඳ ලැගැ ගෙණැ සෙට උදැසන මද්‍රී දෙවින් ඵලා ඵල සොයා යාදී ගොස් දරුවන් දන් ගණිමි යි සිතා ඒ ගුහායේ

ලැහැ ගත. එදවස් මද්‍රී දේවීන් පාන්වන වේලෙහි නපුරු සඵපනයක් දැකැ හඝානකුවැ ඳිදැ සිතන්නෝ මේ මුළුපොළොව වෙඝසඝනර රජ්ජුරුවන් සමාන සඵපන දන්නා වූ නැතැයි සිතා බොධිසත්ත්වයන්ගේ පන්සල් මළුයෙහි පියවරසන් කොටැ සිටි කල්හි බොධිසත්ත්වයෝ දෙරැ සිටියෝ කවුරුදැ යි විචාළහ. වහන්ස! මම යැයි කිහ.

දේවීනි! නුඹ වේවලහි මා කරා නොඑන්නට වරලද්දේ වේ දැයි කිහ. දේවි කියන්නාහු සඵාමිනි! අන්‍යතර 1 සිතෙකින් ඇයෙමි නොවෙමි. මා දුටු සඵපනයක් කියන්නට අම්මි කිහ. බෝසතානෝ කියව යි වදාළහ. මද්‍රී දේවි කියන්නාහු සඵාමිනි! "එක් කලු මිනිසෙක් එක් රතයක් හැදුගෙණැ රතක් කරලා ගෙණැ දෙකණ රත්මල් පැළැඳැ කඩුවක් හිසැ සිසාරමින් මා කරා අවුත් මට නොයෙක් තුඩුවැඩ බැණැ පියා මා හිසැ ජටාව අල්වා ගෙණැ ඇදූ බිමැ හෙලා ගෙණැ මා හඬව හඬවා මාගේ දැස් උදුරා ගත් තව. සඵාමිනි! මාගේ දැතත් කපාගෙණැ හදවතත් උදුරා ගෙණැ ලේ පහර පහරා හැරගෙණැ ගියේ නමැ" යි කිහ. බෝසතානෝ සිනය අසා සිතන්නාහු මාගේ සත්මසක් පිරිහිගිය දානපාරමිතාවෝ පරිපූණී වෙති යි සතුටුවැ දරුවන් දෙන්නා ගෙණ යන්නට වනයට බමුණෙක් අවනැ යි සිතා බිසවුන්ට කියන්නාහු පෙර තොප මිශ්‍රු ආහාර කා සුව යහන්හි හෝනා වූ තොපට දැන් වනඵලාඵල වළඳා සුව යහන් නොලදින් දඩුමැස්සෙහි හෝනෙන් පැණෙන සිහිනයයි කියා සංගිඳුවා බැණැ යවූදැඝ.

පාන්වූකල මද්‍රී දේවි මළු හැමදා දූහැරි පැන් තබා පන්සල් හැමදා මල්පුදා දරුවන් දෙදෙනා කැදවා මූනින් මූන තබා සිඹැ පියා දරුයෙනි! මා රැ දුටු සඵපන නපුර. තලබිදක් සාදා යහපතෙක් නැත. තොප පියානන් හැරැ බැහැරට නොයව කෙළිනා තැන බියපත්වව යි දරුවන්ට ඔවා දී බෝසතානන් කරා ගොස් වැඳැ සඵාමිනි! මෙවල මට නැගෝ නම් නුඹ වහන්සේ හා මාගේ දරුවෝ දෙඛිගින්නෝමය. සඵාමිනි! මම වලට පලවැල සොයා යෙමි. මා එනතෙක් නුඹගේ දරුවන් දෙදෙනා කෙරෙහි බියපත්වුව මැනව. නුඹ වහන්සේත් සිහි ඇතිවැ වැඩහුන මැනව. සඵාමිනි! මා යන බව මුත් මාගෙ ලය නුඹ වහන්සේ අත බවයයි දැන වදාළ මැනවැයි

1 අන්‍යතර.

කියා දරුවන් පාවාදී මල්කරුව හා පෙට්ටිය හා හැරගෙණ වනමුල් වනඵල සොයා යන්නී හඬමින් වලපමින් මෙවල දෙවියනි! මා දරුවන් කෙරෙහි බියපත්වව සි මා කම්කිලියගේ එකලාකම් බලව සි දෙවියන්ට යදිමින් ගියහ.

බෝධිසත්ත්වයෝ බිසවුන් වලට යාදී සක්මන්මළු කෙළ වර බමුණා එන පෙරමග බල බලා වැඩහුන්හ. දරු දෙදෙනා බෝධිසත්ත්වයන් පෙරමගැ වැලි කෙළෑ කෙළෑ හුන්නාහ. ඉක්බිති බමුණු මද්‍රිදේවීන් වනමුල් වනඵලයට මේ යන වේලාය. උන් වලැ සිටැ නොඑනතුරු දරුවන් ගොස් ඉල්වා ගෙණැ එම් සිතා පන්සලට ගියේ. බෝධිසත්ත්වයෝ ද එන්නා වූ බමුණ දුරදී දැකැ සත්මසක් අප නුදුන් දැනපාරමිතාවන් ඇති කරවන්නට එන කල්‍යාණමිත්‍රයෙක. සුළුවනය තිස්යොදනක් මහවනය තිස්යොදනක් තැන්හිනිකම් නොඑසි. දරුවන් ඉල්වා එනවා වනැ සි සතුටු වූ නියාද දරුවන් කෙරේ කළ ප්‍රේමයට වඩා සිරියේය.

බෝසතාණෝ ජාලිය කුමාරයන් කැඳවා කියන්නාහු පෙර මිගට ගොස් බමුණ අත පිරිකර ගෙණැ කැඳවා ගෙණැ එව සි සැවූය. ජාලිය කුමාරයෝ සතුටුවැ ගොස් පිරිකරට අත දික් කළහ. බමුණු සිතන්නේ වෙස්සන්තර රජ්ජුරුවන් මට දන් දෙන දරුවෝයසි සිතා දැන් මා මොළොක් වුවහොත් මට මෙහෙ නොකෙරෙනි සිතා දැන්ම මුන්ට භයගන්වා උරණවුව මැනවැයි සිතා කුමාරයන්ට උරණවිය. ජාලිය කුමාරයෝ භය ගෙණැ පලා අවුත් බොධිසත්ත්වයන් කරා වන්හ. උන් පසුපස්සේ බමුණු ද අවුත් බොධිසත්ත්වයන් දැකැ සතුතිකොටැ සිටැ කියන්නේ ශ්‍රීවන්තය! නොප ශරීරයට පීඩා කරුණු නැද්ද? මැසි මදුරුවන් විසින් සිංහ ව්‍යාඝ්‍රයන් විසින් යක්ෂ ප්‍රේතයන් විසින් දුක් නැද්ද? වනමුල් වනඵල ලැබද්ද? තපසට අනතරාය නැද්ද? දනට බාධා නැද්දැයි කීහ.

ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු නා කී මෙතෙන් දෙසින් දුක් නැත. තපසට අනතරාය නැත. දනට බාධා නැත. පින්වත් නාගේ ගමන් ශ්‍රමදූහ නිවා නිලින් අඹ දඹ කෙහෙල් කවුළුරම්ණීය මේ සේ රසවැන්න. ඒ ඵලාඵල කා පැන් බී සැනසී හිඳ සි වදළහ. බමුණු ද එසේයින් ම කා බී සැනපී හුන්කල බෝසතාණෝ කියන්නාහු නා ආ කාරිය කිමෙක්දැයි පුළුවුත්හ.

බමුණු කියන්නේ මහාපුරුෂය පඤ්චමහාගඩගාව පැන් යම් කෙනෙක් බොද්ද? ඒ පැන් උනුනොවන සෙයින් සියලු යාචකයන්ගේ සිත් මනදෙලි පුරණ උත්තමයානෙනි! අනික් වැඩි කටයුත්තකට ආයෙම් නොවෙමි. තොපගේ දරුවන් දෙන්නා මතු ඉල්වා ආමි සි කියය. මේ කපැ බුදුවන්නාවූ වූළු ලොවට වැඩක් ම සිතන්නාහු ඒ මහතානන් වහන්සේ බමුණ කී බස් අසා දෙදරුවන් මුහුණු හා බමුණු මුහුණු හා බලා පියා පලවැලටැගිය බිසවුන් සිහිකොටැ ලා සිතා උපන් දළ සෝගිනි බමුණට දන් දෙමි යන සිත් නැමැති ජලධාරාභිෂෙක යෙන් නිවා වදුරා දන් දීමෙහි ම එක්සිත් වූ සේයෙක.

එසේ නොසිතුවහොත් බෝමැඩැ පිටදී වජ්‍රාසනයෙහි වැඩ හිඳැ මරසෙනඟ ප්‍රලයකොටැ කෙසේ නම් බුදුවන සෙයෙක්ද මෙසසර අවුලෙහි බැඳුනු සත්වයෝ කා මූන බලද්ද? මෙම සත්වයා නිවන්පුරයට ගෙණැ යන්නෝ කවුරුද? එදා දරුවන් දීමෙහි පසුබටහොත් බුදුවැ ඒ මහතානන් කරා මෙහෙයූ නාලාගිරි නම් පරුෂ ඇත් ශ්‍රීපාදය කුමට වැද ගෙණැ හොවී ද? තවද ඝොර වූ මරහු වැනි වූ ආලවක නම් යක්ෂයා මන්බිඳි කුමට ශ්‍රීපා ද වඳිද? එදා දන්දීමෙහි මසුරුවූනම් මිනීමරු වූ අඟුලිමාලයා දුන් තමන් සස්නෙහි කුමට කුලගැනි වේ ද? එදා දරුවන් නොදෙමි සිතුව දුන් දෙවදන් කයා හිසට පෙරැ ගල්හෙන නොදී පොලොවින් ගල්දෙකක් නැගී කුමට පිළිගණී ද?

තවත් මහමෙර සත්දරණ පවෙකින් වෙළාගෙණැ තමන් වහන්සේට කිපි විෂතේජසින් දිලිහෙන්නා වූ නළාපනාගයා දුන් කෙසේ නම් හික්මෙවන සේක් ද? එදා දරුවන්ට සිනෙහැති වැ බමුණට දන් නොදෙමි කිව හෝ බ්‍රහමතේජසින් දිලිහෙන්නා වූ සහම්පති මහාබ්‍රහමයා දුන් ඒ සවාමිදරුවන්ගේ සිරසට තමාගේ ඛවලච්ඡත්‍රය ඛරා කුමට සරස් මෙහෙතැන සිටී ද? එදා දරුවන් නොදෙමි සි ඒ දරුණු බමුණ ම යැවුව හොත් දෙවු ලොව දෙවිඳන්ට අගපති වූ සක්‍රදෙවෙන්ද්‍රයා දුන් තමාගේ එක් සිය විසිරියන් ජයතුරා සක්රුවන දුන් තමා තුඩ පොපියන තෙක් කුමකට පිණී ද?

එදා ඒ ලදබොලඳ දරුවන් නොදෙමි සිතුව නම් දැන් පස්වා දහසක් මුළුල්ලෙහි නිවන් පුරයෙහි දෙරහැරැ තබා තමන් පිරිනිවිසද ශ්‍රී ශරීරයෙන් දැහිය ඇට ද වැළඳූ පාත්‍රය ද පිපි වහල් වූ ශ්‍රීබොධිය ද තමන් වදුළු දහම ද වැඳැ පිදූ සියලු මිනිස් දෙව් බඹුන් කෙසේ නම් නිවන් පිහිටුවන සේක් ද? මෙසේ ඒ බමුණු දරුවන් ඉල්වා ඇමි කී බස බෝසතානෝ තමන්ට රාජ්‍යයෙන් වොටුනු පළඳුව සි කී බසක් සෙයින් සතුටුවැ කියන් නාහු බමුණ! නෝ මට පරලෝ අමුත්තෙහි නෑ සේ මට මිතු ශෝනැත. සෙසු යාචකයෝ ඉල්වත් නම් ඇතකු හෝ ඉල්වති. අසකු හෝ ඉල්වති. රන්රුවන් හෝ ඉල්වති. මෙවැනි මහ වලට අවුත් අනිකක් නොඉල්වා අප දරුවන් ඉල් වූ බව ඉතා ඔහපත.

ඒට මරුවැලක් සිහිනෙනුත් නොකියම්හ. දරුවන් දෙන්නා නට සමසිනින් ම පාවා දෙම්හ. බල·එකක් කියමි. බමුණ! මේ ලදබොලඳ කුමාරයෝ කිසිදුකක් නොදිටු විරුය. දැන් ම දරුවන් දෙබිහින්නන් ගෙණැ ගියෙම් නම් මේ දරු බිලිදු සාවිඩාවෙති. එසේහෙයින් බිසවුන් වල ගොසින් අවුදින් දරුවන් දෙදෙනා නහවා මල් පළඳවා වනමුල් වනඵලා කවා දරුවන් ඇඳ වැළඳැ සිපගෙණැ ලදබොලඳ වූ සුරතල් බස් අස අසා ඈ ල නිවී සැනහුණුකල අද රෑ ලැගැ පහන් වූ කල දරුවන් දෙදෙනා ගෙණ යව.

නවද මේ දරුවන්ගේ එකලා මෑනියෝ දරුවන් අපට පාවාදිලා වලට ගියේය. එලාඵල ගෙණැ අවුත් දරුවන් දෙදෙනා නුදුටුවෝ නම් උන් ලය පැලියෙති සිතුම්. මාගේ ඉෂ්ට මිත්‍ර වූ බමුණ! නට ගැතිවෙන ම දරුවන් දෙදෙනා ඉතා ම සිවුමැලි රජකුමරුවෝය. ගැති මෙහෙයෙහි නොහසලවිරුය. තදින් මොලොකින් මෙහෙ උගන්වාගෙණැ ගැති මෙහෙකම් ගෙණැ අද මෙවෙලා හැම්මෙයි වදුළහ. එබස් ඇසූ බමුණු තෙම රජ්ජුරුවෙනි! සත්‍රිහු නම් දැනයට බාධාකරණ සුල්ලහ. සුහ කම්මානන නොදනිති. මම මෙහි ලඟින්ට නොපොහොසත්මි. දරුවන් දෙව් නම් මට කල් නොයවා දෙව. නොදෙව් නම් මම ඈ සේ නැඟියෙමි. තෙල තන්වැසිකම් තෙපි කෙසේ උගතුදැයි බ්‍රාහ්මිය.

බෝසතානෝ එබස් අසා බමුණාට දරුවන් දෙම් කියාලා නැවත දරුවන් නො දෙම් කියා බොරුවක් නො කියම්. දනට පසුබස්නා එකෙකින් නො වෙම්. බිසවුන් එනතුරු නොහම් මෙයි නම් මේ සිවුමැලි දරුවන් මහ නලව නලවා සතපමින් අස්වසමින් කැඳවා ගෙණැ දරුවන්ගේ මුතුන්මිත්තන්ගේ රටට ගෙණැ ගොස් සඳමහරජානන්ට මෙපවත් කිකල මපියා නන් වහන්සේ අප කෙරේ කළ සෙනහයෙන් මුනුබුරන් දුටු සතුටෙන් ඔවුන්ගේ මිගිරි බස් අසමින් තට කෙළි කොල්ලන් හා බොහෝ වසතුව දෙති යි කිහ.

බමුණු එබස් අසා හිස සලමින් යාපත මා දිවිගන්නට සිතූ නියායෙ:– හිමි නෙපි මේ උපාය කොයින් උගතු ද මුනු බුරන් දුටු සඳමහරජානෝ මට කියපියක් කියති. බමුණ! තෝ අප දරුවන් ඇතිකොටැ ගෙණෙයිදැයි කියමින් මා කන් නාසා කපා මා දිවි ගණිති. වහල් නඹා දිවි රැකගැණුම් සහපත. දරුවන් දෙව් නම් දෙව. නො දෙව් නම් නො දෙව. තෙල බස් අප රකුත්හොත් නො කියව යි කියා.

දරුවෝ දෙදෙන ද බමුණ කියන බස් ද පියරජුන් හිදැ ගැතිකොටැ දෙම් කියන බස් ද අසමින් හඝපත්වැ සිටැ ගත නොහී දිවියා දැකැ මරණ හයින් දිවන මුවපැටවුන් දෙන්නකු සේ ඉගිලෙමින් බමුණා ලුහුබැඳැ එති යි පසුබලමින් දිවන් නාහු පන්සල් පිටිපස්සට වැදූ හයින් එතන ද සිටැගත නො හී වනලැහැබයකට වැදූ සැඟවුනාහ. බැලූ බැලූ දිශාවෙන් බමුණා දිවන්නා සේ පැනෙන්නේ එතන ද හයින් සිටගත නොහී අනේ අනේ නඟඬ! කුමක් කරමෝදැයි කියමින් වෙවුලමින් හඬාගෙණැ දිවන්නාහු සතරැස් පොකුණට වැදූ ඇපි සිටිනතැන් ඔවුනොවුන් නොපාම්හ යි දෙන්නා බැණැ ගෙණැ උනුන් අත එල්බ ගෙණැ පොකුනේ කරපමණක් දියට බැසැ නෙලුම්පත් හිසලා ගෙණැ සැඟවිගෙණැ කන්දි සොල්මන් අස අසා අද අම්මඬින් දුටු සින නපුරැයි කිවි බැහැරට නො යන්නට කිවුය. බිසපත්ව යි අපපඬිට බලන්නට පාවාදි හියෝය. අම්මඬි අප හා සිහිකරව. අම්මඬි අප වැලි කෙළිනි සිතත්දෝ හෝ මෙවැනි දුක් වූ බව නො දනිද්දෝ හෝ අප හා පුරුදුවන දෙවියෙනි! නොපි වහා දිවැගොස් අප දෙදෙනා රැකැ අම්මඬිට කියා වහා හැරගෙණැ එව. අපි උන් දැකැ පියා පාපිට හී හඬාපියා උන් කිවක් කරම්හ යි.

මෙසේ බැඟැපත් කඩින් හඬ හඬා වෙවුලමින් කර පම ණක් දියෙහි සැඟවී සිටියහ. බෝධිසත්ත්වයෝ දරුවන් සැඟ වුනු බව නො දැනැ බමුණාට දන් දෙන්නටය යි කැඳවූහ. දරු වන් නොබිණූ හෙයින් බමුණු සිටැ කියන්නේ වෙස්සන්තර යෙනි! නොප සේ වූ 1 බොරුවෝ මේ මුළුරට නැත. තෙපි හිහි ලාලා දරුවන් සඟවා පියා නොදත් වැනිවැ හිඳැ දරු වන් කැඳවා ද? මෙසේ තන්වැසිකම් දන් දෙනා නොප සේ වූ කෙණෙකුන් නොදුටු විරිමි යි කියා බිණූය. ඉක්බිති බෝධි සත්ත්වයෝ බොරු කියහ යන බසට ලජ්ජාවැ හිඳැ කියන්නා බමුණ මා දන්සොඬ හෙයින් හා මැනියන් ඊ නැතිවන්නා තාගේ රළුකම් සිතා භයපත්වැ පැලවන්හ. තෝ මදක් හැල් මෙව යි කියමින් නැඟිසිටැ.

පන්සල් පිටිපස්සට ගොස් වල් ලැහැබට වැදූ එහි නො දූකැ දරුවන්ගේ පියෙන් පියෙන් ඝෝසින් පොකුණට ගියබව දූකැ මෙකප බුදුවන මුළුලොවට ශාන්ති එළුවන ඒ මහතානෝ ලය වහවා ගෙණැ හඬගහන්නා වූ මපුතුයෙනි! ජාලියකුමාර යෙනි! හඬහාලූහ. බුදුවන ජානියෙහි රහල්කුමාර වන මහ පිණැනි වූ ඒ රාජකුමාරතෙම පියානන් හඬගැ එකහඬ අසමින් බමුණු මා දිවිගණුව යි මා ගැනි කෙරෙව යි මපියානන් වහන් සේ ලූ හඬ අසා නො සිටිමි යි සිතා එම් අපපඬැයි කියමින් දෙ අතින් නෙළුඹුපත් පිඹිරිගෙණැ පොකුණෙන් නැඟී අවුදු පියා නන් දකුණුපය වැදූ ගෙණැ හෙවැ හඬන්නට වන්හ.

බෝධිසත්ත්වයෝ පුතනුවන්ගේ හඬ අසා ල කම්පාවැ සිත් සංහිදුවා ගෙණැ කියන්නාහු පුත! නොපගේ නැගණියෝ කොයිදැ යි විචාළහ. ජාලිය කුමාරයෝ පළමුව නො කියම්හ යි දෙන්නා බැණගත් හෙයින් පියානන් වහන්ස! මරණ භයින් පලායන මෘ ඉජානිහු උනුන්ට කියාලා පලද්ද? අපවද වූ දූ එබන්දක් වැන්නැයි කිහ. බෝධිසත්ත්වයෝ ඒ අසා මාගේ දියණියනි! කණ්හාජිනාවෙනි! යි හඬහා ලූහ. මතු බුදුවූ කල තමන් සස්නෙහි උපුල්වන් වණ්ණවෙරිනියයි ප්‍රසිඬවන ඒ මහා පිණැනි දියණියෝ පියානන් හඬගැ හඬ අසා බමුණා මා දිවි ගණුව යි මා මිඬිකරව යි මපියානන් වහන්සේ ලූ හඬ අසා සිටිමිදැ යි හිස ලූ නෙළුම්පත් හැරිපියා ශ්‍රී දෙවිදුවක නැංගාක් මෙන් අවුදු බෝධිසත්ත්වයන් වම්පය වැදැගෙණැ හඬන්නට වන්හ.

---

1 බොරු දන්නේ-ඉං. 2 රන් පියුමක්.

දරුවන් දෙන්නා හඬා වගුළ කඳුළු බෝධිසත්වයන්ගේ නෙළුම් පෙති වැනි දෙපත්ලෙහි වැහිරෙයි. බෝසතාණන් දරුවන්ගේ දුක් බලා හඬන්නාවූ කඳුළු 1 රන්පිටාටු වැනි දරුවන් පිට වැහිරෙයි. මෙසේ හඬා වැලපෑ සිතන්නාහු මා හැඹු හෙයින් බුදුබව නොසෑදෙයි. දරුවන් දෙම් සිතා හඬ මින් හොත් දෙදරුවන් වඩා ලෙහි හොවා ගෙණෑ සිඹෑ සන හා පියා මනහර වූ මාගේ දරුවෙනි! මා දන්සොඬ බව නො දනු ද? මේ සංසාර නැමැති සාගරයට තොප පසුරක් කොටැ ගෙණෑ ගොඩ දක්මි. මම ගොඩ දැකැ තොප ඇතුළු වූ දෙවි බඹු නා ගුරුළු මිනිසුන් ගොඩ දක්වම් යි කියා දෙදෙනා වටනා මිළකොට ලා පන්සලට කැඳවා ගෙණෑ අවුදු කෙණ්ඩකා වෙන් බමුණු අත පැන් එව සිත්කළුවූ මේ දරුවන් දන් දුන් පිනින් ලොවුතුරා සම්මාසම්බෝධියට පැමිණෙම්වා යි කියා දරුවන් අත් බමුණු අත පිටැ තබා දන් දුන්හ. මෙසේ දරු වන් දන් දෙත් ම ලය කකියවා හඬන පසුපාත මිඩියක සේ මහපොළොව හඬන්නට වන. මෙරු මඳුරුදි පර්වතයෝද දරුශොකයෙන් හඬා වැනෙන්නෝ සේ සැලෙන්නට වන්හ. දෙවියෝ ද සතුටුවැ මල්වැසි වස්වමින් සාධුකාර දෙන්ට වන්හ මෙසේ දරුවන් දන් ගෙණෑ නික්මැ ගෙණයෙමින් සිටි බමුණු සෙලෙකින් බස්නේ පැකි ලැ මුනින් වැටිහිනි.

බමුණු නැගී නොසිටිනාතෙක් දරුවෝ දෙදෙන දිව ගෙණෑ අවුත් පන්සලට වැද බෝධිසත්වයන් දෙපත්ලෙහි වැටී නී හඬ හඬා කියන්නාහු සැමිනි! අම්මා නපුරු සිතයක් දැකැ නුඹවහන්සේට අප පාවාදී එකලා වල් යන්නවුන් කී බස් නුඹ ද දෙස් නොවේද? අපඹ! දැන් සිහිනැද්ද අප නුදුටු අමඩින් ලය කෙසේ නිවී සැනහේද? අමඩිත් අකල උන් වැදෑ ගෙණෑ හඬාපියා අපගේ දුක් පෑ පියනතුරු අප රැකගන්න. නුඹ හැරැපියා කොයි ගොස් හැලී යමෝද? මදක් හැල්මෙන් නකව දන්වම්. මේ මේ අවලක්ෂණ බමුණාට අප නොදී අනි කක් හට දෙන්නේ. මුගේ සිසකේ තඹවණ. ඇස් පිඟසිය. වම්පරැ සිය බැමරැදුය, බුන් නාසාය, කන්රොඹුරුය, දත් බොලුය, පිටින් වකය, බඩින් වකය, උසය, බඩ මහතය, පා බකලය, නිය විරිතිය, මෙසේ අවලක්ෂණ වූ යකුට අප නො දෙන්නේ නො වැළකම දන් දෙන බැවින් මා දෙන්නේ

---

1 රන් පියුමක්.

මා නැහණියෝ ඉතා සිවුමැල්ලෝය. තමන් මොළකැටි හෙයින් මිඩි මෙහෙ නොකොටැ හෙනි. ම නහතට වැඩිමාලු හෙයින් මම දුක් ගතහෙමි. උන් කරණ මෙහෙද මම ම කෙරෙමි. ඝෘෂ්ණජිනාව මිඩි වූ කල සිවිමහ රජවංශයට පරිභවය. ම නහුන් රැකැ මා උඹට ගැනිකොටැ දුනමැනව. අම ඕන්ට මා දුන්බව කියා ම නැහණි ලා බැණ අස්වසා අමඩින් රැක පියන්නැයි කියා හැඬූහ.

බොධිසත්වයෝ මෙතෙක් දෑ සියතුන් නො බැණ හුන් නාහ. ජාලිය කුමාරයෝ කියන්නාහු පියාණන්වහන්ස! මා මෙතෙක් දෑ කියතුත් නොබැණනදැය. නුඹවහන්සේගේ ලය හලෙකින් කෙළෙඳ යපනින් මැසූයේ ද? මේ කුමන නම් දුඩිකමෙක්දෝ හෝ නුඹ මියෙන් නොබැණ හිඳිනට කවර වරදක් කෙළෙම්දැයි කියා මෙසේ හඬමින් සිටි තැනට නිෂ්කරුණ වූ එ බමුණු 1 රෙද්දු තමා හුණ තැනින් සෙමින් නැඟී සිටැ දෙදන වැලමිට වැලිපිසැ ලේහුණු තැන්බලමින් දෙවැලමිට නලළ ලේ පිසමින් පිටතොල් කමින් වැලක් දනින් කඩා ගිපලක් හැරිගෙණැ යමයකු සේ අවුදින් වැදූ ගියේ. දරුවෝ උඹ දැකැ භයපත්වැ වෙවුන්ලට වන්හ.

මෙසේ සිටි දරුවන් හසුකරණකල ජාලිය කුමාරයන් ගතදී නැහණියෝ හසු නො වෙති. නැහණියන් හසුවුව ජාලිය කුමාරයෝ හසු නො වෙති. හසුකොටැ ගතනොහී රැහණිවැ බෝධිසත්වයන් බල බලා ගින්දදී දෙබිගින්නන් අසුකොටැ ගෙණ වැලකින් බඳිනේ කුමාරයන් දකුණත හා එලඳ කුමාරිය වමත හා දැන එක්කොටැ බැඳැ ගෙණැ ඉපලකින් මර මරා කර අල්වා දමමින් යමපලකු සේ ගෙණැ යන්නට වන.

බැනන් පිට ගැසූ පහර නැහණියෝ පිට ලවා ගණිති. නැහණියන් පිටට ගිපල ගැසුව බැනෝ තමන් පිට ලවා ගණිති. රාහු විසින් ගැලනලද නොනැවත යන හිර සඳ සෙයින් යෙමින් යෙමින් සිටැ පෙරළී පියාණන් බලමින් පියුම් පෙති වැනි අත්සුඟින් වඳිමින් අප පිටින් වැඟිරෙණ ලෙහෙ බලන්නේ අතබැඳි අලුව බලන්නේ මුයෙන් නොබැණ හිඳින්නේ අපඩ! මේ යකු අප කා මරා පියනතුරුද අම්මඬින්ට අප

1 බමුණු නරියා—රෙද්දු.

වැදෑ සමුගත්බව කියන්න. අප සුවපත් බව ද, නැවත දැක් මක් නොවනබව කියන්නැයි මෙසේ කියා හඬමින් යෙමිනුත් සිටිසඳ බෝධිසත්ත්වයෝ දරුවන් දෙදෙනාගේ දුක් බලා ලය කකියවා.

අනේ! බමුණකු ඉතා දුඩි නියාය. මා ඇස් ඇවැසෙහි මෙසේ දුඩිවැ මරන්නෝ ඔබ්බෙහි කුමක් නම් නො කෙරේද? එනකල අප දෙදෙනා ඔවුන් ආ දරුවෝ දැන් කඳු බැවිල් කවුබොරළුයේ කෙසේ නම් යේදෝ හෝ සසින් වීඩා වූ දරුවන් කවුරු නහවා කිරි පොවිත් දෝ පතුල් ඉදිමුනු දරුවන් කෙසේ කවුරු සතපා වඩාගණිත් දෝ හෝ සුළං අවුකා වෙවුලන දරු වන් කවුරු සනහා නලවාගණිත් දෝ මැණියන් තන මැදු සැනසුණු දරුවෝ අද රෑ කොතැනක වැද හෙව නිදත් දෝ දරු සෙනහයෙන් මාපා පිවිනි හඬා පෙරළෙන බිසවුන් කෙසේ නම් කියා අස්වසම් දෝ හෝ යි මෙසේ මහත් වූ ශොකයෙන් සිතන්නාහු බමුණු බැඳෑ හොවා පියා දරුවන් ගෙණෙව මැන වැසි සිතා නැවත ඒ ක්ෂණයෙහි සිතන්නාහු මනාකොටැ දන් දී තපස් රකින්නාහු සිත් කලකිරුවත් ද?

පෙර බුදුවන උත්තමයෝ ද පළමුකොටැ දසපෙරුම් දස උප පෙරුම් දසපරමත් පෙරුම් යි සමතිස්පෙරුම් පුරා පඤ්ච මහා පරිත්‍යාග කොටැ බුදුවූහ. මම ද එසේම බුදුවෙමි සිතා මහත් වූ ප්‍රඥ උපයා මා සිතූ සේ ඉතා නපුර. බුදුබවට හේතු වූ පාරමිතා නැමැති සාගරය පිනා හොඬ දක්නා සඳ සිහිල් පොකුණෙක. දියෙහි ගැලුණු සෙයින් මා සිත වෙන් වෙන් කෙරෙම්දැයි ඒ සිත් දුරුකොටැ ලුළුලොව සත්තෙකුට නො පිළිවන් වූ මී නියා දරුවන් දන් දින්මි. ඒකාන්තයෙන් මේ දැනය බුදුබවට හෙතුවේවා යි සිත සිතා සතුටුවැ ගස් සෙව නක වැද හුන්හ.

දරුවෝ දෙදෙන යෙමින් සිටැ තමන් කෙළ ඇවිදි වෘක්ෂ සෙවනලු බලා කෙළි වලන් බලා ගල්ගුහා බලා මැරියෙන් හැඹූ ඇතුන් අසුන් බලා රථගොන් පෙතැල්ලන් ගිරවුන් වන මෘගයන් සතරැස් පොකුණු දැකැ කියන්නාහු මනහර වූ මල් පිපෙන වෘක්ෂයෙනි! තොප හා පුරුදුවැ තොප මුල්හී වැලි කෙළ අදින් වියෝ වූ දෙබිහින්නමු. තොපට වැදෑ සමු ගණුම්හ. පැහනුදුල වැලිතලායෙහි අප දියකෙළනා මනහර

ගඟුල් හැල්ලෙනි! නොප අතින් සමුගෙණැ ගැනිවී මෙහෙයට යම්හ. මිහිර හඬන කුරවි කෙවිල්ලෙනි! අත්වල ගස ගසා අප ඉදිරියෙහි නටා බස්නා ලියකින්නරාවෙනි! අප දෙන්නා අපගේ අම්ඩින්නට වැඳැ සමුගත්බව කියව.

අනේ! වන දෙවියෙනි!! අප හා පුරුද්දෙනි!!! අම්ඩින්ට අපගේ පතුල් ඉදිම නොයාහෙන බව කියව. අප විඳිනා සුව කියා අම්ඩින් එතොත් මේ මඟ හොත් සේ හඬා දිවන්නට කිය වයි. මෙසේ හඬමින් වලප්මින් කැටිවැ කෙළිනා වනමෘග යෙනි! කෙළිවල නිදි සතරැස් පොකුණෙහි අදින් නොප කෙරෙන් වියෝවුම්හ යි කියා සමු දෙමින් යෙමින් සිටිසද.

අකුරු බොරළු මිශ්‍ර වූ මඟ ගොස් දරුවන් මිරිකුණු සේ බලා මඟ දෙපැත්තෙහි පිනිගත් වෘක්ෂ වලප්නා වැන්න. වන වෘක්ෂයෙහි බොහෝ බරවැ බමර රවට පිපෙන මල්මුව විවෘතකොටැ මද්‍රදේවීන්ට දරුවන් ගියබැවි කියන්නා වැන්න. ඒ වෙනෙහි පක්ෂි මෘගයෝ දෙබිගින්නන් කෙරෙන් වියෝ වූ ශොකයෙන් මහහඬින් හැඬුහ.

ඉක්බිති වලට ගිය මද්‍රදේවී සිතන්නාහු රෑ මම නපුරු සිහිපත දිටිමි. මා දරුවෝ වහන්සේ කෙරෙන් පන්සලින් පිටත්වූ දෝ හෝ යි ලය කකියවමින් වනමුල් වනඵල ගෙනා සද අත ඝනුල වැටියෙයි. පෙට්ටිය වැටියෙයි. දෙව්විල්ල වැටියෙයි. දකුණැස මස් සැලිණ. මා දෙපය වෙවුලයි. හෘදය කකියයි. එනකල නුනු වැළකිය, මේ පළිනයෙහි දේවතාවියෙනි! මට කිමෙක්දෝ යි ලය කකියවමින් පන්සලට, එන සද ශක්‍රදෙවේන්‍රතෙම දිව්‍යපුත්‍රයන් තුන්දෙනකු කැඳවා ලා කියන්නේ බොධිසත්වයෝ දරුවන් දන් දෙමින් සිටි සහ. එතනට බිසවු ගියේ නම් නපුර. නොපි හොස් සිංහ ව්‍යාඝ්‍ර වලස්වෙස් මවාගෙණැ මඟ අවුරා වැද හොවයි සම්මතකෙළේ. දෙවියෝ එසේ ම වෙස් මවාගෙණැ මඟ අවුරා ගෙණැ වැද හොත්තහ.

බිසව් එන්නාහු මඟහොත් හයඬකර රු දකැ කියන්නාහු ඔම යම් දවසෙක් මේ මඟ එනකල මෙසේ වූ සතු(න්) නුදුටු විරිමි. මා දක්නෝ මුවන් මොණරුන් වළිකුළන් වදුරන් දකුත් මුත් මෙසේ වූ සත් කෙණෙකුත් දුටු විරු නැත. මේ වෙනෙහි වෘක්ෂ දෙවතාවෙනි! පළිත සිඛරයෙහි දෙවියෙනි!

යවව රමයන්ට සිතාවන් සේ මාගේ සවාමින්ට පනිවුතා වී නම් කුඩාවරිනි! මඟින් ඇලව යව යි මහත් කොටැ හඬාද නොයන හෙයින් අනික් යන මඟක් නැත්තෙන් පෙරමඟට දරුවෝ අවු නම් නපුර. මම මේ මඟ හොත් සතුන් විසින් නොයා හෙම්. ලය කකියවා තුමූ ම නැඟියෙත් දෝ යි සිතා සිවැකියන්නාහු දරුවෙනි! නොප මැඩපිය කොටැ වනාන්තර ආවෙසසනතර රජ්ජුරුවන් අඹුයෙම්. තොපගේ මවුම්. නොප මුත් මාගේ නෑයෝ නැත. මා නුදුටු දරුවෝ නො හැම මෙති. රෑ නොවෙන තුරු මා නැඟි යා දෙව යි කිහ.

එසේ කිව ද නොයන හෙයින් වැලපෑ මහත් කොටැ හඬා අත්පොළසන්දී නොපට කුමන වරදක් කෙලෙම්දැ යි පනිවුතාවන් එසේ කියත් ම මෘගජානිහු භය ඇතිවැ නිදු පුබුද්දන් සේ පිටට හැඹී හිර බටබව දුනැ නොපැණී නැඟිගියහ. ඉක්බිනි මදුදෙවි වනමුල් වනඵල ගෙණෙමින් මා දරුවන් මඟ මෙතන දකිම් දෝ මෙතන දකිම් දෝ හෝ යි සිතා මඟ නොදැකැ ඔබ්බට ගොස් මා දරුවන්ට කිමෙක් වී දෝ හෝ යි කියමින් 1 මිඟිරි බස් මා කණ නොහෙයි සඳක් වැනි වූ මුහුණු නුදුටු යෙම්. පෙර කෙළනා වූ වෘෂමුල නොදක්මි. ජාලිය කුමාර යෝ පෙරමඟට අවුදු අම්ම! 2 පල නැද්දැයි ගින බලති. කණහජිනාවෝ අවුදු තනය ගණිති.

මේ නුගරුක්මුල වැලි කැවිකොටැ කෙළනා තැනයි 3 හඬමින් ගොස් පන්සලට වැදැ තෙනෙහි කිරි ඉස්මින් සියලඟ වෙවුල්වමින් මුවය වියලී ල කකියා වහන්සේ කෙරෙන් නැත්නු යි කොතැනෙක නිදිගැන්වූදැ දෝ යම් රුකක්මුල හෙවැ නිදත් දෝ හෝ ඇත් ගිජුලිහිණියෝ ගෙණෑ ගියේ දෝ මුතුන් මිත්තන්ගේ රවින් අවුදු ගෙණ ගියේ දෝ හෝ යක් බූ ප්‍රෙත යෝ ගෙණෑ ගියේ දෝ ලදබොලඳ මිඟුරු බසක් කවර වියෙක අසම් දෝ හෝ ලදබොලඳ සිනාවක් හා ඇසියෙම් දෝ හෝ අමඬ! අපබැයි යන බසක් හා ඇසිය හෙම් දෝ හෝ ලසදක් වැනි මුහුණ දැකැ පියහෙම් දෝ හෝ යි කියා හඬමින් වැලපැ බෝධිසතතවයන් විචාරන්නාහු සවාමිනි! දරුවන් සිහන්නන්ට දන් දුන්දැ දැයි විචාළහ.

බෝසතානන් මියෙන් නොබැණෑ හිඳිනෙන් කියන්නාහු වහන්ස! මා දරුවන් නොදක්නා ශොක තබා නුඹ වහන්සේ

1 ලදබොලඳ බසක් නොඇසිම්. 2 අඹදඹ. 3 ඉලමින්.

නොබණින ශොක මට ඉතා බෙහෙව යි හැඬූහ. මෙසේ හඬතුදු එක බසකුත් නො කියා වැඩහුන්හ. ඉක්බිති බිසව් කියන්නාහු වහන්ස! පෙරැ ගිනි දර පැන් ඇතිකොටැ ගිඳිනා දැය. අද මුයෙන් නො බැණැ ම හුන්දැය. මා එනතුරු දරුවන් රකිමි යි මට වරදුන්දැ වේ ද? දරුසන්නව මා හඬා විචාර තුදු නොබැණ වැඩගිඳිනාදැය. නුඹ මා දරුවන් කැඳවා එලා එල වැලඳුව මැනව. නුඹ නොබැණනදැ නම් නුඹ කෙරෙන් මාගේ ප්‍රාණය දුරුකෙරෙමි යි කිහ.

එසඳ බෝධිසත්වයෝ සිතන්නාහු මොවුන් දරුවන්ට සෙනහ ඉතා බෙහෙව. දැන් ම දරුවන් දුන්බව කියම් නම් ල පැළි මළහොත් නපුරුයි සිතා කාලක්ෂෙප කොටැ කියන්නාහු නෙපි වනමුල් වනඵල පිණිස එවේලෙහි ගොස් මෙවේලේ සඳපහන ආවව. අදම දරුවන්ට සෙනහ බොහෝවී ද නෙපි පඤ්චකල්‍යාණයෙන් යුක්තවූ රූපසම්පන්නයව. මෙවෙනෙහි මලදරුවෝ ද සෘෂිවරයෝ ද තපස්වී ද ඇත. මේ වන යෙහි මා අසැපයෙන් වසන බැව් නෙපි මතු දන්ව යි වදළහ.

එබස් අසා මද්‍රි දෙවී මා ලස්වූව යි නොබණනදැ වනැ යි සිතා කියන්නාහු සැමිනි! මම වේලේම ආම්. මේ වෙනෙහි ඝතුන් මහත් කොටැ හැඬූ හඬ අසා මා දරුවන්ට කිමෙක්දෝ හෝයි සිතා ල කකියවා එමින් සිටිසඳ වග වලස් සිංහයා තුන්දෙනෙක් මා එන නො දී මග අවුරුවා හොත්හ. එයින් ලස්වීම් යි කිහ.

මෙසේ කියතුදු නො බණන විසින් ල කකියවා වෙවුල මින් හඬාගෙණැ පන්සල පිටිපස්සට ගොස් හඬගසන්නාහු මාගේ ලයක් වැනි ජාලිය කුමාරයෙනි! සිවුමැලිවූ කෘෂ්ණාජිනා වෙනි! යි මහත් කොටැ හඬගසා තොප නහවන්නට වලින් කසා ගෙණම්. මාගේ කනකමය වැනි වූ කුමාරයෙනි, මා කම්කිළිය කරා නොඑවුදැයි හඬලා මෙවන් බසක් නොලදින් මාගේ දරුවන්ට නැස්මෙක් වී වනැ යි නියතකොටැ සිතා රාත්‍රියෙහි මහත් සෝදුකින් හඬා ඇවිදිනාහු.

මා දරුවන් කෙළනා පොකුණුය යි පොකුණු බලා මා දරුවන් හා එක්වැ කෙළනා මුවපොල්ලෝය යි මුවන් බලා මා දරුවන් කෙළනා රුක්මුලය යි රුක්මුල් බලා නො දැකැ මහත් කොටැ හැඬූහ. ඒ හඬ අසා වල පක්ෂිහු මෘගජාතීහු

මාහඬින් හඬනැඟුහ. ඉන් ඔබට ගොසින් මා දරුවන්ට නටන මොණරුයයි මොණරුන් බලමින් මා පැවැත්නිය් ලද දියණියන් බස් වැනි කුරවි කෙවිල්ලෝයයි කුරවි කෙවිල්ලන් බලමින් මාගේ දියණියන් ඇස් වැනි යහපත් වූ ඇස් ඇති මෘගාඛනාවෝය යි රැළගියන බුවන් හා බුවදෙනුන් බලමින් මා දරුවන් හා එක්වැ ඇවිදිනවුන් දක්මින් මාගේ දරුවන් නො දක්මි යි බියවූ මහහඬින් හඬා හී සිසන් නැතිවැ මදවිඟස කින් සිසන් ලදින් මා දියණියන් කෙළනා කෙළිවලනැයි කෙළිවලන් බලමින් ම පුනනුවන් හා කෙළනා මැපියෙන් හැඹූ රථ අශවයෝය යි ඇතුන් අසුන් බලමින් මා දියණියන් කෙළනා මැපියෙන් හැඹූ ගිරවුය යි ගිරවුන් බලමින්හලාහලව බඩ අත්සපා හඬාගෙණැ බිමහී නොඑක් වාරයෙහි හඬාහී රාත්‍රියෙහි ගල්කැටපහණ ගැසී හැල්දෙළින් කදුබැවිල් හා හෝ මේ ආදී සථාන බලබලා වංකපවීතයෙහි පසලොස් ගවු වක් මානයෙහි සඳපහණ තුන්විටක් වටකොටැ ඇවිදැ බිසවු දරුවන් සොයා ඇවිදි බෝසතානෝ ඇසිපිය නොබහා නිදි විගෝවැ හුන්නාහු පහන්ව හිරු අබස්පාමින් සිවි වේලෙහි බෝසතානන්; පාමුල බළලකු ගත් කිකිළියක සෙයින් වෙවූ ලා හඬාපි සිසන් නැතිවැ හොත්හ.

බෝධිසත්වයෝ මදු දේවීන් හොත් විලස් දැකැ ල කණි යවා මෙවෙනෙහි මා නැකෙනෙක් නැත. තොප නැකෙනෙක් නැත. තෙපි මේ වනානතරයෙහි මළාදැයි කිය කියා සිත් කැළඹී බෝසතානෝ මහා ශොකපත්වැ 1 නැණ විශෙෂ යෙන් ශොකදුරුකොටැ නෙළුම් පොකුණට ගොස් දිය ගෙණැ හැරැ සත්මසක් රැකි බ්‍රහමචරියායෙහි ඇලුම් නොකොටැ මදු දේවීන් උර හොවා ගෙණැ නෙළුම් පියුමක් වැනි අත් ලෙහි අත් තබා මුහුණ දිය ඉසැ අතින් ලෙහි දිය ගහා පිසපියා සිතන්නාහු සිවිරට හෙවැ මළා නම් වෙනියරට හෙව මළා නම් මහාරාජපෙරහරින් දවන්නාහ. මා හුදකලාවූව මේ වෙනෙහි කුමකෙරෙම් දෝ හෝ යි මෙසේ මහත් වූ ශොක යෙන් තැවි තැවී හුන්කල බිසවුන් කල්යාමෙකින් සිසන්න ලදින් කියන්නාහු වහන්ස! මා දරුවෝ කොයිදැයි කිහ.

---

1 ජාති විශෙෂ.

එසඳ බෝධිසත්වයෝ කියන්නාහු දේවිනි ! ඉතා වමයා වෘඩ්වූ මහළු බමුණෙක් තිස්යොදුනක් තැන් මග ගෙවා දන් පිණිස ඇවුට දරුවන් දිනිම් සි වදුළහ.

ඒ වේලෙහි ම මහපොළොව හඬා ගුගුලේ. සියලුදෙව්යෝ සාධුකාර දුන්හ. මහාමේරු පර්වතය ද සපතකුලපර්වතයෝ ද රැව් පිළිරැව් දී නටන්නට වන්හ. දේවිනි! දානපාරමිතාවන්ට යම් සිතක් නොසිතා පින් අනුමොවව සි කිහ. බිසවු කියන්නාහු සවාමිනි! මෙසේ නොකියා මා හඬා ඇවිද්දදී නොබිඳුණු දැනු සි කියමින් දෙහොත් මුදුනෙහි තබාගෙණ සාධු සාධු පින් අනුමෝවීම් සි කියා අනුමෝවා ගෙණ කියන්නාහු සවාමිනි! දරුවන්ට වැඩි දසයෙන් සියෙන් දහසින් ලක්ෂයෙන් බුදුබව වේ ද! උත්තමයසි කියා සතුටුවා බිසවුන් සිත් සංසිදුවා ගෙණ කියන්නාහු සවාමිනි! මට පින්කම් දෙනදැද? මුළු තුන් ලොව සියලු සතුන්ට ද පින් දුනමැනවැසි පින් දෙව සි සිත් ප්‍රසන්නාකොටා දානපාරමිතා මුදුන්පත් කළහ. සියලු දෙව්යෝ සතුටුවා සාධුකාර දී පින්ගෙණ මල්වැසි වැස්වූහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයා සිතන්නේ බෝධිසත්වයෝ තමන්ගේ දරුවන් දෙදෙනා බමුණුට දන් දුන්හ. බිසවුහු යමකුට දුනහොත් නපුරුයි සිතා දිව්‍ය ශරීරය හැර මහළු බ්‍රාහමණ වෙශයක් මවාගෙණ සැරයවියෙක් එල්බගෙණ අවුදු ගමන මිරිකිනිම්. රජ්ජුරුවෙනි! කොයි හුන්නාහුදැයි කිය කියා ලඟව ගොස් බෝසතානන් දැකැ කියන්නේ කරුණු මදද? වනමුල් වනඵලාඵල ලැබෙද්ද? වෙනෙහි සතුන් විසින් උපද්‍රව නැද්දැයි කියා පුළුවුන. බෝධිසත්වයෝ කියන්නාහු තා කී හැමදෙයෙන් ම ගහට නැත. නොප අකා යසය කිමෙක්දැයි වදුළහ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! ඉතා වෘඩයෙමි. ගමන මිරිකිනිම්. නොප අතින් රන් රිදි මුතු මැණික් ඉල්වා නො ආයෙමි. මාගේ ගෙයි මෙහෙකරණ වහළක් නැත්තේල. බිසවුන් මට මෙහෙකරන්නට පාවා දෙව සි කිහ.

බෝසතානෝ කළමනා කිම්දෝහෝ සි සිතා බිසවුන් මුහුණ බැලූහ. බිසවු බෝධිසත්වයන් සිත අභිප්‍රාය දැන කියන්නාහු සවාමිනි ! මවුපියෝ සත්‍රුන්ට දෙස් වැස්සහ. නැයෝ නම් තමාගේ සවාමිභූමය. පින් සදහා දන් දෙත් ම (මනා) මය වයතු සදහා විකුණත්මය (මනා) මය, සැමියන්ට

ඉන් වන දෙඟයක් නැත. නුඹවහන්සේට අභිමතයක් කළ මැනවැ යි කීහ. එසේ කියත් ම ඛෝසනාගෝ සතුටුවැ අත පැන් එවැ පිඟුමක් වැනි වූ බිසවුන් අත ගෙණැ එකාන්තයෙන් සම්‍යක් සම්බෝධියට පැමිණෙ සියලු ලෝවැස්සන් නිවන් පුරෙහි පිහිටුවාලිය හෙම්ව යි පතා ගෙණැ බුදුරජාට දන් දුන්හ.

මෙසේ බිසවුන් දන් දෙත් ම මහපොළොව සතුටුවැ ගුගුළේ. මේරු මන්දරාදි සපතකුල පර්වතයෝ සතුටුවැ නටත් නට වන්හ. සදෙව්ලොව දෙවියෝ සාධුකාර දුන්හ. බුදුරජුන් කියන්නේ රජ්ජුරුවෙනි? තොප දන් දුන් බිසවුන් මා සන්තක යෝ ය. තොප සන්තක දෙයක්වුත් අනුන් සන්තක දෙයක් නො දිය හැක්කේ වේ ද? මා එනතුරු බිසවුන් තොපට ම පාවා දින්මි. තොපි මුන්ට සුදුස්සව. මූ තොපට සුදුස්සහ යි කියා බිසවුන් බෝසතාණන්ට පාවා දී තමා ශක්‍රදෙවෙන්ද්‍ර බව හඟවා ශක්‍රවිලාසයෙන් සිටැ කියන්නේ රජ්ජුරුවෙනි! තොප දරුවන් දන් දුන්විට දෙලක්ෂ හතළිස්දහසක් යොදුන් ගනකඩ බොල් මහපොළොව මා හඬින් හඬා ගුගුළේ. එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහාමේරු පර්වතය ද සපතකුලපර්වතයෝ ද සතුටුවැ නැටූහ. තලාටු බුමාටු දෙවතාවෝ ද සදෙව්ලොව දෙවියෝ ද සොළොස් බඹතෙලෙහි දෙවියෝ ද සාධුකාර දුන්හ. තොපට එකාන්තයෙන් බුඩතත්වය සිඩවේයි. තොපගේ දරුවන් දෙදෙනා මුතුන් මිත්තන් කරා බුදුරජුන් ගෙණැ ගියේය. අනික් සත්වයකින් තොප කරා එති මාගෙන් ද අටවරයක් ගණුව යි කීය.

බෝධිසත්වයෝ ද 1 අටවරයක් ගන්නාහු දෙවෙන්ද්‍රය! එසේ වී නම් "මම රාජ්‍යයෙහි ප්‍රතිෂ්ඨිත වෙම්ව යි දසරාජධර්මින් වියෝ නො වෙම්ව යි පුතුන් ලබම්ව යි සියලු සත්වයන්ට උතුම් නොවන කරුණා ඇති වෙම්ව යි සියලු දෙනාම මගෙන් ජීවත්වනු ලබාවා සත්‍රුන්ගේ වසඟයට නො පැමිණෙම්වයි මිථ්‍යාදෘෂ්ටි ගත්තවුන් සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවම්ව යි කෙළවර නිවන් දකිම්ව යි" කියා වර ගත්හ.

---

1 දශවරයක්-ඝ-ජාතකඨකථායෙහි අටවරයෙකැයි දක්වයි-එය යොග්‍ය තර ගෙයින් මෙහි පහත සඳහන් කරමු.

1 වරඤ්චේව මෙ දදෙයක්ක! සබ්බභූතා න මිස්සර!
පිතාමං අනුමොදෙය්‍ය ඉතො පත්‍තං සකං ඝරං
ආසනෙන නිමන්තෙය්‍ය පඨමෙතං වරං වරෙ

2 පුරිස වධං නරොචෙය්‍යං අපි කිබ්බිසකාරකං
වජ්ඣං වධමහා ඒමාවෙය්‍යං දුතියෙ තං වරං වරෙ

මේ අටවරය දී ශක්‍රදෙවෙන්ද්‍රතෙම දෙවිලොවට ගියේ. **ජූජක** නම් බමුණු දරුවන් දෙබිගින්නන් ගෙණැ යන්නේ හිරු හසතයට යන වේලෙහි දෙවියන්ගේ ආනුභාවයෙන් එම දවස් සැටයොදුනක් නැන් ගොස් අඳුරු වූ කල දරුවන් ගෙණැ රුක් මූලකට වැදූ දරුවන් දෙදෙනා බැඳැ වනමඟ ගසමූලැ හොවා වඟුන් වලසුන්ගේ භයින් තෙමේ ගසට නැඟී ගස්පිටැ හෙවැ නිදිය.

දෙවතාවෝ දෙදෙනෙක් අවුදිත් මවුපියන් දෙදෙනා සෙයින් දරුවන් බැඳුමෙන් උනා සුවඳ දියෙන් නහවා (බදනා) මල් පලදවා බත් කවා මල් යහනේ හොවා බඩදී හෙවැ නිදි ගන්වා පහන් වූ කල පළමු බැඳි වනම හොවා නොපැණී නැඟී ගියහ. ඉක්බිති බමුණ පිබිදූ පාන් වූ බව දැනැ ගසින් බැසැ පියා දරුවන් ගෙණැ තමන්ගේ රටට යෙම් සිතා යන්නාහු දෙවිඹෝ තමන්ගේ ආනුභාවයෙන් සිව්රට ම ගෙණැ ගියහ.

එදවස් ම **සඳමහරජුනෝ**[1] සුපනයක් දක්නාහු "කලු මිනි සකු අවුත් 1 පියුම් දෙකක් තමන් අනට දුන්නා දැක ඒ කන්හි පැලැන්දූ ද එහි රොන් ගිලිහි උරෙහි වැටෙයි" දැකැ පිබිදූ පියා චතුවේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා ගෙණැ තමන් දුටු සුපනය විචාළහ.

---

3 යෙ වුඩ්ඪා යෙව දහරා යෙව මජ්ඣිම පොරිසා
මමෙව උපජීවෙයුං තනියෙ තං වරං වරෙ

4 පරදූරං නගවෙජ්ඣං සදූර පසුතෝ සියා
පිතං වරං නගවෙජ්ඣං වතුන්නෙ තං වරං වරෙ

5 පුත්තෝ මෙ සක්කජායෙථ සෝ ච දිසාඡුකෝ සියං
ඛමෙමන ජිනෙ පථවිං පඤ්ඤවෙ තං වරං වරෙ

6 තතෝ රත්‍යා විවසනෙ සුරිසසසුගහමනං පති
දිබ්බා හක්ඛා පාතුහවෙයුං ඡඩ්ඪෙතං වරං වරෙ

7 දදතෝ මෙන බියෙථ දත්වානානුතපෙය්‍යහං
දදං චිත්තං පසාදෙය්‍යං සත්තමෙතං වරං වරෙ

8 ඉතෝ විමුචව මාඛාහං සග්ගගාමෙ විසෙසගූ
අනිබ්බත්තී තතෝ අස්සං අඪමෙතං වරං වරෙ'ති.

1 රන්මල් දෙකක්.

බමුණෝ කියන්නාහු සාමිනි! තොප සිත් ප්‍රිතිවන දරුවෝ දෙදේනෙක් එනවන්හ යි කිය කියා බැණු හුන් තැනට **ජාලිය** කුමාරයන් හා **කණ්හාජිනාවන්** ගෙණු බමුණෝ ආයයි යනු අසා බමුණ ගෙන්වා ගෙණු දරුවන් දෙන්නා දැකැ සතුටුවැ බමුණ! මේ දරුවන් දෙදෙනා කොයි සිටැ ගෙණ්ඩි දැයි විවාළහ. බමුණු බොරුවක් කියා ගැළවුනු මැනවැ යි සිතා අනිත් රජකු නම් කියම් යි සිතූ සඳ දෙවතාවෝ නොකියාදි **විශ්වාමිත්‍ර** රජ්ජුරුවෝ මට දන් දුන්නෝය යි කියවූහ. ඉක්බිති බමුණු මේ කවර රටෙක් දෝ හෝ යි සිතා **සඳමහරජ** නන්ගේ රටබව දැනැ එතෙකින් මා දිවි නැත. කුම් කෙරෙම් දෝහෝ යි සිතා වෙවුලන්නට වන. **සඳමහා රජ්ජුරුවෝ** පුත නුවන් වෙනෙහි හිඳැ දන්දුන්බව සිතා. මහත් කොටැ හඬා කඳුළු පිසැ දරුවන් දන් දුන්බව නගරවාසින්ට කිහ. නගර වාසිහු අසා කියන්නාහු සාමීනි! ඒ උත්තමයා ලය ගල්තෙලේ දෝහෝ යි යපතකින් වැසූ දෝහෝ යි බමුණු මහල්ලකුට මෙවැනි දරුවන් දිපියා ඒ ලය කෙසේ වැහව් නිවී දෝහෝ ඇපි ඔවුන් හැළි ඇතු දුන් සේ නපුරු යි **රාහණී**වැ වංකගිරි පව්තයට ඇවුම්හ.

දැන් මෙවැනි මනහර වූ ලඳබොලඳ සිඟුමැලි දරුවනුදු දන් දුන්හ. මෙවැනි සිතක් ඇති උත්තමයාගේ ගුණ නොදැනැ නුගුණ කළම්හ. පෙර අප කළ නුගුණ පහකොටැ ගොස් ගෙණෙම්හ යි කිහ. නුවරවාසින් බස් අසා **ජාලිය** කුමාරයෝ කියන්නාහු අප දන් දෙන සාමිනු බමුණා කෙරෙහි කරුණායෙන් දුන්දැය. මපියානන් වහන්සේ දුඩිය යි කුමට කියාදැයි කිහ. එබස් අසා නුවරවාසිහු සතුටු සොම් නස්වැ සාමිදරුවෙනි! සිඟුමැලි කුමාරයන් වහන්ස! තොප පියානන් වහන්සේගේ නුගුණ නොකියම්හ. ඒ උත්තමයා යමකු විසින් නොකොටැ ගතහැකි තොප නියා දරුවන් දන් දුන් සේ ඉතා බැරිය යි ඔවුන්ට සතුතිකළ බවමුත් නුගුණයක් නොකිවම්හ. සාමිනි! ඒට ඍමාකරව යි කියා සිටිසද **සඳමහ රජානෝ** ඇසින් කඳුළු ගෙණු කියන්නාහු මපුතුන්ගේ මනහර දරුයෙනි! සිඟුමැලි මාගේ මුනුබුරෙනි! මෙසේ අවුත් මා කලවයෙහි හිඳුව යි කිහ.

ජාලිය කුමාරයෝ මුත්තනුවන්ගේ බස් අසා කියන්නාහු බමුණන්ගේ හැත්තොත් රජ්ජුරුවන්ගේත් ඔර හිඳිද්ද? මෙසේ සිටුමිහ සි කිසද නගරවාසිහු මහාශොක පත්වූහ. රජ්ජුරු වෝ ද වැලපැ වැලපැ හිදැ කියන්නාහු **ජාලිකුමාරයෙනි!** නොප දෙනකල නොපගේ පියානෝ කෙතෙක් මිළිකොටැ දුන්නුදැ සි කිහ. **ජාලිකුමාරයෝ** කියන්නාහු මට දැසක් දෙන්නට කීදැය. මා නැගණියන්ට මිළ උන් හාරයේ වසතු දෙන්නට කීදැය සි කිහ.

සඳමහාරජානෝ කුමාරයන්ගේ මිහිරි නෙපුල් අසා සතුටුවැ **ජාලිය** කුමාරයන්ට දැසක් දී **කිසාගෝතමීනාවන්ම** උන් හාරයේ රන් හා දැසි දැසාදින් හා බොහෝ වසතු බමුණාට දී දෙඛි හින්නන් ගලවා ගෙණැ ඉස් සොධා නහවා බත් කවා **ජාලිය** කුමාරයන් දකුණු කලවයෙහි හිදුවා **කිසාගෝතමීනාවන්** වම් කලවයෙහි හිදුවා සතුටුවැ සිඹැ සනහා **සඳමහා රජ්ජුරුවන්** කියන්නාහු ඒ උත්තමයා දන් දුන් ශ්‍රීවනත කුමාරයන් හා ශ්‍රී වනත නැගණියන් හා මා කරුම නැඟි ආ බව සිවිරට වාසින් ගේ හා මාගේ දෙවය සි කියා සතුටුවැ හිදැ බමුණා ඉස් සොධා නහවා තමන් කන පරිද්දෙන් රසබෝජනයෙන් බත් කැවූහ.

බමුණු තමා නොකෑ විරූ ආහාර බොහෝ කොටැ කා දිරවාගත නොහී රෑ මියගියේ, මළකල නොයෙක් පෙරහරින් දවා බමුණාගේ නෑකෙණෙක් ඇත්නම් මේ වසතු ගන්ව සි නුවර බෙර පියෝ කරවා නෑකෙනෙකුන් නොදැකැ ඒ වසතු භාණ්ඩාරයට ම ගෙණ ගියේ. එසඳ **සඳමහරජානෝ** කියන්නාහු **ජාලිකුමාරයෙනි!** නොපගේ මැණියන් හා පියානන් හා සුවයෙන් වෙසෙද්ද? ලෙඩදුක් නැද්ද සි සුළුවුත්හ.

කුමාරයෝ කියන්නාහු මුත්තනුවන් වහන්ස! අප ආ මේ දූතුරෙහි අම්මඬින් යමක්හට දන් නුදුන්හ සි නොසිතමි. මපි යානන් වහන්සේ නුඹ කෙරෙන් වියෝ වූ දුක් හා නපස්කිරීමෙන් වහළදැය. අම්මඬින් අවු පැහැරැ මලාගියේ නෙළුම් මලක් සේ මලානිකව ගියදැය සි කිහ. ඒ ලඳ බොලඳ බස් අසමින් රජ්ජුරුවන් හා නුවර වැස්සන් හා මහත් වූ ශොකයට පැමිණියහ.

ඉක්බිති **ජාලිකුමාරයෝ** කියන්නාහු සියලු සතුබවයන් තමන් තමන්ගේ දරුවන්ට ප්‍රෙම ඇතැ සි යෙති. නුඹ වහන්සේ දරුවන්ට ප්‍රෙම මදවනැසි කිහ. සැබව කඩැනිවරුනි! කිසි මදවරදක් නැති මපුතනුවන් නුවරවාසින් බසින් නෙරපි මි සි හඬා වැලපැ අමාත්‍යයන් කැඳවා කියන්නාහු **වංකගිරි පර්වතයට** යන්නට සැරහෙව.

සද්දවසකින් ගමනැසි කියා නුවර බෙරලවා යොධයන් 1 පන්දහසක් දෙනා රත් පිළි සුදු පිළි ආදිවූ නොයෙක් පිළි හැඳැ පලඳනායෙන් සැරහී පඤ්චායුධ ගෙණැ සැදි නොයෙක් ඇතුන් අසුන්පිට හිදුවා සිවුරඟ සෙනඟ පිරිවරා මහත් වූ යස සින් දිලිසෙමින් නික්මුණහ. අමාත්‍යයෝ මඟ සදන්නාවූ කළුවැලි පියා සුදුවැල්ලන් තවරා කෙහෙල් තැඹිලි පුන් කලස් ධජපතාකයෙන් මඟ සදා ක්‍රමයෙන් **වෙභාරයට** ගෙණැ ගොස් වන්හ. **වෙභාරඅධිපතිවරයෝ** ද දැකැ සතුටුවැ උපස්ථාන කොටැ සැටදහසක් රජදරුවන් ගෙණැ **සඳමඟ රජතුමන්** හා එක්ව ම නික්මුනාහ.

ජාලිකුමාරයන් හා **කෘෂ්ණාජිනාවන්** හා දෙන්නා ඇත් පිටට නඟාගෙණැ මහත් වූ රාජ්‍යශ්‍රියෙන් දිලිසෙමින් දරුවන් පළඹුකොටැතුමූ **පසුවැ** ගෙණැ ගොස් **වංකගිරිපර්වතයට** අසන් නවූහ. ඉක්බිති බෝධිසත්වයෝ හෙරිශංඛනාද තුසහී ඝොෂා හා ඇතුන්ගේ කුඤ්චනාද හා අසුන්ගේ හෙෂාරව හා රථචක්‍ර නාද හා මෙසේ මහත් ඝොෂා අසමින් කියන්නාහු දේවිනි! මපියානන් වහන්සේ මාළු විසින් අප 2 ම් වසන බව දැනැ අප කරා එන සතුරු කෙනෙක්දෝ හෝ **වංකගිරිපර්වත** යට නැඟී පරීක්ෂාකරව සි කිහ.

දේවි පර්වතයට නැඟි මහාඝොෂා අසා සැමිනි! නුඹට කවුරු සතුරුකෙනෙක් ඇද්ද? නුඹගේ පියවර මැඩැපියන සතුරු කෙණෙක් ඇද්ද? සැමිනි! එදවස **ශක්‍රදෙවෙන්ද්‍රයා** කියන්නේ අපගේ දරුවන් දෙදෙනා මුතුන්මිත්තන් කරා ගොස් වන්නැසි කිය. අදින් සත්දවසකින් නුඹවහන්සේ කරා එනී කියේ වේද? නුඹ පියානන් වහන්සේ (එන) ගමන් වන් නැසි කියා දෙදෙනා ඇඬිත් පන්සල හුන්නාහ.

---

1 සැටදහසක්. 2 විවාදකරණ බව.

සඳමහා රජ්ජුරුවෝ නැන්ගි නැන්ති ඇතුන් අසුන් විහිදුවා වංකපළුත ඇසන්නයට ගොස් ඇඹෙනියන් පූසනිදේවිත්ම කියන්නාහු දේවීනි! දරුවන් හා අප හා එකවිට දක්නා ශොක බොහෝ වෙති. මා ගොස් පළමුවැ උන් දැකැ ශොක සංහි දුවූ කල නෙපි එව යි කියා දහසක් රථපොළොව රඳවා තුබූ ගොස් බෝසතානන් පන්සල් කෙසරසිංහයකු සේ වැඩහුන් නන් දුටහ.

බෝසතානෝ පියානන් දැකැ හුනස්නෙන් නැඟී පෙර ගමන්කොටැ බැසැ හෙව වැඳැ හිඳිනා ආසන පනවා වඩා හිඳුවූහ. මද්‍රිදේවි ද මසිලනුවන් දැකැ බැස හෙවැ වැඳැ සිට සාමිනි! මා දරුවන් ගෙණගිය බමුණා කොයිදි දුටුදැයි කීහ. සඳමහා රජනෝ යෙහෙලනියෙනි! මාගේ රටදී!දැකැ බමුණාට රන්දී ගලවා ගනිමි යි කියත් ම බිසවුන්ට මහම් සොම්නස් උපන.

ඉක්බිති බෝධිසත්වයන්ගේ මෑණියෝ මහත් පෙර හරින් පන්සල් වන්හ. බොධිසත්වයෝ ද මද්‍රිදේවි ද වැඳැ ආසන පනවා හුන්කල ජාලිකුමාරයන් හා කණ්හාජිනාවන්හා ඇතුන්පිටට නඟා ගෙණැ දෙදෙනා පෙරට කොටැ ලා චෙතිය රජ්ජුරුවන් ඇතුළු වූ සැටදහසක් රජදරුවන් හා පන්දහසක් මහ යොධයන් හා හෙරි සංඛනාදයෙන් හා මහසෙනඟ පිරිවරා ගෙණැ එන කුමාරවරුන් දෙදෙනා දැකැ මද්‍රිදේවි හඬා පෙරමගට ගිය. මෑණියන් දැකැ දෙඛිගින්න ඇත්පිටින් බැසැ මෑණියන් දෙපත්ලෙහි හිස් තබාගෙණැ හඬන්නට වන්හ. බිසවුන් තෙනෙන් කිරිබාරා දෙඛිගින්නන් හිස් නෙමි ගියේය. දෙඛිගින්නන් නඟා සිටුවා සිපැගෙණැ මහත් වූ ශොකයෙන් හඬා හුන්හ. ඒ අසා සඳමහා රජ්ජුරුවෝ ද ඇඹෙනියෝ ද මහ හඬින් හඬා හුන්හ. චෙතිය රජ්ජුරුවන් ඇතුළු සැටදහසක් රජදරුවෝ ද මහහඬින් හඬා හුන්හ.

එදැක පන්දහසක් යෝධයන් හා මහසෙනඟ එකහෙළා මහපවනින් වැගිරගිය සල්වනයක් සේ මහහඬින් හඬා හුන්හ. ඒ වෙසතුරු මහරජානන්ගේ අණුවන්ගේ දුස්පත්කම් සිතා හඬන ජනයා සිසන්න නැතිවැ හොත්සඳ ශක්‍රදෙවෙන්ද්‍රයා අවුත් මුන්හැම සිසන්න නැතිවැ හොත් සේ බලා පොකුරු වැසි වැස්වීය. ඒ වැස්සෙහි තෙමහු කැමැත්තෝ තෙමෙනි.

නො නෙමෙනු කැමැත්තෝ නො නෙමෙති. මෙසේ පොකුරු වැස්සෙහි නෙම් සියලු ජනයා සිසන්න ල්දින් විසමයට පැමිණෙ කියන්නාහු සේමිනි! නුඹ ගුණ නොදනෙ නුවරින් නහා පියම්හ. ඒට ක්‍ෂමාකර අපගේ නුවරට අවුත් වොටුනු පැලඳ අප රක්‍ෂාකළ මැනවැයි කීහ. ඒ අසා බෝධිසත්වයෝ රට වැස්සෙනි! තව ද මා වොටුනු පළඳවාදැ යි කියා නො ගිවිසෙන් නගරවාසිහු සඳමහා රජ්ජුරුවන්ම කියන්නාහු සේමිනි! අප කිව ද නො ගිවිස්නාදැයි. නුඹවහන්සේ වදාළ මැනවැ යි ආරාධනා කළහ.

ඉක්බිති සඳමහා රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට කියන්නාහු පෙර ද මා කියමන් ගෙණ මෙවලට අවවද? දැනුත් මා කියමන් ගෙණ වොටුනු පැලඳ රාජ්‍යය කරව. ගුරුන් කිවක් කරණබව සත්පුරුෂ පුතුන්ට සුදුසුවේදැ යි කීහ. බොධිසත්වයෝ දෙමව්පියන්ගේ බස් මැඩැපීම මට සුදුසු නොවන්නේ වේදැ යි සිතා වල්තලා හැරැ සුවඳ පැනින් ඉස් සොඬා නහා සළුහැඳ සූසැට ආභරණයෙන් සැදී වොටුනු පැලඳ දෙවෙඳ විලාසයෙන් සිටියහ. සියලු ජනයා මහත් වූ සන්තෝෂයෙන් මඳිදේවින් ද ඉස් සොඬා නහවා දිව්‍යඛනාවක මෙන් සරහා වොටුනු පැලඳවූහ. එසඳ වෙනෙහි වල් හා පබ්බත නැටුහ. ජය තෙපුල් හා මහත් සොඟාකොටැ හෙරි සඬ තූර්‍යනාද යෙන් හා එකකොලාහල කෙරෙමින් පිඬා නම් හැලිඇතු සඳ ගෙණාහ.

බෝසතාණෝ ඇතු දැකැ රැහැණිවැ සිත්තන්නාහු මපියා නන් වහන්සේ ද මා දන් දුන් ඇතු ගෙන්වා ගත්වනැ යි සිතා ලජ්ජා ඇතිවූහ. ඒ බව දත් නගරවාසිහු සේමිනි! කාලිඬයේ රජ්ජුරුවෝ තමන් රට වැසි වැසැ බත් බුලත් සුලභවූයෙන් තුමූ ම ඇතු එවාපූහ. ඇතුපිටට නැඟී වදාළ මැනවැ යි කීහ. බොධිසත්වයෝ ඇතුපිටට නැඟී වංකගිරිපබ්භතයෙහි තපස් කළ සත්මසින් නුවරට නික්මැ කිපදවසක් මග ලැගැ දෙවි නුවරක් මෙන් සැදූ නුවරට වන්හ. සියලු නුවරවාසී සතුටුවැ කෙළිමින් නටමින් පිළිගිසැ සිසාරම්න් නොයෙක් කුතුලින්

රජගෙට වඩාගෙණැ ගියහ. බොධිසත්ත්වයෝ ශ්‍රී සම්පත් අනුභවකරන්නාහු සඳන්හල් කරවා දන් දෙමින් සියලු ජනයා කුසල්හි පිහිටුවා දසරාජධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් සහ පිරිවරින් දෙව්ලෝ ගියේ.

මෙසේ ඒ මහතානන්ත් අනෙක ජාතියෙහි රැක මුදුන් පත්කළ සඛර්ම්ය සරණ යෙමි යි දහම් සරණ යා යුතු.

සිඩිරසුනු.

දහම් සරණ නිමි.